වෙළුම 3 මුද්‍රණය 1 සැප්තැම්බර් 2020

# ලොව දිනූ චරිත

ජාත්‍යන්තර අධ්‍යයනය විෂය ශිෂ්‍ය සංගමය

ජාත්‍යන්තර අධ්‍යයනය අධ්‍යයනාංශය

කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාව

# හැඳින්වීම

විසිඑක්වන ශත වර්ෂය ලෝක ප්‍රජාව විසින් හඳුනාගෙන ඇත්තේ "ආසියානු ශත වර්ෂය" ලෙස ය. වර්තමාන ජාත්‍යන්තර දේශපාලන තත්ත්වය පිරික්සීමේ දී පැහැදිලි වන එක් කරුණක් වන්නේ ආසියාතික රාජ්‍යයන් ජාත්‍යන්තර දේශපාලනය තුළ සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරන බවයි. චීනය අද වනවිට ලෝකයේ දෙවන විශාලතම ආර්ථිකයට හිමිකම් කියන අතර ඉන්දියාව, ජපානය, දකුණු කොරියාව, සිංගප්පූරුව, ඉන්දුනීසියාව වැනි රාජ්‍යයන් ද තම බලය ජාත්‍යන්තරය තුළ ක්‍රියාත්මක කරමින් සිටී. ශතවර්ෂ ගණනාවක් ජාත්‍යන්තර දේශපාලනයේ බල කේන්ද්‍රස්ථානය ලෙස පැවති යුරෝපය හා ඇමෙරිකාව අභිභවා අද වන විට ආසියානු කලාපය ඉදිරියට පැමිණ ඇත. ආසියානු සංවර්ධන බැංකුව (Asian Development Bank) විසින් 2011 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද "ආසියාව 2050- ආසියානු ශත වර්ෂය සාක්ෂාත් කර ගැනීම" (Asia 2050- Realizing The Asian Century) නම් වූ වාර්තාවට අනුව වර්තමානයේ දී ආසියානු කලාපය සිටින්නේ ඓතිහාසික පරිවර්තනයක් මධ්‍යයේය.

2050 වර්ෂය වන විට ආසියානු කලාපය ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයෙන් මෙන්ම ජාත්‍යන්තර වෙළඳාමේ හා හා සමස්ත ලෝක ආයෝජන වලින් අඩකට වඩා ප්‍රමාණයකට හිමිකම් කියනු ඇත. එමෙන්ම ජාත්‍යන්තර දේශපාලනය තුළ වැඩි බලපෑමක් කිරීමේ හැකියාව ද ගොඩනඟා ගනු ඇත. ආසියානු කලාපය අත්පත් කරගෙන ඇති මෙම සංවර්ධනය කරුණු කිහිපයක් හේතුවෙන් සුවිශේෂී වේ. පළමුවැන්න නම්, මෙම කලාපයේ ඇති බොහෝ රාජ්‍යයන් තුළ දරිද්‍රතාවය, විරැකියාව, අවම ජීවන තත්ත්වයන්, අභ්‍යන්තර හා අන්තර් රාජ්‍ය යුද තත්ත්වයන්, ත්‍රස්තවාදය වැනි ගැටලු රාශියක් දැකගත හැකි වීමයි. මෙම ගැටලු සමස්ත ආසියාවටම බලපෑම් එල්ල කරනු ලබන පොදු ගැටලු වේ. දෙවැන්න, මෙම කලාපයේ බොහෝ රාජ්‍යයන් බහු සංස්කෘතික හා බහු ආගමික රාජ්‍යයන් වීමත් ඇතැම් රාජ්‍යයන් තුළ භාෂා සිය ගණනක් භාවිතා වීමත් හේතුවෙන් යම් අවස්ථාවන්හි එය රාජ්‍යයන්හි දේශපාලන අස්ථාවරත්වයක් ඇති වීමට හේතු වීමයි. තෙවැන්න නම්, මෙම කලාපයේ බොහෝ රාජ්‍යයන් දෙවන ලෝක යුද්ධය

අවසාන වන තෙක්ම යුරෝපීය අධිරාජ්‍යයන්හි යටත් විජිත ලෙස පැවතුන රාජ්‍යයන් වීමයි. එවැනි පසුබිමක් තුළ පවා ආසියානු කලාපය මේ වන විට ජාත්‍යන්තරය තුළ පෙර නොවූ විරූ ආකාරයේ බලපෑමක් කිරීමට සමත්ව තිබේ. එසේ නම් පෙර සඳහන් කළ අභියෝග මධ්‍යයේ වුවද ඉතා සාර්ථක ලෙස දේශපාලනික, ආර්ථික හා සමාජයීය දියුණුවක් ආසියාතික රාජ්‍යයන් විසින් අත්පත් කර ගනු ලැබුවේ කෙසේද යන්න විමසිය යුතු වේ. මෙහිදී මෙම කලාපය තුළ දැකගත හැකි පොදු සාධකයක් වන්නේ නිවැරදි හා දූරදර්ශී නායකත්වයයි. බොහෝ අභියෝග මධ්‍යයයේ වුවද මෙම ආසියාතික රාජ්‍යයන්ගේ පිබිදීමට හේතු වූ ප්‍රධාන කරුණ වන්නේ එම රාජ්‍යයන්හි පුරවැසියන්ට නායකත්වය දුන් අති විශිෂ්ඨ නායකයන් ය.

"ලොව දිනූ චරිත -03" කෘතිය හරහා සමකාලීන ඉතිහාසයේ ආසියානු කලාපයෙන් බිහිවූ විශිෂ්ඨ නායකයින් පහළොවකගේ ජීවන කතාව ගෙන හැර දක්වයි. මෙහිදී සාකච්ඡාවට බඳුන් වන නායකයන් වන්නේ: මහජන චීනයේ අසහාය නායක ඩෙන් ෂියාඕපින්, ජපානයේ අගමැති ෂින්සෝ අබේ, නිදහස් ඉන්දියාවේ ප්‍රථම අගමැති ජවහර්ලාල් නේරු, දකුණු කොරියාවේ තෙවන ජනාධිපති පාර්ක් චුන්ග් හී, ඉන්දුනීසියාවේ නිදහස් අරගලයට නායකත්වය දුන් එරට ප්‍රථම ජනාධිපති සුකර්ණෝ, ඉන්දුනීසියාවේ දෙවන ජනාධිපති සුහර්තෝ, පකිස්තානයේ නිර්මාතෘ මොහොම්මද් අලි ජින්නා, පකිස්තානයේ ප්‍රථම කාන්තා අගමැතිනිය බෙනාසීර් භූතෝ, පකිස්ථානයේ අගමැති ඉම්රාන් ඛාන්, බංග්ලාදේශයේ නිදහස් අරගලයට නායකත්වය දුන් ෂෙයික් මුජිබර් රහ්මාන්, බංග්ලාදේශයේ අසහාය කාන්තා නායකත්වය ෂෙයික් හසීනා, වියට්නාමයේ ජනාධිපතිවරයෙකු වූ හෝ චි මිං, මියන්මාරයේ රාජ්‍ය නායිකා අවුන් සාන් සු කී, නේපාලයේ හිටපු අගමැති බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාළ හා ඇෆ්ගනිස්ථානයේ හිටපු ජනාධිපති හමීඩ් කර්සායි යන කෘතහස්ත ලෝක නායකන් ය.

ඉහත සඳහන් සියලු රාජ්‍ය නායකයින් අනේකවිධ අභියෝග ජය ගනිමින් නිවැරැදි ප්‍රතිපත්තීන් තුළින් තම රාජ්‍යය සාර්ථකත්වය කරා මෙහෙයවූ නායකයෝ වෙති. මොවුහු තම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා විවිධ ක්‍රමෝපායන් අනුගමනය කළහ. කෙසේ වෙතත් මේ සියලු නායකයින් තුළ වූ

පොදු ලක්ෂණ රාශියක් වේ. ඒවා අතර දුරදර්ශී චින්තනය, ආත්ම විශ්වාසය හා නොපසුබට උත්සාහය ප්‍රධාන වේ. මොවුහු සැබැවින්ම දේශප්‍රේමියෝ වූහ. තවද ඔවුන් තම රට තුළ මෙන්ම ජාත්‍යන්තරය තුළ ද ඉහළ පිළිගැනීමකට ලක්විය. අද වන විට ආසියානු කලාපය ජාත්‍යන්තරය තුළ ඉතා බලවත් තත්වයකට පත්ව ඇත්තේ මෙම රාජ්‍ය නායකයින් ගේ දැඩි කැපවීම හා උත්සාහය තුළින් බව අවිවාදයෙන් පිළිගත යුතු වන්නේ ය .

මෙම කෘතිය තුළින් ඉහත සඳහන් කළ නායකයන් ගේ ළමා කාලය හා අධ්‍යාපනය, දේශපාලනයට පිවිසීම හා බලයට පත් වීම, රට තුළ ඔවුන් විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තීන් හා විදේශ ප්‍රතිපත්තීන් මෙන්ම ඔවුන්ගේ චරිත තුළින් උගත හැකි ආදර්ශ පිළිබඳව ද සාකච්ඡා කෙරේ.



## කැලණිය විශ්වවිද්‍යාලයීය උපකුලපතිතුමියගේ පණිවිඩය

කැලණිය විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර අධ්‍යයනය අධ්‍යයන අංශයේ ශිෂ්‍ය සංගමය මගින් ප්‍රකාශ කරනු ලබන ලොව දිනූ චරිත 3 ග්‍රන්ථය 2020 දී එළි දැක්වීම සඳහා සුබාශිංසන පිරිනැමීමට ලැබීම සම්බන්ධව ප්‍රථමයෙන් මාගේ සතුට පළ කරමි.

ඉතා මෑත ඉතිහාසයක බිහිවූ ජාත්‍යන්තර අධ්‍යයන අංශය විවිධ විෂය කරුණු මුල් කොට ගනිමින් විවිධ ග්‍රන්ථ හා සඟරා ප්‍රකාශයට පත් කොට තිබීම සම්බන්ධයෙන් මාගේ අවංක සතුට ප්‍රකාශ කර සිටිමි. විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ප්‍රජාව මෙවැනි කෘති මගින් සමස්ත සමාජයට ම සුවිශේෂී මෙහෙවරක් මෙන්ම කාලීන අවශ්‍යතාවයක් ඉටු කිරීමේ ව්‍යායාමයක් ලෙස ද පෙන්වා දිය හැක.

මාගේ දැක්මට අනුව ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල ප්‍රජාවට මව් බසින් රචිත විෂයානුබද්ධ කෘතීන් දුර්ලභ මෙවන් වකවානුවක ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් පුද්ගලයින් පිළිබඳ සිංහල බසින් ප්‍රකාශන එළිදැක්වීම ප්‍රශස්ත මෙන්ම මිල කළ නොහැකි කර්තව්‍යයක් ලෙස ද හඳුන්වා දිය හැකිය.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා**
**උපකුලපති**
**කැලණිය විශ්වවිද්‍යාලය**



## කැලණිය විශ්වවිද්‍යාලයීය සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපතිතුමන්ගේ පණිවිඩය

විශ්වවිද්‍යාලය මඟින් මානව සමාජයේ ප්‍රගමනය උදෙසා සමාජයීය, දේශපාලනික සහ සංස්කෘතික ගමන් මාර්ගයේ නිවැරදිව දිශාව තීරණය කිරීමෙහිලා මහගු කාර්යභාරයක් ඉටුකරනු ලබයි. එමෙන්ම ගෝලීයකරණයට ලක් වූ වර්තමාන ආර්ථික හා දේශපාලනික පසුබිම තුළ වඩා ගවේෂණශීලීවීම විද්‍යාර්ථීන්ගෙන් අපේක්ෂා කෙරේ. එවැනි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා පර්යේෂණ හා ප්‍රකාශන එළිදැක්වීම අතිශය වැදගත් කාර්යයක් ලෙස සැලකිය හැකිය.

එකී අපේක්ෂාවන් ඉටු කර ගැනීමේ සාධනීය අවස්ථාවක් ලෙස මෙම ග්‍රන්ථය ඇගයීමට ලක් කිරීම මාගේ වගකීමක් ලෙස සලකයි. මෙම ග්‍රන්ථය තුළින් විද්‍යාර්ථීන්ගේ ලේඛන කුසලතා, භාෂා ඥානය, භාෂා පරිවර්තන හැකියාව වර්ධනය වීම මෙන්ම සාමූහිකත්වය ද වර්ධනය වේ. මෙම ප්‍රයත්නය හෙට දින සාර්ථක පුරවැසියකු බිහි කිරීමට මග පාදනු ඇති බවට මම අපේක්ෂා කරමි.

මෙම ග්‍රන්ථය එළිදැක්වීම සඳහා මඟ පෙන් වූ ආචාර්ය මණ්ඩලයට ද ලේඛන සැකසූ නිර්මාණශීලී විද්‍යාර්ථීන්ට ද නන් අයුරින් සහය දැක්වූ සියල්ලන්ට ද මාගේ උණුසුම් සුබාශිංසන පිරිනමමි.

**මහාචාර්ය එම්. එම්. ගුණතිලක**
**පීඨාධිපති**
**සමාජීය විද්‍යා පීඨය**
**කැලණිය විශ්වවිද්‍යාලය**



## කැලණිය විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර අධ්‍යයනය අධ්‍යයනාංශයේ අංශාධිපතිතුමාගේ පණිවිඩය

ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යයනාංශයේ අංශාධිපතිතුමා වශයෙන් ජාත්‍යන්තර අධ්‍යයන විෂය ශිෂ්‍ය සංගමය මගින් "ලොව දිනූ චරිත - 03" කාලෝචිත ග්‍රන්ථයක් ලෙස එළිදැක්වීම පිළිබඳ සුභාශිංසන එක් කරන්නේ හදපිරි සතුටිනි.

ලෝක දේශපාලනය, ජාත්‍යන්තර සබඳතා, මිනිස් අයිතිවාසිකම්, නිදහස වැනි ක්ෂේත්‍රයන්හි කැපී පෙනෙන චරිත පිළිබඳ සිංහල භාෂාවෙන් පලවී ඇති ශාස්ත්‍රීය ලේඛනයන්හි අඩුවක් දක්නට ලැබේ. එම හිඩැස පිරවීම සඳහා දායකත්වය දැක් වූ ජාත්‍යන්තර අධ්‍යයනය විෂය ශිෂ්‍ය සංගමයටත්, ලිපි සම්පාදනයෙන් දායක වූ විද්‍යාර්ථීන්ටත්, නන් අයුරින් සහය දුන් සැමටත්, එය සාර්ථකව නිම කර ගැනීමට කටයුතු කළ අපගේ ආචාර්ය මණ්ඩලයටත් ජාත්‍යන්තර අධ්‍යයනය අධ්‍යනාංශයේ අංශාධිපති ලෙස මාගේ උණුසුම් සුභ පැතුම් එක් කරන අතර මෙම කාර්යය අඛණ්ඩව ඉදිරියටත් පවත්වා ගැනීමට ධෛර්යය ලැබේවා යයි ආශිංසනය කරමි.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සිතාර ප්‍රියදර්ශන**
**අංශ ප්‍රධාන**
**ජාත්‍යන්තර අධ්‍යයනය අධ්‍යයනාංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**

ලොව දිනූ චරිත - 03

ප්‍රධාන සංස්කාරක

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සිතාර ප්‍රියදර්ශන
- ආධුනික කථිකාචාර්ය හෂාන් විරාජ් විජේසිංහ

සංස්කාරක

- අරෝෂ් මාටින්
- මදාරා ජයලත්

සහය සංස්කාරක

- චාරුක මදුසංක
- ධනංජය තෙලිකඩ ආරච්චි
- සාලිය නෙරන්ජන්
- සමීර ප්‍රදීප් කුමාර
- ලක්ෂිකා හෙට්ටිආරච්චි
- තුෂිණි යසස් ශ්‍රී
- කවින්දි කෞෂල්‍යා
- ගෝතමී නාරංගල
- නිමෝෂා විමලරත්න
- නිශාරා අබේවික්‍රම
- නදීශා අබේවික්‍රම
- හසිනි සිරිවර්ධන
- දුලංශි අංශිකා
- සඳුනි චතුරිකා
- ඉෂිනි සෙව්වන්දි
- නිසලි එදිරිසිංහ
- ශෂිණි විජේතිලක

- හිරුණි ජයසිංහ
- කුළුණි විතානගේ
- ටී. එම්. වයි. එච්. තෙන්නකෝන්

ජාත්‍යන්තර අධ්‍යයනය විෂය ශිෂ්‍ය සංසදයේ නිලධාරී මණ්ඩලය

| | |
|---|---|
| • සභාපති | :- චාරුක මදූසංක |
| • ලේකම් | :- පියුමි බණ්ඩාර |
| • සංස්කාරක | :- අරෝෂ් මාටින් |
| • සඟරා සංස්කාරක | :- ලක්ෂිකා හෙට්ටිආරච්චි<br>කවින්දි කෞෂල්‍යා |
| • කණිෂ්ඨ භාණ්ඩාගාරික | :- හිරුණි ජයසිංහ |
| • උප සභාපති | :- මන්දාකිණි අත්තනායක |
| • උප ලේකම් | :- මාලිංග රමේෂ් |
| • කණිෂ්ඨ සංස්කාරක | :- මදාරා ජයලත් |

නිර්මාණ සංකල්පය හා මෙහෙයවීම

- ලක්ෂ්මන් ප්‍රනාන්දු (බාහිර කථිකාචාර්ය)

පිට කවර නිර්මාණය

- ගෝතමී නාරංගල

# පටුන

1. ඩෙන් ෂියාඕපින්

2. ෂින්සෝ අබේ

3. ජවහර්ලාල් නේරු

4. පාර්ක් චුන්ග් හී

5. සුකර්ණෝ

6. සුහර්තෝ

7. මොහොම්මද් අලි ජින්නා

8. බෙනාසීර් භූතෝ

9. ඉම්රාන් ඛාන්

10. ෂෙයික් මුජිබර් රහ්මාන්

11. ෂෙයික් හසීනා

12. හෝ චි මිං

13. අවුන් සාන් සු කී

14. බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාළ

15. හමීඩ් කර්සායි

# පෙළගැස්ම

මෙම කෘතියේ ඇතුළත් සියලුම ලිපි පොදු ආකෘතියක් යටතේ පෙළගස්වා ඇත. එම ආකෘතිය පහත පරිදි වේ:

- හැඳින්වීම
- ළමා කාලය
- අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම
- නායකත්වය කරා ගිය ගමන් මඟ
- නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව
- විදේශ ප්‍රතිපත්තිය
- ගත හැකි ආදර්ශ
- සාරාංශය

# ඩෙන් ෂියාඕපින්



**කණ්ඩායම් සාමාජිකයන් :**

- මදාරා ජයලත්
- නිසලි එදිරිසිංහ
- ශෂිණි විජේතිලක
- හිරුණි ජයසිංහ
- ආර්.පී.එච්. අමල්කා

මකර රාජධානිය තුළ 'ඩෙන්' නාමය අමරණීය කරමින්,

තමාට ම ආවේණික වූ නන් විධ හැකියාවන් භාවිතා කොට,

ස්වකීය මාතෘභූමිය සුවිශේෂි දිශානතියකට ගෙන යමින්,

රාජ්‍යයේ පළවැනි පුරවැසියා ලෙස වගකීම් සහගත ව,

දැඩි විප්ලවාදියෙකු වූ මාඕ ගේ දැක්ම වෙනස් කොට,

චීනයේ වසා තිබූ කවුළු පියන්පත් ලෝකයාට විවෘත කළ ඔහු,

නමින්, **ඩෙන් ෂියාඕපින්** නම් වූ නූතන චීනයේ නිර්මාතෘ විය.

# හැඳින්වීම

විලංගුලා සිටි ගිජිඳෙකු ස්වශක්තියෙන් නැගිටින්නාක් මෙන් අඳුරු කඨෝර යුග ගණනාවක සෝ සුසුම් නිම කරමින් අපේක්ෂාවේ ආශිර්වාද වැසි වස්සමින් දියත සුපතළ මකර රජිඳෙකු ගේ ආගමනයත් සමඟ ලොවෙන් සැගව නිද්‍රාශීලීව හුන් මකර රාජධානියේ ඓතිහාසික පිබිදීම ඩෙන් ෂියාඕපින් (Deng Xiaoping) නම් අසහාය නායකයාගේ සම්ප්‍රාප්තියත් සමඟ වර්ෂ 1978 දී සනිටුහන් විය. එතෙක් මෙතෙක් චීනයේ පහළ වූ විශිෂ්ඨතම නායකයන් අතුරෙන් දීප්තිමත් චරිතයක් වන මෙතුමා "නූතන චීනයේ නිර්මාපකයා" යන ගෞරව නාමයට පාත්‍ර විය. එතුමාගේ සාර්ථකත්වයේ ගමන රෝස මල් යහනාවක් මතින් සිදුවූවක් නොවේ. විවිධ හැලහැප්පීම්, පලිගැනීම්, සිත් රිදවීම් අතරින් නොපසුබස්නා චිත්ත ශක්තියෙන් සාර්ථකත්වයේ හිනිපෙත්තටම ගමන් කළ එතුමා නිසැකවම විසිවන ශතවර්ෂයේ විශිෂ්ඨම නායකයන් අතර නම් දරන්නේ ඔහුගේ දුරදක්නා ප්‍රතිසංස්කරණවල ආශිර්වාදයෙන් චීනය පෙර නොවූ විරූ පරිදි හිස එසවීමත් සමඟයි. ආර්ථික, දේශපාලනික, සාමාජීය ආදී විවිධ පැතිකඩ ඔස්සේ චීන ඉතිහාසය නැවත ලිවීමට තරම් ප්‍රබල කාලෝචිත ප්‍රතිසංස්කරණ හා ප්‍රතිපත්ති මෙතුමා ක්‍රියාත්මක කළේය. 'Made in China' ලෙස සටහන්ව අප අතට පත්වන සෑම නිමැවුමකම සාර්ථකත්වය මේ අසහාය නායකයාගේ විදිමත් මගපෙන්වීමක ප්‍රතිඵලයකි. අද වනවිට ලොව දෙවන විශාලතම ආර්ථිකයට හිමිකම් කියන චීනය ඉදිරි වසර 30 ඇතුළත ලෝක බලවතා වීමේ සිහිනය අත්පත් කරගැනීමට දැන් සියල්ල සූදානම් කර හමාරය. 'චීන සිහිනය' සැබෑවක් කර ගැනීමටත් ඇමරිකාවට නිර්භීතව අභියෝග කිරීමටත් දූප්පත් රටක්ව පැවති චීනයට මෙතරම් ශක්තියක් හිමි වන්නේ නිතැතින්ම ඩෙන් ෂියාඕපින් ගේ ප්‍රබල නායකත්වය තුළින් ලැබූ පන්නරය වත්මන් චීන නායකයින් විසින් තවදුරටත් අනුගමනය කරන නිසාවෙනි. එවන් වූ අමරණීය මිනිස් පෞරුෂයක ළමා කාලය, අධ්‍යාපනය, දේශපාලන ගමන්මග, එතුමාගෙන් විවිධ ක්ෂේත්‍ර වලට සිදු වූ සේවාවන්, ලෝකය හා සම්බන්ධ වීමට එතුමා අනුගමනය කළ ප්‍රතිපත්තීන් සහ අවසානයේ මෙවැනි නොසැලෙන දක්ෂ නායකත්වයකින් ගත හැකි ආදර්ශ පිළිබඳව මෙහිදී ගැඹුරු විශ්ලේෂණයක් සිදු කෙරේ.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

21 වන සියවස 'ආසියානු සහශ්‍රය' (Asian Century) ලෙස හැඳින්වීමට එක් ප්‍රබල හේතුවක් වන්නේ මහජන චීන සමූහාණ්ඩුවේ නැගී සිටීමය. චීනයට මෙලෙස නැගී සිටින්නට හැකි වූයේ එක් මිනිසෙකුගේ විශාල තීරණයක් නිසාවෙනි. ශරීරයෙන් කුඩා වුවත් සිතුවිලි අතින් ලොවක් උඩු යටිකුරු කිරීමට සමත් වූ මොහු චීනය තුළ විවෘත ආර්ථිකයක් ඇති කරමින් සිය දහස් ගණන් ජීවිත දිළිඳු බවෙන් මුදවා ගත්තේය. ඒ අන් කවරෙකුත් නොව නූතන චීනයේ නිර්මාතෘවරයා හෙවත් ඩෙන් ෂියාඕපින් නම් වූ සොඳුරු මිනිසා විය.

ඩෙන් ෂියාඕපින් 1904 අගෝස්තු මස 22 වන දින සීචුවාන් (Sichuan) පළාතේ ගුවාන්ගන් (Guangan) හි උපත ලැබීය. ඔහුගේ පියා ඩෙන් වෙන්මින් (Deng Wenming) නම් වූ මධ්‍යම පාංතික ඉඩම් හිමියෙක් වූ අතර ඔහු එකල දේශීය වශයෙන් කැපී පෙනෙන චරිතයක් විය. මොහු විවාහයන් හතරක් සිදුකර ගත් බැවින් ඩෙන් ගේ මව ඔහුගේ භාර්යාවන් සිව් දෙනාගෙන් දෙවැන්නා වන ඩෙන් දන්ෂි (Deng Danshi) විය. කුඩා ඩෙන් එක් සහෝදරියක් ද සහෝදරයන් දෙදෙනෙකු ද සහ ඔහුගේ පියාගේ අනෙක් භාර්යාවන්ගේ දරුවන් ද සමඟ හැදී වැඩුණේ ය.

ඩෙන් ට වයස අවුරුදු පහ ලබන විට ඔහුගේ අධ්‍යාපනය සම්ප්‍රදායික චීන ප්‍රාථමික පාසලකින් ආරම්භ කරන ලදි. මින් අනතුරුව වැඩිදුර අධ්‍යාපන කටයුතු සඳහා නගරබද පාසල් කිහිපයක් වෙත ගියේය. තම මව්බිමේ සිදු කළ අධ්‍යාපන කටයුතුවල අවසානය වූයේ 1919 වසරේ සරත් සෘතුවේ දී චොන්ග් චින්ග් පාසලෙන් (Chongqing School) ඔහුගේ පළමු උපාධිය ලබා ගැනීමෙන් අනතුරුවය. එකල ඔහු වයස අවුරුදු පහළොවක තරම් කුඩා ගැටවරයෙක් විය. අනතුරුව 1920 දී ඔහු ඇතුලු තවත් පාසල් මිතුරන් 80ක් 'කඩිසර වැඩ-සකසුරුවම් අධ්‍යයන ව්‍යාපාරය' හෙවත් 'Diligent Work-Frugal Study Movement' යනුවෙන් හඳුන්වන චීන සිසුන් ප්‍රංශයට හා බෙල්ජියමට ගෙන එන

ලද වැඩසටහන් මාලාවකට සහභාගී වීම සඳහා ප්‍රංශය බලා පිටත් විය. එය සඳහා මේ පිරිසට අමතරව තවත් 4001 ක චීන පිරිසක් සහභාගී වු අතර ඩෙන් මේ පිරිසේ ලාබාලතමයා විය. ප්‍රංශය බලා ගිය පිරිසෙන් ඩෙන් ද ඇතුලුව ගණනින් 210 කින් යුතු චීන පිරිසක් දකුණුදිග ප්‍රංශයේ පිහිටි මක්සෙයි (Marseille) නම් වූ වෙළෙඳ නගරය වෙත රැගෙන ගියේය. එහිදී ඔහු බැයු (Bayeux) හා ෂැතියොන් (Châtillon) යන ප්‍රදේශ වල පාසල් වෙත ගිය නමුත් ඔහු වැඩි අවධානයක් ප්‍රංශ කර්මාන්තශාලාවල වැඩ කිරීම සඳහා යොමු කළේය.



*(ඩෙන් ෂියාඕපින් අවුරුදු 16 දී )*

1921 දී ඩෙන් වයඹදිග ප්‍රංශයේ උප නගරයක් වන ලා ගැරේන්-කොලොම්බස් (La Garenne-Colombes) වෙත ගිය අතර එහිදී ඔහු තම පළමු රැකියාව වශයෙන් වැද්දුම්කරුවෙකු (fitter) ලෙස ල ක්‍රියුසොට් යකඩ හා වානේ කම්මලට (Le Creusot Iron and Steel Plant) බැඳුණේය. ල ගැරේන්-කොලොම්බස් හිදී ඩෙන් හට චෞ එන්ලායි (Zhou Enlai), නී රොන්ෂු (Nie Rongzheu), කායි හෙසන් (Cai Hesen), ෂාවො ෂියාන් (Zhao Shiyan) යන ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් හමු වන අතර ඔවුන්ගේ මැදිහත් වීම යටතේ ඩෙන් මාක්ස්වාදය ඉගෙනීමටත් දේශපාලන ප්‍රචාරණ කටයුතු සඳහා සම්බන්ධ වීමටත් පටන් ගත්තේය. එහි ප්‍රතිඵල කෙතෙක් ද කිවහොත් 1921 දී මොහු යුරෝපයේ චීන කොමියුනිස්ට් තරුණ එක්සත් මණ්ඩලයට (Chinese Communist Youth League in Europe) සම්බන්ධ වනවා පමණක් නොව 1924 වන විට මෙම මණ්ඩලයේ ප්‍රධාන ශාඛාවෙහි (General Branch of the Youth League in Europe) සාමාජකයින් අතරින් ප්‍රමුඛ පෙළේ සාමාජිකයෙක් බවට පත් වීමට සමත් විය. 1926 දී ඩෙන් සෝවියට්

දේශයට ගිය අතර එහි දී සුන් යට්-සෙන් විශ්වවිද්‍යාලය (Sun Yat-sen University) තම අධ්‍යාපන කටයුතු සඳහා තෝරා ගත්තේය. නමුත් වයඹදිග චීනයේ සිටි හමුදා නායකයෙක් වූ ෆෙන් යුක්ෂියාන් (Feng Yuxiang) සෝවියට් දේශයට තමන්ගේ සහයට සහයකයෙක් අවශ්‍ය බවට ඉල්ලීමක් සිදු කල බැවින් 1927 දී ඩෙන් හට එම පාලකයාගේ හමුදාවට සම්බන්ධ වීම සඳහා සෝවියට් දේශය අතහැර නැවත චීනයට පැමිණීමට සිදු විය. මෙම ආගමනය ඩෙන් ගේ හැරවුම් ලක්ෂය වූ අතර දේශපාලනයට අවතීර්ණ වීමේ පළමු පියවර ද විය.

ඩෙන් ගේ විවාහ දිවිය කිසිවිටෙකත් ඔහුට සුන්දර, මිහිරි මතකයක් නොවීය. මන්ද ඔහුට තෙවරක්ම විවාහ වන්නට සිදු විය. ඩෙන් ගේ පළමු බිරිඳ පළමු දරුවා බිහි කිරීමෙන් දවස් කිහිපයකට පසු මිය ගියාය. ඇය මිය යන විට වයස අවුරුදු 24 ක් වූ අතර ඩෙන් දුක් සයුරක ගිල්ලවමින් කුඩා දරුවා ද ඔහුව මෙලොව තනි කරමින් ජීවිතයෙන් සමු ගත්තාය. එහෙත් ඔහු දෙවන වරටත් විවාහ වන්නට තීරණය කළ අතර ඔහුගේ දෙවන බිරිඳ ජින් වෙයිඉන්ග් (Jin Weiying) නම් විය. නමුත් දෛවය ඔහුට එරෙහි වූවේ කිසිසේත් නොසිතූ පරිදි ය. 1933 වසරේදී ඩෙන් දේශපාලන ප්‍රහාරයකට ලක් ව සිරගත කළ අවස්ථාවේ දී ඔහු ව හැර යන්නට තරම් ජින් අමානුෂික විය. එය ඔහුගේ ජීවිතයට දැඩි බලපෑමක් ඇති කළ අතර තෙවසරක් ගත වන තෙක් ඔහුගේ දිවියෙන් විවාහය නැමැති පරිච්ඡේදය ඉවත් කර තැබීමට දෛවය තීරණය කරන ලදි. නමුත් නොබෝ කලෙකින් ඩෙන් ගේ ජීවිතයට වසන්තය පැමිණියේ ලොව තුළ සදාකාලික දුකක් නැති බව පසක් කරමින්ය. තෙවන හා අවසාන වරට ඩෙන් විවාහ වන්නට තීරණය කළ අතර ඔහුගේ ජීවන සහකාරිය වූයේ චෞ ලින් (Zhou Lin)ය. ඇය 1916 දී යුනන් (Yunnan ) පළාතේ ෂුවැන්වෙයි (Xuanwei ) හි උපත ලැබීය. 1938 වසරේදී ඇය චීන කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධ වූ අතර ඉන් වසරකට පසුව එනම් 1939 දී ඩෙන් හා විවාහ විය. ඔවුන් දෙදෙනාට ඩෙන් ලී (Deng Lin), ඩෙන් නන් (Deng Nan), හා ඩෙන් රොන් (Deng Rong)

ලෙස දියණියන් තිදෙනෙක් ද ඩෙන් පුෆැන් (Deng Pufang) හා ඩෙන් ෂිෆන් (Deng Zhifang) නම් වූ පුතුන් දෙදෙනෙක් ද විය.

## නායකත්වය කරා ගිය ගමන් මග

ෆෙන් යුක්ෂියාන්ගේ හමුදාවෙන් ඉවත් වූ පසු ඩෙන් කොමියුනිස්ට්වාදීන් ගේ මූලස්ථානය තිබූ වූහාන් (Wuhan) නගරයට පැමිණියේය. එහිදී ඔහු කොමියුනිස්ට් පක්ෂය තුළ ප්‍රමුඛ තනතුරු දැරීමට ද සමත් විය. වූහාන්හිදී ඩෙන්, එවකට පක්ෂයේ සටන්කාමී සෝවියට් හිතවාදී නායකයන්ගේ පැසසුමට එතරම් ලක් නො වූ මාඕ සේතුං සමඟ සබඳතා ඇති කර ගත්තේය.

1927 සිට 1929 දක්වා කාලය තුළ ඩෙන් ෂැංහයි ප්‍රදේශයේ වාසය කළේය. ඒ කාලයේ දී ඔහු විවිධ විරෝධතා ව්‍යාපාර සංවිධානය කළ අතර ඒවාට කුවෝමින්ටැන් (Kuomintang) බලධාරීන් දරුණු ලෙස පීඩා එල්ල කරනු ලැබීය. එම වසරවල බොහෝ කොමියුනිස්ට් සටන්කාමීන්ගේ ඝාතනයන් පක්ෂ සාමාජිකයන් ගේ සංඛ්‍යාව අඩුවීමට හේතු වූ අතර එමගින් ඩෙන්ට ඉක්මනින් පක්ෂ තනතුරු වලින් ඉහළට ගමන් කිරීමට හැකි විය. කෙසේ වෙතත් 1933 දී කොමියුනිස්ට් පක්ෂයේ අභ්‍යන්තර එදිරිවාදිකම් හේතුවෙන් ඩෙන්ට ප්‍රසිද්ධියේ චෝදනා කිරීමෙන් අනතුරු ව ඔහුව සියලු දේශපාලන කාර්යයන් වලින් නෙරපා හරින ලදී. එපමණක් නො ව ඔහුව අත්අඩංගුවට ද ගැනුණි.

1934-1935 කාලය තුළ චීන රතු හමුදාව (Red Army) සිදු කළ දිගු පා ගමන (Long March) අතරතුර කාලයේ දී ඩෙන්, පළමුවෙන්ම පළමු හමුදා බලකායේ දේශපාලන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ලෙසත් පසුව එහි දේශපාලන කොමසාරිස්වරයා ලෙසත් සේවය කළේය. 1937 දී ජපානය සමඟ යුද්ධය ආරම්භ වීමෙන් පසු ඔහු, සීචුවාන්හි උපන් ඩෙන්ගේ අසල්වැසි ලියු බෝචෙන් (Liu Bocheng) විසින් අණ දෙන ලද 8 වන කොමියුනිස්ට් මාර්ග හමුදාව මගින් ප්‍රතිසංවිධානය කරන ලද කණ්ඩායම් තුනෙන් එකක් වන 129 වන සේනාංකයේ

දේශපාලන කොමසාරිස්වරයා ලෙස පත් කරන ලදී. මෙම සීචුවාන් ජාතිකයන් දෙදෙනා යටතේ පැවති හමුදාව විශාල මිලිටරි යාන්ත්‍රණයක් දක්වා වර්ධනය වූ අතර යුද සමයේදී පැවති විශාලතම කොමියුනිස්ට් හමුදා ඒකක හතරෙන් එකක් බවට 129 වන සේනාංකය පත්විය.

සිවිල් යුද්ධය ආරම්භ වූ 1948 දී එය දෙවන ක්ෂේත්‍ර හමුදාව (Second Field Army) ලෙස නම් කරන ලදී. 1948 නොවැම්බර් මාසයේ සිට 1949 ජනවාරි දක්වා නැගෙනහිර චීනයේ පැවැති තීරණාත්මක හුආයිහායි (Huaihai) සටන්වලදී ඩෙන් කොමියුනිස්ට් හට පිරිස් සහභාගි කරවා ගැනීමට අවශ්‍ය හමුදා ක්‍රියාමාර්ග මෙහෙයවීමට ස්ථාපනය කරන ලද විශේෂ සාමාජිකයන් පස් දෙනෙකුගෙන් යුත් පොදු පෙරමුණු කමිටුවක ලේකම් ලෙස සේවය කළේය. 1949-1950 දී දෙවන ක්ෂේත්‍ර හමුදාව නිරිතදිග චීනය අල්ලාගත් අතර 1950 දශකයේ මුල් භාගයේ දී ඩෙන් එහි ශ්‍රේණිගත පක්ෂ නායකයා බවට පත්විය.

1952 දී පීකිං (Peking) වෙත මාරු වීමෙන් පසු ඩෙන් නායකත්ව ධූරාවලිය තුළ ඉතා ඉක්මනින් ඉහළට  පැමිණියේය. ඔහු 1954 දී චීන කොමියුනිස්ට් පක්ෂයේ මහ ලේකම්වරයා ලෙස පත්විය. පසුව තනතුරුවලින් නෙරපා හැරි විරුද්ධවාදී කලාපීය නායකයන් දෙදෙනකු පිළිබඳ ඔහු කළ අධීක්ෂණයකින් අනතුරුව ඊළඟ වසරේදී දේශපාලන මණ්ඩල සාමාජිකත්වය ද ඔහුට හිමිවිය. 1956 දී පැවැති අටවන චීන  කොමියුනිස්ට් පක්ෂ සම්මේලනයේදී ඩෙන්, හය  දෙනෙකුගෙන් යුත් දේශපාලන මණ්ඩල ස්ථාවර කමිටුවට ( Politburo Standing Committee) උසස් කරනු ලැබූ අතර පක්ෂ ලේකම් කාර්යාලයේ ප්‍රධානියා ලෙස මහලේකම් ධූරයට ද පත්විය. ඒ වනවිටත් ඔහු චීනයේ බලවත්ම පුද්ගලයන් හය දෙනාගෙන් එක් අයකු වී අවසන්ය.

බොහෝ වාර්තාවලට අනුව ඩෙන්  ඉතා දක්ෂ බුද්ධිමත් හා දැනුමින් සන්නද්ධ මිනිසෙකි. එම නිසාවෙන්ම ඔහුගේ සගයන් විසින් ඔහුව "ජීවමාන විශ්ව කෝෂයක්" ලෙස හඳුන්වන ලදී. වරක් මාඕ සේතුං විසින් රුසියානු නායක කෘෂෙව් (Khrushchev) වෙත ඩෙන් පෙන්වා දී "එහි සිටින කුඩා මිනිසා දෙස බලන්න! ඔහු ඉතා බුද්ධිමත්ය. ඔහු ඉදිරියේ විශාල අනාගතයක් ඇත." යනුවෙන් පැවසීය.  චීන-සෝවියට් සබඳතා හා ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය

පිළිබඳව ඔවුන්ගේ ආරවුල්වලට සමීපව සම්බන්ධ වූයෙන් ඩෙන්, 1950 හා 1960 දශකවල කිහිප වතාවක්ම සෝවියට් දේශයේ සංචාරවල නියැළී ය.

දැඩි මිත්‍රත්වයකින් වෙළී සිටි මාඕ සේතුං ගේ හා ඩෙන් ගේ සබඳතා දෙදරා යාම ආරම්භ වන්නේ ද මේ අතරතුරේදීය. ඒ අනුව 1960 ගණන්වලදී ආර්ථික සංවර්ධන උපායමාර්ග හා වෙනත් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් එකිනෙකා එකඟ නොවීම නිසා එම දෙදෙනා වෙන් වූහ. "ඔවුන් කළු බළලුන් ද සුදු බළලුන් ද යන්න ගැටළුවක් නොවේ. ඔවුන් මීයන් අල්ලා ගන්නා තාක් කල් ඔවුන් හොඳ බළලුන්ය" යන ඩෙන්ගේ සුප්‍රසිද්ධ ප්‍රකාශයේ අන්තර්ගත ඩෙන්ගේ ප්‍රායෝගිතාවාදය (Pragmatism) මාඕගේ කනට මිත්‍යාවක් ම පමණක් විය. ඩෙන් ඔහුගෙන් උපදෙස් නොගෙන තීරණ ගැනීම පිළිබඳව අමනාප වූ මාඕ 1961 පැවති පක්ෂ රැස්වීම්වකදී "මෙය කළේ කුමන අධිරාජයා දැයි" විමසමින් ඩෙන් වෙත බැණ වැදුණේය. 1966 දී මාඕ විසින් මහා නිර්ධන පංති සංස්කෘතික විප්ලවය (Great Proletarian Cultural Revolution- GPCR) දියත් කළ අතර ඩෙන් වැනි පක්ෂය තුළ වූ ධනවාදී බලවතුන් ඉවත්කොට පක්ෂය පවිත්‍ර කිරීම සඳහා තරුණ කොමියුනිස්ට් පක්ෂ රතු ආරක්ෂක භටයන් බල මුලු ගැන්වී ය. 1969 සිට 1973 දක්වා ඩෙන් සහ ඔහුගේ පවුලේ අය නැවත අධ්‍යාපනය ලැබීම සඳහා ජියැන්සි (Jiangxi) ග්‍රාමයෙහි මැයි හත්වන සේවක පාසල (May Seventh Cadre School) නම් කම්කරු විද්‍යායතනයට පිටුවහල් කරන ලදී. එහිදී ඔහු සාමාන්‍ය ශ්‍රමිකයෙකු ලෙස කටයුතු කරමින් මාඕ සහ මාක්ස් විසින් රචිත ලේඛන අධ්‍යනයේ ද නිරත විය. එහිදී ඩෙන් ගේ වැඩිමහල් පුත් ඩෙන් පුෆැන් (Deng Pufang) රතු ආරක්ෂකයින්ගේ පහරදීමකින් ස්ථිර ආබාධිත තත්ත්වයකට පත් විය. 1973 වසන්ත ඍතුවේ දී ඩෙන් නැවත පීකිං වෙත කැඳවන ලදි. ඉන් අනතුරුව ආරක්ෂක අමාත්‍ය ලින් පියාඕ (Lin Piao)ගේ අභාවයත් ලින්ගේ අනුගාමිකයන් ඉවත් කිරීමත් නිසා යථා තත්ත්වයට පත්වෙමින් පැවති දේශපාලන බලවේගවල ප්‍රතිඵලයක් වශයෙන් ඩෙන් නැවත උප අග්‍රාමාත්‍යවරයෙකු ලෙස බලයට පත්විය.

චීන නායකත්වය තුළ ඩෙන්ගේ හැකියාව හා විශේෂඥතාව ඉතා ඉහළ අගයක් ගත් අතර ඔහු ඉක්මනින් වැදගත් කාර්යභාරයන් රැසක් තමා වෙත පවරා

ගත්තේය. 1973 අග භාගයේදී ඔහු කලාපීය හමුදා නායකයින්ගේ විශාල වෙනසක් සිදු කිරීමත් සමඟ ඔහු දේශපාලන මණ්ඩලයට උසස් කරනු ලැබීය. 1974 අප්‍රේල් මාසයේදී ඩෙන් එක්සත් ජාතීන්ගේ විශේෂ සැසියක් සඳහා නිව්යෝක් බලා ගිය අතර එහිදී ඔහු මාඕගේ "තුන් ලෝකයන්" (Three Worlds) පිළිබඳ න්‍යාය පැහැදිලි කළේය. (තුන් ලෝකයන්- මාඕ සේතුං, දේශපාලන-ආර්ථික ලෝක තුනක් යෝජනා කරයි. ඒවා නම් පළමු ලෝකය, දෙවන ලෝකය සහ තුන්වන ලෝකය යි. පළමු ලෝකය පිළිවෙලින් අධිරාජ්‍යවාදයේ හා සමාජ අධිරාජ්‍යවාදයේ නියැලී සිටින සුපිරි බලවතුන් වන එක්සත් ජනපදය සහ සෝවියට් සංගමයෙන් සමන්විත වේ. දෙවන ලෝකය ජපානය සහ කැනඩාව, යුරෝපය සහ උතුරු-දකුණු ගෝලීය බෙදීම (global North–South divide) ඇති රටවල් වලින් සමන්විත වේ. තෙවන ලෝකය අප්‍රිකාව, ලතින් ඇමරිකාව සහ මහාද්වීපික ආසියාව යන රටවලින් සමන්විත වේ.)



*(ඩෙන් ෂියාඕපින් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සමුළුව අමතමින් (1974) )*

1974 මැයි මාසයෙන් පසු අගමැති චෞ එන් ලායි (Chou En Lai) රෝහල් ගත කිරීමත් සමඟ නායකත්වය සහ පරිපාලනය සම්බන්ධ බර වැඩි බරක් ඩෙන්ගේ උරමත පැටවිණි. 1975 ජනවාරියේදී ඩෙන් පක්ෂයේ උප සභාපති, ජෝෂ්ඨ උප අගමැති හා හමුදා මාණ්ඩලික ප්‍රධානි ලෙස උසස් කරන ලදී. 1976 ජනවාරි 8 වන දින අග්‍රාමාත්‍ය චෞ මියගිය වහාම ඩෙන්, චීන මාධ්‍යන්ගේ ප්‍රහාර වල ඉලක්කය බවට පත් විය. එම වසරේම අප්‍රේල් 7 වන දින කොමියුනිස්ට් පක්ෂ දේශපාලන මණ්ඩලය මාඕගේ යෝජනාවට අනුව ඩෙන් සියලු නායකත්ව තනතුරු වලින් නෙරපා හරින ලෙස ඉල්ලා සිටියේය.

1976 සැප්තැම්බර් මාසයේ මාඕගේ මරණයෙන් පසුව ඩෙන් ඇතුළු පාක්ෂියන්ට නැවත බලය ලැබෙන අතර ඔවුන්ගේ මැදිහත්වීමෙන් ඩෙන් නැවතත් 1977 ජූලි මාසයේ දී සේවයේ පිහිටුවන ලදී. එනම් 1977 ජූලි 22 වන දින ඩෙන් කොමියුනිස්ට් පක්ෂ මධ්‍යම කාරක සභාවේ උප සභාපති, හමුදා කොමිෂන් සභාවේ උප සභාපති සහ මහජන විමුක්ති හමුදාවේ (People's Liberation Army) සාමාන්‍ය මාණ්ඩලික ප්‍රධානී යන තනතුරුවලට පත් කරන ලදී. එනමුත් නව පක්ෂ සභාපති වූ හුවා ගුවෝෆෙන්ගේ (Hua Guofeng) විරෝධය ඩෙන් ට එදිරිව නොඅඩුව පැවතුණි.

කෙසේනමුත් පොදු මහජනයාගේ එකම බලාපොරොත්තුව හා කැමැත්ත වූයේ ඩෙන් බලයට පත් වනු දැකිමයි. මෙය ඔහුට වාසිසහගත විය. එබැවින් පක්ෂයේ ඉහළ පෙළ නියෝජනයන්ගෙන් එල්ල වූ විවිධ අභියෝග පරාජය කරමින් ඩෙන් 1978 දී චීනයේ අසහාය නායකයා (Paramount Leader) බවට පත්ව 1992 විශ්‍රාම යනතෙක්ම චීන ජනතාව උදෙසා තම සේවය නොපිරිහෙළා ඉටු කළේය. පක්ෂය තුළ තම ආධාරකරුවන් ප්‍රවේශමෙන් ඉතා සූක්ෂමව බලමුලු ගැන්වීමෙන් අනතුරුව හුවා අභිබවා යමින් 1980 දී ඩෙන් විසින් හුවාගේ සියලු ඉහළ පෙළේ නායකත්ව ධූරයන්ගෙන් ඔහුව නෙරපා හරින ලදි.

ඩෙන් කිසි විටෙකත් රාජ්‍ය නායකයා, රජයේ ප්‍රධානියා හෝ කොමියුනිස්ට් පක්ෂයේ නායකයා ලෙස කටයුතු නොකළ නමුදු ඇතැම්හු ඔහු හැඳින්වූයේ සමාජවාදී දෘෂ්ටිවාදය නිදහස් ව්‍යවසාය සමඟ ඒකාබද්ධ කළ නව චින්තනයක "නිර්මාණ ශිල්පියා" ලෙසයි.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව

චීන කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකත්වය දැරූ හා චීනයේ ජනාධිපති ධූරය දැරූ ජනාධිපතිවරු අතරින් මාඕ සේතුං මහජන චීනය බිහි කළ නායකයා වන අතර ඩෙන් ෂියාඕපින් චීනය ගොඩනැගූ නායකයා ලෙස සැලකේ. ඩෙන් ෂියාඕපින් විසින් පවසනු ලැබුවේ, තමන්ගේ බලය ලෝකයට නොපෙන්වන ලෙසයි. එයට හේතු වූයේ නිසි ලෙස ශක්තිමත් වනතුරු චීනයේ ශක්තිය

ලෝකය දැනගත යුතු නොවේ යැයි ඔහු විශ්වාස කළ නිසාය. එය නිවැරදි තීරණයක් වූයේ චීනයේ ශක්තිය නිවැරදිව දැනගත්තේ නම් බටහිර ලෝකය ශක්තිමත් වෙමින් සිටින චීනය විනාශ කරන නිසාය. ඩෙන් ෂියාඔපින් රටෙහි නවීකරණ අංග හතරක් (Four Modernizations) හඳුන්වා දුන් අතර ඒවා නම් කර්මාන්ත, කෘෂිකර්මාන්ත, ආරක්ෂක සහ අධ්‍යාපනයයි. ඩෙන් චීනයේ දේශපාලන, ආර්ථික හා සමාජ ජීවිතයේ සෑම අංශයකම වැදගත් ප්‍රතිසංස්කරණ සැලසුම් කළේය.

**ආර්ථිකමය සේවාවන්**

බලයට පත්වීමෙන් පසු මොහුගෙන් සිදුවූ සුවිශේෂිතම සේවාව වන්නේ ආර්ථික ක්ෂේත්‍රයට සිදු කරන ලද සේවයයි. පසුගිය දශක තුන තුළ චීනයේ ආර්ථිකය ඉතා ඉහළ වේගයකින් දියුණුවට පත්විය. 1978 දී මේ සඳහා ඩෙන් ෂියාඔපින් විසින් තමාගේම විවිධ ආර්ථිකමය ප්‍රතිසංස්කරණ රාශියක් ගෙනාවේය. ඔහු විසින් ඇති කරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණ හා විවෘත ආර්ථික පිළිවෙත (Open Economic Policy) නිසා සීඝ්‍රයෙන් එරට ආර්ථිකය දියුණුවට පත් විය. ඔහු බොහෝ සාම්ප්‍රදායික කොමියුනිස්ට් මූලධර්මය අතහැර දමා, නිදහස් ව්‍යවසාය පද්ධතියේ අංග හා අනෙකුත් ප්‍රතිසංස්කරණ චීන ආර්ථිකයට ඇතුලත් කිරීමට උත්සාහ කළ අයෙක් විය. ඩෙන් ෂියාඔපින් ආර්ථික කටයුතුවල දී බටහිර රටවල් සමඟ සබඳතා පැවැත්වූ අතර චීන ව්‍යවසායකයන් විදේශ ආයෝජන සඳහා විවෘත කළේය.

1979 ජූලි මාසයේ දී ඩෙන්ගේ බලපෑම යටතේ මධ්‍යම රජය 'විශේෂ අපනයන කලාප' (Special Export Zones) පසුව "විශේෂ ආර්ථික කලාප" (Special Economic Zones) ලෙස නම් කිරීමට තීරණය කළේය. ෂෙන්ෂෙන් (Shenzhen), ෂුහායි (Zhuhai) සහ ගුවැන්ඩොං (Guangdong) පළාතේ ෂැන්ටෝ (Shanto) සහ ෆුජියන් (Fujian) යන නගරවල එම කලාප ඇති කළේය. මෙය චීනය බාහිර ලෝකයට විවෘත කිරීමේ ආරම්භය සනිටුහන් කළේය. එසේම ප්‍රතිසංස්කරණ ඇති කිරීමේදී විවිධ දේශපාලන ප්‍රතිරෝධතා ඇතිවන අතර ඒවා මගහැරීම උදෙසා විවිධ පියවර අනුගමනය කරන ලදී. තවද ප්‍රතිසංස්කරණ ඇති කිරීමේදී චීනය මඟින් ප්‍රායෝගිතාවාදය (Pragmatism) බිහි කළ අතර එය රටෙහි

විශේෂිත ආයතන බිහි වීමට ඉඩ සලසා දී ඇති අතර සියලු සංක්‍රාන්ති ආයතනවල (Transitional Institution) සැලසුම්සහගත ආර්ථිකයක් වර්ධනය වීම සඳහා ද්විත්ව ධාවන පථ ක්‍රමය (The Dual Track System) ප්‍රමුඛ විය. එය ප්‍රතිසංස්කරණය සැලසුම් සහගතව අඛණ්ඩ මිලකට පවත්වාගෙන යාමට ඉඩ දුන් අතර එමගින් චීනයේ නිෂ්පාදනය බිඳ වැටීම වලක්වා ගැනීමට ද දායක විය. මේ සඳහා හොඳම උදාහරණය ලෙස, (Township and Village Enterprise-TVE) ක්‍රමය හඳුන්වා දිය හැක.

1992 ඔක්තෝම්බර් මාසයේ ජාතික සම්මේලනයේදී සමාජවාදී වෙළඳපොල ආර්ථික ක්‍රමයක් (Social Market Economic System) ස්ථාපිත කිරීම ආර්ථික ප්‍රතිසංස්කරණවල ඉලක්කය වී ඇත. ජාතික සම්මේලනයේ තුන්වන පූර්ණ සැසියේදී, තවදුරටත් වෙළඳපොළ අරමුණු කරගත් ප්‍රතිසංසකරණ සඳහා සැලසුම් සකස් කෙරිණි. 1991 සිට මේ දක්වා විශාල වැදගත්කමක් ඇති ප්‍රතිසංස්කරණ ක්ෂේත්‍ර හයක් මෙම උපාය මාර්ගය මගින් ක්‍රියාවට නංවා ඇත. ඒවා නම්,

- චීනයේ ඉතිහාසය තුළ, ප්‍රථම වතාවට රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ (Fiscal Reforms) හඳුන්වා දුන්නේ "තථ්‍ය මූල්‍ය ෆෙඩරල්වාදය" (Facto Fiscal Federalism) එනම්, ආදායම්-වියදම් ගැලපීම යන මූලධර්මය යටතේ ය. එය ප්‍රධාන වශයෙන් සංලක්ෂිත වන්නේ මධ්‍යම බදු, දේශීය බදු සහ මධ්‍යම-දේශීය බෙදා ගැනීමේ බදු ඇතුළු ක්‍රම හඳුන්වාදීම මගින් ය.

- මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ ලෙස, (Reforms in Financial Sector) 1978 ට පෙර, චීනයේ එකම බැංකුව ලෙස, මහජන චීන බැංකුව (PBC-People's Bank of China) එකවර කාර්යභාරයන් දෙකක් ඉටු කරමින් සිටියේය. එනම්, මහ බැංකුව සහ ව්‍යාපාරික බැංකුව ලෙසිනි. 1978 සිට, ප්‍රතිසංස්කරණ රැළි තුනකට පසු, මහජන චීන බැංකුව (PBC) මුදල් ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වන එකම මූල්‍ය අධිකාරියක් බවට පත් කර ඇත. ව්‍යාපාරික බැංකු, ප්‍රතිපත්ති බැංකු,

ආයෝජන බැංකු හා රක්ෂණ සමාගම් යනාදියෙන් සමන්විත නවීන මූල්‍ය අංශයක් බිහිකර ඇත. මේ අතර, ප්‍රාග්ධනය, මූල්‍ය, විදේශ විනිමය සහ රන් වෙළෙඳපොළ මතුවීමත් සමඟ මූල්‍ය වෙළෙඳපොළ වර්ධනය වී තිබේ.

- චීනයේ විනිමය අනුපාත ප්‍රතිසංස්කරණ (Exchange Rate Reforms); විදේශ වෙළඳාම, මූල්‍ය, නියාමනය සහ කළු කඩ වෙළඳපොල යන අංශ හතර යටතේ විශාල වෙනස්කම් ඇති කිරීමට සමත් විය. 1994 දී චීනය ඉහත එකිනෙකට වෙනස් අංශ හතර ඒකාබද්ධ කිරීමෙන් පසු කළමනාකරණය කර පාවෙන විනිමය අනුපාත ක්‍රමයක් (Floating Exchange Rate Reforms) අනුගමනය කිරීමට පටන් ගත්තේය.

- මූල්‍ය හා මූල්‍ය ප්‍රතිසංස්කරණවල (Fiscal and Financial Reforms) පදනම මත වෙළඳපොළ පදනම් කරගත් සාර්ව විචක්ෂණ පද්ධතියක් (Macro Prudential System) ස්ථාපිත කර ඇත.

- 1980 දශකයේ සිට පරිභෝජන භාණ්ඩ වෙළඳපොළ, ප්‍රාග්ධන භාණ්ඩ වෙළඳපොළ, සහ 1994 දී මූල්‍ය අංශය තුළ පෞද්ගලික ආයෝජන සඳහා අනුමැතිය ලබා දී ඇත.

- රජයේ කාර්යයන් පරිවර්තනය කිරීම සහ නීති පද්ධතිය ඉදිකිරීම ප්‍රවර්ධනය කිරීම.

මෙම ක්ෂේත්‍රයන් තුළ ඇති කරනු ලැබූ ප්‍රතිසංස්කරණ මඟින් චීනයේ ආර්ථිකය වේගවත් ලෙස වර්ධනය වීමකට ලක්විය.

**1980 සිට 2015 දක්වා චීනයේ දළ දේශීය නිශ්පාදිතයේ (China's GDP) විචල්‍යතා 0% උද්ධමනය සකස් කර ඇත.**





*(මූලාශ්‍රය :- National Bureau of Statistics of China)*

තවද ඔහු රටෙහි ආර්ථික දිරිගැන්වීම් කටයුතු උදෙසා හා ආර්ථික සංවර්ධන කටයුතු සඳහා විවිධ වූ ක්‍රමෝපායන් භාවිතා කළේය. ඒ අතර ගවේෂණයේ දක්ෂ තාක්ෂණික හා කළමනාකරණ ශිල්පීන් බිහි කිරීම වැදගත් වේ. ඩෙන් ෂියාඕපින් කාර්යක්ෂම ආර්ථික වර්ධනයක් ළඟා කරගැනීම සඳහා 'විමධ්‍යගත ආර්ථික කළමනාකරණය' (Decentralized Economic Management) නම් ක්‍රියාපිළිවෙත මෙන්ම තාර්කික, දිගුකාලීන සහ කාලෝචිත සැලසුම් ආරම්භ කළේය. ඩෙන් ෂියාඕපින් වසර හැත්තෑවක් ඇතුළත චීනයේ ආර්ථික සංවර්ධන උපාය මාර්ගයකට සුදුසු පියවර තුනක් ඉදිරිපත් කළ අතර ඔහු එය ඉදිරියට ගෙන ඒමට කටයුතු කළේය. ඉන් පළමුවැන්න නම් 1980 දශකයේ දළ ජාතික නිෂ්පාදිතය දෙගුණ කිරීම හා ජනතාවට ප්‍රමාණවත් ආහාර ඇති බව සහතික කිරීමයි. එය 1980 දශකයේ අගභාගය වන විට අත්පත් කර ගන්නා ලදී. දෙවැන්න 20 වන සියවස අවසන් වන විට 1980 පැවති දළ ජාතික නිෂ්පාදිතය නැවත සීඝ්‍රයෙන් වැඩි කිරීමයි. එය 1995 දී නියමිත කාලයටත් පෙර අත්පත් කරගන්නා ලදී. තුන්වැන්න නම් 2050 වන විට දළ ජාතික නිෂ්පාදිතය මධ්‍යම සංවර්ධිත රටවල

මට්ටමට ඉහළ නැංවීමයි. මෙය සාර්ථක ක්‍රියාපිළිවෙතක් වී ඇති අයුරු අද වන විට ලෝකයටම පසක් වූ කරුණකි.

**චීනයේ කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා යන අංශයන්ගේ විචල්‍යතා**




*(මූලාශ්‍රය :- World Development Indicators, April 2013, World Bank)*

තවද ඩෙන් ෂියාඕපින් කෘෂිකාර්මික නිෂ්පාදනය විශාල වශයෙන් ඉහළ නැංවීමට හේතු වූ ප්‍රතිපත්ති රාශියක් හඳුන්වා දුන්නේය. මිලියන ගණනක් මිය ගිය 1961 මහා සාගතයෙන් දිවි ගලවා ගත් ඩෙන්, ඉඩම් ක්‍රමය ප්‍රතිසංස්කරණය කර කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කළේය. ඔහු ගොවීන්ගේ ඉඩම් බදු දීර්ඝ කළ අතර, ඔවුන් ගෙවිය යුතු ප්‍රමාණයට වඩා ඉහළින් වගා කරන ඕනෑම ධාන්‍යයකින් ලාභ ලබා ගැනීමට ඔවුන් දිරිමත් කළේය. "හරිත විප්ලවයේ" (The Green Revolution) ඵලදායීම නවෝත්පාදනයන් අනුගමනය කරමින් ඉහළ අස්වැන්නක් සහිත ධාන්‍ය වර්ග සහ කෘතීම පොහොර වර්ග ඔහු හඳුන්වා දුන්නේය. ඒ අතරම ගොවීන් හට ඔවුන්ගේ නිෂ්පාදන හා ලාභය පිළිබඳ තනි පාලනය හා වගකීම ලබා දෙන ලදී. බොහෝ කාර්මික ව්‍යවසායන් මධ්‍යම රජයේ පාලනයෙන් හා අධීක්ෂණයෙන් නිදහස් කළ අතර නිෂ්පාදන මට්ටම් තීරණය කිරිමට ද ඔවුන්ගේ ව්‍යාපාර සඳහා ලාභ ලබාගැනීමට කර්මාන්තශාලා

කළමණාකරුවන්ටම බලය පැවරීය. මෙම ක්‍රියාමාර්ගය එරට ආර්ථිකය ශක්තිමත් කිරීමට මනා පිටිවහලක් විය. එසේම ඩෙන් ආර්ථික ප්‍රතිපත්ති මගින් විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම උදෙසා නවීන තාක්ෂණයන් පිළිබඳව විදේශයන්හි සිසුන් දැනුවත් කිරීම මෙන්ම ඒ සඳහා චීනය ලොවටම විවෘත කිරීම සිදුකළේය. ඔහුගේ නායකත්වය යටතේ චීනය සංවර්ධිත රටක් බවට පත් කිරීම සඳහා නිදහස් වෙළෙඳපොළ යාන්ත්‍රණයක් ඇති කිරීමට ඔහු විසින් කල සේවාව ප්‍රශංසනීය වේ.

**දේශපාලනික සේවාවන්**

ඩෙන් ෂියාඕපින් දේශපාලනික වශයෙන් චීනයට කළ සේවාව ආර්ථිකමය වශයෙන් සිදු කළ සේවාව මෙන් ඉතාමත් වැදගත් වේ. එසේම ඩෙන් උසස් දේශපාලන කුසලතාවලින් පරිපූර්ණ අයෙක් වූ අතර චීනයට කාලෝචිත, දේශීය හා විදේශීය කටයුතුවල ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදනය කළ අයෙක්ද විය. ඩෙන් ප්‍රායෝගිතාවාදය කෙරෙහි නැඹුරු වූ අයෙක් වූ අතර එයම ඔහු මාක්ස්-ලෙනින්වාදියෙකු ලෙස නිරූපනය කිරීමට හේතු විය. මාක්ස්-ලෙනින්වාදීන්, කෙසේ වෙතත් ප්‍රායෝගික විය යුතු ව තිබුණද, ඔවුන් මෙන් නොව ඩෙන් විශ්වාසය තැබුවේ යමක ප්‍රායෝගිකතාව නැතහොත් යමක් නිසැකයෙන්ම ක්‍රියාවට නැංවිය හැකි ආකාරය පිලිබදවයි. ඔහු පලාත් පාලන ආයතන වෙත බලය විමධ්‍යගත කිරීම සිදු කළේය. ඒ තුළින් ආයෝජන අනුමත කිරීම්, රාජ්‍ය මූල්‍ය සම්පාදන ප්‍රතිපත්ති පිළිබඳ වැඩි බලයක් පළාත් පාලන ආයතන වලට ලැබුණි.

තවද ඔහු අටවන මාර්ග හමුදාවේ 129 වන සේනාංකයේ දේශපාලනික කොමසාරිස් ලෙස වැඩ භාර ගෙන මහඟු කාර්යභාර්යයක් සිදු කළේය. ඔහු විප්ලවවාදී ප්‍රවීණයකු ලෙස සලකනු ලැබූ අතර එයට හේතුව වූයේ ඔහු සිය ගණනක් වූ රෙජිමේන්තුවේ සිය සගයන් අතර ඔහුගේ ස්ථාවරත්වය ඉහළ නැංවූ නිසාවෙන් පමණක්ම නොව ඒ සඳහා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකළ නිසාවෙනි.

යුද්ධයේ අවසාන අදියරේදී දෙවන ක්ෂේත්‍ර හමුදාවේ දේශපාලන කොමසාරිස් ලෙස හා ප්‍රචාරක ප්‍රධානියා ලෙස ඔහු ප්‍රධාන භූමිකාවක් ඉටු කළේය. ජාතිකවාදීන්ට එරෙහිව හුආයිහායි (Huaihai) ව්‍යාපාරයේදී ද විශාල

කාර්යභාරයක් ඉටු කළේය. එසේම ඩෙන් ෂියාඕපින්ගේ පාලන සමයේ දී දේශපාලනික ප්‍රගතියක් දැකගත හැකි වූ අතර තරඟකාරී මැතිවරණ ප්‍රාදේශීය වශයෙනුත් ඇති කිරීම වැදගත් කරුණකි. දිගුකාලීන පළපුරුද්ද හා දේශපාලනික හැකියාවන් උපයෝගී කරගනිමින් ඩෙන් චීනයට දේශපාලනික වශයෙන් විශාල සේවාවක් ඉටු කරන ලදි.

**සමාජීය සේවාවන්**

ඩෙන් ෂියාඕපින් විසින් කළ සමාජ ජීවිතයට අදාළ ප්‍රතිසංස්කරණ අතුරින් වැදගත්ම සමාජ ප්‍රතිසංස්කරණය වූයේ චීනයේ වේගයෙන් වර්ධනය වන ජනගහනය පාලනය කිරීම සඳහා ලෝකයේ වඩාත්ම දැඩි පවුල් සැලසුම් ක්‍රමයක් යටතේ දියත් කළ වැඩසටහනක් වන “එක් දරු ප්‍රතිපත්තිය” (The One Child Policy) ක්‍රියාවට නැංවීමයි. එය එවකට චීනයේ අධික ජනගහන අර්බුදයට සාර්ථක විසඳුමක් ලෙස ඩෙන් ෂියාඕපින් හඳුන්වා දෙන ලදී. තවද ඔහු චීනයේ විශ්වවිද්‍යාල ප්‍රවේශ නැවත ආරම්භ කළේය. එසේම ඔහු රටෙහි දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ නිතර අවධානය යොමු කළ නායකයෙක් වූ අතර වසර නවයක අධ්‍යාපනය අනිවාර්ය කරවීය. එය එරටෙහි සාක්ෂරතාවය වර්ධනයෙහි ලා මහෝපකාරී විය. එසේම ඔහු විද්‍යාව හා තාක්ෂණය සඳහා 863 (The 863 program) නම් වැඩසටහන දීප ව්‍යාප්තව දියත් කළේය. තවද නව විශ්වවිද්‍යාල විවෘත කිරීම සිදු කිරීම අධ්‍යාපනික අංශයෙන් ඔහු කළ වැදගත් මෙහෙවරක් ලෙස දැක්විය හැකිය. එසේම ඩෙන් විසින් තම රටේ සිසුන් තාක්ෂණික පුහුණුව හා වැඩිදුර අධ්‍යාපනය සඳහා විදේශගත කරවනු ලැබීය. පසුකාලීනව එය රටෙහි දියුණු අනාගතයට සෘජු ලෙස බලපෑ කරුණක් විය.

ඔහු සමාජීය වශයෙන් විශාල සේවයක් කළ අතර අවසන් වරට ජීවිතයෙන් සමුදෙන මොහොතේදී තම ශරීරයේ අවයව දන් දීමට පවා පරිත්‍යාගශීලී විය.



*(11 වන ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මධ්‍යම කාරක සභාවේ තුන්වන පූර්ණ සැසියේදී ඩෙන් ෂියාඕපින් (1978))*

## විදේශ ප්‍රතිපත්තිය

ඩෙන් ෂියාඕපින් යටතේ චීනය හැඩගස්වා ඇත්තේ ‘hide your ambitions and disguise your claws’ යන අදහස පෙරදැරිකොට ගෙනය. චීනය සිය ශක්තිය, ආර්ථික වශයෙන් වඩාත් සංවර්ධනය වීම සඳහා කැප කල යුතු බව ඩෙන් ෂියාඕපින්ගේ අදහස විය. එසේ වුවද ඩෙන් ෂියාඕපින්, රුසියාව, ජපානය හා දකුනු කොරියාව සමග සබඳතා වැඩිදියුනු කළේය. 1974 දී, මොහු එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයට සහභාගී වීම සඳහා නිව්යෝර්ක් බලා ගියේය. ඔහු, 1926 දී පැරිසියෙන් පිටත්ව ගිය පසු බටහිර සංචාරයකට ගිය පලමු අවස්ථාව මෙයයි.

1979 දී, ඩෙන් එක්සත් ජනපදයට ගිය පලමු චීන නායකයා බවට පත්විය. මෙම වසරේදීම, මහජන චීන ජනරජය සහ එක්සත් ජනපදය අතර විධිමත් රාජ්‍ය තාන්ත්‍රික පිළිගැනීමක් සිදු විය. ඩෙන් ෂියාඕපින් 1978 දී චීනය ලොවට විවෘත කිරීමේ ක්‍රියාවලිය සඳහා ප්‍රතිසංස්කරණ ගෙන ආ අතර 'චීන සිහිනය' (Chinese Dream) සඳහා අවශ්‍ය වේදිකාව එමගින් සැකසීය. මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ වාසි හා සාර්ථකත්වය ඉදිරියට ගෙන යමින් ෂී ජින්පින් (Xi Jinping) විසින් 'චීන සිහිනය' යන යෙදුම භාවිතා කරන ලදී. අත්‍යවශ්‍යයෙන්ම, එය "චීන ජාතිය විශාල වශයෙන් නවීකරණය කිරීම" යන අරමුණ ඉලක්ක කර ගත් අතර එය ගොඩබිම් සේද මාවත සහ සමුද්‍ර සේද මාවත (One Belt One Road and Silk Road ) ලෙස බෙදා ඇත.

'චීනය වෙත එක්සත් ජනපද හැරීම' (US pivot to China), වොෂිංටන්-බීජිං ද්විපාර්ශ්වික සබදතාවේ නව අදියරක් ඇරඹීය. ලෝක දේශපාලනයේ ආධිපත්‍යයට ඩෙන් ෂියාඕපින් විරුද්ධ විය. ෂී ජින් පින්ගේ විදේශ ප්‍රතිපත්තියට ඩෙන් ෂියාඕපින්ගේ ප්‍රතිපත්තියේ අභාසයක් ඇත. කෙසේ වෙතත්, යම් යම් වෙනස් කිරීම් ද කාලෝචිතව සිදුව ඇති බව පෙනේ. මෙයට හේතුව, අද චීනය ක්‍රියාත්මක වන්නේ ඩෙන්ගේ යුගයේ පැවති තත්ත්වයට වඩා බෙහෙවින් වෙනස් වූ දේශපාලනික පරිසරයක වීමයි. ෂී වෙනත් නායකයෙකුට වඩා පරමාදර්ශයක් ලෙස සළකමින් ඩෙන්ගේ ප්‍රතිපත්තිමය උරුමය අනුගමනය කරන බව පෙනේ. 1977 මුල් භාගයේදී ඩෙන් බලයට පත්වීමෙන් පසු, එක්සත් ජනපද ජනාධිපති ජිමී කාටර් (Jimmy Carter) සිය රාජ්‍ය ලේකම් වැන්ස් (Cyrus Roberts Vance) සහ ඔහුගේ ධවල මන්දිරයේ ජාතික ආරක්ෂක සහකාර ස්බිග්නිව් බ්‍රෙසින්ස්කි (Zbigniew Brzezinski) පිළිවෙලින් 1977 අගෝස්තු සහ 1978 මැයි මාසවලදී චීනයට ගොස් චීන-එක්සත් ජනපද සබඳතා සාමාන්‍යකරණය කිරීම පිළිබඳ සාකච්ඡා පැවැත්වූහ. 1978 දෙසැම්බර් 16 දින සවස මහජන චීන සමූහාණ්ඩුව සහ ඇමරිකා එක්සත් ජනපදය අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇති කිරීම පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කළහ. චීනය සහ එක්සත් ජනපදය එකිනෙකා හඳුනාගෙන 1979 ජනවාරි පළමුවනදා වන විට රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇති කර ගනිමින් තානාපතිවරුන් හුවමාරු කර මාර්තු පළමුවනදා සිට තානාපති කාර්යාලය පිහිටුවීය. දෙරට අතර අන්‍යෝන්‍ය අවබෝධය වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ සබඳතා වර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා උප අගමැති ඩෙන් ෂියාඕපින් 1979 ජනවාරි 29 සිට පෙබරවාරි දක්වා ජනාධිපති කාටර්ගේ ආරාධනයෙන් එක්සත් ජනපදයට ගොස් නිල සුබ පැතුම් එක් කළේය.

මෙය මහජන චීන සමූහාණ්ඩුව පිහිටුවීමෙන් පසු චීන නායකයෙකු එක්සත් ජනපදයට කළ පළමු සංචාරය විය. එක්සත් ජනපද රජය සහ ජනතාව විසින් ඔහු සාදරයෙන් පිළිගනු ලැබීය. මෙම සංචාරයේදී දෙපාර්ශවයම විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාව පිළිබඳ ගිවිසුමක් සහ සංස්කෘතික ගිවිසුමක් අත්සන් කළහ.



*(ධවල මන්දිරයට ඩෙන් පැමිණීමේ උත්සවයක් අතරතුර ඩෙන් සහ ජනාධිපති ජිමී කාටර් (1979))*

දේශපාලන නොසන්සුන්තාවයෙන් පසු රට ස්ථාවර වූ 1978 නොවැම්බර් මාසයේදී ඩෙන් බැංකොක්, ක්වාලාලම්පූර් සහ සිංගප්පූරුවට සංචාරයක නිරත වූ අතර සිංගප්පූරුවේ අගමැති ලී ක්වාන් යූ (Lee Kuan Yew) හමුවිය. සිංගප්පූරුවේ ආර්ථික සංවර්ධනය, යටිතල පහසුකම් සහ පාරිසරික අංග පිළිබඳව ද ඩෙන් තුළ ඉතා පැහැදිලි දැක්මක් වූ අතර පසුව ඔවුන්ගේ අත්දැකීම් වලින් ඉගෙන ගැනීමට සහ ඔවුන්ගේ දැනුම නැවත ගෙන ඒමට චීන ජාතිකයන් දස දහස් ගණනක් සිංගප්පූරුවට සහ ලොව පුරා රටවලට යවා ඇත. අනෙක් අතට ලී ක්වාන් යූ අග්නිදිග ආසියාවට කොමියුනිස්ට් මතවාද ප්‍රචාරය කිරීම නවත්වන ලෙස ඩෙන්ට උපදෙස් දුන්නේය.

1978 දී, ඩෙන්ගේ සිංගප්පූරු සංචාරය පළමු හා එකම සිංගප්පූරු නිල සංචාරය විය. තායිලන්තය-මැලේසියාවද ඇතුලුව අග්නිදිග ආසියාවේ (Southeast Asia) යන ත්‍රිත්ව සංචාරයේ අවසාන නැවතුම ද මෙම වර්ෂයේදීම සිදුවිය. මෙම සිංගප්පූරු සංචාරයේදී එනම්, 1978 නොවැම්බර් 12 වන දින ඩෙන් හා 36 දෙනෙකුගෙන් යුක්ත දූත පිරිස එවකට සිංගප්පූරු අගමැති ලී ක්වාන් යූ සමග දෙරට අතර ප්‍රථම රැස්වීම පවත්වන ලදී. චීන හා සිංගප්පූරු රාජ්‍යයන් දින දෙකක් පුරා පැය පහහමාරක කාලයක් පුරා පැවති සාකච්ඡාවේදී වියට්නාමය සමග ඇති සන්ධානය පිළිබදව ද සාකච්ඡා කර ඇත.

මොහුගේ විදේශ ප්‍රත්පත්තිය පිළිබදව සාකච්ඡා කිරීමේදී 1978 වර්ෂය ඉතා වැදගත් වර්ෂයක් වේ. ඒ මෙම වසරේදී ඩෙන් සිංගප්පූරු හා ජපන් නිල සංචාරයන් ආරම්භ කිරීම නිසයි. ඒ අනුව 1978 නොවැම්බර් 22 ජපන් රජයේ ආරාධනයෙන් ජපානයට ගිය අතර ඔක්තෝබර් 23 වන දින ඔහු චීන-ජපන්

සාම මිත්‍රත්ව ගිවිසුමකට අත්සන් තැබීය. දින අටක ජපන් සංචාරයේදී ඩෙන්, ජපන් අධිරාජයෙකු වූ හිරෝහිතෝ ද (Japanese Emperor Hirohito) මුණ ගැසුනි.

ජපන් අගමැති විසින් සංවිධානය කරන ලද පිළිගැනීමේ රාත්‍රී භෝජන සංග්‍රහයකට සහභාගී වූ ඩෙන් ප්‍රකාශ කර සිටියේ මෙම නිල සංචාරය දෙරට අතර ද්වි-පාර්ශවික සබඳතාවල ඉතිහාසයට නව පරිච්ඡේදයක් එක් කල බවයි. 1978 වර්ෂය මොහුගේ ධූර කාලයේ නැවුම් ඇරඹුමක් සනිටුහන් කළ වර්ෂයක් වන්නේ  ඩෙන් ප්‍රථම හා එකම නිල සිංගප්පූරු සංචාරයට සහභාගී වීමත්, ජපානයට ගිය පළමු චීන රාජ්‍යය  නායකයා මොහු  වීමත් යන හේතූන් නිසාවෙනි

ඩෙන් ෂියාඕපින් කොමියුනිස්ට් පාලනය ක්‍රම ක්‍රමයෙන් විසුරුවා හරින ලද අතර එමගින් ගොවීන්ට තමන් වගා කළ ඉඩම් කළමනාකරණය කිරීමට සහ ඔවුන්ගේ නිෂ්පාදන වෙළඳපොලේ විකිණීමට වැඩි නිදහසක් ලැබුණි. ඒ සමගම චීනයේ ආර්ථිකය විදේශ වෙළඳාමට විවෘත විය. 1979 ජනවාරි පළමුවෙනිදා එක්සත් ජනපදය මහජන චීන සමූහාණ්ඩුව සමග රාජතාන්ත්‍රික සම්බන්ධතා නිල වශයෙන් ආරම්භ කළ අතර මේ අනුව චීනය හා බටහිර රටවල් අතර ව්‍යාපාරික සම්බන්ධතා වර්ධනය වීමට පටන් ගත්තේය. එහි ප්‍රතිපලයක් ලෙස, කොකා කෝලා (coca-cola) නම් බීම සමාගම සඳහා ෂැංහයි (Shangahai) හි නිෂ්පාදන කම්හලක් විවෘත කිරීමට ද ඩෙන් අදහස් කළේය.

1979 මුල් භාගයේදී ඩෙන් එක්සත් ජනපදයේ නිල සංචාරයක් කළ අතර වොෂිංටන්හිදී ජනාධිපති ජිමී කාටර් සහ කොන්ග්‍රස් සභිකයින් කිහිප දෙනෙකු හමුවිය. මෙම සංචාරයේදී ඩෙන් පිළිවෙලින් හූස්ටන්හි (Houston) ජොන්සන් අභ්‍යවකාශ මධ්‍යස්ථානයට (Johnson Space Center) මෙන්ම ඇට්ලන්ටා (Atlanta) සහ සියැටල්හි (Seattle) කොකාකෝලා සහ බෝයිං (Boeing) මූලස්ථානයටද ගියේය. මෙම සංචාරයන්ගේ වැදගත්කම නිසාම නව චීනයේ ප්‍රමුඛතාව ආර්ථික හා තාක්ෂණික සංවර්ධනය බව ඩෙන් පසක් කළේය.

එමෙන්ම, 1984 ජපානයේ අගමැති වූ යසුහිරෝ නැකසෝන් (Yasuhiro Nakasone) චීන සංචාරයක නිරත විය. ඔහු චීන නායක ඩෙන් සමග සමුළුවක් ද මෙහිදී පැවැත්වූ අතර මෙම සංචාරය දෙරට අතර සබඳතාවල හැරවුම් ලක්ෂයක් විය. මෙහිදී චීන-ජපන් මිත්‍රත්ව ගිවිසුමක් අත්සන් කළ අතර එමගින් දෙරට අතර දේශපාලන සම්බන්ධතාවය පමණක් නොව ආර්ථික සහයෝගිතාවයද වර්ධනය විය. 80 දශකයේ චීන විදේශ ප්‍රතිපත්තිය තුළ කැපීපෙනෙන වෙනසක් පෙන්නුම් කළේය. වේගවත් චීන ආර්ථික වර්ධනය ලොව පුරා නිෂ්පාදිතයේ වර්ධනයට සැලකිය යුතු ලෙස දායක වී ඇති අතර චීනය ධනවාදී යන්ත්‍රයක් ලෙස පෙනෙන්නට පෙළඹී ඇත. ඩෙන් විසින් මෙහෙයවන ලද ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ගෝලීය ආර්ථිකය හා දේශපාලනයට වඩා චීන ආර්ථිකයේ ප්‍රමුඛතාවය කෙරෙහි අවධානය යොමු කර ඇත. චීන-ජපන් සබඳතා ද සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. ආර්ථිකමය වශයෙන් චීනයට හොඳ ආදර්ශයක් ලෙස ඩෙන් ජපානය භාවිතා කළේය.

චීනයේ වැදගත්ම විදේශ ප්‍රතිපත්තිය ආරම්භ වන්නේ ඩෙන්ගේ කාලයේ දී චීන ආර්ථිකය ලෝකයට විවෘත කිරීමත් සමගයි. මේ හේතුව මුල් කර කරගනිමින් චීනය තවතවත් ඇමරිකා එක්සත් ජනපදය සමග විදේශ සම්බන්ධතා ඇතිකර ගත් අතර එමගින් චීනයේ වෙළඳ පද්ධතිය සියලු රටවලට එක හා සමානව විවෘත විය. මෙම ප්‍රතිපත්තිය යටතේ කිසිවෙකුට නිශ්චිත ප්‍රදේශයක සුවිශේෂී වෙළඳ අයිතිවාසිකම් නොමැත.

20 වන ශතවර්ෂයේ අගභාගයේදී, Open door policy යන යෙදුම මගින් රට තුළ ආයෝජනය කිරීමට අවශ්‍ය විදේශීය ව්‍යාපාර සඳහා චීනය විවෘත කිරීම සඳහා 1978 දී ඩෙන් ෂියාඕපින් විසින් ආරම්භ කරන ලද ආර්ථික ප්‍රතිපත්තිය ලෙසද මෙය විස්තර කළ හැක. මෙම ප්‍රතිපත්තිය පසුකාලීනව නූතන චීනයේ ආර්ථික පරිවර්තනයට මුල පිරීය.

දෙවන වරට උතුරු කොරියාව විසින් දකුණු කොරියාව ආක්‍රමණයට සැරසෙන අවස්ථාවේදී, ඩෙන් ෂියාඕපින් එම ආක්‍රමණය කිරීමට විරුද්ධ විය. යානෝ (Yano) නම් විද්වතාගේ ලේඛන වලට අනුව ඩෙන් කොරියානු අර්ධද්වීපයේ ගැටළු පිළිබඳව විශාල උනන්දුවක් දක්වා ඇත. එමෙන්ම උතුරු කොරියාවෙන්

යම් හෙයකින් දකුණු කොරියාවට ප්‍රහාරයක් එල්ල කළහොත් උතුරු කොරියාවට චීන සහය නොලැබෙන බවද ඩෙන් ප්‍රකාශ කර ඇත. උතුරු කොරියාව හා චීනය අතර රාජතාන්ත්‍රික සබදතා ඩෙන්ගේ පාලන සමයේ දී වර්ධනය වී ඇත. ඩෙන් මෙලෙස උතුරු කොරියාව සමග පවත්වාගෙන ගිය සබදතා හේතුවෙන් උතුරු කොරියාවේ විශාලතම වෙළඳ හවුල්කරුවා බවට චීනය පත් විය. 1990 දශකයේ දී උතුරු කොරියාව ආර්ථික වශයෙන් චීනය මත බෙහෙවින් රඳා පැවතුන අතර පාලන තන්ත්‍රයේ පැවැත්ම සහතික කිරීම සඳහා චීනයෙන් අවශ්‍ය ආධාර ලබා ගැනීමට එය සමත් විය.

## වියට්නාම දේශ සීමා අර්බුදය (1979-1991)

මෙය 1979 චීන යුද්ධයෙන් පසුව චීන සමූහාණ්ඩුව හා වියට්නාම සමාජවාදී ජනරජය අතර ඇති වූ දේශසීමා හා නාවික ගැටුම් මාලාවක් විය. මෙම ගැටුම් 1991 වර්ෂය දක්වාම පැවතිණි. ගැටුමෙන් අනතුරුව චීන හමුදා වර්ග කිලෝමීටර 60ක් එනම් වර්ග සැතපුම් 23ක භූමි ප්‍රදේශයක් අත්පත් කරගත් අතර මෙම ගැටුම් ඇතිවීමට පෙර වියට්නාමය විසින් පාලනය කළ ප්‍රදේශවල පාලනය හා ඉඩම් පිළිබදව මතභේද ඇති විය. මෙම ගැටුම 1988 දක්වා පැවතුන අතර 1984-1985 යන කාලය අතරතුර ගැටුම උද්ගත විය. 1990 දශකයේ මුල් භාගය වන විට වියට්නාමය කාම්බෝජයෙන් ඉවත්වීම සහ සෝවියට් සංගමය විසුරුවා හැරීමත් සමග දෙරට අතර සම්බන්ධතාවය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්විය. 1991 වන විට දෙරට අතර රාජ්‍ය සබදතා යථා තත්ත්වයට පත් කිරීම නිල වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති අතර එමගින් දේශසීමා ගැටුම් අවසන් විය.

1990 දශකයේ මැද භාගයේ සිට විශේෂයෙන් 1995-1996 තායිවාන් සමුද්‍ර සන්ධියේ අර්බුධයෙන් පසුව චීනය ජාත්‍යන්තරය සමඟ උපායමාර්ගිකව හවුල්කාරීත්වයක් ඇති කර ගනිමින් නව ජාත්‍යන්තර දේශපාලන හා ආර්ථික පිළිවෙල ස්ථාපිත කිරීමේ වේගය ප්‍රවර්ධනය කර තිබේ. ඩෙන් ඔහුගේ විදේශ ප්‍රතිපත්තිය ගෙන යාමේදී ප්‍රකාශ කර ඇත්තේ, චීනය සෑම විටම තුන්වන ලෝකයේ රටවල් සමඟ අත්වැල් බැදගනු ඇත. නමුත් කිසිවිටෙකත් ඔවුන්

කෙරෙහි ආධිපත්‍යය පතුරුවන්නේ හෝ ඔවුන්ගේ නායකයා ලෙස කටයුතු නොකරන බවයි.

1989 දී ටියානාන්මෙන් චතුරස්‍රයේ (Tiananmen Square) වැඩි දේශපාලන නිදහසක් ඉල්ලමින් ශිෂ්‍ය නායකත්වයෙන් යුතු විරෝධතාවයක් පැවැත්වුනු අතර මෙම සිද්ධි සමුදායන්ගෙන් ඇතිවූ කලකිරීම හේතුවෙන් ඩෙන් ෂියාඕපින් තම සේවයෙන් හා නිල තනතුරෙන් ඉල්ලා අස් විය.

කෙසේ වුවත් වර්තමානය වන විට ලොව ප්‍රමුඛ බලවතුන් අතර සිටින රටක් වන චීනයටත් වර්තමාන ජනාධිපති ෂී ජින්පින්ටත් මේ ආකාරයට ජාත්‍යන්තර පද්ධතිය තුළ බලවතුන් ලෙස රඳා පැවතීමට මූලික අඩි අඩිතාලම සහ ශක්තිමත් පදනම බවට පත්වූයේ ඩෙන ෂියා ඕ පින් හා ඔහුගේ දූරදර්ශී ප්‍රතිපත්ති බව අවිවාදාත්මක කරුණකි.

## ගත හැකි ආදර්ශ

ඩෙන් ෂියාඕපින් නූතන චීනයේ නිර්මාපකයා ලෙස විරුදාවලිය ලත් කීර්තිමත් පුද්ගලයෙකි. පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණ තුළින් තිරසාර ආර්ථික වර්ධනයක් කරා චීනය මෙහෙයවූ අතර ඒ තුළින් ඔහු සතුව පැවැති දූරදක්නා නුවණ මනාවට පිළිබිඹු වේ. අද වන විටත් චීනය ඉහළ ආර්ථික අභිවෘද්ධියකට හිමිකම් කියනු ලබන්නේ මේ නිසාවෙනි. ඩෙන් ඉතා බුද්ධිමත් හා දැනුමින් පරිපූර්ණ මිනිසෙකි. එමනිසා ඔහු ජීවමාන විශ්ව කෝෂයක් ලෙස ද හඳුන්වනු ලැබේ. ප්‍රථම උපාධිය ලබා ගන්නා විට ඔහු වයස අවුරුදු 15ක තරම් කුඩා ළමයෙකි.

ඩෙන් සතුව පවතින හැකියාව හා විශේෂඥතාව ඉතා ඉහළ විය. 1973 වර්ෂයේ උප අගමැතිවරයා ලෙස පත් වීමෙන් පසු ඔහු ඉතා ඉක්මනින් කාර්යයන් රැසක් තමා වෙත පවරා ගැණුනි. ඩෙන් කිසිවිටෙකත් රාජ්‍ය නායකයා, රාජ්‍ය ප්‍රධානියා හෝ කොමියුනිස්ට් පක්ෂයේ නායකයා ලෙස කටයුතු නොකළේය. එමගින් ඔහුගේ නිහතමානිත්වය පිළිඹිබුවේ.

විසිඑක්වන සියවසේ මහා බලවතෙකු ලෙස චීනය අද වන විට හිස ඔසවා ඇත්තේ ඩෙන්ගේ ස්ථානෝචිත ප්‍රඥාව හේතුවෙනි. විවෘත ආර්ථිකය ඇති

කිරීමෙන් සිය දහස් ගණනක් දිළිඳු ජනයා ඔහු විසින් දිළිඳු බවින් මුදවා ගනු ලැබීය. ඔහුගේ මෙම තීරණය නොවන්නට අදත් චීනය දිළිඳු රටකි. සමාජයේ පවතින කියමනක් වන 'ඔබගේ මීළඟ පියවර රහසක්ව තබා ගන්න' යන්න පසක් කරමින් ඩෙන්ගෙ නිවැරදි තීරණ ගැනීමේ හැකියාව චීනය නව මාවතකට යොමු කළේය, නවමු බලාපොරොත්තු ඇති කළේය. එහිදී ඔහු කෘෂිකාර්මික, කර්මාන්ත, ආරක්ෂක සහ අධ්‍යාපන යන ක්ෂේත්‍ර වලට වැඩි නැඹුරුවක් දැක්වීය. ඔහු පැවසුවේ චීනය ශක්තිමත් වනතුරු එය ලෝකය දැනගත යුතු නැති බවයි.

ජීවිතයේ සෑම දෙයක්ම සැලසුම් සහගතව සිදු කළ යුතු බව පසක් කරමින් ඩෙන් බලයට පත්වීමත් සමඟ ආර්ථික ප්‍රතිසංස්කරණ සිදු කරන ලදි. එහිදී ඉදිරි දියුණුව, ආර්ථික වර්ධනය තකා ප්‍රතිසංස්කරණ සිදු කරන ලදි. තවද ආර්ථික දිරිගැන්වීම් කටයුතු උදෙසා විවිධ ක්‍රමෝපායන් භාවිත කළේය. එමෙන්ම මෙම ආර්ථික සැලසුම් දිගුකාලීන හා කාලෝචිත සැලසුම් වේ. මෙම ආර්ථික වර්ධනයක් අත්පත් කරගත් අවස්ථාවන් ලෙස 1980 දශකයේ ජාතික නිෂ්පාදනය දියුණු කිරීම හා ජනතාවට ප්‍රමාණවත් තරම් ආහාර ඇති බව තහවුරු කිරීම පළමුවැන්න වන අතර 1980 අග භාගය වන විට මෙය ද අත්පත් කරගන්නා ලදී. විසිවන සියවසේ අවසානය වන විට දේශීය නිෂ්පාදිතය සීඝ්‍රයෙන් වැඩිකිරීම දෙවැන්න වේ. එය 1995 දී නියමිත කාලයටත් පෙර අත්පත් කර ගන්නා ලදී.

මීට අමතරව ඔහු විසින් දියත් කරන ලද කාලෝචිත ප්‍රතිපත්ති චීනයේ සාර්ථකත්වයට මග පෑදුවකි. එහිදී කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නංවා ගැනීමට හේතු වූ ප්‍රතිපත්ති රාශියක් හඳුන්වා දුන්නේය. එයට අමතරව වර්තමාන ලෝක බලවතුන් සිටින රටක් වන චීනයටත් වර්තමාන ජනාධිපති වන ෂි ජින් පින්ටත් මේ ආකාරයට ජාත්‍යන්තර පද්ධතිය තුළ බලවතුන් ලෙස රඳා පැවතීමට මූලික අඩිතාලම ඩෙන් ෂියාඔපින් බව අවිවාදයෙන් පිළිගත යුතු කරුණකි. ඩෙන් විසින් ගෙන එන ලද එක්දරු ප්‍රතිපත්තිය මගින් චීනයේ ඉතා සීඝ්‍රයෙන් ඉහල යන ජනගහනයට සාර්ථක විසඳුමක් ලබා දුනි. එහිදී ඔහු සතුව පැවැති දූරදර්ශී බව ලොවටම කියාපායි.

මෙය අදටත් ක්‍රියාත්මක වන අතර 2013 වර්ෂයේ මෙම තීරණය ලිහිල් කොට එය එක් පවුලකට දරුවන් දෙදෙනකු සඳහා අවසර දෙන ලදි. මේ තුළින් 2019 වර්ෂය වන විට ජනගහනය වර්ෂයකට මිලියන 14.6 ක අඩුවීමක් දක්නට ලැබුණි.

1949-1950 වර්ෂවලදී ජපාන හමුදාව විසින් නිරිතදිග චීනය අල්ලාගත් අතර 1950 දශකයේ මුල් භාගයේදී ඩෙන් එහි ශ්‍රේණිගත නායකයා බවට පත්විය. එමගින් ඔහුගේ නොසැළෙන පෞරුෂය පිළිබිඹු වේ. නායකත්ව ධූරාවලිය තුළ ඉහළටම පැමිණීම, ඔහු සතුව පවතින නොපසුබට උත්සාහය යි. එහිදී කොමියුනිස්ට් පක්ෂයේ මහලේකම්වරයා බවට පත්වීම, 1956 දී පැවති අටවන චීන කොමියුනිස්ට් පක්ෂ සම්මේලනයේදී ඩෙන් හය දෙනෙකුගෙන් යුත් දේශපාලන මණ්ඩල ස්ථාවර කමිටුවට උසස් කිරීම වැනි අවස්ථා ගත හැක.

ඩෙන්ගේ මේ ගුණාංග වර්තමානයේ ඕනෑම නායකයෙකු තම දිවියට ඈඳා ගැනීමෙන් අභියෝග ජයගනිමින් විශිෂ්ඨත්වය කරා පිය මැනීමට මහෝපකාරී වන බව නොඅනුමානයි.



*(චීනයේ සෙන්චෙන් (Shenzhen) හි පිහිටි ඩෙන් ෂියාඕපින් ගේ ප්‍රතිමාවක්)*

## සාරාංශය

දීර්ඝ කාලයක් තිස්සේ දුප්පත් රටක්ව පැවති චීනය අද වන විට ලෝක බලවතා වන ඇමරිකාවට පවා නිර්භීතව අභියෝග කළ හැකි මට්ටමේ මහා සංවර්ධනයකට හිමිකම් කීම දක්වා වූ අද්විතීය චාරිකාව අධ්‍යයනය දී සමස්ත

ලෝකයෙන්ම මුවා වී සිටි චීනය පසුකාලීනව ලොවටම විවෘත කර ඓතිහාසික විජයග්‍රහණයට මග පෑදූ ඩෙන් ෂියාඕපින් නැමැති අසහාය චීන නායකයා එරට ඉතිහාසය නවමු මගකට යොමු කළ අග්‍රගණ්‍ය මිනිස් පෞරුෂයක් ලෙස සඳහන් කළ හැක.

මාඕ සේතුං ගේ පාලනය යටතේ කොමියුනිස්ට් විප්ලවවාදී සහ මිලිටරි අණ දෙන නිලධාරියෙකු ලෙස කටයුතු කළ ද ඩෙන්, 1978 දී චීනයට එතෙක් මෙතෙක් පහළ වූ දක්ෂතම නායකයා බවට පත් විය. මේ නිසාම ඔහු නූතන චීනයේ "නිර්මාණ ශිල්පියා" යන විරුදාවලියෙන් පිදුම් ලැබීය.

ඩෙන් මූලික වශයෙන් මේ සා විශිෂ්ඨත්වයකට පත් වූයේ ඔහු ආරම්භ කළ ආර්ථික ප්‍රතිසංස්කරණ නිසාවෙනි. ඒ අතර චීනය වෙළඳපොළ ආර්ථිකයක් කරා යොමු කොට ඉහළ ආර්ථික වර්ධනයකට මංපෙත් විවර කිරීම, මිලියන සිය ගණනකගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම, පුද්ගලික හා සංස්කෘතික නිදහස පුළුල් කිරීම සහ චීනය ලෝක ආර්ථිකයට සැලකිය යුතු ලෙස ඒකාබද්ධ කිරීම යන කරුණු හරහා වඩාත් මොහුගේ නායකත්වය කැපී පෙනේ.

ඔහුගේ නායකත්වය තුළ මානව ඉතිහාසයේ අන් කවරදාකටත් වඩා වැඩි පිරිසක් දරිද්‍රතාවයෙන් මිදී හිස ඔසවනු ලැබීය. ඒ ඔහුගේ ප්‍රතිසංස්කරණවල යහපත් බලපෑම නිසාවෙනි. මේ හේතුව නිසා සමහරු යෝජනා කර ඇත්තේ ඩෙන් හට නොබෙල් සාම ත්‍යාගය හිමි විය යුතු බවයි. මාඕ සේතුංගේ සංස්කෘතිය අතුගා දැමීමත් සංස්කෘතික විප්ලවයේ ගැටළු සහගත යුගය අවසන් කිරීමත් සම්බන්ධයෙන් ද ඩෙන්ට ගෞරවය හිමි වේ. එපමණක් නොව, එවකට පැවති අනෙකුත් ප්‍රධාන කොමියුනිස්ට් බලවේගයන්ට වඩා වෙනස්ව (උදාඃ-1991 දී බිඳ වැටුණු සෝවියට් සමූහාණ්ඩුව), මහජන චීන සමූහාණ්ඩුව එක්සත් ලෙස පවත්වා ගැනීමේ ගෞරවය ද ඩෙන් සතු වේ.

ඉතා දක්ෂ බුද්ධිමත් මෙන්ම දැනුමෙන් සන්නද්ධ නායකයෙකු ලෙස හඳුනා ගත හැකි ඩෙන් කුඩා කළ පටන්ම දැනුම එකතු කිරීමේ පිපාසයකින් පෙළුණු අයෙකි. තමා වෙත පැමිණි විවිධ බාධක සාර්ථක ලෙස නොපසුබස්නා වීරියෙන් හා තමා සතු බුද්ධියෙන් ජයගත් ඔහු විවිධ හැල හැප්පීම් හමුවේ නොසැලී නායකත්වයේ විශිෂ්ඨත්වය ලොවට පෙන්වීය.

චීනයේ මාක්ස්වාදී විප්ලවවාදී ව්‍යාපාරයට ඩෙන් සම්බන්ධ වුවද, ඉතිහාසයඥ මොබෝ ගාඕ (Mobo Gao) තර්ක කර ඇත්තේ, "ඩෙන් ෂියාඕපින් සහ ඔහු වැනි චීන කොමියුනිස්ට් පක්ෂයේ බොහෝ දෙනෙක් සැබවින්ම මාක්ස්වාදීන් නොව, චීනය ලොව මහා බලවතුන් හා සමානව නැගී සිටිනු දැකීමට කැමති විප්ලවවාදී ජාතිකවාදීන් ය. ඔවුන් මූලික වශයෙන් ජාතිකවාදීන් වූ අතර ඔවුන් කොමියුනිස්ට් විප්ලවයට සහභාගී වූයේ චීන ජාතිකවාදය සොයා ගත හැකි එකම ශක්‍ය මාර්ගය එය වූ බැවිනි." ලෙසටය.

වර්තමානය වනවිට චීනය ලඟා කරගෙන ඇති සියලුම සාර්ථකත්වයන්ගේ පුරෝගාමියා වන්නේ ද එම සාර්ථකත්වයන් සඳහා වූ පදනම දමන ලද්දේ ද ඩෙන් ෂියාඕපින් නම් කෘතහස්ත නායකයා වග වත්මන් චීන ජනපති, ෂී ජින් පින් විසින් තවමත් අනුගමනය කරන ඩෙන්ගේ යම් යම් ප්‍රතිපත්ති වලින් පිළිබිඹු වේ.

මේ සියලු සාධක නිසාවෙන්ම චීන ජන ජීවිතයටත්, චීන ආර්ථිකයටත් පමණක් නොව මුළු මහත් චීන ඉතිහාසයටම නව පරිච්ඡේදයක් එක් කළ, චීන ජන හදවත් දේශානුරාගයේ උදම් නදින් මොහොතකට සලිත කරවන, ලොව ප්‍රබලම නායකයන් අතර තවමත් වැජඹෙන අමරණීය මකර රජු, ඩෙන් ෂියාඕපින් බව සපථ කෙරුමට තවත් තර්ක විතර්ක සැබැවින්ම අනවශ්‍ය ය.

## මූලාශ්‍ර නාමාවලිය

BIOGRAPHY OF DENG XIAOPING: Free PDF Download. (2019, May 10). Retrieved April 8, 2020, from https://www.studyiq.com/blog/biography-deng-xiaoping-free-pdf-bank-upsc-ssc/

Hays, J. (n. d.) DENG XIAOPING'S LIFE. Retrieved April 8, 2020, from http://factsanddetails.com/china/cat2/sub7/item81.html

Lee, K. Y. (2000). From Third World to first: the Singapore story, 1965-2000. Retrieved April 8, 2020, from https://www.amazon.com/Third-World-First-Singapore-1965-2000/dp/0060197765

Three Chinese Leaders: Mao Zedong, Zhou Enlai, and Deng Xiaoping: Asia for Educators: Columbia University. (n.d.). Retrieved April 8, 2020, from http://afe.easia.columbia.edu/special/china_1950_leaders.htm

Hung, R. Y. Y. (n.d.). How Global Capitalism Transforms Deng Xiaoping. Retrieved April 8, 2020, from https://www.academia.edu/7839340/How_Global_Capitalism_Transforms_Deng_Xiaoping

China’s Growth Miracle: Past, Present, and Future. (n.d.). Retrieved April 8, 2020, from http://www.unrisd.org/80256B3C005BD6AB/(httpAuxPages)/2893F14F41998392C1257BC600385B21/$file/China's growth miracle 0808.pdf

China's 40 Years of Reform and Development. (n.d.). Retrieved April 23, 2020, from https://www.worldcat.org/title/chinas-40-years-of-reform-and-development/oclc/1053799573

Richter, F. (2020, January 17). Infographic: China Posts Weakest Economic Growth Since 1990. Retrieved April 23, 2020, from https://www.statista.com/chart/amp/16715/china-economic-growth/

# ෂින්සෝ අබේ



**කණ්ඩායම් සාමාජිකයන් :**

- ආර්. පී .එච්. අමල්කා
- කේ. ජී. එම්. එම්. කහගල්ල
- කේ. එස්.  එච්. කරුණාතිලක
- ම් . එම් .පාරමිතා
- එම්.  පී.  එස්. බී .කුමාර

# හැඳින්වීම

නැගෙනහිර අසියාවේ පිහිටා ඇති රාජ්‍යයක් වන ජපානය ප්‍රධාන දූපත් හතරකින් හා කුඩා දූපත් රාශියකින් සමන්විත වේ. සමුරායිවරුන්ගේ දේශය, සකුරා දේශය හා නැගීඑන සූර්යාගේ දේශය යන විවිධ නම්වලින් ජපානය ලොව සුපතළය. අද්විතීය ඉතිහාසයකට උරුමකම් කියන ජපානයේ, ජනතා කැමැත්තට අනුව දෙවන වරටත් අගමැතිවරයා ලෙස තේරීපත් වූ වත්මන් අගමැති ෂින්සෝ අබේ දේශපාලන ලෝකය තුළ දක්නට ලැබෙන ප්‍රබල චරිතයකි.

ආර්ථිකයෙන් පමණක් නොව දේශපාලනයෙන් ද බලවත් පවුල් පසුබිමකින් බිහිවූ අබේ දේශපාලන වේදිකාවේ පෙරළිකාර චරිතයක් විය. දීර්ඝ කාලයක් ජපන් දේශපාලනය තුළ නොනැසී, අගමැතිවරයකු දක්වා ඔහු පැමිණි ගමන් මග විවිධ හැලහැප්පීම්, බිඳවැටීම්, පරාජයන් මතින් ඉතා දුෂ්කරව හා වෙහෙස වී ලද සාර්ථක ජයග්‍රහණයකි. අබේ ලිබරල් ඩිමොක්‍රටික් පක්ෂයෙන් (Liberal Democratic Party) දේශපාලනයට අත්පොත් තැබුවේ තම පවුලෙන් ලැබූ ආභාසය නිසාවෙනි. එම දේශපාලන ජීවිතයේදී අභියෝග භාර ගැනීමටත් නව අදහස් ක්‍රියාත්මක කර අවදානමක් ගැනීමටත් හසල දේශපාලන අත්දැකීම් ඇති අබේ කිසිවිටෙකත් පසුබට නොවීය. විඥානය රටක ප්‍රතිරූපය බව වටහාගෙන දේශප්‍රේමී අධ්‍යාපන ක්‍රමයක් ප්‍රචලිත කිරීමට අබේ තීරණය කළේද මේ නිසාවෙනි. ආපදාවන් මෙන්ම, දේශීය හා විදේශීය අභියෝග හමුවේ කඩා වැටුණු ජපන් ආර්ථිකය ප්‍රතිසංස්කරණ තුළින් නැවත ශක්තිමත් කිරීමට ඔහු කටයුතු කළේ ද දීර්ඝකාලීන සාර්ථකත්වයේ යතුර ආර්ථික ප්‍රතිපත්ති බව මනාව පසක් කර ගනිමිනි. එහි ප්‍රතිඵලයක් ලෙස අබේනොමික්ස් (Abenomics) ලොවට බිහිවිය. දේශපාලනික වශයෙන් ජපානය ස්ථාවර කිරීමට වඩාත් ක්‍රියාකාරී ප්‍රායෝගික විදේශ ප්‍රතිපත්ති හඳුන්වා දීමට කටයුතු කර ඒ තුළින් ආර්ථිකය ශක්තිමත් කිරීමටත්, නිදහස් වෙළඳාම ජාත්‍යන්තරය තුළ ප්‍රචලිත කර ජාත්‍යන්තර වෙළඳාම නව මානයකට ගෙන යාමටත් ඔහු කටයුතු කළේය. පරමාණු බෝම්බ හමුවේ කඩා වැටෙන ජපානය අළු මතින් දෙපයින් නගා සිටුවූ නායකයන්ගේ අඩිපාරේ යමින් ජාතික හරයත්, දේශීය මුහුණුවරත් ප්‍රචලිත

කරමින් තාක්ෂණික දියුණුව නම් පියගැට පෙළ තරණය කර නවීකරණයට ලක් වූ ජපානය සාර්ථකත්වය කරා රැගෙන යාමට නායකයකු ලෙස ෂින්සෝ අබේ පියමනින මාවත පෙරදිගට පමණක් නොව මුළු මහත් ලෝකයටම ආදර්ශයකි.

## ළමා කාලය අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

නැගී එන සූර්යයාගේ දේශයේ දී 1954 සැප්තැම්බර් 21 වන දින ෂින්සෝ අබේ නම් සොඳුරු මිනිසා උපත ලැබීය. ෂින්සෝ අබේ ශක්තිමත් ආර්ථික පසුබිමකින් යුක්ත වූවෙකි. අබේගේ සීයා වන නොබුසුකේ කිශි (Nobusuke Kishi) එයට හේතු විය. ඔහු ජපානය තුළ පමණක් නොව චීනයේ මැන්චූරියාවේද (Manchuria) සුපතල ධනපතියෙකි. අබේගේ පවුල් පසුබිම ධනවත් වීමට මූලික හේතුව වූයේ මොහුය. අබේගේ පරම්පරාව ජපානයේ හොන්ෂු දූපතේ ජුන්කෝ පළාතට අයත් යමුගුචි (Yamaguchi) ප්‍රදේශය තම තිඹිරිගෙය කරගත්තේය. අබේගේ පියා වන ෂින්ටාරෝ අබේ (Shintaro Abe) වෙළඳ සංකීර්ණයක රැකියාවක නිරත වෙමින් තම වෘත්තීය ජීවිතය ආරම්භ කළත් පසුව මව්බිමට තම යුතුකම් ඉටුකරමින් පැසිපික් යුද සමයේදී කමිකසේ (Kamikase) ගුවන් නියමුවෙකු ලෙස ගුවන් හමුදාවට බැඳුණේය.

අබේගේ මව වන යොකෝ කිෂිගේ (Yoko Kishi) පියා වන නොබුසුකේ කිෂි, (Nobusuke Kishi) එවකට බලවත්ව සිටි රුසියානු අධිරාජ්‍යාගේ ආක්‍රමණ ජපානය දෙසට හැරෙන්නට ඉඩ නොදී ඊට විරුද්ධව දැඩි කොමියුනිස්ට් විරෝධී අදහස් ප්‍රචලිත කරන්නෙකු විය. එවකට ඔහු ජපන් නිපොන් (Japan Nipon) කර්මාන්තශාලාවේ කම්කරුවෙකු ලෙස කටයුතු කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඔහු දේශපාලන සිරකරුවෙක් ලෙස බන්ධනාගාර ගත විය. ඉන් නිදහස් වූ පසු ඔහු ඉචිරෝ හටොයාමා (Ichirō Hatoyama) සහ මමොරු ශිගෙමිට්සු (Mamoru Shigemitsu) සමඟ එකතු වී ජපන් ඩිමොක්‍රටික් පක්ෂය නිර්මාණය කළේය.

ධනවත් පවුලකට උරුමකම් කියන අබේ තම මූලික අධ්‍යාපනය සෙයිකි (Seiki) මූලික පාසලෙන් ආරම්භ කර සෙයිකි කනිෂ්ඨ පාසලෙන් හා සෙයිකි උසස් පාසලින් ද අධ්‍යාපනය ලැබීය. ඔහු රාජ්‍ය පරිපාලනය හැදෑරූ අතර 1977 දී සෙයිකි විශ්වවිද්‍යාලයෙන් දේශපාලන විද්‍යාව පිළිබඳ උපාධියක් හැදෑරීමට කටයුතු කළේ අනාගතයේ දේශපාලනයට පැමිණීමට ඔහුගේ සිතේ හටගත් දැඩි ආශාව නිසාවෙනි. පසුව අබේ ඇමෙරිකා එක්සත් ජනපදයේ දකුණු කැලිෆෝනියා (California) විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය ආණ්ඩු ක්‍රම පිළිබඳ අධ්‍යාපනය ලැබීය.

ඉන් අනතුරුව 1979 දී ඔහු කොබේ ස්ටීල් (Kobe Steel) ආයතනයේ තම වෘත්තීය ජීවිතයට අඩිතාලම දමන ලදී. නමුත් 1955 දී ෂිගෙරු යොෂිඩාගේ (Shigeru Yoshida) ලිබරල් පක්ෂයත්, කිම්ගේ ඩිමොක්‍රටික් පක්ෂයත් සන්ධානගත වෙමින් වාමාංශික විරෝධී ලිබරල් ඩිමොක්‍රටික් පක්ෂය (Liberal Dimocratic Party) ඇතිවීමත් සමඟ අබේගේ දේශපාලනයට පිවිසීමට තිබූ පිපාසය උග්‍රවිය. එම නිසා කොබේ ස්ටීල් (Kobe Steel) හි රැකියාවෙන් ඉවත් වී විදේශ කටයුතු අමාත්‍යාංශයේ විධායක සහකරු ලෙස 1982 දී දේශපාලනික දිවියට මුල්ම අඩිතාලම දැම්මේ ය. ඉන්පසු මහා මණ්ඩල සභාපතිගේ පෞද්ගලික ලේකම් ධූරය, ලිබරල් ඩිමොක්‍රටික් පක්ෂයේ මහ ලේකම්වරයාගේ පෞද්ගලික ලේකම් ධූරය ද මීට අමතරව තවත් බොහෝ රජයේ තනතුරු ද දරමින් අබේ ලොව සුපතළ චරිතයක් දක්වා තම දේශපාලන ගමන් මග රැගෙන ගියේය.



*(ෂින්සෝ අබේ වයස අවුරුදු 2දී තම මව,පියා සහ වැඩිමහල් සහෝදරයා සමඟ- 1956)*

## නායකත්වය කරා ගිය ගමන් මඟ

ෂින්සෝ අබේ දේශපාලන දිවිය ඇරඹීමට පෙර ඔහු විදේශ කටයුතු අමාත්‍යංශයේ විධායක සහකාර වරයෙකු ලෙස කටයුතු කළේ ය. ඔහුගේ පියාගේ අභාවයෙන් පසු 1993 වර්ෂයේදී යමගුචි (Yamaguchi) ප්‍රාන්තයට තේරී පත්වන්නේ තම පියාගේ නාමය ඉදිරියට ගෙන යාමට මනා පිටිවහලක් වෙමිනි. වෙනස් කළ නොහැකි තනි ඡන්ද බලයක් සහිත (Single Non-Transferable) කැබිනට් මණ්ඩලයේ බහු සමාජික දිස්ත්‍රික්කයෙන් තේරීපත් වූ නියෝජිතයින් සිව්දෙනාගෙන් වැඩිම ඡන්ද ප්‍රමාණයක් මොහු සතු කර ගත්තා සේම 1999 දී සමාජ කටයුතු අංශයේ අධ්‍යක්ෂ ධූරයට ද පත්විය. මොහුගේ දේශපාලන දිවියේ තවත් ඉදිරි පියවරක් ලෙස 2000-2003 වර්ෂය දක්වා වසර තුනක කාලයක් පුරාවට යොෂිරෝ මොරිගේ (Yoshiro Mori) සහ ජුනිචිරෝ කොයිසුමිගේ (Junichiro Koisumi) කැබිනට් මණ්ඩලවල නියෝජ්‍ය ප්‍රධාන කැබිනට් ලේකම් වරයා බවට පත්වී පසුව ඔහුගේ දැඩි කැපවීම මත ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ මහ ලේකම්වරයා ලෙස පත් විණි.

අබේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ මොරි (Mori) කණ්ඩායමේ ක්‍රියාකාරී සාමාජිකයෙකි. මෙම කණ්ඩායමේ නායකත්වය හිටපු අගමැති යොෂිරෝ මොරි විසින් දරනු ලැබිණි. නමුත් පක්ෂයේ සිරිතක් වශයෙන් පක්ෂ තනතුර භාර ගැනීම ඔහු ප්‍රතික්ෂේප කළේය. අබේගේ දේශපාලන ගමන්මග අතරතුර ඔහුට මුහුණ දීමට සිදු වූ ඇතැම් සිදුවීම් අමතක කලයුතු නොවේ. 2000 වර්ෂයේ යමගුචි ප්‍රාන්තයේ ෂිමොනොසෙකි (Shimonoseki) හි අබේගේ නිවස සහ ඔහුගේ ආධාරකරුවන් ගේ කාර්යාලයට අවස්ථා ගණනාවක දී මෙලටොව් කොක්ටෙල් (Molotov Cocktail) වලින් පහර දෙන ලදී. මෙම අවස්ථාවේදී වැරදිකරුවන් ලෙස කිටකියුෂු (Kitakyushu) පදනම් කරගත් බොර්යොකුඩාන් (Boryokudan) වෙළඳ මණ්ඩලයක් (Cyndicate) වන කුඩො කායිට (Kudo Kai) අයත් යකුසා (Yakusa) සාමාජිකයන් කිහිප දෙනෙක් අල්ලාගන්නා ලද අතර මෙයට හේතු වශයෙන් ගෙනහැර දක්වන්නේ, 1999 වර්ෂයේදී ෂිමොනොසෙකි ප්‍රාන්තයේ නගරාධිපති අපේක්ෂකයෙකුට සහාය දැක්වීම

හේතුවෙන් අබේගේ  දේශීය ආධාරකරුවන් ෂිමොනොසෙකි ප්‍රාන්තයේ දේපල වෙළඳාම් තැරැව්කරුවකු ට මුදල් ලබාදීම ප්‍රතික්ෂේප කිරීම යැයි කියැවෙයි.

අබේගේ ජනප්‍රියත්වය කැපී පෙනුණු  අවස්ථාවක් ලෙස ජපානයේ පැහැරගත් පුද්ගලයන් උතුරු කොරියාවට රැගෙන ගිය අවස්ථාවේ ඔවුන් වෙනුවෙන් අබේ ජපාන රජයේ ප්‍රධාන සාකච්ඡාකරු වශයෙන් ක්‍රියා කළ ආකාරය දැක්විය හැක. මෙම උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහු 2002 වර්ෂයේ කිම් ජොන් ඉල් (Kim Jong-il) හමුවීමට ගියේය. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය විසින් පවත්වාගෙන යන ලද සමීක්ෂණක් වන ''අධි ලිංගික අධ්‍යාපනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය තොර අධ්‍යාපනය'' ව්‍යාපෘතිවල කණ්ඩායම් නායකයා බවටද පත්විය . මෙහිදී මෙම කණ්ඩායම විසින් විරෝධතා කිහිපයක් මතුකර තිබේ. එනම් ව්‍යුහ විද්‍යාත්මක බෝනික්කන්, වෙනත් විෂයමාලා ද්‍රව්‍ය දරුවන්ගේ වයස සැලකිල්ලට නොගැනීම, සාම්ප්‍රදායික පිරිමි හා ගැණු ලමයින්ගේ උත්සව තහනම් කරන පාසල් ප්‍රතිපත්ති සහ මිශ්‍ර ස්ත්‍රී පුරුෂ ශාරීරික අධ්‍යාපනයයි. ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට වඩා වෙනස් ප්‍රතිපත්තියක් ඇති කිරීම සඳහා මෙම කණ්ඩායම උත්සාහ දරා ඇති අතර එවැනි ප්‍රතිපත්ති සඳහා තම සහාය ද ලබා දීම අබේ  විසින් සිදු කර තිබේ.

2006 අප්‍රේල් 23 වන දින අබේ පාලක ලිබරල් ප්‍රජාතන්තවාදී පක්ෂයේ සභාපති ලෙස තේරී පත් විය. මෙම තනතුර සඳහා ඔහුගේ ප්‍රධාන තරඟකරුවන් වූයේ සඳකාසු ටනිගකි (Sadakazu Tanigaki) සහ ටාරෝ අසෝ (Taro Aso) ය. යසුමා ෆුකුඩා (Yasuma Fukuda) ප්‍රමුඛ මුල් තරඟකරුවෙකු  වූ නමුත් අවසානයේ ඔහු තරඟ නොකිරීමට තීරණය කළේය. හිටපු අගමැති යොශිරෝ මෝරි ප්‍රකාශ කළේ අබේ සහ ෆුකුඩා යන දෙදෙනාම තම කණ්ඩායමට (මෝරි කණ්ඩායමට) අයත් වූ නමුත්, මෝරි කණ්ඩායම අබේ වෙත දැඩි ලෙස නැඹුරු වූ බවයි. මේ අනුව සලකා බලන විට අබේගේ දේශපාලන ගමන් මග වෙනස්කම් රාශියකට ලක් වුණු බව කිව මනාය.



*(අගමැති ලෙස ෂින්සෝ අබේ)*

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව

අබේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ජනප්‍රිය චරිතයකි .ඔහු උතුරු කොරියාව සම්බන්ධයෙන් දැඩි මතධාරී පුද්ගලයකු ලෙස හඳුනාගත හැකි අතර 2006 ජූලි 14 වන අබේ ප්‍රථම වරට ජපන් අගමැති ලෙස ඔහුගේ දේශපාලන ගමන්මගේ පළමු පියවර තැබුවේය. 1937 දී අගමැති ධුරයට පත්වූ ෆුමිමාරෝ කොනෝට (Fumimaro Konoe) පසුව තේරීපත්වූ ලාබාලතම අගමැතිවරයා මොහු වේ. ඒ වනවිට ඔහු පනස් දෙවැනි වියේ පසු විය.

2006 සැප්තැම්බර් සිට 2007 සැප්තැම්බර් දක්වා කාලය ඔහුට අමතක කළ නොහැකි ඓතිහාසික කාල පරිච්ඡේදයකි. මෙම කාලවකවානුව අතරතුර ජපානයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සාම වගන්තිය වන, නම (9) වන වගන්තිය, සංශෝධනය කිරීමේ අභිලාෂයන් ප්‍රකාශයට පත් කළේය.

අබේ ජාත්‍යන්තර වශයෙන්ද කීර්තිනාමයක් දිනා ගත් පුද්ගලයෙකි. ඊට හේතුව වන්නේ ඔහුගේ ආර්ථික ප්‍රතිපත්ති සමුදායයි. එමනිසා ජපානයේ මෙම ආර්ථික ක්‍රමවේදය අබේනොමික්ස් යන අන්වර්ථනාමයෙන් හඳුන්වනු ලබයි. මෙම ප්‍රතිපත්ති අතරට මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම, රාජ්‍ය මූල්‍ය උත්තේජනය සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අනුගමනය කිරීම වැනි ප්‍රතිපත්ති ගෙනහැර දැක්විය හැක . ආර්ථික පුනර්ජීවනය සහ අවධමනය ප්‍රධාන සහ හදිසි ප්‍රශ්නයක් බවට පත්ව ඇති බව 2003 වර්ෂයේ අබේ විසින් ඩයට් සභාවට ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් වේ. ඔහුගේ මෙම අබේනොමික්ස් ප්‍රතිපත්තිය ඊතල තුනක් මගින් විග්‍රහ කෙරේ.

මෙහිදී පළමු ඊතලය වන්නේ සියයට දෙකක උද්ධමන ඉලක්කයක් සපුරා ගැනීම අරමුණු කොට ගනිමින් මූල්‍ය ව්‍යාප්තියක් ඇති කිරීමයි. දෙවැන්න නම්‍යශීලී ආර්ථික ප්‍රතිපත්තිය කෙටි කාලීන ආර්ථික උත්තේජනයක් ලෙස කටයුතු කිරීමයි. තුන්වැන්න ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හා පුද්ගලික අංශයේ දිගුකාලීන වර්ධනයක් ඇතිකර ගැනීම සඳහා ආයෝජනය කිරීමයි. මෙහිදී පළමු ඊතල දෙකම ඔහුට ආරම්භක සාර්ථකත්වයක් ගෙන දුන්න ද තුන්වැනි ඊතලය ජපානයේ ජනවිකාශනයත් සමඟ තවමත් ක්‍රියාකර නොමැති බව හඳුනාගත හැක.

ජපානය තුළ දරුවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීමේ ඇති දැඩි අරමුණත් ඔවුන්ට ජපන් ඉතිහාසය ඉගැන්වීමට තිබූ කැමැත්තත් නිසාවෙන් ජපන් ඉතිහාස පෙළපොත් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඔහු යොමු වුණු අතර ඉතිහාස පොත් මුද්‍රණය සඳහා ද සහාය විය. එමෙන්ම 1977 වර්ෂයේ සිට ජපානයේ ''දෘෂ්ටිය සහ ඉතිහාසය අධ්‍යාපනය'' පිළිබඳව වන කනිෂ්ඨ සාමාජික සභාවේ (Institute of Junior Assembly of Japan and History Education) ප්‍රධානියා ලෙසද අබේ කටයුතු කළේය.

දක්ෂිණාංශික දේශපාලනයේ කැපී පෙනෙන පුද්ගලයකු වන අබේ 2007 මාර්තු මාසයේදී ''රටට සහ උපන් ගමට ආදරය'' ලෙස දිරි ගැන්වීමේ පනතක් යෝජනා කර ඇති අතර මූලික අධ්‍යාපන නීති සංග්‍රහයට ඇලුම් කිරීම ඇතුළත් කරන ලෙස ද ඔහු යෝජනා කර ඇත.

වසර පනස් දෙකකට පසු අබේගේ පාලනය අහිමි වූ ප්‍රථම අවස්ථාව ලෙස ඉහළ සභා මැතිවරණයෙන් ඔහු පාලක ලිබරල් පක්ෂය පරාජය වීම දැකිය හැක. මෙම අවස්ථාවේදී ජපන් කාන්තා රාජාණ්ඩුවක් පක්ෂ අපේක්ෂා කළද එය ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඔහුට ආධාරකරුවන්ගේ සහය අහිමි විය.

සිය දැක්ම පුනර්ජීවනය කිරීමේ උත්සාහයක් ලෙස අබේ විසින්, මූල්‍ය වංචාවකට හසු වූ කෘෂිකාර්මික ඇමති ටකෙහිකො එන්ඩො (Takehiko Endo) ඉල්ලා අස්වී දින හතකට පසු 2007 වර්ෂයේ අගෝස්තු මස 27 වන දින නව කැබිනට් මණ්ඩලයක් ප්‍රකාශයට පත් කරන ලදී. එම වර්ෂයේ සැප්තැම්බර් 12 වන දින නව පාර්ලිමේන්තු සැසිවාරය ආරම්භ කරමින් ඔහු විසින් ඉල්ලා

අස්වීමට තමන් ගන්නා ලද තීරණය ප්‍රකාශ කළේය. ඔහුගේ පක්ෂ නිලධාරීන් පවසන ලද්දේ ඔහු දුර්වල සෞඛ්‍ය තත්ත්වයෙන් පෙළෙන බවකි. 2007 සැප්තැම්බර් 26 වන දින ඔහු නිල වශයෙන් ධූර කාලය නිමාවට පත් කරන ලද්දේ යසුඔ ෆුකුඩාගේ (Yasuo Fukuda) නව ධූර කාලය ආරම්භ වීමත් සමගයි. ධූර කාලය අවසන් වීමෙන් පසු අබේගේ රෝගී තත්ත්වය හෙළි කරන ලදී. එහිදී ඔහු Ulcerative Colitis (UC) නම් රෝගී තත්ත්වයෙන් පෙළුණු බව පවසයි. එහිදී මහා බඩවැලෙහි හා ගුද මාර්ගයේ තුවාල වැනි දීර්ඝකාලීන රෝගවලින් මොහු පෙළී ඇත. පසුව අනාවරණය කරගන්නා තොරතුරු වලට අනුව අබේ විසින් Asacol නම් ජපානය විසින් මෙයට පෙර භාවිතා නොකළ, ප්‍රදාහ සහ බඩවැලෙහි තුවාල් සඳහා ගනු ලබන ඖෂධය භාවිත කිරීම නිසා සුවය ලබා තිබේ. ඔහු නැවත බලයට පැමිණීමෙන් පසු නව ඖෂධ අනුමත කිරීමට ගත වන්නා වූ කාලය අඩු කිරීමට අවශ්‍ය බව පෙන්වීම සඳහා ඔහු විසින් ගන්නා ලද ඖෂධ ම නිදසුන් කර ගන්නා ලද බව වාර්තා වේ.

අගමැති නෝඩා (Noda) විසින් 2012 නොවැම්බර් 16 වන දින ප්‍රකාශ කරන ලද්දේ පහළ මන්ත්‍රී මණ්ඩලය විසුරුවා හැර මහ මැතිවරණය දෙසැම්බර් 16 වන දින පවත්වන බවයි. අබේ විසින් ''ජපානය ආපසු ගන්න'' (Take back Japan) යන සටන්පාඨය භාවිත කරමින් ආර්ථික ප්‍රතිසංස්කරණ තුළින් මුදල් ලිහිල් කිරීම, ඉහළ රාජ්‍ය වියදම සහ න්‍යෂ්ටික බලශක්ති අඛණ්ඩව භාවිතා කිරීම සහ භෞමික ආරවුල් සඳහා දැඩි තීරණ ගැනීමට පොරොන්දු විය.

අබේ දෙවන වරටත් අග්‍රාමාත්‍ය ධුරයට 2012 දෙසැම්බර් 16 වන දින පත් වනු ලබන්නේ මන්ත්‍රී මණ්ඩල සාමාජිකයන් 480 න් 328 දෙනෙකුගේම ඡන්දය ලබා ගනිමිනි. අර්බුදකාරී කැබිනට් මණ්ඩලයක් ලෙස හඳුන්වනු ලබමින් අබේ තම පක්ෂය වන ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකයන්ට නව ආණ්ඩුවේ වැඩි ආසන ප්‍රමාණයක් වෙන් කරනු ලැබීය.

අබේගේ ජයග්‍රහණයෙන් පසු ''මගේ සමස්ත කැබිනට් මණ්ඩලයේම ශක්තීන් මගින් මම නිර්භීත මූල්‍ය ප්‍රතිපත්තියක්, නම්‍යශීලී මූල්‍ය ප්‍රතිපත්තියක් සහ පුද්ගලික ආයෝජන දිරිමත් කරන වර්ධන උපායමාර්ග ක්‍රියාත්මක කරමි'' යනුවෙන් ප්‍රකාශ කළ අතර මේ ඔහුගේ කුළුණු තුනේ ප්‍රතිපත්තිය වේ. වාසනාව

අබේට ඉතා දුර්ලභ දෙවන අවස්ථාවක් ලබා දුනි. දෙවන වර අගමැති වීමෙන් පසු දුර්වල විපක්ෂයට එරෙහිව අඛණ්ඩව මැතිවරණ හයක් අබේ ජයග්‍රහණය කරන ලදි. මෙහිදී අබේ විසින් දේශපාලන ස්ථාවරත්වය යථාතත්වයට පත්කිරීම, ආර්ථික පුනර්ජීවනය ඇති කිරීම සහ ශක්තිමත් විදේශ සහ ආරක්ෂක ප්‍රතිපත්තියක් සකස් කිරීමට උත්සහ දරා තිබේ. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුග්‍රහය ඇතිව 2014 දෙසැම්බර් 24 වන දින අබේ නැවත අග්‍රමාත්‍ය ධූරයට පත් කරගන්නේ රටේ ජනතාව ඔහු කෙරෙහි තබා ඇති විශ්වාසය මනාවට පිළිබිඹු කරමිනි. ඔහුගේ පාලන කාලය තුළ සිදුවූ එකම ඍණාත්මක වෙනස වූයේ දේශපාලන අරමුදල් පිළිබඳ මතභේදයට සම්බන්ධ වූ ආරක්ෂක ඇමති අකිනොරි (Akinori) වෙනුවට ජෙනරල් නැකතානිව (Nakatani) පත් කිරීමයි. එමෙන්ම 2015 වසරේ දෙසැම්බර් මාසයේදී අබේ නැවත වරක් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකයා ලෙස තේරී පත්විය. වරක් ඔහු කැබිනට් සංශෝධනයක් සිදු කළ අතර නැවත වරක් මුදල්, ආර්ථික, විදේශ කටයුතු සහ ප්‍රධාන ලේකම් ධූරයේ ද කටයුතු කරන ලද්දේ ඔහුගේ දේශපාලන දිවිය තුළ තුන්වෙනුවට ද අග්‍රාමාත්‍ය ධුරය හොබවමිනි. මීට අමතරව අබේ විසින් සමාජ ආරක්ෂණ ප්‍රතිසංස්කරණ සම්බන්ධ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීම සඳහා නව අග්‍රාමාත්‍ය ධූරයක් ද නිර්මාණය කළේ තම රට කෙරෙහි පවතින අසීමිත ඇල්ම නිසාවෙනි.

2017 වර්ෂයේදී නැවත මහ මැතිවරණය තුළින් අබේ තුනෙන් දෙකක බලය තමා සතු කර ගනිමින් සිව්වන වතාවටත් අග්‍රාමාත්‍ය ධූරයට පත්විය. මෙම කාල වකවානුව වන විට උතුරු කොරියානු අර්බුදය එරටෙහි ප්‍රමුඛ පුවත බවට පත්විය. මේ අතරතුර චීනයේ නායක ෂි ජින්පින්ග් (Xi Jinping) සමග පරමාදර්ශි අග්‍රාමාත්‍ය ෂින්සො අබේ රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. මේ හේතුවෙන් 2019 වර්ෂයේ චීන ජාතිකයන්ට ජපානයේ බලපත්‍ර ඉතා පහසුවෙන් ලබා ගැනීමේ පහසුකම් අබේ විසින් සළසා දීමට අපේක්ෂා කෙරිණි.

එදා මෙදා තුර ජපන් ඉතිහාසය රන් අකුරින් ලියවීමට කටයුතු කර ෂින්සෝ අබේ දින 2883ක දීර්ඝ කාලයක් පසු කරමින් 2019 නොවැම්බර් 19 වැනි දින එක පිට සිව් වතාවක් අග්‍රාමාත්‍ය ධූරය හොබවමින් ජපානයේ දීර්ඝතම කාලයක් සේවය කළ අග්‍රාමාත්‍යවරයා ලෙස නම් තැබීය.

## විදේශ ප්‍රතිපත්තිය

විදේශ ප්‍රතිපත්තිය යනු රාජ්‍යයක් වෙනත් රටවල් සමග කටයුතු කරන ආකාරයයි. රටක විදේශ ප්‍රතිපත්තිය එම රටේ සංවර්ධනය, ස්ථාවරත්වය, අනන්‍යතාවය වැනි කරුණු කෙරෙහි දැඩිව බලපායි. දෙවන ලෝක යුද්ධයෙන් පසු ජපානය අනෙකුත් රාජ්‍යයන් කෙරෙහි සුහදශීලි විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට කටයුතු කරන ලදි. ඒ අතරින් ෂින්සෝ අබේගේ විදේශ ප්‍රතිපත්තිය කැපී පෙනේ. වර්තමානය වන විට ඇමරිකාව වැනි බලවත් රාජ්‍යයන් අන්තර්ජාතික තලය තුළ හුදකලා වීමට උත්සාහ දරණ අතර ජපානයේ ආර්ථික තත්ත්වය ඇතුළු අනෙකුත් මෘදු බල (Soft Power ) උපාංගයන්ගේ තත්ත්වයන් මනාව හඳුනා ගත් අගමැති කෙනෙකු වන අබේ සිය රටේ ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීම උදෙසා අනෙකුත් රාජ්‍යයන් සමඟ ආර්ථික, දේශපාලන, ආරක්ෂක හා සමාජීය බැඳීම් ස්ථාපිත කිරීමේ වැදගත්කම අගය කරන්නෙකු විය.

ඉන්දියාව, ශ්‍රී ලංකාව වැනි දකුණු ආසියානු රටවල් සමඟ ද තායිවානය, දකුණු කොරියාව, ඕස්ට්‍රේලියාව , ඇමරිකාව මෙන්ම අග්නිදිග ආසියාවේ රාජ්‍යයන් සමඟ ද, දෙවන ලෝක යුද සමයේ සිට වර්තමානය දක්වා ජපානය සමඟ විරසක වූ උතුරු කොරියාව හා චීනය වැනි දැවැන්ත ආර්ථිකයන් සහිත රටවල් සමඟ ද අබේ අගමැතිතුමා උපායශීලි විදේශ ප්‍රතිපත්තියක් පවත්වා ගැනීමට උත්සාහ දරන බව හඳුනාගත හැක.

බලයට පත් වීමෙන් පසු අබේගේ පළමු කැබිනට් මණ්ඩලයේ අවධානය යොමු වුයේ වඩාත් ක්‍රියාශිලි විදේශ හා ආරක්ෂක ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට ය. ජපානය බලවත් රටක් බවට පත් කිරීමටත් මිත්‍ර පාර්ශවයන් ගොඩ නැඟීම සඳහා මෘදු හා දැඩි බලය යොදා ගනිමින් ජපානය ලෝකයේ ඉහළ තලයකට ගෙන ඒමටත් අබේ සිහින මැවීය. ඉන් ඔහු අදහස් කළේ සමබර සහ සමාන සම්බන්දතාවයක් නිසැකවම ඇති කර ගැනීම සහ ඉන්දියාව, ඕස්ට්‍රේලියාව වැනි අනිකුත් ආසියා පැසිෆික් බලවතුන් සමඟ සබඳතා තරකර ගැනීමයි. එමෙන්ම කලාපයේ චීන බලයේ වර්ධනයට එරෙහිව


චීනය සමඟ සූක්ෂම ලෙස දැඩි සබඳතාවයක් ගොඩ නගා ගැනීම අබේගේ ප්‍රධාන අරමුණ විය.

එමෙන්ම ජාත්‍යන්තර තලය තුළ රාජ්‍යයන්ට අමතරව ඉතා ප්‍රබල ක්‍රියාකාරීන් ලෙස හඳුනාගත හැකි නේටෝ (NATO), ආසියන් (ASEAN), G8 සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය (UN) වැනි ජාත්‍යන්තර සංවිධානවල පවා ප්‍රධාන භූමිකාවක් හොබවන රාජ්‍ය නායකයෙකු ලෙස ෂින්සෝ අබේ පිළිගැනේ.

ෂින්සෝ අබේගේ දෙවන අගමැති ධූර කාලය තුළදී චීනය කෙරෙහි වඩා ශක්තිමත් ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කළ අතර ජපාන විදේශ ප්‍රතිපත්තිය වෙනත් කලාපයක් දෙසට යොමු කිරීමක් ලෙස ඇමරිකා එක්සත් ජනපදය හැර වෙනත් ආරක්ෂක හවුල්කරුවන් කෙරෙහි අවධානය යොමු කිරීම අබේගේ විදේශ ප්‍රතිපත්තිය තුළ කැපී පෙනෙන අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැකිය.

**මහජන චීනය සමඟ පවතින සබඳතා**

අබේගේ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සඳහා එක්සත් ජනපදය, අග්නිදිග ආසියාව හා යුරෝපය වෙතින් සහයෝගය ලබාගත් අතර චීනය සහ කොරියාව සමඟ ජපානයේ සම්බන්ධතා සතුටුදායක මට්ටමක පැවතුනි. අතීතයේ දෙරට අතර ඉතා යහපත් සබඳතා පැවතුනි. නමුත් 2007 වන විට එය හාත්පසින්ම වෙනස් විය. සෙන්කාකු (Senkaku) සහ ඩියායුඩෝ දූපත් (Diaoyudao Island ) ආරවුල් මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. අග්නිදිග ආසියානු කලාපය තුළ දේශපාලන, ආරක්ෂාව සහ ආර්ථික සබඳතා ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය අබේ ප්‍රකාශ කර තිබේ. මේ වන විට අබේ පිලිපීනයේ සහ ඉන්දුනීසියාවේ සාර්ථකව සංචාරය කර ඇති අතර චීනය අග්නිදිග ආසියානු කලාපය තුළ නොතිබුනද ජපානය එහි සහය ද ඉල්ලා තිබේ. කෙසේ වෙතත්, සෙන්කාකු දූපත් (Senkaku Island) ආරවුල මෙන්ම අබේ යසුකුනි දේවස්ථානය ( Yasakuni Shrine ) නැරඹීම නිසා ද චීනය සමඟ සබඳතා දිගින් දිගටම පළුදු වී ඇත.



*(ජපාන අගමැති ෂින්සෝ අබේ සහ චීන අගමැති ෂී ජින්පින් හමුවූ අවස්ථාවක් )*

ජපානය සහ චීන සමූහාණ්ඩුව අතර සම්බන්ධතාවය වර්ධනය කිරීමට 2009 වර්ෂයේ අප්‍රේල් 2 දා ජපානයේ හිටපු අගමැති ටාරෝ අසෝ (Taro Aso) සමග හිටපු චීන ප්‍රධාන නායක හූ ජින්තාවෝ (Hu Jintao) සමුළුවක් පැවැත්වීමට උත්සහ කළේය.

2011 සැප්තැම්බර් 11 වන දින සෙන්කාකු දූපත් ජනසතු කිරීමට නෝඩා රජය ගත් තීරණය චීනය ප්‍රකෝප කිරීමක් බව විචාරකයන්ගේ මතයයි. ඊට අමතරව දෙවන ලෝක යුද සමයේ ජපානය පාලනය කළ ජපන් අධිරාජ්‍යයා ඇතුළු යුද වීරයන්ගේ ආත්මයන් වෙනුවෙන් කැප කර ඇති යසුකුනි දේවස්ථානයට ( Yasakuni Shrine ) 2013 දෙසැම්බර් මාසයේ දී එරට අගමැති වූ අබේ සංචාරය කළේය. අබේ විසින් යසකුනි දේවස්ථානය සංචාරය කිරීම මුළු මහත් මිනිස් සංහතියටම දෙවන ලෝක යුද්ධයෙන් සිදුවූ බරපතල ජීවිත හා දේපළ හානි වලට වගකිව යුතු ජපාන පාලකයන් වෙත දැක්වූ ගෞරවයක් ලෙස විවිධ රාජ්‍යයන් විසින් හඳුන්වනු ලැබිනි.

විශේෂයෙන් අබේ දෙවන වර නැවත බලයට පත් වීමෙන් පසු ජපානය ආසන්න අසල්වැසි රටවල් වන චීනය සහ දකුණු කොරියාව සමග පැවතුණු සබඳතා දුර්වල මට්ටමකට ඇද වැටුණි. අබේ යසුකුනි දේවස්ථානයට සංචාරය කිරීම දෙරටේම විවේචනයට ලක් වූ අතර චීනයේ විදේශ ඇමති වරයා, "මෙම ක්‍රියාව ජපානය අතිශය භයානක දිශාවකට ගෙන යන බව" විස්තර කළේය.

තායිවානයේ නිදහස අපේක්ෂා කරන පෑන්- ග්‍රීන් සන්ධානයේ (Pan Green Coalition) සාමාජිකයන් වන තායිවානයේ දේශපාලකයන් අතර නිරන්තරයෙන්

අබේ ගෞරවයට පාත්‍ර වේ. 2020 ජනවාරි 20 වන දින අබේ සිය ප්‍රතිපත්ති කථාවේදී පුරා තුන් වතාවක් තායිවානය ගැන සඳහන් කළ අතර ඩයට් සාමාජිකයන්ගේ අත්පොළසන්ද ලැබිය. වසර 14 කට පසු ජපන් අග්‍රමාත්‍යවරයෙක් ව්‍යවස්ථාදායක මණ්ඩලය තුළ ප්‍රතිපත්ති කථාවකදී තායිවානය පිළිබඳව සඳහන් කළ පළමු අවස්ථාව මෙයයි.

එසේම තායිවානය පිළිබඳව සැළකීමේදී චීනය ගෙන යන වැඩ පිළිවෙල පිළිබඳ ෂින්සෝ අබේ දැඩි ආන්දෝලනාත්මක ප්‍රකාශයක් කළේය. ඒ, පැතිරී යන COVID 19 වෛරසය පිළිබඳව චීනය සිදු කරන සෞඛ්‍ය ආරක්ෂක කටයුතු වලින් තායිවානය බැහැර කර තැබීම පිළිබඳවයි. තායිවානය වෙනම රාජ්‍යයක් ලෙස නැගී සිටීමට උත්සාහ කළ ද චීනය විසින් එය චීනයේම කොටසක් ලෙස සලකමින් කටයුතු කරන අතර ජාත්‍යන්තර සංවිධාන වල සාමාජිකත්වය ලබා ගැනීමට ද අවස්ථාවක් නොදේ. මේ සම්බන්ධව පවතින ප්‍රබලම උදාහරණය ලෙස හඳුනා ගත හැක්කේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලය තුළ ස්ථිර සාමාජිකත්වය දරන බලවත් රාජ්‍යයන් පහ අතුරින් එක් රාජ්‍යයක් වූ චීනය, තම නිෂේධ බලය භාවිතා කරමින් තායිවානයට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීමට ඉඩ නොදීමයි.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ වසංගත වැළැක්වීමේ ක්‍රියාවලියෙන් තායිවානය දේශපාලන වශයෙන් බැහැර කර තිබීම පිළිබඳ ජපානයේ නිල ප්‍රතිපත්ති ස්ථාවරය සම්බන්ධව ෂුන් ඔටොකිටා (Shun Otokita ) විමසීමේදී ෂින්සෝ අබේ මෙසේ ප්‍රකාශ කළේය.

"තායිවානය ලෝක සෞඛ්‍ය සංවිධානයට බැඳීම අත්‍යවශ්‍යයි. වසංගත වැළැක්වීම සහ මහජන සෞඛ්‍ය ප්‍රතිපත්ති යන කරුණු යටතේ දේශපාලන ස්ථාවරයන් අවලංගු කළ යුතුය. එසේ නොවුනහොත් සමස්ථ කලාපයේම සෞඛ්‍ය පවත්වාගෙන යාම සහ වෛරසය පැතිරීම තවදුරටත් වළක්වා ගැනීම සහ ආසාදනය වීම වළක්වා ගැනීම දුෂ්කර ගැටළුවක් වනු ඇත."

2013 පෙබරවාරි වොෂින්ටනයේ උපායමාර්ගික හා ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානයේ පැවති දේශනයකදී අබේ අවධාරණය කළේ ජපාන-චීන සම්බන්ධතා වඩා වැදගත් අතර චීනය සමඟ පොදු උපායමාර්ගික අවශ්‍යතා

මත පදනම්ව අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සම්බන්ධතාවයක් ඇතිකර ගැනීමට ඔහු දක්වන කැපවීම ස්ථිර වන බවයි. එමෙන්ම චීනයේ නායකයින්ට ජපානයේ දොරටු සැම විටම විවෘත බවද හෙතෙම ප්‍රකාශ කළේ ය. එහිදී ෂින්සෝ අබේ ස්ථානෝචිත ලෙස චීනය සමඟ සම්බන්ධතා පැවැත්විය යුතු බව ප්‍රසිද්ධියේ පිළිගත්තේය. කෙසේ නමුත්, වර්තමානය වන විට ෂින්සෝ අබේ සූක්ෂම ලෙස විදේශ ප්‍රතිපත්ති මාලාවක් මඟින් චීන විරෝධී ආකල්ප ඉටු කර ගැනීමට උත්සාහ කරන ආකාරයක් දැකිය හැකිය.

**ආසියා- පැසිෆික් කලාපය සමඟ පවතින සබඳතා**

එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව හා පිලිපීනය සමඟ මෙන්ම ප්‍රධාන ආරක්ෂක ආයතන හා හවුල්කරුවන් සමඟ සහයෝගිතාවය වැඩි දියුණු කිරීමට අබේ පියවර ගෙන තිබේ. ඊට අමතරව අග්නිදිග ආසියාව සමඟ වැඩෙන ආරක්ෂක සම්බන්ධතා වැඩි දියුණු කිරීමටද ආයුද අපනයන පිළිබඳව දීර්ඝ කාලීන මූලධර්ම සංශෝධනය කිරීමටද කටයුතු කර ඇත.

පිලිපීනය වැනි සංවර්ධනය වෙමින් පවතින රටවලට ජපානය විසින් අරමුදල් සැපයීම, සමාජ හා ආර්ථික සංවර්ධනය උදෙසා තාක්ෂණය හුවමාරු කිරීම , ආපදා සහන වැනි විවිධාකාරයේ සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඊට අමතරව චීන මුහුදේ වැඩි වන චීන ස්ථාවරත්වය හා ආරවුල් සම්බන්ධයෙන් පිලිපීනය 2013 දෙසැම්බර් මාසයේ ආරක්ෂක මුර සංචාර නැව් 10ක් මාරු කරන ලෙස ඉල්ලා සිටියේය. මෙම මාරුව මඟින් අබේ හා පිලිපීන ජනාධිපති ඇක්විනෝ (Akwino) අතර ඉහළ මට්ටමේ සම්බන්ධතාවයක් ගොඩ නඟා ගැනීමට හැකි විය.

2014 දී අබේ සහ බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය ඩේවිඩ් කැමරන් (David Cameron) බ්‍රිතාන්‍ය සහ ජපාන විදේශ හා ආරක්ෂක අමාත්‍යංශ අතර වාර්ෂික උපදේශන රාමුවක් ස්ථාපිත කිරීමට එකඟ විය. අබේ 2014 දී ඕස්ට්‍රේලියාවේ ඇබට් රජය සමඟ ජපාන-ඕස්ට්‍රේලියානු ආර්ථික හවුල්කාරිත්ව ගිවිසුම (Japan-Australia Economic Partnership Agreement) අවසන් කළ අතර ජූලි මාසයේ ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුවේ ඒකාබද්ධ රැස්වීමක් ඇමතීය. ගිවිසුම ප්‍රකාශයට

පත් කරමින් ඔහු ඕස්ට්‍රේලියානුවන් දෙවන ලෝක යුද්ධයේ විදි දුක්ගැහැට ගැන තම ශෝකය ප්‍රකාශ කළේය. ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුව ඇමතූ ප්‍රථම ජපන් අගමැති ලෙස ඉතිහාසගත වන්නේ ද ෂින්සෝ අබේය.

නිදහස් වෙළඳාම පිළිබඳව ජාත්‍යන්තර නායකයෙකු ලෙස අබේ පැසසුමට ලක් වී ඇත. කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණයේ ප්‍රගතිය එක්සත් ජනපදය හා තවත් ආසියා පැසිෆික් රටවල් එකොළහක් සමග නිදහස් වෙළඳ ගිවිසුමක් වන ට්‍රාන්ස් පැසිෆික් හවුල්කාරිත්වය (Trans-Pacific Partnership-TPP) සම්පූර්ණ කිරීමට අබේ මූලික වී කටයුතු කරන ලදි. චීනය ජපානයේ ප්‍රධානතම ආර්ථික සගයා වුවද නැගෙනහිර චීන මුහුදේ ඩයෝයු, සෙන්කාකු දූපත් සම්බන්ධයෙන් තෝකියෝව මැතකදී බීජිං සමග ඇතිකරගත් ආරවුල් ඔවුන්ගේ ආර්ථික සම්බන්ධතාවයට ද ව්‍යාප්ත වී ඇත.

ට්‍රම්ප් (Trumph) විසින් TPP සහ ජපාන වෙළඳ භාවිතයන් ප්‍රතික්ෂේප කිරීම, අබේගේ ආර්ථික ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන් අවුල් කරනු ඇත බවට සැක පළ විය. ට්‍රම්ප් වෙනුවට ද්විපාර්ෂික එක්සත් ජනපද-ජපාන වෙළඳ ගනුදෙනුවක් අපේක්ෂා කරන බව වාර්තා විය. නමුත් මේ දක්වා අබේගේ රජයේ සාකච්ඡා ආරම්භ කිරීම සඳහා එක්සත් ජනපද ආරාධනා ප්‍රතික්ෂේප කොට ඇත. එක්සත් ජනපදයට සැළකිය යුතු ලෙස වඩා හොඳ ප්‍රතිඵලයක් ලබාගත හැකිනම් නැවත TPP හා සම්බන්ධ වීම ගැන සලකා බලන බව ද ට්‍රම්ප් පවසා ඇත.

2020 ඔලිම්පික් ජපානයේ තෝකියෝහි පැවැත්වීමට නියමිතව තිබුණි. කොරෝනා වෛරස් වසංගතයේ මුල් සතිවලදී ජපානයේ අගමැති ෂින්සෝ අබේ ටෝකියෝ 2020 ඔලිම්පික් උළෙල බේරා ගැනීමට උත්සාහ කරමින් සිටියේය. එහි නොවැළැක්විය හැකි බව පිළිගත් අබේ ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව සමඟ එකඟ වූයේ ගිම්හාන ක්‍රීඩා පළමු වරට කල් දැමීමටයි. ඒ අනුව 2021 ජූලි දක්වා තෝකියෝ ඔලිම්පික් ප්‍රමාද කරන ලදි. 2020 මාර්තු තෙවන සතියේ ජපානයට පැමිණි ඔලිම්පික් පන්දම දැල්වෙන බවත්, ක්‍රීඩා පැවැත්වෙන තෙක් එය රට තුළ දැල්වෙමින් පවතිනු ඇති බවත් අබේ මහතා The Nation on Saturday පුවත්පතට පැවසීය. "මෙම පන්දම අපි දැනට මුහුණ දී සිටින දිගු අඳුරු උමගෙන් පිටවීමට මානව වර්ගයාට මග පෙන්වන බලාපොරොත්තුවේ

ආලෝකය යි. මගේ අරමුණ ක්‍රීඩා මිනිස් සංහතියේ ජයග්‍රහණයේ සංකේතයක් බවට පත් කිරීමයි." යනුවෙන් ඔහු ප්‍රකාශ කළේය.

තෝකියෝ රජය ඇස්තමේන්තු කර ඇති පරිදි 2013 දී ලංසුව දිනා ගැනීමේ සිට 2030 තෙක් පැවතෙන තරඟ වලින් ජාතික ආර්ථිකයට ඩොලර් බිලියන 294 ක වර්ධනයක් ලැබෙනු ඇත. ඔහුගේ "අබෙනොමික්ස්" ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රබල සංකේතයක් මෙම ක්‍රීඩා මගින් ඉදිරිපත් කරයි.

2020 තෝකියෝ ඔලිම්පික්හි අනුග්‍රාහකයන් පවසන්නේ එය "ආර්ථික පණිවුඩ යැවීමේ ජාතික ක්‍රියාවක් වන අතර එමගින් රටේ කොටස් වෙළඳපල, සමාගම් සහ ප්‍රතිසංස්කරණ ජාත්‍යන්තරය තුළ පුළුල් කළ හැකි බවයි. එමෙන්ම එය ජපානයේ සංචාරක කර්මාන්තය සහ චීනයට නිරාවරණය වීම වැනි දේශීය ආර්ථික වර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීමේ මාර්ගයක් බවයි.

ෂින්සෝ අබේ සාම්ප්‍රදායිකව ඇමරිකාව, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව වැනි රාජ්‍යයන් සමඟ උපාය මාර්ගික සබඳතා පවත්වාගෙන යන අතර ඇමරිකාව, ඉන්දියාව වැනි රටවල් චීනය සමඟ පවත්වන දේශපාලනික හා ආර්ථික විරසක භාවය වාසිදායක ලෙස යොදාගැනීමට උත්සාහ කරන ආකාරය දැකිය හැකිය. අබේ 2007 දී ජපානය, ඇමරිකාව, ඕස්ට්‍රේලියාව හා ඉන්දියාව අතර චතුරස්‍රාකාර ආරක්ෂක සංවාදයක් (QSD- The Quadrilateral Security Dialogue) ආරම්භ කරන ලදි. 2007 අගෝස්තු මාසයේ දී ඔහුගේ තෙදින ඉන්දියානු සංචාරය නව ද්වීපාර්ශ්වික ආසියානු සන්ධානයක් ආරම්භ කළ අතර ඉන්දියාව හා ජපානය අතර මිත්‍රශීලි සබඳතා තර කරන ලදි.

2014 ජනවාරි මාසයේ දී දිල්ලියේ පැවති ඉන්දියානු ජනරජ දින පෙළපාලියට ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වු පළමු ජපන් නායකයා බවට අබේ පත් විය. තදින සංචාරයකදී ඔහු සහ අගමැති මන්මෝහන් සිං (Manmohan Sing) ආර්ථික සහ ආරක්ෂක ගැටළු සම්බන්ධයෙන් සහයෝගීතාවය වැඩි කිරීමට එකඟ වී අත්සන් තැබූහ. 2014 මැයි මාසයේදී ඉන්දීය අග්‍රමාත්‍ය ධූරයට පත් වීමෙන් පසු අබේ සහ නරේන්ද්‍ර මෝදි අතර සමීප සබඳතාවයක් අපේක්ෂා කරන ලදි. වර්තමානය වන විට ප්‍රබල චරිතයක් ගොඩ නඟා ගනිමින් සිටින මෝදි සිය ධූර කාලයේ පළමු විදේශ සංචාරය සඳහා 2014 සරත් සමයේ දී ජපානය

තෝරා ගැනීම තුළින් ජපානය හා ඉන්දියාව අතර පවතින සමීප සම්බන්ධතාවය තේරුම් ගත හැකිය.එම සංචාරයේදී මෝදි සහ අබේ 2014 සැප්තැම්බර් 01 වන දින ටෝකියෝ නුවර පැවති රැස්වීමකදී ජපානයේ විශේෂ උපාය මාර්ගික හා ගෝලීය හවුල්කාරීත්වය පිළිබඳව සාකච්ඡා (Tokiyo Declaration for India – Japan Special Strategic and global Partnership) සිදු කරමින් ද්විපාර්ශවික ගිවිසුමකට අත්සන් තැබීය. එසේම න්‍යෂ්ටික සහයෝගීතාව, දුර්ලභ පාංශු මූලද්‍රව්‍ය සහ ඒකාබද්ධ නාවික අභ්‍යාස ගිවිසුම් පිළිබඳව සාකච්ඡා කළහ. අබේගේ ප්‍රායෝගික ඉන්දියානු විදේශ ප්‍රතිපත්තිය වන්නේ ආසියාවේ තීරණාත්මක හවුල්කරුවෙකු ලබා ගනිමින් ජපානයේ පුනර්ජීවනය වන ආර්ථික දර්ශක ඉහළ නැංවීමයි.



*(ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි (Narendra Modi ) ජපාන අගමැති ෂින්සෝ අබේව උණුසුම්ව පිළිගත් අයුරු)*

2015 දෙසැම්බරයේදී අබේ සහ ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි ගිවිසුමක් අත්සන් කළ අතර ඉන්දියාව ජපානයේ ෂින්කන්සන් තාක්ෂණය (Technology of Shinkansen) මිලදී ගැනීමට එකඟ විය. මීට අමතරව මිලිටරි නොවන න්‍යෂ්ටික තාක්ෂණය ඉන්දියාවට විකිණීමේ යෝජනාවක් ද සාකච්ඡාවට ඇතුළත් විය. මේ පිළිබඳව විශ්ලේෂකයින්ගේ අදහස වූයේ න්‍යාෂ්ටික ගනුදෙනුව ජපානයේ කොටසක් ලෙසත් ආසියා පැසිෆික් කලාපයේ වැඩෙන චීන බලයට ප්‍රතිචාර දැක්වීමට ඉන්දියාව දරන උත්සාහයේ කොටසක් ලෙසත් ය.

2012 වර්ෂයේ මැතිවරණයෙන් පසු අගමැති අබේගේ අවධානය යොමු වූයේ නැගෙනහිර ආසියානු රටවල් කෙරෙහිය. එනම් වියට්නාමය, තායිලන්තය, ඉන්දුනීසියාව වැනි රාජ්‍යයන් කෙරෙහිය. ජපානය ආසියාන් (ASEAN) සමඟ මුහුදේ මෙන්ම අහසේ ආරක්ෂාව සහතික කිරීම සහ නාවික නිදහසට

සහයෝගය දක්වමින් පිලිපීනයට වෙරළ ආරක්ෂක නැව් දහයක්, ඉන්දුනීසියාවට මුර සංචාරක නැව් තුනක්, ඉන්දුනීසියාව, මැලේසියාව, පිලිපීනය යන රටවල නිළධාරීන්ට වෙරළාරක්ෂක මෙහෙයුම් පිළිබඳ තාක්ෂණික දැනුම හා පුහුණුව ලබා දෙන අතරම වියට්නාමය සමඟ ද අවබෝධතාවය වර්ධනය කර ගැනීමට කටයුතු කරයි.

අග්‍රාමාත්‍ය අබේ විසින් ආසියානු රටවල සිදු කළ සංචාරයකදී 2013 ජනවාරි 18 වන දින ජකර්තාහි පැවැත් වූ "විවෘත මුහුදේ ත්‍යාගයඃ ජපන් රාජ්‍ය තාන්ත්‍රිකභාවය සඳහා නව මූලධර්ම පහක් "යන මාතෘකාවෙන් යුත් කතාවේදී, කලාපයේ සහයෝගය වෙනුවෙන් දැඩි දායකත්වයක් ලබාදීම සඳහා මූලධර්ම පහක් හඳුන්වා දෙන ලදි.

1. විශ්වීය වටිනාකම් සහිත ආසියාන් සංවිධානයේ සාමාජික රටවල් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම , නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය හා මූලික මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

2. නිදහස් සහ විවෘත සාගර නීති රීති ඇති කිරීම මඟින් පාලනය වීම, සහතික කිරීම හා එක්සත් ජනපද කලාපය නැවත සමතුලිත කිරීම.

3. විවිධ ආර්ථික හවුල්කාරීත්ව ජාල හරහා වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධනය, වෙළඳ අගනගර හා සේවා ප්‍රවර්ධනය.

4. ආසියාවේ විවිධ සංස්කෘතික උරුමයන් හා සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම.

5. අන්‍යොන්‍ය අවබෝධය වර්ධනය කිරීම සඳහා තරුණ පරම්පරාව අතර හුවමාරුව ප්‍රවර්ධනය කිරීම.

මෙම මුලධර්ම තුළින් ජපානය ආසියාන්හි ප්‍රධාන ක්‍රියාකාරිකයෙකු ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන බව පැහැදිලි වේ.

අබේ සිය ආරක්ෂක හා විදේශ ප්‍රතිපත්තියේ බොහෝ සලකුණු තැබූ නායකයෙකි. අග්‍රාමාත්‍ය අබේ 2013 දෙසැම්බර් මාසයේ දී ජපානයේ පළමු ජාතික උපාය මාර්ගය ප්‍රකාශයට පත්කළ අතර එම මාසයේම ජපානයේ ජාතික ආරක්ෂක කවුන්සලය පිහිටුවන ලදි. මිට අමතරව 2015 සැප්තැම්බර් මාසයේ

දී සම්මත කරන ලද ආරක්ෂක පනත් කෙටුම්පත් මගින් ජපානයේ ආරක්ෂක කටුයුතු ජාත්‍යන්තර තලයට පුළුල් කරන ලදි. ජපාන රජය මෙය නම් කළේ 'සාමයට ක්‍රියාකාරී දායකත්වයක්' (Proactive contribution to peace) ලෙසය.

සාමූහික ආත්මාරක්ෂාව සඳහා සීමිත ප්‍රමාණයට ක්‍රියා කිරීමට ජපානයට මෙමගින් හැකිව තිබේ. එමෙන්ම ජපානය හා එක්සත් ජනපදය අතර නව ආරක්ෂක මාර්ගෝපදේශය සමඟ ජපානයේ ස්ව-ආරක්ෂක හමුදාවන්ට එක්සත් ජනපද සන්නද්ධ හමුදා සමග වඩාත් ගැඹුරින් සහයෝගයෙන් කටයුතු කළ හැකිවිය. ඊට අමතරව අබේගේ කැබිනට් මණ්ඩලය යටතේ ඇති ජපාන රාජ්‍ය ඔස්ට්‍රේලියාව, ඉන්දියාව, එක්සත් රාජධානිය හා ප්‍රංශය වැනි සමාන අදහස් ඇති රටවල් සමග ආරක්ෂක සහයෝගිතාව පුළුල් කරමින් සිටි.

2007 වර්ෂයේදී අබේ ජපානය ඉන්දියාව, ඔස්ට්‍රේලියාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ චතුරශ්‍රාකාර ආරක්ෂක සංවාදයක් දියත් කළේය. එය 2007 මැයි මාසයේ මැනිලා නුවරදී ද සැප්තැම්බර් මාසයේ බෙංගාල බොක්කේ මලබාර් අභ්‍යාසය වශයෙන්ද පුහුණුවීම් පවත්වනු ලැබීය.

**කොරියානු ජනරජය සමඟ පවතින සබඳතා**

අබේ ජපාන අග්‍රමාත්‍යවරයෙකු ලෙස විදේශ කටයුතු ක්ෂේත්‍රයේ අසාමාන්‍ය ලෙස ක්‍රියාකාරී වූ අතර 2012 දෙසැම්බර් සිට 2014 සැප්තැම්බර් දක්වා කාලය තුළ රටවල් 49 ක සංචාරය කළේය. ලෝක වේදිකාවේ ජපානයේ පැතිකඩ වැඩිදියුණු කිරීමෙන් සහ කලාපයේ අනෙකුත් රටවල් සමඟ ද්විපාර්ශ්වික සබඳතා තීව්‍ර කිරීමෙන් චීනය සමඟ මෙන්ම දකුණු හා උතුරු කොරියාව සමඟ ඇති දුර්වල සබඳතා මඟහරවා ගැනීමේ මාධ්‍යයක් ලෙස මෙම සංචාරයන් අර්ථකථනය කරන ලදි. ජපානයේ ජාත්‍යන්තර ව්‍යාපාරික ප්‍රජාව ප්‍රවර්ධනය කිරීම සහ වෙළඳ, බලශක්ති සහ ආරක්ෂක ප්‍රසම්පාදන ගණුදෙනු සඳහා මංපෙත් විවර කිරීම මගින් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වැඩිදුරටත් ක්‍රියාත්මක විය. අබේගේ තුන් වන ධූර කාලය තුළ අබේගේ යුද සංවත්සර ප්‍රකාශයෙන් පසුව දකුණු කොරියාව සමඟ ජපානයේ සබඳතා තරමක් දියුණු වී තිබේ. අබේ සහ දකුණු කොරියාවේ ජනාධිපති පාක් ගියුන්-හයි (Park Geun-hye) ඔවුන්ගේ පළමු

ද්විපාර්ශ්වික රැස්වීම 2015 නොවැම්බරයේ දී පැවැත්වූ අතර දෙවන ලෝක යුද සමයේදී ජපාන හමුදා විසින් ලිංගික බලහත්කාරකම් සඳහා යොදවා ගත් කොරියානු "ඊනියා සැනසිල්ලේ කාන්තාවන්"(Comfort Women) පිළිබඳ ගැටලුව එහිදී ඔවුන් දෙදෙනා විවෘතව සාකච්ඡා කළහ. මේ අනුව, උතුරු කොරියාව සමඟ මෙන්ම දකුණු කොරියාව සමඟද උපාය මාර්ගික සබඳතා පවත්වාගෙන යාමට අබේ සූක්ෂම වී ඇත.

**අනෙකුත් රටවල් සමඟ පවතින සබඳතා**

අබේ 2015 ජනවාරි මාසයේ මැද පෙරදිග සංචාරයකදී ඩොලර් බිලියන 2.5 ක ආධාර පැකේජයක කොටසක් ලෙස ඉස්ලාමීය ඉරාක සහ ලෙවන්ට් රාජ්‍යයට (Islamic State of Iraq and The Levant) එරෙහිව සටන් කරන රටවලට ජපානය ඩොලර් මිලියන 200ක මිලිටරි නොවන ආධාර ලබා දෙන බව නිවේදනය කළේය. ඔහු 2015 අප්‍රේල් මාසයේ දී එක්සත් ජනපද කොන්ග්‍රසයේ ඒකාබද්ධ රැස්වීමක් ඇමතීය. සිය කතාවේ දී ඔහු ජපාන-එක්සත් ජනපද සන්ධානය "බලාපොරොත්තුවේ සන්ධානය" ලෙස හැඳින්වූ අතර, ජපානය සන්ධානය තුළ වඩාත් ක්‍රියාකාරී ආරක්ෂාව සහ ආරක්ෂක කාර්යභාරයක් ඉටු කරන බවට පොරොන්දු විය. මෙම දේශනය ඔබාමා ජනාධිපතිධූරයේ අටවන එක්සත් ජනපද රාජ්‍ය සංචාරයක කොටසක් ලෙස සැලකූ අතර ජනාධිපතිවරයා එය හැඳින්වූයේ ඇමරිකාව සහ ජපානය අතර "මිත්‍රත්වයේ බැඳීම් සැමරීමක් " ලෙස ය.

2014 මැයි 30 වන දින අබේ, ආසියානු රටවල්, එක්සත් ජනපදය සහ ඕස්ට්‍රේලියාවේ නිළධාරීන්ට පැවසුවේ කලාපීය ආරක්ෂාව පවත්වාගෙන යාමේ දී ජපානයට විශාල කාර්යභාරයක් ඉටු කිරීමට අවශ්‍ය බවත්, එය දෙවන ලෝක යුද්ධයෙන් පසු පෙන්නුම් කර ඇති උදාසීනත්වයෙන් ඉවත්ව යන බවත් ය. භෞමික ආරවුල් විසඳීම සඳහා ඔහු වෙනත් රටවලට ජපානයේ සහය ලබා දුන් බව නොරහසකි. මෙලෙස දෙවන ලෝක යුද සමයේ පළුදු වූ ජපානයේ හොඳ හිත උපක්‍රමශීලීව ගොඩ නඟා ගැනීමට අබේට හැකි විය.

**ගිවිසුම් හා ජාත්‍යන්තර සංවිධානවල ක්‍රියාකාරිත්වය**

2007 වර්ෂයේදී ජර්මනියේ පැවති 33 වන G-8 සමුළුව ප්‍රංශ ජනාධිපති නිකොලස් සාකෝසි සහ ජපාන අගමැති ෂින්සෝ අබේගේ පළමු සමුළුව විය. 2007 දී අබේ උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (The North Athlantic Treaty Organization-NATO ) යුරෝපා සංගමය (Europian union-EU) ඉන්දියාව හා ඔස්ට්‍රේලියාව සමග ජපානයේ සම්බන්ධතා වර්ධනය කර ගැනීමට පියවර ගත්තේය. අබේ, ආසියා-පැසිපික් කලාපයේ තනි රටවල් සමග උපායමාර්ගික හවුල්කාරිත්වයක් ඇතිකර ගැනීමට අමතරව බහුවපාර්ශවික ආයතන ආයතන, විශේෂයෙන් ආසියාව සහ ජපානය ඔවුන්ගේ ආර්ථික සම්බන්දතා වලින් ඔබ්බට ගොස් කලාපයේ ආරක්ෂාව විශේෂයෙන්ම යාත්‍රාකිරීමේ සම්බන්ධතා නිදහස පිලිබදව වගකීම භාරගත හැකි පරිදි සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම පිළිබඳව අබේ සතුට පළ කළේය. 2013 අවසන් වනවිට ඔහු ආසියානු රටවල් දහය තුළම සංචාරය කොට තිබුණි. 2013 දෙසැම්බරයේදී 40 වන ජපාන-ආසියානු අනුස්මරණ සමුළුවට සත්කාරකත්වය දැක්වූයේ ජපානයයි.

එම අවස්ථාවේදී ජපාන-ආසියාන් ආරක්ෂක ඇමතිවරුන් සඳහා සංසදයක් පිහිටුවීමට ගිවිසුමක් ඇතිකර ගත්තේ ය. උතුරු අත්ලාන්තික් කවුන්සිලය ඇමතු පළමු ජපාන අගමැතිවරයා වූයේ ද අබේය. එහිදී අබේ ක්‍රියාකාරී විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමටත්, ගෝලීය වේදිකාවට අර්ථවත් කාර්යභාරයක් ඉටු කිරීමට හා සහයෝගයෙන් කටයුතු කිරීමටත්, නේටෝ සමග පොදු විශ්වාසයක් ගොඩනගා ගැනීමට කටයුතු කරන බවටත් අදහස් දැක්වීය.

ජාත්‍යන්තර ස්ථාවරත්වය සහ ආරක්ෂාව සඳහා ජපානය විශාල කාර්යභාරයක් ඉටු කිරීමේ අභිලාෂයෙන් නේටෝ සහ යුරෝපා සංගමය සමග සබඳතා ශක්තිමත් කිරීමට අබේ කටයුතු කර ඇත. 2014 මැයි 6 වන දින උතුරු අත්ලාන්තික් සමුළුව අමතමින් ඔහු ජපානය සහ නේටෝ ස්වාභාවික හවුල්කරුවන් ලෙස අර්ථ දැක්වීය. සෝමාලියාවේ වෙරළ තීරයේ සහ ඒඩන් (Aden) බොක්කෙහි මුහුදු කොල්ලකෑම් වැළැක්වීමට ජපාන-නේටෝ සහයෝගීතාව අපේක්ෂා කරයි.

2015 පැවති එක්සත් ජාතීන්ගේ සංගමයේ මහා සභාවේ වාර්ෂික මහා විවාදයේදී ලෝක නායකයින් අමතමින් ජපාන අගමැති ෂින්සෝ අබේ නිදහස් වෙළඳාම සඳහා ප්‍රබල අවස්ථාවක් ගෙන හැර දක්වමින් ස්වභාවික සම්පත් නොමැති රටවලට එහි ප්‍රතිලාභ ඉස්මතු කළේය.



*(ජපානයේ අගමැති ෂින්සෝ අබේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ හැත්තෑ තුන් වන සැසිවාරය අමතමින්)*

ජපානය සහ යුරෝපා සංගමය අතර පවතින "යුරෝපීය සංගමය-ජපාන ආර්ථික හවුල්කාරිත්ව ගිවිසුම" (The European Union Japan- Econpmic partnership Agreemnt- EPA) 2019 පෙබරවාරි 01 වන දා සිට ලෝක ආර්ථිකයෙන් තුනෙන් එකක් ආවරණය කිරීමට සමත් විය. ජපානය යුරෝපා සංගමයේ හය වන විශාලතම අපනයන වෙළඳපොළ වේ. 11 වන නැගෙනහිර ආසියානු සම්මේලනය (The East Asia Forum) 2013 අගෝස්තු මාසයේ දී අබේගේ නායකත්වය යටතේ ජපානයේ කියෝතෝ නගරයේ පැවැත්විණි.

එමෙන්ම 2019 පැවති G-20 ඔසාකා සමුළුවේ සභාපතිත්වය දරන ලද්දේ මෙතුමා ය. ජපානය එහි සභාපතිත්වය භාරගත් පළමු අවස්ථාව මෙයයි. ජාත්‍යන්තර ආර්ථික සහයෝගීතාවයේ ප්‍රමුඛතම සංසදය" වන G-20 සඳහා සත්කාරකත්වය සැපයීමේ ස්ථානය ඔසාකා වනු ඇත. එමඟින් බොහෝ සංවර්ධිත රටවල් සහ නැගී එන රටවල් ජාත්‍යන්තර ආර්ථිකයේ වර්ධනය වෙමින් පවතී. ඔසාකා සමුළුවේදී ජපානය නිදහස් වෙළඳාම හා නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම, ආර්ථික වර්ධනය සහ විෂමතා අවම කිරීම යන දෙකම සාක්ෂාත් කර ගනිමින් ගෝලීය ආර්ථික වර්ධනයට නායකත්වය දීමට කටයුතු කරයි. G7 රටවල් අතර එකම ආසියානු සාමාජිකයා වන්නේ ජපානයයි. G7 නායකයින් රැස්වීමට පැය කිහිපයකට පෙර අගමැති ෂින්සෝ

අබේ ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් (Emmanuel Macron) ජර්මානු චාන්සලර් ඇන්ජෙලා මර්කෙල් (Angela Merkel) සහ කැනේඩියානු අගමැති ජස්ටින් ටෘඩෙවු (Justin Trudeau) සමඟ වෙනම සාකච්ඡා පැවැත්වීය. අබේ සිය සගයන් තිදෙනා සමඟ උතුරු කොරියාව විසින් එල්ල කර ඇති ආරක්ෂක තර්ජනය පාලනය කිරීම සඳහා "සමීපව සහයෝගයෙන් කටයුතු කිරීමට" එකඟ වූ බව විදේශ අමාත්‍යාංශයේ නිලධාරීහු පවසති. මීට අමතරව නැගෙනහිර කලාපයේ ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීමට ද එහිදී අබේ කටයුතු කර ඇත.

2015 වසරේදී අබේ විසින් ඉන්දීය අගමැති මෝදි සමග න්‍යෂ්ටික බලය හුවමාරුව සම්බන්ධ ගිවිසුමකට අත්සන් කරන ලදි. 2018 ටෝකියෝහි අග්‍රාමාත්‍ය කාර්යාලයේදී පැවති රැස්වීමේදී අගමැති ෂින්සෝ අබේ සහ ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන දෙරට අතර ද්විපාර්ශ්වික ආරක්ෂාව සඳහා කටයුතු කිරීමට ද ඉන්දු-පැසිෆික් කලාපයේ සමුද්‍රීය ආරක්ෂාව පිළිබඳ ද්විපාර්ශ්වික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමට ද එකඟ විය.

## ගත හැකි ආදර්ශ

ෂින්සෝ අබේ ජාත්‍යන්තරය තුළ තම නාමය ඉහළින්ම බැබලවූ නායකයෙකි. ඔහුගේ දේශපාලන ජිවිතයේ වැදගත් අවස්ථාවලදී ඔහු ක්‍රියාකල ආකාරය සැලකිල්ලට ගැනීමේ දී අපට ඔහුගෙන් ගත හැකි ආදර්ශ බොහෝමයක් තිබේ.

අගමැති ධූරය දක්වා ඔහු ආ ගමන් මග ඉතාමත් දිගු ගමනකි. එහිදී ඔහු ජපානයේ අගමැති ලෙස කටයුතු කිරීම දක්වා ඔහු ලබාගත් සියලු ජයග්‍රහණ ඔහුගේ ඉලක්කය හඹායෑමේ දී ඔහුගත් දූරදර්ශී හා සෘජු තීරණයන්ගේ ප්‍රතිඵලයකි.

ෂින්සෝ අබේ කිසිවිටකත් අභියෝගවලට මුහුණ දීමට භය වූ පුද්ගලයෙකු නොවේ. චීනය සමඟ දකුණු මුහුදේ අයිතිය පිළිබඳ ඇති වූ ආරවුල් දී ද අබේ කටයුතු කළේ සෘජු හා ස්ථිර ආකාරයෙනි. චීනය සමග පමණක් නොව උතුරු කොරියාවේ නොහික්මුණු න්‍යෂ්ටික අත්හදා බැලීම් කෙරෙහිද අබේ සෘජු

මතයක පිහිටා කටයුතු කලේය. නායකත්වය දැරීමේ දී අබේ මෙන් තැනට ගැලපෙන ආකාරයට අපද සෘජු මෙන්ම ස්ථිර ලෙස තීරණ ගත යුතුයි.

අබේ ඉතාමත් දූරදර්ශී පුද්ගලයෙකි. රටට ඉදිරියේ දී මුහුණ දීමට සිදුවන ගැටලු කල්තියාම හඳුනාගත්තේය. දෙවන ලෝක යුද්ධය නිසා ජපානයට සිදුවූ අලාභ හානි අවම කර ගැනීමේ අරමුණින් 09 වන ව්‍යවස්ථාව ගෙන එන ලද අතර එහි සඳහන් වන්නේ ජපානය කිසිදු රටක් සමග යුද ප්‍රකාශ කර නොගන්නා බවයි. නමුත් වර්තමානයේ ජපානය උතුරු කොරියාව සමග පවතින අමනාපකම් හේතුවෙන් අබේ විසින් 09 වන ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කළ යුතු බව ප්‍රකාශ කර සිටියේය. එමගින් රටට හමුදා බලයක් ස්ථාපිත කිරීම අරමුණු විය. තම ආරක්ෂාව තමා විසින්ම සපයා ගැනීමේ අරමුණු පෙරදැරි කරගෙන ඔහු මෙම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එනු ලැබූ අතර මේ සඳහා ඩයට් සභාවේ අනුමැතිය හිමි වුවද ජනතා ප්‍රසාදය දිනා ගැනීම මෙන්ම තවත් දේශපාලකයින් අති බහුතරයකගේ කැමැත්ත අවශ්‍ය වේ. අබේ විසින් මෙමගින් සිදු කොට ඇත්තේ මින් පෙර කිසිදා දේශපාලන නායකයෙකු විසින් ජපානය සඳහා නොකළ දෙයකි. ඒ අනුව තම රට වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කරන පුද්ගලයකු ලෙස අබේව හඳුනාගත හැක.

අනාගතය පුරෝකථනය කරමින් සැබෑ නායකයෙකු ලෙස රට හමුවේ ඉදිරියේදී පැමිණිය හැකි බාධා හඳුනගෙන ඒ සඳහා කල්තියාම සූදානම් වීම ඔහුගේ පුරුද්දකි. වත්මන් අන්තර්ජාතික දේශපාලන වාතාවරණය තේරුම්ගෙන ඉදිරියේ දී ආසියාව තුළ බලවතුන් වීමේ අරගලයක යෙදී සිටින චීනයෙන් හා අනෙකුත් රටවල්වලින් තම දේශය ආරක්ෂා කිරීමට ඔහු උත්සුක විය. ලොව වැඩිම රටවල් ප්‍රමාණයක් සමඟ නාවික අභ්‍යාස වල යෙදෙන රට ලෙසද ජපානය පත් වූයේ ඒ නිසාය. රටක ගැටලු නිරාකරණය පමණක් නොව අපටද අපගේ අනාගතයේ ඇති විය හැකි ගැටලුකාරි තත්වයන් අවබෝධ කරගෙන ඊට පෙර සිටම සූදානම් වීම ජීවිතයේ සාර්ථකත්වයට ගත හැකි ධනාත්මක පියවරකි.

2020 ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ජපානයට හිමි විය. එය ඔවුන් ලබා ගත්තේ දිර්ඝකාලීන උත්සහයක ප්‍රතිඵලයක් ලෙසිනි. ඔවුන් ඔලිම්පික් ක්‍රීඩා උළෙලට ඇමෙරිකානු ඩොලර් බිලියන 12.6ක පමණ අයවැයක් වියදම් කිරීමට

සූදානම් කොට තිබිණි. නමුත් නොසිතූ ලෙස Covid -19 වෛරසය ව්‍යාප්ත වීම නිසා එය 2021 දක්වා කල් දැමීමට සිදුවිය. නමුත් අබේ කිසි විටකත් මෙවැනි අභියෝග හමුවේ පසුගාමී වූයේ නැත. එය 2021 දී මීට වඩා සාර්ථකව පැවැත්වෙනු ඇත.

එසේම ඔහු තම මුල්ම වගකීම Covid -19 වෛරසයෙන් රටේ ජනතාව බේරා ගැනීම බව තේරුම් ගත්තේ ය. ඒ නිසා ජපානය Covid -19 වෛරසය සාර්ථකව පාලනය කර ගනිමින් සිටී. එහිදී ද ඔහු කටයුතු කළේ ඉතාමත් වගකීම් සහගතවය. ගැටලු කිහිපයක් එකවර ඇති වූ විට වෙන් වෙන් වශයෙන් ඒ ගැටලු තේරුම් ගෙන සාර්ථකව පිළිතුරු සෙවීමත්, මුලින් කළ යුතු දේ මුලින් කිරීමත් ඔහුගේ පුරුද්දකි. ඕනෑම කෙනෙකුට සාර්ථකව ගැටලුවලට පිළිතුරු සෙවීමට එය කදිම උපක්‍රමයකි.

## සාරාංශය

සමුරායිවරුන්ගේ දේශයට පරමාණු අළු මතින් නැගිට ආසියාවේ තාක්ෂණික බලාගාරය දක්වා පරිවර්තනය වීමට නායකයන් බොහොමයකගේ මග පෙන්වීම ලැබුණි. ඒ අතරින් ෂින්සෝ අබේ නම් මේ සොඳුරු මිනිසා විශේෂ ස්ථානයක් හිමිකර ගනී. දශක කීපයක් අඛණ්ඩව පැවත ආ දේශපාලන හා ආර්ථික ඒකාග්‍රතාවයෙන් මිදී රටක් ලෙස තව තවත් ඉහලට ජපානය රැගෙන යාමට අබේ කටයුතු කළේය. සුන්දර ජපානය ආලෝකමත් කිරීමට අබේගේ ක්‍රියා කලාපය බලපෑවේය. ස්වභාවික උපද්‍රව හා වෙනත් අර්බුද හේතුවෙන් දේශපාලනමය හා ආර්ථිකමය වශයෙන් ජපානය මද පසුබෑමකට ලක් වුවද සංශෝධන හා ප්‍රතිසංස්කරණ ගෙන එමින් ජපානයේ ආර්ථිකය ශක්තිමත් කළ අබේ ඒ හරහා රටේ දේශපාලනය ස්ථාවර කළේය. එමඟින් රට නෛතිකව ගොඩ නැංවීමට මේ අපූරු මිනිසාට හැකි විය. එමෙන්ම වඩාත් ක්‍රියාකාරී කාර්‍ය ක්ෂම විදෙස් ප්‍රතිපත්ති රටට හඳුන්වාදුන්නේ ය. දේශීයත්වය හඳුනාගනිමින් දේශප්‍රේමී අධ්‍යාපනය රට තුළ ප්‍රචලිත කිරීමට ඔහු උත්සාහ ගත්තේය. ඒ අනුව ජපානය සතු සංස්කෘතික කලා අංගයන් සඳහා මෙන්ම සාම්ප්‍රදායික ඉගැන්වීම්

සඳහා නව වටිනාකමක් ගොඩ නැංවීමට හැකි විය. අබේගේ නායකත්වය යටතේ ජපානයේ ආරක්ෂාව කෙරෙහි දැඩි අවධානයක් යොමුවූ අතර ආරක්ෂාව සඳහා සිදුකරන ආයෝජනද වැඩි කෙරිණි. විශේෂ ආරක්ෂක ප්‍රතිපත්තියක් හඳුන්වා දෙමින් ජපානයේ ආරක්ෂාව ඉතා හොඳින් ඉහළ නැංවීමට ෂින්සෝ අබේට හැකියාව ලැබිණි.

කුඩා අවධියේ පටන් තම පවුලේ ආභාෂයට යමින් දේශපාලනයට පිවිසි අබේ සෑම විටම උත්සහ කළේ අනෙකුත් රාජ්‍යන්ට ඉහළින් තම නිජ භූමිය ඔසවා තැබීමටයි. ඒ සඳහා තම රාජ්‍ය සතු මෘදු බලය සූක්ෂම අයුරින් යොදා ගැනීමට අබේට හැකි විය. දෙවන ලෝක යුද සමයේ සෑම රාජ්‍යකම අපහාසයට සහ කොන් කිරීමට ලක්ව තිබූ ජපානය නැවතත් අනෙකුත් රාජ්‍යන් සමඟ මුහු කිරීමට ජපාන නායකයින් ගත් උත්සහය අගය කළ යුතුමය. ඒ අතරින් අබේ වැනි නායකයින් තම විදේශ ප්‍රතිපත්තීන් ඉතා උසස් ලෙස මෙහෙයවමින් අනෙකුත් රාජ්‍යයන්ගේ හොඳ හිත දිනා ගැනීමට කටයුතු කළේය.

සකුරා දේශයට අනෙකුත් රාජ්‍යයන් අතරින් ප්‍රතාපවත් යෝධයෙක් ලෙස නැගී ඒමට හැකියාව ලැබුණේ අබේ වැනි ස්ථානෝචිත කාර්යශූර්ය නායකයන් නිසාය. වර්තමානය වන විට ජපානයෙන් නොනැවති අනෙකුත් රාජ්‍යයන් දියුණු කිරීම සඳහා මේ මිනිසා කටයුතු කරන්නේ කිසිදු පැකිලීමකින් තොරවය. වර්තමානය වන විට තම රාජ්‍යය පමණක් නොව ජාත්‍යන්තරය තුළ හඬක් නැගිය නොහැකි සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්ගේ සුබසාධනය උදෙසා ද අතහිත දෙමින් ජපානය ,ජාත්‍යන්තරය තුළ වැදගත් භූමිකාවක් ඉටුකරන රාජ්‍යයක් බවට පරිවර්තනය වී ඇත. එය නායකත්වයේ කැපී පෙනෙන ලක්ෂණයකි.

වත්මන් අගමැති ලෙස තම දෙවන ධූර කාලය ගත කරමින් සිටින අබේ තම ධූර කාලය අවසන් වනවිට සකුරා දේශය මුළුමහත් ලෝකයටම ''ජපනා හපනා" බව පසක් කර දෙමින් තාක්ෂණයෙන් පමණක් නොව අනෙකුත් ක්ෂේ හි ද දැවැන්තයෙකු බව ලොවටම පෙන්වා දෙන බව නොඅනුමානය.

## මූලාශ්‍ර නාමාවලිය

France 24. (2019). Tokyo 2020 Olympics unveil final budget of $12.6 billion. [online] Available at: https://www.france24.com/en/20191220-tokyo-2020-olympics-unveil-final-budget-of-12-6-billion [Accessed 13 Apr. 2020].

East Asia Forum. (2019). The enigma of Shinzo Abe's legacy. [online] Available at: https://www.eastasiaforum.org/2019/11/25/the-enigma-of-shinzo-abes-legacy/ [Accessed 13 Apr. 2020].

www.world-nuclear.org. (n.d.). Fukushima Daiichi Accident - World Nuclear Association. [online] Available at: https://www.world-nuclear.org/information-library/safety-and-security/safety-of-plants/fukushima-daiichi-accident.aspx.

Balmer, E. (2020). What would it cost Japan to cancel the Olympics? The Japan Times Online.[online]12Mar.Available at:https://www.japantimes.co.jp/news/2020/03/12/national/cost-japan-cancel-olympics/ [Accessed 13 Apr. 2020].

Encyclopedia Britannica. (n.d.). List of prime ministers of Japan. [online] Available at: https://www.britannica.com/topic/list-of-prime-ministers-of-Japan-1812632.

WorldAtlas. (n.d.). The Largest Islands in Japan. [online] Available at: https://www.worldatlas.com/articles/the-largest-japanese-islands.html [Accessed 19 Apr. 2020].

Profile: Shinzo Abe. (2017). BBC News. [online] 23 Oct. Available at: https://www.bbc.com/news/world-asia-19725705 [Accessed 19 Apr. 2020].

Library, C.N.N. (n.d.). Shinzo Abe Fast Facts. [online] CNN. Available at: https://edition.cnn.com/2013/01/10/world/asia/shinzo-abe---fast-facts/index.html [Accessed 19 Apr. 2020].

# ජවහර්ලාල් නේරු



**කණ්ඩායම් සාමාජිකයන් :**

- ජී. එන්. ඉෂිනි සෙව්වන්දි
- එච්. යූ. ඩී. කීර්තිසිංහ
- ඩබ්. එම්. එච්. එච්. කේ. වීරසිංහ
- කේ. වී. සඳුනි ඉමාෂා
- එස්. ඒ. එන්. පී. සේනාධීර
- හංසිමා රත්නායක
- වයි. එම්. යූ. එස්. යාපා

## හැඳින්වීම

බ්‍රිතාන්‍ය කිරීටයෙන් නිදහස උදෙසා ලොව පුරා දියත් වූ නිදහස් අරගලයන් අතර ඉන්දීය නිදහස් ව්‍යාපාරය ප්‍රමුඛත්වයට පත්වෙයි. ඉන්දීය නිදහස් අරගලයේ පුරෝගාමීන්ගේ ලැයිස්තුවේ ඉහළින්ම සනිටුහන් වී ඇති චරිතයක් ලෙස ශ්‍රී ජවහර්ලාල් නේරුතුමාගේ නාමය සඳහන් කළ හැකිය. බ්‍රිතාන්‍යයන්ගේ මැදිහත් වීමෙන් පරාධීන ජාතියක් බවට පත්ව සිටි ඉන්දියානුවන් ස්වාධීන කිරීමට අවශ්‍ය මාර්ගය හෙළි පෙහෙළි කරමින් මහත්මා ගාන්ධිතුමා සමඟ අවිහිංසාවාදී අරගලයට පණ පෙවූ මෙතුමා ලෝක ජනයාගේ ගෞරවාදරයට පාත්‍ර වන්නේය. එවන් සුවිශිෂ්ට චරිතයක ලෝක සම්ප්‍රාප්තියේ සිට ජීවිත අවසානය දක්වාම ඔහුගේ චරිතාපදානය මෙමඟින් විස්තර කෙරේ. නේරුගේ ළමා කාලය, පවුල් පසුබිම, දේශපාලනයට පිවිසීම සහ ඉන්දීය නිදහස් අරගලයේ ඔහුගේ දායකත්වය යන ප්‍රධාන තේමා යටතේ කරුණු පෙළ ගස්වා ඇත.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම


*(නේරු ළමා අවධියේදී)*

1889 නොවැම්බර් මස 14 වැනි දින බ්‍රිතාන්‍ය ඉන්දියාවේ අලහබාද් නුවරදී ජවහර්ලාල් නේරු (Jawaharlal Neru) උපත ලැබීය. මොහුගේ පියා වූයේ ධනවත් බැරිස්ටර්වරයෙකු වූ මෝටිලාල් නේරුය. ඔහු දෙවරක් එනම් 1919 සහ 1928 යන වර්ෂ වලදී ඉන්දියානු ජාතික කොංග්‍රසයේ සභාපතිවරයා ලෙස පත්විය. ඔහුගේ මව වූයේ කාශ්මීරයේ ප්‍රසිද්ධ බ්‍රාහ්මීය පෙළපතකින් පැවත එන සුවරූප්‍රානි තුසු ය. ඇය ඔහුගේ දෙවැනි භාර්යාව වූවාය. දරුවන් තිදෙනෙකුගෙන් යුත් පවුලේ වැඩිමහල් දරුවා වූයේ නේරු ය. ඔහුගේ සොහොයුරියන් අතරින් විජයලක්ෂ්මි පසුකාලීනව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලයේ ප්‍රථම කාන්තා සභාපතිවරිය ලෙස පත්වන්නීය.

බාල සොහොයුරිය වූ ක්‍රිෂ්ණා හතිසිං (Krishna Hutheesing) ලේඛිකාවක් වූ අතර ඇගේ සහෝදරයා පිළිබඳ ග්‍රන්ථ රැසක්ම රචනා කර ඇත. නේරු තම ළමාවිය විස්තර කරන්නේ සැඟවුණු සහ අනාරක්ෂිත එකක් ලෙසයි. ධනවත් පවුල් පසුබිමක් තුළ හැදී වැඩුණු ඔහු අධ්‍යාපනය ලැබුවේ පුද්ගලික ගුරුවරුන් හා උපදේශකවරුන් යටතේය. ඔහුගේ උපදේශකවරයෙකු වූ ෆර්ඩිනන් ටී. බ්රූක්ස් (Ferdinand T.Brueks) යටතේ විද්‍යාව හැදෑරූ ඔහු එම විෂයට වඩාත් ප්‍රියතාවයක් දැක්වීය. එසේම බෞද්ධ හා හින්දු දර්ශනය හැදෑරීමට ද වඩාත් උනන්දුවක් ඔහු තුළ විය.

නේරු ඉතාමත් උද්යෝගිමත් තරුණයෙක් විය. දෙවන බෝර් යුද්ධය සහ රුසියානු - ජපන් යුද්ධය ඔහුගේ උද්වේගකර හැඟීම් අවුස්සන්නට විය. පසුකාලීනව ඔහු මෙසේ ලියා ඇත: “ජාතිමාමක ජපන් විජයග්‍රහණය හේතුවෙන් මාගේ මනස පිරී ඉතිරී ගොසින්ය. යුරෝපා වහල්භාවයෙන් ඉන්දියාව සහ ආසියාව නිදහස ලැබිය යුතු බව මම ප්‍රකාශ කරමි”. 1905 දී ඔහු සිය ආයතනික අධ්‍යාපනය එංගලන්තයේ හැරෝහි (Harrow) ප්‍රධාන පෙළේ පාසලකින් ඇරඹීය. එහි දී ජී. එම්. ට්‍රෙවිලියන්ගේ (G. M. Trevelyan) ගරිබල්ඩි (Garibaldi) පොත් ඔහු කෙරෙහි විශාල බලපෑමක් ඇති කරන ලදී. ඔහු ‘ගරිබල්ඩි’ සැලකුවේ විප්ලවවාදී වීරයෙකු ලෙසය.

නේරු, 1907 වර්ෂයේ වැඩිදුර අධ්‍යාපනය සඳහා කෙම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයට ඇතුළත් වූ අතර 1910 වර්ෂයේ දී ස්වභාවික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියකින් ඔහු පිදුම් ලැබුවේය. මෙම කාල පරිච්ඡේදය තුළදී ඔහු දේශපාලනය, ආර්ථික විද්‍යාව මෙන්ම සාහිත්‍ය පිළිබඳව ද ගැඹුරු අධ්‍යයනයක යෙදුණේය. බර්නාඩ් ෂෝ (Bernard Shaw), එච්. ජී. වෙල්ස් (H. G. Wells), ජෝන් මේනාර්ඩ් කේන්ස් (John Maynard Keynes), බර්ට්‍රන්ඩ් රසල් (Bertrand Russell), ලෝස් ඩිකින්සන් (Lowes Dickinson) සහ මෙරඩිත් ටවුන්සෙන්ඩ්ගේ (Meredith Townsend) ලේඛන නේරුගේ දේශපාලන හා ආර්ථික චින්තනයන් පෝෂණය කරන ලදී. 1910 දී උපාධිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව නේරු ලන්ඩනයට ගොස් නීතිය හදාරන්නට විය. ඒ අනුව 1921 දී ඔහු නීතිඥ සංගමයට බැඳී ඇත.

ඉන්දියාවට ආපසු පැමිණීමෙන් පසු 1912 අගෝස්තුවේ දී නේරු අලහබාද් නුවර (Allahabad) මහාධිකරණයේ නඩුකාරවරයෙක් ලෙස පෙනී සිටියේය. ඔහු සිය පියා මෙන් දක්ෂ නීතිඥවරයෙකු නොවූ අතර ඔහු තම වෘත්තියෙන් කිසිවිටෙකත් ආත්ම තෘප්තියක් නොලැබුවේය. ඔහු ජාතිකවාදී දේශපාලනයට ප්‍රවේශ වීමත් සමඟ ඔහුගේ වෘත්තිය මෙන්ම දිවිය ද නවමු මගකට යොමු විය.



*(නේරු අලහබාද් මහාධිකරණයේදී )*

## <u>නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව</u>

බ්‍රිතාන්‍ය සමයේ ශිෂ්‍යයෙකු ලෙස මෙන්ම නීතිඥයෙකු ලෙස සිටි අවධියේ පටන් නේරු දේශපාලනය පිළිබඳ දැඩි උනන්දුවක් දක්වීය. 1912 දී ඉන්දියානු ජාතික කොංග්‍රසය මඟින් පවත්වන ලද වාර්ෂික සැසියකට නේරු සහභාගී විය. මේ කාලය වන විට ඉන්දියානු ජාතික කොංග්‍රසය මධ්‍යම පාන්තික හා ප්‍රභූවරුන්ගේ පක්ෂයක් විය. මෙම ඉංග්‍රීසි උගත් ප්‍රභූ පැළැන්තිය පිළිබඳව නේරු කලකිරී සිටියේය. කොංග්‍රසයේ කාර්යක්ෂමතාව පිළිබඳ දැඩි කලකිරීමකින් පසුව වුවද 1913 දී ජාතික ව්‍යාපාරයේ වැඩ කටයුතු සඳහා අරමුදල් එකතු කිරීමේ අවස්ථාවේ දී පක්ෂයට සම්බන්ධ වැඩ කිරීමට තම කැමැත්ත ප්‍රකාශ කරන ලදී. පසු කලෙක බ්‍රිතාන්‍ය පාලන සමයේ දී බ්‍රිතාන්‍යයන් විසින් අනෙක් යටත් විජිත වලට රැගෙන

යන ලද ඉන්දීය ජාතික කම්කරුවන් මුහුණ පෑ ගැටලු වලට හා එම රටවල දී සිදු වූ වෙනස්කම් වලට එරෙහිව නැඟී සිටීමට ද මොහු කටයුතු කරන ලදී.

පළමු ලෝක යුද්ධයේ ආරම්භයත් සමඟ ඉන්දීය ජනතාව එතෙක් බ්‍රිතාන්‍ය පාලනය පිළිබඳව දක්වූ ආකල්පය ප්‍රසිද්ධියේ දෙකට බෙදී යන්නට විය. එහිදී නිහතමානීව හා සුහදශීලීව බ්‍රිතාන්‍යය ජාතිකයන් ඇසුරු කළ ඉන්දියානුවෝ විශාල වශයෙන් සතුටට පත් වූහ. ඇතැම් ඉහළ පාන්තික ඉන්දියානුවන් මිත්‍ර පාක්ෂිකයන් සමඟ පොර බදින්නට විය. මෙහිදී නේරු මෙම යුද්ධය පිළිබඳ ඉතා සතුටට පත් නොවුණා මෙන්ම කනගාටුවට ද පත් නොවුණි. එනම් ඔහු එහිදී මිත්‍ර හැඟීම් සහිත අයෙකු විය. ෆ්‍රෑන්ක් මෝරාස් (Frank Moras) පවසන ආකාරයට මෙම යුධ සමයේදී නේරු ප්‍රංශය ඇතුලුව අනෙක් සෑම රටක් කෙරෙහිම තම අනුකම්පාව දක්වන ලදී. මෙම යුද්ධය අතරතුර නේරු ශාන්ත ජෝන් (St.John) ගිලන් රථ සේවයේ ස්වේච්ඡා සේවකයෙකු ලෙස සේවය කළ අතර ඔහු එහි අලහබාද්හි ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් අයෙකු විය.

1930 වන විට යුරෝපයේ සිදු වූ නැඟී සිටීම පිළිබඳ නේරු සැලකිලිමත් විය. එය ක්‍රමක්‍රමයෙන් වර්ධනය වූ අතර තවත් ලෝක යුද්ධයක පෙර නිමිත්තක් ඒ තුළින් දක්නට ලැබුණි. සුභාෂ් චන්ද්‍රබෝස් (Subash Chandrabose) වැනි ජාතික ව්‍යාපාරයේ නායකයින් සමඟ නේරු ඉතා සමීපව කටයුතු කරන ලදී. එහිදී ඔහු ලොව පුරා නිදහස් හා යටත්විජිත රාජ්‍යයන් සමඟ හොඳ සබඳතාවයක් ඇති කර ගැනීමට කටයුතු කරන ලදී. කෙසේ වෙතත් 1930 අගභාගය වන විට බ්‍රිතාන්‍යයින් ඉන්දියාවෙන් පලවා ඉන්දියාව ස්වාධීන කිරීමට ෆැසිස්ට්වාදීන්ගේ උපකාරය ලබා ගැනීමට සුභාෂ් චන්ද්‍රබෝෂ් එකඟ විය. මේ කාලයේ දී ෆ්‍රැන්සිස්කෝ ෆාරාන්හෝගේ (Fransisco Farahnho) ස්පාඤ්ඤ සිවිල් යුද්ධයට එරෙහිව සටන් වැදි රිපබ්ලිකානුවන්ට නේරු විසින් සහය ලබාදෙන ලදී. එවකට ඉතාලිය පාලනය කළ ඒකාධිපති පාලකයෙකු වූ බෙනිටෝ මුසෝලිනී (Benito Mussolini) හමුවීමට ඔහු අකමැති වූ අතර එය ප්‍රතික්ෂේප කරන ලදී. අධිරාජ්‍යවාදීන් පාලනය කරන ලද ඉන්දියාවේ ප්‍රාන්ත ප්‍රදේශවල ජනතාව මුහුණපාන ගැටලු හා ඔවුන්ගේ ප්‍රශ්න වෙනුවෙන් කතා කරන ලද පළමු ජාතිකවාදී නායකයින් අතර නේරු ද විය. එම හේතූන් මත 1923 දී ඔහු නභා,

(Nabha) නම් රාජ්‍යයක සිරගත කරන ලදී. බ්‍රිතාන්‍ය පාලනය යටතේ ඉන්දියානු ජාතිකවාදී ව්‍යාපාරය එක් සීමාවකට කොටු වූ ව්‍යාපාරයක් විය. මේ තත්ත්වය තුළ ජනතාවගේ අරගලය ස්වාධීනත්වය උදෙසා කරන ජාතික ව්‍යාපාරයේ කොටසක් බවට පත් කිරීමට නේරු කටයුතු කරන ලදී. ඒ අනුව 1927 දී සමස්ත ඉන්දියානු රාජ්‍ය සම්මේලනය පිහිටුවන ලදී. වසර ගණනාවක් තිස්සේ ඉන්දියාවේ විවිධ ප්‍රාන්ත රාජ්‍ය වල ජනතාවගේ ගැටලු වෙනුවෙන් පෙනී සිටි නේරු 1939 දී එම සංවිධානයේ සභාපති ධූරයට පත්විය. ඉන්දියාව දේශපාලනික වශයෙන් ඒකාබද්ධ කිරීමට මේ ආකාරයෙන් නේරු දැක්වූ දායකත්වය අතිමහත්ය.

**1929 නිදහස පිළිබඳ ප්‍රකාශනය**

බ්‍රිතාන්‍ය සමග මිත්‍ර සබඳතා ඇති කරගෙන සිටි පුද්ගලයින් පිළිබඳව අප්‍රසාදය පල කළ නේරු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය සමග පවතින සියලු මිත්‍ර සබඳතා පැහැදිලි ලෙස සම්පූර්ණයෙන්ම විසුරුවා හැරීමට කොංග්‍රස් පක්ෂය අධිෂ්ඨාන කරගත යුතු බව ප්‍රකාශ කළ පළමු ජාතික නායකයින් අතර අයෙක් විය. ඒ පිළිබඳ ගාන්ධිගේ විවේචනයයන් නොතකා 1972 දී කොංග්‍රසය පවත්වන ලද මද්‍රාස් (Madras) සැසියේ දී නිදහස සඳහා වූ යෝජනාව ඉදිරිපත් කරන ලදී. ඒමෙන්ම එවකට ඔහු ඉන්දියාව නිදහස් කර ගැනීමේ අරමුණින් කොංග්‍රස් පක්ෂය තුළම 'ඉන්දියානු ලීගය සදහා නිදහස' (Independence for India League) නමින් බලපෑම් කණ්ඩායමක්  නිර්මාණය කළේය. 1928 දී ගාන්ධි ද නේරුගේ මෙම ඉල්ලීම් වලට එකඟ වූ අතර වසර දෙකක් ඇතුළත ඉන්දියාවට නිදහස ලබා දීමට බ්‍රිතාන්‍ය කටයුතු කරන බවත් බ්‍රිතාන්‍යයන් මෙම ඉල්ලීම සපුරාලීමට නොහැකි වුවහොත් සමස්ත ඉන්දියාව බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස් කර ගැනීමේ විමුක්ති අරගලයට සියලුම ඉන්දියානුවන්ගේ සහයෝගය ලබාදෙන ලෙස ද කොංග්‍රසය ඉල්ලා සිටින ලදී.

එහිදී බ්‍රිතාන්‍යයන්ට ගාන්ධි විසින් ලබාදුන් එම වසර දෙකක කාල සීමාව පිළිබඳව දැඩි විරෝධයක් දැක්වූ නේරු බ්‍රිතාන්‍යයන්ගෙන් කඩිනම් විසඳුමක් ඉල්ලා සිටීමට ගාන්ධිට තදින් බලපෑම් කරන ලදී. එම කරුණු මත ගාන්ධි එම වසර දෙකක කාලය අඩු කරන ලද අතර නේරු විසින් එම යෝජනාවට තම

කැමැත්ත පල කරන ලදී. 1929 දෙසැම්බර් 29 දින ලාහෝර් සැසියේ දී කොංග්‍රස් පක්ෂයේ නව සභාපති ලෙස නේරු පත්වූ අතර ඔහු විසින් නිදහස ලබා ගැනීම සඳහා සාර්ථක වැඩ පිළිවෙලක් හඳුන්වා දෙන ලදී. 1929 මෙම ලාහෝර් සැසිවාරයෙන් පසු ඉන්දියානු නිදහස් අරගලයේ ප්‍රමුඛ නායකයෙකු ලෙස නේරුගේ ක්‍රියාකාරීත්වය ක්‍රමයෙන් ඉස්මතු වන්නට විය. නමුත් 1942 දක්වා ගාන්ධි විසින් තමන්ගෙන් පසු දේශපාලන උරුමක්කාරයා නිල වශයෙන් හඳුන්වා නොදුන්නත් 1930 මැද භාගය වන විට එම තනතුර සඳහා නේරු අනුප්‍රාප්තිකයා බවට පත්විය. ලුණු බද්ධට එරෙහි සත්‍යග්‍රහය හරහා නේරු ජනතාව අතර කැපී පෙනෙන නිදහස් සටනේ නායකයෙකු බවට පත්විය. 1938 දී කොංග්‍රසයේ ජාතික නිදහස සඳහා වන අනාගත ප්‍රතිපත්ති නිකුත් කළ නේරු, එමඟින් ජනතාව අතර තව තවත් ජනප්‍රිය විය.

දෙවන වරට ද කොංග්‍රස් පක්ෂයේ ලේකම් ධුරයට පත් වූ නේරු විසින් ඉන්දියාවේ විදේශ සබඳතා හා විදේශ ප්‍රතිපත්තිය යම් යම් ප්‍රගතිශීලී වෙනස්කම් වලට භාජනය කළ අතර ලොව පුරා විවිධ රටවල් හා ආණ්ඩු සමඟ ඉතා හොඳ විදේශ සම්බන්ධතාවක් ඇති කර ගන්නා ලදී. වර්ෂ 1930 මැතිවරණ සමයෙන් අනතුරුව 1936 දී නේරුගේ යුරෝපීය සංචාරය ඔහුගේ දේශපාලන හා ආර්ථික චින්තනය දියුණු කර ගැනීමට ලැබුණු මහඟු අවස්ථාවක් විය. මාක්ස්වාදය හා සමාජවාදී චින්තනය පිළිබඳව ඔහුගේ උනන්දුව මෙම චාරිකාව සමඟ මතු වූ බව දක්නට ලැබේ. ඒ අනුව එතැන් පටන් ඔහුගේ ආර්ථික චින්තනයේ ප්‍රධාන මිනුම් දණ්ඩ බවට මාක්ස්වාදය පත් වූ අතර එය අවශ්‍ය අවස්ථා වලදී ඉන්දියානු අභිලාෂයන් හා අවශ්‍යතාවයන් අනුව වෙනස් විය.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව ඉන්දියාවට පූර්ණ නිදහස ලබාදීමට බ්‍රිතාන්‍ය විසින් නව ව්‍යවස්ථාවක් සකස් කිරීමට ව්‍යවස්ථාදායක සභාවට ඉඩ ලබාදෙන ලදී. 1940 දී පකිස්තානු යෝජනාවක් ඉදිරිපත් වූ අතර එහිදී ඉන්දියාව තුළ ජීවත්වන මුස්ලිම් ජනතාව වෙනුවෙන් එක් භූමි ප්‍රදේශයක් අවශ්‍ය බවට දැඩි ඉල්ලීමක් මොහොමඩ් අලි ජින්නා (Mohommed Ali Jinna) විසින් ගෙන එන ලදී. මේ පිළිබඳ නේරු තම අප්‍රසාදය පළ කළ අතර 1940 ඔක්තෝම්බර් මස 08 වැනි දින ඉන්දියාවේ ඩොමීනියම් තත්වය පිළිබඳ බ්‍රිතාන්‍යයේ අදහස් නේරුට ඉදිරිපත් කරන ලදී. මේ තත්ත්වය මත 1940 ගාන්ධි හා නේරු බ්‍රිතාන්‍යයට සහය

දැක්වීම සම්බන්ධව වූ ඔවුන්ගේ අදහස අතහැර අකීකරු ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ගත් උත්සහයක ප්‍රතිඵලයක් ලෙස නේරුට වසර හතරක සිර දඬුවමක් ලැබුණ ද වසරකට වැඩි කාලයක් තුළ පර්ල් වරයාට බෝම්බ හෙළීමට දින තුනකට පෙර ඔහුව කොංග්‍රස් සිරකරුවන් සමඟ නිදහස් කරන ලදී.

1942 දී ඉන්දියාවෙන් පිටවන ලෙස ගාන්ධි බ්‍රිතාන්‍යයන්ගෙන් ඉල්ලීමක් කළ අතර නේරු විසින් බ්‍රිතාන්‍යයන් පලවා හැරීමට යුධ ප්‍රයත්නයක් දරන ලදී. මේ සමඟ ම ගාන්ධි හා නේරු ඇතුළුව සමස්ත කොංග්‍රස්කාරක කමිටුවම අත්අඩංගුවට ගත් අතර 1945 ජුනි 15 වන දින දක්වා ඔවුන් සිරගත කරන ලදී. කොංග්‍රස් නායකයන් සිරගතව සිටි කාලය තුළ ජින්නාගේ මුස්ලිම් ලීගය බලයට පත් වූ අතර ඔහු විවිධ ප්‍රදේශවල ජනතාව තුළ මුස්ලිම්වරුන්ට වෙනම භූමියක් අවශ්‍ය යැයි යන අදහස වපුරන්නට විය. කෙසේ හෝ 1947 ජුනි 03 වන දා ඉන්දියාවේ අවසන් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වූ ලුවිස් මවුන්ට්බැටින් විසින් ඉන්දියාව හා පාකිස්තානය වෙන් කිරීමේ අදහස නිවේදනය කරන ලදී. ඒ අනුව ඉන්දියානු නිදහස් පනත යටතේ 1947 අගෝස්තු 14 වන දින පාකිස්තානය වෙනම රාජ්‍යයක් ලෙස ප්‍රකාශයට පත් කළ අතර 1947 අගෝස්තු 15 දින නේරු ඇතුළු බොහෝ නායකයින්ගේ කැපකිරීම් මත ඉන්දියාව බ්‍රිතාන්‍යයන්ගෙන් පූර්ණ නිදහස ලබා ගන්නා ලදී.

## නේරු යටතේ ඉන්දියාව

### දැක්ම සහ දේශපාලන ප්‍රතිපත්ති

බිකු පාරෙක්ට (Bhikhu Parekh) අනුව නූතන ඉන්දියාවේ නිර්මාතෘ ලෙස ශ්‍රී ජවහර්ලාල් නේරු මහතා හැඳින්විය හැකිය. නේරු දක්වන ආකාරයට නව්‍යකරණය, ජාතියක දර්ශනය ලෙස හැඳින්විය හැකිය. එය අරමුණු හතකින් සමන්විත වේ. ජාතික එකමුතුභාවය, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය, කාර්මීකරණය, සමාජවාදය, විද්‍යාවේ දියුණුව හා නොබැඳි පිළිවෙත එහි අන්තර්ගත වේ.

**ආර්ථික ප්‍රතිපත්ති**

නේරු මහතාගේ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ විමසා බලන විට එය ආනයන ආර්ථික ක්‍රමයක් මත පදනම් වූ අතර, පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය හා සබැඳුණු මිශ්‍ර ආර්ථික රටාවකින් යුක්ත විය. ඉතාමත් දියුණු ශක්තිමත් කර්මාන්ත රටාවක් ඉන්දීය ආර්ථිකය නගා සිටුවීමට ඉතා වැදගත් වන බව ඔහුගේ විශ්වාසය විය. ඒ සඳහා සෑම අංශයකින්ම ඔවුන්ගේ ආර්ථිකය දියුණු කිරීම සඳහා විවිධ ප්‍රතිපත්ති ගෙන එමින් නොමඳ උත්සහයක නිරත වී ඇත.

නේරු මෙහිදී අනුගමනය කළ එක් වැදගත් ක්‍රමෝපායක් නම් ලෝක බලවතුන් දෙදෙනාගෙන්ම ඉන්දීය කර්මාන්ත වර්ධනය උදෙසා මූල්‍යමය හා කාර්මික සහය ලබා ගැනීමයි. නමුත් නේරු විවේචනය කරන ඇතැමුන් පෙන්වාදෙන කරුණක් වන්නේ එය ඉන්දියාවේ ස්වයං නිෂ්පාදන කර්මාන්ත නඟා සිටුවීමට විශාල බාධාවක් වූ බවයි.

**කෘෂිකාර්මික ප්‍රතිපත්ති**

නේරුගේ නායකත්වය යටතේ කෘෂිකර්මාන්තය හරහා ඉන්දීය ආර්ථිකය නඟා සිටුවීම කෙරෙහි අවධානය යොමු කොට ඇත. ඒ සඳහා කෘෂිකාර්මික විශ්වවිද්‍යාල ඉදිකරමින් ද පිලිපීනය, මෙක්සිකෝව වැනි රටවල අනුගමනය කළ ආර්ථික ක්‍රම හරහා ඉන්දීය ආර්ථිකය නගා සිටුවීමට ද උත්සහ දරා ඇත.

**භාෂා ප්‍රතිපත්ති**

නේරුගේ නායකත්වය යටතේ දීර්ඝ සාකච්ඡාවකින් අනතුරුව හින්දි භාෂාව ඉන්දියාවේ රාජ්‍ය භාෂාව ලෙස පිළිගන්නා ලදී. නමුත් වර්ෂ 1965 න් අනතුරුව හින්දි භාෂාව රාජ්‍ය භාෂාව ලෙස පවත්වාගෙන යාමට විවිධ බාධා එල්ල වූ අතර එයට ප්‍රධාන හේතුව වූයේ හින්දි භාෂාව භාවිතා නොකරන රටවල් ඉංග්‍රීසි භාෂාව ප්‍රමුඛත්වයෙහි ලා සැළකීමයි. කෙසේ වුවද වර්ෂ 1964 දී කොංග්‍රසය හරහා ඉන්දිරා ගාන්ධි (Indira Gandi) විසින් හින්දි භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව රාජ්‍ය භාෂා ද්විත්වය ලෙස පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

**සමාජ ප්‍රතිපත්ති - අධ්‍යාපනය**

නේරු විශ්වාස කළ ආකාරයට ඉන්දියාවේ අනාගතය හැඩගැස්වීම සඳහා ඉන්දියානු සිසුන්ගේ සහ තරුණ පරම්පරාවේ අධ්‍යාපනය උසස් මට්ටමකට ගෙන ඒම ඉතා වැදගත් වේ. ඔහු ඒ සඳහා විවිධ අධ්‍යාපන ආයතන ගොඩ නංවමින් එහි අත්‍යවශ්‍ය සියලුම විෂයයන් උදාහරණ ලෙස වෛද්‍ය විද්‍යාව, තාක්ෂණය, කළමණාකරණය වැනි විෂයන් ඉගැන්වීම සඳහා මූලික ප්‍රතිපාදන සකස් කරන ලදී. නේරුගේ තවත් වැදගත් ක්‍රියාමාර්ගයක් වූයේ වසර 05 ක කාලය තුළ නිදහස් ප්‍රාථමික අධ්‍යාපනය සියලුම ඉන්දීය සිසු පරපුර වෙත ලබාදීමයි. ඒ සඳහා ඔහුගේ වැදගත්ම ක්‍රියා පිළිවෙතක් වූයේ ගමින් ගමට විවිධ වැඩසටහන් දියත් කරමින් දහස් ගණනින් පාසල් ඉදි කිරීමයි. එසේම කුඩා දරුවන් හට නොමිලේ කිරි සහ කෑම බීම ලබා දීමෙන් කුඩා දරුවන්ගේ පෝෂණ ධාරිතාව නංවා සිටීමට කටයුතු කරන ලදී.

## විදේශ ප්‍රතිපත්තිය

නූතන ඉන්දියාවේ නිර්මාතෘ ලෙස සැලකෙන ශ්‍රී ජවහර්ලාල් නේරු පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ඔහුගේ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි යොමුවන්නේ සුවිශේෂී අවධානයකි. නේරුතුමාගේ විදේශ ප්‍රතිපත්තිය බොහෝ අවස්ථාවන් වලදී මතභේදයන්ට හා වාද විවාදයන්ට තුඩුදෙන ලදී. කෙසේ වුවද ඉන්දියාව නව රාජ්‍යයක් ලෙස නිර්මාණය කිරීමේදී ඒ කෙරෙහි ඔහු අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය බොහෝ සෙයින් ඊට බලපා ඇති බව දක්නට ලැබේ.

සමාජවාදය නේරුගේ විදේශ ප්‍රතිපත්තිය සකස් කිරීමෙහිලා බලපාන ලද වැදගත් ජාත්‍යන්තර සාධකයක් විය. නේරුගේ විදේශ ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන් කරුණු දෙවර්ගයකින් සැදුම්ලත් විය. මින් පළමුවැන්න වූයේ ඉන්දියාව ලෝක බල කඳවුරු දෙකෙන්ම වෙන්ව එයට ආවේණික ස්වාධීන අනන්‍යතාවයක් හිමි රාජ්‍යයක් වශයෙන් නඟා සිටුවීමයි. එහි උච්ඡතම අවස්ථාව වූයේ නේරු විසින් ඉන්දියාව තුළ නොබැඳි පිළිවෙතෙහි ආරම්භය සනිටුහන් කිරීමයි. දෙවැන්න නම් ඔහු විශ්වාස කළ ආකාරයට ජාත්‍යන්තර සබඳතාවන්හි

දී අවංකත්වයෙන් කටයුතු කිරීමෙහි වැදගත් කමයි. නේරුගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ඔහු කිසිදු විටෙක යුද්ධය පිළිබඳ විශ්වාසය තැබූ අයකු නොවන බව පෙනී යයි. ඔහු තරයේ විශ්වාස කළ කරුණක් නම් ඉන්දියාව නව රාජ්‍යයක් ලෙස බිහි වීමෙන් අනතුරුව එය සතු සියලු වත්කම් හෝ අවි ආයුධ යුද්ධය කරා නොව හුදෙක්ම එහි සංවර්ධනය කරා පමණක්ම යොමු කළ යුතු බවයි.

**නේරු සහ නොබැඳි පිළිවෙත**

නේරුගේ විදේශ ප්‍රතිපත්තිය තුළ සිදුවූ විශේෂත්වයක් ලෙස නොබැඳි පිළිවෙතෙහි ආරම්භය සනිටුහන් කිරීම දැක්විය හැකිය. මෙහි මුල් අවධියේ දී ඔහු යුගොස්ලෝවියාවේ හිටපු ජනාධිපති වන ටිටෝ (Tito), ඉන්දුනීසියාවේ හිටපු ජනාධිපති සුකරණෝ (Sukarno), බුරුමයේ හිටපු අගමැති උ නූ (U Nu) සහ ඝානාවේ හිටපු ජනාධිපති නක්රුමා (Nukrumah) සමඟ සබඳතා ගොඩනගා ගනිමින් ඒ සඳහා මුල් පදනම සකස් කර ගන්නා ලදී. මෙහි මුල් අවධියේ දී ඔහුට විශාල වශයෙන් අන්තර්ජාතික පීඩනයන්ට ලක් වීමට සිදු වූ නමුත් ඔහු ඒ සෑම අවස්ථාවකදීම නොපසුබට උත්සාහයෙන් හා ධෛර්යකින් යුතුව මුහුණ දී ඇත. ඔහු සෑම විටම පෙන්වා දුන් කරුණක් නම් ආසියානුවන් වශයෙන් ඔවුන්ට ආවේණික දේශපාලන රටාවක් තිබිය යුතු අතර එය බටහිර රාජ්‍යයන් අනුගමනය කරන්නක් නොවිය යුතු බවයි.



*(ඉන්දුනීසියාවේ පළමු ජනාධිපති සුකර්ණෝ සමග ඉන්දියාවේ පළමු අගමැති ජවහර්ලාල් නේරු)*

**නේරු සහ කාශ්මීර අර්බුදය**

නේරුගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ අවධානය යොමු කිරීමේදී පෙනී යන වැදගත් කරුණක් නම් සෑම විටම සාකච්ඡා මාර්ගයෙන් ගැටලු විසඳා ගැනීමට

කටයුතු කළ ද තම අසල්වැසි පාකිස්තානයත් සමඟ කාශ්මීරයේ ගැටලුව පිළිබඳ නිසි සාර්ථක වැඩපිළිවෙලක් අනුගමනය කිරීමෙහිලා සාර්ථක නොවූ අන්දමයි. ඔහු එක්සත් ජාතීන්ගේ සංවිධානය හරහා පාකිස්තානයත් සමඟ සාකච්ඡා මාර්ග වලට යොමු වීමට උත්සාහ කළ ද පාකිස්තානය විසින් ඒ සියල්ල ප්‍රතික්ෂේප කරන ලදී. කෙසේ වුවද නේරු අනුගමනය කළ සුවිශේෂී විදේශ ප්‍රතිපත්ති හමුවේ වුව ද කාශ්මීර ගැටලුවට නිසි විසඳුමක් ලබාදීමට අපොහොසත් විය. එය අදවන විටත් දකුණු ආසියාතික දේශපාලනය තුළ නොවිසඳුන ප්‍රධාන ගැටලුවක් ලෙස ඔඩුදුවන ආකාරය දක්නට ලැබේ.

නේරු තම පාලන කාලය තුළ බැග්ඩෑග් සමුළුවේ (Baghdad conference) දී වැදගත් සංවිධායකයෙකු වශයෙන් ද කටයුතු කර ඇත. ඔහු නව ස්වාධීන රාජ්‍යයන් 29 ක් එකට එක් කරමින් සාමය උදෙසා ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීමට නායකත්වය සැපයීමට දායක විය. ඔහුගේ මෙම ප්‍රයත්නය ජාත්‍යන්තර රාජ්‍යයන් එකමුතු කළ තවත් වැදගත් අවස්ථාවක් ලෙස හුවා දැක්වීමට හැකිය.

## <u>ගත හැකි ආදර්ශ</u>

ලොව දිනූ කිසියම් පුද්ගලයෙකුගේ අතීතාවර්ජනය ගත් කළ කිසිදු විටෙක විල්ලුද පලසකින් සකස් වූවක් නොවන අතර, නොයෙක් බාධක, අභියෝග හා පරාජයන් සමඟ එක් වූ ඔවුන්ගේ නොපසුබස්නා උත්සහයත්, කැපවීමත්, ධෛර්යයත් මතින් ගොඩනැගුනා වූ කටුක කාලපරිච්ඡේදයක මතක සටහනක් බව නොකිවමනාය. ශ්‍රී ජවහර්ලාල් නේරු යන නාමය ඉන්දියාවට පමණක් සීමා නොවූ මුලු මහත් ලෝකයක් ගරු කරන නාමයක් බවට පත් වූයේද ඔහු විසින් මුලු මහත් ලෝකයටම විදහා දැක්වූ ඔහුගේ එම යහපත් ගුණාංගයන් නිසාවෙන්මය.

කුඩා කල පටන් නොයෙක් දුෂ්කරතා මධ්‍යයේ හැදී වැඩුණු නේරු කිසිදු අවස්ථාවක එම දුෂ්කරතාවන් තම ඉදිරි ගමනට බාධාවක් කර නොගත්තේය. බාධාවන් අභියස නොසැලී, එම බාධාවන් තම දිවියට දෙවියන් වහන්සේ විසින් ලබාදුන් ආශිර්වාදයක් ලෙස සලකා නොපසුබස්නා උත්සහයෙන් හා

ධෛර්යයකින් යුතුව ඔහු තම අධ්‍යාපන කටයුතු අති සාර්ථකව සිදු කරන ලදී. නේරුගේ පවුල් පසුබිම වුවද සැලකීමේදී පෙනී යන්නේ ඔහුගේ සියළුම ඥාතීන් සාර්ථක ලෙස අධ්‍යාපන කටයුතු නිම කළ වූවන් බවයි. මෙයට ගත හැකි කදිම නිදසුන ලෙස මෙතුමාගේ පියා සඳහන් කළ හැකි අතර එතුමා අධිනීතීඥවරයෙකු ලෙස කටයුතු කර ඇත. පියාණන්ගේ අඩිපාරේම යමින් ලන්ඩන්හි Inner temple Inn මගින් නීතිය හදාරා නීතීඥ මණ්ඩලයට ඇතුළත් වීමේ විභාගය ද සමත් වූ අතර තමන් විසින් සිදු කරනු ලබන ඕනෑම කාර්යයක් උනන්දුවෙන් හා කැපවීමෙන් අවසානය දක්වා සිදු කළ යුතුය යන ආදර්ශය ලෝකයට ලබා දෙමින් ඔහු ඉංග්‍රීසි නීතිඥ මණ්ඩලයට ඇතුළත් වන ලෙස ඇරයුම් ලබන්නට ද සමත් විය.

තම මව් රටට පණ සේ ආදරය කළ යුතු බවත්, මාතෘ භූමියට සේවය කිරීම අපගේ වගකීම බවත් පසක් කරමින් 1912 වසරේ දී නේරු ඉන්දියාවට පැමිණ අලහබාද් මහාධිකරණයේ අධිනීතිඥයෙකු ලෙස  කටයුතු කළේය.

නායකත්ව ගුණාංග මනාව පිළිඹිබු කරන චරිතයක් ලෙස ජවහර්ලාල් නේරු චරිතය ගත හැකි අතර ඉන්දීය නිදහස් අරගලයේදී එතුමාගේ ක්‍රියා කලාපය අධ්‍යයනය කරන විට එතුමාගේ නායකත්ව ගුණාංගයන් හොඳින් හඳුනාගත හැක. නොපසුබස්නා උත්සහය, ඍජු තීරණ ගැනීමේ හැකියාව, ජ්‍යෙෂ්ඨයින්ට ගරු කිරීම, අන්‍ය මත ඉවසීම, ආදර්ශමත්ව කටයුතු කිරීම, මාතෘ භූමියට ගරු කිරීම, ස්වදේශිකයන්ට ගරු කිරීම වැනි බොහෝ ගුණාංගයන් නිදහස් අරගලය තුළ නේරු විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් තුළින් මනාව පැහැදිලි වේ. ඔහුගේ එම නායකත්ව ගුණාංග හා මහත්මා ගති ගුණ හේතුවෙන් 1947 නිදහස් ඉන්දියාවේ ප්‍රථම අගමැති ලෙස ශ්‍රී ජවහර්ලාල් නේරුපත්විය.

මෙතුමාගේ චරිතයෙන් ගත හැකි තවත් එක් ආදර්ශයක් ලෙස සමානාත්මතාවයට මෙතුමා තුළ තිබූ කැමැත්ත පෙන්වා දිය හැකිය. ධනය, බලය, කුලය, ආගම හා වර්ණය වැනි දේ හරහා මිනිසාව වෙනස්කම් වලට භාජනය නොකළ යුතු බව තරයේ කියා සිටි මෙතුමා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රතිපත්ති මත සිටිමින් සමානාත්මතාවය ඉන්දියාව තුළ ඇති කරන්නට වෙහෙස වූ වැදගත් නායකයෙකු ලෙස හැඳින්විය හැකිය. කුල භේදය ඉතා දැඩිව පවත්නා

වූ ඉන්දීය ජන සමාජය තුළ මෙම සමානාත්මතාවයේ බීජ වැපිරීම ඉතා දුෂ්කර කාර්යයක් වුවද එම අභියෝගයට නොසැලී මුහුණ දීමට තරම් ආත්ම ශක්තියක් නේරු තුළ තිබිණි.

ඉන්දීය සමාජය තුළ නේරු චරිතයට තිබූ ගෞරවය කෙතෙක් ද යත් 1947 නිදහස් ඉන්දියාවේ ප්‍රථම අගමැති ලෙස තේරී පත්වූ නේරු 1964 වසරේ මිය යන තෙක්ම ඉන්දියාව පාලනය කරන ලදී. ඉන්දීය ජනතාව ඔහු කෙරේ තැබූ විශ්වාසයත්, ඔහු ජනතා විශ්වාසය සුරැකි අන්දමත් වටහා ගැනීමට එයම ප්‍රමාණවත් ය.

ගැටුම් කළමනාකරණයට මෙතුමා තුළ තිබූ හැකියාව ගෝවා ප්‍රදේශය ලබා ගැනීමේ අරගලයෙන් පෙන්නුම් කරන අතර දක්ෂ කථිකයෙකු ලෙස ද නිදහස් අරගලය මෙන්ම දේශපාලන දිවිය තුළ ද නේරු චරිතය කැපී පෙණුනි.

නේරු විසින් ඉන්දියාවට සිදු කරන ලද සේවාවන්ට ගරු කිරීමක් ලෙස ජවහර්ලාල් නේරු විශ්වවිද්‍යාලය, පුස්තකාලය, වරාය හා කෞතුකාගාරය ඉදිකර එතුමාගේ නමින් නම් කොට ඇත. නූතන ඉන්දියාවේ නිර්මාතෘ යන අන්වර්ථ නාමයෙන් පිදුම් ලැබීමට තරම් මෙතුමා ශ්‍රේෂ්ඨ චරිතයක් විය. දක්ෂ කථිකයෙකු මෙන්ම රචකයෙකු ලෙස ද වටිනා කෘති කිහිපයක්ම ලොවට දායාද කිරීමට මෙතුමා සමත් විය. ලොවෙන් එකෙකු එක් දෙයකට වෙයි සමත යන කියමන නේරුට අදාළ නොවුණේ ඔහු දස්කම් දැක්වූ ක්ෂේත්‍ර ගණනාවක්ම පැවති හෙයිනි. මිනිසෙකු ලෙස ඉපිද ශ්‍රේෂ්ඨයෙකු ලෙස 1964 මැයි මස 27 වන දින නේරු දිවියෙන් සමුගත්තද ඔහුගේ චරිතය හා නාමය සදා අමරණීය වූයේ ඔහු ලෝකයාට දුන් මහඟු ආදර්ශයන් නිසාවෙන්මය.

## සාරංශය

නිදහස් ඉන්දියාවේ ප්‍රථම අගමැතිවරයා ලෙස ඉන්දියාව ආර්ථික, සමාජීය හා දේශපාලනික වශයෙන් ඉතා සුවිශේෂී ස්ථානයකට ගෙන ඒමට සමත් වූ අසහාය නායකයා ශ්‍රී ජවහර්ලාල් නේරුතුමාය. බ්‍රිතාන්‍යයන්ගේ පාලනයෙන් ඉන්දියාවට

නිදහස ලබා ගැනීම උදෙසා වූ අවිහිංසාවාදී විමුක්ති අරගලය මෙහෙයවීම සඳහා ගාන්ධිතුමා සමඟ එක්ව අති දැවැන්ත කාර්යභාරයක් මෙතුමා අතින් ඉටු විය. නිද්‍රාශීලී පිළිවෙතක් අනුගමනය කරමින් සිටි ඉන්දීය ජනතාව යළි පුබුදුවාලමින් නිදහස ලබා ගැනීමේ සටන මෙහෙයවීමට මූලිකත්වය ගත් මෙතුමා දූරදර්ශී මෙන්ම කෘතහස්ත පාලකයෙක් ලෙස හඳුනාගත හැක.

අවශ්‍යම මොහොතේ සුදුසු ක්‍රමවේදයන් අනුගමනය කරමින් ඉන්දියාව ලෝක දේශපාලන පද්ධතිය තුල අද්විතීය ස්ථානයකට රැගෙන ඒමට නොනිමි අරගලයක යෙදුනු මෙතුමා ඉන්දීය ජනතාව අතර පමණක් නොව මුලු මහත් ලෝක ජනතාව අතරම නොමැකෙන නාමයක් සනිටුහන් කොට ඇත්තේය.

# මූලාශ්‍ර නාමාවලිය

Dr. Ravindra k. (1990) Pandith Jawaharlal Nehru and The Peasant Movement. Atlantic Publishers and distributions, Retrieved from (https://books.google.lk)

Frank M. (2007) Jawaharlal Nehru: A biography. Jaico publishing house, Retrieved from (https://books.google.lk)

Affanul H. (2017) Jawaharlal Nehru: The architect of India's Foreign policy, Retrieved from (https://m.timesofindia.com)

History .com editors (2009) Jawaharlal Nehru, A and E Releuision networks, Retrieved from (https://www.history.com/topics/india/jawaharlal-Nehru)

Frank M. Jawaharlal Nehru- Prime minister of India, Retrieve from (https://www.britannica.com)

Akshobh G. (2015) Nehru's legacy,5 years after his death, Retrieved from (https://thediplomatic.com)

Ragini N. (2014) Jawaharlal Nehru, a legacy revisited, Retrieved from (https://www.thehindu.com)

Raja M. (2015) India's foreign policy: Nehru's enduring legacy, Retrieved from (https://blog.oup.com)

Benjamin Z. (2004) Nehru, Routledge publisher New York, Retrieved from (https://www.questa.com)

Biography.com editors (2014) Jawaharlal Nehru biography. A and E telusion networks, Retrieved from (https://www.biography.com/political-fugure/jawaharlal-nehru)

Michel B. (1962) Nehru: A political biography, Beacon press publisher Boston, Retrieved from (https://www.questa.com)

# පාර්ක් චුන්ග්-හී



**කණ්ඩායම් සාමාජිකයන් :**

- ඩබ්ලිව්.එල්.එච්.කේ සිරිවර්ධන
- පියුමි බණ්ඩාර
- සඳලි මනීෂා
- සරින්දි උත්තරා
- රුවින්දි රණසිංහ

## හැඳින්වීම

දකුණු කොරියාවේ තෙවන ජනාධිපති මෙන්ම හිටපු ජෙනරාල්වරයෙකු සහ සුවිශේෂි යුග පුරුෂයෙකු වන පාර්ක් චුන්ග් හී (Park Chung-Hee) කොරියානු අර්ධද්වීපයේ නූතන ඉතිහාසය තුළ වඩාත් සුවිශේෂී මෙන්ම මතභේදාත්මක නායකයෙකු ලෙස සැලකේ. ඔහු 1961 සිට 1979 දක්වා කාල පරිච්ඡේදය තුළ වේගවත් ආර්ථික සංවර්ධනයක් කරා රට මෙහෙයවමින් දකුණු කොරියාව තුළ විශාල සමාජය පරිවර්තනයක් ඇති කළේ ය.

දකුණු කොරියාවේ ආර්ථික අභිවෘද්ධිය උදෙසා ඔහු කළ මෙම සේවය හේතු කොටගෙන ඔහු දකුණු කොරියාව තුළ එදා මෙදා තුර බිහි වූ විශිෂ්ට නායකයෙකු ලෙස ඉතිහාසයට එක් විය. විශේෂයෙන්ම දකුණු කොරියාව නවීකරණය කිරීමේ දී සහ ආර්ථික වශයෙන් නඟා සිටු වීමේ දී ඔහු ලබා ගත් ජයග්‍රහණ සම්බන්ධයෙන් මෙන් ම, විනාශයේ අද්දරට ඇද වැටෙමින් සිටි ජාතියක් වර්තමානයේ දී ආර්ථික, තාක්ෂණික හා සමාජීය වශයෙන් ලෝකයේ අග්‍රගණ්‍ය රාජ්‍යයක් බවට මුළුමනින්ම පරිවර්තනය කිරීමෙහි ලා ඔහු විසින් ඉටු කරනු ලැබූ මහඟු කර්තව්‍යය හේතු කොටගෙන ඔහු අදටත් බොහෝ කොරියානුවන්ගේ ගෞරවාදරයට පාත්‍ර වේ.

එමෙන්ම, පාර්ක් විසින් ගෙන ගිය දැඩි පාලන ප්‍රතිපත්ති හේතු කොටගෙන ඔහු ඉතා ආන්දෝලාත්මක නායකයෙකු ලෙස ද දකුණු කොරියානු ඉතිහාසයට ඔහුගේ නම එක් කළේ ය. කෙසේ වෙතත්, දකුණු කොරියාව හැන් නදියේ ආශ්චර්යය (The Miracle of Han) බවට පත් කළ මෙම ශ්‍රේෂ්ඨ නායකයා පිළිබඳව අපි කොපමණ වශයෙන් දැන සිටිමු ද?

මෙම ලිපියේ අරමුණ මෙම ශ්‍රේෂ්ඨ නායකයා පිළබඳව සාකච්ඡා කිරීම වේ. මෙම ලිපිය මඟින් දිළිඳු, ග්‍රාමීය පවුලක ගෙවුණු ඔහුගේ ළමා විය, අධ්‍යාපන පසුබිම සහ ඔහුගේ දේශපාලන දිවිය තුළින් ඔහු ලැබූ සාර්ථකත්වය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කෙරේ. එමෙන්ම, දකුණු කොරියාව ආර්ථික වශයෙන් ගොඩ නැඟීමේ සිහිනය යථාර්ථයක් බවට පත් කර ගැනීම සඳහා ඔහු විසින් ගනු ලැබූ පියවර පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කරනු ලැබේ.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

වර්තමානය වන විට ලෝකයේ දියුණු රටවල් අතර දකුණු කොරියාව සුවිශේෂි ස්ථානයක් හිමි කරගන්නා අතර පාර්ක් චුන්ග් හී (Park Chung-hee) යන නාමය දකුණු කොරියාව තුල ඉතාමත් ප්‍රචලිත නාමයක් විය. 1917 නොවැම්බර් මස 14 වන දින කොරියාවේ උතුරු ගියොන්ග්සන්ග් (North Gyeongsang) පලාතේ ගුමි (Gumi) ග්‍රාමයෙහි උපත ලබන මොහු පාර්ක් සන්ග් බින් (Park Sungbin) සහ බෙක් නාම් එයුඉට (Bek Nam-eui) දාව ඉපදුණු ඉතාමත් ආර්ථික දුෂ්කරතා සහිත පවුලක සහෝදරයන් පස් දෙනෙකු හා සහෝදරියන් දෙදෙනෙකු සමග පවුලේ බාල දරුවා විය.

කොතෙකුත් ආර්ථික දුෂ්කරතාවන්ගෙන් පසු වුවත් ඔහු කුඩා කල පටන්ම ඉතාමත් දක්ෂ, බුද්ධිමත්, ආඩම්බර, අභිලාශකාමි පුද්ගලයෙක් විය. ඔහුගේ කුඩා කාලයේ වීරයා බවට පත් වූයේ නැපෝලියන්ය. කෙමෙන් කෙමෙන් ඔහු තමන්ගේ ගමන ආරම්භ කළ අතර ආර්ථික දුෂ්කරතාවන්ට කිසි විටෙකත් ඔහුට බාධා කරන්නට නොහැකි විය. ඔහුට සැමවිටම තමන් පත්ව සිටින තත්වයෙන් ගැලවී යාමට අවශ්‍ය වූ අතර ඔහු කෙරෙන් ඉතාමත් ක්‍රියාකාරි පුද්ගලයෙක් සැමවිටම ප්‍රදර්ශනය විය. ජපාන පාලනයට අනුව ක්‍රියාත්මක වූ කොරියාවේ ජීවත්වූ ඔහු සැමවිටම 1867 මෙයිජි ප්‍රතිසංස්කරණයෙන් පසු ජපානයේ සිදුවූ සීඝ්‍ර නවීකරණය අගැයීමට ලක් කලේය. පාසල් කාලය තුල සාමාන්‍ය මධ්‍යස්ථ ශිෂ්‍යයෙක් ලෙස අධ්‍යාපන කටයුතු සිදු කල ඔහු දඑගු (Daegu) හි පාසලකට (Daegu Teacher's college) ඇතුලත් ව උසස් අධ්‍යාපනය ලබා ඉන් 1937 දී ඉහල ගෞරව සහිතව උපාධියක් ලබාගත්තේය. අනතුරුව මුන්ග්යියොන්ග්ප් (Mungyeongup) හි පාසලක ප්‍රාථමික ගුරුවරයෙක් ලෙස සේවය කළේය. ඉන් අනතුරුව දෙවන චීන-ජපාන යුද්ධය (Sino-



*(පාර්ක් චුන්ග් හී තරුණ කාලයේ)*

Japanese War) ආරම්භ වීමත් සමග පාර්ක් තමන් විසින් අරමුණු කරගත් ආකාරයට මන්චුකුඕ රාජකීය හමුදාවේ (Manchukuo Imperial Army) චන්ග්චුන් හමුදා අධ්‍යාපන ආයතනයට (Changchun Military Academy) ඇතුළත් වීමට තීරණය කළේය. ඩෙයිගු (Daegu) ගුරු පාසලේ උපදේශකවරයෙකු වු ජපාන රාජකීය හමුදාවේ කර්නල් අරිකාවාගේ (Colonel Arikawa) මග පෙන්වීම ඔහුට ඒ සඳහා ඉමහත් ශක්තියක් විය. මෙම කාලය තුළදි ඔහු ටාකාගි මාසාඕ (Takagi Masao) යන ජපන් නාමයෙන් ප්‍රසිද්ධ වු අතර පාර්ක් හට එම කාලයේදී තම නම එලෙස වෙනස් කිරීමට සිදු වූයේ එම කාලය තුළදි කොරියානුවන් හට තම නම වෙනුවට ජපන් නමක් තිබිය යුතු බවට ජපන් ප්‍රතිපත්තියක් පැවතීම හේතුවෙන්ය. ඔහු 1942 දී නැවතත් චන්ග්චුන් හමුදා අධ්‍යාපන ආයතනය (Changchun Military Academy) මගින් උපාධිදරයෙකු වු අතර තවත් වසර 2ක පුහුණුවක් සඳහා ටොකියෝ වේ රාජකීය හමුදා ඇකඩමියට (Imperial Military Acadamy) තේරිපත් වන්නේ ඔහුගේ ජපන් උපදේශකවරයා විසින් ඔහු ඊට නිර්දේශ කිරීමෙනි. 1944 තෙවන පන්තියේ උපාධිධාරියෙක් වූ පසුව මන්චුකුඕ රාජකීය හමුදාවේ ලුතිනන් වරයෙකු ලෙස හමුදා පදවියක් ලැබුවේය.

එමෙන්ම දෙවන ලෝක යුද්ධයේ අවසන් අදියරයේ රෙජිමේන්තු කමාන්ඩවරයෙකු ලෙස සේවය කළේය. යුද්ධයෙන් පසුව නැවතත් කොරියාවට පැමිණෙන ඔහු කොරියානු හමුදා අධ්‍යාපන ආයතනයට ඇතුළත්ව නැවත වරක් 1946 දෙවන පන්තියේ උපාධිධරයෙකු වන්නේය. පසුව දකුණු කොරියාවේ ඇමරිකානු හමුදා අණ්ඩුවේ පොලිස් බලකායේ නිලධාරියෙකු ලෙස පත්විය. මේ අයුරින් ඔහු විසින් ඔහුගේ අරමුණු සාක්ෂාත් කරගනිමින් ඉදිරියට පැමිණියේය.

එමෙන්ම නව රජ්‍යයක් ලෙස ස්ථාපිත වු දකුණු කොරියානු ආණ්ඩුව සින්ග්මන් රී ගේ (Syngman Rhee) නායකත්වය යටතේ පාලනය වු අතර 1948 නොවැම්බර් මසදි ඔහු විසින් පාර්ක් චුන්ග් හී ව අත්අඩංගුවට ගනු ලබන්නේ කොරියානු පොලිස් බලකාය තුළ කොමියුනිස්ට් ව්‍යාපාරයක් මෙහෙයවීම හේතුවෙනි. හමුදා උසාවිය මගින් ඔහුට මරණ දණ්ඩනය සඳහා තීන්දුවක් ලැබුනු නමුත් එම තීන්දුව රී විසින් ලිහිල් කරනු ලැබුවේ කොරියානු හමුදාවේ ඉහළ

නිලධාරින්ගේ පෙලඹවීම මතය. පාර්ක් චුන්ග් හී හට තම ගමන සාර්ථක කරගැනිම සඳහා නැවත වතාවක් ලැබුනු දෛවෝපගත අවස්ථාවක් ලෙස මෙම සිදුවීම හැදින්විය හැකිය. ඔහු මීට පෙර දකුණු කොරියානු කම්කරු පක්ෂයේ සාමාජිකයෙකුද වී සිටියේය. එමෙන්ම කොමියුනිස්ට් ව්‍යාපාරයක් මෙහෙය වීම සම්බන්ධයෙන් ඔහුට තිබූ චෝදනාව කිසිදාක තහවුරු කරගැනිමටද නොහැකි විය. නමුත් ඔහු හමුදාවෙන් ඉවත් කළේය. වැටුප් නොලත් සිවිල් සහයෙකු ලෙස හමුදාවෙ සේවය කරමින් සිටියදි ඔහු 1950 දි කොරියානු හමුදාවේ 8 වන පන්තියට උපාධියක් ලබා ගත්තේය.

කොරියානු යුද්ධය ආරම්භ විමෙන් පසුව පායික් සුන් යුප් ගේ (Paik Sun Yup) උදව්වෙන් පාර්ක් නැවත වතාවක් මේජර්වරයෙකු ලෙස කොරියානු හමුදාවට සේවය ලබා දුනි. පසුව ඔහු ලුතිනන් කර්නල්වරයෙකු ලෙස 1950 සැප්තැම්බරයේදී ද 1951 අප්‍රේල් මස කර්නල්වරයෙක් වශයෙන්ද උසස් වීම් ලැබීය. එමෙන්ම ඔහු කර්නල්වරයෙක් ලෙස හමුදා බුද්ධි අංශයේ උප අධ්‍යක්ෂකවරයා ලෙසද සේවය කලේය. එමෙන්ම 1953 යුද්ධය අවසානයේදි ඔහු බ්‍රිගේඩියර් ජෙනරල්වරයෙකු වශයෙන් තම වෘත්තීය දිවිය උසස් කරගැනිම ආරම්භ වී තිබිණි. එමෙන්ම කොරියානු යුධ ගිවිසුම් අත්සන් කිරිමෙන් පසුව ඔහුව ඇමරිකාවේ ෆෝර්ට් සිල් (Fort Sill) හි මාස 6ක හමුදා පුහුණුවක් සඳහා තෝරා පත්කර ගත්තේය. නැවතත් කොරියාවට පැමිණිමෙන් පසුව ඔහු හමුදා ධුරාවලියේ ක්‍රම ක්‍රමයෙන් ඉහළටම ළඟා විය. ඔහු කාල තුවක්කු හමුදා පාසලේ ප්‍රධානියා වු අතර ප්‍රථම ජනරජ හමුදාවේ කාර්ය මණ්ඩල ප්‍රධානියා ලෙසද පත් විය. එමෙන්ම කොරියාවේ පලමු හා හයවන දිස්ත්‍රික්කයේ කමාන්ඩර්වරයා ලෙසද සේවය කළේය. තවද 1960 දී කොරියානු හමුදාවේ මෙහෙයුම් ප්‍රධානියා ලෙසද දෙවන ජනරජ හමුදාවේ උප කමාන්ඩර්වරයා ලෙසද අතිවිශාල සේවයක් කොරියානු හමුදා පද්ධතිය තුළ සිදු කලේය. ඔහු එම හමුදා පද්ධතියේ ඉතාමත්ම බලවත්ම හා දක්ෂතම හමුදා නිලධාරියා බවට පත් විය.

සැබවින්ම කුඩා කල කොතෙකුත් දුෂ්කරතාවන්ට මුහුණ පාන්නට සිදුවුවද ඒවාට නොසැලි නොබියව මුහුණ දි තම අරමුණු සාර්ථක කරගැනිම සඳහා ඔහු ඉතාමත් දක්ෂ ලෙස තම ජීවිතය මෙහෙයවා ඇති බව මෙයින් පෙනී යනු ඇත. එමෙන්ම ඔහු එතනින් නොනැවති තව දුරටත් තම අරමුණු කරා ගමන් කළේය.

මේ ආකාරයට තම හමුදා වෘත්තියේ කටයුතු සාර්ථකව කරමින් ඔහු ක්‍රම ක්‍රමයෙන් රාජ්‍ය දේශපාලනයට පිවිසීමත් ආරම්භ විය.

## නායකත්වය කරා ගිය ගමන් මග

පාර්ක් ඇතුලු ඉහළ පෙලේ හමුදා නිලධාරින්ගේ ජීවිතවලට දේශපාලනය සෘජුවම බලපා තිබිණ. ජනාධිපති සින්ග්මන් රීගේ (Syngman Rhee) ලිබරල් පක්ෂය 1960 ජනපතිවරණය ඉතා දැඩිවම ක්‍රියාත්මක කිරීමට සූදානම් වූ අතර ඒ සඳහා හමුදාවේ ඉහළ නිලධාරින්ද සහය දක්වා ඇති බවත් ඔවුන්ගේ උසස් වීම් සම්බන්ධයෙන්ද ලිබරල් පක්ෂ නායකයින් ප්‍රබල බලපෑමක් කළ බවට විශ්වාස කෙරේ.

කෙසේවෙතත් 1960 අප්‍රේල් 19 වන දින ජනාධිපති රීගේ පාලනයට එරෙහිව ඇතිවූ ශිෂ්‍ය උද්ඝෝෂණ ව්‍යාපාරය මගින් සාමාජ, ආර්ථික හා දේශපාලන අවුල් සහගත බව යම්තාක් දුරකට පිළිවෙලකට සැකසිණ. ජනාධිපති රී විසින් මේ සම්බන්ධයෙන් දැඩි ක්‍රියාමාර්ගයන්ට එලඹුණද වඩාත් තීරණාත්මක අවස්ථාවේදී පාලන තන්ත්‍රයේ පැවැත්ම අවදානමට ලක්ව තිබියදී හමුදා නායකයන් විසින් මධ්‍යස්ථ වීමට ගත් තීරණය හේතු කොටගෙන ශිෂ්‍ය උද්ඝෝෂණ ව්‍යාපාරය අවහිර නො කළේය. එහෙයින් හමුදාව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග නිසා 1960 අප්‍රේල් 25 දා ජනාධිපති  රීව බලයෙන් පහකිරිම දක්වා කටයුතු සම්පාදනය විය.

මෙම ක්‍රියාමාර්ගය ඉතාමත් ප්‍රතිඵලදායී පියවරක් බවට විශ්වාස කළ අතර ඉන් ටික කලකට පසුව 1960 අගෝස්තු 13 වන දින ප්‍රජාතන්ත්‍රවාදි නව රජයක් පිහිට විය. යුන් බෝ-සියෝන් (Yun Bo-seon) එහි නාමමාත්‍රික ජනාධිපතිවරයා වූ අතර අගමැති චැං මයෝන් (Chang Myon) හට සියලු පාලන බලතල භාර දුන්නේය. නමුත් එය කොරියානු ජනරජ පාර්ලිමේන්තු පාලනයේ කෙටි කාල පරිච්ඡේදයක් විය. එයට එම ආණ්ඩුකරණයේ පැවති යම් යම් ගැටලුකාරී තත්වයන් හේතු වූ අතර දිගු කාලීන ගැටුම් හේතුවෙන් මහජන සහයෝගය පවා අහිමි විය. එහෙයින් ඇතිවූ සමාජ අස්ථාවරත්වය හා බේදීම්වල පසුබිම හේතුකොටගෙන මේජර් ජෙනරාල් පාර්ක් විසින් හමුදා විප්ලවවාදි කමිටුව

(Military Revolutionary Committee) පිහිටුවිය. පසුව දෙවන කොරියානු ජනරජය බලයේ සිටියදී පාර්ක් ඇතුලු හමුදා කණ්ඩායම 1961 මැයි 16 දින හමුදා කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක කළහ. ඉන් දෙවන ජනරජයේ සමස්ත දේශපාලන ව්‍යුහය පෙරලා දැමු අතර ජනාධිපති යුන්ගේ (Yun Bo-Seon) ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩුව බල රහිත විය.

පාර්ක්ගේ නායකත්වයෙන් යුත් මිලිටරි විප්ලවවාදි කමිටුව (Military Revolutionary Committee) සියලු රාජ්‍ය සංවිධාන හා සමස්ත පාලනය සියතට ගත්තේය. මිලිටරි විප්ලවවාදි කමිටුව, ජාතික ප්‍රතිසංස්කරණ සඳහා වූ උත්තරීතර සභාව (Supreme Council for National Reconstruction) ලෙස පරිවර්තනය වූ අතර ජුලි 3 වන දින ඔහු එහි සභාපති බවට පත් විය. පාර්ක්ගේ අවිවාදිත නායකත්වය යටතේ ඉතා මධ්‍යගත, රෙජිමේන්තුගත හා සර්ව බලධාරි හමුදා තන්ත්‍රයක් බිහි විය. දකුණු කොරියානු සමාජය මිලිටරිමය වශයෙන් විනයගරුක කිරිම ඔහුගේ අරමුණ විය. එහෙයින් ඔහු කළ පලමු ක්‍රියාව වූයේ වීදි ළමයින් සහ සල්ලාලයින් අත්අඩංගුවට ගෙන ඔවුන් වීදි පිරිසිදු කිරීම සඳහා යොමු කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීමය.

1961 ජුනි 19 වන දින මිලිටරි කවුන්සිලය කොරියානු මධ්‍යම බුද්ධි ඒජන්සිය නිර්මාණය කළේය. ප්‍රති කුමන්ත්‍රණ වැළැක්විම සහ විදේශීය හා දේශීය වශයෙන් සතුරන් මර්දනය කිරිම සඳහා එය උපයෝගි විය. එමෙන්ම 1961 නොවැම්බර් මස ඇමරිකාව සහ ජපානයේ සංචාරය තුළින් පාර්ක්ගේ කීර්තිය ඉහළ නැංවුනු අතර 1962 මාර්තු 16 වන දින පුළුල් දේශපාලන ක්‍රියාකාරකම් රැසක්ම ක්‍රියාත්මක කරන ලදි.

1962 මාර්තු 24 වන දින හමුදා තන්ත්‍රයට නීත්‍යානුකූලභාවය ලබා දෙමින් ජනාධිපති යුන් බෝ-සියෝන් තම ධූරයෙන් ඉල්ලා අස් විය. පසුව පාර්ක් වැඩ බලන ජනාධිපතිවරයා වීමෙන් තම බලය තහවුරු කර ගත්තේය. පාර්ක් 1963 අගෝස්තු 30 වන දින සක්‍රීය හමුදා සේවයෙන් ඉල්ලා අස් වූ අතර එදිනම ප්‍රජාතන්ත්‍රවාදි රිපබ්ලිකන් පක්ෂයට බැදුනි. පසුව එම පක්ෂයෙන් ජනාධිපති අපේක්ෂකත්වය සඳහා ඔහුව ඊළඟ දිනයේ දීම පිළිගත්තේය.

පසුව ඔක්තෝම්බර් 15 වන දින පැවති ජනාධිපතිවරණයෙන් පාර්ක් ජයග්‍රහණය කළ අතර කොරියාවේ 3 වන ජනාධිපතිවරයා ලෙස ඔහු නායකත්වයට පත් විය. මේ ආකාරයට කුඩා කල පටන්ම කොතෙකුත් දුෂ්කරතා පැවතියද තම අභිලාශයන් ඔස්සේම ඉලක්ක ගත වීමෙන් රාජ්‍ය පාලනයෙහි නායකයා බවට පත් විමට පාර්ක් චුන්ග් හී හට හැකි විය. එමෙන්ම කොරියාවේ 3 වන ජනරජය නිල වශයෙන් 1963 දෙසැම්බර් 17 වන දින ස්ථාපිත විය.



*(දකුණු කොරියානු හමුදා දිනයේදි ජනාධිපති පාර්ක් චුන්ග් හී හට දැක්වූ ගෞරවය)*

## <u>නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව</u>

දකුණු කොරියානු දේශපාලන නායකයෙකු වන පාර්ක් චුන්ග් හී එරට තෙවන ජනාධිපතිවරයා වශයෙන් 1963 වර්ෂයේ දී බලයට පත් වේ. ඔහු බලයට පත් වීමෙන් පසු ඔහුගේ ප්‍රධාන අරමුණ වූයේ දකුණු කොරියාවේ ආර්ථිකය නඟා සිටු වීම ය. ඒ සඳහා ඔහු විසින් ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දෙන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 60 සහ 70 යන දශකයන්හි දී ශීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතින රාජ්‍යයක් බවට දකුණු කොරියාව පත් විය. එසේම, 1971 වර්ෂයේ පැවැත්වූ දකුණු කොරියානු ජනාධිපතිවරණයේ ජයග්‍රහණයත් සමඟ පාර්ක් චුන්ග් හී විසින් නීතිය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ අතර අනතුරුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන ලදී. එසේ සංශෝධනය කරන ලද ව්‍යවස්ථාව "යුෂින් ව්‍යවස්ථාව" (Yushin Constitution) ලෙස හැඳින්වෙන අතර එය එරට හත්වෙනි ව්‍යවස්ථා සංශෝධනය වේ. තවදුරටත්, ඔහුගේ පාලන සමය තුළ ඔහු විසින් ජනමාධ්‍ය සහ හමුදාව සඳහා පූර්ණ පාලන බලතල ලබා දෙන ලදි.

එමෙන්ම, ඔහුගේ පාලන සමය තුළ සංවර්ධනාත්මක වැඩසටහන් මාලාවක් යටතේ බලවත් ආයතන තුනක් හඳුන්වා දෙන ලදී. එනම් ආර්ථික සංවිධානාත්මක සමාගම, ප්‍රවාහන සහ කාර්මික අමාත්‍යාංශය සහ මූල්‍ය අමාත්‍යාංශය යි. ඔහු විසින් දායකත්වය දක්වන ලද පළමු ව්‍යාපෘතිය වූ සියෝල් පසන්" (Seoul Pasan) නම් අධිවේගී මාර්ගය මඟින් දකුණු කොරියාවේ විශාල නගර දෙකක් සම්බන්ධීකරණයට ලක් කරන ලදී. ප්‍රධාන වශයෙන්ම ඔහුගේ පාලන සමය අපනයන ක්‍රමය අරමුණු කරගත් කර්මාන්ත පද්ධතියක් මත පදනම් වූ අතර ඒ සඳහා රජය විසින් දායකත්වය දක්වන ලදි.

1961 වර්ෂයේ දී දකුණු කොරියාවේ ඒක පුද්ගල ආදායම වසරකට ඩොලර් 100ට වඩා අඩු විය. මෙම අසමතුලිතතාවය නිවැරදි කිරීම සඳහා පාර්ක් විසින් පියවර ගනු ලැබී ය. ඔහු විසින් ආර්ථික සංවර්ධනයට මධ්‍යම රජයේ මඟ පෙන්වීම සැපයීම සඳහා ආයතනයක් පිහිටුවා තිබුණි. පස් අවුරුදු සැලැස්මක් සකස් කරන ලද අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා ආර්ථික විද්‍යාඥයින් පාර්ක් විසින් පත් කරන ලදී. විදේශ ප්‍රාග්ධනයේ විශාල මුදල් සම්භාරයක් වියදම් කිරීමේ අවශ්‍යතාව වටහා ගත් පාර්ක් ජනාධිපතිවරයා ජපානය සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සාමාන්‍යකරණය කිරීමට වැදගත් නමුත් එතරම් ජනප්‍රිය නොවූ පියවර අනුගමනය කළේ ය. 1965 වර්ෂයේ දී ජපානය සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සාමාන්‍යකරණයට පත් වූ අතර ඒ සඳහා ඩොලර් මිලියන 800ක ආර්ථික ආධාර ලබාදෙන ලදී.

පාර්ක් ජනාධිපතිවරයාගේ එක් ප්‍රධාන අරමුණක් වූයේ දකුණු කොරියාවේ දරිද්‍රතාවය තුරන් කිරීම සහ ඒමැටිස්ට් ක්‍රම මඟින් එරට තුන්වන ලෝකයේ ආර්ථිකයක සිට පළමු ලෝකයේ ආර්ථිකයක් දක්වා ඔසවා තැබීම ය. සෝවියට් සමූහාණ්ඩුව සහ පස් අවුරුදු සැලැස්ම යොදා ගනිමින් පාර්ක් 1962 දී උල්සාන් නගරය "විශේෂ කාර්මික සංවර්ධන කලාපයක්" ලෙස ප්‍රකාශයට පත් කරමින් සිය පළමු පස් අවුරුදු සැලැස්ම දියත් කළේ ය. තවද 1963 වර්ෂයේ දී පැවැත්වූ මැතිවරණය තුන්වන ජනරජයේ ආරම්භය බවට පත් විය. දකුණු කොරියාව සංවර්ධිත ලෝකයක් කරා ගෙන යාමට උත්සාහ කරමින් පාර්ක් ජනාධිපතිවරයා විසින් ආර්ථික ප්‍රතිපත්ති මාලාවක් ආරම්භ කළ අතර එමඟින් වේගවත් ආර්ථික සංවර්ධනයක් සහ කාර්මීකරණයක් වෙත රාජ්‍යය ගෙන එන ලදී.

එසේම, පාර්ක් ජනාධිපතිවරයාගේ එක් ප්‍රතිසංස්කරණයක් වූයේ 1964 වර්ෂය වන විට දී පැය 24 පුරා විදුලිය සැපයීම යි. එය විශාල වෙනසක් වූ අතර මීට පෙර නිවාස හා ව්‍යාපාරවලට දිනපතා විදුලිය ලබා දී තිබුණේ පැය කිහිපයක් පමණි. 1967 වර්ෂයේ දී දෙවන පස් අවුරුදු සැලැස්ම සමඟ පාර්ක් නිරිතදිග සෝල්හී (Seol) කුරෝ කාර්මික උද්‍යානය ආරම්භ කළ අතර මෙමගින් දකුණු කොරියාවේ පළමු මෝටර් රථ කර්මාන්ත ශාලාව මෙන්ම ලාභ වානේ සැපයීම සඳහා රජයට අයත් යකඩ සහ වානේ සමාගම නිර්මාණය කළේ ය. එමෙන්ම, ආර්ථික සංවර්ධනය උදෙසා ප්‍රබල රසායනික කර්මාන්ත පද්ධතියක් ද පාර්ක් චුන්ග් හී විසින් හඳුන්වා දෙන ලදී. රසායනික කාර්මීකරණ සැලැස්ම ලෙස නම් කරන ලද තුන්වන පස් අවුරුදු සැලැස්ම තුළින් උපායමාර්ගික ක්ෂේත්‍ර, ඉලෙක්ට්‍රොනික තාක්ශණය ඇති නැව් තැනීම, යන්ත්‍රෝපකරණ, ඛණිජ රසායනික හා ෆෙරෝරස් නොවන ලෝහ ලෙස වෙන් වෙන් වශයෙන් ක්ෂේත්‍ර පහක් නම් කරන ලදී.

පාර්ක් ජනාධිපතිවරයා විසින් කොරියාවේ ආර්ථික සැලසුම්කරණ තත්ත්වය ඉහළ නැංවීම සහ සිවිල් විශේෂඥයන් ඒ සඳහා යොමු කිරීම සඳහා දායකත්වය සපයන ලදී. ඔහු ආසියාවේ ප්‍රමුඛ පෙළේ ඉදිකිරීම්කරුවෙකු බවට පත් විය. අපනයන ප්‍රමුඛ සංවර්ධනය තුළින් දකුණු කොරියාව වේගයෙන් නවීකරණය කරන අතරම එක්සත් ජනපද හමුදාවන්ගේ සහාය ඇතිව කොමියුනිස්ට් කඳවුරෙන් තම ජාතිය සාර්ථකව ආරක්ෂා කළේ ය. පාර්ක් ජනාධිපතිවරයා ඔහුගේ දැඩි ඒකාධිපති පාලනය හේතුවෙන් දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද විවේචනයට ලක් විය. කෙසේ වෙතත්, දකුණු කොරියාවේ විශිෂ්ට ආර්ථික ප්‍රගතියේ පියා වශයෙන් පුළුල් ලෙස ඔහු ගෞරවයට පාත්‍ර විය. විශේෂයෙන්ම, මානව හිමිකම් හෝ නිදහස් වෙළඳාම වැනි පුළුල් කාරණා නොව සිය රටේ ක්ෂණික අවශ්‍යතා අනුව න්‍යාය පත්‍රය සකස් කරන ලද පාක් සමඟ ගනුදෙනු කිරීමට ඕනෑම ජනපදයකට කිසිවිටෙක පහසු නොවී ය.

එසේම, දකුණු කොරියානු ග්‍රාමීය ආර්ථිකය නවීකරණය කිරීම සඳහා 1970 දශකයේ මුල් භාගයේ දී පාර්ක් ජනාධිපතිවරයා විසින් දියත් කරන ලද ඉතා සාර්ථක වැඩසටහනක් වන නව ප්‍රජා ව්‍යාපාරය "සයමීයල් උන්දොන්" (Saemaual Undong) ලෙස ද හැඳින්වේ. එතැන් සිට එය අනෙකුත් නොදියුණු

ජාතීන්ට ද ආදර්ශයක් විය. එහි සාර්ථකත්වය සඳහා ග්‍රාමීය ප්‍රජාව ස්වයං ආධාර සහ සහයෝගීතාව සඳහා පෙළඹවීමක් විය. එසේම, එහි ප්‍රතිඵලයක් වශයෙන් 1979 වන විට කෘෂිකාර්මික අංශයෙන් ග්‍රාමීය ආදායම, නාගරික ආදායම අභිබවා ගොස් තිබුණි.

පාර්ක් ජනාධිපතිවරයාගේ පාලන සමය තුළ දක්නට ලැබුණු සුවිශේෂී ක්‍රියාදාමයක් වනුයේ දකුණු කොරියානු සමාජය "මිලිටරිමය වශයෙන් විනයගරුක රේඛා" ඔස්සේ බලමුළු ගැන්වීම ය. එසේම, පාර්ක් විසින් වියට්නාම යුද්ධයේ දී එක්සත් ජනපදය හා දකුණු වියට්නාමය සමඟ සටන් කිරීමට දකුණු කොරියානු හමුදා තුන් ලක්ෂ විසි දහසක් පමණ යවා ඇත. එක්සත් ජනපදය සමඟ සුහදශීලී සබඳතා පවත්වා ගැනීමත්, නැගෙනහිර ආසියාවේ කොමියුනිස්ට්වාදයේ ඉදිරි දියුණුව වැලැක්වීමත්, ජනරජයේ ජාත්‍යන්තර තත්ත්වය ඉහළ නැංවීටත් ඔහුගේ ප්‍රධාන අරමුණු විය. කෙසේ වෙතත්, දකුණු කොරියානු හමුදා වියට්නාමය වෙත යැවීම සඳහා පාර්ක් ජනාධිපතිවරයා විසින් මහත් උනන්දුවක් දක්වන ලදී. ඔහුගේ පාලන සමය තුළ හමුදා බැඳීම්වලට ප්‍රතිඋපකාර ලෙස දකුණු කොරියාවට ඩොලර් බිලියන ගණනක ප්‍රදාන, ණය, සහනාධාර තාක්ෂණික හුවමාරු සහ වරණීය වෙළඳපොළවල් ද හිමි විය.

එසේම, වියට්නාමයේ එක්සත් ජනපද හමුදා සමඟ සටන් කිරීම සඳහා කෝටි දෙකක මුදලක් යැවීමට පාර්ක් ජනාධිපතිවරයා විසින් එම වසරේ දී එකඟ වූ අතර ඒ සඳහා කොරියාව වෙත වොෂින්ටන් වෙතින් ත්‍යාගයක් ද පිරිනැමුණි. 60 දශකයේ මැද භාගයේ දී වියට්නාම් යුද්ධයෙන් ලද ආදායම කොරියාව සඳහා විදේශ විනිමය ඉපැයීම්වල විශාලතම ප්‍රභවය විය. මෙම අරමුදල් පාර්ක් ජනාධිපති සමය තුළ කොරියාව යකඩ හා වානේ නිෂ්පාදනය, නැව් තැනීම, රසායනික ද්‍රව්‍ය, පාරිභෝගික ඉලෙක්ටොනික උපකරණ සහ වෙනත් වෙළෙඳ භාණ්ඩවල ලොව ප්‍රමුඛයා බවට පරිවර්තනය කිරීමට උපකාරී විය. පාර්ක් ජනාධිපතිවරයාගේ පාලන කාලය තුළ දකුණු කොරියාවේ ඒක පුද්ගල ආදායම දස ගුණයකින් වැඩි විය.

පාර්ක් චුන්ග් හී වසර 18ක කාලයක් ජනාධිපතිවරයා වශයෙන් සිය පාලනය ගෙන ගිය අතර ඔහු සතුව පැවතියේ මිශ්‍ර දේශපාලන ප්‍රතිපත්ති සමුදායකි. එසේම, ඔහු බලයට පත්වීමෙන් පසුව යුදමය ආධිපත්‍යක් සහිත පාලන ක්‍රමයකට

නැඹුරු වූයේ 1961 වර්ෂයේදී ය. එසේම, ඔහු විසින් දේශපාලන නායකත්වය දරන කාලය තුළ වැඩි වශයෙන් නැඹුරුතාවක් දක්වනු ලැබුවේ යුදමය කටයුතු සඳහා වන අතර යුද හමුදාව සඳහා පූර්ණ බලතල ලබාදෙන ලදී. කෙසේ වෙතත්, ඔහුගේ වසර 18ක ඒකාධිපති පාලන ක්‍රමය පිළිබඳව දකුණු කොරියානු ජාතිකයන් අසතුටට පත් විය. ඒ සඳහා ප්‍රධානම හේතු සාධකය වූයේ ඔහුගේ ඒකාධිපති පාලන ක්‍රමය යටතේ පැවති ආරක්ෂක සේවාවන්හි අර්බුදකාරී තත්ත්වයන් සහ ජනතාවගේ පෞද්ගලික නිදහස සඳහා පනවනු ලැබූ සම්බාධක මෙන්ම අත්තනෝමතික නිර්ණායකයන් ය.

1968 වසරේ සිට විවිධ පුද්ගලයන් ඔහුව ඝාතනය කිරීමට දැරූ උත්සහයන් ව්‍යර්ථ වුවද 1979 වසරේ ඔක්තෝම්බර් මස 26 දින ඔහුගේ ජීවිතයේ අවසන් දිනය විය. එදින ඔහු පෞද්ගලික රාත්‍රි භෝජන සංග්‍රහයකට සහභාගි වූයේ තම අතිශය සමීපතමයන් වූ කොරියානු මධ්‍යම බුද්ධි අංශයේ කිම් ජේ ක්‍යු (kim Jay-Kyu), ප්‍රධාන ආරක්‍ෂක නිලධාරියා වූ චා ජි චුල් (Cha Ji-chul), නිල් මන්දිරයෙ (blue house) හි ප්‍රධාන ලේකම් මෙන් ම කොරියානු මධ්‍යම බුද්ධි අංශයේ හිටපු අධ්‍යක්‍ෂ කිම් ගේ වොන් (Kim Gae-won) සමඟිනි. මෙහි දී මොවුන් අතර යම් යම් කරුණු සම්බන්ධ ව බහින්බස් වීම් ඇති වු අතර එහි දී තම දීර්ඝ කාලීන සගයකු මෙන් ම කොරියානු මධ්‍යම බුද්ධි අංශයේ ප්‍රධානියා වු කිම් ජේ ක්‍යු ගේ (Kim Jay-Kyu) වෙඩි පහරින් පාර්ක් චුන්ග් හී මෙන් ම ඔහුගේ ප්‍රධාන ආරක්‍ෂක නිලධාරියා වු චා ජි චුල් (Cha Ji-chul) ජීවිතක්ෂයට පත් විය. පාර්ක් රෙජිමය තුළ තම බලය අස්ථාවර වීම හේතු වෙන් කිම් ජේ ක්‍යු, කොරියානු ජනාධිපතිවරයා ඝාතනය කළ බව පරීක්‍ෂණ වල දී පසු ව හෙළි වු අතර ඔහුගේ පාලන දිවිය නිමාවට පත් විය.

කෙසේ වෙතත් පාර්ක් ජනාධිපතිවරයා විසින් සිදූ කරන ලද මහඟු සේවාවන් හේතු කොට ගෙන ඔහුගේ පාලන සමය දකුණු කොරියාවේ සුවිශේෂී සන්ධිස්ථානයක් ලෙස පෙන්වා දිය හැකි ය.



*(ජනාධිපති පාර්ක් චුන්ග් හී විසින් සංවර්ධන කටයුතු පිළිබඳ නිරීක්ෂණය කරන අයුරු)*

## විදේශ ප්‍රතිපත්තිය

1965 ජූනි මාසයේ දී පාර්ක් ජපානය සමඟ සබඳතා ගොඩනැගීමේ ගිවිසුමකට අත්සන් තැබූ අතර එමගින් ජපානයෙන් වන්දි ලබා ගැනීම සහ සුළු ණය ලබා ගැනීමට හැකි වූ අතර දකුණු කොරියාව සහ ජපානය අතර වෙළඳ කටයුතු හා ආයෝජන වැඩි කිරීමට මෙම ගිවිසුම සමත් විය. 1966 ජූලි මාසයේ දී දකුණු කොරියාව සහ එක්සත් ජනපදය අතර වඩා මිත්‍ර සබඳතාවයක් පවත්වා ගැනීමේ අරමුණ ඇතිව දෙරට අතර වඩාත් ශක්තිමත් ආරක්ෂක ගිවිසුමක් අත්සන් කරන ලදි. එක්සත් ජනපදය සතු වර්ධනය වන ආර්ථික බලයත් සහ ආරක්ෂක බලයත් සමඟම උතුරු කොරියාවෙන් එල්ල කරන ලද සාම්ප්‍රදායික ආක්‍රමණ තර්ජන වඩ වඩාත් දුරස්ථ බවක් පෙනෙන්නට තිබුණි.

1965 මාර්තු මාසයේ දී වියට්නාම් යුද්ධය උත්සන්න වීමත් සමඟම දකුණු කොරියාව 1965 සැප්තැම්බර් මාසයේ දී තම දෙවන නාවික බලකාය දකුණු වියට්නාමයට යැවූ අතර පසුව 1966 සැප්තැම්බර් මාසයේ දී අශ්ව බලකාය ද යැවීමට සමත් වූහ. 1960 දශකය පුරාම ජපානය කොරියාව අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් පාර්ක් විසින් ඇන්ග්ලෝ ජපන් සන්ධානයට (Anglo- Japanese alliance) සහ බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව දොස් නැගිය.



*( ජපානය සමග ගිවිසුම් ඇති කර ගත් මොහොත )*

**වියට්නාම් යුද්ධය**

එක්සත් ජනපදයේ ඉල්ලීම පරිදි, පාර්ක් වියට්නාම් යුද්ධයේ දී දකුණු කොරියානු හමුදා සෙබළුන් 320,000ක් පමණ උතුරු වියට්නාමයට විරුද්ධව සටන් කිරීමට යවා ඇත. මෙයට මූලික හේතුව වූයේ එක්සත් ජනපදය සමඟ සමීප සබඳතා පවත්වා ගැනීමත්, නැගෙනහිර ආසියාව තුල කොමියුනිස්ට්වාදයේ ව්‍යාප්තිය වැළැක්වීමත්, ජනරජයේ ජාත්‍යන්තර තත්ත්වය ඉහළ නැංවීමත් ය.

1965 ජනවාරියේ දී ප්‍රධාන පෙළේ පනත් කෙටම්පතක් සම්මත කළ දිනයේ (ඡන්ද 106ක් හා විපක්ෂව 11ක්) පාර්ක් විසින් මෙසේ නිවේදනය කර ඇත.

"දකුණු කොරියාව උදාසීන තත්ත්වයෙන් මිදීමට කාලය පැමිණ ඇත. උදව් කිරීම, මැදිහත් වීම සහ ප්‍රධාන ජාත්‍යන්තර ගැටළු සම්බන්ධයෙන් වගකීම භාර ගැනීමට කාලය පැමිණ ඇත."

මූලික වශයෙන් එක්සත් ජනපදය සමඟ යුදමය සන්ධානය ශක්තිමත් කිරීමට මෙන් ම යුද්ධය සඳහා ද සහභාගී වීමට මූල්‍යමය දීමනා ද දෙනු ලැබූහ. දකුණු කොරියානු හමුදා නිලධාරීන්ට එක්සත් ජනපදය විසින් මුදල් ගෙවන ලද අතර ඔවුන්ගේ වැටුප් ඍජුවම දකුණු කොරියානු රජයට සම්ප්‍රේෂණය කරන ලදි. එමනිසා දකුණු කොරියානු හමුදා වියට්නාමයට යැවීමට පාර්ක් මහත් උනන්දුවක් දැක්වූ අතර යුද්ධය දීර්ඝ කිරීමට මහත් උත්සාහයක් ගත්තේ ය. යුදමය සබඳතා සඳහා ප්‍රතිඋපකාර ඉහත සඳහන් ලෙස දකුණු ෙ කොරියාවට ඩොලර් බිලියන ගණනක ප්‍රදානයන්, ණය, සහනාධාර, තාක්ෂණය සහ වරණීය

වෙළඳපොළවල් එක්සත් ජනපද ජොන්සන් සහ නික්සන් පරිපාලනය විසින් ලබා දෙන ලදි.

**උතුරු කොරියාව**

උතුරු කොරියාව හා දකුණු කොරියාව අතර සාම්ප්‍රදායික වෙනස්කම් පාර්ක් විසින් අධීක්ෂණය කරන ලදි. 1961 දී උතුරු කොරියානු නායක කිම් ඉල් සුං (Kim il sung) රහසිගතව පාර්ක්ගේ මිතුරෙකු සහ ඇමතිවරයෙකුව සිටි හ්වාං ටේ සොං (Hewang te Song) ව අන්තර් කොරියානු සබඳතා වැඩි දියුණු කිරීමේ අරමුණින් දකුණු කොරියාවට යැවී ය. කෙසේ වෙතත් කොමියුනිස්ට් නැඹුරුව පිළිබඳ සැක දුරු කිරීම සහ සගයෙකු ලෙස ඇමරිකානුවන්ට ඔහුගේ ස්ථාවරය සහතික කිරීම සඳහා පාර්ක් විසින් හ්වාං ටේ සොං ව ඔත්තුකරුවෙකු ලෙස ඝාතනය කිරීමට තීරණය කළේ ය.

1964 ඔක්තෝබර් මාසයේ සිට උතුරු කොරියාව සිය බුද්ධි තොරතුරු රැස් කරන්නන් හා ප්‍රචාරකයන් දකුණු කොරියාවට යාම වැඩි කළේ ය. එම නිසා දකුණු කොරියානු සොල්දාදුවන් 30කට වැඩි පිරිසක් හා සිවිල් වැසියන් 10 දෙනෙක් පමණ උතුරු කොරියානු ආක්‍රමණිකයන් සමඟ ඇති වූ ගැටුම් වලින් මියගොස් තිබුණි. 1966 ඔක්තෝබර් මාසයේ දී පාර්ක් විසින් ජෙනරාල් චාල්ස් බොන්ස්ටීල්ගේ (Bonsteel) අනුමැතිය නොමැතිව උතුරු කොරියාවට ප්‍රහාරයක් එල්ල කරන ලෙස හමුදාවට නියෝග කළේය. දකුණු කොරියාවේ අලාභයන්ට පළිගැනීමක් ලෙස ගත් මෙම ක්‍රියාව පාර්ක්ගේ රජය සහ කොරියාවේ එක්සත් ජනපද නිලධාරියා අතර දුරස්ථභාවය වැඩි විය.

1966 සිට 1969 දක්වා කාලය තුළ දෙවන කොරියානු යුද්ධයේ දී පාර්ක්ගේ හමුදාව යුධ කටයුතුවල නිරත වීමත් සමඟ ගැටුම් උත්සන්න විය. එය 1966 ඔක්තෝබර් 5 වන දින කිම් ඉල් සුං විසින් කරන ලද කතාවකට සම්බන්ධ වූ අතර එහිදී උතුරු කොරියානු නායකයා 1953 අවි ආයුධ ගිවිසුමේ නීත්‍යානුකූලභාවය අභියෝගයට ලක් කළේ ය. එමෙන්ම එක්සත් ජනපද හමුදාවට එරෙහිව උතුරු කොරියාව විසින් ප්‍රකෝප කිරීමක් සිදු කළහොත් පාර්ක් පරිපාලනය අඩපණ කළ හැකි බව ඔහු විශ්වාස කළේ ය. 1968 ජනවාරි 21 වන දින උතුරු කොරියානු හමුදා විශේෂ බලකායක් පාර්ක් ඝාතනය කිරීම

සදහා යැවූ අතර එය තරමක් දුරට සාර්ථක විය. පොලිස් මුර සංචාරයන් මගින් ඔවුන්ව බ්ලූ හවුස් (Blue house) සිට මීටර් 800ක් දුරින් නතර කරන ලදි. එහිදී සටනක් ඇති වූ අතර උතුරු කොරියානුවන් පිරිසක් මරණයට පත් විය. මෙයට ප්‍රතිප්‍රහාර ලෙස කිම් ඉල් සුං ඝාතනය කිරීමට සේනාංකයක් යැවූ අතර එය 1971 දී විසුරුවා හරින ලදි.

මෙලෙස සතුරුකම් තිබියදීත් නැවත එක්වීම පිළිබඳ උතුර සහ දකුණ අතර සාකච්ඡා පැවැත්විණි. 1972 ජූලි 4 දින ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කරමින් බාහිර බලවේග මත හෝ බාහිර මැදිහත් වීමකින් තොරව අභ්‍යන්තර ව නැවත එක්විය යුතු බවත් යුධමය බලය යොදා නොගෙන එම ක්‍රියාවලිය සාමකාමී ව සාක්ෂාත් කර ගත යුතු බවත් ජාතික සමගිය ප්‍රවර්ධනය කළ යුතු බවත් ප්‍රකාශ කළහ. නමුත් එක්සත් ජනපදය මෙම යෝජනා සම්බන්ධයෙන් සතුටට පත් නොවීය.

**බටහිර ජර්මනිය**

පාර්ක්ගේ ආර්ථික ප්‍රතිපත්තිය තුලින් ඉස්මතු වූයේ දකුණු කොරියාව හා බටහිර ජර්මනිය අතර ඇති සම්බන්ධතාවයයි. බිස්මාර්ක් හා හිට්ලර් වැනි ශක්තිමත් නායකත්වයක් ඇති ඉතිහාසය නිසා පාර්ක් ජර්මනියට ඇල්මක් දැක්වූ අතර ආර්ථික අපහසුතා, ජනගහණ වර්ධන ගැටළු සම්බන්ධයෙන් කටයුතු කර විදේශ ප්‍රාග්ධනය තම රට තුළට ගලා ඒමට ජර්මනිය සමග සබඳතා ඇති කර ගත්තේය. 1961දී ඇති කර ගත් ගිවිසුමකට අනුව දකුණු කොරියාව ජර්මනියට ශ්‍රම බලකාය යවා ඇති අතර පතල් කම්කරුවන් 8000ට වැඩි ප්‍රමාණයක් සහ හෙදියන් 10 000කට අධික ප්‍රමාණයක් එයට ඇතුළත්ය.

**ඉරානය**

පාර්ක් ඉරානයේ තම මිතුරෙකු වන මොහොමඩ් රේසා පලාවි (Mohammad Reza Pahlavi) සමග 1962දී රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇති කරගත් අතර 1969දී ඉරාන සංචාරයෙන් පසුව දෙරට අතර සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගත්හ. දකුණු කොරියාවේ කාර්මික සංවර්ධනය සඳහා තෙල් සුරක්ෂිත කිරීමේ දී ඉරානයේ ඇති වැදගත්කම පාර්ක් වටහා ගත් අතර 1973 තෙල් අර්බුදයේ දී ඔවුන්ගේ ප්‍රධාන හා එකම තෙල් ප්‍රභවය ඉරානය විය. බොරතෙල් සැකසීමට

හා තෙල් පිරිපහදුව වර්ධනය කිරීම සඳහා ඉංජිනේරුවන් හා කම්කරුවන් දහස් ගණන් ඉරානයට යවන ලදි. මෙම සම්බන්ධය තෙල් වලින් ඔබ්බට ව්‍යාප්ත වූ අතර හියුන්ඩායි ඉංජිනියරින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් (Hyundai Engineering and Construction) ඇතුළු බොහෝ චේබොල්වරු ඉරානයට ගියහ. එමෙන්ම දකුණු කොරියානු විශේෂ බලකාය ඉරාන නාවික හමුදා භටයින් පුහුණු කිරීමට උපකාරී විය.

## ගත හැකි ආදර්ශ

පාර්ක් චුන්ග් හීගේ චරිත කතාව අධ්‍යයනය කිරීමේ දී පෙනී යන කරුණක් වනුයේ ඔහු ඉතා සංකීර්ණ පුද්ගලයෙකු බවයි. වර්තමානයේ දී ඇතැමෙක් ඔහුගේ දේශපාලන තීන්දු, තීරණ හා ප්‍රතිපත්ති විවේචනයට ලක් කළ ද, ඔහු සතු වූ නායකත්ව ගුණාංග අපට නොසලකා හැරිය නොහැක. අවුරුදු 18ක් දකුණු කොරියාවේ ජනාධිපති ධූරය දරමින් එය ජාත්‍යන්තරය තුළ ආර්ථික වශයෙන් ඉහළටම ඔසවා තැබීම සඳහා මෙම අසහාය නායකයා විසින් සිදු කරනු ලැබූ ඉමහත් කාර්යභාරය තුළින් එම නායකත්ව ගුණාංග මනාව පිළිබිඹු වේ.

පාර්ක් චුන්ග් හී යනු නොයෙකුත් උත්කෘෂ්ට ගුණාංගයන්ගෙන් යුතු නායකයෙකි. ඒ අතුරින් වඩාත් කැපී පෙනෙන සුවිශේෂ ගුණාංග වූයේ ඔහුගේ බුද්ධිමත්භාවය, අධිෂ්ඨානශීලීභාවය, අභිලාෂකාමීත්වය, අප්‍රතිහත ධෛර්යය සහ ආත්ම විශ්වාසය යන ගුණාංග වේ. මෙම ගුණාංග ඔහුගේ දේශපාලන මෙන්ම පෞද්ගලික ජීවිතය තුළ ද ඔහු ක්‍රියා කරන ලද ආකාරයෙන් පිළිබිඹු වේ.

පාර්ක් චුන්ග් හී යනු ස්ථිර දැක්මක් හා පැහැදිලි අරමුණකින් කටයුතු කළ නායකයෙක් විය. ඔහුගේ එකම අභිප්‍රාය වූයේ දකුණු කොරියාව ආර්ථික වශයෙන් ශක්තිමත් කර එය සංවර්ධිත රාජ්‍යයක් කරලීමයි. මෙම දැක්ම කරා යන ගමනේ දී ඔහු විසින් මුහුණ දෙන ලද බාධක කම්කොටළු කොතෙකුත් වුව ද, ඔහු විසින් කිසිදු විටක ඒවායින් නොසැලී අප්‍රතිහත අධිෂ්ඨානයකින් සහ අසාමාන්‍ය කැප වීමකින් යුතුව සැම විටම කටයුතු කරන ලදී. ඔහු සතු වූ

මෙවැනි උත්කෘෂ්ට ගුණාංග මගින් ඔහු දකුණු කොරියාව තුළ එදා මෙදා තුර බිහි වූ නායකයන්ගෙන් කැපී පෙනෙන නායකයෙක් බවට පත් කළේ ය.

තව ද, දකුණු කොරියානු ආර්ථිකය නගා සිටු වීමෙහි ලා ඔහු විසින් පෙන්වා දුන් මාර්ගෝපදේශකත්වය තුළින් ද ඔහු සතු වූ නායකත්ව ගුණාංග මනාව පිළිබිඹු වේ. ඔහුගේ උද්යෝගිමත් නායකත්වය මත ඔහු විසින් සිය රාජ්‍යය මෙන්ම වැසියන් ද එක් දැක්මක් ඔස්සේ පෙළගස්වන ලදී. ඔහු පැවසූ කාරණයක් නම්, "කොරියාව තුළ දිළිඳුකම තුරන් කිරීම සඳහා අපි අපගේ කාර්යභාරය ඉටු කළ යුතු වෙමු. එවිට අප මේ මොහොතේ අත් විඳින දෑ මීළඟ පරම්පරාව අත් නොවිඳුනු ඇත" යනුවෙනි. එබැවින්, ඔහු මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා අප්‍රතිහත කැප වීමකින් කටයුතු කළ අතර ඇතැම් අවස්ථාවලදී ඒ සඳහා අත්‍යාවශ්‍ය දැඩි මතභේදාත්මක තීන්දු තීරණ ගැනීමට ද පසුබට නොවිණි. ඔහුගේ මෙම දැඩි තීන්දු තීරණ සඳහා රාජ්‍ය අභ්‍යන්තරයෙන් මෙන් ම ජාත්‍යන්තරයෙන් ද නොයෙකුත් විවේචන එල්ල වූ අතර එම විවේචන මධ්‍යයේ වුව ද පාක් චුන්ග් හී විසින් ඔහුගේ ස්ථාවරය පවත්වා ගෙන යමින් ඒවාට සාර්ථක නායකයෙකු ලෙස මුහුණ දෙන ලදී. ඔහු සතු වූ මෙම දැඩි ආත්ම විශ්වාසය නායකයෙකු සතු විය යුතු ගුණාංගයකි.

දකුණු කොරියාව තුළ මෙන් ම ලෝක දේශපාලනය තුළ ද ඉතා මතභේදාත්මක චරිතයක් වූ පාර්ක් චුන්ග් හී යන මෙම අසහාය නායකත්වය නූතන දකුණු කොරියානු දේශපාලන ඉතිහාසයේ සුවිශේෂී චරිතයක් වන අතර එම උත්කෘෂ්ට මිනිසා තුළින් උකහා ගත හැකි ආදර්ශ බොහෝ වේ.

## සාරාංශය

දකුණු කොරියානු ජනරජය වසර 18 ක් පාලනය කළ එරට ජන හදවත් තුළ නොමැකෙන සළකුණක් සනිටුහන් කල රාජ්‍ය නායකයෙකු ලෙස පාර්ක් චුන්ග් හී හඳුන්වා දිය හැකිය. ඔහු 1917 වසරේ සැප්තැම්බර් මස 30 වන දින ඉතා දිළිඳු පවුලක උපත ලැබ ගෞරව උපාධිධරයකු බවට පත් ව ජපන් යුද හමුදා විද්‍යාලයෙන් පුහුණු ව ලැබූ ලුතිනන්වරයෙකු ලෙස ලෝක යුද්ධ සමයේ සේවය

කළ අතර කොරියානු යුද සමයේ බ්‍රිගේඩියර් ජනරල්වරයෙකු ලෙස ද සේවය කිරීමෙන් පසුව 1958 වසරේ ජනරල් තනතුර දක්වා උසස් වීම් ලැබුවේය.

චුන්ග් හී 1961 වසරේ දී හමුදා කුමන්ත්‍රණයකින් එරට තෙවන ජනාධිපති බවට පත් ව තම ප්‍රථම හා දෙවන ධූර කාලයන්හි එරට දළ දේශිය නිශ්පාදිතය දෙගුණ කිරීමට පියවර ගත් අතර අපනයනය මූලික කර ගත් ආර්ථිකයක් බිහි කර ලොව නැඟි එන කාර්මික රාජ්‍යයක් බවට දකුණු කොරියාව පත් කළේය. අද දක්වා දකුණු කොරියාව ලොව සමෘධිමත් රාජ්‍යයක් ව පවතිනුයේ ඔහුගේ ආර්ථික ප්‍රතිපත්ති නිසාවෙනි. ඔහුගේ "saemaual undong" ලෙස කොරියානු බසින් හඳුන්වන නව ගම්මාන වැඩසටහන (new village movement) දකුණු කොරියානු ග්‍රාමීය ආර්ථිකය නවීකරණය කළ අතර එය ඉතා ඉහළ සාර්ථකත්වයකට පත් විය. පසුව එය නොදියුණු රටවල ආර්ථිකය මොඩලය බවට ද පත් විය.

චුන්ග් හී ජාතික බුද්ධි සේවය (National Intelligence Service) නමින් වර්තමානයේ හඳුන්වන කොරියානු මධ්‍යම බුද්ධි අංශයේ (Korean Central Intelligence Accademy) හි නිර්මාතෘ වන අතර එහි කාර්යභාරය තවදුරටත් වර්ධනය කළේය. දකුණු කොරියානු ආර්ථිකයේ පියා ලෙස හඳුන්වන පාර්ක් චුන්ග් හී දකුණු කොරියාවේ අද පවතින වේගවත් ආර්ථිකය නිර්මාණය කළේ තම ආශ්චර්මත් ආර්ථිකය (economic miracle) නම් වැඩසටහන තුළිනි. 1968 වසරේ සිට විවිධ පුද්ගලයන් ඔහුව ඝාතනය කි රීමට දැරූ උත්සහයන් ව්‍යර්ථ වුවද 1979 වසරේ ඔක්තෝම්බර් මස 26 දින තම දීර්ඝ කාලීන සගයකු මෙන් ම කොරියානු මධ්‍යම බුද්ධි අංශයේ ප්‍රධානියා වූ කිම් ජේ ක්‍යුගේ (kim Jay-gyu) වෙඩි පහරින් ඔහු ජිවිතක්ෂයට පත්විය.

ආඥාදායක පාලකයෙකු වුව ද අද දක්වා පාර්ක් චුන්ග් හී දකුණු කොරියානු ජනතාව තුළ මහත් ගෞරවාදයට පත් වනුයේ ඔහු රටට අත් කර දුන් ඉහළ ආර්ථික වර්ධනය ,දේශමාමකත්වය, අල්ලස සහ දූෂණයෙන් තොර වීම මෙන් ම සරල ජිවිතයක් ගත කළ විශිෂ්ට නායකයෙකු වශයෙනි. 1999 වසරේ ලෝක ප්‍රකට ටයිම් සගරාව ඔහු ව ශත වර්ෂයේ වඩාත් බලපෑම් කළ ආසියානුවෙක්

ලෙස නම් කරනු ලැබීය. එමෙන් ම ඔහුගේ දියණිය වූ පාර්ක් ගියුන් හී 2013 වසරේ සිට 2017 වසර දක්වා එරට ජනපති ලෙස කටයුතු කළ අතර ඇය එරට ප්‍රථම ජනාධිපතිනිය ද විය.

## මූලාශ්‍ර නාමාවලිය

GREGG, D., 1999. Park Chung Hee. [online] TIME.com. Available at: <http://content.time.com/time/world/article/0,8599,2054405,00.html> [Accessed 23 February 2020].

Graham, E., 2003. Reforming Korea's Industrial Conglomerates. [ebook] Washington, DC: Institute for International Economics, pp.11-50. Available at: <https://www.piie.com/publications/chapters_preview/341/2iie3373.pdf> [Accessed 1 March 2020].

Newworldencyclopedia.org. 2020. Park Chung-Hee - New World Encyclopedia. [online] Available at: <https://www.newworldencyclopedia.org/entry/Park_Chung-hee> [Accessed 15 January 2020].

Santos, B., 2018. South Korean Nationalism And The Legacy Of Park Chung Hee: How Nationalism Shaped Park' S Agendas And The Future Korean Sociopolitical Landscape. Chadron State Graduate Theses, pp.215-242. Available at: <https://digitalcommons.unl.edu/cgi/viewcontent.cgi?article=1000&context=chadron> [Accessed 31 January 2020].

Sjsu.edu. n.d. The Park Chung Hee Regime In South Korea. [online] Available at: <https://www.sjsu.edu/faculty/watkins/park.htm> [Accessed 19 March 2020].

Podoler, G., 2016. "Who Was Park Chung-Hee?" The Memorial Landscape And National Identity Politics In South Korea. 33rd ed. [ebook] East Asia. Available at: <https://www.researchgate.net/publication/309691852_Who_Was_Park_Chung-hee_The_Memorial_Landscape_and_National_Identity_Politics_in_South_Korea> [Accessed 15 February 2020].

# සුකර්ණෝ



**කණ්ඩායම් සාමාජිකයන් :**

- ගෝතමී නාරංගල
- ලක්ෂිකා කේ. කුලතුංග
- නිමෝෂා විමලරත්න
- තුෂිණි යසස් ශ්‍රී
- ධනංජය තෙලිකඩ ආරච්චි

## හැඳින්වීම

නිදහස් ඉන්දුනීසියාවේ ප්‍රථම ජනාධිපතිවරයා මෙන්ම ඉන්දුනීසියානු ජනරජයේ (Republic of Indonesia) නිර්මාතෘවරයා ලෙස සලකනු ලබන්නේ සුකර්ණෝ ය (Sukarno). 1945 සිට 1966 දක්වා කාලය තුළ ඉන්දුනීසියාව පාලනය කළ මොහු, එරට ඕලන්ද යටත් විජිතයක් ව පැවති සමයේ දී එයට එරෙහිව ඉන්දුනීසියාව තුළ වූ නිදහස් සටනට නායකත්වය දුන් ප්‍රබල චරිතයක් විය. ඉන්දුනීසියාවේ ප්‍රතිරූපය මුළුමනින් ම වෙනස් කිරීමට සමත් වූ මොහු එරට ඉතිහාසයේ ඉහළම ගෞරවයට පාත්‍ර වූ චරිතයක් ලෙස හැඳින්විය හැකි ය. මෙලෙස ඉහළ ජනප්‍රසාදයක් ලබා සිටි ඔහු "බුන්ග් කර්නෝ" (Bung Karno) නොහොත් කර්නෝ සහෝදරයා, විප්ලයේ මහා නායකයා (Great Leader of the Revolution), ගොවියන්ගේ පියා (Father of the Farmers) යන විරුද නාමවලින් හඳුන්වනු ලැබීය.

දෙවන ලෝක යුද්ධය සමයේ දී ජපානය විසින් ලන්දේසි පාලනය යටතේ පැවති ඉන්දුනීසියාව ආක්‍රමණය කළ අතර එම අවස්ථාවේ දී ජපානයේ සහය ඇතිව රට තුළ ජාතිකවාදී මත ව්‍යාප්ත කිරීමට සුකර්ණෝ සමත් විය. එමගින් ඉන්දුනීසියාව තුළ අධිරාජ්‍යවාදයට එරෙහි ව ජනතාව අතර ප්‍රබල මතයක් ඇති කරවීමට ඔහු සමත් විය. ලෝක යුද්ධය අවසානයේ ජපානය තම හමුදාව ඉන්දුනීසියාවෙන් ඉවත් කරගත් අතර, ඒත් සමඟම එනම් 1945 අගෝස්තු 17 වන දින ඉන්දුනීසියාව නිදහස් හා ස්වාධීන රාජ්‍යයක් ලෙස සුකර්ණෝ විසින් ප්‍රකාශයට පත් කරන ලදී. නමුත් ඕලන්දය නැවතත් ඉන්දුනීසියාව තම අණසකට යටත් කර ගැනීමට උත්සාහ ගත් අතර එම උත්සාහයන් ව්‍යාර්ථ කිරීමට ඔහුගේ දූරදර්ශී නායකත්වයට හැකි විය.

පෙර සිටි නායකයන් මෙන් නොව, සුකර්ණෝ හට එරට පැවති සාම්ප්‍රදායන්, ඉස්ලාම් දහමේ මත හා මාක්ස්වාදී මත එක්කොට තනි මතයක් ගොඩනගා, ඒ මතය වටා විශාල ජනතාවක් රැස් කිරීමට හැකි දක්ෂතාවයක් තිබුණි. මෙසේ

ඉන්දුනීසියාවේ සිටි සෑම ජන කොට්ඨාශයක්ම තනි මතයක් වටා එක්සත් කිරීමට හැකි වූ ප්‍රථම මෙන්ම එකම නායකයා වන්නේ ද සුකර්ණෝ ය. ඉන්දුනීසියානු ලේඛකයෙකු වන ප්‍රමෝද්‍ය අනන්ත ටොර් (Pramoedya Ananta Toer) සුකර්ණෝ හඳුන්වනු ලබන්නේ "කිසිඳු ලේ සෙලවීමකින් තොරව විවිධ ආගමික, සංස්කෘතික හා ජන වාර්ගික වෙනස්කම්වලින් සමන්විත ජන පිරිසක් එක්සත් කර වූ එකම ආසියානු නායකයා" ලෙස ය.

සුකර්ණෝ විසින් හඳුන්වාදෙනු ලැබූ "පංචසීල දර්ශනය" (Pancasila), නිදහසින් පසු ගෙවීගිය පළමු වසර 17 තුළ එරට ප්‍රධාන ගාමක බලවේගය විය. එම දේශපාලන දර්ශනය හා 1959 දී පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවට හඳුන්වාදෙනු ලැබූ අධිකාරී බලයක් සහිත "Guided Democracy" පාලන ක්‍රමය හේතුවෙන් එතෙක් ඉන්දුනීසියාවේ පැවති දේශපාලන හා සමාජීය අස්ථාවරභාවය නැති කරලීමට ඔහුට හැකි විය.

ඉන්දුනීසියාව වත්මන් තත්ත්වයට ළඟාවීමට අවශ්‍ය අඩිතාලම දමන ලද්දේ සුකර්ණෝ විසින් බව කීම නිවරැදිය. එබැවින් ඉන්දුනීසියාවේ සලකුණ ලෙස ද මොහුව හඳුන්වනු ලබයි.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

සුකර්ණෝ (Sukarno) 1901 ජූනි මස 06 වන දින නැගෙනහිර ජාවාහි සුරබයා හි (East Surabaya) උපත ලැබූ අතර, ඔහුට 'කුස්නෝ සොස්‍රෝඩිහාර්ඩ්ජෝ' (Kusno Sosrodihardjo) යන නම යොදන ලදි. ඔහු ඉතා අසාද්‍ය තත්ත්වයේ පැවති අසනීපයකින් දිවි ගලවා ගැනීමෙන් පසුව ඔහුගේ දෙමව්පියන් විසින් නැවතත් ඔහුට "සුකර්ණෝ" (Sukarno) ලෙස නම් තබන ලදී. සුකර්ණෝගේ පියා වූයේ ජාවාහී මුස්ලිම් වංශාදිපතිවරයෙකු හා පාසල් ගුරුවරයෙකු වූ " රේඩන් සොකෙමි සොස්‍රෝඩිහාර්ඩ්ජෝ" (Raden Soekemi Sosrodihardjo) ය.

ඔහුගේ මව වූයේ ජාවාහී බ්‍රාහ්මණ කුලයේ හින්දු භක්තිකයෙකු වූ "ඉඩා අයු නියෝමාන් රායි" (Ida Ayu Nyoman) ය.

පියාගේ ගුරුහරුකම් නොමදව හිමිකරගත් සුකර්ණෝ ලන්දේසි භාෂාව පිලිබඳව හසල දැනුමක් කුඩා කල සිටම හිමි විය. මේ නිසාවෙන් ඔහුට යුරෝපීය ප්‍රාථමික පාසලකට ඇතුලු වී මූලික අධ්‍යාපනය හැදෑරීමට හැකිවිය. ඉන්දුනීසියාවේ සිටි උගත් ප්‍රභූන් අතර පවා කුඩා සුකර්ණෝ භාෂා කිහිපයකින් චතුර ලෙස කතා කළේ ය. ඔහුගේ ළමා කාලයේ ජාවානු භාෂාවට අමතරව සන්ඩනීස් (Sundanese) බාලී (Balinese) හා ඉන්දුනීසියානු භාෂාව (Indunesian Language) පිලිබඳව ප්‍රවීනයකු විය. ඊට අමතරව ලන්දේසි භාෂාව (Dutch) මනා ලෙස හසුරවන ලදී. යුරෝපියානු භාෂාවන් වන ජර්මානු භාෂාව (German), ඉංග්‍රීසි භාෂාව (English), අරාබි (Arabic) හා ජපන් භාෂා (Japanese Language) ප්‍රවීණයකු වේ. පහලොස් හැවිරිදි සුකර්ණෝ 1916 දී සුරබයාහි ද්විතීක පාසලකට ඇතුළත් කළ අතර එවකට එරට ප්‍රසිද්ධ සිවිල් හා ආගමික චරිතයක් වන " එච්.ඕ.එස්. ජෝක්‍රොමොමිනෝටෝ" (H.O.S. Tjokroaminoto) ගේ නිවසේ නවාතැන් ගෙන ඉගෙනීම් වැඩ කටයුතු සිදුකරන ලදි. ද්විතීක අධ්‍යාපන කටයුතු අවසන් කළ පසු විසිහැවරදි සුකර්ණෝ ජෝක්‍රොමොමිනෝටෝ (Tjokroaminoto) ගේ දාසය හැවැරදි දියණිය සමඟ විවාහ විය.

සුරබනාහි ගත කල අවුරුදු පහ (1916-1921) ඔහුගේ අනාගත බුද්ධිය හා දේශපාලනය සංවර්ධනය සඳහා වඩාත් වැදගත් විය. මක්නිසාද යත් ඔහු ඉන්දුනීසියාවේ ප්‍රධාන ජාතිකවාදීන් හා ලන්දේසි සමාජවාදීන් සමඟ සමීප සම්බන්දතාවන් පැවැත්වූ නිසාවෙනි.

අධ්‍යාපනය සාර්ථකව අවසන් කළ සුකර්ණෝ උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා බැන්ඩුන් හි (Bandung) තාක්ෂණ ආයතනයට ඇතුළු වූ අතර, 1926 දී ඉංජිනේරුවරයෙකු ලෙස උපාධිය ලබා ගත්තේ ය. අධාපනයේ හිනිපෙත්තටම ගමන් කළ ඔහු දේශපාලනයට පිවිසීමට තීරණය කරනු ලැබුවේ සමස්ත ඉන්දුනීසියානුවන්ගේම යහපත ලබා දීමට ඇති දැඩි අධිෂ්ඨානය නිසාවෙනි.

දේශපාලන දිවිය ආරම්භක අවදියේ ම මොහු ලිපි මාලාවක් ප්‍රකාශයට පත් කරමින් ඉස්ලාම් ආගම හා කොමියුනිස්ට් වාදය නොගැළපෙන බව පෙන්වීමට උත්සහ කරමින් එම තරඟකාරී පාර්ශවයන් දෙක සමගි කිරීමට මහත් උත්සාහයක් ගත්තේ ය. ඉන්දුනීසියානු නිදහස සඳහා පෙළ ගැසෙන බලවේගය වූයේ ආක්‍රමණශීලී ලෙස ලුහුබැඳ ගිය ජාතිකවාදයයි. මොහුගේ තීන්දුවට අනුව අධිරාජ්‍යවාදය හා ධනවාදය යන දෙපාර්ශවයම ඉන්දුනීසියාවේ පොදු කණ්ඩායම් වලට පොදු සතුරන් විය. ඉස්ලාම්වාදය හා සමාජවාදය අතර පවතින්නා වූ මෙම ගැටුම පිළිබඳ ප්‍රථමයෙන්ම ඉදිරිපත් කරනු ලැබුයේ 1926 දී සුකර්ණෝ විසිනි.

1927 දී සුකර්ණෝ බැන්ඩුන් හි ජාතිකවාදී අධ්‍යාපන සමාජයේ සභාපති බවට පත්විය. 1927 දී ඉන්දුනීසියානු ජාතිකවාදී පක්ෂය (PNI) ආරම්භ කිරීමත් , 1926 දී මැඩියෙන් කැරැල්ලේ ප්‍රතිඵලයක් ලෙස (PKI) තහනම් කිරීමත් සමගම විවිධ ජාතිකවාදී කණ්ඩායම් එක්සත් වීම මඟි න් සුකර්ණෝගේ කාර්යයන් වඩාත් පහසු විය. ඔහු තුළ පැවැති චතුර කථිකත්වය හා දේශපාලන අරමුණු ජනතාවට තේරුම්ගත හැකි භාෂාවකින් වාක්‍ය බණ්ඩනය කිරීමට ඇති හැකියාව හේතුවෙන් බොහෝ ඉන්දුනීසියානුවන් තුළ ඔහු ජාතික වීරයෙකු බවට පත් විය. විශාල බාධක රාශියක් මධ්‍යයේ වුවද ඔහුගේ සියලුම අරමුණු ඉන්දුනීසියානුවන් වෙනුවෙන් ඉටු කිරීමට ඔහු නොපැකිළිව වැඩ කටයුතු සිදු කළ අතර 1930 දී ඔහුට එරෙහිව පැවති නඩු විභාගයක් මඟින් ඇති වූ බලපෑම නිසාවෙන් ඔහුගේ කීර්තිය බෙහෙවින් වැඩි විය. එමඟින් තවත් ශක්තිමත් වූ ඔහු සිය සුප්‍රසිද්ධ ආරක්ෂක කතාව වන ඉන්දුනීසියාවේ මැන්ගුගට් (Indunesia Accuses) ඉදිරිපත් කළ අතර එය ඔහුගේ දේශපාලන දිවියේ ඉතාම වැදගත් සන්ධිස්ථානයක් ලෙස සැලකේ.



*(ළමා කාලය)*



*(තරුණ කාලය)*

## නායකත්වය කරා ගිය ගමන

ලොව වෙනත් රටවල් මෙන්ම මෙම වකවානුව වන විට එනම් ක්‍රි.ව.1900 පමණ වන විට ඉන්දුනීසියාව ද අධිරාජ්‍යවාදී බල තරඟයේ ඉත්තෙක් බවට පත් වී තිබිණ. එනම් ලන්දේසි ජාතිකයන් අතින් මෙම ප්‍රදේශය පුරා තම ආධිපත්‍යය පතුරවමින් තම මව් රටවල් ශක්තිමත් කරමින් තම අධිරාජ්‍යවාදී අපේක්ෂාවන් සපුරා ගත්හ. සුකර්ණෝ ගේ පිබිදීම තුළින් රට තුළ බල පෙරළියක් වූයේ මෙවැනි යුගයක ය. ඔහු තම ජීවිතය ඉන්දුනීසියාව වෙනුවෙන් කොතෙක් දුරට පරාර්ථය උදෙසා යෙදෙව්ව ද යත් ඔහුගේ චරිතාප්‍රදානය ඊට සාක්ෂි වේ. ඔහු කුඩා කල සිටම ලන්දේසි අධ්‍යායපනය හරහා ලොව විවිධ දේශපාලන දර්ශනයන් පිළිබඳ හසල දැනුමක් ලබා තිබුණි. ඔහු සමාජවාදි චින්තනය පමණක් නොව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය අධ්‍යනයෙන් දත් අයෙක් විය. හෙතෙම ඒ හරහා ඉන්දුනීසියානු සමාජවාදී ස්වයංපෝෂිත භාවය ස්වයං  දර්ශනය වර්ධනය කර ගත්තේ ය. එමෙන්ම තමා ලැබූ අධ්‍යාපනයේ වටිනාකම ද ඔහු ඉන්දුනීසියානු ශිෂ්‍යන් හට 'ඇල්මේමින් ස්ටඩිකල්ස්' (Almemin Study School) ස්ථාපිත කළේ ඉතා යහපත් පරමාර්ථයෙනි.

1927 දී සුකර්ණෝ සහ ඇල්මේමින් ස්ටඩි ස්කුල් හි අනෙකුත් සාමාජිකයන් විසින් අධිරාජ්‍ය විරෝධී, ධනේශ්වර විරෝධී පක්ෂයක් වන පැරායි පක්ෂය, ජාතිකවාදී ඉන්දුනීසියන්(PNI) ලෙස ප්‍රතිසංස්කරණය කළහ. එපමණක් නොව මේ වන විට අග්නිදිග ආසියාවේ බලවත් වූ ජපානයේ සහය ලන්දේසි බලය පරාජය කිරීමට ලබා ගැනීම ඔහු තීරණය කළේය.ලන්දේසි රහස් පොලිසිය මගින් (PNI) පිළිබඳව ඉක්මනින් කරුණු අනාවරණය කරගත් අතර එහි ජාතිකවාදී රාවය ලන්දේසි පාලනයට වැඩි කරදරයක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස සුකර්ණෝ ඇතුළු සාමාජිකයන් රැසක් ලන්දේසි පොලිසිය විසින් අත් අඩංගුවට ගැනින. මෙම අත්අඩංගුවට ගැනීමත් සමඟ සුකර්ණෝ පිළිබඳව ජාතිකවාදී පිළිගැනීම තව තවත් ඉහළ නැංවූයේ 1930 වසරේ අවසන් මාස 05 තුළ පැවති සිය නඩු විභාගයන් හිදී සුකර්ණෝ විසින් නොබියව සිදුකළ ජාතිමාමක අධිරාජ්‍ය විරෝධී කතා මාලාවයි. ඔහුගේ හඬ අවදි වීම අධිරාජ්‍ය පාලකයන්ට ගැසූ අතුල් පහරක් වූවා සේම ඉන්දුනීසියා ජනයා අතර එය ජාතිමාමක හැඟීම් පුබුදු කරවන එකක් විය. ඔහුගේ අතිශය දේශප්‍රේමී කතා රට පුරා ප්‍රචලිත විය.

මේ නිසාවෙන් ඔහුට වසර 04 ක සිර දඬුවමකට ලක් වීමට සිදු විය. කෙසේ වෙතත් මෙහිදී ඔහුගේ කතා වල මාධ්‍යය ආවරණය මගින් නෙදර්ලන්තයට සහ ලන්දේසි නැගෙනහිර කොදෙව්වල ලිබරල් කණ්ඩායම් ආකර්ෂණය වී තිබුණේ ඔහු සිරගත කර වසර එක හමාරක පමණ ගිය පසුව ය.ඔහුගේ සිරගතවීම අතරතුර කාලයේදී PNI පක්ෂය දෙකඩ වී තිබුණි. එක් පාර්ශවයක් ඉන්දුනීසියාව විප්ලවය සඳහා සටන්කාමී ප්‍රවේශයන් අනුගමනය කළහ. තවත් පිරිසක් සාමකාමී ප්‍රතිරෝධ හා මන්දගාමී විප්ලවය යෝජනා කළහ. Puni Independent පක්ෂයට වඩා Internet In cooperation පක්ෂය සමඟ සුකර්ණෝ එකඟ විය. 1932 දී ඔහු එම පක්ෂය ප්‍රධානියා බවට පත්විය. 1933 දී අගෝස්තු මස ජකර්තා නුවර සංචාරයක් අතරතුර ඔහු යළිත් ලන්දේසි පොලිසිය අත් අඩංගුවට ගත්හ. 1945 දී ජූනි මාසයේ සුකර්ණෝ සිය ස්වාධීන ඉන්දුනීසියාවේ මූලධර්ම හඳුන්වා දුන්නේය. දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම, සෙසු ආගම්, ප්‍රජාතන්ත්‍රවාදය සාධාරණත්වය සඳහා ඉවසීම, සියල්ලට ම සම්මුතිය හා ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සමාජ සාධාරණත්වය යන සියල්ල ඊට ඇතුළත් විය. උදව් ලබා ගත් ජපානය පීඩාකාරී පාලනය සහ අතපෙවීම් ද තරුණ

ඉන්දුනීසියානුවන් විසින් සුකර්ණෝ පැහැරගෙන ගොස් ජපානයෙන් නිදහස ලබා ගැනීම සඳහා නායකත්වය ගැනීමට ඒත්තු ගැන්වීය.

අනතුරුව ස්වකීය රටට නිදහස ගැනීම සඳහා විවිධ වාද භේද මත ඉතා දිගු ක්‍රියාන්විතයක් බ්‍රිතාන්‍යයන් ලන්දේසීන් මෙන්ම ජපාන ජාතිකයන් සමග ඔහුට තීරණ උපාය මාර්ග සටන් යොදන්නට සිදු විය. 'රොමි වැන් රොයින්' ගිවිසුම අත්සන් තබා නෙදර්ලන්තයට සිය හිමිකම් ප්‍රකාශය අත්හැරීමට නිල වශයෙන් කිරීමට සිදුවිය. 1950 දී අවසන් වරට ඉන්දුනීසියාව නිදහස් කළ පසු රට පූර්ණ නිදහස් රාජ්‍යයක් විය. ජනපති සුකර්ණෝ චරිතානුකූලව චරිතයක් වුවද ඔහු " ජාතියේ පියා" ලෙස ඉතා බලවත් වූ බලපෑමක් ඇති කරන ලදී. රට අලුතින් මුහුණ දුන් අභියෝග රැසක් විය. මුස්ලිම් බහුතරයක් සිටින එරට තුළ හින්දු, කිතුනු සහ මුස්ලිම් ආගම් අතර ගැටුම් බහුලව තිබිණ. එපමණක් නොව චීන සහ ඉන්දුනීසියානු ජාතිකයන් අතර ජනවාර්ගික ගැටුම් ද, කොමියුනිස්ට්වාදීන් හා මුස්ලිම්වරු අතර පැවති සටන් ද ඒ අතර විය. ඔහු මේ ගැටුම් සමථයට පත් කිරීමට සමත් විය. ඔහු ලෝක ප්‍රසිද්ධියට පත් වූයේ එහි ගුණාංග නිසාය.ඔහු 'මඟ පෙන්වන ප්‍රජාතන්ත්‍රවාදය' සඳහා ඔහුගේ සැලැස්ම ඉදිරිපත් කළේය. ජාතික ගැටළු පිළිබඳ සම්මුතියට එකඟ වූ ඔහු 1957 මාර්තු පැවැති ආතතීන් මධ්‍යයේ ද යුද නීතිය ප්‍රකාශ කළේය. ඔහුට බෝම්බ ගැසීමට උත්සාහයන් ක්‍රියාත්මක වීමේ දීත් ඔහු ඉන්දුනීසියාව මත සිය ග්‍රහණය තද කර ගත්තේ ය. ලන්දේසි පුරවැසියන් හතළිස් දාහක් (40,000) පමණ පන්නා දැමීම, දේපල ජනසතු කිරීම, ඉඩම් හා ව්‍යාපාර වලට වාර්ගික අයිතිවාසිකම් වලට එරෙහිව නීති රීති පැනවූ අතර ලක්ෂයක් (10,000) පමණ චීන ජාතිකයන් යළි චීනයට හරවා යැවීමට බල කෙරින.



*(ජනතාව අමතන සුකර්ණෝ)*

1959 ජූලි මාසයේදී ඔහු ආණ්ඩුක්‍රමය අහෝසි කරනු ලැබූ අතර 1945 ව්‍යවස්ථාව යළි ස්ථාපිත කර දේශීයත්වය සහ ජාතීන් අතර සුහදත්වය වර්ධනය කර ගැනීමට සුකර්ණෝ නම් වූ චරිතය හරහා ඉන්දුනීසියාවට හැකියාව ලැබිණ.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව

නිදහස් ඉන්දුනීසියාවේ ප්‍රථම ජනාධිපති වන්නට සුකර්ණෝට හැකිවිය. ඔහු දශකයකට වැඩි කාලයක් ජනාධිපති ධූරය දැරීය. 1945 සිට 1967 දක්වා මොහුගේ පාලනය කාලය සඳහන් කල හැකිය. සුකර්ණෝගේ නායකත්වය දෙස බලන කල පෙනීයන දෙයක් වන්නේ ඔහුගේ සුවිශේෂී දේශපාලන දර්ශනයයි.

සුකර්ණෝ ධනවාදයට විරුද්ධ වූ අතර ඔහු ධනවාදය මගින් ජනතාව සූරා කෑ ආකාරය යටත්විජිත අධිරාජ්‍ය පාලනයේදී අත්දැකීය. මේ හේතුව නිසා සුකර්ණෝ සමාජවාදයට පක්ෂ නායකයෙක් විය. මේ නිසා මොහු විදේශ ආධාර ලබා ගැනීමේදී ප්‍රධාන වශයෙන් කොමියුනිස්ට් චීනය හා සෝවියට් කණ්ඩායම දෙසට නැඹුරු සුකර්ණෝගේ දේශපාලන දර්ශනය වූයේ මාර්හයිනිස්වාදය (Marhaenism) යි. එනම් ඔහු ඉන්දුනීසියාවට ගැලපෙන පරිදි ඔහු මාක්ස්වාදය අර්ථ දැක්වී ය.

සුකර්ණෝගේ පංචසීල දැක්මෙන් 1945 දී ඉන්දුනීසියාවේ ව්‍යවස්ථාව සමන්විත විය. මෙම මුල් ව්‍යවස්ථාවට අනුව පිහිටවූ ඉන්දුනීසියාවේ පාර්ලිමේන්තුව අසාර්ථක එකක් විය. මෙයට හේතු වූයේ විවිධ සමාජ, දේශපාලන, ආගමික හා ජනවාර්ගික කණ්ඩායම් අතර ඇති නොගැළපීම් ය.

මෙම අවුල් සහගත කාල පරිච්ඡේදයෙන් පසුව සුකර්ණෝ 1956 දී මාර්ගෝපගත ප්‍රජාතන්ත්‍රවාදය (Guided Democracy) නම් අත්තනෝමතික ක්‍රමයක් හඳුන්වා දුන්නේ ය. සුකර්ණෝ මෙය අර්ථ දැක්වූයේ සාම්ප්‍රදායික ඉන්දුනීසියානු මූලධර්ම මත පදනම් ව සැකසුනු ක්‍රමයක් ලෙසටය. එසේම ඔහු යෝජනා කර සිටින්නේ රජයක පදනම විය යුත්තේ දේශපාලන පක්ෂ නොව ජනාධිපතිගේ මග පෙන්වීම යටතේ ජාතික සම්මුතියකට එලඹිය හැකි ක්‍රියාකාරී කණ්ඩායම් මත බවයි.

එමගින් රටේ පැවැත්මට තර්ජනයක් වූ විවිධාකාරයේ ගැටලු රැසක් සාර්ථකව මැඩපැවැත්වීමට ඔහුට හැකියාව ලැබිණි.

1960 දශකයේ මුල්භාගයේ දී සුකර්ණෝ ඉන්දුනීසියාව වාමාංශික කරනුයේ මිලිටරි සහ ඉස්ලාම්වාදීන්ගේ බලපෑම්වලින් ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂයට සහයෝගය හා ආරක්ෂාව සැපයීමට ය. ඒවාගේම සෝවියට් සමූහාණ්ඩුවේ සහ චීනයේ ආධාර ඇතිව අධිරාජ්‍ය විරෝධී පාලනය යටතේ ආක්‍රමණශීලී විදේශ ප්‍රතිපත්ති මාලාවක් ද ඔහු ආරම්භ කළේ ය.

කෙසේවෙතත් 1965 වනවිට සුකර්ණෝගේ රජය මිලිටරි වියදම් හමුවේ දැඩි බලපෑමකට ලක්විය. එසේම හමුදාවේ සිටි ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් 06 දෙනෙකු ඝාතනයෙන් ඝාතන රැල්ලක් ද ආරම්භ විය. මෙය සැප්තැම්බර් 30 ව්‍යාපාරය ලෙස හඳුන්වනු අතර එය හමුදා කණ්ඩායමක් විසින් මෙහෙය වූ බව සඳහන් වේ.

නමුත් පැය කිහිපයක් ඇතුළත මේජර් ජෙනරාල් සුහර්තෝ සිය අණ යටතේ හමුදා බලමුලු ගැන්වූ අතර ජකර්තා පාලනය සියතට ගත්තේ ය. කොමියුනිස්ට් විරෝධීන් විසින් රට පුරා සිටි කොමියුනිස්ට් වාදීන් මිලියනයකට ආසන්න ප්‍රමාණයක් ඝාතනය කළහ.

පසුව දේශපාලන වශයෙන් දුර්වල වූ සුකර්ණෝට ත්‍රිවිධ හමුදාවේ ප්‍රධානියා බවට පත්ව සිටි ජෙනරාල් සුහර්තෝ වෙතට ප්‍රධාන දේශපාලන හා මිලිටරි බලය පැවරීමට බල කෙරුණි. 1967 මාර්තු මාසයේ දී ඉන්දුනීසියානු පාර්ලිමේන්තුව ජෙනරාල් සුහර්තෝ වැඩ වැඩබලන ජනාධිපති ලෙස නම් කළේය වසරකට පසුව ඔහු නිල වශයෙන් ජනාධිපති ධූරයට පත්විය. සුකර්ණෝ 1970 දී මිය යන තෙක් ම නිවාස අඩස්සිය ජීවත් විය.

# විදේශ ප්‍රතිපත්තිය

ඉන්දුනීසියානු නිදහස් අරගලය ජයග්‍රහණය කරා මෙහෙය වූ ශ්‍රේෂ්ඨ නායකත්වය නොහොත් විප්ලවයේ මහා නායකත්වය වූ සුකර්ණෝ, ඉන්දුනීසියාවට නව ප්‍රතිරූපයක් නිර්මාණය කිරීමෙහිලා නිරත විය. මෙහි දී ඔහු විසින් අනුගමනය කරන ලද විදේශ ප්‍රතිපත්තීන් ඔහුගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙන්ම නිදහස් ඉන්දුනීසියාව ලෝකය ඉදිරියට ගෙන යාමට විශාල බලපෑමක් සිදු කරන ලදී. විදේශ ප්‍රතිපත්තියේ දී ඉන්දුනීසියාව මධ්‍යස්ථ ස්ථාවරයක් ගත්තේ ය.

සුකර්ණෝගේ බලය රට තුල සුරක්ෂිත වීමත් සමඟ ඔහු ලෝක දේශපාලනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට පටන් ගත්තේ ය. ඔහු ඉන්දුනීසියාවේ ජාත්‍යන්තර කීර්තිය ඉහළ නැංවීම සඳහා අධිරාජ්‍ය විරෝධීවීම මත පදනම් වූ ආක්‍රමණශීලී හා ස්ථිර ප්‍රතිපත්ති මාලාවක් දියත් කළේ ය. මෙම අධිරාජ්‍ය විරෝධී හා බටහිර විරෝධී ප්‍රතිපත්ති බොහෝ විට වෙනත් ජාතීන් සමඟ විවිධාකාර වූ අඳුරු මතභේද නිර්මාණය කිරීමට සමත් වුවද ඉන්දුනීසියානු ජනතාව එක්සත් කිරීම සඳහා ඔහු විසින් මෙම ප්‍රතිපත්තීන් නිර්මාණය කර ඇත. මේ සඳහා ඔහුගේ විදේශ අමාත්‍ය සුබන්ඩ්‍රියෝගේ (Subandrio) විශාල සහයෝගයක් ලැබුණි.

1956 දී ඔහුගේ පළමු බීජිං (Beijing) සංචාරයෙන් පසුව, සුකර්ණෝ මහජන චීන සමූහාණ්ඩුව හා පොදුවේ කොමියුනිස්ට් කණ්ඩායම සමඟ සබඳතා ශක්තිමත් කිරීමට පටන් ගැනීම ඔහුගේ විදේශ ප්‍රතිපත්තියේ වූ සුවිශේෂී අවස්ථාවකි. තවද ඔහු වැඩි වැඩියෙන් සෝවියට්-හමුදා මිලිටරි ආධාර පිළිගැනීමට ද පටන් ගත්තේ ය. 1960 දශකය මුල් භාගය වන විට සෝවියට් කණ්ඩායම වෙනත් කොමියුනිස්ට් නොවන රටකට වඩා ඉන්දුනීසියාවට වැඩි ආධාර ලබා දුන් අතර එම සෝවියට් හමුදා ආධාර සමාන වූයේ කියුබාවට ලබා දුන් ආධාරවලට පමණි.

එමෙන්ම ඉන්දුනීසියානු රජයට ලැබෙන්නා වූ කොමියුනිස්ට් ආධාරවල මෙම සැලකිය යුතු ගලායාම සහ සුකර්ණෝ විසින් පමණට වඩා සෝවියට්

සමූහාණ්ඩුවේ ආධාර මත විශ්වාසය තැබීම, එවකට වාමවාදී දර්ශනයන් පිළිබඳ කනස්සල්ලෙන් පසු වූ ඩ්වයිට් අයිසන්හවර් (Dwight Eisenhower) සහ ජෝන් එෆ්. කෙනඩි (John F. Kennedy) පාලන කාලයන්හි ද ඉන්දුනීසියාව් මිලිටරි ආධාර වැඩි කිරීමට හේතු විය.

1956 දී එක්සත් ජනපදයේ කළ සංචාරයේ දී සුකර්ණෝ එක්සත් ජනපද කොන්ග්‍රසයෙහි (United States Congress) ඒකාබද්ධ සැසියක් ඇමතීය. අද වන විටත් ඉන්දුනීසියානු ජනාධිපතිවරයෙක් එක්සත් ජනපද කොන්ග්‍රසයේ ඒකාබද්ධ සැසියක් ඇමතූ එකම අවස්ථාව මෙයයි. සිය පළමු ඇමරිකානු සංචාරයෙන් ඉක්බිතිව, සුකර්ණෝ සෝවියට් දේශයට ගිය අතර එහිදී ඔහුට වඩාත් සුබ පිළිගැනීමක් ලැබුණි. 1960 දී සෝවියට් අගමැති නිකිටා කෘෂෙව් (Nikita Khrushchev) ජකර්තා (Jakarta) සහ බාලි (Bali) වෙත නැවත පැමිණියේ ය. එහි දී ඔහු සුකර්ණෝට ලෙනින් සාම ත්‍යාගය (Lenin Peace Prize) ප්‍රදානය කළේ ය. පී.ආර්.ආර්.අයි.-පර්මෙස්ටා කැරැල්ලට (PRRI-Permesta Rebellion) සී.අයි.ඒ. (C.I.A) මැදිහත්වීමට අදාළ සංශෝධන සිදු කිරීම සඳහා එක්සත් ජනපද ජනාධිපති කෙනඩි, සුකර්ණෝට වොෂිංටන් ඩී.සී. (Washington D.C) වෙත ආරාධනා කළ අතර ඉන්දුනීසියාවට ඩොලර් බිලියන ගණනක් සිවිල් සහ හමුදා ආධාර ලබා දුන්නේ ය.



*(1956 මැයි මස 17 දින සුකර්ණෝ එක්සත් ජනපද කොන්ග්‍රසයෙහි ඒකාබද්ධ සැසියක් ඇමතීම)*

සුකර්ණෝ තම විදේශ ප්‍රතිපත්ති යටතේ 1955 දී සාර්ථකව පැවති බන්ඩුන්ග් සමුළුවේ (Bandung Conference) පසු විපරම් කිරීම සඳහා ඔහු විසින්, "නව යටත් විජිතවාදය සහ අධිරාජ්‍යවාදය" ව්‍යාප්ත කළ බවට චෝදනා කළ " පැරණි ස්ථාපිත බලවේග" ලෙස නම් කරන ලද බටහිර සුපිරි බලවතුන්ට ප්‍රතිවිරුද්ධ ලෙස "නව නැගී එන බලවේග" නමින් නව සන්ධානයක් ඇති කිරීමට උත්සාහ කළේ ය. 1961 දී සුකර්ණෝ ඊජිප්තු ජනාධිපති ගමාල් අබ්දෙල් නසාර් (Gamal Abdel Nassar), ඉන්දියාවේ අගමැති පණ්ඩිත් ජවහර්ලාල් නේරු (Pandit Jawaharlal Nehru), යුගෝස්ලාවියාවේ ජනාධිපති ජොසිප් බ්‍රොස් ටිටෝ (Josip Broz Tito) සහ ඝානාවේ ජනාධිපති ක්වාමේ නකුමා (Kwame Nkrumah) සමඟ නොබැඳි ව්‍යාපාරය නමින් තවත් දේශපාලන සන්ධානයක් ඇති කළේය. සීතල යුද්ධ තරඟයේ යෙදී සිටි ඇමරිකානු සහ සෝවියට් සුපිරි බලවේගයන්ගෙන් ස්වාධීනත්වය පවත්වා ගැනීමට අපේක්ෂා කරන ජාතීන්ට දේශපාලන සමගිය හා බලපෑම සැපයීම එහි අරමුණ විය.

තවද, ඔහුගේ නම කයිරෝ (Cairo), ඊජිප්තුවේ (Egypt) සහ මොරොක්කෝවේ රබාත්හි (Rabat) වීදි නාමයක් ලෙස ද පාකිස්තානයේ පෙෂාවර් හි (Peshawar) ප්‍රධාන චතුරශ්‍රයක් ලෙස ද භාවිත වේ. 1956 දී බෙල්ග්‍රේඩ් විශ්ව විද්‍යාලය ඔහුට ගෞරව ආචාර්ය උපාධියක් ප්‍රදානය කළේය. 1960 දී සුකර්ණෝ ඉන්දුනීසියානු භූමිය හා හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා ආක්‍රමණශීලී විදේශ ප්‍රතිපත්තියක් ආරම්භ කළේ ය. මීට අමතරව 1949 ලන්දේසි-ඉන්දුනීසියානු වට මේස සමුළුවේදී එකඟ වූ පරිදි, එම වසරේ අගෝස්තු මාසයේදී, නෙදර්ලන්තයේ නිව්ගිනියාවේ අනාගතය පිළිබඳ සාකච්ඡා දිගටම කරගෙන යාමට අපොහොසත් වීම හේතුවෙන් සුකර්ණෝ නෙදර්ලන්තය සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා බිඳ දැමීය.

ස්වාධීන පැපුවාන් රාජ්‍යයක් (Papuan) නිර්මාණය කිරීමට අදහස් කරමින් 1961 අප්‍රේල් මාසයේදී ලන්දේසීන් නිව්ගිනියා රාඩ් (Nieuw Guinea Raad) පිහිටුවීම නිවේදනය කළේ ය. 1961 දෙසැම්බර් 19 වන දින යෝගකාර්තා හි (Yogyakarta)

පැවති ට්‍රයි කොමන්ඩෝ රක්ජාත් (Tri Komando Rakjat - TRIKORA) කතාවේදී සුකර්ණෝ හමුදා ගැටුමක් ප්‍රකාශයට පත් කළේ ය. පසුව ඔහු බටහිර ඉරියන් ලෙස හැඳින්වූ අර්ධ දූපතට හමුදා ආක්‍රමණයන් යොමු කළේ ය.

1962 අවසානය වන විට ඉන්දුනීසියානු සොල්දාදුවන් 3,000 ක් බටහිර ඉරියන්/බටහිර පැපුවා (West Irian/ West Papua) පුරා පැමිණ සිටියහ. 1962 ජනවාරියේ දී ඉන්දුනීසියාවේ ටෝර්පිඩෝ (Torpedo) බෝට්ටු හතරක් ලන්දේසි නැව් සහ ගුවන් යානා විසින් ව්ලැක්කේ හෝක් වෙරළට (Vlakke Hoek) ඔබ්බෙන් වූ විට නාවික සටනක් ඇති විය. මෙහිදී එක් ඉන්දුනීසියානු බෝට්ටුවක් ගිලී ගිය අතර, නාවික නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී කොමදෝරු ජෝස් සුදාර්සෝ (Commodore Jos Sudarso) මිය ගියේ ය. 1962 පෙබරවාරි මාසයේදී එක්සත් ජනපද නීතිපති රොබට් කෙනඩි (Robbert Kennedy) නෙදර්ලන්තයට ගොස් ඉන්දුනීසියාව සමඟ සන්නද්ධ ගැටුමකදී එක්සත් ජනපදය නෙදර්ලන්තයට සහාය නොදක්වන බව රජයට දැනුම් දුන්නේ සුකර්ණෝ විසින් ඇති කරගත් විදේශ සම්බන්ධතා නිසාවෙනි.
සෝවියට් අවි සහ උපදේශකයින් සමඟ සුකර්ණෝ 1962 අගෝස්තු මාසයේදී ඔපෙරසි ජ්ජාවිජ්ජජා (Operasi Djajawidjaja) නමින් බයැක්හි (Biak) ඕලන්ද හමුදා මූලස්ථානයට මහා පරිමාණ ගුවන් හා මුහුදු ආක්‍රමණයක් සැලසුම් කළේය. එය මෙහෙයවනු ලැබුවේ මේජර් ජෙනරාල් සුහර්තෝ (Major General Suharto) විසිනි. මෙම සැලසුම් සාක්ෂාත් කර ගැනීමට පෙර ඉන්දුනීසියාව සහ නෙදර්ලන්තය 1962 අගෝස්තු මාසයේදී නිව්යෝක් ගිවිසුමට (New York Agreement) අත්සන් තැබීය. ඇමරිකානු රාජ්‍ය තාන්ත්‍රික එල්ස්වර්ත් බන්කර් (Ellsworth Bunker) විසින් සකස් කරන ලද බන්කර් සැලැස්ම (Bunker Plan) ක්‍රියාත්මක කිරීමට දෙරට එකඟ වූ අතර, 1962 ඔක්තෝබර් 1 වන දින බටහිර ඉරියන් / බටහිර පැපුවා එක්සත් ජාතීන්ගේ සංවිධානයට භාර දීමට ලන්දේසීන් එකඟ විය. 1963 මැයි මාසයේදී UNTEA විසින් එම ප්‍රදේශය ඉන්දුනීසියානු අධිකාරියට පැවරීය.

බටහිර ඉරියන්/බටහිර පැපුවා හි පාලනය අත්පත් කර ගැනීමෙන් පසුව, සුකර්ණෝ 1963 දී බ්‍රිතාන්‍යයේ සහාය ඇතිව පැවැත්වීමට නියමිතව තිබූ මැලේසියාවේ සම්මේලනය (Federation of Malayasia) පිහිටුවීමට විරුද්ධ විය. එය ඉන්දුනීසියාව යටපත් කිරීම සඳහා බ්‍රිතාන්‍යයන් විසින් කරන ලද නව යටත් විජිත කුමන්ත්‍රණයක් යැයි ඔහු කියා සිටියේ ය. බ්‍රිතාන්‍ය බෝර්නියෝ ප්‍රදේශ වූ (Borneo Territories) සරවක් (Sarawak) සහ බ්‍රැනයි (Brunei) ප්‍රදේශවල වාමාංශික දේශපාලන කොටස් මෙම මැලේසියා සම්මේලනයේ සැලැස්මට විරුද්ධ වූ අතර සුකර්ණෝ සමඟ සන්ධානගත වුවද, සුකර්ණෝගේ දේශපාලන ප්‍රකාශයන් නොතකා 1963 සැප්තැම්බර් මාසයේ දී මැලේසියාව පිහිටුවන ලදී. ඉන් අනතුරුව ඉන්දුනීසියාවේ-මැලේසියාවේ ගැටුම සුකර්ණෝ විසින් 1964 මැයි 3 වන දින ජකර්තා (Jakarta) නුවරදී ඩිවි කොමන්ඩෝ රක්ජාත් (Dwi Komando Rakjat - DWIKORA) කතාවේදී ප්‍රකාශයට පත් කරන ලදී. නමුත් ඇතැමුන් චෝදනා කළ පරිදි, සුකර්ණෝගේ ප්‍රකාශිත පරමාර්ථය වූ කලී සබා (Sabah) සහ සරවක් (Sarawak) ඉන්දුනීසියාවට සම්බන්ධ කිරීමක් නොව, උතුරු කාලිමන්තන් කොමියුනිස්ට් (North Kalimantan Communist Party) පක්ෂයේ පාලනය යටතේ "උතුරු කාලිමන්තන් රාජ්‍යයක්" (State of North Kalimantan) පිහිටුවීමයි.

සුකර්ණෝ විසින් 1964 සිට 1966 මුල් භාගය දක්වා ඉන්දුනීසියානු සොල්දාදුවන්, සිවිල් වැසියන් සහ මැලේසියානු කොමියුනිස්ට් ගරිල්ලන් සීමිත පිරිසක් උතුරු බෝර්නියෝ (North Borneo) සහ මැලේ අර්ධද්වීපයට යවන ලදී. මෙම හමුදා මැලේසියාවේ නව රාජ්‍යය ආරක්ෂා කිරීම සඳහා යොදවා ඇති බ්‍රිතාන්‍ය සහ පොදුරාජ්‍ය මණ්ඩලීය සොල්දාදුවන් සමඟ සටන් කළහ. ඉන්දුනීසියානු නියෝජිතයින් විසින් සිංගප්පූරුවේ බෝම්බ කිහිපයක් ද පුපුරවා දමන ලදී. දේශීය වශයෙන්, සුකර්ණෝ විසින් බ්‍රිතාන්‍ය විරෝධී හැඟීම් අවුස්සන අතර බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලය ගිනිබත් කරන ලදී. 1964 දී වරලත් බැංකුවේ ඉන්දුනීසියානු මෙහෙයුම් සහ යුනිලීවර් (Unilever) ඇතුලු රට තුළ ක්‍රියාත්මක වන සියලුම බ්‍රිතාන්‍ය සමාගම් ජනසතු කරන ලදී. 1964 අගෝස්තු මාසයේදී සුකර්ණෝ විසින් මැලේසියානු භූමියේ පොන්තියන් (Pontian) සහ ලැබිස්

(Labis) වෙත ඉන්දුනීසියානු හමුදා ගොඩබැස්සවීමට අවසර දීමත් සමඟ ගැටුම උච්චතම අවස්ථාවකට එළඹුණු අතර එම උත්සන්න වීම් සමඟම යුද්ධය නොවැළැක්විය හැකි කරුණක් බවට පත්විය. කෙසේ වෙතත්, 1964 සැප්තැම්බර් මැද භාගය වන විට සුන්ඩා සමුද්‍ර සන්ධියේ (Sunda Straits Crisis) අර්බුදය අවසන් වූ විට තත්ත්වය සන්සුන් වූ අතර 1965 අප්‍රේල් මාසයේ සිදු වූ ව්‍යසනකාරී ප්ලාමන් මාපු සටනින් (Battle of Plaman Mapu) පසුව, සරවක් (Sarawak ) වෙත ඉන්දුනීසියානු වැටලීම් අඩු හා දුර්වල විය.

1964 දී සුකර්ණෝ ඇමරිකානු විරෝධී ව්‍යාපාරයක් ආරම්භ කළ අතර එයට තුඩු දුන් ප්‍රධාන හේතූන් ලෙස සුකර්ණෝ කොමියුනිස්ට් කණ්ඩායම දෙසට මාරුවීම සහ ලින්ඩන් ජොන්සන් (Lyndon Johnson) පරිපාලනය සමඟ අඩු මිත්‍ර සබඳතා ඇති කිරීම යනාදිය දැක්විය හැක. ඉන්දුනීසියාවේ ඇමරිකානු අවශ්‍යතා සහ ව්‍යාපාර රජයේ නිලධාරීන් විසින් හෙළා දකින ලද අතර පී.කේ.අයි. (PKI) නායකත්වයෙන් යුත් මැරයන් විසින් ඔවුන්ට පහර දෙන ලදී. ඒ අනුව ඇමරිකානු චිත්‍රපට තහනම් කිරීම, ඇමරිකානු පොත් සහ බීට්ල්ස් ඇල්බම් (Beatles Albums) පුළුස්සා දැමීම මෙන්ම ඉන්දුනීසියානු සංගීත කණ්ඩායමක් වන කොයිස් ප්ලස් (Koes Plus) ඇමරිකානු විලාසිතාවේ රොක් ඇන්ඩ් රෝල් සංගීතය (rock and roll music) වාදනය කිරීම නිසා සිරගත කිරීම වැනි දැඩි සීමා පැනවීම් කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඉන්දුනීසියාව සඳහා එක්සත් ජනපද ආධාර නතර කරන ලද අතර, සුකර්ණෝ ප්‍රසිද්ධියේ එම ආධාර ප්‍රතික්ෂේප කරන ලදී.

1965 ජනවාරි 7 වන දින සුකර්ණෝ එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් (UNO) ඉන්දුනීසියාව ඉවත් කරගත් අතර එක්සත් ජනපදයේ සහාය ඇතිව මැලේසියාව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ අසුනක් ගත්තේ ය.

සුකර්ණෝ චීනය, උතුරු කොරියාව, උතුරු වියට්නාමය සහ කාම්බෝජය සමඟ නව සන්ධානයක් ඇති කර ගත් අතර එය ඔහු "බීජිං-ප්යොංයැං-හැනෝයි-නොම් පෙන්-ජකර්තා අක්ෂය" (Beijing-Pyongyang-Hanoi-Phnom Penh-

Jakarta) ලෙස නම් කළේ ය. 1965 ජනවාරියේ දී ඉන්දුනීසියාව අධිරාජ්‍යවාදී ආධිපත්‍යය සහිත එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ඉවත් කිරීමෙන් පසුව, සුකර්ණෝ එක්සත් ජාතීන්ගේ සංවිධානයට "නව නැගී එන බලවේගයන්ගේ සම්මේලනය" (Conference of New Emerging Forces - CONEFO) නමින් තරඟකාරී සංවිධානයක් එවකට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයෙකු නොවූ චීන මහජන ජනරජයේ සහය සමඟ පිහිටුවීමට උත්සාහ කරන ලදී. රජය සෝවියට් සංගමයට දැඩි ලෙස ණයගැති වීමත් සමඟ ඉන්දුනීසියාව වැඩි වැඩියෙන් චීනය මත යැපීම සඳහා ආධාර ලබා ගත්තේ ය.

## ගත හැකි ආදර්ශ

ඉන්දුනීසියානු ජාතිකයන්ගේ හදවත් තුළ ලැගුම් ගත් ශ්‍රේෂ්ඨ ජාතිකවාදී ඉන්දුනීසියානුවා බව ඉහත චරිතාංග විස්තර කිරීම තුළ දී මනාව විස්තර වන්නට ඇත.ඔහුගේ ජීවිතය තුළ තම රට උදෙසා සිදු කළ ජාතික නිදහස් කර්තව්‍යය හේතුවෙන් දේශීය ජනතාවගේ හදවත් තුළ ඔහු ලැගුම් ගත්තා පමණක් නොව ජාත්‍යන්තර ප්‍රජාව තුළ ද ඔහුගේ කීර්තිනාමය පැතිරිණ.

ඔහු මෙලෙස ඉතා ජනප්‍රියත්වයට පත්වූයේ විශේෂයෙන්ම ඔහු ඉන්දුනීසියාව නිදහස් රාජ්‍යයක් ලෙස පත් කරන්නට කරන ලද සේවාව සහ නිදහස් ඉන්දුනීසියාවේ පැවැති ගෝත්‍රික, වර්ගවාදී සහ ආර්ථික වාදය ආදී භේද ඉවතලා එක් ඉන්දුනීසියානු ජාතියක් ගොඩනැගීමේ උත්කෘෂ්ට කර්තව්‍යය නිසා ය.

තවද ඔහුගේ ජාතික කර්තව්‍යය එතනින් නිමා නොවී නොබැදි ජාතීන්ගේ සංවිධානයට උපත ලබා දීමට ද ඔහු කරන ලද සේවාව අතිමහත් ය. ඔහු මෙම සියල්ල හරහා ඉදිරිපත් වූයේ අධිරාජ්‍යයවාදයට විරුද්ධව යටත්විජිත පිබිදවීමට සහ එම රාජ්‍යයන්ගේ වෛරය ද ඉහළ නංවා ගැනීම උදෙසා ය. ජීවිතයට කොතෙකුත් බාධා පැමිණියද ඒවාට නොබියව මුහුණ දී අරමුණු වෙත ලඟාවීම ඔහුගේ මූලික අභිප්‍රාය විය.

## සාරාංශය

ඉන්දුනීසියාවේ ප්‍රථම ජනාධිපතිවරයා වන සුකර්ණෝ, එරට ඕලන්ද අධිරාජ්‍යවාදී පාලනයෙන් මුදවා නිදහස් හා ස්වාධීන රාජ්‍යයක් බවට පත් කිරීමට සුවිශාල කාර්යභාරයක් කරන ලද නායකයෙකු ලෙස හැඳින්විය හැකි ය. වසර 20කට ආසන්න කාලයක් ඉන්දුනීසියාව පාලනය කළ මොහු එරට තුළ දේශපාලනික, ආර්ථික හා සමාජීය වශයෙන් ස්ථාවරභාවයක් ඇති කිරීමට සමත් විය. ඉන්දුනීසියාවට ආවේණික වූ “Guided Democracy” නම් වූ දේශපාලනික ක්‍රමය හඳුන්වා දී එමඟින් රට එක්සත් මෙන්ම ස්ථාවර කිරීමට ඔහුට හැකි විය.

සුකර්ණෝ ඉන්දුනීසියාව දේශපාලනික වශයෙන් ස්ථාවර කළ ද ආර්ථික වශයෙන් සැලකිය යුතු සංවර්ධනයක් ඇති කරලීමට අසමත් විය. එයට ඔහුගේ ඒකාධිපති පාලන ක්‍රමය හේතු වූ බව බොහෝ අයගේ මතය විය. 1960 දශකය මැද භාගය වන විට සුකර්ණෝගේ පාලනයේ අසාර්ථකභාවයන් මනා ලෙස පිළිඹිබු වන්නට විය. ඒ ඉන්දුනීසියාවේ දේශපාලනය මෙන්ම ආර්ථිකය ද විශාල ආගාධයකට ඇද දමමින් ය.

අවසානයේ දී, එනම් 1967 දී ඔහුගේ ජෙනරාල්වරයෙකු ලෙස කටයුතු කළ සුහර්තෝ, සුකර්ණෝ ව බලයෙන් නෙරපා ඉන්දුනීසියාවේ පාලන බලය ලබා ගත්තේ ය.

## මූලාශ්‍ර නාමාවලිය

Hays, J. (n.d.). SUKARNO. Retrieved September 13, 2020, from http://factsanddetails.com/indonesia/History_and_Religion/sub6_1c/entry-3957.html

Szczepanski, K. (n.d.). Biography of Sukarno, Indonesia's First President. Retrieved September 13, 2020, from https://www.thoughtco.com/sukarno-indonesias-first-president-195521

# සුහර්තෝ



**කණ්ඩායම් සාමාජිකයන්:**

- ශෂිණි විජේතිලක
- අංජනා සංදීපනී
- දේවින්දි වීරසේකර
- හිරුණි ආරියරත්න
- දිල්ෂානි වීරසිංහ

## හැඳින්වීම

යම් පුද්ගලයෙකුගේ නාමයක් ඇසූ පමණින් එය අපගේ මතකයට නැගෙන්නේ නම්, ඔහුගේ හෝ ඇයගේ චරිතයට ලොව තුළ පවතින ප්‍රබලත්වය කොතෙක්දැයි මනා ලෙස අවබෝධ කරගත හැකිය. එවන් ප්‍රබලත්වයකට හිමිකම් කීමට නම් තමන්ගෙන් ඉටු විය යුතු යුතුකම් නිසි ලෙස ඉටු කරමින් මේ මිහිතලයට ණය නැති පුද්ගලයෙක් විලස ගෞරාන්විත අවසානයක් ලබා ගත යුතුය. එලෙස ආසියානු කලාපයේ නොමැකෙන සලකුණක් තැබූ රාජ්‍ය නායකයින් අතරින් ඉන්දුනීසියාවේ නොමියෙන මතකයන් රැසක් ඉතිරි කරමින් නිවී ගිය තරුවක් සිටියේය. ලොව විශාලතම ද්වීපත් රාජාධානිය තම මාතෘ භූමිය වීමේ වාසනාවට හිමිකම් කීමට සමත් වුවද අනාගතයේ යම් දිනයක එහි උරුමකරු වීමට තරම් භාග්‍යවන්ත වේවි යැයි මෙම රාජ්‍ය නායකයා සිහිනෙකිනවත් නොසිතන්නට ඇත. ඉන්දුනීසියාව යන නම ඇසෙන විටම මොහුගේ පාලන සමය මතකයට නැගීමට තරම් ඔහු ඉන්දුනීසියාවේ හැරවුම් ලක්ෂය විය. මුළු රාජ්‍යයම ආලෝකමත් කිරීමට සමත් වූ ඒ ප්‍රබල අකුණ නමින් "සුහර්තෝ" නම් වූ ඉන්දුනීසියාවේ දෙවැනි ජනාධිපතිවරයා විය.

ඉන්දුනීසියාව ඕලන්ද පාලනය යටතේ පැවතුන කාලයේදී එනම් 1921 ජූනි මස 8 වන දින එහි කෙමසුක් නම් කුඩා ගමේදී සුහර්තෝ උපත ලැබුවේය. එකල ඔහුට අනෙකුත් බොහෝ ජාවා වැසියන් සේම වාසගමක් නොමැතිව සුහර්තෝ යන තනි නාමය පමණක් දැමීමට එකල වැඩිහිටියන් තීරණය කරන ලදි. තරුණ වියට එළඹීමෙන් පසුව ඕලන්ද හා ජපන් හමුදා යටතේ සේවයට බැඳීමෙන් අනතුරුව 1945 අගෝස්තු 17 වන දින ඉන්දුනීසියානු නිදහසෙන් පසුව පිහිටවූ ඉන්දුනීසියානු හමුදාවට ද බැඳුණේය. 1950 දී ඉන්දුනීසියාව ජනරජයක් බවට පත් වූ අතර සුහර්තෝ ඉන්පසු එළඹුණු අවුරුදු 15 ඇතුළතදී ටිකෙන් ටික සිය හමුදා නිලයන් උසස් කර ගැනීමට සමත්වුයේ ය. ඔහු 1957දී කර්නල් තනතුරට, 1960 දී බ්‍රිගේඩියර් ජෙනරල් තනතුරට හා 1962 දී මේජර් ජෙනරල් තනතුරට පත් වුයේ ය.

එවකට ඉන්දුනීසියානු ජනපති වූ සුකර්නෝ ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂය සමගත් චීනය සමඟ සමීප සබඳතා පැවැත්වුවද හමුදාව දිගින් දිගටම

කොමියුනිස්ට් විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කළහ. 1965දී ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂයේ සහය මත වූ කුමන්ත්‍රණයක් සිදු වූ අතර එය මැඩපැවැත්වීමට සුහර්තෝ ඇතුළු හමුදාව සමත් වුහ. හමුදාව විසින් කොමියුනිස්ට් විරෝධී රැල්ලක් ගෙන ගිය අතර ඇමරිකානු මධ්‍යම බුද්ධි අංශයට අනුව එය විසිවන ශතවර්ෂය තුළදී සිදු වූ දරුණුතම සමූලඝාතන වලින් එකක් ලෙස විස්තර කර ඇත. 1967 මාර්තු මාසයේ දී මහජන උපදේශක සභාව (ජාතික ව්‍යවස්ථාදායකය) සුහර්තෝ ව වැඩබලන ජනපති ලෙස පත්කළ අතර 1968 දී ඔහුව ජනපති ලෙස පත් කළේය.

ඉන්දුනීසියාවේ දෙවන ජනාධිපති ලෙස පත්වීමෙන් පසුව සුහර්තෝ එරටේ ආර්ථික දියුණුව උදෙසා ඇමරිකානු ආර්ථික විශේෂඥයින්ගේ සහය මත "නව පාලන ක්‍රමය" නොහොත් New Order නමින් ප්‍රතිපත්තියක් දියත් කළේය. ඒ අනුව යමින් 1972 වර්ෂය වන විට ඉන්දුනීසියාව ඔහු යටතේ ස්ථාවර ආර්ථික දියුණුවක් ලබා ගැනීමට සමත් විය. එමෙන්ම ඉන්දුනීසියාව නැවත එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය ලබා ගැනීමත් අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමයේ (ASEAN) ආරම්භක සාමාජිකයෙකු බවට පත්වීමත් ඔහු යටතේ සිදුවූ විශේෂ සේවාවන්ය.

සුහර්තෝ මූලික වශයෙන් හමුදා ක්‍රියාකාරීත්වයක් මත පදනම් වූ පාලනයක් ගෙන ගියේය. ත්‍රිවිධ හමුදාවේ සහ රාජ්‍යයේ ප්‍රධානියා ලෙස බලය ඔහු සතු විය. එහෙත් කල්යත්ම ඉන්දුනීසියාවේ ආර්ථිකය ඉහළ ගිය ද එම ධනය රටේ අසමාන ලෙස බෙදීයාම ගැටළු සහගත වූ අතර පාලනය ටිකෙන් ටික නොසන්සුන් හා ගැටලුකාරී තත්ත්වයකට පත්විය. ඔහුගේ පාලනය යටතේ හා ශීත යුධ සමයේදී ඉන්දුනීසියාව බටහිර අභිලාෂයන්ට වඩාත් සමීපව බැඳී සිටියේ ය. එමෙන්ම වේගවත් ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම සඳහා ආධාර සහ ආයෝජන ද ලැබුණු අතර එය ඔහුගේ හිතවතුන්ට ද වාසිදායක විය. ඔහු බොහෝවිට නිරවුල් නොවන සංවර්ධන ව්‍යාපෘති සඳහා අවධානය යොමු කළ අතර බොහෝ ඉඩම් අහිමි ගොවීන් නැවත පදිංචි කරවීම සඳහා වනාන්තර එළි පෙහෙළි කිරීම් සිදුකළේ ය. එය පසුකාලීනව රටේ පාරිසරික අර්බුද වලට හේතු විය.

ඔහුගේ පාලනය සමයේදී විශාල වශයෙන් ප්‍රතිවිරුද්ධ දේශපාලඥයින් ඝාතනය කිරීම්, සිරගත කිරීම් එසේත් නැතිනම් කම්කරු කඳවුරුවලට යැවීම් සිදුවිය. එමෙන්ම නැගෙනහිර ටිමෝරය 1975 වර්ෂයේදී නීතිවිරෝධී ලෙස ආක්‍රමණය කිරීමේදී දස දහස් ගණනක් ජීවිත අහිමි වුහ. 1997 ආසියානු ආර්ථික අර්බුදයේ දී ඉන්දුනීසියානු ආර්ථිකයටද එය අහිතකර ලෙස බලපෑ අතර මිල ගණන් ඉහළ යාමත්, විරැකියාවත් මහජන නොසන්සුන්තාවයට මුල පිරූ අතර සුහර්තෝ එයට අවශ්‍ය පියවර ගැනීමට අපොහොසත් වුයේ ය. එයද ඔහුගේ බලය අතහැරීමට හේතුවක් විය. ඔහුගේ පාලන කාලය තුළදී ඉන්දුනීසියාව ආර්ථික, දේශපාලනික ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමට සමත් වුවද කෙමෙන් කෙමෙන් ඔහුගේ රාජ්‍යද අස්ථාවරත්වයක් සහිත පාලනයක් බවට පත් වුයේ ය.

ඔහුගේ දේශපාලන ජීවිතය 1998 මැයි මාසයේදී අවසන් වුයේ ය. මැයි දොළොස් වන දින ආරක්ෂක අංශ විසින් ත්‍රිසක්ති විශ්වවිද්‍යාලයේ (Trisakti University) සිසුන් සය දෙනෙකු ඝාතනය කිරීම සුහර්තෝට බලය අත්හැරීමට හේතු විය. ඔහු 1998 දී වසර 31 ක පාලන කාලයකින් පසුව බලයෙන් ඉවත් වුයේ ය.

වර්තමානයේ දී අග්නිදිග ආසියාවේ විශාලතම ආර්ථිකය හිමි රාජ්‍ය වන්නේ ඉන්දුනීසියාවයි. සුහර්තෝගේ පාලන සමය තුල ඉන්දුනීසියාව අත්කරගත් ආර්ථික දේශපාලනික දියුණුව නිසාවෙන් එරට ඉතිහාසයේ එම කාල පරිච්ඡේදයක් සුවිශේෂී විය. ඒ අනුව මෙම ලිපිය තුලින් සුහර්තෝගේ ළමා කාලය, අධ්‍යාපනය, දේශපාලනයට පිවිසීම, ඔහු නායකත්වය කරා ගමන් කල ආකාරය, ඔහු විසින් එරට ජනපති ලෙස රටට කල සේවය හා අනුගමනය කල විදේශ ප්‍රතිපත්තිය සහ ඔහුගේ දිවිය තුළින් අපගේ ජීවිතය සාර්ථක කරගැනීමට ගත හැකි ආදර්ශ පිළිබඳව සාකච්ඡා කරයි.

## ළමා කාලය, අධ්‍යාපන පසුබිම හා දේශපාලනයට පිවිසීම

අනෙකුත් වැසියන් මෙන් සුහර්තෝ ද ඔහු තම වාසගම නොවල ලබාදුන් නාමය පමණක් නිතර භාවිතයට ගත් ඉන්දුනීසියානු නායකයෙකු වුයේ ය. මෑත වසරවල ආගමික සන්දර්භය තුළ ඔහු සමහර විට හජි (Haji) හෝ "එල්-හජ්

මොහොමඩ් සුහර්තෝ" (El-Haj Mohammed Suharto) ලෙස හැඳින්වුවද මෙම නම් ඔහුගේ විධිමත් නාමයේ කොටසක් ලෙස සාමාන්‍යයෙන් භාවිතා නොවීය. ඉන්දුනීසියාවේ සාමාන්‍ය ප්‍රවේශය වන්නේ අදාළ පුද්ගලයා කැමති අක්ෂර වින්‍යාසය ට අනුව නාමයක් භාවිතා කිරීමයි. ජාත්‍යන්තර ඉංග්‍රීසි භාෂා මුද්‍රණාලය සාමාන්‍යයෙන් ‘‘සුහර්තෝ’’ (Suhartho) අක්ෂර වින්‍යාසය භාවිතා කරන අතර ඉන්දුනීසියානු රජය සහ මාධ්‍ය ‘‘සෝහාර්තෝ’’ (Soeharto) ලෙස භාවිතා කරයි. ඔහු ඉන්දුනීසියානු පුරවැසියන් අතර "පක් හර්තෝ" (Pak Harto) නමින් ප්‍රසිද්ධ වූ ශ්‍රේෂ්ඨ නායකයෙකු වුයේ ය. එම " පක් "යන නාමය එරට පුද්ගලයන් හට ගෞරවයක් ලබා දී ඇමතීම සඳහා යොදා ගන්නා ලදී. සුහර්තෝ 1921 ජූනි මස 8 වන දින ලන්දේසි යටත් විජිත සමයේ සාමාන්‍ය මධ්‍යම ජාවානු පවුලක විශාල ගෝඩියන් (Godean) ගම්මානයේ කොටසක් වූ කෙමසුක් (Kemasuk) නම් කුඩා ගම්මානයේ උණ බම්බු වලින් නිර්මාණය කරන ලද නිවසක උපත ලැබුවේ ය. මෙම ගම්මානය ජාවාවරුන්ගේ සංස්කෘතික හදවත වන යෝගියාකාර්තා (Yogyakarta) සිට කිලෝමීටර් 15ක් බටහිරින් පිහිටා ඇත. ගොවි පන්තියේ ජාවා ජනවාර්ගික දෙමාපියන්ට දාව උපත ලැබූ ඔහු තම පියාගේ දෙවන විවාහයේ එකම දරුවා වූයේ ය. එනම් ඔහු හට එක කුස උපන් කිසිදු සහෝදර සහෝදරියන් නොමැති වූ නමුදු ඔහුගේ පියාගේ පෙර විවාහයෙන් දරුවන් දෙදෙනෙකු සිටි අතර ඔහුගේ පියා වූ කර්ටෝසුඩිරෝ (Kertosudiro) ගමේ වාරිමාර්ග නිලධාරියෙකු වුයේ ය. සුහර්තෝගේ මව වන සුකිරා (Sukirah) සරල ගැමි කාන්තාවක වූවා ය.

පුංචි සුහර්තෝ කුඩා කල හැදී වැඩුනේ සාමාන්‍ය ජීවිත රටාවකට අනුවයි. ඔහුගේ ජාවානී මුස්ලිම් දෙමාපියන් ඔහු උපතින් වැඩි කලක් යන්නට පෙර දික්කසාද විය. සුහර්තෝගේ පියා දික්කසාදයෙන් පසුව තම පුතුව රැගෙන වොරියන්තෝරෝ (Wuryantoro) වෙත පැමිණි තම ආදරණීය පුතා ඔහුගේ එකම සහෝදරිය වෙත භාර දුන්නේය. ඇයගේ සැමියා වූ ප්‍රවීරෝවිහාරිජෝගෙන් (Prawirowiharjo) ඉඩම් වගා කිරීම, ගොවිතැන් කටයතු, ඖෂධ පැළෑටි ආදී අංශ කෙරෙහි හසල දැනුමක් ලබා ගත්තේය. ප්‍රවීරෝවිහාරිජෝ විසින් පියෙකු සතු භූමිකාව නිසි ලෙස ඉටු කරමින් කුඩා

සුහර්තෝ ව ආදරයෙන් බලා කියා ගනිමින් ඔහුට අවශ්‍ය මග පෙන්වීම ලබා දෙන ලදි. සුහර්තෝ තමන් හදාගත් පියාගෙන් ආධ්‍යාත්මික පුහුණුව, සඳුදා හා බ්‍රහස්පතින්දා දිනවල නිරාහාරව සිටීම වැනි බොහෝ අසීරු ක්‍රියා ඉගෙන ගත්තේය. එවැනි ආකාරයේ ඉගැන්වීම් තුළින් ඔවුන් බලපොරොත්තු වූයේ විඳ දරා ගැනීමේ ශක්තිය වැඩිදියුණු කිරීම හා චිත්ත ශක්තිය වැඩිදියුණු කිරීම ය.

එසේම පිරිසිදු ජාවා (Javanese) ජාතිකයකු වන්නේ කෙසේදැයි ඔහු ඉගෙන ගත්තේ ද තමා හදාවඩාගත් පියාගෙන්මය. ද්විපායන සහ රාමදාන්ට (Dwipayana and Ramadhan) (1989:13) අනුව වරක සුහර්තෝ ප්‍රකාශ කල සිටියේ, "එකල මට ජාවා (Java) ජීවිතයේ දර්ශනය තේරුම් ගැනීමට, ඒවා අනුගමනය කිරීමට බල කෙරිණි. තවද ආගම හා ජාවා ජීවන රටාව අවබෝධ කරගැනීමට අවට සමාජය එලදායී වුණි." යන්නයි.

සුහර්තෝට කුඩා අවධියේ දී අධ්‍යාපන කටයුතු සඳහා විවිධ වූ බාධා ඇති විය. එහි ප්‍රතිඵලයක් වූයේ ඔහු හට වරින් වර පාසල් මාරු කිරීමට සිදුවීමයි. ඔහුගේ පාසල වූයේ ගෝඩියන්හි (Godean) පුලුහාන් (Puluhan) පාසලයි. පසුව ඔහුට එයින් ඉවත් වී කෙමසුක් හී පැවති පීඩිස් (Pedes ) පාසලටද, තිවීර් (Tiwir) යන පාසලටද ඇතුළත් වීමට සිදුවිය.

සුහර්තෝ කුඩා කල ඉගෙනීම් කටයුතු සඳහා ඉතා දක්ෂ සිසුවෙකු වූ අතර පවුල් පසුබිමේ පැවති අර්බුදකාරී තත්වයන් හේතුවෙන් අධ්‍යාපනයට යම් බාධා එල්ල වුවද හැකි උපරිමයෙන් තම අධ්‍යාපන කටයුතු සිඳු කිරීමට ඔහු සමත් විය. තවද ඔහු ජාවා දර්ශනය පිළිබඳව හසල දැනුමක් ලබාගත්තේය. එසේම ඔහු ජාවා දර්ශනයට අමතරව ඉස්ලාම් දර්ශනය පිළිබඳව හොඳින් උගත්තේය. ඔහු කුඩා කල තම අධ්‍යාපනය සඳහාම පමණක් නොව විවිධ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහාද තම උපරිම දායකත්වය ලබාදුන්නේ ය. තම අධ්‍යාපනය අතරතුර තමා හදාවඩාගත් පියා හට ගොවිතැන් කටයුතු වලදී සහාය වීමට සුහර්තෝ අමතක නොකළේය. මේ අනුව යමින් සුහර්තෝහට පොතපතෙහි දැනුම පමණක් නොව සමාජය පිළිබඳවද හසල දැනුමක් ලබා ගැනීමට හැකි විය.



(සුහර්තෝ කුඩා අවධියේ දී හා හමුදාවන්හි සේවය කල සමයේ)

ඔහු විසි තුන් වියට පා තැබීමෙන් අනතුරුව එවකට ඉන්දුනීසියාව තුල කීර්තිමත් හා ධනවත් පවුලක දියණියක වූ සිති හර්ටිනා (Siti Hartinah) (මැය පසු කාලීනව "Madame Tien" ලෙස හැඳින්වේ) මෙනවිය සමඟ විවාහ වූවේය. විවාහයෙන් පසු ඔවුන් දෙපළ දරුවන් හයදෙනෙකු හට උපත ලබා දුන්හ. ඒ අනුව සිති හර්දියන්ති රුක්මානා (Siti Hardiyanti Rukmana) වර්ෂ 1949 දී, සිගිට් හර්ජෝජුදාන්තෝ (Sigit Harjojudanto) වර්ෂ 1951 දී, බම්බාං ත්‍රිහාට්මොඩ්ජෝ (Bambang Trihatmodjo) වර්ෂ 1953 දී, සිටි හෙදියාති (Siti Hediati) වර්ෂ 1959 දී, හුටෝමෝ මැන්ඩලා පුත්‍රා (Hutomo Mandala Putra) වර්ෂ 1962 දී, සහ සිති හුටාමි එන්ඩාන්ග් ඇඩිනිංසි (Siti Hutami Endang Adiningsih) වර්ෂ 1964 දී ද උපත ලදහ. එහෙත් අවසානවන්ත ලෙස ඉදින් වසර දෙකකට පසුව එනම් වර්ෂ 1966 දී සුහර්තෝගේ බිරිඳ මෙලොවින් සමු ගත්තාය.



(සුහර්තෝ ඔහුගේ බිරිඳ සහ දරුවන් හයදෙනා සමඟ)

## නායකත්වය කරා ගිය ගමන් මග

මෙතුමා නායකත්වය කරා ගිය ගමනේදී ඒ තුළ වැඩි ඉඩකඩක් වෙන් වන්නේ ඔහුගේ හමුදා ජීවිතයටයි. සුහර්තෝ වයස 18දී මධ්‍යම පාසල අවසන් කළ අතර වොරියන්තාරෝහි (Wuryantoro) බැංකුවක ලිපිකරු රැකියාවකට බැඳුණේය. පාපැදි අනතුරකින් පසුව ඔහුට රැකියාවෙන් ඉල්ලා අස්වීමට සිදු වුයේ ඔහු සතු වු එකම නිල ඇඳුම විනාශ වීම නිසාය. එයින් ඇති වූ විරැකියා තත්වයේ ප්‍රතිඵලයක් ලෙස ඔහුගේ හමුදා ජීවිතය ආරම්භ වුයේ ය. ඔහු 1940 ජුනි මාසයේ දී රාජකීය නෙදර්ලන්ත නැගෙනහිර ඉන්දීය හමුදාවට (Royal Neatherlands East Indies Army-KNIL) සම්බන්ධව යෝගියාකාර්තා (Yogyakarta) අසල ගොම්බොංහි (Gombong) මූලික පුහුණුව ලබා ගත්තේය.

සුහර්තෝ ව රැම්පල්හි (Rampal) දහතුන්වන බලඇණියට අනියුක්ත කළ අතර ගොම්බොංහි KNIL කාදර්ස් පාසලෙහි (Kadrschool) කෙටි පුහුණු පාඨමාලාවකින් පසු සාජන් තනතුරට පත්ව සිසාරුවා (Cisarua) සංචිත බලඇණියට අනියුක්ත කරන ලදී. ඉන් අනතුරුව සුහර්තෝ 1942 මාර්තු මාසේදී ලන්දේසීන් ජපන් හමුදාවට යටත් වීමෙන් පසුව රාජකීය නෙදර්ලන්ත නැගෙනහිර ඉන්දීය හමුදාවෙන් ඉවත්ව යෝගියාකාර්තාහි පොලිස් බළකායට බැඳුණේ ය. ඉන් ඔහුට ජපාන ආරක්ෂක හමුදාවන්ට බැඳීමට අවස්ථාව ලැබුණු අතර 1943 ඔක්තෝම්බර් මාසයේදී සුහර්තෝ ජපාන අනුග්‍රහයෙන් පොලිස් බලකායෙන් අලුතෙන් පිහිටුවන ලද පීටා (PETA) ආරක්ෂක බළඇණිය වෙත මාරු කරන ලදී. දෙවන ලෝක යුධ සමයේ ජපානය යටත් වීමෙන් පසුව 1945 අගෝස්තු මාසයේ දී ඉන්දුනීසියානු නිදහස ප්‍රකාශ කිරීම සිදුවිය.

ඉන්දුනීසියානු ජාතික විප්ලවයෙන් පසු සුහර්තෝ ජපාන අණට අනුව ඔහුගේ සේනාංකය විසුරුවා හැර නැවත යෝගියාකාර්තා වෙත පැමිණියේය. ජනරජ කණ්ඩායම් ඉන්දුනීසියාවේ නිදහස තහවුරු කරගැනීම සඳහා නැගී සිටින විට සුහර්තෝ හිටපු පීටා සගයකු වන උමර් ස්ලැමෙට් සමඟ සටන් ඒකකයක් පිහිටවුයේ ය. මෙම ඒකකය අලුතින් පිහිටුවන ලද ඉන්දුනීසියානු ත්‍රිවිධ හමුදාව (TKR) සමග ඒකාබද්ධ කරන ලදී. පසුව යෝගියාකාර්තාහි ඉතිරිව සිටි ජපන්

සොල්දාදුවන්ට එරෙහිව ප්‍රහාර මෙහෙය වීමෙන් පෙන්වූ නායකත්ව කුසලතාව හේතුවෙන් ඔහු මේජර් තනතුරකට උසස් කරන ලදී. 1945 ඔක්තෝබර් වන විට ඉතිරි වී සිටි ජපන් සොල්දාදුවන් ද යටත් කර ගනිමින් යෝගකාර්තා ප්‍රදේශය පාලනයට නතුකර ගැනීමට සුහර්තෝ සමත් වු අතර 1946 දී ඔහුව ලුතිනන් කර්නල් තනතුරට උසස් කරන ලදී. 1946 අගෝස්තු වන විට සුහර්තෝ යෝගිකාර්තාහි විසිදෙවන රෙජිමේන්තුවේ ප්‍රධානියා ලෙස සේවය කළ අතර ලන්දේසි බුද්ධි වාර්තා වල සඳහන් වන පරිදි 1947 මැද භාගය වනවිට සුහර්තෝ ගේ රෙජිමේන්තුව බලඇණි හතරකින් සමන්විත විය.

පසුව 1947 ජූලි 21 වන දින ලන්දේසීන් විසින් ජනරජ පාලනය (Republican) යටතේ පැවති ප්‍රදේශවල ප්‍රහාර එල්ලකරන විට එයට එරෙහිව සුහර්තෝ තම හමුදාවන් මෙහෙයවුයේ ය. 1949 ජූලි මාසයේදී රිපබ්ලිකන් නායකයන් නිදහස් කිරීමටත් හමුදා ප්‍රහාර නවතා නැවත සාකච්ඡා ආරම්භ කිරීමටත් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් ලන්දේසීන්ට බලපෑම් කරන ලදී. 1949 දෙසැම්බර් 27 වන දින ලන්දේසින් විසින් ඉන්දුනීසියාවට ස්වෛරීභාවය ලබාදුන් අතර නිදහසින් පසු කාලසීමාව තුළ සුහර්තෝ තම නායකත්වය කරා ගිය ගමනේ තවත් කඩඉම් පසු කළේ ය. 1950 වන විට සුහර්තෝ දිපෝනෙගෝරෝ (Diponegoro) දහවන බලඇණියෙහි අණදෙන නිලධාරියා වශයෙන් කටයුතු කළේ ය. ඉන්පසුව මක්සාර් (Makassar) වෙත සිය සේනාව මෙහෙයවූ අවස්ථාවේ මක්සාර්හි නැවතී සිටි කාලය තුළ සුහර්තෝ හබීබී පවුල සමග දැන හඳුනා ගත්තේය. ඔහුගේ වැඩිමහල් පුත් ජුසූෆ් හබීබී (Jusuf Habibie) පසුව සුහර්තෝ ගේ උප ජනාධිපති ධුරයට පත්වූ අතර ඔහුගෙන් පසු ජනාධිපති ධුරයට පත්වුයේ ය. 1951 නොවැම්බර්හිදී සලාතිගාහි (Salatiga) පිහිටි පුගෝලා බලකාය මෙහෙයවීම සඳහා සුහර්තෝව අනියුක්ත කිරීමෙන් පසු ඔහු වයඹදිග මධ්‍යම ජාවාහි දරුල් ඉස්ලාම් (Darul Islam) කැරලිකරුවන්ට එරෙහි සටන් සහ මවුන්ට් මෙරාපි (Mount Merapi) ප්‍රදේශයේ කොල්ලකෑම් විරෝධී සටන් සඳහා සහභාගි විය.

1956 සැප්තැම්බර් තුන්වන දින සුහර්තෝ දිපොනෙගෝරෝහි අණදෙන නිලධාරියා බවට උසස් කරන ලදී. 1957 මාර්තු මාසේදී ජනාධිපති සුකර්නෝ

විසින් යුධ නීතිය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සුහර්තෝ කලාපයේ යුධ නීති පරිපාලකයා බවට පත් වු අතර මෙයින් සිවිල් කටයුතුවලට බලපෑම් කළහැකි බලයක් මොහුට හිමිවිය. මෙම නව අධිකාරිය යොදාගෙන හමුදා වැටුප් සඳහා මුදල් රැස් කිරීමට මොහු විසින් පුණ්‍යායතන පිහිටුවන ලදී. බැන්ඩුන්හි සේවය කරමින් සිටියදී ඔහුව 1960 ජනවාරි මාසයේදී බ්‍රිගේඩියර් ජෙනරාල් තනතුරට උසස් කරන ලද අතර පසුව ඔහුව ජකර්තා (Jakarta) හි හමුදා මාණ්ඩලික ප්‍රධානීන් ගේ මෙහෙයුම් නියෝජ්‍ය නිලධාරියා ලෙස පත් කරන ලදී. 1961 වසරේ ඔක්තෝම්බර් මාසයේදී නව ගුවන් හමුදා ආරක්ෂක අණදෙන නිලධාරියා ලෙස පත්වු අතර 1962 ජනවාරි මාසයේ දී මොහුව මේජර් ජෙනරාල් තනතුරට උසස් කරන ලදී. 1964 අප්‍රේල් මාසය වනවිට සුහර්තෝ ප්‍රවාහන බැංකු හා නිෂ්පාදන අංශ ඇතුළු ව්‍යාපාර රාශියක කොටස් අත්පත් කර ගත්තේය.

මේ අතර ජනාධිපති සුකර්නෝගේ ආරක්ෂාව යටතේ ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂය (PKI) ශක්තිමත් වූ අතර 1965 වනවිට කොමියුනිස්ට් බලය රජයේ සියලු මට්ටම් හා හමුදාව දක්වාත් ව්‍යාප්ත විය. මෙහි ප්‍රතිපලයක් ලෙස 1965 සැප්තැම්බර් 30 දින රාත්‍රියේ ජකර්තාහි දී ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂය විසින් මෙහෙයවන ලද ජනාධිපති ආරක්ෂක අංශ සෙබළුන් කණ්ඩායමක් විසින් ජ්‍යේෂ්ඨ හමුදා නිලධාරීන් හය දෙනෙකු මරා දමන ලදීග සුහර්තෝ ඒ වනවිට සිටි ජ්‍යෙෂ්ඨතම හමුදා නිලධාරියෙක් වූ නමුත් මෙයින් ඔහුගේ දිවිගැලවුනු අතර උපක්‍රමශීලීව ක්‍රියාත්මකවී කොමියුනිස්ට් සැලසුම් ව්‍යර්ථ කර හමුදාව තම පාලනයට නතුකර ගැනීමට සමත්විය. ඊලග මාස හය පුරා ජනතා සහය ද ලබා ගනිමින් කොමියුනිස්ට් අදහස් දැරූවන් අතුගා දැමීමට කටයුතු කළ අතර සුහර්තෝ ජනාධිපති සුකර්නෝට පූර්ණ පක්ෂපාතී බව ප්‍රකාශ කළ නමුත් ක්‍රමයෙන් ඔහුව නොසලකා හැරියේය. පසුව එවකට ජනාධිපති වූ සුකර්නෝ විසින් 1967 පෙබරවාරි 22 වන දින සුහර්තෝ වෙත බලය පවරා දෙන ලදී. මේ අනුව ඔහු වැඩ බලන ජනාධිපති බවට පත් වු අතර 1968 දී ඉන්දුනීසියාවේ ජනාධිපති ලෙස තේරී පත් වුයේ ය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කල සේවාව



*(ජෙනරාල් සුහර්තෝ 1966 ජූලි 29 වන දින ජනාධිපති සුකර්නෝ ඉදිරියේදී ඉන්දුනීසියානු කැබිනට් මණ්ඩලයට දිවුරුම් දුන් අවස්ථාව)*

වර්ෂ 1967 බලයට පත්වීමෙන් අනතුරුව සුහර්තෝ විසින් සිදු කල සේවාව ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වෙන් කොට හඳුනා ගත හැකිය. එනම් දේශපාලනික, ආර්ථික මෙන්ම සමාජීය වශයෙනි. මොහුගෙන් සිදු වන ලද සේවාව ඉන්දුනීසියාවේ සංවර්ධන කෙරෙහි සමස්තයක් වශයෙන් බලපා ඇති බව පැහැදිලි වේ. එමෙන්ම මෙම සමය කාර්මීකරණය සහ අධ්‍යාපනික පුනරුදය ඔස්සේ ඉන්දුනීසියාව නව මාවතකට ගෙන යන ලදි.

**දේශපාලනික සේවාවන්**

සුහර්තෝ බලයට පත් වූ වහාම ඔහු විසින් නව පාලන සංකල්පයක් ඉදිරිපත් කරන ලදි. එම නව සංකල්පය "නව පාලන ක්‍රමය" (New order) ලෙස හැඳින්වේ. සුකර්නෝගේ විප්ලවීය දක්ෂකම අභිබවමින් ඒ වෙනුවට, සුහර්තෝ විසින් බලය ප්‍රායෝගිකව භාවිතා කළ බවක් පෙන්නුම් කළ අතර 1950 ගණන්වල ලිබරල් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට වඩා වෙනස් ඒකාධිපති, මධ්‍යගත, මිලිටරි ආධිපත්‍යය දැරූ රජයකට සුහර්තෝ නායකත්වය දුන්නේය. විශාල පරාසයක විහිදුන විවිධත්වයක් සහිත දුර්වල ඉන්දුනීසියානු සිවිල් සමාජය සමඟ ශක්තිමත් රජයක් ගොඩනැගීමත් රට තුළ ආර්ථික සංවර්ධනයත් ඔහුගේ පරම අදිටන විය. පාලන තන්ත්‍රයට එල්ල විය හැකි තර්ජයන් මෙන්ම අනතුරු මැඩපවත්වා ගැනීමට සුහර්තෝ විසින් ආරක්ෂක

අංශ ද්විත්වයක් ස්ථාපනය කළේය. ඒවා, ආරක්ෂාව හා විධිවිධාන ප්‍රතිෂ්ඨාපන කිරීමේ මෙහෙයුම් අංශය (KOPKAMTIB) සහ රාජ්‍ය බුද්ධි අංශ

සම්බන්ධීකරණය ආයතන (BAKIN) ලෙසින් හඳුන්වන ලදි. මෙමගින් රාජ්‍ය ආරක්ෂාව තර කිරීමට ඔහු ගන්නා ලද ප්‍රයත්නය ඉන්දුනීසියාවට සිදු වූ සේවාවකි.

සුහර්තෝගේ නව පාලන ආකෘතිය යටතේ පවත්වන ලද ඡන්ද ව්‍යාපාරයන් මනාව සැලසුම් කොට පවත්වනු ලැබුවේය. සෑම වසරකම පාහේ සුහර්තෝ ඡන්දයට ඉදිරිපත් වූ ගෝල්කර් (Golkar) දේශපාලන පක්ෂය 60% ක ප්‍රතිශතයකට වැඩි ඡන්ද ප්‍රමාණයක් හිමිකර ගැනීමට සමර්ථ වූයේය. පහත දැක්වෙන සංඛ්‍යාන දත්ත වගුව මෙය මනාව පැහැදිලි කර ගැනීමට උපකාරී වේ.

---

**නව පාලන ක්‍රමය යටතේ මැතිවරණ**

| **පක්ෂය** | **1971 *** | **1977** | **1982** | **1987** |
|---|---|---|---|---|
| Golkar<br>*(ගෝල්කර් දේශපාලන පක්ෂය)* | 62.8% | 62.1% | 64.3% | 73.2% |
| PPP<br>*(Pasrtasi Persatuan Pembnguan - එක්සත් සංවර්ධන පක්ෂය)* | 27.1 | 29.3 | 27.8 | 16.0 |
| PDI<br>*(Partai Demokrasi Indonesia - ඉන්දුනීසියානු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය)* | 10.1 | 8.6 | 7.9 | 10.9 |
| **එකතුව** | 100.0 | 100.0 | 100.0 | 100.1 |

*(Source: Institute of Southeast Asian Studies)*

(* මෙම තීරුවේ සඳහන් වන PPP සහ PDI ප්‍රතිශතයන් 1973 දී PPP සහ PDI බවට පත් වූ පක්ෂවල ඒකාබද්ධ ඡන්ද සඳහා වේ.)

සුහර්තෝගේ පාලන සමය ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් නොවුවද, ජනතාවගේ ප්‍රසාදය දිනාගැනීමට තරම් එම පාලනය සමත් වී තිබූ බව මෙමගින් සනාථ වේ.

එයට ප්‍රධානම හේතුව බවට පත්ව තිබුණේ ඒ සමයේ නව පාලන ආකෘතියක් මගින් ජනතාව වෙත සලසා දී තිබූ සේවාවන් බව ඉන්දුනීසියානු ඉතිහාසය මගින් වටහා ගත හැකිය.

**ආර්ථික සේවාවන්**

බලයට පත්වීමෙන් පසු මොහුගෙන් සිදු වූ සුවිශේෂී සේවාව වන්නේ ආර්ථික ක්ෂේත්‍රයට සිදු කරන ලද ප්‍රතිසංස්කරණයි. ඔහු ඉන්දුනීසියාව විදේශ ආයෝජන මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කිරීම සඳහා වූ ආර්ථික ප්‍රතිපත්ති ගණනාවක් සම්මත කළේය. කාර්මික රටවල් විසින් ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා එහි ස්වාභාවික සම්පත් පුද්ගලීකරණය කිරීම, බහුජාතික සමාගම්වලට හිතකර කම්කරු නීති සහ ලෝක බැංකුව, බටහිර බැංකු සහ මිත්‍රශීලී රජයන් ඇතුළු ආයතනවලින් සංවර්ධනය සඳහා අරමුදල් ඉල්ලා සිටීම මෙයට ඇතුළත් ය. එම ප්‍රතිසංස්කරණයන්ගේ ප්‍රතිඵල සඳහා කදිම නිදසුනක් ලෙස, ඉන්දුනීසියාව සුහර්තෝගේ පාලන කාලය තුල ලොව විශාලතම සහල් අපනයනයකරු වීම පෙන්වා දිය හැක. එමෙන්ම 1970 දශකය තුල තෙල් අපනයනය කිරීමෙන් ද ලොව අනෙකුත් තෙල් අපනයනකරුවන් හා සමග සැලකිය යුතු මට්ටමකට පැමිණීමට ඉන්දුනීසියාව සමත්ව තිබුණේය. මෙයට ප්‍රධානතම හේතුව වන්නේ සුහර්තෝ විසින් තම මව් රටේ ආර්ථිකය සංවර්ධනය කිරීමට, පුහුණුව ලද විශේෂිත ඇමරිකානු ආර්ථික විද්‍යාඥයන්ගේ සහය ලබා ගැනීමයි. මෙය "බර්ක්ලි මාෆියාව" (Berkeley mafia) යන අන්වර්ථ නාමයෙන් හඳුන්වන ලදි.

එමෙන්ම, සුහර්තෝගේ දැඩි කොමියුනිස්ට් විරෝධී ප්‍රතිපත්ති නිසාවෙන්ම නිරන්තරයෙන් බටහිර ධනවාදී රටවල් වල මූල්‍යමය ආධාර ඉන්දුනීසියාවට හිමි වුයේය. එය මොහුගේ පාලන සමය තුල සිදුවූ තවත් වාසි සහගත තත්වයකි. මේ සමය තුලම තවත් අග්නිදිග ආසියාතික රටක් වූ වියට්නාමය දැඩි ඇමරිකානු ආක්‍රමණයන්ට යටත් ව තිබියදී පවා ඇමරිකාව විසින් (US Aid) ඉන්දුනීසියාවට මූල්‍යමය ආධාර ලබා දෙන ලදි. එම මුදල වසරකට ඩොලර් බිලියන හතර ඉක්මවූ අගයකි. එම ආධාර ක්‍රමානුකූලව බෙදා හැරීමට ලොජිස්ටික්ස් කාර්යාංශයක් සුහර්තෝ පිහිටුවන ලද්දේය. එය භාණ්ඩ සැපයුම් හා බෙදා හැරීමේ ඒකකයක් (BULOG) නම් විය. ඇමරිකානු විදේශ ආධාර ව්‍යාපෘතියට

අමතරව තවත් බටහිර ධනවාදී රාජ්‍යන් මෙන්ම ජපානයද ඉන්දුනීසියාවට මූල්‍යමය ආධාර පරිත්‍යාගය කලහ. වාර්ෂික උද්ධමන අනුපාතය 630% සිට 9% දක්වා අඩු වීමත් දේශීය ආර්ථික වර්ධනය වේගය 7% කින් වැඩි වීමත් මෙම පාලන කාලය තුල සිදු කළ ආර්ථිකමය සේවාවන්ගේ ප්‍රතිඵල වේ.

**සමාජීය සේවාවන්**

සුහර්තෝගේ පාලන සමය තුළ ඉන්දුනීසියාවේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් විශාල වශයෙන් ආරම්භ කෙරිණි. මෙම සමය තුළ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ රැකියා වෙළෙඳපොළ වඩාත් ශක්තිමත් කොට දියුණු කිරීම වැනි ප්‍රතිපත්තීන් ගණනාවක් ක්‍රියාවට නැංවුන අතර එහි සේවාව සාමාන්‍ය පොදු ජනයාට මහත් සේ උපකාරී විය.

එමෙන්ම ජාතික භාෂාව ව්‍යාප්ත කිරීම උදෙසා වූ විවිධ වැඩසටහන් ඉන්දුනීසියාව පුරා ක්‍රියාත්මක විය. විශාල විවිධත්වක් සහ විසිරී පැතිරී ගිය දූපත් එකට එක් කිරීම අපහසු කාරණයක් වුවද එවන් ව්‍යාපෘතීන් ගණනාවක් මෙම පාලන සමය පුරාවටම සුහර්තෝගේ පාලනාධිකාරිය මගින් ක්‍රියාවට නැංවීමට කටයුතු කළේය. අධ්‍යාපනය සංවර්ධනය කිරීමට සහ මහජන සාක්ෂරතාවය නගා සිටුවීමට සැලකිය යුතු ප්‍රමාණයක මූල්‍යමය සහ අනෙකුත් සම්පාදන සැලසීමට සුහර්තෝ කටයුතු කළේය. බලයට පත් මුල් කාලය තුළ ඔහු ඉතා සාර්ථක ප්‍රතිපත්ති හඳුන්වාදෙමින් හා ක්‍රියාත්මක කරමින් ගෙන ගිය පාලනය ආර්ථිකමය මෙන්ම සාමාජීය වශයෙන් සාර්ථක ප්‍රතිඵල ගෙන දෙන ලදි. කෙසේ නමුත් පසු කාලීනව ඔහුගේ පාලනය පිළිබඳව විවිධ විවේචන තිබුණද, ස්ථාවර දේශපාලන තත්ත්වයක් පවත්වාගනිමින් තිරසාර සංවර්ධනයකට මග විවර කරගැනීමට ඔහු සමත් වූ බව ඉතිහාසය ගෙන හැර පායි.



*(සුහර්තෝ සිය පාලන සමය අවසන් වී ජනතාව අමතමින් )*

## විදේශ ප්‍රතිපත්තිය

රටක විදේශ ප්‍රතිපත්තිය තීරණය කිරීමෙහිලා ප්‍රධාන වශයෙන් බලපාන සාධක දෙකක් ලෙස පවත්නා ජාත්‍යන්තර මෙහෙයුම් තුළ රටේ ස්ථාවරත්වය හා රාජ්‍ය තුළ පවතින දේශපාලන, ආර්ථික හා සාමාජීය සාධක දැක්විය හැකිය. ඒ අනුව ලන්දේසි යටත් විජිත පාලනයෙන් නිදහස ලැබූ පසු ඉන්දුනීසියාවෙහි විදේශ ප්‍රතිපත්තිය ප්‍රධාන අදියර තුනක් යටතේ සාකච්ඡා කළ හැක. එනම් සුකර්නෝ යටතේ පාලන අවධිය, සුහර්තෝ යටතේ පාලන අවධිය සහ සුහර්තෝ බලයෙන් ඉවත් වීමෙන් පසු අවධිය යි. මෙම පාලන අවධි තුන අතරින් කැපී පෙනෙන ලෙස විදේශීය ප්‍රතිපත්තියක් සහ පාලනයක් ගෙන ගිය පාලකයෙකු ලෙස සුහර්තෝ හැඳින්විය හැකිය.

1961 වර්ෂයේ දී සුකර්නෝගේ පාලන සමයේදී ඉන්දුනීසියාව නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය ආරම්භ කිරීමට කටයුතු කරන අතර සුහර්තෝ බලයට පැමිණීමෙන් පසු මෙම විදේශ ප්‍රතිපත්තියෙහි පැහැදිලි වෙනස්කම් දැකගත හැකි විය. ඒවා අතර කිහිපයක් පහත පරිදි වේ. කලාපීය රාජ්‍යයන් සමඟ සබඳතා තහවුරු කර කර ගැනීම, තම රටෙහි ආර්ථිකය ශක්තිමත් කර ගැනීම, තම රටෙහි අභිවෘද්ධිය උදෙසා විදේශ ප්‍රතිපත්තිය මෙහෙයවීම මේ අතරින් කිහිපයක් වේ.

එසේම 1965 දී ඉන්දුනීසියාව පීකිං සමග ඇතිකරගත් සහයෝගීතාවයේ ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ඉවත් වීමට තීරණය කළේය. නමුත් බටහිර රාජ්‍ය සමඟ ඉතා සමීප පාලනයක් ගෙන ගිය සුහර්තෝ

විසින් නැවත ඉන්දුනීසියාවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීමට ක්‍රියා කළේය. සුහර්තෝගේ පාලන සමයේ දී ඉන්දුනීසියාවේ විදේශ ප්‍රතිපත්තිය නව යුගයක් ආරම්භ කළේය.

සුහර්තෝ බලයට පත්වීමෙන් පසු අසල්වැසි රාජ්‍යයන් සමඟ සබඳතා වලදී සාමකාමී ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර ඔහු සැලකිය යුතු මට්ටමේ සංවර්ධනයක් හිමිකරගෙන සිටි කොමියුනිස්ට් නොවන බටහිර රාජ්‍යයන්ගේ ද ආධාර ලබා ගැනීමට කටයුතු කලේය. එමෙන්ම ඔහු තවදුරටත් බාහිර ලෝකය සමඟ සබඳතා වර්ධනය කර ගැනීම උදෙසා විදේශීය වෙළඳපල සමඟ මිත්‍රශීලී වෙලඳ ප්‍රතිපත්තියක් සකසන බවට ප්‍රකාශ කලේය. ඔහු පවත්වාගෙන යන ලද සබඳතා අතරින් ජපානය සමග පැවති ද්විපාර්ශ්වික සබඳතා වැදගත් සන්ධිස්ථානයක් ගනු ලබයි.

ආසියාන් සංවිධානය පිහිටුවීමෙහිලා ප්‍රධාන කාර්යයක් ඉටු කරන්නට වූයේ ඉන්දුනීසියාව වන අතර ආසියානු ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත්තේ ද ඉන්දුනීසියාවේ ජකර්තා (Jakarta) නුවරයි. ඒ අනුව 1967 අගෝස්තු 8 වන දින ආරම්භ කරන ලද ආසියානු ජාතීන්ගේ සංවිධානය ඉන්දුනීසියාවේ කලාපීය සහ ජාත්‍යන්තර සබඳතා කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්නට විය. සුහර්තෝ අසල්වැසි රටවල් සමග එක්ව ආර්ථික සහයෝගීතාව උදෙසා කටයුතු කිරීමටත් කලාපීය බහුතර රාමුව ගොඩනැගීමටත් සහ අභ්‍යන්තර ගැටුම් අවමකිරීමටත් කටයුතු කළේය. මෙලෙස ඉතා කැපී පෙනෙන ලෙස තම විදේශ ප්‍රතිපත්තිය අසල්වැසි රටවල් සමඟ ගොඩනඟාගත් සුහර්තෝ 1969 දී තායිලන්තය, මැලේසියාව සහ සිංගප්පූරුව සඳහා යුධ ගිවිසුම් අවශ්‍ය නොවන බව පැවසීය.



*(එවකට ඇමෙරිකාවේ ආරක්ෂක ලේකම් විලියම් කොහෙන් (William kohen)සමග සාකච්ඡාවකදී.)*

තවදුරටත් ක්‍රියාශීලී ලෙස තම අසල්වැසි රටවල් සමඟ සමීප සබඳතා ගොඩනඟාගත් සුහර්තෝ වියට්නාම ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය සමග ද තම සම්බන්ධතා ශක්තිමත් කර ගත්තේය. එමෙන්ම 1970 දශකයේ අග භාගයේ සිදු වූ කාම්බෝජ ගැටුම ඉන්දුනීසියාව තුළ රාජ්‍ය තාන්ත්‍රික කටයුතු ශක්තිමත්

කිරීමට හේතුවිය. සුහර්තෝ බලයට පත්වීමෙන් පසු ඔහුගේ සම්බන්ධතා තවදුරටත් වර්ධනය වූ අතර ඔහු ජාත්‍යන්තර කටයුතු පිළිබඳ සොයා බලමින් ඇමරිකා එක්සත් ජනපදය (USA), සෝවියට් සංගමය (Soviet Union), යුරෝපය (Europe) සහ ලතින් ඇමෙරිකාව (Latin America) යන රටවලට විදේශීය සංචාර සිදුකරන්නට විය. එපමණක් නොව තම කලාපයෙන් පිටත ද සබඳතා ගෙන ගිය සුහර්තෝ 1970 පෙබරවාරි මාසයේදී වියට්නාමයේ සයිගොන්හි (Saigon) දී රජයේ වෙළෙඳ කාර්යාලයක් පිහිටවූයේ ය. එය ජකර්තා සහ දකුණු වියට්නාම රාජ්‍ය අතර නිල සම්බන්ධතාවක් ඇති වූ පළමු අවස්ථාවයි. 1980 මුල්භාගයේ දී ඉන්දුනීසියාව ආසියාන් සම්බන්ධ කටයුතු වලදී කැපී පෙනෙන කාර්යයක් ඉටු කළේය. අග්නිදිග ආසියාවේ එකම නියෝජිත රට ලෙස ඉන්දුනීසියාව 1999 වර්ෂයේදී “G20” සාමාජිකයෙකු බවට පත් විය. ඉන්දුනීසියාව එහිදී ආර්ථිකය හා ජනගහන ප්‍රමාණය යන කරුණු පදනම් කරගෙන නියෝජිතයකු ලෙස තෝරා ගන්නා ලදී.

## <u>ගත හැකි ආදර්ශ</u>

සුහර්තෝ නම් වූ ශ්‍රේෂ්ඨ නායකයාගේ ජීවිත කාලය දෙස අවධානය යොමු කළ විට පෙනී යන්නේ ඔහුගේ ජීවිතයේ මුල් කාලයේදී එතරම් සුඛෝපභෝගී ජීවිතයක් ගත කළ අයෙකු නොවන බවයි. විවිධාකාර වූ සමාජීය ගැටළුවලට මුහුණ දෙමින් තම වැදූ දෙමාපියන්ගේ දික්කසාදයත් සමඟ ඉතා කටුක ජීවිතයක් ගතකිරීමට ඔහුට සිදුවිය. සුහර්තෝ හට ඔහුගේ කුඩා කාලයල ඔහුව අරන් හදාගත් දෙමාපියන් සමඟ ගත කිරීමට සිදු වුයේය. කුඩා කල අධ්‍යාපනයද විවිධ වූ බාධක හමුවේ සිදු වුවද සිය අධ්‍යාපනය සාර්ථකව අවසන් කිරීමට ඔහු සමත් වුයේය. කුඩා කාලයේ නිතරම පාහේ විවිධ පාසල්වලට මාරුවීමට ඔහුට සිදුවිය.

ඉන් ගත හැකි ආදර්ශය නම් කෙතරම් බාධක පැමිණියද, නොපසුබට උත්සාහය නිසා තම දෙමාපියන් නොමැතිව වුවද සිය අධ්‍යාපනය සාර්ථකව නිම කිරීමට ඔහු සමත් වීමයි. එමෙන්ම මිනිසෙකුට වටිනාම සම්පත වන්නේ අධ්‍යාපනය බවද ඔහුගේ ජීවිත කතාව තුලින් මනාවට පසක් වෙයි.

සුහර්තෝ තමන් හමුවේ ඇති අභියෝගයන්ට සැමවිටම මුහුණ දුන්නේ සිනාමුසු මුවින් ය. ඉන් උකහා ගත හැකි ආදර්ශයක් වන්නේ ඕනෑම පීඩාකාරී අභියෝගයක් වුවද ඉවසීමෙන්, දරා ගැනීමෙන් සහ සිනාවෙන් මැඩ පැවැත්විය හැකි බවයි. සුහර්තෝගේ පාලන සමය අවසානයේදී දූෂණ සම්බන්ධයෙන් චෝදනා එල්ල වුවද ඔහු වරෙක ඉඩම් අහිමි ගොවීන් සඳහා ඉඩම් ලබා දුන්නේය. එසේම ඔවුන්ව නැවත පදිංචි කිරීම් සඳහාද කටයුතු කළේය. එයින් පෙනී යන්නේ ඔහුද සමාජයේ ධනවත් පවුලකින් පැවතගෙන නොඑන නිසා ඔහුට පහළ පාන්තිකයන්ගේ දුක අවබෝධ වූ බවයි. තවද ඔහු වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ධෛර්යවන්ත පුද්ගලයෙකි.

වරෙක ඔහුට පාපැදි අනතුරකින් පසුව රැකියාවෙන් ඉල්ලා අස්වීමට සිදු වුයේ ඔහු සතු වු එකම නිල ඇඳුම විනාශ වීම නිසාය. එහෙත් ඉන් නොසැලුනු ඔහු හමුදාවට බැඳීම නිසා ඔහුගේ ජීවිතය නව මගකට යොමු කිරීමට එය සමත් විය. ඔහු රැකියාව අහිමි වූ අවස්ථාවේදී සිය උත්සාහය අත්හැරදැමූ වේ නම් ඔහුට ඉන්දුනීසියාවේ ජනපති වීමට නොහැකිවන්නට ඉඩ තිබුණි. එහෙත් ඔහු අවශ්‍ය මොහොතේදී නිවැරදි තීරණ ගත් නිසා ඔහුට එරට ජනාධිපති ධූරය හෙබවීම දක්වා යැමට හැකි වුයේය. ඔහුගේ හමුදා ජීවිතය ද ඉතා සුවිශේෂී වන්නේ ඔහුගේ හැකියාව හා දක්ෂතාව නිසා කෙමෙන් ඔහු සිය හමුදා නිලය උසස් කර ගැනීමට සමත්වීමයි. ඒ සඳහා නොපසුබට උත්සාහයත්, කැපවීමත්, අධිෂ්ඨානයත් අත්‍යාවශ්‍ය වේ. එය ඔහුගේ ජීවිතයෙන් ගත හැකි වටිනාම ආදර්ශය වේ.

ඔහුගේ පාලනය සම්බන්ධව විවිධ වූ විවේචන එල්ල වුවද සිය පාලනයේ මුල් කාලයේදී රටේ දියුණුව උදෙසා ගත හැකි ක්‍රියාමාර්ග ගත්තේය. ඇතැම්විටක ඔහු දැඩි මතධාරී නොනැමෙන සුළු පුද්ගලයෙකු වීම ඔහුගේ වසර 30කට අධික පාලනයට හේතු විය. එමෙන්ම ඔහුගේ මෙම දැඩි චරිත ලක්ෂණ පසෙක දැමූ විට ඔහු ආදරණීය පියෙකු හා සැමියෙකු විය. තවද ඔහු තමා විශ්වාස කරන

දෙය වෙනුවෙන් පෙනී සිටීමට පසුබට නොවීය. මේ අනුව බලන විට සුහර්තෝ සිය පාලන කාලය තුළ ඉන්දුනීසියාව නව මාවතක් කෙරෙහි යොමු කළ අතර ඔහු ඒ දක්වා පැමිණි ගමන් මග දෙස ආපසු හැරී බලන විට ඉන් ගත හැකි ආදර්ශ බොහෝ ය.

## සාරංශය

ඉන්දුනීසියාවේ දෙවන ජනපති වූ සුහර්තෝ 1967 සිට 1998 දක්වා වසර 30කට අධික කාලයක් ඉන්දුනීසියාවේ රාජ්‍ය පාලනය ගෙන ගියේය. ඔහුගේ රාජ්‍ය කාලය තුළදී ඉන්දුනීසියාව ආර්ථික මෙන්ම දේශපාලනික වශයෙන් සුවිශේෂී දියුණුවක් හිමි කරගත් අතර මොහුගේ පාලන සමය ඉන්දුනීසියාවේ සුවිශේෂී කාලපරිච්ඡේදයක් ලෙස හැදින්වේ.

ඔහුගේ ජීවිත කාලය තුළ වැදගත්ම කාල පරිච්ඡේදයක් ලෙස ඔහුගේ හමුදා සේවා කාලය හඳුනාගත හැක. බැංකුවක ලිපිකරුවෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය අරම්භ කල ඔහු ඉන් ඉවත් වී පසුව හමුදා සේවයට එක් වීමෙන් සිය ජීවිතයේ සුවිශේෂී කඩඉමක් ආරම්භ කළේය. ඔහු හමුදාවේ පෙන්වූ දක්ෂතා හේතුකොට ගෙන ටිකෙන් ටික ඔහුගේ නිලයන් උසස් කරගැනීමට සමත් විය. මේ අනුව 1946 පෙබරවාරි වන විට ඔහු ලුතිනන් කර්නල් තනතුරට උසස් කළ අතර එම වර්ෂයේම අගෝස්තු වන විට සුහර්තෝ යෝගකර්තාහි 22 වන රෙජිමේන්තුවේ ප්‍රධානියා බවට ද පත් විය. 1950 දී ඉන්දුනීසියාව ජනරජයක් බවට පත් වීමෙන් පසුව 1957 දී සුකර්නෝ විසින් කලාපයේ යුධ නීති පරිපාලකයා බවට සුහර්තෝ ව පත් කළ අතරල ඉන්පසුව 1960 වර්ෂයේදී ඔහු බ්‍රිගේඩියර් ජෙනරාල් තනතුරටත්ල 1962 වර්ෂය වන විට මේජර් ජෙනරාල් තනතුරටත් පත්වියග එමගින් පෙනීයන්නේ ඔහු කෙතරම් දක්ෂ හමුදා නිලධාරියකු වන්නේද යන්නයි. ඒ තුළින් ඔහු සිය බලය තහවුරු කරගැනීමට සමත් වී ඇත.

1968 දී ජනපති ලෙස පත්වීමෙන් පසුව ඉන්දුනීසියාවේ දේශපාලන හා හමුදා නායකත්වය ඔහුට හිමි විය. ජනපති ලෙස පත්වීමෙන් පසුව ඔහුගේ නව පාලන

ක්‍රමය යටතේ මධ්‍යගතල ශක්තිමත් හමුදාව ප්‍රමුඛ කොටගත් පාලනයක් පිහිටුවීමට සමත් විය. බොහෝ අවස්ථාවලදී ඔහුගේ පාලනය ඒකාධිපති පාලනයක් ලෙස හඳුන්වා දුන්නද සුහර්තෝගේ පාලන සමය තුළ දී ඉන්දුනීසියාව කාර්මීකරණය, අධ්‍යාපනය සහ ආර්ථිකමය අතින් ඉතාමත් දියුණු මට්ටමකට ගෙන ඒමට ඔහුට හැකි විය. සුකර්නෝගේ පාලන සමයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ඉවත්වී ඉන්දුනීසියාව නැවත වරක් එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය ලබා ගැනීමට ක්‍රියා කිරීමත්ල අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමයේ ආරම්භක සාමාජිකයෙකු ලෙෂ ඉන්දුනීසියාව පත්වීමත් මොහුගේ පාලන සමයේදී සිදුවූ විශේෂ සිදුවීම් ය. ඒ අනුව මොහුගේ පාලන සමය සුවිශේෂී වන්නේ ආර්ථික දියුණුව, දේශපාලනික වෙනස්වීම් පමණක් නිසා නොවන බව ඉහත සාකච්ඡා කළ කරුණු තුළින් පෙනී යයි.

කෙසේ වුවද වසර 30කට අධික කාලයක් රාජ්‍ය පාලනය සඳහා දැඩි අධිෂ්ඨානයක් හා කැපවීමක් අත්‍යවශ්‍ය වන අතර සුහර්තෝ තුළ එම ගුණාංගයන් තිබු බව මනාව පැහැදිලි වේ. ලිපිකරුවෙකු ලෙස සිය වෘත්තිය ආරම්භ කළ ඔහු හමුදා පාලනයට එක් වී අවසානයේ දී ඉන්දුනීසියාවේ ජනාධිපති බවට පත් වීමෙන් පෙනී යන්නේ ඔහු තුළ තිබූ ධෛර්යය අධිෂ්ඨානය හා කැපවීමයි. වසර 30කට අධික රාජ්‍ය පාලන කාලයකින් පසුව 1998 දී ඔහු ජනපති ධුරයෙන් ඉවත් වුයේය. ඉන්දුනීසියානු ඉතිහාසයේ සුවිශේෂී කාලපරිච්ඡේදයකට හිමිකම් කියූ සුහර්තෝ 2008 වර්ෂයේ ජනවාරි මස 27 වන දින මෙලොවින් සමුගත්තේ එරට එරට ඉතිහාසයේ සදා නොමැකෙන නමක් ඉතිරි කරමිනි.

## මූලාශ්‍ර නාමාවලිය

Douglas, S. A. (2010, March 26). Suharto: A Political Biography. By R. E. Elson. Cambridge: Cambridge University Press, 2001. xix, 389 pp. $35.00 (cloth).: The Journal of Asian Studies. Retrieved April 9, 2020, from https://www.cambridge.org/core/journals/journal-of-asian-studies/article/suharto-a-political-biography-by-r-e-elson-cambridge-cambridge-university-press-2001-xix-389-pp-3500-cloth/F6F7AA5976AD3B149CEA491B287E07B0

Hays, J. (n.d.). SUHARTO: HIS LIFE AND RISE TO POWER. Retrieved April 9, 2020, from http://factsanddetails.com/indonesia/History_and_Religion/sub6_1c/entry-3959.html

Indonesian Political Parties Before The 1971 General Election. (1982). *Political Parties and the 1982 General Election in Indonesia*, 1–11. doi: 10.1355/9789814376143-003

Kroef, J. M. V. D. (1983). The Kampuchean Problem: Diplomatic Deadlock and Initiative. *Contemporary Southeast Asia*, *5*(3), 263–292. doi: 10.1355/cs5-3a

Lee, T. (2001). Indonesia Outs Its History. *Foreign Policy*, (125), 91. doi: 10.2307/3183335

Liddle, R. W. (1988). Indonesia in 1987: The New Order at the Height of Its Power. *Asian Survey*, *28*(2), 180–191. doi: 10.1525/as.1988.28.2.01p0135l

Suharto: A Political Biography - free download. (n.d.). Retrieved April 8, 2020, from https://www.medicalproforma.it/suharto-a-political-biography.html

Vatikiotis, M. R. (1992). Indonesia´s Foreign Policy in the 1990s. *Contemporary Southeast Asia*, *14*(4), 352–367. doi: 10.1355/cs14-4d

# මොහොමඩ් අලි ජින්නා



**කණ්ඩායම් සාමාජිකයන්:**

- ඩී.පී.සාලිය නෙරන්ජන් ජයසිංහ
- ඩබ්ලිව්.පී.සමීර ප්‍රදීප් කුමාර
- ඒ.ඒ.එස්.චතුරිකා
- පී.ඒ.ඩබ්.දිසානායක
- ටී.ඩී.එන්.පී.මල්වත්ත

# හැඳින්වීම

ලොව පහළ වූ විවිධාකාර පුද්ගලයන් අතර මොහොම්මද් අලි ජින්නාට (Muhammad Ali Jinnah) හිමිවනුයේ ඉතා සුවිශේෂී ස්ථානයකි. මහා භාරතය බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස් කරගැනීම මෙන්ම මුස්ලිම් ජනතාවගේ සුභසිද්ධිය උදෙසාද ප්‍රබල වෙනස්කම් රාශියක් හා ලොව ප්‍රචලිත විවිධාංග රාශියක් පාකිස්තානයේ නාමයෙන් ලොව පුරා ව්‍යාප්ත වීමට ඔහුගේ ක්‍රියා කලාපය බෙහෙවින් බලපාන්නට ඇති බව පැහැදිලි කරුණකි.

ඒ නිසාවෙන්ම අලි ජින්නාගේ ළමා කාලය හා ඔහුගේ පාසල් ජීවිතය පිළිබඳව අධ්‍යයනයක යෙදීමත්, ඒ සමඟ ඔහුගේ කුඩා කාලයේ වූ චරිත ලක්ෂණ පිළිබඳව සොයා බැලීමත් ඉතා වැදගත් වේ. එසේම ක්‍රමයෙන් මුහුකුරා ගිය මොහු දේශපාලන ජීවිතයට පිවිසීමත්, ඒ හරහා ලෝක දේශපාලන නාමාවලියෙහි පාකිස්තානය අද වනතුරුත් ප්‍රමුඛ ස්ථානයක දක්නට ලැබෙන සිද්ධි මාලාවට අලි ජින්නාගේ දායකත්වය කොතෙක් දුරට බලපෑවේද යන්නත්, එසේම දේශපාලන ක්ෂේත්‍රයේ පමණක් නොව ආර්ථික හා සමාජීයමය වශයෙන් පාකිස්තානයෙහි මෙන්ම ඉන් පරිබාහිරව ද, පාකිස්තානයේ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහිද මෙතුමාගේ ක්‍රියා කලාපයේ බලපෑම සොයා බැලීම ඉතා වැදගත්ය. එසේම අතීත හා වර්තමාන ලෝක දේශපාලනයෙහි නොමැකෙන නාමයක් සනිටුහන් කිරීමට සමත් වූ මොහොම්මද් අලිජින්නාගේ ජීවිතයේ ප්‍රබල ගුණාංග හා ඒවායේ වටිනාකම් පිළිබඳව යම්තාක් දුරකට කෙරෙන විවරණයක් ලෙස ද මෙය පෙන්වා දිය හැකි ය.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

1876 දෙසැම්බර් 25 වන දින පාකිස්තානයේ (එවකට ඉන්දියාවේ) කරච්චි(Karachchi) නුවර වසිර් මන්දිරයේ (Wazir Mansion) දෙවන මහලේ කුලියට ගත් මහල් නිවාසයක ජින්නා උපත ලැබිය. දරුවන් හත්දෙනෙක්ගෙන් යුත් පවුලේ වැඩිමල් දරුවා වු ජින්නා උපතේ දී නිරෝගි දරුවකු නොවුයේ උපත් බර ඉතා පහල මට්ටමක තිබිම හේතුවෙනි. ඒ නිසාවෙන් එකල ජන සමාජයට අනුව ඔහුගේ බිළිදු අවදිය ''ශාරීරිකව දුර්වල වූ දරු උපතක් " ලෙස හදුන්වා ඇත.

ජින්නා උපතේදී ලැබූ නාමය වුයේ " මුහම්මද් අලි ජින්නාභායි" (Muhammad Ali Jinnahbhai) පසුව මොහුගේ වඩාත් ප්‍රචලිත වූ නාමය වුයේ මුහම්මද් අලිජින්නා (Muhammad Ali Jinnah) නොහොත් ඒම්.ඒ.ජින්නා (M.A.Jinnah) ය. ඔහුගේ පාසලේ පැරණිතම ලේඛනයේ ඔහුගේ උපන් දිනය ලෙස 1876 ඔක්තොම්බර් 20 දිනය දක්වා ඇත. එසේම ජින්නාගේ පලමු චරිතාපදානයේ කතුවරයා ඔහුගේ උපන් දිනය සිදුවුයේ 1876 දෙසැම්බර් මස 25 වන දින ලෙස දක්වයි. ජින්නාගේ උපන් දිනය පිලිබඳව ලේඛන කිහිපයක විවිධ පරස්පරතා තිබූ නමුදු බොහෝමයක් ලේඛන තුල ජින්නාගේ උපත සිදුවූයේ 1876 දෙසැම්බර් මස 25 වන දින බව සාක්ෂි දරයි.

ජින්නාගේ පියාගේ නම වූයේ ජින්නාභායි පූන්ජා (Jinnahbhai Poonja) ලෙස ය. ඔහු 1857 උපත ලද අතර 1901 මියගියේ ය. ඔහුගේ මව නමින් මිතිභායි (Mithibai) නම් විය. මෙම පවුලේ වැඩිමල් දරුවා වුයේ ජින්නා ය. පසු කාලයේ දී ජින්නා ඇතුලු පවුලේ සියලු දෙනා ඉන්දියාවේ කැතියාවර් (Kathiawar) ප්‍රදේශයෙන් සින්ද් ප්‍රදේශය වෙත සංක්‍රමනය වී ඇත.ජින්නාගේ පියා ඉතා ධනවතෙක් වූ අතර ඔහුගේ එකම අරමුණ වූයේ තම පුතුට හොද අධ්‍යාපනයක් ලබා දිමයි.එම නිසාවෙන් ජින්නාගේ පියා වු පූන්ජා විසින් ඒ සදහා අවශ්‍ය සියලු පහසුකම් තම දරුවන්ට සලසාදෙන ලදි. ජින්නාගේ මව නිරන්තරයෙන් තම පුතු වු ජින්නා කවදා හෝ විශාල ජයග්‍රහණයන් රැසක් අත්කර ගනු ඇතැයි සිතුවා ය. ජින්නාට වයස අවුරුදු හය සම්පූර්ණ වන විට ජින්නාගේ පියා "

ජින්නාවසින්ද් මද්‍රසාතුල්" (Sindh Madrasatul) ඉස්ලාම් පාසලට ඇතුල් කළා ය. කුඩා කල ජින්නා ආදර්ශමත් ශිෂ්‍යයකුට වඩා තරමක් නොහික්මුණු ගති පැවතුම් ඇති ශිෂ්‍යයකු විය. එම අවදියෙදි ඔහු තම අධ්‍යාපනයට යොමු වනවාට වඩා කැමැත්තක් දැක්වුයේ තම මිතුරන් සමග නිතර සෙල්ලම් කිරිමට ය. නමුත් ජින්නාගේ පියා ඒ වනවිට ඔහු සතුව පැවති ව්‍යාපාර කටයුතු සඳහා තම පුතු වූ ජින්නා යොමු කිරිමට විශාල කැමැත්තක් දැක්වූ නමුත් ඒ හා සම්බන්ධ ගණිත විෂයයන් පිලිබඳව ජින්නා සතු වුයේ දැඩි අප්‍රසාදයකි.

ජින්නාගේ මව තිබූ බාධක නොසලකා ජින්නාට හොඳින් අධ්‍යාපනය ලබාදිමේ අරමුණ සමග ජින්නා සිය නැන්දණිය සමග ආපසු යැවූ අතර එහිදි ඇය ජින්නාව "ගෝකල් දාස් තේජ්" (Gokal Das Tej Primary School) ප්‍රාථමික පාසලට ඇතුලත් කළාය. දර්ශනය වෙනස් වුවද ජින්නා දිගින් දිගටම නොසන්සුන් හා නොහික්මුණු ශිෂ්‍යයකු බව ඔප්පු කලේ ය. කෙසේ නමුදු ඔහුගේ හැසිරිම හේතුවෙන් මාස හයක් ඇතුලත නැවතත් ඔහුව කරච්චි වෙත යවන ලදි. ඉන් අනතුරුව ජින්නාගේ දෙමාපියන් විසින් ජින්නාව ක්‍රිස්තියානි මිෂනාරි සමිතියේ උසස් පාසලට ඇතුලත් කරනු ලැබීය. උසස් අධ්‍යාපන කටයුතු ඉතා හොඳින් අවසන් කල ජින්නා ඉන් නොනැවති තවදුරටත් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා එංගලන්තයට යාමට තීරණය කලේ ය. එංගලන්තයේ දී නීතිය පිලිබඳව අධ්‍යාපනය ලැබිම ආරම්භ කල ඔහු එය සාර්ථකව හදාරා නිම කිරිමට සමත් විය.

කුඩාකළ සිටම සුවිශේෂි ගති පැවතුම් පෙන්නුම් කල ජින්නා සාර්ථකව අධ්‍යාපන කටයුතු අවසන් කරමින් වෘත්තියමය ජිවිතය සඳහා ප්‍රවේශ වෙනවාත් සමගම දේශපාලනයටද අවතිර්ණ වූයේ ඔහු සතුව තිබූ සුවිශේෂි දක්ෂතාවයත් සහජ හැකියාවත් හේතුවෙනි. සිය උසස් අධ්‍යාපනය නිම කරමින් නීතිඥවරයෙකු වශයෙන් වෘත්තීය ජිවිතයට පා තබන මොහු, නීතිඥවරයෙකු ලෙස ලබාගත් දැනුම, අත්දැකීම් සහ පරිණතභාවය ස්වකීය දේශපාලන ජීවිතයට පදනම ලෙස යොදා ගත්තේය.

## නායකත්වය කරා ගිය ගමන් මග

මොහොම්මද් අලි ජින්නාගේ දේශපාලන දිවිය ඇරඹීමට පෙර ඔහු නීතීවේදියෙකු ලෙස කටයුතු කලේය. නීතිවේදියෙකු ලෙස තම සේවය ආරම්භයේ පටන් ඔහුගේ දේශපාලන දිවියද සාර්ථක විය. තම උසස් අධ්‍යාපනය ලබා ගැනීම පිණිස එංගලන්තය වෙත ගිය ඔහු දැඩි ලෙස ලිබරල්වාදී මත දරන්නෙක් (Pro-Liberal) බවට පත් විය. මේ සඳහා ප්‍රධාන හේතුව වූයේ 19 වන සියවසය තුල බ්‍රිතාන්‍ය තුල පැන නැගුණු ලිබරල්වාදයයි. ඒ අනුව ප්‍රධාන වශයෙන් ජින්නා අනුගමනය කරනු ලැබුවේ බෙන්තම් (Bentham), මිල් (Mill), ස්පෙන්සර් (Spencer), කොම්ටේ (Comte) වැනි ලිබරල්වාදී චින්තකයින්ය. පසුකාලීනව මොහු පාර්සි බ්‍රිතාන්‍ය ඉන්දියානු (Parsis British Indian),දේශපාලන නායකයන් වන දඩාබායි නාරෝජි (Dadabhai Naoroji) සහ ශ්‍රීමත් ෆරෝශා මේතාගෙ (Sir Pherozeshah Mehta) අනුගාමිකයෙක් ද විය. මේ අනුව ජින්නාට තම නීති දිවිය තුලදී දේශපාලන ආභාසයද ලැබුනු බව නොරහසකි .

බටහිර ලෝකය ජින්නාට දේශපාලන ආභාසය ලබා දුන්නා පමණක් නොව ඔහුගේ පෞද්ගලික ජීවිතයටද බලපෑම් එල්ල කරන ලදි. ඒ අනුව මොහු තම දේශීය ඇඳුම් අත් හැර බටහිර විලාසිතාවන් කෙරෙහි දැඩි ඇල්මක් දක්වන ලදි. එය මොහුගේ ප්‍රකාශ වලින්ම එය පැහැදිලි වන්නකි. "මම මාගේ පිජාමා වල ගමන් නොකරමි". එමෙන්ම මොහු "කරකුල් තොප්පිය" (Karakul hat) පැළඳ සිටීම ද විශේෂ ලක්ෂණයකි. එය පසුව "ජින්නා තොප්පිය" (Jinnah hat) නමින් හැඳින්විය .

නීති වෘත්තිය තුළ මොහු හිනි පෙත්තටම නැගි නීති විශාරදයෙකු ලෙස හැඳින්විය හැකිය.1896 දී නීති විභාගය සමත් වී අධිකරණය වෙත පියනැගූ ලාබාලතම නීතිවේදියා බවට පත් වූ මොහු, 1900 වසරේදී ජනාධිපති නීතිඥයෙක් වීමටද වාසනාව ලැබීය. 1900 වසරේදී මුම්බායේ (Mumbai) ජනාධිපති නීතිවේදියෙකු වූ පී.එච්. දස්තූර් (P. H. Dastoor) තාවකාලිකව මෙම ධූරයෙන් ඉවත් වීම හේතුවෙන් මාස 6ක කාලයක් මෙම තනතුරෙහි යෙදී

කටයුතු කිරීමට මොහුට අවස්තාව ලැබුණි. පසුව ජින්නා හට මෙම පත්වීම ස්ථිර වශයෙන්ම ලබා දීමට බ්‍රිතාන්‍ය රජය කටයුතු කළ අතර ජින්නා විසින් එම පත්වීම ප්‍රතික්ෂේප කරන ලදි. ජින්නාගේ නීති දිවියේ ස්වර්ණමය අවස්ථාවක් ලෙස "කොකේස් නඩුව" (Caucus Case) හැදින්විය හැකිය. ප්‍රසිද්ධ නීතිවේදියෙකු වන ශ්‍රීමත් ෆරෝශා මේතා වෙනුවෙන් ජින්නා මෙම නඩුව හසුරුවන්නට විය. මේ නිසාම මොහු මහත් ප්‍රසිද්ධියක් ඉසිලීය. කෙසේ වුවද ජින්නා මෙම නඩුව පරාජයට පත් වූ අතර නඩුවේදී ඉදිරිපත් කළ නීති තර්ක මහත් සේ කතාබහට ලක් වන්නට විය. මේ නිසාම ජින්නා කෙමින් කෙමින් ජනප්‍රිය චරිතයක් බවට පත් වෙමින් පැවතුණි. නීති වෘත්තියේ නියැලෙමින් සිටි ජින්නා පියවරෙන් පියවර දේශපාලනයට පිවිසීම ද ආරම්භ කර තිබුණි. ඒ අනුව යමින් ජින්නා වෘත්තීය සමිති ක්‍රියාධරයෙකු ලෙස පෙනී සිටියේය. ඒ අනුව මොහු කම්කරු පංතියේ විවිධ ගැටලු සම්බන්දයෙන් පෙනී සිටියේය.

මෙලෙස කම්කරු පන්තිය වෙනුවෙන් තම ක්‍රියාකාරීත්වය රැගෙන ගිය ජින්නා 1925 දී සමස්ත ඉන්දීය තැපැල් මාණ්ඩලික සංගමයේ සභාපති වශයෙන් තේරී පත් විය.

මෙහි සාමාජිකයන් ගණන 70000 කට අධික විය. මීට අමතරව ජින්නා කම්කරුවන්ගේ අයිතිවාසිකම් බලහත්කාරයෙන් ඉල්ලා සිටීමට පවා කටයුතු කලේය. ඒ අනුව මොහු කම්කරුවන්ගේ ජීවන වැටුප් වෙනුවෙන් හා ඔවුන්ගේ සුබසාධනය සදහා සාධාරණ පිළිතුරක් බලාපොරොත්තුවෙන් නිරන්තරයෙන්ම අරගල කළේය. එමෙන්ම 1926 දී වෘත්තීය සමිති පනත බලාත්මක කිරීමෙහිලා මොහු විසින් වැදගත් කාර්ය භාරයක් ඉටු කරන ලදි. එමගින් වෘත්තීය සමිති ව්‍යාපාරයට සංවිධානය වීමට නීතිමය ආවරණය ලබා දෙන ලදි. මේ ආකාරයට කම්කරු පන්තියේ අයිතීන් වෙනුවෙන් සටන් වැදි ජින්නා තම දේශපාලන දිවියට නිල වශයෙන් අත් පොත් තබන්නේ 1904 වසරේදීය. එනම් 1904 වසරේ දෙසැම්බරයේ දී, කොංග්‍රස් මණ්ඩලය පැවැත් වූ 20 වෙනි සංවත්සරයට සහභාගී වීමත් සමගය.



*(ජින්නා, ඔහුගේ දියණිය ඩීනා (Dina Wadia) සමග)*

ජින්නා කොන්ග්‍රසයේ (congress) මධ්‍යස්ථ කණ්ඩායමේ සාමාජිකයෙකු වූ අතර ස්වයං පාලනය දිනාගැනිම සඳහා හින්දු-මුස්ලිම් එක්සත්භාවයට අනුග්‍රහය දැක්වීය. ඒ අනුව ජින්නා මුලින්ම සිදු කළේ ඉස්ලාම්වරුන් සඳහා ලබා දෙන වෙනම මැතිවරණ කොට්ඨාස තුලට විරුද්ධ වීමය. ජින්නා ප්‍රධාන වශයෙන්ම අනුගමනය කරනු ලැබුවේ කොන්ග්‍රසයේ ප්‍රබල නායකයන් වූ මේතා (Mehta), නාරෝජි (Naoroji) හා ගෝපාල් ක්‍රිෂ්ණා (Gopal Krishna Gokhale) වැනි නායකයින් ය. කෙසේ නමුත් 1915 වන විට දී කොන්ග්‍රස් මණ්ඩලයේ ප්‍රබල සාමාජිකයන් වූ මේතා හා ගෝපාල්ගේ මරණයත් සමඟ කොන්ග්‍රස් මණ්ඩලය හුදෙකලා වීමට පටන් ගැනුණි. එමෙන්ම කොන්ග්‍රසයේ තවත් ප්‍රබල සාමාජිකයෙකු වූ නාරෝජි ලන්ඩනයේ සිටීම නිසා ජින්නා ඇතුළු පාක්ෂිකයන් තවදුරටත් හුදෙකලා විය. මේ අනුව නිර්මාණය වූ දැඩි වියවුල්කාරී තත්ත්වය මත ජින්නා කොන්ග්‍රසය හා ලීගය එක් කිරීමට මහත් ප්‍රයත්නයක් දැරීය. ඒ අනුව 1916 දී, මුස්ලිම් ලීගයේ (Muslim League) සභාපති, ජින්නා සමඟ එකතු වී ඉස්ලාම් හා හින්දු නියෝජනය සඳහා කෝටා නියම කරමින් ලක්නව් ගිවිසුමට (Lucknow Pact) අත්සන් තැබීය. මෙහිදී මෙම ගිවිසුම සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක නොවුනත්, කොන්ග්‍රසය හා ලීගය අතර සහයෝගීතාවය වර්ධනය වීමට එය මහත් පිටුබලයක් විය. කෙසේ නමුත් මෙලෙස සන්ධාන ගතව ඉදිරියට ගිය මෙම පක්ෂ අතර බෙදීම් හා දේශපාලන විරසක වීම් ආරම්භ විය. 1919දී බ්‍රිතාන්‍යයන් විසින් ඉන්දියාවට ලබා දුන් මොන්ටෙගු චෙම්ස්ෆෝර්ඩ් (Montagu–Chelmsford) ප්‍රතිසංස්කරණත් සමඟ ඔවුන් අතර ප්‍රධාන බෙදීම ඇතිවිය. මෙම නව ප්‍රතිසංස්කරණය සඳහා මහත්මා ගාන්ධි (Mahatma Gandhi) ඇතුළු කොන්ග්‍රස් පිරිස සිය අකැමැත්ත ප්‍රකාශ කළ ද ජින්නා ප්‍රමුඛ පිරිස ඊට සිය කැමැත්ත පළ කරන ලදී. මේ ගැටුම පක්ෂ අර්බුධයක් දක්වා වර්ධනය විය.

එමෙන්ම පළමු වන ලෝක යුද්ධයෙන් පසුව ගාන්ධි තුමා 1920 දී කිලාෆට් කණ්ඩායම (Khilafat Faction) සමඟ සන්ධාන ගත වීම ජින්නා ඇතුළු පිරිසගේ නොසතුටට හේතු විය. ඊට සිය අප්‍රසාදය පල කළ ජින්නා අවසන් ප්‍රතිඵලය ලෙස කොන්ග්‍රසයේ සියලු තනතුරු අතහැර ලීගය සමඟ ඉදිරියට ගියේය. 1923දී පැවැත්වූ මැතිවරණයෙන් ජයග්‍රහණය කල ජින්නා නව මධ්‍යම ව්‍යවස්ථාදායක සභාවේදී බොම්බායේ මුස්ලිම් නියෝජිතයෙකු ලෙස තෝරා පත් විය. මෙය ජින්නා ලබාගත් මහඟු අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැක. ඒ අනුව ජින්නා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස දක්ෂ ලෙස කටයුතු කළ අතර ඔහු තවදුරටත් පූර්ණ වගකීම සහිත ස්වරූපයක් සඳහා දිගින් දිගටම ඉල්ලීම් කරනු ලැබීය. මේ අනුව 1925 දී ඔහුගේ ව්‍යවස්ථාදායක කටයුතු සඳහා පිළිගැනීමක් ලෙස ඔහුට නයිට් පදවියක් ලෝඩ් රීඩින් (Lord Reading) විසින් පිරිනමන ලදී .කෙසේ නමුත් ජින්නා මෙහිදී පවසා සිටියේ "සර් ජින්නා (Sir jinnah) ලෙස ආමන්ත්‍රණය කරනවාට වඩා මා කැමති ජින්නා මහතා (Mr. Jinnah) ලෙස ආමන්ත්‍රණය කරනු ලැබීමටයි" යනුවෙනි.

1930 වර්ෂයේ මුල් භාගයේදී ඉන්දියානු මුස්ලිම් ජාතිකවාදයේ පුනර්ජීවනයක් ඇතිවූ අතර එය රට පුරා ප්‍රචලිත විය. ඒ අනුව 1933දී ඉන්දියානු මුස්ලිම්වරු ජින්නාගෙන් ඉල්ලා සිටියේ නැවත අක්‍රීය තත්වයට පත්වූ මුස්ලිම් ලීගයේ නායකත්වය භාර ගන්නා ලෙසයි. ඒ අනුව ඔහු ලීගයේ නාමික සභාපති ලෙස කටයුතු කළේය. එලෙස ජින්නා තම දේශපාලන ව්‍යාපාරයට පාකිස්තානයේ පළමු අගමැතිවරයා වන ලියාකත්වාත් අලිඛාන් (Liaquat Ali Khan) මෙන්ම මුහම්මද් ඉක්බාල් (Muhammad Iqbal) යන නායකයින් සම්බන්ද කරගන්නා ලදී. ප්‍රධාන වශයෙන්ම පාකිස්තානය නිර්මාණය කිරීමේදී පෙරමුණ ගැනීම සම්බන්ධයෙන් ජින්නා කෙරෙහි ඉක්බාල්ගේ බලපෑම බොහෝ සෙයින් හේතු විය.1939යේදී බ්‍රිතාන්‍යය නාසි ජර්මනියට එරෙහිව යුධ ප්‍රකාශ කිරීමත් සමඟ අලි ජින්නා ඇතුළු පිරිස ප්‍රකාශ කර සිටියේ තමන් බ්‍රිතාන්‍යය කදවුරට සහයෝගය ලබා දෙන බවයි. ඉන්දියානුවන්ට නිදහස ලබා ගැනීමට එලෙස ක්‍රියා කරන බව ප්‍රකාශ කළද එම තීරණයට ඉන්දියානුවන් බහුතරයක් අකමැති විය. කෙසේ නමුත් බ්‍රිතාන්‍යයන් මුස්ලිම් ලීගයට සිය රාජ්‍ය අනුග්‍රහය ලබා දුන් අතර ජින්නා හට ගාන්ධිතුමාට සමාන තත්වයක් ලබා දීමට කටයුතු කළේය. ක්‍රමක්‍රමයෙන්

මුස්ලිම් ලීගය ඉන්දියාව තුල ප්‍රධාන පක්ෂයක් බවට පත් වූ අතර සුළුතරයක් වූ මුස්ලිම්වරුන්ගේ අයිතිවාසිකම් උදෙසා 1940 මාර්තු 23 දී ලාහෝරයේ (Lahore) පැවතුණු ලීග් සැසිවාරයේදී ද්වීජාතීන් ගේ න්‍යාය (Two Nation's Theory) සම්මත කරගන්නා ලදී. ඒ අනුව ලාහෝරයේදී මුස්ලිම් ලීගය සින්ද් (Sindh) පන්ජාබ් (Punjab), බලුකිස්ථානයේ වයඹ මායිම් පළාත ( Northwest Frontier Province of Balochistan) හා බෙංගාලය (Bengal) ඇතුළත් ස්වාධීන මුස්ලිම් රාජ්‍යයක් බිහි කිරීම සඳහා විධිමත් ලෙස නිර්දේශ කර තිබූණි. සමස්ත මුස්ලිම් ජනතාවට ඉතා වාසිදායක වුවද මෙම තීරණයට මහත්මා ගාන්ධි ඇතුළු ඉන්දියානු හින්දු බහුතරයක් විරුද්ධත්වය පළ කළේය.

ඒ අනුව ජින්නා සහ ගාන්ධිතුමා අතර දීර්ඝ සාකච්ඡා වට කිහිපයක් පැවතුණි. මෙහිදී ජින්නා පාකිස්තානය නමින් වෙනම රාජ්‍යයක් මුස්ලිම් වරුන්ට අවශ්‍ය බව තරයේ විශ්වාස කළ බව කියවේ. මේ පිළිබඳව ජනමත විචාරණයක් පැවැත්විය යුතු බව තීරණය කළද, 1945 දෙසැම්බරයේ පැවත්වූ ව්‍යවස්ථාදායක මණ්ඩලය සඳහා වූ මැතිවරණයේදී ලීගය, මුස්ලිම්වරුන් සඳහා වෙන් කළ සියලුම ආසන දිනා ගැනීමට හැකියාව ලැබිණි. මෙම සුවිශාල මැතිවරණ ජයග්‍රහණය පාකිස්තානයේ උපතට තුඩු දුන්නක් විය.ඒ අනුව ඉන්දියාවේ නව ආණ්ඩුකාරවරයා වූ මවුන්ට් බැටන් (Lord Mountbatten) ගේ ප්‍රධානත්වයෙන් 1947 ජූනි 2වන දින ඉන්දියානු නායකයින්ට අවසන් සැලැස්ම යොමු කරන ලදුව අගෝස්තු  මස 15 වන දින සමස්ත ඉන්දියාවට නිදහස ලබා දුන් අතර පාකිස්තානය ලෙස වෙනම රාජ්‍යයක්ද නිර්මාණය විය. ජූනි 3 වන දින මවුන්බැටන්, නේරු (Nehru), ජින්නා හා සීක් නායක බල්දේව් සිං (Baldev Singh) විසින් ගුවන් විදුලියෙන් නිවේදනයක් නිකුත් කරනු ලැබිණි. එහිදී ජින්නා සිය දේශනය අවසන් කළේ පිටපතෙහි නොමැති "පාකිස්තාන් සින්දාබාද්" (දිගුකල් පාකිස්තානය සමඟ) (Pakistan Zindabad)යන ප්‍රකාශයත් සමඟිනි. මේ අනුව 1947 අගෝස්තු 22 වන දින ජින්නා පාකිස්තානයේ පළමු ආණ්ඩුකාරවරයා ලෙස පත් විය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව

ඉන්දියානු උප මහද්වීපය තුළ මුස්ලිම් නිජබිමක් ස්ථාපනය කිරීම පිළිබඳ අතිශය වුවමනාවකින් යුතු වූ මොහොම්මද් අලි ජින්නා මුස්ලිම්වරුන්ගේ සම්ප්‍රදායන් ආරක්ෂා කිරීමට ඇති එකම ක්‍රමය එය බව විශ්වාස කළේය. ඉන්දියාවෙන් පාකිස්තානය වෙන්කර ගැනීමට ගෙන ගිය අරගලයේ අවසානය සනිටුහන් වූයේ පාකිස්තානය වෙනම රාජ්‍යයක් ලෙස ජාත්‍යන්තර පද්ධතියට එකතු වීමෙනි. මොහොම්මද් අලි ජින්නා නව රාජ්‍යයේ පළමු ප්‍රධානියා බවට පත් විය. තරුණ රටක් වූ පාකිස්තානයට මුල්කාලීනව බරපතළ ගැටලුවලට මුහුණ දීමට සිදු වූ අතර අලි ජින්නා එම ගැටලු සියල්ල විසඳා ගැනීමට සමත් විය. ඔහු හුදෙක් ආණ්ඩුව පවත්වාගෙන යන ආණ්ඩුකාරවරයෙක් හෝ පාලකයෙක් පමණක් නොවීය.ඔහු මිනිස් හදවත් වලට සමීප වෙමින් තමන්ගේ රට ඉතාමත් සාර්ථකව ඉදිරියට ගමන් කරවීමට මුළු ජීවිතයම කැප කළේය. එබැවින් ඔහු පාකිස්තානුවන්ගේ ආත්මය ම ස්පර්ෂ කළ "ජාතියේ පියා"(The Farther of the Nation) ලෙස ගෞරවයට පාත්‍ර විය.රිචඩ් සයිමන්ස්ට (Richard Simmons) අනුව පාකිස්තානයේ පැවැත්ම උදෙසා අන් කවරෙකුටත් වඩා වැඩියෙන් දායකත්වය සපයා ඇත්තේ මොහොම්මද් අලි ජින්නාය. පාකිස්තානය නිර්මාණය කළ දින කිහිපයකට පසු මොහොම්මද් අලි ජින්නා මෙසේ පැවසීය

”ඔබට ඔබේ පන්සල් වලට යාමට නිදහස තිබේ.ඔබේ පල්ලිවලට හෝ මෙම පාකිස්තාන රාජ්‍යයේ වෙනත් පූජනීය ස්ථානයකට යාමට ඔබට නිදහස තිබේ. ඔබ ඕනෑම ආගමකට හෝ කුලයකට අයත් විය හැකිය.ඔබ අයත් වන කුලය හෝ ඔබ අදහන ආගම සමග රාජ්‍ය ව්‍යාපාරයට කිසිදු සම්බන්ධතාවයක් නැත" යන්නයි.මෙම ප්‍රකාශය තුළින් ගම්‍ය වන්නේ පාකිස්තානය මුස්ලිම්වරුන්ගේ රාජ්‍යයක් පමණක් නොවන බවත් සැමට සමාන අයිතිවාසිකම් ලබාදීම මෙතුමාගේ ප්‍රතිපත්තිය වූ බවත්ය. දේශපාලනය සමග ජනතාවගේ පෞද්ගලික අයිතිවාසිකම් පටලවා නොගනිමින් ඉතා පැහැදිලි මාවතක් ඔස්සේ රාජ්‍ය මෙහෙයවීමට මෙතුමා සමත් විය.මෙතුමාගේ මරණයෙන් පසු ඔහුගේ අනුප්‍රාප්තිකයන්ට පැවරී තිබුණේ ද පාකිස්තානු ජාතිය ආරක්ෂා කොට පවත්වාගෙන යාමයි.



*(ජින්නා, ඔහුගේ සහෝදරිය ෆාතිමා ජින්නා (Fatima Jinnah) සමග)*

වර්ෂ 1947 අගෝස්තු 15 වන දින පාකිස්තානයේ නව ආණ්ඩුකාරවරයා බවට පත් වූ අවස්ථාවේ පටන් තම වගකීම් සමුදාය ජනතාව වෙනුවෙන් ඉටු කිරීමට හෙතෙම සමත් වූයේය. සරණාගතයින් පුනරුත්ථාපනය කිරීමට හෝ රාජ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා නිසි ක්‍රියා පටිපාටියක් නොතිබීම මෙන්ම ගොවිතැන් කිරීම සහ මූල්‍යමය දුෂ්කරතා වැනි ගැටලු රැසකටම මුල් කාලීනව පාකිස්තානය මුහුණ දී තිබුණි. මෙම සියලු ගැටලු වලට පකිස්තානය මොහොම්මද් අලි ජින්නාගේ නායකත්වය යටතේ පාකිස්තානය නිර්භිතව මුහුණ දුන්නේය.

පාකිස්තානය නිර්මාණය කිරීමේ දී ඉන්දියාවේ මුස්ලිම්වරුන් ඉටු කළ කාර්යභාරය පිළිබඳව මෙතුමා හොඳින් දැන සිටියේය. පාකිස්තානය නිර්මාණය කිරීමෙන් පසු ඔහු ජීවත් වූ කෙටි කාලය තුළ පාකිස්තානයේ වර්ධනය හා සාර්ථකත්වය උදෙසා නිවැරදි පූර්වාදර්ශ ඉදිරිපත් කළේය. තවද මෙතුමා රට තුළ නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත කිරීම උදෙසා ක්‍රියා කළේය. මොහොම්මද් අලි ජින්නා තරයේ විශ්වාස කළේ රටේ අනාගතය රඳා පවතිනුයේ දරුවන්ට ලබාදෙන අධ්‍යාපනය මත බවයි.

ඉන්දීය අධ්‍යාපන සමුළුවට පණිවුඩයක් නිකුත් කරමින් ඔහු කියා සිටියේ " අපගේ අනාගත තත්ත්වය අපගේ දරුවන්ට ලබාදෙන අධ්‍යාපනය මත රඳා පවතින බවට කිසිදු සැකයක් නැත. අපගේ ජනතාවට විද්‍යාත්මක හා තාක්ෂණික අධ්‍යාපනයක් ලබාදීම සඳහා ඉතා උත්සුකව කටයුතු කළ යුත්තේය." යනුවෙනි.මේ තුළින් පෙනී යන්නේ මෙතුමා අධ්‍යාපනය ඉතාමත් වැදගත් සමාජයීය අවශ්‍යතාවක් ලෙස සලකා රටේ අධ්‍යාපනය නගාසිටුවීම සඳහා ක්‍රියාකල අයෙකු බවයි. මෙතුමා රටේ ආර්ථික හා මූල්‍ය සංවර්ධනය

පිළිබඳව අවධාරණය කළේය. ඔරියන්ට් එයාර්වේස් (Orient Airways), හබීබ් බැංකුව (Habib Bank), මුස්ලිම් කොමර්ෂල් බැංකුව(Muslim Commercial Bank),වාණිජ හා ක්රමාන්ත මණ්ඩලය (Muslim Chamber of Commerce and Industries) සහ මුද්‍රණාලය (Printing Press) වැනි සංවිධාන බිහි වූයේ මොහොම්මද් අලි ජින්නා රාජ්‍ය පාලකයා වශයෙන් කටයුතු කළ සමයේ ය. පාකිස්තාන ගුවන් විදුලි සේවයේ සමාරම්භක දිනයේ දී ඔහු පැවසුවේ "අපට අවශ්‍ය වන්නේ සාමකාමීව ජීවත්වීමට සහ අපගේ අසල්වැසියන් හා ලෝකය සමඟ සුහදව සබඳතා පවත්වා ගැනීමයි" යනුවෙනි. මේ සෑම ක්‍රියාවක් තුළින්ම වටහාගත හැකි වඩාත් වැදගත්ම දේ වන්නේ මොහොම්මද් අලි ජින්නා නමැති විශිෂ්ට නායකයාට අවශ්‍ය වූයේ ස්රව සාධාරණත්වය සපිරි සාමකාමී දේශයක් ගොඩනැගීම බවයි.

## විදේශ ප්‍රතිපත්තිය

රටක විදේශ ප්‍රතිපත්තිය යනු එම රටෙහි අනන්‍යතාවය, අරමුණු, අභිලාෂයන් සහ අනෙකුත් රටවල් සමග ගනුදෙනු කරන ආකාරය පිළිබඳව කෙරෙන විග්‍රහයකි. 1947දී නවමු රාජ්‍යයක් ලෙස සංවිධානය වූ පාකිස්තානයට තමන්ට ම ආවේණික වූ විදේශ ප්‍රතිපත්තියක් නිරමාණය කිරීමෙහිලා පුරෝගාමී වූයේ මොහොම්මද් අලි ජින්නා ය. මොහොම්මද් අලි ජින්නාගේ පාලන අවධිය ඉතා කෙටි වුවද, එම අවධිය තුළ සිදු වූ සිදුවීම් පාකිස්තානයේ විදේශ ප්‍රතිපත්තිය හැඩගැස්වීමෙහිලා දායක විය.

1947දී මොහොමඩ් අලි ජින්නාගේ විදේශ ප්‍රතිපත්තිය ඉතාමත් වැදගත් එකක් විය. ඔහු එහිදී ප්‍රකාශ කළේ ''අපට අවශ්‍ය වන්නේ අසල්වැසි රාජ්‍යයන් සහ ලෝකය සමඟ මිත්‍රශීලී ,සාමකාමී සහ සුහද සබඳතා පවත්වමින් ජීවත් වීමටය. අප තුළ අනෙකාට විරුද්ධව ආක්‍රමණශීලී සැලසුම් නැත. අප එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය වෙනුවෙන් පෙනී සිටින අතර ඉතාමත් සතුටින් ලෝක සාමය සහ සෞභාග්‍යය උදෙසා අපගේ දායකත්වය සපයමු." එසේම 1948 පෙබරවාරි මස ඇමරිකා එක්සත් ජනපදයේ ජනතාවට කළ විකාශන වැඩසටහනකදී මොහොම්මද් අලි ජින්නා පාකිස්තානයේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව පහත

අයුරින් විග්‍රහ කළේය. "අපගේ විදේශ ප්‍රතිපත්තිය ලෝකයේ අනෙකුත් ජාතීන් කෙරෙහි මිත්‍රශීලී බව සහ හොඳ හිත පතුරවන්නකි. අප හට කිසිම රටකට හෝ ජාතියකට විරුද්ධව ආක්‍රමණශීලී සැලසුම් නැත.ජාතික හා ජාත්‍යන්තර ගණුදෙනු වලදී අවංකභාවය සහ සාධාරණ ලෙස ක්‍රියා කිරීමේ මූලධර්ම පිළිබඳ අපි දැඩිව විශ්වාසය තබන්නෙමු. එසේම ජාතීන් අතර සාමය සහ සෞභාග්‍යය ප්‍රවර්ධනය කිරීමෙහිලා අපගේ උපරිම දායකත්වය සපයමු.එමෙන්ම ලොව පීඩිත පන්තිය සඳහා ද එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය තහවුරු කිරීම සඳහා ද අපගේ නොමසුරු ද්‍රව්‍යමය හා සදාචාරාත්මක සහයෝගය ලබා දෙන්නෙමු."

මොහොමඩ් අලි ජින්නාගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව දැක්ම නිසා එක්සත් ජාතීන්ගේ මූලධර්ම මෙන්ම අරමුණු වන ස්වෛරී සමානාත්මතාවය, භෞමික අඛණ්ඩතාවය, එකිනෙකාගේ කටයුතුවලට මැදිහත් නොවීම, ද්විපාර්ශවික ආරවුල් සාමකාමීව විසඳාගැනීම වැනි මූලධර්ම පිළිපැදීමට පාකිස්තානය උත්සුක විය. මොහොමඩ් අලි ජින්නාගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව මූලධර්ම සහ අරමුණු මත පදනම්ව පාකිස්තානයේ විදේශ ප්‍රතිපත්ති ස්වරූපය පහත පරිදි ගෙනහැර දැක්විය හැක.

"ස්වෛරී ස්වාධීනත්වය,භෞමික අඛණ්ඩතාවය, සමාජ ආර්ථික සංවර්ධනය, ඉස්ලාමීය අනන්‍යතාවය මෙහෙයවමින් නවීන සහ ඉදිරි දැක්මක් සහිත ප්‍රජාතාන්ත්‍රික ජාතියක් ලෙස නැගී සිටිමින්, ජාත්‍යන්තර සමාජය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ජාත්‍යන්තර සාමයට සහ සුරක්ෂිතතාවයට හේතුව බවට පත්කරමින්, පාකිස්තානය කලාපීය සහ ගෝලීය ස්ථාරත්වය ශක්තිමත් කිරීමට බලපාන සාධකයක් බවට පත් කිරීම."

**පොදු රාජ්‍ය මණ්ඩලය සහ බ්‍රිතාන්‍යය සමඟ පැවැති සබඳතා**

1947 දෙසැම්බර් මස 19 වන දින රොබර්ට් ස්ටිම්සන් (Robert Stimson) සමඟ පැවැති බිබිසි (BBC) සාකච්ඡාවකදී මොහොම්මද් අලි ජින්නා පැවසුවේ පාකිස්තානය තවදුරටත් පොදු රාජ්‍ය මණ්ඩලය සමඟ රැඳී සිටිය යුතුද නැද්ද යන්න ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය තීරණය කරන බව ය. නමුත් අනන්‍යය වූ

ප්‍රතිලාභ ලැබීමට කැමැත්ත දක්වන රටක් වශයෙන් පොදු රාජ්‍ය මණ්ඩලය තුළ පාකිස්තානය තවදුරටත් රැඳී සිටීමට සූදානම් බව මොහොම්මද් අලි ජින්නා පැවසූවේය. එසේම ඔහුගේ මතයට අනුව පොදු රාජ්‍ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨතම සාමාජිකයා වශයෙන් බ්‍රිතාන්‍යයට සදාචාරාත්මක වගකීම් ඉටුකළ හැක.

බ්‍රිතාන්‍යය පිළිබඳව මොහොමඩ් අලි ජින්නාට එකල පැවතියේ තරමක් වෙනස් ආකල්පයකි. වරෙක ඔහු ප්‍රකාශ කළේ බ්‍රිතාන්‍යය විසින් පාකිස්තානයට උදාසීන ලෙස සලකන බව තමාට දැනෙන බවයි. බ්‍රිතාන්‍යයට තවදුරටත් කිසිදු කටයුත්තකට මැදිහත් වීමට බලයක් නොමැති වුවද සදාචාරාත්මක ඒත්තු ගැන්වීමක් හරහා පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජිකයන් අතර පවතින වෙනස්කම්,දුර්මත සමථයකට පත්කිරීමට බ්‍රිතාන්‍යයට හැකි බව ඔහු ප්‍රකාශ කලේය. එහෙත් මේ සම්බන්ධව බ්‍රිතාන්‍යය තම වගකීම් පැහැර හරින බවක් මොහොම්මද් අලි ජින්නා ට පසක් විය.

කෙසේ වෙතත් මේ සියල්ල පසෙකලා මොහොමඩ් අලි ජින්නාට අවශ්‍ය වූයේ බ්‍රිතාන්‍යය සමග සුහදශීලී සබඳතා ඇති කර ගැනීමටය. දෙරට අතර පැවති මිත්‍රශීලී සබඳතා වල ප්‍රතිඵල වශයෙන් එකල් හි ත්‍රිවිධ හමුදාපතිවරුන් ලෙසද, මධ්‍යම ආණ්ඩුවේ සහ පළාත් ආණ්ඩුවල විවිධ තනතුරු සඳහා ද, විවිධ පළාත්වල ආණ්ඩුකාරවරුන් ලෙස ද, බ්‍රිතාන්‍ය නිලධාරීන් පත් විය .එසේම මෙකල්හි පාකිස්තානය තුල විවිධ බ්‍රිතාන්‍ය බැංකු සහ ව්‍යාපාර ආරම්භ කර පවත්වාගෙන යාමට අවශ්‍ය අවසරය ලැබිණි. මේ හේතුවෙන් පාකිස්තානුවන් ට මුළුමහත් පොදු රාජ්‍ය මණ්ඩලයම සිය පවුල ලෙසත් මහා බ්‍රිතාන්‍යය සිය වැඩිමහල් සොහොයුරා ලෙසත් දැනෙන්නට විය.

මොහොම්මද් අලි ජින්නා නිරන්තරයෙන් විශ්වාස කලේ සාමාජික රටවල් අතර පවතින ගැටලු තම අභ්‍යන්තර දෙයක් ලෙස සලකා පොදුරාජ්‍ය මණ්ඩලය තුළ කටයුතු කළ යුතු බවය. කාශ්මීර අර්බුදය (Kashmir conflict) එක්සත් ජාතීන්ගේ හමුවට ගිය අවස්ථාවේ දී මහා බ්‍රිතාන්‍යය සමඟ ඇමරිකාව, කැනඩාව සහ අනෙකුත් ආරක්ෂක කවුන්සිලයේ සාමාජිකයන් මුලදී සාධාරණව කටයුතු කළ නමුත් ඉන්දියාව විසින් එල්ල කළ තර්ජන (පොදු රාජ්‍ය මණ්ඩලයෙන් ඉවත් වන බව පවසමින්) හමුවේ තරමක පසුබැසීමක් දක්නට ලැබිණි. නමුත් මොහොමඩ්

අලි ජින්නාව පුදුමයට පත් කරමින් ඉන්දියාව තවදුරටත් පොදු රාජ්‍ය මණ්ඩලයේම රැඳී සිටියේය. මේ නිසා පාකිස්තානය තුළ පොදු රාජ්‍ය මණ්ඩලය පිළිබඳව පැවති ධනාත්මක හැඟීම් තරමක් උදාසීන වුවද මොහොමඩ් අලි ජින්නා ඉන් නොනැවතී තවදුරටත් ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කර ගැනීමට කටයුතු කළේය.

**එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ පාකිස්තානය අතර පැවති සබඳතා**

1947 සැප්තැම්බර් 30 වන දින පාකිස්තානය එක්සත් ජාතීන්ගේ සංවිධානයට එක් කර ගනු ලැබුවේ ලොව සියලුම නායකයන් සහභාගි වූ ආක්‍රමණීය උත්සවයකදීය. මෙය අනෙකුත් රටවල් සමඟ සබඳතා ඇතිකර ගැනීමට පාකිස්තානයට ලැබුණු වරමක් බඳු විය. ඉන්දියාව, කැනඩාව, ශ්‍රී ලංකාව ආදී රටවල් සඳහා මහකොමසාරිස්වරුන් පත් කරනු ලැබූ අතර ඇමෙරිකාව, ඉරානය, බුරුමය, ඇෆ්ගනිස්ථානය, තුර්කීය ආදී රටවල තානාපති කාර්යාල ඇතිවිය. මලික් සර් ෆෙරොස් ඛාන් නූන් (Malik Sir Feroze Khan Noon) මොහොම්මද් අලි ජින්නාගේ පෞද්ගලික නියෝජිතවරයා ලෙස මැද පෙරදිග කලාපයට පත්වූ අතර සර් සෆ්රුල්ලා ඛාන් (Sir Zafrullah Khan) පලස්තීන අරාබිවරුන් පිළිබඳ විමසීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට පිටත් කර යවන ලදී .මේ හරහා රටවල් අතර සබඳතා ශක්තිමත් කර ගැනීමට පාකිස්තානයට හැකිවිය.

පාකිස්තානය පිහිටවූ වසරේදී විවිධාකාර ජාත්‍යන්තර සමුළු සඳහා සහභාගි වීමට එයට හැකිවිය. ජපන් සාම බේරුම්කරණය පිළිබඳ සමුළුව (Conference about Japanese Peace Settlement) සඳහා නියෝජිතයන් කැන්බරා නුවර (Canberra) ට පිටත්ව යැවීම මෙහිදී සිදුවිය. එසේම ජිනීවා (Geneva) වල පැවැති ආහාර හා කෘෂිකර්මාන්ත සංවිධාන (Food and Agricultural Organization) සමුළුවට සහභාගි වීමට ද ජාත්‍යන්තර කම්කරු සංවිධානය (International Labour Organization), ජාත්‍යන්තර සෞඛ්‍ය සංවිධානය (World Health Organization) ලෝක බැංකුව (World Bank), ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (International Monetary Fund) ආදී සංවිධාන සමග එකතු වීමට ද පාකිස්තානයට හැකිවිය.

එසේම මොහොමඩ් අලි ජින්නාගේ නායකත්වය යටතේ එක්සත් ජාතීන්ගේ සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන වල සාකච්ඡා සහ ක්‍රියාකාරකම් වලට සහභාගී වීමට පාකිස්තානයට හැකිවිය. මොහොමඩ් අලි ජින්නා යනු නිරන්තරව එක්සත් ජාතීන්ගේ මූලධර්ම සහ පරමාදර්ශ පිළිබඳව දැඩි බලාපොරොත්තු තබාගෙන සිටි අයෙකි. වරෙක ඔහු ප්‍රකාශ කළේ "පාකිස්තානය මෑතකදී එක්සත් ජාතීන්ගේ සංවිධානය හා අත්වැල් බැඳගන්නා ලදී. එක්සත් ජාතීන්ගේ සංවිධානය ශක්තිමත් කිරීමට මෙන්ම එහි අරමුණු හා පරමාදර්ශ ශක්තිමත් කිරීමට හැකි උපරිම අයුරින් පාකිස්තානය සහයෝගය දක්වන" බවය.

## ඇමරිකාව සහ පාකිස්තානය අතර පැවති සබඳතා

මොහොමඩ් අලි ජින්නාට අවශ්‍ය වූ තවත් කරුණක් වන්නේ ඇමරිකාව සමග මිත්‍ර සබඳතා ඇතිකර ගැනීමයි. ඇමරිකා එක්සත් ජනපදය, පාකිස්තානයේ ආරම්භක අවධියේ පටන්ම පාකිස්තානය සමග මිත්‍රව සිටි අතර 1947 අගෝස්තු දාහතර වන දින උපත ලැබූ එය නිල වශයෙන් පිළිගත් පළමු රටවල් අතර එක් රටක් ද වන්නේ ය. පාකිස්තානය සහ ඇමරිකාව අතර වෙළඳ සහ වාණිජ සබඳතා ද පවත්වාගෙන යමින් දෙරට අතර සබඳතා තර කර ගැනීමට මොහොමඩ් අලි ජින්නා ට හැකිවිය. එකල්හි පාකිස්තානය ආරම්භක අවධියක සිටි නිසා අවශ්‍ය තාක්ෂණික සහ මූල්‍යමය සහයෝගය ලබාදීමට ඇමෙරිකාව ඉදිරිපත් විය. මෙලෙස බටහිර ගැති,විශේෂයෙන්ම ඇමරිකානු ගැති රටක් බවට පත්වීමට හේතු සාධක කිහිපයක් පවතී. විශේෂයෙන්ම මොහොමඩ් අලි ජින්නා යනු බටහිර අධ්‍යාපනය ලද, බටහිර ආශ්‍රය ලද අයෙකි. එමෙන්ම එහි ආර්ථික ය නිරන්තරයෙන්ම මුහු වූයේ බටහිර ලෝකය සමග ය. වඩාත් තරඟකාරී මිලකට පාරිභෝගික භාණ්ඩ සැපයීමට හැකි වීමත්, පාකිස්තානු අමුද්‍රව්‍ය වලට ස්ථිරවෙළඳපොළක් නිර්මාණය කරදීමට හැකිවීමත් නිසා පාකිස්තානයට අවශ්‍ය වූයේ බටහිර වෙළඳ සහකරුවන් සොයා ගැනීමටය. එසේම ඉන්දියාව සහ එරට අතර පැවති කාශ්මීර අර්බුදය විසඳා ගැනීම සඳහා වඩාත් ශක්තිමත් රාජ තාන්ත්‍රික හා දේශපාලන සහයෝගයක් බටහිර ලෝකයෙන්, විශේෂයෙන්ම ඇමරිකාව සහ බ්‍රිතාන්‍යයෙන් පාකිස්තානය බලාපොරොත්තු විය.

## මුස්ලිම් රටවල් සමග පැවති සබඳතා

මොහොම්මද් අලි ජින්නාගේ සිහිනයක් වූයේ ඉස්ලාම් පදනම මත සියලුම මුස්ලිම් රටවල් සමඟ වඩාත් ශක්තිමත් ඵලදායි සබඳතාවයන් ඇති කර ගැනීමටය. මේ හරහා ඔවුන්ට පැමිණෙන සතුරු බලවේග වලට වඩාත් ශක්තිමත්ව මුහුණ දිය හැකි බව ඔහු වටහා ගත්තේය. මොහොම්මද් අලි ජින්නා නිරන්තරයෙන් මුස්ලිම් රටවල් වල එක්සත්භාවය වර්ධනය කිරීමට කටයුතු කළ අයෙකි.තුර්කිය, ඉරානය සහ පාකිස්තානය අතර පැවැති සම්බන්ධතාවයන් ද මෙකල්හි වඩාත් මිත්‍රශීලී තත්වයක විය.

විශේෂයෙන්ම මුස්ලිම් ජනයාගේ නිදහස සහ ස්වාධීනත්වය වෙනුවෙන් නිරන්තරයෙන් උනන්දු වූ මොහොම්මද් අලි ජින්නා පලස්තීනය බෙදීයාමට තරයේ විරුද්ධ වූ අතර ඊශ්‍රාලය බිහිවීමද හෙලා දකින ලදී.එසේම උතුරු අප්‍රිකානු අරාබිවරුන්ට ප්‍රංශ බලපෑම් වලින් මිදී යාමට ඔහු සහයෝගය ලබාදුන්නේය.1948 දී ඉන්දුනීසියාවට පැමිණි ලන්දේසි ආක්‍රමණය තම රටට සිදු වූ ආක්‍රමණයක් ලෙස සලකා ඉන්දුනීසියාවට යුද උපකරණ රැගෙන යන සියලුම ලන්දේසි නැව් සහ ගුවන්යානා සඳහා සංක්‍රමණික පහසුකම් ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට මොහොම්මද් අලි ජින්නාට හැකිවිය. එසේම මුස්ලිම් රටවල පැවති නිදහස් අරගල වලදී අවශ්‍ය සහයෝගය ලබාදීමට ඔහු කටයුතු කළේය. විශේෂයෙන්ම ඉන්දුනීසියාව ,සුඩානය ,ලිබියාව ,මොරොක්කෝව ආදී රටවල පැවති නිදහස් අරගල වලට අවශ්‍ය රාජතාන්ත්‍රික සහ ද්‍රව්‍යමය සහයෝගය ලබාදීමට මොහොම්මද් අලි ජින්නා සමත්විය.

## මොහොමඩ් අලි ජින්නා සහ කාශ්මීර අර්බුදය

මොහොම්මද් අලි ජින්නාගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ සලකා බලන විට කිසි ලෙසකින්වත් අමතක කළ නොහැකි කරුණක් වන්නේ කාශ්මීර අර්බුදයයි. කාශ්මීර අර්බුදය යනු ඉන්දියාවත් පාකිස්තානයත් අතර කාශ්මීර ප්‍රදේශය අරබයා කාලාන්තරයක් තිස්සේ පවතින ගැටළුවකි. මෙම ගැටලුව ආරම්භ වන්නේ 1947 දී සිදුවන ඉන්දීය සහ පාකිස්තාන බෙදී යාමත් සමඟය. ඉන්දියාවෙන් වෙන්ව පාකිස්තානය තනි මාර්ගයක ගමන් කිරීමට තීරණය කරනවාත් සමඟම එතෙක් බ්‍රිතාන්‍යයේ යටත් විජිත පාලනය තුළ සිටි කුමාර

රාජ්‍යයන්ට (Princely states) තමන් ඉන්දියාව සමඟ එකතු වෙනවා ද නැතහොත් පාකිස්තානය සමඟ එකතු වනවා ද යන්න තීරණය කිරීමට අවස්ථාව ලැබිණි. එකල්හි එවකට කාශ්මීරයේ පාලකයාව සිටි මහරාජා හරි සිංහට (Maharaja Hari Singh) අවශ්‍ය වූයේ කාශ්මීරය කිසිදු රටක් සමඟ සම්බන්ධ නොවී ස්වාධීන රාජ්‍යයක් බවට පත් කිරීමට ය. විශේෂයෙන්ම කාශ්මීරය යනු බහුතර මුස්ලිම් ජනගහණයක් ජීවත් වන එහෙත් හින්දු පාලකයෙක් සිටින ප්‍රදේශයකි. ඉන්දියාවට හෝ පාකිස්තානයට සම්බන්ධ වීමට පවතින පීඩනයෙන් මිදීම සඳහා මහරාජා හරි සිං පාකිස්තානය සමග ස්ථාවර ගිවිසුමක් අත්සන් කළේය. මේ හරහා කාශ්මීර වැසියන්ට පාකිස්තානය සමග වෙළඳාම් සහ ගමනාගමන කටයුතු පවත්වාගෙන යාමට අවසර ලැබිණි. නමුත් ඉන්දියාව කාශ්මීරය සමඟ මෙවැනි ගිවිසුමකට එළඹුණේ නැත.

මෙකල්හි ඉන්දියාවත් පාකිස්තානයත් අතර ගැටුම් තරමක් දුරට තිබූ කාලයකි. පාකිස්තානය නිරන්තරවම තමා සමග එකතුවන ලෙස කාශ්මීරයට බල කළ අතර පාකිස්තානය කාශ්මීරයට ලබා දෙන ආහාර පාන,ඇඳුම් පැළඳුම් ආදිය ද අත්හිටුවීමට පෙළඹිණි. දෙවනුව පාකිස්තාන ආධාර ඇතිව පාකිස්තානු ගැති කැරලිකරුවන් බටහිර කාශ්මීරයේ වැඩි කොටසක් අත්පත් කර ගත්තේය. 1947දී පතාන් (Pathan) ගෝත්‍රිකයන් පාකිස්තානයේ සිට දේශසීමාව හරහා කාශ්මීරයට ඇතුළු විය. මේ අවස්ථාවේදී මහරාජා හරි සිං ඉන්දියාවේ සහයෝගය ඉල්ලා සිටි අතර කාශ්මීරය ඉන්දියාවේ කොටසක් බවට පත් වුවහොත් යුධ ආධාර ලබාදෙන බවට ඉන්දියාව පොරොන්දු විය. ඒ අනුව 1947 දී මහරාජා හරි සිං සහ ඉන්දියාව අතර ගිවිසුමක් ඇති වූ අතර ඒ හරහා කාශ්මීරය ඉන්දියාව සමග සබඳතා ආරම්භ විය . ඉන් පසුව ඉන්දියාව සිය මිලිටරි ආධාර කාශ්මීරයට ලබාදුන් අතර 1947 දී ඉන්දියාව හා පාකිස්තානය අතර පලමු යුද්ධය එසේ ඇතිවිය. පසුකාලීනව ඉන්දීය ව්‍යවස්ථාව හරහා කාශ්මීරයට විශේෂ තත්ත්වයක් ලැබුණි. මහරාජා හරි සිං ගත් මෙම තීරණය නිසා කාශ්මීරය සම්බන්ධ ගැටලුව වර්තමානයේ දී ද තවදුරටත් නොවිසඳුණු ගැටලුවක් බවට පත්ව ඇත.

කාශ්මීරය සම්බන්ධ ගැටළුවේ දී ඉන්දියාව හා පාකිස්තානය ප්‍රධාන වශයෙන් අවස්ථා හතරකදී යුද වැදී ඇති අතර 1947-1948 කාලයේ ඇති වූ යුද්ධය මින්

ප්‍රධාන වේ.එකල්හි මොහොම්මද් අලි ජින්නා පාකිස්තානයේ ආණ්ඩුකාරවරයා වූ අතර ඔහු කාශ්මීරය හැඳින්වූයේ පාකිස්තානයේ "කන්ධරීක ශිරාව" වශයෙනි. කාශ්මීරයේ බහුතර වශයෙන් ජීවත් වූයේ මුස්ලිම් ජනතාව නිසා මොහොම්මද් අලි ජින්නා විශ්වාස කළේ කාශ්මීරය පාකිස්තානය සමග එක්විය යුතු බවය. කෙසේ වෙතත් 1947 දී කාශ්මීර ප්‍රදේශය අරබයා ඇති වූ පළමු ඉන්දීය සහ පාකිස්තාන යුද්ධය විසඳීම සඳහා ඉන්දියාව ප්‍රථම වරට එක්සත් ජාතීන් හමුවට මෙය ඉදිරිපත් කරන ලදී. එහිදී තමා අයත් විය යුත්තේ කුමන රටට දැයි තීරණය කිරීම සඳහා කාශ්මීර වැසියන්ට අවස්ථාව දිය යුතු බවත් ඒ සඳහා ස්වාධීන ජනමත විචාරණයක් පැවැත්විය යුතු බවටත් එක්සත් ජාතීන්ගේ සංවිධානය නිරදේශ කළේය.

කාශ්මීර අර්බුදය සම්බන්ධයෙන් මොහොම්මද් අලි ජින්නා තුළ තිබූ ආකල්පය තරමක් දුරට කුතුහලය දනවන තත්ත්වයකි. විශේෂයෙන්ම 1947 දී ඉන්දියාවේ සහ පාකිස්තානයේ බෙදී යාමත් සමඟ තමන් ස්වාධීන රාජ්‍යයක් වන බවට කාශ්මීරය ප්‍රකාශ කර තිබූ අවස්ථාවක පාකිස්තානය විසින් එලෙස මැදිහත්වීම සම්බන්ධයෙන් යම් ගැටලුකාරී තත්ත්වයක් ඇත. එමෙන්ම ඇතැමුන් අදටත්, මෙම නොවිසඳුණු කාශ්මීර අර්බුදයට මුල පිරිම සම්බන්ධයෙන් මොහොම්මද් අලි ජින්නා හට ද චෝදනා එල්ල කරයි. කෙසේ වෙතත් මුස්ලිම් බහුතරයක් දෙනා ජීවත් වන නිසා මොහොම්මද් අලි ජින්නා නිරන්තරයෙන්ම විශ්වාස කළේ කාශ්මීරය ඔවුන් සමඟ එකතු විය යුතු බවය. පෙර සඳහන් කල පරිදිම මොහොම්මද් අලි ජින්නාගේ එකම සිහිනය වූයේ මුස්ලිම් සියලුම දෙනා එක්සත්භාවයෙන් යුතුව කටයුතු කිරීමට ය.

තම පාලන කාලය ඉතාමත් සීමිත වුවද එම සීමිත කාලය තුළ වඩාත් ඵලදායී සහ ශක්තිමත් විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට මොහොම්මද් අලි ජින්නා ට හැකිවිය. අදටත් පාකිස්තානය ඔහුව මහා නායකයා (quaid-i-Azam -great leader) යනුවෙන් හඳුන්වන්නේ එම නිසාය.



*(ජින්නා, මහත්මා ගාන්ධි සමඟ)*

## ගත හැකි ආදර්ශ

පාකිස්තානයේ පියා ලෙස විරුදාවලිය ලත් මොහොම්මද් අලි ජින්නා ඉතා ආදර්ශමත් ගුණාංග රැසකින් සමන්විත වූ ලෝක නායකයෙකු ලෙස හඳුනා ගත හැකිය. විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයේ යටත්විජිතයක් වූ මහා භාරතයේ නිදහස් සටනේ පුරෝගාමියෙකු වූ මහත්මා ගාන්ධිතුමාගේ සමකාලීනයෙකු ලෙස ඔහුව සරලව හදුනාගත හැක. බ්‍රිතාන්‍යය යටත්විජිතයක් ලෙස 1858 සිට පැවති මහා භාරතය තුල හින්දු ජනවර්ගය, සික් ජනවර්ගය හා මුස්ලිම් ජනවර්ගය වැනි ජනවර්ග සමූහයක් ජීවත් වූ බව සියල්ල දන්නා කරුණකි. මහා භාරතය තුල මුස්ලිම් සුළුතරයට හින්දු බහුතරය අතින් සිදුවූ අසාධාරණකම් වලට එරෙහිව නැගී සිටි දේශපාලඥයෙක් වූ ඔහු, මුස්ලිම් සුළුතරයට වෙන්වූ "වෙනම රාජ්‍යයක්" බිහි කර ගැනීමේ සටනේද පුරෝගාමියෙකු ලෙස කටයුතු කල නායකයෙකු ලෙස විස්තර කල හැකිය.

මිනිසෙකු පරිපූර්ණ වන්නේ ඔහු ලබා ගත් අධ්‍යාපනය, අත්දැකීම් ආශ්‍රයෙන් පරිණත වූ දැනුම් සම්භාරයක ප්‍රතිඵලයක් ලෙසය. ඇතැම් විචාරකයන්ට අනුව ළදරු වියේ අලි ජින්නා තරමක මුරන්ඩු මෙන්ම නොහික්මුණු දරුවෙකු විය. එහෙත් ඔහුගේ ළමා අවධියෙන් උකහා ගත හැකි ආදර්ශ කිහිපයක් පවතී. කෙතරම් අකීකරු වුවද ඔහු අධ්‍යාපනයට දක්ෂ ශිෂ්‍යයෙකු විය. ඔහු උනන්දුවෙන් අධ්‍යාපනය ලද බව කියවේ. විශේෂයෙන්ම අලි ජින්නාව ක්‍රිස්තියානි මිෂනාරි සමිතියේ උසස් පාසලට ඇතුලත් කල පසුව ඔහු ඉතා උද්‍යෝගිමත්ව ඔහුගේ උසස් අධ්‍යාපන කටයුතු වල නියැලුනු බවද සඳහන් කළ යුතුය.

කුඩා අලිජින්නාගේ චරිතයෙන් ගතහැකි තවත් ආදර්ශයක් වන්නේ ඔහු තමාගේ දක්ෂතාවයන් හඳුනා ගත්තෙකු වීමයි. ජින්නාගේ පියාට අවශ්‍ය වූයේ ඔහුව සිය ව්‍යාපාර කටයුතු වලට සම්බන්ධ කර ගැනීමට වුවත් ගණිතයට ඔහු දැක්වූ උදාසීන බව හේතුවෙන් ඔහු ව්‍යාපාර කටයුතු වලට සම්බන්ධ නොවිය. එහෙත් ජින්නා තුල නීතිය හැදෑරීමට තිබූ ආශාව ඔහු කිසි විටෙකත් අත් හරින්නේ නැත . වැඩිදුර අධ්‍යාපනයට එංගලන්තය බලා පිටත් වන ඔහු නීතිය හදාරා අවසානයේ වාග් චාතුර්‍යයෙන් හා සුපිලිපන්නතාවයෙන් පරිපූර්ණ නීතිඥයෙකු බවට පත් වේ. තරුණ ජින්නා දේශපාලනයට අවතීර්ණ වීමත්, මුස්ලිම්වරුන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් වැදීමත් මෙන්ම ඉන්දීය නිදහස් අරගලයේ සුප්‍රකට, කැපී පෙනෙන නායකයෙකු බවට පත් වීමත් සිදු වන්නේ කුඩා කල ජින්නා සිය දක්ෂතාවයන් හඳුනා ගැනීම හා ඒ ඔස්සේ නීතිය හැදෑරීමට තීරණය කිරීමත් නිසා ය.

තමා බෙහෙවින් ගරු කරන පුද්ගලයෙකු ඇසුරින් තමන්ගේ ජීවිතය හැඩ ගස්වා ගැනීම තරුණ අලි ජින්නා අනුගමනය කල පිළිවෙතකි. ප්‍රධාන වශයෙන් ඔහු බ්‍රිතාන්‍යයේ සිට නීතිය හදාරන සමයෙහි පටන් ඔහු දැඩි ලෙස ගරු කල දේශපාලඥයෙකු ලෙස දඩාබායි නවරෝජිව සැලකිය හැකිය. මෙලෙස තම දේශපාලන ජීවිතයට පන්නරය ලබා ගැනීමට තමාට වඩා අද්දැකීම් හා පළපුරුද්ද සහිත පුද්ගලයන්ව ආදර්ශ කොට සැලකීමද ඔහුගේ නිහතමානීත්වය පිළිබිඹු කරන තවත් ගුණාංගයකි.

නීතිඥයෙකු ලෙස ඔහු සතුවූ චතුර කථිකත්වය මනාව විදහා පාන අවස්ථාවක් වූයේ "කොකේස් නඩුව " ය. යථෝක්ත ඡේදයක ද සඳහන් කළ පරිදී ඔහු ප්‍රසිද්ධ නීතිවේදියෙකු වන ශ්‍රීමත් ෆරෝශා මේතා වෙනුවෙන් මෙම නඩුව හසුරුවන්නට විය. මේ නිසාම මොහු මහත් ප්‍රසිද්ධියක් ඉසිලීය. කෙසේ වුවද ජින්නා මෙම නඩුව පරාජයට පත් වූ අතර නඩුවේදී ඉදිරිපත් කළ නීති තර්ක මහත් සේ කතාබහට ලක් වන්නට විය ය. "අසාර්ථකත්වය යනු මා නොහඳුනනා වචනයකි." අලි ජින්නාගේ දේශපාලන දිවියේ සාර්ථකත්වය විදහා දැක්වීමට ඉහත කියමන සාක්ෂි දරනු ඇත. අසාධාරණයට ලක්වී සිටි මුස්ලිම් සුළුතරය උදෙසා සිය දේශපාලන දිවිය කැප කළ ඔහු, මහත්මා ගාන්ධිතුමන්ගේ ප්‍රතිපත්ති වලට තරමක් වෙනස් ප්‍රතිපත්ති හරහා බ්‍රිතාන්‍යයන් ඉන්දියාවෙන් ඉවත් කිරීමට

උත්සාහ කළේය. ගාන්ධිතුමන් ඇතුළු කොන්ග්‍රසයේ අති බහුතරය පළමු ලෝක යුධ සමයේදී බ්‍රිතාන්‍යයට පක්ෂපාතීත්වය නොදැක්වීමට තීරණය කළද, අලි ජින්නාගේ තීරණය වූයේ බ්‍රිතාන්‍යයන් සමඟ මිත්‍රශීලී ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාම සහ එමඟින් ඉන්දියාවට නිදහස ලබා දීමට ඔවුන් ලවා පොරොන්දු කරවා ගැනීමයි.

ඇතැම් විචාරකයන්ට අනුව මුස්ලිම්වරුන්ට වෙනම රාජ්‍යයක් ඉල්ලා කළ අලිජින්නාගේ යෝජනාවට බ්‍රිතාන්‍ය පාලකයන් සාධරණීය පිළිතුරක් ලබා දීමට මෙම මිත්‍රශීලී ප්‍රතිපත්තිය හේතු විය. ජින්නාගේ පාකිස්තානය පිළිබඳ සිහිනය පදනම් වූයේ සමාජ සාධාරණත්වය, සහෝදරත්වය සහ සමානාත්මතාවය යන මූලධර්ම මත ය. ඔහුගේ රාජ්‍ය පාලනය තුළ සමගිය සහ විනය යන ද්විත්වය සිය ආදර්ශ පාඨය කර ගැනීමට ඔහු අමතක නොකළේය. සැබැවින්ම මොහොම්මද් අලි ජින්නාගේ පාලන කාලය ඉතා කෙටි එකක් වුවද ඔහු පාකිස්තානුවන්ගේ හදවත් පුරා නොමැකෙන නාමයක් සනිටුහන් කිරීමට සමත් වූයේ ඔහුගේ පාලනය යටතේ පාකිස්තානුවන් අත්කරගත් ස්වෛරීත්වය හා නිදහස නිසාමය. මේ අනුව පැහැදිලි වන්නේ මොහොම්මද් අලි ජින්නා යනු අසාධාරණය හමුවේ සුළු ජාතීන්ගේ කඩවුණු අයිතිවාසිකම් තහවුරු කිරීම උදෙසා පෙනීසිටි ආදර්ශවත් නායකයෙකු බවයි.

## සාරාංශය

මුස්ලිම්වරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ඔවුන්ගේ යහපැවැත්ම තහවුරු කිරීම උදෙසා පාකිස්තානය නමින් වෙනම ස්වාධීන රාජ්‍යයක් නිර්මාණය කොට එම රාජ්‍යය ආර්ථික, දේශපාලන, සමාජීය වශයෙන් ස්ථාවරත්වයට පත් කිරීමට සමත් වූ අසහාය නායකයා මොහොම්මද් අලි ජින්නාය. ජනතාව වෙනුවෙන් නොපිරිහෙලා තම යුතුකම් ඉටු කරමින් සාර්ථක රාජ්‍ය පාලනයක් ගෙනගිය හෙතෙම පාකිස්තානුවන්ගේ ජාතියේ පියා ලෙස විරුදාවලි ලැබීය. රටට අවශ්‍යයම මොහොතේ සුදුසුම විකල්ප තෝරා දෙමින් නිවැරදි මාවතක් දිගේ රාජ්‍යය මෙහෙයවීම තුල මෙතුමාගේ දේශපාලන කෘතහස්තභාවය මැනවින් ප්‍රකට කෙරේ. ඔහුගේ දේශපාලන ජීවිතය ඉතා කෙටි එකක් වුවද ඔහු විසින්

පාකිස්තානුවන්ගේ ජීවිත සුඛිත මුදිත කිරීම උදෙසා සිදු කළ කාර්යභාරය තව වසර ගණනාවක්ම ජනතාවගේ හදවත් තුළ ජීවමානව පවතිනු ඇත.

## <u>මූලාශ්‍ර නාමාවලිය</u>

nazariapak.info. (n.d.). Nazaria-i-Pakistan Trust. [online] Available at: http://nazariapak.info/Quaid-e-Azam/Forign-policy.php [Accessed 7 Apr. 2020].

Anon, (n.d.). Foreign Policy – Ministry of Foreign Affairs. [online] Available at: http://mofa.gov.pk/foreign-policy-2/ [Accessed 7 Apr. 2020].

Wikipedia.org. (2013). Foreign relations of Pakistan - Wikipedia. [online] Available at: https://en.m.wikipedia.org/wiki/Foreign_relations_of_Pakistan [Accessed 20 Sep. 2019].

www.google.lk. (n.d.). Redirect Notice. [online] Available at: https://www.google.lk/url?sa=t&source=web&rct=j&url=https://www.britannica.com/biography/Mohammed-Ali [Accessed 7 Apr. 2020].

# බෙනාසීර් භූතෝ



**කණ්ඩායම් සාමාජිකයින් :**

- නිසලි එදිරිසිංහ
- දිලිනි උදලාගම
- හිරුණි ජයසිංහ
- මදාරා ජයලත්
- කාවින්ද්‍යා දිනාලි

එදා මුස්ලිම් සමාජ ක්‍රමය **බෙ**හෙවින් සීමා සහිත වුවත්,

නොබියව තම මව්බිමේ අ**නා**ගතය උදෙසා කැප වෙමින්,

අහිංසක ජනතාව වෙත අ**සී**මිත ස්නේහයෙන් යුතුව,

පියාගේ පාරේ යමින් නි**ර්**භීත සිංහ ධේනුවක් ලෙසට,

තම යුතුකම් ඉටු කරමින් **භූ**මියට ණය නැති දියණියක් විලස,

ජීවිතය පූජා කළ ඇය භු**තෝ** පවුලේ ගිනි සිළුව විය.

## හැඳින්වීම

කාන්තාවකට ඇති බලය, නිදහස හා අයිතිවාසිකම් සීමාවූ සංස්කෘතියන් ඇති ඉස්ලාම් අන්තවාදී රාජ්‍යයන්හි කාන්තා පාර්ශ්වය මුහුණ දෙන අභියෝග දුටු සැණින් අපගේ මතකයට නැගෙන්නේ කෙතරම් බාධක කම්කටොළු පැමිණියද තීක්ෂණ බුද්ධියකින් යුතුව පාකිස්තානය පමණක් නොව මුළු මහත් මුස්ලිම් සමාජය ම නව විප්ලවීය මාවතකට යොමු කරමින් ස්ත්‍රී සමාජයටම මහගු ආදර්ශයක් ලබා දුන් ඒ ප්‍රබල දේශපාලන කාන්තා චරිතයයි. 'තොටිල්ල පදවන අත ලොව පාලනය කරයි'යන්න සනාථ කිරීමට සමත් වූ ඇය අළුමතින් නැගුණු ෆීනික්ස් පක්ෂියෙක් මෙන් තම පියාගේ ඝාතනයේ වේදනාව තුළින් නැගී සිටිමින් එක් වරක් නොව දෙවරක් ම පාකිස්තානයේ ඇගමැතිනිය වීමට වරම් ලබා ගත්තා ය. දශක තුනක් පුරාවට පාකිස්තානයේ දේශපාලන කුණාටුවට අප්‍රතිහත ධෛර්යකින් මුහුණ දුන් ඇය එරටට පමණක් නොව මුළු මහත් ලෝකයටම පෙරළිකාර චරිතයක් බවට පත් වීමට සමත් විය. අධිෂ්ඨානශීලි දෙනෙතකට හා නේත්‍රාකර්ශනීය සිනාවකට උරුමකම් කියූ ඕ තොමෝ බෙනාසීර් භූතෝ (Benazir Bhutto)නම් වූ, දකුණු ආසියාවේ ගිනි සිලුව විය.

සිව් දෙනෙකුගෙන් යුත් පවුලේ වැඩිමලා ලෙස ඇය 1953 දී පාකිස්තානයේ කරච්චි නුවරදී (Karachi in Pakistan) මෙලොව එළිය දුටුවා ය. දියණියන් සමීපතම පියාට යන්න සනාථ කරමින් ඇය තම පියාගේ අඩි පාරේ යමින් ඔහුගේ ගමන් මගට නැවතීමේ තිත වෙනුවට කොමාව එක් කළාය. ඉස්ලාමීය සමාජය කෙතරම් සීමා මායිම් වලින් ඇයව බැඳ දැමීමට උත්සහ කළ ද ඒවා ට යටත් නොවී ඇයගේ රුචි අරුචිකම් වලට ඉඩ දෙමින් නිදහස් කිරිල්ලියක් විලස හැදී වැඩුණා ය. ඉංග්‍රීසි බසට මුල් තැන දුන් ඇය ජාත්‍යන්තර මට්ටමින් විශිෂ්ට ගණයේ විශ්වවිද්‍යාල වන හාවර්ඩ් සහ ඔක්ස්ෆර්ඩ් (Harvard and Oxford Unversities) යන ද්විත්වයෙන්ම තම අධ්‍යාපන කටයුතු සිදු කිරීමට තරම් දක්ෂ යෞවනියක් විය. නැවත පෙරළා මව්බිමට පැමිණීමෙන් අනතුරව තම දෛවෝපගත චාරිකාව ආරම්භ කළ අතර බොහෝ විටකදී ඇගේ දිවියට පැමිණියේ වසන්තයන් නොව සීතලෙන් සීත වූ සීත සමයන්ය. චණ්ඩ

මාරුතයන් හා කුණාටු බලවේගවලින් ඇයගේ ගමන පිරී තිබුණි. අනෙකුත් කාන්තාවන් මෙන් ඇයත් සාම්ප්‍රදායික ලෙස සිටිමින් වෙනස් සිතුවිලිවලින් පෝෂණය නොවුණා නම් කුඩා ඉලන්දාරියෙකුගේ වෙඩි පහරින් තම ජීවිත කතාවේ සමාප්තිය සනිටුහන් කිරීමට ඉඩ නොදෙන්නට තිබුණි. එහෙත් එය අවසානයම විය. ජාතියම අඳුරේ ගිල්වමින් ගිනි සිළුව සදාකාලයටම නිවී ගියාය. එහෙත් මිනිසුන්ගේ සිත් තුළින් අදටත් ඇගේ මතකයන් නොනැසී පවතී. මන්ද ඒ ගිනි සිළුවේ ජීව ශක්තිය මකා දමන්නට කිසිවෙකුත් සමත් නොවුණු බැවිණි. එවන් අමරණීය ස්ත්‍රී පෞරෂයක ළමා කාලය, අධ්‍යාපනය,දේශපාලන ගමන් මඟ මෙන්ම එතුමියගෙන් විවිධ ක්ෂේත්‍රවලට සිදු වූ සේවාව, ලෝකය හා සම්බන්ධ වීමට අනුගමනය කළ ප්‍රතිපත්තීන් හා මෙවන් උදාර චරිතයකින් ගත හැකි ආදර්ශ ආදී නොයෙක් මානයන් ඔස්සේ ඇය පිළිබඳව කළ ගවේෂණයක ප්‍රතිඵලයකි මෙලෙස විවරණය වන්නේ.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

**ළමා කාලය**

බෙනාසීර් භූතෝ (Benazir Bhutto) 1953 ජූනි මස 21 වන දින පාකිස්තානයේ කරච්චි නුවර දි (Karachi) උපත ලැබීය. ඇයගේ පියා සුල්ෆිකර් අලි භූතෝ (Zulfikar Ali Bhutto) වූ අතර මව බේගම් නුස්රත් ඉස්පහානි (Begum Nusrath Ispahani) විය. බෙනාසීර් ට අමතරව මුර්ටාසා (Murtaza), සනම් (Sanam), ෂනවාස් (shanavaz) නමින් පුතුන් දෙදෙනෙකු සහ දියණියක් මේ දෙපළට සිටි අතර ඔවුන් බෙනාසීර්ට වඩා බාල විය.

බෙනාසීර්ගේ පියාණන් වු සුල්ෆිකර් අලි භූතෝ ෂියා මුස්ලිම්වරයෙකු වූ අතර ඔහු ශ්‍රීමත් ෂා නවාස් භූතෝ (Sir Shah Nawaz Bhutto) ගේ සහ කුරුෂිඩ් බේගම් (Khursheed Begum) ගේ තෙවැනි දරුවා විය. තම වැඩිදුර අධ්‍යාපනය හැදැරීම

සඳහා බර්ක්ලි හි කැලිෆෝනියා විශ්ව විද්‍යාලයට (University of California, Berkeley) සහ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයට ඇතුළත් වූ අතර සිය ඉගෙනුම් කටයුතු නිම කිරීමෙන් අනතුරුව ලොව පිළිගත් වෘත්තීය මණ්ඩලයක් වූ ලින්කන් තානායමේ (Lincoln Inn ) අධි නීතිඥයෙකු (Barrister) ලෙස පුහුණුව ලබා පාකිස්තානයට නැවත පැමිණියේ ය. ඉන් අනතුරුව ජනාධිපති ඉස්කන්දර් මිර්සා (Iskandar Mirza) ගේ කැබිනට් මණ්ඩලයේ වාණිජ අමාත්‍යවරයා ලෙස වැඩ බාර ගත්තේ ය. මෙය ඔහුගේ දේශපාලන ගමන් මගේ මුල්ම අත්පොත් තැබීම විය. එක් එක් පාලන තන්ත්‍රය යටතේ නොයෙක් අමාත්‍යධූර වලින් පිදුම් ලබමින් අවසානය වුනේ 1963 දී ආයුබ් ඛාන් (Ayub Khan) ගේ පාලන සමයේ විදේශ අමාත්‍ය ධූරයෙන් පිදුම් ලැබීමෙනි. පසු කලෙක ඇති වූ මතභේද මත ඔහු විදේශ අමාත්‍ය ධූරයෙන් ඉල්ලා අස්වූ අතර ආයුබ් ට එරෙහිව රැල්ලක් ඇති කරමින් සුල්ෆිකර් දේශපාලන දේශන පැවැත්වීම සඳහා පාකිස්තානය පුරා සංචාරය කළේය. ඔහු ගේ දක්ෂ කථිකත්වය හමුවේ ඒවා සවන් දීමට විශාල ජනකායක් රැස් වූහ. 1966 ඔක්තෝම්බර් මාසයේ දී මොහු සිය නව පක්ෂයේ විශ්වාසයන් 'ඉස්ලාම් දහම අපගේ විශ්වාසයයි, ප්‍රජාතන්ත්‍රවාදය අපගේ ප්‍රතිපත්තියයි, සමාජවාදය ආර්ථික දර්ශනයයි, සියලු බලය ජනතාවටයි' යනුවෙන් පැහැදිලි කළේ ය. ඒ අනුව 1967 නොවැම්බර් 30 වන දින පාකිස්තාන මහජන පක්ෂය (Pakistan Peoples Party) ආරම්භ කළ අතර එය තම දියණියගේ ජීවිතය පවා වෙනස් මාවතකට හැරවූ ශක්තිමත් කඳවුරක් විය. අනතුරුව ඔහු 1971 සිට 1973 දක්වා පාකිස්තානායේ 4 වන ජනාධිපතිවරයා වශයෙන් ද, 1973 සිට 1977 දක්වා 9 වන ඇගමැතිවරයා ලෙසද, පත් විය. එහෙත් 1977 වසරේ අගභාගයේ හමුදාව විසින් බලය අල්ලාගත් අතර සුල්ෆිකර් සිරගත කරන ලදී. ඉදින් වසර 2කට පසුව එනම් 1979 දී ජෙනරාල් සියා උල් හක් (Zia Ul-Haque) ගේ හමුදා රජය විසින් මොහුව එල්ලා මරණ ලදී.

බෙනාසීර්ගේ මව වූ බේගම් නුස්රත් ඉස්පහානි (Begum Nusrath Ispahani) 1929 දී ඉරානයේ ඉස්ෆහන් (Isphan) හිදී ධනවත් පවුලකට දාව උපත ලැබීය.

නුස්රත් හට සුල්ෆිකර් කරච්චි හිදී මුණ ගැසුණු අතර ඇය 1951 දී ඔහුගේ දෙවන බිරිඳ ලෙස විවාහ විය. ජනාධිපති ආර්යාවක් ලෙසත් අගමැති භාර්යාවක් ලෙසත් දේශපාලන කටයුතුවලට යම් ආකාරයකට සම්බන්ධ වුවද නිල වශයෙන් සම්බන්ධ වීමක් දක්නට ලැබුණේ ස්වාමියා මිය ගිය පසු ඔහු නායකත්වය දැරූ පාකිස්තාන මහජන පක්ෂයේ නායකයා බවට පත් වීමෙන් පසුවය. තම ස්වාමිපුරුෂයා ගෙන ගිය යුද නීතියට එරෙහි අරගලය නොකඩවා ගෙන ගියා ය. 1977 දී බෙනාසීර්ගේ ආගමනයත් සමග දෙදෙනාම එක් ව හමුදා පාලනයට එරෙහිව සටන් කල අතර ඇගේ සෙවණැල්ල බෙනාසීර්ගේ ගමනට ආශිර්වාදයක් විය. ඇගේ දියණිය බෙනාසීර්ගේ පාලන කාලය තුළ ඇය නොයෙක් තනතුරු හෙබ වූවා ය. 1990 ගණන්වලදී පවුල් ආරවුලක් අතරතුර නුස්රත් ඇගේ පුත් මුර්ටාසාට පක්ෂ වූ විට ඇය සහ බෙනාසීර් වෙන්ව ගිය නමුත් පසුව මුර්ටාසාගේ ඝාතනයෙන් පසු ඔවුන් සමගි විය. නුස්රත් ඇගේ දියණිය සමග එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි හි ජීවත්වන අතරතුර හෘදයබාධයක් වැළදී 2011 දී මරණයට පත් විය.



*(සුල්ෆිකර් අලි භුතෝ සහ බේගම් නුස්රත් ඉස්පහානි යුවළ)*

**අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම**

කුඩා කාලයේ සිට බෙනාසීර් උර්දු (Urdu) සහ සින්දි (Sindhi) බස අවම වශයෙන් භාවිත කළ අතර ඉංග්‍රීසි බසට වැඩි අවධානයක් ඇය ලබා දුන්නාය. ඒ හේතුවෙන් ඇය ඉංග්‍රීසි මූලික අධ්‍යාපනයක් ලබා ගත්තා ය. පළමුව කරච්චි හි ජෙනිංග්ස් ආර්යාවගේ පෙර පාසලටත් (Lady Jennings' Nursery School )

ඉන් අනතුරුව මුරේ (Murre) හි පිහිටි නේවාසික පාසලක් වූ ජේසු හා මේරි කන්‍යාරාමයට (Convent of Jesus and Mary) ඇයව යවන ලදි. 1968 දී හුතෝ සාමාන්‍ය පෙළ ඉතා විශිෂ්ඨ අන්දමින් සමත් විය. ඇගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා 1969 දී ඇමෙරිකා එක්සත් ජනපදයේ හාර්වඩ් විශ්වවිද්‍යාලයේ (Harvard University) රැඩික්ලිෆ් විද්‍යාලයට (Radcliffe College) ඇතුලත් විය. එහි සිටින අතරතුර 1972 වසරේදී බෙනාසීර් සිය පියා සමඟ සිම්ලා (Simla) හි පැවති ඉන්දියානු-පාකිස්තාන සමුළුවට සහභාගි වූ අතර එහිදී ඉන්දීය අගමැති ඉන්දිරා ගාන්ධිව හඳුනාගැනීමට අවස්ථාව  හිමි විය.

1973 දී පළමු උපාධියේ අවසානයත් සමඟ ඒ වර්ෂයේදීම සරත් සෘතුවේ දී ඇගේ දෙවන උපාධිය සඳහා එක්සත් රාජධානියේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයට (University of Oxford ) ඇතුලත් විය. ඇය තෝරා ගනු ලැබුවේ දර්ශනය, දේශපාලන විද්‍යාව සහ ආර්ථික විද්‍යාව යන විෂයන් වූ අතර උපාධිය උදෙසා ඇය දෙවන වසරේ සාමාර්ථයක් (Second-Class Degree) ලබා ගැනීමට සමත් විය. එහි සිටින කාලය තුළ දී එනම් 1974 දී ඉස්ලාමීය සහයෝගිතා සංවිධානයේ සමුළුවට (Organisation of Islamic Cooperation's summit) තම පියා සමඟ ලාහෝර් (Lahore) බලා යෑමට ඇයට හැකි විය. එහිදී ලිබියාවේ මුවම්මර් ගඩාෆි (Muammar Gaddafi), ඊජිප්තුවේ අන්වර් සදාත් (Anwar Sadat), සිරියාවේ හෆීස් අල් අසාද් (Hafez al-Assad), සෞදි අරාබියේ ෆයිසාල් (Faisal) සහ ජොර්දානයේ හුසේන් (Hussein) ඇතුළු ජ්‍යෙෂ්ඨ මුස්ලිම් නායකයින් කිහිපදෙනෙකු ඇයට මුණ ගැසීමට අවස්ථාව හිමි විය.

ඉන් අනතුරුව තම පියාගේ බලවත් ඉල්ලීම මත ඇය ජාත්‍යන්තර නීතිය (International law) සහ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා (diplomacy) පිළිබඳ පශ්චාත් උපාධිය හැදෑරීමට තව වසරක කාලයක් ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ ශාන්ත කැතරින් විද්‍යාලයට (St. Catherine's College) සම්බන්ධ විය. ඒ අතරතුර කාලයේ එනම් 1977 දී ඔක්ස්ෆර්ඩ් සංගමයේ විවාද කණ්ඩායමේ (Oxford Union Debating Society)  නායිකාව වශයෙන් ද පත් වීමට සමත් විය. එම තනතුරුට

පත් වූ පළමු ආසියානු කාන්තාව වීමට ඇය වරම් ලබා ගත්තාය. තම අධ්‍යාපන කටයුතු නිම කිරීමෙන් අනතුරුව 1977 දී ඇය නැවත පාකිස්තානයට පැමිණියාය. එහිදී ඇගේ පියා වන සුල්ෆිකාර් අලි භූතෝ අගමැති ලෙස තේරී පත් වී සිටි නමුත් ඇය පැමිණ දින කිහිපයකට පසු හමුදාව විසින් බලය අල්ලා ගත් බැවින් ඇගේ පියා සිරගත කොට දැමුවා පමණක් නොව 1979 වසරේදී ඔහුව එල්ලා මරා දමන ලදී. මෙය කටුක වේදනාවක් වුවද ඇගේ ඓතිහාසිගත දේශපාලන ගමන ආරම්භ වීමට පදනම සකස් කරවූ අවස්ථාව විය.



*(බෙනාසීර් භූතෝ සහ ඇගේ සහෝදර සහෝදරියන්)*

## නායකත්වය කරා ගිය ගමන් මග

පියාගේ මරණයෙන් පසුව බෙනාසීර් භූතෝ හා ඇගේ මව වූ නුස්රත් පාකිස්තාන මහජන පක්ෂයේ පාලනය සියතට ගත් අතර 1981 දී ප්‍රජාතන්ත්‍රවාදය යථා තත්ත්වයට පත් කිරීමේ ව්‍යාපාරය (The movement for the Restoration of Democracy) විධිමත් ලෙස ස්ථාපිත කළ ඇය එහි නායකත්වය ගෙන කටයුතු කළා ය. එමෙන්ම, මෙම ව්‍යාපාරය විසින් පාකිස්ථානු මහජන පක්ෂය (P.P.P.) රටේ විශිෂ්ඨ දේශපාලන පක්ෂයක් ලෙස ඇගෙන ඒමට මූලික අඩිතාලමක් විය. වර්ෂ 1982 දී, ඇය හා ඇගේ මව නුස්රත් පාකිස්තාන මහජන පක්ෂයේ සම සභාපතිනියන් ලෙස පත් වූහ.

ඊළඟ වසර කිහිපය තුළ භූතෝ ද බොහෝ වාරයක් අත්අඩංගුවට ගනු ලැබූ අතර 1984 දී රට හැර යාමට අවසර ලැබීමට පෙර වසර තුනක් රඳවා ගනු ලැබීය. ඇය ලන්ඩනයේ පදිංචි වූ නමුත් ඇගේ සහෝදරයන් දෙදෙනා සමග හමුදා ආඥාදායකත්වයට එරෙහි වීම සඳහා සංවිධානයක් ආරම්භ කළා ය. 1985

දී ඇගේ සහෝදරයා මිය ගිය විට ඔහුගේ භූමදානය සඳහා ඇය නැවත පාකිස්තානයට ගිය අතර රාජ්‍ය විරෝධී රැලිවලට සහභාගී වීම නිසා ඇය නැවත අත්අඩංගුවට ගනු ලැබීය. ඇය නිදහස ලැබීමෙන් පසු නැවත ලන්ඩනයට ගිය අතර වසර අවසානයේ පාකිස්තානය තුළ යුද නීතිය ඉවත් කළ බැවින් සිය විරෝධී උද්ඝෝෂණ යළිත් ආරම්භ වූ අතර 1986 අප්‍රේල් මාසයේදී බෙනාසීර් භූතෝ නැවත පාකිස්තානයට පැමිණියේ ය. ඉන් අනතුරුව 1987 පෙබරවාරි මාසයේ 17 වන දින බෙනාසීර් භූතෝ හා අසීෆ් අලි සර්දාරී (Asif Ali Zardari) ගේ විවාහ සිදුවිය. මෙය යෝජිත විවාහයක් වූ බැවින් බොහෝ දෙනා විශ්වාස කලේ ඇය දේශපාලනයට සමු දෙනු ඇතැයි කියාය, නමුත් සිදුවූයේ ඊට හාත්පසින්ම වෙනස් දෙයකි. සර්දාරි ඇයව තව තවත් දේශපාලන වැඩකටයුතු වලට දිරිමත් කළේ ය. ඔවුන් දෙදෙනා දරුවන් තිදෙනෙක් වැඩූහ. පිළිවෙලින් ඔවුන් බිලාවල් භූතෝ සර්දාරි (Bilawal Bhutto Zardari), බක්තවාර් භූතෝ සර්දාරි (Bakhtawar Bhutto Zardari) සහ අසීෆා භූතෝ සර්දාරි (Aseefa Bhutto Zardari) විය.



*(1988 දී අගමැතිනිය ලෙස දිවුරුම් දීම)*

1988, නොවැම්බර් මාසයේ දී ෂියා (Zia) විසින් මැතිවරණයක් පැවැත්වීමට තීරණය කළ අතර ඔහු එම දිනය යොදා ගෙන තිබුනේ බෙනාසීර් භූතෝට දරු ප්‍රසූතියට දින නියම කර තිබූ දිනයේදීමයි. "භූතෝ මැතිවරණ අපේක්ෂකාවක ලෙස ඉදිරිපත් වීම වැළැක්වීම" අරමුණු කරගෙන මෙම තීරණය ඔහු විසින් ගෙන තිබුණි. නමුත් භූතෝ මෙම සියලු දුෂ්කර අභියෝගවලට අප්‍රතිහත ධෛර්යකින් යුක්තව මුහුණ දෙමින්, පාකිස්තාන මහජන පක්ෂය ජයග්‍රහණය කරා මෙහෙය වූ අතර තරඟ කළ ආසන 205න්, 93 ක් ලබා ගැනීමට ඇය සමත් විය. රටේ බලවත්ම පළාත වන පන්ජාබ් (Punjab) හි, ඉස්ලාමීය ප්‍රජාතන්ත්‍රවාදී

සන්ධානය (Islamic Democratic Alliance) දිනා ගත්තේ ද ආසන 54ක් පමණි. මේ අනුව පාකිස්තාන මහජන පක්ෂට බහුතර ආසන සංඛ්‍යාවක් දිනා ගැනීමට හැකිවීම බෙනාසීර් භූතෝගේ විශිෂ්ට නායකත්වයෙහි සාර්ථකත්වය ද ගම්‍යමාන කරයි.

ඉන්පසුව, ජනාධිපති ගුලාම් ඉෂාක් ඛාන් (Ghulab Ishak Khan) ඊළඟ ආණ්ඩුව පිහිටුවීමට භූතෝට ආරාධනා කර ඇත. තම ආණ්ඩුව ගොඩ නගාගැනීමට භූතෝ පාර්ලිමේන්තුවේ ආසන 13ක් ඇති මුත්තහිඩා කෞමි ව්‍යාපාර (Muttahida Kaumi-MQM) පක්ෂය සමග සන්ධානයක් ඇති කරගත්තේ ය. අග්‍රාමාත්‍යවරයා තෝරාපත් කරගැනීමේ දී පාකිස්තාන ජනතාව මුස්ලිම් සංස්කෘතිය පසෙකලා බෙනාසීර් භූතෝව පාකිස්තානයේ අගමැතිනිය ලෙස තෝරා පත් කරගත්තේය. තම ඡන්ද ව්‍යාපාරය සාර්ථක ලෙස ගෙන ගිය ඇය වර්ෂ 1988 දී, දෙසැම්බර් 02 වන දින පාකිස්තාන අගමැතිනිය ලෙස දිවුරුම් දෙමින් මුස්ලිම් බහුතර රටක ප්‍රථම කාන්තා අගමැතිනිය වූවා ය. එපමණක් නොව ඇයගේ මැතිවරණයෙන් පසු, පක්ෂ ක්‍රියාකාරීන් ඇයව මො(හ්)තර්මා (Mohtarma) හෙවත් "ගෞරවනීය කාන්තාව" ලෙස ද හැඳින්විය. දෙවන ධූර කාලය අතරතුර එනම්, වර්ෂ 1994 දී බෙනාසීර් භූතෝ යුරෝපා සංගමයේ (European Union) හි විදේශ නියෝජිත කමිටුවට තේරී පත් විය. ඇගේ නායකත්ව ගමන ශක්තිමත් කිරීමට එය විශිෂ්ට රුකුලක් විය.

## <u>නායකත්වයට පත්වීමෙන් පසු සිදු කළ සේවාව</u>

### පළමු වරට අග්‍රාමාත්‍යධූරය දැරීම (1988- 1990)

බෙනාසීර් බූතෝ නම් අසහාය චරිතය දේශපාලනයට පිවිසීමට මූලික අඩිතාලම සකස් වන්නේ සිය පවුලෙනි. ඇයගේ පියාගේ මරණයෙන් පසු ඔහුට සිදු වූ අසාධාරණය වෙනුවෙන් තම මව සමග කළ සටනේ ප්‍රතිඵලයක් ලෙස 1988 පැවති මැතිවරණයෙන් පාකිස්තානු මහජන පක්ෂය (Pakistan Peoples' Party) නියෝජනය කරමින් වැඩි ඡන්දයෙන් ආසන 94 ක් ලබාගෙන පාකිස්තානයේ

නව අග්‍රාමාත්‍යවරිය ලෙස දිවුරුම් දුන්නා ය. ඇය පත් වීමෙන් අනතුරුව තම මව ජ්‍යෙෂ්ට කැබිනට් නොවන ඇමතිවරියක් (Senior non Cabinet Minister) වශයෙන් ද තම මාමණ්ඩිය පාර්ලිමේන්තු මහජන ගිණුම් කාරක සභාවෙහි (Parliamentary public accounts committee) සභාපති වශයෙන්ද පත් කරනු ලැබීය. බෙනාසීර් එහි භාණ්ඩාගාර ඇමති (Treasury Minister) වශයෙන් දිවුරුම් දුන්නාය. මෙම කැබිනට් මණ්ඩලය මෙතෙක් පාකිස්තානයේ පත්කරනු ලැබූ විශාලතම කැබිනට් මණ්ඩලය ලෙසද හැඳින්වේ.

ඇය විසින් ධනේශ්වරවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. ප්‍රධාන තනතුරු තුනකට මුල්තැන දෙමින් රට පාලනයට ඇය කටයුතු කළා ය. ඒ අනුව හමුදා ප්‍රධානී, අයි.එස්.අයි. ප්‍රධානී (Inter- Services Intelligence) සහ ජනාධිපතිට ප්‍රමුඛත්වයක් හිමි විය. ඉහත තනතුරුවලින් දිගින් දිගටම එල්ල වූ විරෝධය නිසා ප්‍රථම ධූර කාලය තුළදී කිසිඳු ප්‍රධාන නීති සම්පාදනයකට ඇයට ඉඩකඩ හිමි නොවී ය. ෂියා (Zia) පාලන සමයේදී සිරගත කරනු ලැබූ දේශපාලන සිරකරුවන් කිහිප දෙනෙකු නිදහස් කිරීමට භුතෝ කටයුතු කළා ය. එමෙන්ම වෘත්තීය සමිති සහ ශිෂ්‍ය සංගම් කෙරෙහි පනවා තිබූ වාරණය, රාජ්‍ය නොවන සංවිධාන කෙරෙහි පනවා තිබූ වාරණය සහ මාධ්‍ය වාරණය ද ඉවත් කිරීමට කටයූතු කළේ ය. ඇය අග්‍රාමාත්‍ය ලෙස පත්වන විට රට විරැකියාවෙන් පෙළුණු අතර සේවා වියුක්තිය ඉහල අගයක පැවතුනි. එකල පැවති නීති විරෝධී මත්ද්‍රව්‍ය වෙළඳාම නිසා පාකිස්තානය ලොව වැඩිම හෙරොයින් අපනයනකරුවන් අතරට එක්ව සිටි අතර මහජනයා මත්ද්‍රව්‍යට ඇබ්බැහි වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබුනි. තනතුරට පත් වූ අලුත ඇය මූලික අවධානය යොදවන ලද්දේ මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට පියවර ගැනීම සඳහා ය. 1989 දී විපක්ෂය විසින් ගෙන එන ලද විශ්වාසභංගය සාර්ථක ලෙස පරාජය කිරීමට ඇගේ ආණ්ඩුවට හැකිවිය.

1990 දී සින්ද් පළාතේ පැවති වාර්ගික ගැටුම්වලින් මොහජිර්වරුන්ව ඝාතනය කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස භුතෝගෙ හවුල් ආණ්ඩුවේ මොහජිර්

(Mohajir) නියෝජිතවරු ඉන් ඉවත් විය. මේ හේතුවෙන් තව දුරටත් බහුතර බලය නොමැති වීමෙන් ආණ්ඩුව අඩපණව පැවතුණි. ගබ්සාව නීතිගත කිරීමට ඇය ගත් තීරණය පාකිස්තානයේ සිටි ස්ත්‍රීවාදීන් හෙළා දකින ලදී. සාමාන්‍ය වැඩවර්ජන හා විරැකියාව නිසා පෙළගැසුණු කම්කරු වැඩවර්ජන මැඩලීමේ අරමුණින් 1990 දී භූතෝ වැඩවර්ජන නැවැත්වීමට හා සාමය ආරක්ෂා කිරීමට හමුදාවට අණ දෙන ලදි. විචාරකයන් පෙන්වා දෙන ආකාරයට රට තුළ පැවති ගැටලු විසඳීමට නොහැකි වූ ප්‍රධානතම හේතුව වූයේ භූතෝ හා ජනාධිපති ගුලාම් ඉශාක් ඛාන් අතර තිබූ සීතළ යුද්ධයයි. ඒ අනුව 1990 දී ගුලාම් ඉශාක් ඛාන් (Ghulam Ishaq Khan) විසින් 8 වන ව්‍යවස්ථා සංශෝධනය මඟින් භූතෝ ආණ්ඩුව නිෂ්ප්‍රභා කරන ලදී. ඒත් සමඟම භූතෝ වෙත දූෂණ නඩු දැමූ අතර ඛාන් විසින් පුද්ගලික පැමිණිලිකරුවන් හට ඒ සඳහා මූල්‍ය ආධාර ලබාදුන් බව සඳහන් වේ.

### පළමු වරට විපක්ෂ නායක ධූරය දැරීම (1990- 1993)

භූතෝ සහ ඇගේ සැමියා වන සර්දාරි ට දමන ලද දූෂණ නඩු නිසා ඔවුන්ට රටින් පිටවීම තහනම් කරන ලදී. භූතෝගෙන් පසුව අග්‍රාමාත්‍ය ධූරයට පත්වූයේ නවාස් ශරීෆ් (Navaz Sharrif) ය. 1990 දී පැවති මහමැතිවරණයෙන් දැවැන්ත පරාජයක් ලැබූ භූතෝට හිමි වූයේ ආසන 44 ක් පමණක් වූ අතර ශරීෆ් ආසන 111 ක් ලබා බලයට පත් විය. ශරීෆ් ආණ්ඩුවේ විපක්ෂ නායකයා වූයේ භූතෝය. ශරීෆ් ක්‍රියාත්මක කළ සෑම ප්‍රතිපත්තියකටම විරුද්ධ වී ඒවා විවේචනය කිරීමට පෙළඹිණි.. ඇය විසින් සංවිධානය කරනු ලැබූ සැතැප්ම 10 ක දිගින් යුතු වූ ආණ්ඩු විරෝධී පෙළපාලිය රාවල්පින්ඩි (Ravalpindi) සිට ඉස්ලාමාබාද් (Islamabad) දක්වා ගමන් කළහ. ශරීෆ්ගේ ආණ්ඩුවට දිගින් දිගටම එල්ල වන විරෝධතා නිසා භූතෝව නිවාස අඩස්සියට පත්කිරීමට ශරීෆ් තීරණය කළේ ය.

මේ කාලයේදී පාකිස්තානු හමුදාව තාවකාලික හමුදා ආණ්ඩුවක් ගොඩනගන ලදී. හමුදාව විසින් 1990 ඔක්තෝම්බර් මස ඡන්දයක් ප්‍රකාශයට පත්කළහ. මෙම මැතිවරණයේදී භූතෝ සහ ශරීෆ් දෙපලටම හමුදා නීතියට යටත් වන්නට සිදුවිය.

භූතෝ කෘෂිකර්මාන්තය, රජය හා ව්‍යාපාර අතර සම්බන්ධය යනාදිය දියුණු කිරීමට ජනතාවට පොරොන්දු දුන්නාය. 1993 දී භූතෝ විසින් තමාව පාකිස්තානු මහජන පක්ෂයේ යාවජීව සභාපතිනිය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ක්‍රියාමාර්ගය මගින් පක්ෂ අභ්‍යන්තරයේ ප්‍රජාතන්ත්‍රවාදයට කැළැලක් එක්වූ බවට සමහරුන් ගේ අදහසයි.

**දෙවන වරට අග්‍රාමාත්‍යධූරය දැරීම (1993- 1996)**

1993 මහමැතිවරණයෙන් පාකිස්තානු මහජන පක්ෂය ආසන 89 ක් එනම් ඡන්ද බහුතරයක් ලබාගත් අතර ශරීෆ්ට ලබාගත හැකිවූයේ ආසන 73ක් පමණි. ඒ අනුව භූතෝ මෙම මැතිවරණයෙන් ජයග්‍රහණය කිරීමට සමත්විය. මෙවර ඇයගේ ආණ්ඩුවට හිමිවූයේ දුර්වල වූ පාර්ලිමේන්තු වරමකි. ඒ අනුව 1993 ඔක්තෝම්බර් 19 දින භූතෝ දෙවනවරටත් දිවුරුම් දී අග්‍රාමාත්‍ය ධූරයට පත් විය.

තම මවගේ සභාපතිත්වය අහෝසි කරමින් පක්ෂයේ තනි සභාපතීත්වය ඇය වෙත ලබාගැනීමට කටයුතු කළා ය. ඉන්පසුව මව සහ දියණිය අතර කලින් පැවති සම්බන්ධතාවය පලුදුව ගොස් ප්‍රසිද්ධියේ එකිනෙකා විවේචනය කිරීමට මොවුන් දෙදෙනා පෙළඹුනි. එහෙත් තම මව හා සැමියාට කැබිනට් මණ්ඩලයේ ඇමති ධූර ලබා දීමටත් මින්පෙර ක්‍රියාත්මක කරනු ලැබූ මතයන් බැහැරකරමින් නව ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමටත් ඇය උත්සුක වූවාය.


මෙම කාලසීමාවේදී රට තුළ ජාතිවාදී, වර්ගවාදී ප්‍රචන්ඩත්වයන් බහුලව දක්නට ලැබුණි. විපක්ෂ නායිකාව වශයෙන් සිටි සමයේ ශරීෆ් ගේ අදහස් විවේචනය කලත් ඊට සමාන ආර්ථික ප්‍රතිපත්තියක් අනුගමනය කළා ය. ඇ තුළ තිබුනා වූ හිතුවක්කාර හා ඒකාධිපතිවාදි ක්‍රියාමාර්ග නිසා දේශපාලඥයින් ඇයව "පාකිස්තානයේ යකඩ ගැහැණිය" (Iron Lady of Pakistan) යන අන්වර්ත නාමයෙන් හඳුන්වන ලදි. කෙසේ වෙතත් ඇය ඊට ප්‍රතිචාර නොදැක්වූවා ය. පොලිස් සටන් වදින සේනාව (Police Combatant Force) හා පළාත් ආණ්ඩුවල

(Provincial governments) ප්‍රාමාණික අයිතීන් (Proprietary rights) තවදුරටත් තහවුරු කිරීමට පියවර ගන්නා ලදී.

අද වන තෙක් පාකිස්තානු අතීතයේ කාන්තා අයිතීන් සම්බන්ධව විස්මයානුකූල ප්‍රතිසංස්කරණයන් ඇතිවූයේ භූතෝගේ දෙවන දූර කාලයේදී ය. ඒ අනුව කාන්තා සංවර්ධන අමාත්‍යංශයක් (Ministry of Women's Development) ස්ථාපිත කිරීම, විශ්වවිද්‍යාලවල කාන්තා අධ්‍යයන වැඩසටහන් (Women's study programs) ආරම්භ කිරීම, කාන්තා සංවර්ධන බැංකුව (Women's Development Bank) විවෘත කිරීම, විනිශ්චයකාරවරියන් කිහිපදෙනෙකුව පත් කිරීම, ජාත්‍යන්තර තරඟ සහ ක්‍රීඩා සඳහා කාන්තාවන්ගේ සහභාගිත්වය නීතිගත කිරීමට හා ධෛර්යමත් කිරීම ආදිය ඇය විසින් සිදුකරනු ලැබූ ප්‍රතිසංස්කරණවලින් කිහිපයකි. ඇය ලෝක නායිකාවන්ගේ සභාවේ (Council of Women World Leaders) ආරම්භක සාමාජිකාවකි. භූතෝ වෘත්තියෙන් ආර්ථික විද්‍යාඥවරියෙකි. ඒ නිසාම මූල්‍ය අමාත්‍යංශය ඇය යටතේ පවත්වාගෙන යාමෙන් රටෙහි ආර්ථිකය නංවාලීමට ක්‍රම සහ විධි ඉදිරිපත් කරමින් ආර්ථික සංවර්ධනයට ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. සෝවියට් රුසියාව බිඳවැටීමත් සමග ප්‍රධාන කර්මාන්ත පෞද්ගලීකරණයට ද ජාතිවාදය පිටුදැක කාර්මීකරණයට රට ගෙනයන බවට ජනතාවට පොරොන්දු දුන්නාය. නීතිවිරෝධිව රට තුළට පැමිණෙන බංගලාදේශ සංක්‍රමණිකයින් නිසා ආර්ථික විෂමතාවයක් රට තුළ ඇතිවන බවත් ඇගේ මතය විය. පෞද්ගලීකරණය ශරීෆ්ගේ ප්‍රතිපත්තියක් වූවද ඇය එය ශික්ෂිත සාර්ව ආර්ථික ප්‍රතිපත්තියක් (Disciplined macroeconomics policy) ලෙස හැඳින්වූවාය. ඒ තුලින් රුපියල් බිලියන 42 කට වැඩි ආර්ථිකයක් ද ඇමරිකානු ඩොලර් බිලියන 20 ක පමණ විදේශ ආයෝජන ද ලබාගැනීමට හැකිවිය.

**පාකිස්තානයේ ආර්ථික වර්ධන වේගය**


1993-1996




*(මූලාශ්‍රය-2018 මහ බැංකු වාර්තාව)*

**පාකිස්තානයේ විරැකියා අනුපාතිකය**

1993-1996




*(මූලාශ්‍රය :https://ycharts.com/indicators/pakistan_unemployment_rate_Annual)*

අවුරුද්දක අධ්‍යයනයකින් පසු 8 වන උපාය ($8^{th}$ plan to overcome stagflation) ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම සිදු විය. යුද්ධ හමුදාව සමග දැඩි සම්බන්ධතා පවත්වාගෙන ගිය භුතෝ දෙවෙනි වර ඇයටම ආවේණික වූ ප්‍රවේශයකින් (Pro Bhutto approach) කටයුතු කිරීමට පෙළඹිණි. 1996 දී ඇය විසින්ම පත්කරනු ලැබූ ජනාධිපති ලෙහාරි විසින් ඇයගේ රජය නිෂ්ප්‍රභා කරන

ලදි. එයට හේතුව ලෙස ඈ වෙත දූෂණ චෝදනා එල්ල කළේ ය. කැබිනට් ඇමතිවරුන්ගේ විෂමාචාර හැසිරීම නිසා භූතෝට තම රජය බිඳවැටීම තව දුරටත් නවතාගත නොහැකි විය.

**දෙවන වරට විපක්ෂ නායක ධූරය දැරීම (1996- 1999)**

ඇය යලිත් වතාවක් 1996 දී විපක්ෂ නායක ධූරයට පත්විය. ලොස් ඇන්ජලිස් ටයිම්ස් පුවත්පත් වාර්තාවකදී වරෙක භූතෝ ප්‍රකාශකර සිටින්නේ ජාත්‍යන්තර ආර්ථික සම්බාධක පැනවීමෙන් පමණක් ඉන්දියානු න්‍යෂ්ටික අවි නිෂ්පාදනය හෙලා දැමිය නොහැකි බවත් ඊට වඩා දරුණු ක්‍රියාමාර්ගයන් ක්‍රියාත්මක කරන ලෙසටත්ය. විස්තීර්ණ න්‍යෂ්ටික අත්හදා බැලීම තහනම් කිරීමේ ගිවිසුමට (Comprehensive Nuclear Test ban treaty) අත්සන් කරන ලෙසට ඈ රජයට බලකරන ලදී.

1999 දී ප(ර්)වර්ස් මුශාරෆ් (Perves Musharuff) හදිසි හමුදා වැටලීමකින් පාකිස්තානු ජනාධිපති ධූරයට පත්විය. එම වසරේ අප්‍රේල් මස ලාහෝර් (Lahore) මහාධිකරණය විසින් භූතෝට පස් අවුරුද්දක සිර දඬුවමක් නියම කරන ලදී. මේ අවස්ථාවේදී ලන්ඩන් නුවර පදිංචිව සිටි ඇය නැවත මව් රටට නොපැමිණි අතර ඩුබායිවල තම මව හා දියණියන් රැකබලා ගනිමින් ජීවත් විය. තම සැමියාව නිදහස් කරන ලෙසට ඉල්ලමින් කිහිප විටකදී උද්ඝෝෂණ කිරීමට ඈ පෙළඹුණි. දේශපාලන උපදේශකයින් ඇගේ දේශපාලන ජීවිතයේ උන්නතිය උදෙසා තම සැමියාව අත්හරින ලෙස කොතෙකුත් කියා සිටියද ඒවා ප්‍රතික්ෂේප කළ ඇය කිසිවිටෙකත් එම අදහස් වලට එකඟ වූයේ නැත.

සැලකිය යුතු කාලයක් දේශපාලනයෙන් ඉවත්ව සිටි භූතෝ තෙවන වතාවට ද අග්‍රාමාත්‍යධූරය වෙනුවෙන් තරඟ වැදීමට තීරණය කළාය. මෙවර ඇයට ප්‍රතිවාදීන් ගෙන් විශාල වශයෙන් මරණ තර්ජන එල්ල විය. ඒවාට නොසැලී සිටි භූතෝ කිහිප වතාවක්ම විරුද්ධවාධින් විසින් එල්ල කරනු ලැබූ මරු ප්‍රහාර වලින් තම දිවි ගලවා ගැනීමට සමත් වූවාය. නමුත් අවාසනාවන්ත ලෙස 2007

දෙසැම්බර් 27 වන දින රාවල්පින්ඩි (Ravalpindi) හි ජන රැළියක් අමතා අවසානයේදී පිටව යාමට සූදානම් වන අවස්ථාවේදී බිලාල් (Bilal) නැමැති පහළොස් හැවිරිදි තරුණයෙකු විසින් ඇය වෙත එල්ල කළ වෙඩි ප්‍රහාරයත්, ඒ සමගම මරාගෙන මැරෙන බෝම්බයක් පුපුරවාගැනීමත් සමග එතන සිටි බොහෝ දෙනාගේ දිවි අහිමි වූ අතර ඇය ද ජීවිතක්ෂයට පත් වූවා ය.

## විදේශ ප්‍රතිපත්තිය

ඉස්ලාමීය සමාජයේ ප්‍රථම කාන්තා අගමැතිනිය ලෙස තම ප්‍රතිරූපය ඉහළ නංවමින් බෙනාසීර් භූතෝ විදේශ සංචාර ගණනාවකට සහභාගී වූවා ය. මෙයින් ඇය උත්සාහ කළේ පාකිස්තානය සඳහා විදේශ ආයෝජන හා ආධාර ලබා ගැනීමයි. ඇය අග්‍රාමාත්‍ය ධූරයට පත් වන විට සාමාන්‍ය පොදු අපේක්ෂාව වූයේ ඇයගේ විදේශ ප්‍රතිපත්තිය ද පෙර පැවැති මිලිටරි විදේශ ප්‍රතිපත්ති රාමුවෙන් ඉවත් වීමකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යනු ඇති බවයි. හමුදාවේ අපේක්ෂාවන් සඵල කරමින් ඇය සහිබ්සාධා යාකුබ් අලි ඛාන් (Sahibzada Yaqoob Ali Khan) විදේශ ඇමති ලෙස රඳවාගෙන සිටි නමුත් වැඩි කල් නොගොස් ඇය තන්වීර් අහමඩ් ඛාන් (Tanveer Ahamad Khan) අමාත්‍යාංශයේ ලේකම් ලෙස පත් කළා ය.

ඇගේ ප්‍රථම ධූර කාලයේදී ඇය වඩාත් අවධානය යොමු කළේ උපායමාර්ගික වැදගත්කමක් ඇති කලාපීය ගැටලු සමග කටයුතු කරන්නේ කෙසේ ද යන්න පිළිබඳවයි. එනම් ඉන්දියාව සහ ඇෆ්ගනිස්ථානය සමග සබඳතා වර්ධනය කිරීම හා කලාපීය සන්ධාන ඇති කර ගැනීම ආදිය පිළිබඳව පෙර පැවති මිලිටරි පාලන ක්‍රමයේ දැක්මට වඩා වෙනස් ආකාරයෙන් ඇයගේ දෘෂ්ටිය මෙහෙය වීමට සමත් වූවා ය. ඒ අතරම විශේෂයෙන් ලිබියාවේ ගඩාෆි (Gaddafi), අබුඩාබියේ ෂෙයික් සහීඩ් (Sheikh Zayed) සහ සෞදි රාජකීය පවුල ඇතුළු තම පියා සමග හොඳින් සබඳතා පැවැත්වූ ඉස්ලාමීය රටවල නායකයින් සමග තවදුරටත් සබඳතා වර්ධනය කර ගැනීමට ද ඇය උත්සහ කළා ය. එමෙන්ම පකිස්ථානයට නැවත පොදු රාජ්‍ය මණ්ඩල සාමාජිකත්වය හිමි වූ 1989

ක්වාලාලම්පූර් (Kuala Lampur) හි පැවැති පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට ද ඇය සහභාගී වූවා ය.

1989 ජුනි මාසයේදී ඇය එක්සත් ජනපදයට ගොස් ඇමෙරිකානු කොන්ග්‍රස් මණ්ඩලය හා හාර්වඩ් විශ්ව විද්‍යාලයේ ආරම්භක දේශනය පැවැත්වීමට ද වරම් හිමි කර ගත්තා ය. බෙනාසීර් භූතෝ හා වොෂින්ටන් නුවර අතර සමීප සබඳතා පැවැත්වූ අතර එම සබදතා ඇයට වඩාත් වාසිදායක විය. ධවල මන්දිරය, කොංග්‍රස් මණ්ඩලය ආදිය සමග මෙන්ම විදේශ ප්‍රතිපත්ති සංස්ථාපිතය තුළ සම්බන්ධතා නිසා ඇය පාකිස්තානයේ බලයට ගෙන ඒම සඳහා වොෂින්ටනයේ ආධාර උපකාර ලැබුනු බව ඇයගේ හිටපු උපදේශකයෙකු වූ හුසේන් හකානි (Hussain Haqquani) විසින් තහවුරු කර ඇත. කෙසේ වෙතත් අගමැති ලෙස භූතෝ එවකට එරට මාක්ස්-ලෙනින්වාදී ආණ්ඩුවට එරෙහිව සිවිල් යුද්ධයක යෙදී සිටි ඇෆ්ගනිස්ථානයේ ඉස්ලාමීය මුජාහිදීන් හමුදාවන්ට අයි එස් අයි (ISI) දක්වන සහයෝගයට අභියෝග කිරීමට පසුබට විය.

භූතෝ මුලදීම යුධ රහිත ගිවිසුමක් උදෙසා වූ සියාගේ (Zia) යෝජනාව ඉල්ලා අස්කර ගනිමින් අසල්වැසි ඉන්දියාව සමග සබඳතා වැඩි දියුණු කර ගැනීම උදෙසා දෙරට අතර සබඳතාවල පදනම ලෙස ඇයගේ පියාගේ ධූර කාලයේදී අත්සන් තබන ලද 1972 සිම්ලා (Simla) ගිවිසුම නැවත ප්‍රකාශයට පත් කිරීම මගින් උත්සහ ගත්තාය. එසේම දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සමුළුවෙන් අනතුරුව ඉස්ලාමාබාද් හි දින තුනක සංචාරයක් සඳහා ඇය ඉන්දීය අග්‍රාමාත්‍ය රජීව් ගාන්ධි (Rajiv Gandhi) සහ ඔහුගේ බිරිඳ සෝනියා හට (Sonia) ආරාධනා කළා ය. මාස හයකට පසු රජීව් ගාන්ධි නැවතත් ද්වීපාර්ශවික සංචාරයක් සඳහා පකිස්ථානයට පැමිණියේ ය. එහිදී ඔවුහු දෙරටේ දේශසීමාව ඔස්සේ ඇති හමුදා ශක්තිය අඩු කිරීමටත්, ඔවුන්ගේ න්‍යෂ්ටික කටයුතු ස්ථාපිත ස්ථාන වලට පහර නොදීමටත් එකඟ විය.

මෙතුමියගේ ධූර කාලයේදී සිදුවූ තවත් වැදගත් සංසිද්ධියක් ලෙස ඉන්දියාව සමග ද්විපාර්ශවික සබඳතා නැවත ස්ථාපිත කර ගැනීම වැදගත් වේ. එහිදී දෙපාර්ශවය විසින් 1988 දී න්‍යෂ්ටික අවි පිටුදැකීමේ ගිවිසුමක් අත්සන් තැබුණු අතර එමගින් න්‍යෂ්ටික අවි අඩු කිරීම හෝ සීමා කිරීම සම්බන්ධයෙන් දකුණු

ආසියානු රාජ්‍ය දෙකක් වන ඉන්දියාව හා පාකිස්තානය ද්වීපාර්ශවික එකඟතාවයන්ට පෙළඹුණි. මෙම ගිවිසුම 1988 දී කෙටුම්පත් කරන ලද අතර අගමැති බෙනාසීර් භූතෝ සහ ඇයගේ ඉන්දීය පාර්ශවකරු වන රජීව් ගාන්ධි විසින් එය 1988 දෙසැම්බර් 21 දින අත්සන් කරන ලදී. එය 1991 ජනවාරි සිට ක්‍රියාත්මක විය.



*(බෙනාසීර් භූතෝ හා රජීව් ගාන්ධි 1988 න්‍යෂ්ටික අවි පිටුදැකීමේ ගිවිසුම අත්සන් කිරීම.)*

ඉන්දියාව කෙරෙහි වඩාත් සාමකාමී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට එරෙහිව චෝදනා ලැබීමෙන් පසුව භූතෝ විශේෂයෙන් කාශ්මීර් අර්බුදය සම්බන්ධයෙන් ඔවුනට එරෙහිව දැඩි පියවරක් ගත්තා ය. ඉන්දියානු පාලනයට එරෙහිව වර්ධනය වන කාශ්මීර් විරෝධතා මධ්‍යයේ භූතෝ කාශ්මීර මුස්ලිම් ප්‍රජාවට සහයෝගය දැක්වූවා ය. එමෙන්ම 1948 දී පොරොන්දු වූ පරිදි කාශ්මීර් ජනමත විචාරණය අධීක්ෂණය කරන ලෙස ඇය එක්සත් ජාතීන්ගෙන් ඉල්ලා සිටියා ය. එහිදී පාකිස්තානය ඉන්දියාව ආරක්ෂක මණ්ඩලයේ ස්ථිර සාමාජිකයන් පස් දෙනා සහ ජපානය, ජර්මනිය ඇතුළු අනෙකුත් ප්‍රධාන බලවතුන්ගේ සහභාගීත්වය ඉල්ලා භූතෝ 51 වන එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයේදී බහුපාර්ශවීය සමුළුවක් යෝජනා කර තිබුණි.

කෙසේ නමුත් ඒ වනවිටත් සැලකිය යුතු මට්ටමේ දියුණුවක් තිබූ පාකිස්තානයේ න්‍යෂ්ටික බලය පිළිබඳව ලෝක බලවතා වූ ඇමරිකාවේ පැහැදීමක් නොවිනි. කොටින්ම පාකිස්තානය න්‍යෂ්ටික අවි හා උපකරණ නිපදවීම වැළැක්වීමට එක්සත් ජනපදයට අවශ්‍ය වූ අතර එක්සත් ජනපද ජනපති ජෝර්ජ් බුෂ්, (George Bush) භූතෝට පවසා සිටියේ පාකිස්තානය ආයුධ නිපදවීමේ අවසාන අදියර වන න්‍යෂ්ටික බෝම්බ නිපදවීමෙන් වැළකී සිටින තුරු එරටට ලබා දෙන හමුදා

ආධාර නතර කරන බවයි. කෙසේ නමුත් යුධ බලධාරීන් සෑහීමකට පත් නොවුවද මේ විරෝධතා මධ්‍යයේ 1989 ජනවාරි සිට මාර්තු දක්වා කාලය තුළ බණ්ඩනය කළ හැකි ද්‍රව්‍ය නොමැතිව න්‍යෂ්ටික අවි පිළිබඳව නිහඬ පරීක්ෂණ සඳහා ඇය අවසර දී ඇත. නමුත් 1990 දී ඇමරිකානු තානාපති රොබ්ට් ඕක්ලි (Robert Oakely) එක්සත් ජනපද චන්ද්‍රිකා මගින් ලබාගත් තොරතුරු වලට අනුව ආයුධ ශ්‍රේණියේ යුරේනියම් නිෂ්පාදනයට ඇය පලකල එකඟතාව කහූටා (Kahuta) කම්හලේදී උල්ලංඝනය වී ඇති බවට ඇයට චෝදනා එල්ල කළේ ය.

අග්‍රාමාත්‍ය භූතෝ සිය දෙවන ධූර කාලය තුළ ඇයගේ මෙම අණ කඩ කිරීම පිළිබඳව කම්හලෙන් හේතු විමසීය. ඉන්දියාව විසින් 'අග්නි මිසයිල' (Agni Missile) පද්ධතියක් ඉදි කර ඇති බවත් එමගින් පාකිස්තානයේ ප්‍රධාන නගර සියල්ලටම පහර දීමට හැකියාව ඇති බවත් එයට මුහුණ දීමට සෑහෙන ප්‍රමාණයට පාකිස්තානය ද ඒ හා සමාන දියත් කිරීමේ පද්ධතියක් ස්ථාපනය කිරීම අත්‍යාවශ්‍ය බවත් ඇයට ඒත්තු ගැන්වීය. එමෙන්ම ඔවුන් උතුරු කොරියානු රජය සමග මිසයිල තාක්ෂණය දියුණු කිරීම සඳහා ගිවිසුමක් ඇතිකර ගැනීමට තීරණය කළහ. භූතෝ පසුව ප්‍රකාශ කර සිටියේ 1993 දී උතුරු කොරියාවේ කළ සංචාරයේ දී න්‍යෂ්ටික දත්ත අඩංගු පරිගණක සංයුක්ත තැටියක් ඇය රහසිගතව රැගෙන ගිය බවයි. 1996 සැප්තැම්බර් මාසයේදී තලේබාන් සංවිධානය ඇෆ්ගනිස්තානයේ බලය ලබා ගත්තේ ය. භූතෝගේ රජය එය ඇෆ්ගනිස්ථානයේ නීත්‍යානුකූල රජය බවට පිළිගත් රටවල් තුනෙන් එකක් විය. මෙයින් පාකිස්තානය තවදුරටත් බටහිර කඳවුරෙන් ඈත් විය.

මීට අමතරව එතුමියගේ ධූර කාලයේදී විදේශයන් සමග ඇති කරගත් සම්බන්ධතා අතර,

- චීනය සමග ද්විපාර්ශවික ගිවිසුමක් යටතේ න්‍යෂ්ඨික බලාගාරයක් පිහිටුවීම.
- පකිස්ථානයේ තවත් වානේ කම්හලක් සඳහා රුසියාව සමග ගිවිසුම් ඇතිකර ගැනීම.

- පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් අතරට පකිස්ථානය නැවත ඇතුලත් කිරීම.
- පාකිස්තානයේ සාර්ක් සමුළුව සංවිධානය කිරීම.
- පහසු ණය දීමේ කොන්දේසි සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමග සාර්ථක සාකච්ඡා පැවැත්වීම.
- ඇෆ්ගනිස්තානයේ රුසියානු හමුදාව සහ සාම වැඩපිළිවෙල ඉවත් කිරීම ආදිය වේ.

## ගත හැකි ආදර්ශ

පාකිස්තානයේ ගතිකානුගතික පරිසරය අතික්‍රමණය කළ බෙනාසීර් භූතෝ වනාහි උත්කෘෂ්ට ගුණාංගයන්ගෙන් යුක්ත නවීන අදහස් කැටිකොට ගත් කාන්තාවක් විය. තම පළමු දරුවා කුස තුල දරා සිටමින් වුවද ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපනය කිරීම උදෙසා දැඩි ලෙස සටන් වැදුණු ඇය අප්‍රතිහත ධෛර්යක් සතු ශක්තිමත් මවක් වූවා පමණක් නොව පුරුෂාධිපත්‍ය රජ කළ සමාජයක ඇයගේ ආගමනය මුලු මහත් ස්ත්‍රී සමාජයටම බලාපොරොත්තුවේ සංකේතයක් ද විය. පියාගේ සෙවණෙහි ඔහුගේ අනුගාමිකාව වශයෙන් හැදී වැඩුනු ඇයට ඔහුගේ මරණය දැඩි චිත්ත පීඩාවක් ගෙන ආව ද ඒ දුක තුළින්ම නැගිටුණු ඇය ෆීනික්ස් කුරුල්ලෙක් ලෙසට තම රශ්මි කදම්භයන් මුදා හැරීමට පටන් ගත්තා ය.

කාන්තාවකගේ නායකත්වයෙන් යුත් රජයක් ඉස්ලාමීය නොවන බවත්, අග්‍රාමාත්‍යවරියකට ආචාර කිරීම හමුදා නායකයින් විසින් දිගින් දිගටම ප්‍රතික්ෂේප කරන බවත් ප්‍රකාශ කරමින් මහජනයා කලබලයට පත් කිරීමට උත්සහ කරන මවුලානාවරුන්ගේ විරෝධතා වලට නිරන්තරයෙන් ඇය මුහුණ දුන්නා ය. විරුද්ධවාදීන් ඔවුන්ගේ ශක්තිමත් හස්තය දිගු කරමින් ඇගේ ආරක්ෂාව බරපතළ අනතුරක හෙළීමට දැඩි ප්‍රයත්නයක යෙදී සිටියදී කාන්තාවක් සතු සියුමැලි බව අහිංසකත්වය පසෙක දැමූ ඇය යකඩ ගැහැණියක්

විලස ප්‍රගතිශීලී දැක්මකින් යුක්තව කිසිදු අවමානයක් ඉදිරියේ නොසැලෙමින් තමාගෙන් සමාජයට ඉටු විය යුතු කාර්යයන් නොපැකිළිව ඉටු කළා ය.

ඇය දූෂණ වංචා වලින් තොර රාජ්‍ය නායිකාවක් වුවද නඩු මරණ තර්ජන හා ත්‍රස්ත ප්‍රහාර ගණනාවකට මුහුණ දීමට සිදු වූ නමුත් ඒ කිසිවක් ඉදිරියේ නොසැලෙමින් ධෛර්යය සම්පන්නව කටයුතු කළ ශක්තිමත් කාන්තාවක් ලෙස ප්‍රකට විය. මුළු ජීවිත කාලය පුරාම ඇයගේ විරුද්ධවාදීන් සැලකුවේ ඇයව පාකිස්තානයේ දේශපාලනික හා ආගමික පරිසරයට නොගැලපෙන ලිබරල් දේශපාලකයෙකු ලෙස ය. එහෙත් සියලුම පීඩාවන් ජනතාව වෙනුවෙන් දරා ගනිමින් පරාර්ථකාමී නායිකාවක් විය. පෞද්ගලික ජීවිතයේ වේවා, දේශපාලන ජීවිතයේ වේවා අංශු මාත්‍රයකින් හෝ පරාජය පිළිනොගත් ඇය නොපසුබස්නා වීර්යයෙන් යුතුව තම අවසන් අරමුණ කරා ගමන් කිරීමට සමත් විය.

ජනතාව අතර ඇය අතිශය ජනප්‍රිය නායිකාවක් විය. මන්ද ඇය පොදු ජනතාව පිළිබඳව සැලකිලිමත් බවක් දක්වමින් ඔවුන් වෙත නොබසුබටව තම සේවාව සපයමින් පාකිස්තානු දේශපාලනය කැලඹිලි සහිත, අවුල් සහගත, දූෂිත හා සදාචාර විරෝධි බවෙන් මුදවා ගැනීමට වෙර දැරූ බලාපොරොත්තුවේ ආලෝකයක් ලෙස කටයුතු කළ බැවිනි. පාකිස්තානයේ තරුණ පරපුර තම පක්ෂයට රජයට සහ දේශපාලන ආයතනවලට සම්බන්ධකර ගැනීම, පුවත්පත් සඳහා වූ සීමාවන් ඉවත් කිරීම, ත්‍රස්තවාදින්ට ප්‍රසිද්ධියේ අභියෝග කිරීම හා තම රට දේශපාලනික හා ආර්ථික වශයෙන් යහපත් කිරීමට කැපවීම ආදිය ඇයගේ ජනප්‍රියතාවය තීව්‍ර කිරීමට සමත් විය. ගතානුගතික සමාජ රටාවක් හිමි පාකිස්තානය වැනි රටක සාරධර්ම වැඩිදියුණු කිරීම, කාන්තාවන් සඳහා නිදහස ගරුත්වය සීමා නොකිරීමත්, ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන පද්ධතියක් ඇති කිරීමත් ඇගේ අනාගත බලාපොරොත්තු අතර ප්‍රධාන ස්ථානයක් ගෙන තිබුණි. ඇයගේ කොන්දේසි විරහිත මේ සේවය වෙනුවෙන් සෑම කෙනෙකුම ඇය සමඟ ආදරයෙන් බැඳී සිටියහ.

ඇය තම පෞද්ගලික ජීවිතය සමග වෘත්තිය ජීවිතය සමබර කර ගත් ආකාරය ඇයගේ දරුවන් ගේ දීප්තිමත් හැදී වැඩීමත් සමග ගම්‍ය වේ. එලෙසම ඇය තම ස්වාමියාට මහත් සේ ආදරය කළ දයාබර බිරිඳක් විය. ඔහුට දූෂණ චෝදනා

එල්ල වූ අවස්ථාවන් හී ඇයට ඔහුගෙන් ඉවත් වන ලෙස බලපෑම් ආවද තම ජීවන සහකරු අතහැර ආත්මාර්ථකාමී ලෙස ක්‍රියා කිරීමට කිසිවිටෙකත් නොසිතුවා ය. එමෙන්ම ඇය, ජාතියේ වරප්‍රසාද නොලත් ජනතාවට හොඳ සවන්දෙන්නියක වූ අතර ඇයගේ කොන්දේසි විරහිත සේවය වෙනුවෙන් සෑම අයෙකුම ඇය සමග ඉමහත් සෙනෙහසින් බැඳුණි. එමනිසා ඇයගේ අභාවයෙන් වසර එකොළහකට පසුවත්, පාකිස්තානයේ දේශපාලන ඉතිහාසයේ ප්‍රබල චරිතයක් ලෙස ඇය තවමත් ජීවමානව සිටී.

ඇයගේ සියලු සාර්ථකත්වයන්ගේ රහස ඇය සතු නොසැලෙන පෞරුෂයයි. ඇගේ දේශපාලන ජීවිතය තුළ ඇය පෙන්වා දුන් නායකත්වය සහ මාර්ගෝපදේශකත්වය අපගේ ජීවිත වලට මහත් ආදර්ශයක් සපයයි. අප අභිමුවට පැමිණෙන විශාල මෙන්ම ළඟා කර ගැනීමට අපහසු යැයි හැගෙන ඉලක්කයන් ඉවත නොහෙලා, මගහැර නොගොස් එවා හඹා ගොස් ශක්තිමත්ව අභියෝග වලට මුහුණ දෙමින් ඒවා ජය ගැනීමට ඇගේ චරිතය අපිට මනා පිටුබලයක් ලබා දෙයි. පෞද්ගලික ජීවිතයේ වේවා, දේශපාලන ජීවිතයේ වේවා අංශු මාත්‍රයකින් හෝ පරාජය පිළිනොගත් ඇය නොපසුබස්නා වීර්යයෙන් යුතුව තම අවසන් අරමුණ කරා ගමන් කරමින් දේශයට පමණක් නොව මුළු මහත් ලෝකයටම ද ණය නැති නායකයෙක් වන්නට සමත් වූවා ය. එවැනි නායකයෙකුගේ සෑම ගුණාගයක්ම අපගේ ජීවිත දීප්තිමත් කරන අතර එම ගුණාංග අපගේ ජීවිත වලට එක් කර ගනිමින් සාර්ථක ජීවිත තරණයකට ළඟා වීමට අප නිරන්තරයෙන් උත්සහ කළ යුතුය.

## සාරාංශය

ලෝකයේ නායකයන් අතරින් ප්‍රබල චරිතයක් වූ ඇය මුළු මහත් මුස්ලිම් සමාජයේම කාන්තාවන් නව දිශානතිකයට යොමු කරමින් ශක්තිමත් යෝධ වෘක්ෂයක් බඳුව තම අතුපතර විහි දා ප්‍රචණ්ඩ දේශපාලන කුණාටු බලවේගයන්ගෙන් තම මව්බිම ආරක්ෂා කර ගැනීමට මුළු දිවියම කැප කළා ය. ලොව දිනු චරිත අතර ඉතාමත් ගෞරවනීය හා ප්‍රකට දේශපාලන චරිතයක් වූ



*(බෙනාසීර් භූතෝ, ඇගේ සැමියා සහ දරු තිදෙනා සමඟ)*

භූතෝ කුඩා කල් සිටම තම පියාගේ දේශපාලන භූමිකාව තම දර්ශනය කරගනිමින් කටයුතු කිරීමට උත්සුක වූ ධෛර්යවන්ත දේශපාලන නායිකාවකි. ලෝකයේ කැපී පෙනෙන චරිතයක් වූ අතර දේශීය ජනතාවගේ පමණක් නොව ජාත්‍යන්තරය තුළ ද සිත් දිනා ගැනීමට සමත් වූ බැවින් කෙතරම් දේශපාලන බාධා මැද වුවත් ඇයට දේශපාලන ගමන්මඟ තුළ ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමට හැකි විය. ඇය දයාබර මවක් වූ අතර සමාජ සුබසාධනය ඉලක්ක කොට දේශපාලන වේදිකාවේ හඬ නැගූ දේශපාලනඥයෙක් විය. ඇයගේ ජීවිතය තුළින් දක්ෂ නායකයෙක් චතුර කථිකයෙක් ආදරණීය බිරිඳක් සෙනෙහෙබර මවක් යන චරිත විද්‍යාමාන වේ. ඇය තුළ වූ නොසැලෙන අධිෂ්ඨානය ඇයව සාර්ථක කාන්තාවක් ලෙස ලොවක් ඉදිරියේ ඔසවා තැබීමට උපකාරී විය. ඇයගේ නිර්භීතකම වර්තමානයේදී සමස්ත ලෝවැසියන්ගේ කතා බහට ලක්වන ප්‍රධාන මාතෘකාවකි. දේශපාලන වේදිකාවේ කොතරම් දැඩි ගුණාංග තිබුණද ඇයගේ ස්වාමියාට හා තම පවුලට ගරු කරමින් දරුවන් ආදරයෙන් බලා ගනිමින් පවුලට තම යුතුකම් ඉටු කරමින් ලොවට ඉටු කළ සේවාව නිසා ඇත් රැජිනක් ලෙසට ඇය අප හදවත් තුළ සදා අමරණීයව වැජඹෙනු ඇත. එමෙන්ම 1996 දී ශ්‍රී ලංකාව ලෝක ක්‍රිකට් ලෝක කුසලාන දිනූ අවස්ථාවේදී එවකට නායකත්වය දැරූ අර්ජුන රණතුංග හට කුසලානය පිරි නමන ලද්දේ බෙනාසීර් භූතෝ විසිනි. එබැවින් ශ්‍රී ලංකා වාසීන් වශයෙන් අපට ඇය බෙහෙවින් සමීප චරිතයක් විය.

# මූලාශ්‍ර නාමාවලිය

10 Things You Didn't Know About Benazir Bhutto. (n.d.). Retrieved April 10, 2020, from https://www.usnews.com/news/world/articles/2007/12/27/10-things-you-didnt-know-about-benazir-bhutto

Javeri, S. (2017, November 30). Benazir Bhutto: The strongest woman to lead Pakistan both in life and death. Retrieved April 10, 2020, from https://herald.dawn.com/news/1153920

(PDF) Benazir Bhutto (Life and Trends in Foreign Policy). (n.d.). Retrieved April 10, 2020, from https://www.researchgate.net/publication/252628400_Benazir_Bhutto_Life_and_Trends_in_Foreign_Policy

Shafqat, S. (2019) Struggle for Party Dominance: Benazir Bhutto vs. Nawaz Sharif. *Civil-Military Relations in Pakistan*, 225–254. doi: 10.4324/9780429041884-8

Lakhani, K. (2010, July 1). Reviewing "Bhutto". Retrieved April 11, 2020, from https://foreignpolicy.com/2010/07/01/reviewing-bhutto/

Dorff, P., & Bhutto, B. (1989). Daughter of Destiny. *Foreign Affairs, 68*(3), 186. doi: 10.2307/20044093

Benazir Bhutto assassination: How Pakistan covered up killing. (2017, December 27). Retrieved April 11, 2020, from https://www.bbc.com/news/amp/world-asia-42409374

The Editors of Encyclopaedia Britannica. (2019, December 23). Benazir Bhutto. Retrieved April 11, 2020, from https://www.britannica.com/biography/Benazir-Bhutto

# ඉම්රාන් ඛාන්



**කණ්ඩායම් සාමාජිකයන් :**

- විශ්මි රොද්‍රිගෝ
- චමිදි දයාරත්න
- අයේෂා ගිම්හානි
- සජිනි පියුමා
- සුපුන් ප්‍රභාත්

## හැඳින්වීම

ඉම්රාන් අහමඩ් ඛාන් නියාසි (Imran Ahmed Khan Niazi) නම් මෙම අපූර්ව මිනිසා වර්තමාන තරුණ පරපුර කෘතඥ දේශපාලනඥයෙකු ලෙස හඳුනා ගත්තද වැඩිහිටි පරපුර ඔහුව ආමන්ත්‍රණය කරනුයේ පාකිස්තානයේ ක්‍රිකට් වීරයා ලෙසිනි. පුද්ගලයෙකු වශයෙන් ගත් කළ ඔහු සතු දක්ෂතාවන් හා ඔහු ප්‍රගුණ කරන ලද කෞෂල්‍යයන් අපමණය. තම ක්‍රීඩා දිවිය මෙන්ම තම දේශපාලන දිවියද අති සාර්ථක අන්දමින් ජයග්‍රහණය කළ ඔහු "ලොවෙන් එකෙක් එක් දෙයකට වෙයි සමත" යන කියමනද අභිබවා යමින් ලොව ප්‍රකට පුද්ගලයකු වී ඇත්තේ ඔහු ලද අපරමිත ඉවසීම, උත්සහය හා දැඩි අධිෂ්ඨානය හේතුවෙනි.

ජීවිතයේ එක් එක් අවධියෙහි තමා ඉටු කළ යුතු වගකීම් සම්භාරයන් නිවැරදිව මනා තීක්ෂණ බුද්ධියකින් යුක්තව වටහා ගත්තද ඔහුගේ කුඩා කල එතරම් සුන්දර එකක් නොවී ය. තම ජීවිතයේ එක් එක් අවධියෙහි තමාට ආවේණික වූ හා තමා විසින් සමාජයට සිදු කළ යුතු මෙහෙවර මනාව හඳුනා ගැනීමට මෙතුමා සමත් වූ නමුදු මෙතුමා තම කුඩා කාලයේ දී තරමක් ලජ්ජාශීලි අහිංසක දරුවෙකු ලෙස අධ්‍යාපන කටයුතු සිදු කළේ ය. කෙසේ වෙතත් ඔහු යෞවන වියේදී පාකිස්තානු ජාතික ක්‍රිකට් කණ්ඩායමට බැඳෙමින් තම ක්‍රීඩා කෞෂල්‍යයන් මුලු මහත් ලෝකයටම පෙන්වමින් පකිස්තාන ක්‍රිකට් කණ්ඩායම ලෝක කුසලාන ජයග්‍රහණ කරා ගෙන ගියේ ය. ලෝක ක්‍රිකට් ඉතිහාසයේ ඔහුගේ නම රන් අකුරෙන් බබළවමින් ක්‍රීඩා ලෝලීන්ගේ හදවත් තුළ මතකයන් රඳවමින් ඔහු ක්‍රිකට් දිවියෙන් සමුගත්තේ ය.

ඉන්පසු තම දේශපාලන දිවිය ඇරඹූ ඔහු විවිධ හැලහැප්පීම් හා අභියෝග වලට මුහුණදෙමින් දේශපාලනඥයකු ලෙස සමාජයට වියයුතු යුතුකම් මැනවින් අවබෝධ කර ගත් ඔහු, තමා විසින් පිහිටුවන ලද ටෙහ්රීක්-ඊ-ඉන්සාෆ් (Pakistan Tehreek - e – Insaf) නම් වූ දේශපාලන පක්ෂය ඔප්නංවමින් පාකිස්තාන දේශපාලනය තුළ ඉතා කැපීපෙනෙන ආදර්ශමත් නායකයකු වෙමින් 2018 මැතිවරණයේදී තම දේශපාලන මෙහෙවරට හිමි වූ ජනතා ප්‍රසාදය තුළින් පාකිස්තාන අගමැතිවරයා බවට පත් වුයේ ය.

ඉන්පසුවද ඔහු තම ස්වාධීන දේශපාලන දැක්මට අනුව යුක්තිගරුකව පාකිස්තානයේ දේශපාලන සැකැස්ම තරමක් වෙනස් කරමින් ශක්තිමත් පාකිස්තානයක් බිහිකිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගන්නා බව අවිවාදයෙන් යුතුව කිව හැකි ය. තම ක්‍රීඩා ජීවිතයේ මෙන්ම දේශපාලන දිවියේදී ද හිනිපෙත්තටම පැමිණි මෙම දැවැන්ත චරිතය පිළිබඳ වර්තමාන ලෝකයත් මවිතයට පත් වෙමින් බලා සිටින්නේ අන්කිසිවක් නිසා නොව ඔහු සතු අපරිමිත නායකත්ව ගුණාංග හේතුවෙනි. ඔහුගේ ආදර්ශමත් දිවිය පිළිබඳව තම දැනුම වර්ධනය කර ගැනීමට මෙහි ඇතුළත් එතුමාගේ චරිතාපදානය තුළින් හැකි වන බව නොඅනුමාන ය.

## ළමා කාලය , අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම



*(ඉම්රාන් ඛාන් ළමා වියේ දී )*

1952 වසරේ ඔක්තෝබර් මස 05 වන දින පාකිස්තානයේ පන්ජාබ් ප්‍රාන්තයේ ලාහෝර් නගරයේ උපත ලැබූ ඉම්රාන් ඛාන් පශ්තූන් (Pashtun) පවුලට අයත් අයෙක් වූයේ ය. ඔහුගේ පියා ඉක්රමුල්ලාහ් ඛාන් නියාසි (Ikramullah Khan Niazi) වන අතර ඔහු සිවිල් ඉංජිනේරුවරයෙකු වූයේ ය. ඔහුගේ මව වූයේ ශවුකාට් ඛානුම් (Shaukat Khanum) මහත්මියයි. මෙම පවුල පදිංචිව සිටියේ වයඹ දිග පන්ජාබ්හි මියැන්වාලි (Panjab Miyanwali) ප්‍රදේශයේ ය. මොහුගේ පියාගේ පවුල් පසුබිම පශ්තූන් සම්භවයට (Land-owning Pashtun) අයත් අතර ඔවුහු නියාසි ජනතාව වූහ. එමෙන්ම පාකිස්තානයේ හිටපු ක්‍රිකට් ක්‍රීඩකයන් දෙදෙනෙකු වන ජාවිඩ් බර්කි හා මජිඩ් ඛාන් පාකිස්තානයට දායාද කොට ඇති පශ්තූන් හි ජනවාර්ගික කණ්ඩායමක් වන බර්කි නැමති ජනවර්ගයට මොහුගේ

මව නැකම් කියන ලදී. ඉම්රාන් ඛාන් ඔහුගේ ළමා කාලයේ මුල් අවධියේදී ඉතාමත්ම නිහඬ චරිතයක් වුයේ ය. ඔහුට සහෝදරියන් සිව්දෙනෙකු වූ අතර පිළිවෙලින් රුබීනා ඛානුම් (Rubina Khanum), අලීමා ඛානුම් (Aleema Khanum), උස්මා ඛානුම් (Uzma Khanum) සහ රානි ඛානුම් (Rani Khanum) විය.

ඉම්රාන් ඛාන් ජීවත් වූයේ බනිගාල ප්‍රදේශයේ පිහිටි ඔහුගේ ගොවිපලේ ය. යොවුන් වියේදී ලැජ්ජශීලී පිරිමි දරුවකු වන ඉම්රාන් ඛාන් වයසින් වැඩෙත්ම ඔහුගේ සහෝදරියන් සමග අන්‍යෝන්‍ය අපේක්ෂාවෙන් යුක්තව උසස් මධ්‍යම පාන්තික තත්වයන් සහ අධ්‍යාපන අවස්ථා භුක්ති විඳින ලදී.

ඔහු ලාහෝර්හි එයිට්චිසන් විද්‍යාලයෙන් (Aitchison College), කැතඩ්‍රල් පාසලෙන් (Cathedral College) හා ක්‍රිකට් සඳහා විශේෂ වූ එංගලන්තයේ වොර්චෙස්ටර් රාජකීය ව්‍යාකරණ විද්‍යාලයෙන් (Royal Grammer School in Worcester) අධ්‍යාපනය ලැබුවේ ය.

1972 දී ඔහු දර්ශනවාදය, දේශපාලන විද්‍යාව හා ආර්ථික විද්‍යාව හැදෑරීම සඳහා ඔක්ස්ෆර්ඩ් හි කැබ්ල් විද්‍යාලයට (Oxford Cable College) ඇතුලත්ව 1975 දී උපාධිය ද ලබා ගත්තේ ය. ඔහු ඒ කාලයේදී යෞවන වියේ පසු වූ අතර පකිස්තානයේ සහ එක්සත් රාජධානියේ ක්‍රිකට් ක්‍රීඩාවෙහි යෙදුනේ ය. 1971 දී ඛාන් පකිස්තානයේ ජාතික ක්‍රිකට් කණ්ඩායම වෙනුවෙන් සිය පළමු තරඟය ක්‍රීඩා කළ නමුත් ඔක්ස්ෆර්ඩ් උපාධිය ලබා ගන්නා තෙක් ඔහුට කණ්ඩායමේ ස්ථිර ස්ථානයක් ලබා ගැනීමට නොහැකි වුයේ ය.

කවියෙකු වන මුහම්මද් ඉක්බාල් ( Muhammad Iqbal) සහ ඉරාන ලේඛක සමාජ විද්‍යාඥයෙකු වන අලි ශරිආටි (Ali Shariati) යන මහත්වරුන්ගේ ආදර්ශයන් ඉම්රාන් ඛාන් තම ජීවිතයට ළඟා කරගත්තේ ය. ඉම්රාන් ඛාන්ව සාමාන්‍යයෙන් හඳුන්වනුයේ ජාතිකවාදියෙකු හා ජනතාවාදියෙකු ලෙස ය. ඔහුගේ දේශපාලන ප්‍රකාශනයන්ට පහත සඳහන් කරුණු ඇතුලත් විය. එනම්,

- 1990 ගණන් වලදී ඔහු විසින්ම කැප කරන ලද ඉස්ලාමීය සාරධර්ම රැකගැනීම.
- ආර්ථිකය නියාමනය කිරීම සහ සුභසාධන රාජ්‍යක් නිර්මාණය කිරීම යන පොරොන්දුව සමඟ ලිබරල් ආර්ථික විද්‍යාවකට අනුව කටයුතු කිරීම.
- නිලධාරීවාදය අඩුකිරීම සහා දූෂණ විරෝධී නීති ක්‍රියාත්මක කිරීම.
- පිරිසිදු රාජ්‍යයක් සහතික කිරීම.
- ස්වාධීන අධිකරණයක් පිහිටුවීම.
- රටේ පොලිස් පද්ධතිය නැවත සකස් කිරිම.
- ප්‍රජාතන්ත්‍රවාදී පකිස්තානයක් සඳහා සටන් විරෝධී දැක්මක් ඇති කිරීම.

ඉම්රාන් ඛාන්ට සිය ක්‍රිකට් දිවිය තුළ කීප වතාවක්ම දේශපාලන තනතුරු සඳහා අවස්ථාවන් ලබා දෙන ලදී. 1987 දී එවකට ජනාධිපති මුහම්මද් සියා උල්හක් (Muhammad Ziya-Ul-Haq) පාකිස්තාන මුස්ලිම් ලීගයේ (Pakistan Muslim League) දේශපාලන තනතුරක් ඔහුට පිරිනැමූ අතර එය ඉම්රාන් ඛාන් විසින් ප්‍රතික්ෂේප කළේ ය. පකිස්තානයේ වූ ජමාත්-එ-ඉස්ලාමී (Jamaat-e-Islami) හා පාකිස්තානයේ තරුණ අංශයක් වන පාස්බන්හි (Pasban) ප්‍රධානියා වූ හිටපු අන්තර් සේවා බුද්ධි අංශ ප්‍රධානී හමීඩ් ගුල් (Hamid Gul) සහ මුහම්මද් අලි දුරානිගේ (Muhammad Ali Durrani) නායකත්වයෙන් යුත් කණ්ඩායම සමඟ 1994 වර්ෂයේ අග භාගයේදී සම්බන්ධ වූ ඔහු එම වසරේම දේශපාලනයට උනන්දුවක් දැක්වුයේ ය.

පසුව 1996 අප්‍රේල් 25 වන දින ඉම්රාන් ඛාන් පාකිස්තානයේ ටෙහ්රික්-ඊ-ඉන්සාෆ් (Tehreek-e-Insaf) නැමති දේශපාලන පක්ෂය ආරම්භ කරමින් දේශපාලනයට පිවිසුනේ ය. මෙසේ තම ජාතියට, ආගමට හිතෛෂී ඉම්රාන් ඛාන්, තමාගේ දිවියේ එක් කොටසක් ලෙස සැලකූ ක්‍රිකට් වලින් සමුගෙන දේශපාලන දිවියට පා තබන්නේ අනෙකුත් දේශපාලන නායකයන් ලෙස

ජනතාව මුලාකරමින් තම බඩ ගෝස්තරය රැකගැනීමේ අභිප්‍රායක් සහිත නොවන බව මෙම සඟරාවෙහි ඉදිරි කොටස් කියවීමේ දී ඔබට ඒත්තු ගැන්වෙනවා නිසැක ය.

## නායකත්වය කරා ගිය ගමන් මග



*(ඉම්රාන් ඛාන් අගමැති ධූරයට පත් වූ පසු)*

1996 දී දේශපාලනයට පිවිසුනු ඉම්රාන් ඛාන්ගේ දේශපාලන දිවිය දිනෙන් දින වර්ධනය වූයේ ඔහු තම ක්‍රිකට් දිවියේ දී හෙබවූ නායකත්වයත්, එයින් ලද පන්නරය හා අත්දැකීම් ද ඒකරාශී කර ගැනීමෙනි.

2018 මැතිවරණයේ දී ඔහු පාකිස්තානු අගමැතිවරයා ලෙස ජනතා ප්‍රසාදයෙන් තේරීපත් වීමට ප්‍රථම ඉම්රාන් ඛාන් හට දේශපාලන දිවියේ දී අභියෝග හා ප්‍රතික්ෂේප වීම් රැසකට මුහුණ පෑමට සිදුවූයේ ය. ඔහු විසින් පිහිටුවා ගන්නා ලද ටෙහ්රික්-ඊ-ඉන්සාෆ් නම් වූ දේශපාලන පක්ෂය අද වන විට එරට දෙවෙනි විශාලතම හා බලවත් පක්ෂය බවට පත්වී තිබුණ ද 2002 වර්ෂයේදී එරට පැවති මැතිවරණයේ දී එම පක්ෂයට දිනා ගත හැකි වූයේ එක් ආසනයක් පමණි. එමෙන්ම 2008 ඡන්ද විමසීමේ දී ජනතාව විසින් එම පක්ෂය ප්‍රතික්ෂේප කරන ලදී. ඉම්රාන් 2008 වර්ෂය වන විට අන්තර්ජාතික පිළිගැනීමකට ලක් වූ දේශපාලනඥයකු වූයේ ඔහු සතු වූ නිහතමානී සහ දූරදර්ශී නායකත්ව ලක්ෂණ නිසාවෙන් යැයි කිව හැකි ය.

මෙසේ තම දේශපාලන දිවියේ දී විවිධාකාර ගැටලුවලට මුහුණ දී එම අභියෝග ඉතා නිවැරදි හා මනා තීක්ෂණ බුද්ධියකින් ජයගත් ඔහු පරිපූර්ණ

දේශපාලනඥයකු ලෙස නැවත වතාවක් ඡන්ද විමසුමකට තරග වදින්නේ 2013 වර්ෂයේ දී ය.

2013 වර්ෂය වන විට එරට අභියෝගාත්මක දේශපාලන නායකයකු වූ ඔහුට ඔහුගේ දේශපාලන පක්ෂයද ඉතා සාධනීය ලෙස වර්ධනය කරගැනීමට හැකි විය. එකල පාකිස්තානු මහ මැතිවරණයෙන් ජයගත් ඔහු එරට ප්‍රබල හා සුප්‍රසිද්ධ ජනතා නායකයෙකු වූයේ ඉන්දියාව හා ඇෆ්ගනිස්තානය සමඟ සබඳතා පැවැත්වීමේදී ඔහු විසින් අනුගමනය කළා වූ දැඩි තීන්දු තීරණ හේතුවෙනි. 2013 වර්ෂය වන විට ඔහුගේ පක්ෂයට හිමිව තිබුනේ එරට පාර්ලිමේන්තුවේ දහයෙන් එකක බලයක් පමණි. ඔවුනට 2018 වර්ෂයේ මැතිවරණයෙන් බලය තහවුරු කරගැනීමට  ප්‍රබල තරඟයක නිරත වීමට සිදු වූ අතර ඔහුට මුහුණ පෑමට සිදුවූ ප්‍රබලතම අභියෝග නම්,

- එවකට අග්‍රාමාත්‍ය ලෙස කටයුතු කළ නවාස් ෂරීෆ් (Nawaz Sharif) සහ ඔහුගේ පක්ෂය වන පාකිස්තානු මුස්ලිම් ලීගය පරාජය කරගැනීම.
- පන්ජාබ් ප්‍රදේශයේ තම මනාප වැඩි කර ගැනීම.

ආදිය යි.

නමුදු අවසානයේ දී නවාෆ් ෂරීෆ් ගේ පක්ෂයද උඩු යටිකුරු කරමින් පන්ජාබ් ප්‍රදේශය සතුව පැවති ආසන 272 න් ආසන 116 ක්ම ජයගත් ඉම්රාන් ඛාන්, අනෙකුත් සුළු පක්ෂද ඒකරාශී කරගනිමින් පාකිස්තානු ජාතික සභාවේ (National Assembly) වැඩි බලයක් ලබා ගැනීමට සමත් වුයේ ය. තවද ඉම්රාන් ඛාන් ඉතා සුවිශේෂී හා අනෙකුත් දේශපාලනඥයින්ට වඩා තරමක් වෙනස් නායකයෙකු වූයේ ය. ඔහු නිරතුරුවම තමා ගන්නා ලද තීන්දු තීරණ යාවත්කාලීන හා ක්ෂණිකව වෙනස් කිරීම්වලට ලක් කරන අතර ඇතැම්හු ඔහුගේ නායකත්වය තරමක් අපැහැදිලි එකක් බවට විශ්වාස කළහ.

සමස්තයක් ලෙස ගත් කළ ඔහුගේ නායකත්වය යම්තාක් දුරට ඉස්ලාම් ආගමට නැඹුරු බටහිරකරණය ප්‍රතික්ෂේප කළ වැඩපිළිවෙලක් බවට හැඳින්විය හැකි ය. තවද ඔහු තලෙයිබාන් ත්‍රස්තවාදය දැඩි ලෙස විවේචනයට ලක් කළ අතර ඊට විරුද්ධව තම හඬ නැගුවේ ය. ඔහු නිරතුරුව දූෂණයෙන් තොර වූ

දේශපාලනඥයින්ගෙන් සමන්විත නව දේශපාලනික හර පද්ධතියක් සැකසීමට තම දායකත්වය ලබාදුන්නේ ය. තවද ඔහුගේ දූෂණ විරෝධී දේශපාලන ගමනේ ප්‍රධානතම ඉලක්කය වූයේ තම ප්‍රතිවාදියා වූ නවාස් ෂරීෆ්ගේ දූෂිත දේශපාලනයට අභියෝග කිරීමයි. තවද ඔහුගේ මෙම දේශපාලන ගමන් මගේදී නවාස් ෂරීෆ් විසින් විවිධ වූ අභියෝග රැසක් ඔහු වෙත එල්ල කළ අතර දේශපාලන හිතවතුන් අතර ඉම්රාන් කෙරෙහි අමනාපකම් ඇතිකරලීමට ඔහු දැඩි ලෙස උත්සුක වූවේ ය.

මෙලෙස 2018 මැතිවරණය වන තෙක්ම ඔහු තම පක්ෂයේ යුක්තිය සඳහා වූ ගමන ඉතා දැඩි මතධාරීව නොසැලී ඉතා ගෞරවාන්විත ලෙස දියත් කිරීමට සමත් වූ නිසාවෙන්ම 2018 මැතිවරණයේදී ඔහු සියලු සමකාලීන දේශපාලන අපේක්ෂකයන් පරදවා ඉතා ඉහළ ජනතා ප්‍රසාදයක් හිමි කරගනිමින් පකිස්තානු අග්‍රාමාත්‍යවරයා ලෙස තේරී පත් වුයේ ය. එය ඔහු තම දේශපාලන ජීවිතයේ ලද විශාලතම ජයග්‍රහණය වූ අතර තම ජයග්‍රහණයේදී ඔහු ප්‍රකාශ කර සිටියේ, තමාට අවශ්‍ය වන්නේ දූෂණයෙන් තොර ඉතා ශක්තිමත් පකිස්තානයක් නිර්මාණය කිරීමට බවයි.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව



*(ඉම්රාන් ඛාන් ජනතාව ඇමතූ අවස්ථාවක් )*

ඉම්රාන් ඛාන් පකිස්තානය වෙනුවෙන් සිදුකළ සේවාව අතිමහත් ය. ප්‍රථමයෙන් ඔහු අගමැති ධූරයට පත්වූ විගසම නව පාකිස්තානයක් බිහිකිරීම උදෙසා ඔහුගේ ප්‍රතිපත්තීන් පිළිබඳව ජනතාව දැනුවත් කළේ ය. ඒ අනුව මෙතෙක් කාලයක් පුරාවටම පාකිස්තානු නායකයන් ගෙනගිය පාලන තන්ත්‍රයට වඩා බෙහෙවින්

වෙනස් වූ පාලන තන්ත්‍රයක් හා අනාගත සැලැස්මක් අනුගමනය කිරීමට බලාපොරොත්තු වන බව ඔහු ප්‍රකාශ කර සිටියේ ය. ඒ අනුව ඔහුගේ කාර්යභාරය පිළිබඳ අධ්‍යයනය කරන විට පෙර සඳහන් කළ ඔහුගේ දේශපාලන පක්ෂය පිහිටුවාගෙන ක්‍රියාකාරී දේශපාලනයට පිවිසීමට පෙර සිටම පකිස්තානය වෙනුවෙන් තම සේවය සැපයීමට කටයුතු කර තිබේ.

ඉම්රාන් ඛාන්ගේ සේවය සලකන විට ඔහුගේ ප්‍රථම කාර්යභාරය අතර එතෙක් පකිස්තානය තුළ විශාලතම ගැටලුවක් ව තිබූ පිළිකා රෝහලක් නොමැතිකම මඟහරවමින්, ඔහු විසින් පිළිකා රෝගය නිසා මිය ගිය තම මව අනුස්මරණය කරනු වස් පකිස්තානයේ ප්‍රථම පිළිකා රෝහල ඉදිකරනු ලැබී ය. ඒ ලාහෝරයේ ශෞකාට් ඛානුම් පිළිකා රෝහලයි (Shaukat Khanum Memorial Cancer Hospital). තම ධනය, ශ්‍රමය හා කාලය මෙන්ම ලොව පුරා සිටින පරිත්‍යාගශීලීන්ගේ ධන පරිත්‍යාගයන් ද උපයෝගී කරගනිමින් ඉදි කර තිබෙන මෙම රෝහල තුල සියලුම සේවාවන් සපයනු ලබන්නේ කිසිදු මුදලක් අය කර ගැනීමකින් තොරවයි.

වර්ෂ 1994 දී ඉදිකරන ලද මෙම රෝහල වෙනුවෙන් 1992 වර්ෂයේ ඉම්රාන් ඛාන්ගේ නායකත්වය ජයග්‍රහණය කළ ලෝක කුසලාන ක්‍රිකට් තරගයෙන් ලැබුණු මුදල් ද වැය කර තිබේ. ඉන් නොනැවතුණු ඔහු 2015 වර්ෂයේ දී දෙවන පිළිකා රෝහල ඉදිකිරීමේ කටයුතු ද ආරම්භ කළේ ය. පකිස්තානු සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් ඔහු සිදු කරන ලද්දේ ඉතාමත් ඵලදායි සේවයකි. එසේම ඔහු අගමැති ධූරයට පත් වූ පසු පවසා සිටියේ පකිස්තානය යනු ඉහළ මාතෘ හා ළමා මරණ අනුපාතිකයක් සහිත රටක් වන බවත් මෙයට ප්‍රධාන හේතුව වන්නේ අපිරිසිදු ජල පරිභෝජනය හා මන්දපෝෂණය බවයි. මේ නිසා මෙම අගයන් පහළ මට්ටමක් කරා ගෙන ඒමට අවශ්‍ය කටයුතු සියල්ල ඉම්රාන් ඛාන් විසින් සිදුකරනු ලැබීය.

ඉම්රාන් ඛාන් මහතා "ඉම්රාන් ඛාන් පදනම" (Imran Khan Foundation) නමින් පදනමක් පවත්වාගෙන යන අතර මෙයින් පකිස්ථානය තුළ විපතට පත්වන ජනයා වෙනුවෙන් උපකාර කරයි. ඛාන් පදනම හා බුෂ් පදනම එක්ව ගංවතුරවලින් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් සහන සැලසීමට කටයුතු කර

තිබේ. එසේම ඩේරා ඝාසි ඛාන් (Dera Ghazi Khan) හා ඩේරා ඉස්මයිල් ඛාන් (Dera Ghazi Khan) යන ගම්මානයන් හරිත ගම්මාන බවට පත්කොට සූර්යයාලෝකය උපයෝගී කොට බලශක්ති නිපදවා ගැනීමට අවශ්‍ය පහසුකම් ද සලසා තිබේ.

ලෝකය තුළ දකුණු ආසියානු කලාපය යනු දූෂිත දේශපාලනය රජයන කලාපයකි. පාකිස්තානය ද දූෂිත දේශපාලනයෙන් පරිපූර්ණ රටකි. මේ නිසා ඉම්රාන් ඛාන් බලයට පත් වූ විගසම දූෂිත දේශපාලඥයන් හඳුනාගෙන ඔවුන්ගේ දේපළ රාජසන්තක කිරීමට කටයුතු කළේ ය. පාකිස්තානය යනු අධික ණය බරින් පීඩිත රටකි. එම නිසා ණය බරෙන් මිදීමට පිළියම් ලෙස රජය තම වියදම් අවම කළ යුතු බව ඔහුගේ අදහස විය.

ඒ අනුව ඔහු පළමු පියවර ලෙස තම අගමැති කාර්යය මණ්ඩලය තුළ සිටින සේවයකයින් පන්සිය විසිහත් දෙනාගෙන් (527) තමාට අවශ්‍ය වන්නේ දෙනෙකු (02) පමණක් බව පවසා අනෙක් සේවකයන් ඉවත් කළේ ය. සත්‍ය වශයෙන්ම මෙය ඉතාමත් ඵලදායි කාර්යයකි. එමෙන්ම ඔහු අග්‍රාමාත්‍යවරයාට රජයෙන් පිරිනැමෙන වෙඩි නොවදින නිළ රථයන් වෙන්දේසියට තබා එම රථ මිලදී ගන්නා මෙන් ධනවතුන්ගේ ඉල්ලා සිටි අතර එම මුදල් මහා භාණ්ඩාගාරයෙහි තැන්පත් කිරීමට කටයුතු කළේ ය. තමාට නිලරථ දෙකක් පමණක් ප්‍රමාණවත් බව ඔහුගේ අදහස විය. ඔහු පකිස්තානය වෙනුවෙන් ඉටුකළ විශිෂ්ටතම සේවාව ලෙස ඔහුගේ පෞද්ගලික වියදම් අවම කිරීම පෙන්වා දියහැකි ය. එසේම රටේ අගමැති හෝ ජනාධිපති විදේශ සංචාරයන්හි නිරත වන විට සාමාන්‍ය ගුවන් යානා භාවිතා කළ යුතු බවත් විශේෂිත ගුවන්යානා භාවිත නොකළ යුතු බවත් ඉම්රාන් ඛාන් ප්‍රකාශ කළේ ය. මෙම පියවර රටකට බෙහෙවින් හිතකර විය.

ඉම්රාන් ඛාන් පකිස්තානු ආර්ථිකය සංවර්ධනය කිරීම උදෙසා කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ ව්‍යාපාර නඟා සිටුවීමටත් රැකියා විරහිත තරුණියන්ට පොලී රහිත ණය මුදල් ලබා දෙමින් නව රැකියා අවස්ථා ඇති කිරීමටත් ඉඩප්‍රස්ථාව සැලසුවේ ය. බලූකිස්ථානය (Balochistan), පකිස්තානයේ විශාලතම පළාත වන අතර එය රටේ භූමි භාගයෙන් සියයට හතළිස් හතරක් ආවරණය වන

නමුත් ජනගහනය සියයට පහක් පමණි. මෙය ස්වභාවික සම්පත්වලින් අනූන කලාපයක් වුවත් දුප්පත්ම කලාපයද වේ.

මේ අනුව ඉම්රාන් ඛාන් රජය මෙම කලාපයේ ජනයාගේ ජන ජීවිතයට ප්‍රයෝජනවත් වන වැඩසටහන් ගණනාවක් දියත් කළේ ය. එසේම මෙම කලාපය තුළ චීනය විශාලතම ආර්ථික ව්‍යාපෘතිය වන "එක් මාවතක් එක් තීරයක් ව්‍යාපෘතිය" (One Belt One Road Project) යටතේ "චීන-පකිස්ථාන ආර්ථික කොරිඩෝවට" (Economic Corridor) අයත් ග්වාඩාර් (Gwadar) නගරයේ ඉදි වන වරාය හා ගුවන්තොටුපල නිසා මෙම කලාපයට විශාල වැදගත්කමක් හිමි වේ. මේ අනුව එහි වෙසෙන සියලුම ජනතාවට සෞඛ්‍ය රක්ෂණයක් සැපයීමේ අරමුණින් සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත් බෙදාහැරීම රජය විසින් සිදුකරනු ලැබී ය. එසේම බලුකිස්ථාන් පළාත් පාලකයින් තමාට නිදහස් පාලන තන්ත්‍රයක් ගෙන යාමට අවශ්‍ය බව පවසමින් පකිස්ථානයෙන් නිදහස ඉල්ලුවත් අගමැතිවරයා එයට අවස්ථාවක් ලබා නොදුන්නේ ය. මන්දයත් රටක් තුළ පළාතක් ස්වාධීන වීම එම රටේ ස්වෛරීත්වයට සිදුකරන බාධාවක් බැවිනි. එමනිසා ඉම්රාන් ඛාන්ගේ එකම තීරණය වූයේ පකිස්තානය එක් රාජ්‍යක් වශයෙන් පැවතිය යුතුය යන්නයි.

මේ අතර මුළු ලෝකයම පකිස්තානය කෙරෙහි අවධානය යොමු වූ සිදුවීමක් සිදු විය. එනම් 2019 වර්ෂයේ පෙබරවාරි මස ඉන්දියාව විසින් පකිස්තානයට ගුවන් ප්‍රහාර එල්ල කළ විට තමන්ගේ ගුවන් සීමාවට පැමිණි ඉන්දියානු ගුවන් යානා දෙකක් බිම හෙළීමට පකිස්තානුවන් සමත් වීමයි. එය සැලසුම් කළ සියලු දෙනා බලාපොරොත්තු වූයේ දෙරට අතර ඉක්මන් යුද්ධයකි. නමුත් සිදු වූයේ වෙනකකි. පාකිස්තානු අත්අඩංගුවට පත් වූ අභිනන්දන් වර්දමාන් (Abhinandan Varthaman) නම් ඉන්දියානු ගුවන් භටයාට ආගන්තුක සත්කාර ලබා දුන් පකිස්තානු සෙබළු ඔහුගේ පවුලට පණිවුඩයක් යැවූහ. "ඔබේ පියා ගෙදර ඒවි" අභිනන්දන්ගේ පුතුට පාකිස්තානු හමුදාවෙන් ලැබුණේ එම පණිවුඩයයි. ඒ සාමාන්‍යයෙන් යුධ සිරකරුවෙකුගේ නිවසට යවන ආකාරයේ පණිවුඩයක් නොවේ. අගමැති ඉම්රාන් ඛාන් මේ පිළිබඳ ප්‍රකාශයක් කරමින් පෙබරවාරි 28 වන දින පවසා සිටියේ මාර්තු 01 දින ඔහු නිදහස් කරන බවයි. පොරොන්දු වූ පරිදි පාකිස්තානය අභිනන්දන්ව "සාමයේ සලකුණක්" ලෙසින්

යළි ඉන්දියාවට භාර කළේ ය. මෙතුලින් ජාත්‍යන්තරය හමුවේ පාකිස්තානයේ තත්ත්වය සහ පිළිගැනීම ඉහළ ගිය අතර ඒ සියල්ලටම වඩා යුද්ධයක අනතුර කෙමෙන් පහව යමින් ද පැවතියේ ය. මෙය පාකිස්තානු ජන ජීවිතය සුරක්ෂිත කිරීම වෙනුවෙන් ඉම්රාන් ඛාන් විසින් කරන ලද විශිෂ්ඨතම සේවයකි. ඉම්රාන් ඛාන් ඉන්දියාවට විරුද්ධව යුද්ධය ප්‍රකශ කළානම් සිදුවන විනාශය අතිමහත් ය. එම නිසා ඔහුගේ එම උපායශීලීත්වය අගය කල යුතුම ය. තම රටේ ජනතාවගේ ජීවිතය ආරක්ෂා කිරීම තරම් නායකයෙකුට කළ හැකි වෙනත් සේවයක් නොමැත. මේ තත්වය පකිස්තානු විදේශ ප්‍රතිපත්තියට බලපෑ ආකාරය ඉදිරියේදී සදහන් කර තිබේ.

ඒ අනුව ඉම්රාන් ඛාන් පාකිස්තානු අගමැති ධූරයට පත්වී ගතව ඇත්තේ තවමත් වසරකට ආසන්න කාලයක් වුව ද ඔහු ඔහුට හැකි අයුරින් පාකිස්තානය වෙනුවෙන් ඔහුගේ සේවය සැලසීමට ඇපකැප වී කටයුතු කරයි.

## විදේශ ප්‍රතිපත්තිය



*(ඉම්රාන් ඛාන් ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝඩි හමුවූ අවස්ථාවක් )*

ඉම්රාන් ඛාන්ගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව සලකා බැලීමේ දී ඔහු පාකිස්තානය හා අනෙකුත් රාජ්‍යයන් අතර ඇති සබඳතා පවත්වාගෙන යෑමේ දී ගනු ලබන තීන්දු තීරණ සියල්ල අනෙකුත් රටවල් හා සැසඳීමේදී සැලකිය යුතු මට්ටමක වෙනස් ස්වරූපයක් ගනියි. ඉම්රාන් ඛාන් සෑම විටම උත්සුක වන්නේ විදේශ අභියෝග රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමටයි. ඉම්රාන් ඛාන් කාශ්මීර අර්බුදය සම්බන්ධයෙන් තම රට ක්‍රියා කරන

ආකාරය පිළිබඳ ඇති ජාත්‍යන්තර ප්‍රතිරූපය හැකි අයුරින් පාකිස්තානයට වාසිදායක වන සේ ගෙන ඒමට කටයුතු කරයි.

කාශ්මීර ප්‍රශ්නයට ප්‍රවේශයක් ලෙස ඉම්රාන් ඛාන් "කථන රාජතාන්ත්‍රික'' ක්‍රමය භාවිතා කළේ ය. තවදුරටත් පාකිස්තානය කෙරෙහි මෙතෙක් පැවති අයහපත් ප්‍රතිරූපය වෙනස් කරමින් යහපත් ප්‍රතිරූපයක් ජාත්‍යන්තරය තුළ සාදා ගැනීමට අගමැති ඉම්රාන් ඛාන් උපක්‍රමශීලි විදේශ ප්‍රතිපත්ති ක්‍රමයන් අනුගමනය කළේ ය. ඒ අනුව ඇෆ්ගනිස්ථාන ප්‍රශ්නයේ දී එක්සත් ජනපද-තලෙයිබාන් සම්බන්ධතා සාමාන්‍යකරණය කිරීමට ඉම්රාන් ඛාන් දැඩි උත්සහයක් දැරුවේ ය. ලෝක බලවත් නායකයෙකු වන ට්‍රම්ප් සඳහන් කළේ ද එසේ කිරීමට පාකිස්තානයට බලය ඇති බවයි.

දකුණු ආසියානු කලාපයේ ඉන්දියාව සහ පකිස්තානය අතර පවතින ජම්මු කාශ්මීර අර්බුදය අතීතයේත් වර්තමානයේත් ලෝකයේ ඉතා වැදගත් ස්ථානයක් ගනු ලබන මාතෘකාවකි. මෙහිදී මෙම අර්බුදය සම්බන්ධයෙන් ඉන්දියානු රජය ගෙන ඇති විසඳුම් හා ක්‍රියාමාර් වෙනස් ස්වරූප ගනියි.

වරක් පාකිස්තානු අගමැති ඉම්රාන් ඛාන් මෙම අර්බුදය සම්බන්ධයෙන් කියා සිටියේ "කාශ්මීර අර්බුදය හේතුවෙන් ඉන්දියාව සමග න්‍යෂ්ටික යුද්ධයකට පැටලෙන්නට හෝ හැකිය" යනුවෙනි. මෙම අර්බුදය පිළිබඳ ඉම්රාන් ඛාන් අනෙකුත් ඉස්ලාමීය දේශයන් දැනුවත් කර සිටියේ ය. එහෙත් ඉම්රාන් ඛාන් කොතෙකුත් සන්තාපයට පත් වුව ද අනෙක් ඉස්ලාමීය දේශයන් එය පිළිබඳව තැකීමක් සිදු කළේ නැත.

එමෙන්ම වරෙක ඇමරිකානු ජනාධිපතිවරයා සමඟ ඉම්රාන් ඛාන් ඇමරිකාවේ දී පවත්වන ලද මංගල හමුවේ දී පවා මෙම ජම්මු කාශ්මීර අර්බුදය පිළිබඳව සාකච්ඡා කළේ ය. නමුත් ඇමරිකානු ජනාධිපතිවරයා මෙම ප්‍රශ්නය පිළිබඳව එවලෙහි එතරම් අවදානයක් යොමු නොකළේ ය. ඉන්දියාව සහ පකිස්තානය අතර මෙම ගැටලුව උත්සන්න වූයේ 2019 පෙබරවාරි මාසයේදී 'පුල්වාමා' (Pulwama) නමැති ප්‍රදේශයේදී ඉන්දියානු යුධ හමුදා ට්‍රක් රථ පෙලකට මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල වීමෙන් පසුව ය.

එමෙන්ම කාශ්මීරය සතු බලතල ඉවත් කිරීම තුළින් මුස්ලිම් බහුතරයක් වෙසෙන එම ප්‍රාන්තයේ ජන සංයුතියේ වෙනස්කම් කිරීමට ඉන්දියාවට අවස්ථාව ලැබෙන බවද පකිස්ථානු අගමැතිවරයා වරෙක පෙන්වා දුන්නේ ය. පකිස්තාන අගමැති ඉම්රාන් ඛාන් මෙම ජම්මු කාශ්මීර අර්බුදය විසඳීමට දරන උත්සාහය අතිමහත් ය. නමුත් වර්තමානය වන විටත් මෙය ලෝකයේ නොවිසඳුණු ප්‍රශ්නයක් ලෙස අදටත් කතාබහට ලක්වී ඇත.

Belt and Road Initiative (BRI) ව්‍යාපෘතිය ඔස්සේ ඇමරිකානු ඩොලර් බිලියනයක ආධාර පාකිස්ථානයේ සමාජ සහ ආර්ථික දියුණුව සඳහා චීනය විසින් ලබා දීමට කටයුතු කරනු ලැබීය. ඒ තුළින් පාකිස්තානයේ කෘෂිකර්මාන්තය දියුණු කරමින් මානව සංවර්ධනය ඔස්සේ පාකිස්තානයේ දිළිඳු බව තුරන් කිරීමට ඉම්රාන් ඛාන් හට අවස්ථාව ලැබී ඇත. තවද ඉතා විශාල ආයෝජනයක් වන චීන පාකිස්තානු ආර්ථික කොරිඩෝව හරහා පකිස්තානු අගමැති ඉම්රාන් ඛාන්හට තම ධූර කාලය තුළ දී රටෙහි සංවර්ධන ඉලක්ක වේගවත් හා කාර්යක්ෂම කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලැබී තිබේ.

ඊට අමතරව BRI ව්‍යාපෘතිය හරහා සිදුවන තවත් එක් ප්‍රධාන ක්‍රියාවලියක් වන “දේශගුණික විපර්යාස සහයෝගීතාව” (Climatic Change Co-operation) හරහා ඉම්රාන් ඛාන්ගේ ප්‍රධානත්වයෙන් හා චීන ආණ්ඩුව එක්ව පසුගිය වසර 5 තුළ පාකිස්තානයේ කයිබර් - පක්තුන්ක්වා (Kyber Pakhtunkhwa) නම් පළාතෙහි පැළ බිලියන 5ක් සිටුවීමේ ව්‍යාපෘතියක් සිදුකරන ලදී. තවද මෙම ශ්‍රේෂ්ඨ දේශපාලනඥයා බෙයිජිං හි (Beijing) පැවති දෙවනි BRI සමුළුවේදී ප්‍රකාශ කර සිටියේ "BRI වැඩ පිළිවෙල තව දුරටත් කෙසේ ක්‍රියාත්මක කළද තමන්ගේ අරමුණ වන්නේ පකිස්තානුවන්ට ස්වකීය උත්සහය හා ශක්තීන් උපයෝගී කරගනිමින් දිගුකාලීන වර්ධනයක් කරා යැමට අවශ්‍ය බවයි.” ය.

තවද ඉම්රාන් ඛාන්ගේ තවත් එක් සුවිශේෂී විදේශ ප්‍රතිපත්තියක් ලෙස ඇමරිකා එක්සත් ජනපදය වැනි දියුණු රාජ්‍යයන්ට පකිස්තානය තුළ ආයෝජනය කිරීම සඳහා, පකිස්තානු ආර්ථිකය ගෝලීය පද්ධතියට විවෘත කිරීම සඳහන් කළ හැකි ය. මෙයට මූලාරම්භයක් ලෙස අගමැතිවරයා විසින් ඇමරිකා එක්සත් ජනපදයේ

ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් (Donald Trump) මහතා හමුවීම හා ඔහුට පකිස්තානය තුළ ආයෝජනය කිරීමට ආරාධනා කිරීම දැක්විය හැකි ය.

ග්වඩාර් වරාය (Gwadar Port) දියුණු කිරීමත් සමඟ විදේශ ආයෝජන රැසක් පකිස්තාන වෙත ආකර්ශනය කර ගැනීමට ඉම්රාන් ඛාන්ට හැකියාව ලැබුනු අතර මෙතෙක් පකිස්තානු ඉතිහාසය තුළ වාර්තා වූ වැඩිම විදේශී ආයෝජන ප්‍රමාණය මොහුගේ ධූර කාලය තුළ දී වාර්තා වීමද ඓතිහාසික සිදුවීමකි. එය සංඛ්‍යාත්මකව ගත් කල මෙම කාලය තුළ දී පකිස්තානයේ විදේශ ආයෝජන 11.5%කින් ඉහළ ගොස් ඇත.

තවද ඉරානය, සෞදි අරාබිය , ඇමරිකා එක්සත් ජනපදය යන රටවල් තම රට කෙරෙහි ඇති සෘණාත්මක ආකල්පය මැඩලමින් තම රටේ ජාතික අභිලාෂයන් හැකිතාක් සාක්ෂාත් කිරීමට ඉම්රාන් ඛාන් තම විදේශ ප්‍රතිපත්තිය තුළින් උත්සහ දරයි. ඔහු සැමවිටම මිලිටරි බලය යොදා ගැනීම වෙනුවට රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඔස්සේ තම දේශපාලන ඉලක්ක සාක්ෂාත් කරගැනීමට පාකිස්තානු රජයට අනුබල දෙයි. තවද 2019 නොවැම්බර් මාසයේදී ඉම්රාන් ඛාන් විසින් ‘‘කර්ටපූර් කොරිඩෝව’’ (Kartarpur Corridor) විවෘත කර ප්‍රකාශ කර සිටියේ එසේ කිරීම තුළින්  තම විදේශ ප්‍රතිපත්තිය තවදුරටත් ශක්තිමත් කරගැනීමට හැකි වන බවයි .මිලිටරි බලය භාවිතා කිරීම සම්බන්ධයෙන් ඉම්රාන් ඛාන්ගේ අදහස අපට ඉතා පැහැදිලි ය. අගමැතවරයා පැවසුවේ යුද්ධය කිසිඳු ගැටලුවකට විසඳුමක් විය නොහැකි බැවින් කාශ්මීර ප්‍රශ්නය සාකච්ඡා මාර්ගය තුළින් විසඳා ගත හැකි බවත් යුධමය විකල්පය සොයන අය මෝඩයන් බවත් ය. ‘‘අපි කවදාවත් යුද්ධය ආරම්භ කරන්නේ නැහැ. පකිස්තානය සහ ඉන්දියාව යන දෙකම න්‍යෂ්ටික බලවතුන් වන අතර ආතතිය උත්සන්න වුවහොත් ලෝකය අනතුරකට මුහුණ දෙනු ඇත. යුද්ධය කිසිඳු ගැටලුවකට විසඳුමක් නොවන බව ඉන්දියාවට පැවසීමට මට අවශ්‍යය. යුද්ධයේ ජයග්‍රාහකයෙක් ද සිටී. පරාජිතයා යුද්ධය හේතුවෙන් වෙනත් ගැටලු රාශියක් බිහි කරයි’’ යනුවෙන් ද ඔහු පවසා සිටියේ ය. ඉම්රාන් ඛාන් සාමකාමී හා යුද විරෝධී පුද්ගලයෙකි. මන්ද ඔහුගේ මතය වන්නේ යුද්ධවලට කිසිවිටෙකත් ප්‍රශ්න විසඳා ගත නොහැකි බවයි. මෙම ගැටලුට පිළියම් සෙවීමේ දී සමකාලීන දේශපාලන ඉතිහාසය තුළ පකිස්තානයේ

විදේශ ප්‍රතිපත්තියේ මෙවැනි වෙනස්කම් අප කිසි දිනෙක දැක නැත. ඔහුගේ සාමකාමී ක්‍රියාකලාපය හේතුවෙන් වර්තමානයේ කාශ්මීරයේ සභාපති බවට පත්වීමටද ඉම්රාන් ඛාන්ට හැකි විය.

තවද ඔහුගේ විදේශ සබඳතා ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගයක් ලෙස හවුල්කාරීත්වය සහ නම්‍යශීලි සම්මුතිය පෙන්වා දිය හැකි ය. විදේශ ප්‍රතිපත්ති අභිලාශයන් සාක්ෂාත් කරගැනීමට සහ අනෙකුත් රාජ්‍යයන් සමඟ දිගුකාලීනව සබඳතා ඇති කර ගැනීමට මෙම සාධක ඉතා වැදගත් වේ. එසේ ක්‍රියා නොකළහොත් පාකිස්තාන විදේශ ප්‍රතිපත්තියට උභතෝකෝටික ගැටලු රාශියකට මුහුණපෑමට සිදුවනු ඇත.

## ගත හැකි ආදර්ශ



*(ඉම්රාන් ඛාන් සමුළුවක් ඇමතූ අවස්ථාවක් )*

ලොවම හඳුනන ඉම්රාන් ඛාන්ගේ චරිතයෙන් ලෝකයක් වශයෙන් අපට ලබාගත හැකි ආදර්ශ බොහෝමයි. ඔහුගේ ජීවිතයෙන් අපට ලබා ගතහැකි ආදර්ශ අතරින් වඩාත්ම යහපත් ගුණාංග කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරමු. ඉම්රාන් ඛාන් මහතාගේ ජීවිතය ක්‍රීඩකයකු හා දේශපාලනඥයෙකු වශයෙන් අපට කොටස් 02 ට වර්ග කළ හැකිය.ඒ අනුව එතුමා ක්‍රීඩකයකු හා දේශපාලනඥයෙකු වශයෙන් ඔහුට ළඟා කරගතහැකි උපරිම ස්ථානයක් කරා ළඟා වී තිබෙන්නේ ඔහු තුළ ඇති එම ගුණාංග හේතුවෙනි.

ඉම්රාන් ඛාන් යනු අපරිමිත ධෛර්යයකින් හා නොපසුබස්නා උත්සහයෙන් කටයුතු කළ පුද්ගලයෙකි.ඔහුගේ ක්‍රිකට් ජීවිතය අධ්‍යනය කරන විට ඔහුගේ

ප්‍රථම ජාත්‍යන්තර තරඟය තුළ කිසිඳු සාර්ථකත්වයක් නොලබා සියලු දෙනාගේ සමච්චලයට ලක් වීමට ඔහුට සිදු විය. පකිස්ථානු ක්‍රිකට් මණ්ඩලය ඉම්රාන් ඛාන් කෙරෙහි තබා තිබූ විශ්වාසයට සාදාරණයක් ඉෂ්ට කිරීමට ඔහුට නොහැකි විය.

නමුත් ඔහුගේ අධ්‍යාපන කටයුතුවලින් පසුව නැවත ක්‍රිකට් ක්‍රීඩාවට එක්වී එතෙක් මෙතෙක් කාලය පුරාවට පකිස්ථානු ක්‍රිකට් ඉතිහසය තුල බිහිවූ දක්ශතම ක්‍රිකට් ක්‍රීඩකයා වන්නට ඉම්රාන් ඛාන්ට හැකි වූයේ ඉම්රාන් ඛාන් සතු අපරිමිත ධෛර්යය හා නොසුබස්නා උත්සහය නිසාවෙනි. ලෝක ක්‍රිකට් ඉතිහාසයේ තුළ ඉම්රාන් ඛාන්ගේ තුන් ඉරියව් දක්ශතා දෙවෙනි වන්නේ ලෝක පූජිත ශ්‍රීමත් ගැරිසෝබර්ස්ගේ දක්ශතාවලට පමණි. ඒ අනුව ඔහු තම ක්‍රීඩා ජීවිතය තුළ ළඟා විය හැකි උපරිම ස්ථානය කරා ගමන් කරන ලදි.

ඉම්රාන් ඛාන්ගේ දේශපාලනික ජීවිතය සලකා බලන විට ඔහු සාමාන්‍යයෙන් පාකිස්තාන දේශපාලන පද්ධතිය තුළ පවතින තත්වය වෙනස් කරමින් වසර විස්සක ඔහුගෙ දේශපාලනික ගමන් මග අවසානයේදී පකිස්ථානු අග්‍රාමාත්‍ය ධූරය දක්වා රැගෙන ගියේය. 1992 දී ඉම්රාන් ඛාන්ගේ මූලිකත්වයෙන් පිහිටුවන ලද දේශපාලන පක්ෂය පළමු මැතිවරනයේදී එක් ආසනයක් වත් ජයග්‍රහනය කලේ නැත. නමුත් වසර විස්සකට පසු පැවති මැතිවරනයේදී අග්‍රාමාත්‍ය ධූරය දිනා ගැනීමට ඔහුට හැකි විය. මේ අනුව පෙනී යන්නේ අප යමක් ලබා ගැනීමට අපරිමිත ධෛර්යයෙන් හා නොපසුබස්නා උත්සහයෙන් කටයුතු කරන්නේ නම් එම ඉලක්ක ජයගහනය කල හැකි බවයි. ඉම්රාන් ඛාන්ගේ ජීවිතයෙන් ලබාගත හැකි විශිෂ්ට ආදර්ශය මෙයයි.

පුද්ගලයෙකු සෑම විටම තමාගෙ ඉලක්ක කරා යන විට ජීවිතයේ බොහෝ දේ කැප කිරීමට සිදුවේ. ඉම්රාන් ඛාන්ගේ ජීවිතයේ ඔහු බොහෝ දේ කැප කර තම ජයග්‍රහනයන් ඉලක්කයන් ළඟා කර ගෙන තිබේ. ඒ අනුව ඔහුගේ දේශපාලනික ජීවිතය තුල ඔහුගේ බොහෝ දේ කැප කර පාකිස්තානු ජන සමාජයට ගැලපෙන ආකායරට තම ජීවිතය හැඩගස්වාගෙන ඇත. ඒ අනුව ඔහුගේ ප්‍රථම බිරිඳ ජෙනීමා ඛාන් තමන්ට පාකිස්තාන දේශපාලන පද්ධතියට හැඩ ගැසීමට ඇති අසීරුතාව හේතුවෙන් ඉම්රාන් ඛාන්ගෙන් දික්කසාද වී නැවත එන්ගලන්තයට ගියාය. නමුත් ඇය ඉම්රාන් ඛාන් අගමැති තුමාට සුබ පතා තිබුනි.ඉම්රාන් ඛාන් තම දරු දෙදෙනා හා බිරිඳ මෙන්ම තම පෞද්ගලික ජීවිතයේ තිබූ බොහෝ

පුරුදුන් කැප කොට පකිස්ථානු ජන සමාජයට ගැලපෙන ලෙස තම ජීවිතය හැඩ ගස්වා ගෙන තිබේ.

ඉම්රාන් ඛාන්ගේ ජීවිතයෙන් අපට ලබාගත හැකි ආදර්ශයක් වන්නේ අවංකකම හා සත්‍යවාදී බවයි. ඉම්රාන් ඛාන් සෑම විටම පකිස්ථානයේ තිබූ දූෂිත දේශපාලනයට එරෙහිව කටයුතු කළේ ය. ඔහුගේ පංචවිධ න්‍යාය පත්‍රයේ සිව්වැනි කාරණය යටතේ ඔහු සදහන් කරන්නේ පාලකයින් සෑම විටම සත්‍යවාදී හා වගකීම් ඉටුකරන අවංක පුද්ගලයින් විය යුතු බවයි. ඔහු බලයට පත්වූ දින සිට දූෂිත දේශපාලනයින්ට එරෙහිව කටයුතු කළ අතර ඔවුන්ගේ දේපල රාජ සන්තක කළේ ය.

ඉම්රාන් ඛාන්ගේ ජීවිතයෙන් අපට ලබාගත හැකි ආදර්ශ අතර නායකත්ව ලක්ශණ බෙහෙවින් කැපී පෙනේ. ඔහු යහපත් නායකයෙකි . සෑම පුද්ගලයෙකු තුළම නායකයෙකු සිටී. යහපත් විශිෂ්ට නායකයෙකු බවට පත්වන්නේ අතළොස්සකි. එයිනුත් ලෝකයේ ගෞරවාදරයට පත්වන්නේ සුළුතර පිරිසකි. ඉම්රාන් ඛාන් යනු නොබෙල් සාම ත්‍යාගය ලැබීමට පවා සුදුසුකම් ලැබූ නායකයෙකි . නමුත් ඔහු එය ප්‍රතික්ෂේප කරන්නේ ඔහු තවම එයට සුදුසුකම් නැති බව පවසමිනි. නායකයෙකු සතු උතුම් ගති ගුණ රාශියක් ඔහු සතුව පවතින අතර නිහතමානී බාවය ප්‍රමුඛ වේ.

ලෝකයේ විශිෂ්ටතමයන්ට ලබා දෙන නොබෙල් සාම ත්‍යාගයට තමා සුදුසු නැතැයි ප්‍රතික්ෂේප කිරීමට තරම් ඔහු නිහතමානීය. නායකයෙකු සෑම විටම නිහතමානී විය යුතුය. බලයෙන් තම හිස උදුම්වා ගන්නා නායකයින් අතර ඉම්රාන් ඛාන්ට ඇත්තේ යහපත් චරිතයකි.

ක්‍රීඩකයෙකු වශයෙන් ගත් කළ ඉම්රාන් ඛාන් නායකත්වය යටතේ ලෝක කුසලානය ජයග්‍රහණය කරන්නේ ප්‍රථම වතාවටයි. 1992 දී පාකිස්තානු ක්‍රිකට් පිළ ඉම්රාන්ගේ නායකත්වය යටතේ එංගලන්තයට එරෙහි තරඟවැදී ලෝක කුසලානය ජයග්‍රහණය කරන ලදී. ඔහුට නායකත්වය පිරිනැමීම පිළිබඳව බොහෝ අයගෙන් අප්‍රසාදයන් එල්ල විය. නමුත් ඔහු තම නායකත්වය නිවැරැදිව භාවිතා කොට තම කණ්ඩායම ජයග්‍රහණය කරා රැගෙන ගියේය.ඒ අනුව පාකිස්තාන ක්‍රිකට් ඉතිහාසය තුළ සාර්ථකම ක්‍රිකට් නායකයා වන්නේ ඉම්රාන්

ඛාන්ය. පාකිස්තානු ජනතාව තමා පාලනය කිරීමට ඔහුට අගමැති පුටුව තෝරා දෙනු ලබන්නේ අනෙකුත් නායකයින් ට වඩා මොහු සතුව ඇති විශේෂත්වය හා නායකත්ව ගති තියෙන නිසා වෙනි.

අගමැතිධූරයට පත් වූ ඉම්රාන් ඛාන් තමාට ලැබෙන සියලුම වරප්‍රසාද ප්‍රතික්ෂේප කළ අතර තම නිල නිවස විශ්වවිද්‍යාලයක් ඇතිකිරීමට ප්‍රධානය කරන ලදි. එසේම නව බදු ක්‍රමයක් හඳුන්වා දෙමින් ධනවතුන් ගෙන් වැඩි බදු මුදලක් අය කර දුප්පතුන්ට සහන ලබාදීමට කටයුතු කර තිබේ. ඉම්රාන් ඛාන් යනු සාමාන්‍ය ජනතාවගේ සුභසෙත උදෙසා කටයුතු කළ නායකයෙකි. නායකයෙකු සැම විටම ඇති පුද්ගලයන් වෙනුවෙන් නොව නැති පුද්ගලයන් වෙනුවෙන් පෙනී සිටිය යුතුය. ඉම්රාන් ඛාන් යනු ජනතා හිතවාදී නායකයකු ලෙස සාමාන්‍ය ජනතාවගේ සුභසිද්ධිය උදෙසා කටයුතු කරන බව පෙනී යයි.

සැම නායකයෙකුටම යහපත් පෞර්ෂයක් තිබීම අත්‍යාවශ්‍ය කාරණයකි. ඉම්රාන් ඛාන් තම ක්‍රීඩා ජීවිතය හා දේශපාලන ජීවිතය තුළද පෞර්ෂත්වයෙන් පරිපූර්ණ වූ නායකයෙකි. තම කණ්ඩායම සමඟ සහයෝගයෙන්, විචක්ශණශීලීව, ස්ථානෝචිත ප්‍රඥවෙන් කටයුතු කර ක්‍රීඩාවේ ජයකෙහෙළි නැංවූවා සේම දේශපාලනයේදී ද ජයකෙහෙළි නංවා ඇත. ඉම්රාන් ඛාන්ගේ දේශපාලන ජීවිතයේ මෑත ඉතිහාසය තුල කෝවිඩ් 19 (COVID 19) වෛරසය ව්‍යාප්ත්‍යයේ මූලාරම්භක අවස්ථාවේදී පාකිස්තානයෙන් පිටත සිටින පාකිස්තානුවන්ට මෙන්ම අනෙකුත් විදේශිකයන්ට ද පාකිස්තානයට පැමිණීම තහනම් කර එම මොහොතේදී පාකිස්තානය තුළ සිටින ජනයාගේ ජීවිත ආරක්ෂා කරනු පිණිස ස්ථානෝචිතව එම තීරණය ගෙන තිබීම තුළින් ඔහුගේ නායකත්වය තුළ ඇති සංසුන්භාවය හා ආත්ම විශ්වාසය පිළිබිඹු වේ. ලෝකයේ බොහෝ රටවල් ඒ මොහොතේදී රටින් පිට සිටින තමන්ගේ ජනයා රට තුළට ගෙන්වා ගැනීමට කටයුතු කළ නිසා එම රාජ්‍යයන් තුල වෛරසය දැඩිව ව්‍යාප්ත විය. ඛාන් අගමැතිතුමාගේ එම තීරණයට විවිධ පාර්ශ්වයන්ගෙන් විවේචන එල්ල වූවත් ඔහු ඉතා සන්සුන්ව තමන්ගේ තීරණය පිළිබඳව ආත්ම විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම නිසා වෛරසය පාකිස්තානය තුළ දැඩිව ව්‍යාප්ත වීම වැළකුනි. ඒ තුළින් නායකයෙකු වශයෙන් ඔහු සියල්ලට ප්‍රථම තම රට වැසියාගේ සමාජ සුභ සාධනය කෙරෙහි ප්‍රමුඛස්ථානය ලබාදෙන බවට සනාථ විය. සැම යහපත්

නායකයෙකුගේම ප්‍රමුඛතම අභිප්‍රාය විය යුත්තේ තම අනුගාමිකයින් ආරක්ෂා කිරීම හා ඔවුන්ගේ අවශ්‍යතාවන් සපුරා දීමයි.

ඒ අනුව ඉම්රාන් ඛාන් යනු මුලු ලෝකයටම ආදර්ශය පතුරන චරිතයකි. ඔහුගේ ප්‍රධාන විනෝදාංශය සමාජ සේවය නිසා පොඩි මිනිසාගේ හිතවතා ලෙස රට පුරා ගෞරවාදරයට පත් වූවත් පෙර කාලයේදී ඔහුව ප්‍රසිද්ධියට පත් වූයේ සෙල්ලක්කාර, නාහෙට නාහන, දඩබ්බර, ප්‍රේමණීය චරිතයක් ලෙස යි. නමුත් පසු කාලෙකදී ඔහුගේ සියලුම එම ගති පැවතුම් වෙනස් කරමින් පරිණත ආදර්ශමත් නායකයකු බවට පරිවර්තනය වී තිබේ.

## සාරංශය

1952 වර්ෂයේ දී උපත ලැබූ ඉම්රාන් මොහොමඩ් ඛාන් නම් වූ අපූර්ව පුද්ගලයා පාකිස්තානු ජාතිකයෙකු ලෙස එරට ජාතිකාභිමානය ලොව පුරා ප්‍රචලිත කිරීමට ගත් වෙහෙස වචනයෙන් ලියා නිමකළ නොහැක. කුඩා කල එතරම් කැපී පෙනෙන අයෙකු නොවූව ද දිනෙන් දින වයසින් මුහුකුරා යන විට ඉතා කඩවසම් ක්‍රිකට් ක්‍රීඩකයෙකු ලෙස තම යෞවනය ගෙවූ ඉම්රාන් ඛාන් ඉතා ඉහළ ක්‍රීඩා කෞෂල්‍යයන් පෙන්වමින් ලෝකප්‍රකට චරිතයක් බවට පත් වුයේ ය.

1994 දී දේශපාලනයට පිවිසි මෙතුමා නවක දේශපාලනඥයෙකු ලෙස තමාට මුහුණ පෑමට සිදුවූ අභියෝග මනා තීක්ෂණ බුද්ධියකින් යුක්තව ජයගත් අතර තම නායකත්වය තුළින් තමාට ආවේණික වූ දේශපාලන උපක්‍රම හා විධි විධාන තුළින් ලෝකප්‍රකට දේශපාලන නායකයෙකු වූයේ ඔහු විසින් පකිස්තානයේ යුක්තිය සපුරාලීමට ගත් ආරම්භක උත්සහය නිසාවෙනි.

2018 මැතිවරණයෙන් පසු අති විශාල ජනතා ප්‍රසාදයක් හිමිකරගත් ඔහු පකිස්තානය තුල තම බලය පිහිටුවේ ය. මොහු උපක්‍රමශීලීව තමාට අවශ්‍ය වූ ජනතා මෙහෙවර පාකිස්තානය වෙත ඉටු කිරීමට සිය මූලික අඩිතාලම යෙදුවේ ය. රටක් ලෙස ගත් කළ පාකිස්තානය කෙරෙහි ජාත්‍යන්තර පද්ධතිය තුළ සෘණාත්මක ආකල්ප මැඩලීමටත් කාශ්මීර සම්බන්ධයෙන් වූ දිගුකාලීන අර්බුදයේ දී මිලිටරි ක්‍රම භාවිතය වෙනුවට සාකච්ඡා මාර්ගයෙන් ඉතා සාමකාමී

අන්දමින් එම ගැටලු විසඳා පාකිස්තානය මුහුණ පා ඇති අභියෝගවලින් ජයගැනීමටත් ඔහු පාකිස්තානු අග්‍රාමාත්‍යවරයා ලෙස දැඩි පරිශ්‍රමයක නිරත වී සිටීයි.

පුද්ගලයෙකු ලෙස තම යුතුකම් හා වගකීම් නිවැරදිව හඳුනාගත් ඉම්රාන් ඛාන් පාකිස්තානය තුළ මෙන්ම වර්තමාන ජාත්‍යන්තර පද්ධතිය තුළත් නොමැකෙන මතකයන් රැසක් ඉතිරිකරන බව නොඅනුමාන ය. ඉම්රාන් ඛාන් ස්වාධීන, දේශප්‍රේමී හා ශ්‍රේෂ්ඨ නායකයෙකු වන බව අවිවාදයකින් යුතුව කිව හැකි වන්නේ මෑතකාලීනව පාකිස්තානයේ ජාතික අභිලාෂයන් ජය ගැනීම සඳහා එරට අග්‍රාමාත්‍යවරයා වශයෙන් ඔහු දැනටමත් දියත් කර ඇති දූරදර්ශී වැඩපිළිවෙල නිසාවෙනි. තවද ඔහු තම ජයග්‍රහණයේදී ප්‍රකාශ කර සිටියේ ජින්නා මැවූ පාකිස්තානය නිර්මාණය කිරීම ඔහුගේ එකම අභිප්‍රාය බවයි. එම ප්‍රකාශනය වචනාර්ථයකට පමණක් සීමා නොකර සැබෑවක් කිරීමට කටයුතු කර ඇති බව ඔහුගේ ශ්‍රේෂ්ඨ චරිතය විමසා බැලීමෙන් ගම්‍යමාන වන බව සක්සුදක් සේ පැහැදිලිය.

# මූලාශ්‍ර නාමාවලිය

Mackey, Robert (7 May 2013). "Video of Imran Khan' s Fall at Election Rally in Pakistan". The New York Times. Retrieved 4 May 2013.

"Tehrik-i-Insaf sweeps Khyber Pakhtunkhwa". The Nation. 12 May 2013. Archived from the original on 12 May 2013. Retrieved 12 May 2013.

"Imran Khan elected 22nd Prime Minister of Pakistan". The News International. 18 August 2018. Retrieved 18 August 2018


Pakistan Test Captaincy record Archived 1 March 2017 at the Wayback Machine. Cricinfo. Retrieved 18 December 2012.

India, Press Trust of (12 May 2013). "Imran Khan's party set to form govt in Khyber-Pakhtunkhwa". Business Standard. Archived from the original on 23 October 2013. Retrieved 14 May 2013.

"Imran Khan: From top cricketer to winning politician - Times of India". The Times of India.

"Pakistan election: Party of Ex-PM Nawaz Sharif concedes to Imran Khan". Retrieved 27 July 2018.

# ෂෙයික් මුජිබර් රහ්මාන්



**කණ්ඩායම් සාමාජිකයන් :**

- ටී.එම්.වයි.එච්.තෙන්නකෝන්
- ජේ.ඩී.අයි.ටී.ජයසංඛ
- එච්.එම්.එස්.ඩබ්ලිව්.හේරත්
- අයි.යූ.ඊශ්වර
- ඩී.වී.එම්.මහෝෂධ

## හැඳින්වීම

ලෝක ඉතිහාසය අධ්‍යයනය කරන විට තමාගේ ජීවිතය පරදුවට තබා තම රට,ජාතිය, ජනතාව වෙනුවෙන් උදාර සේවාවන් කළ ජන නායකයින් කොතෙකුත් හමුවේ. ඒ අතර බංගලාදේශ ජනතාව හා එම භූමිය වෙනුවෙන් දිවිහිමියෙන් කැප වූ ජනහිතකාමී දේශපාලන නායකයෙකු බංගලාදේශ දේශපාලන ඉතිහාසය තුළ දක්නට ලැබේ. නිදහස් බංගලාදේශයක් නිර්මාණය කරන සිහිනය සැබැවක් කළ මෙතුමා එරට පළමු ජනාධිපතිවරයා වේ. නමින් ඔහු "ෂෙයික් මුජිබර් රහ්මාන්" (Sheik Mujibur Rahman) වන අතර " ජාතියේ පියා" (Father of the Nation) යන අන්වර්ථ නාමයෙන් ද හැඳින්වේ.

මෙම විචාරාත්මක නිර්මාණය තුළින් එම ජනහිතකාමී දේශපාලන නායකයාගේ ළමා කාලය, අධ්‍යාපනය,එතුමාගේ දේශපාලන ගමන් මග ,එතුමා නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවය ,එතුමාගේ විදේශ ප්‍රතිපත්තිය හා එම ජන නායකයාගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ පිළිබඳ විස්තරාත්මක ඉදිරිපත් කිරීමක් සිදුකර තිබේ.

1920 මාර්තු 17 දින ෂෙයික් මුජිබර් රහ්මාන් බෙංගාල පළාතේ ගෝපාල්ගංජ් දිස්ත්‍රික්කයේ උපත ලැබුවේ ය. 1927 දී "ගිමදංග" ප්‍රාථමික පාසලෙන් අධ්‍යාපනය ආරම්භ කළ මෙතුමාගේ දේශපාලන ගමන ආරම්භ වූයේ 1939 දී"ගෝපාල්ගංජ්" මිෂනාරි පාසලේ ඉගෙනුම ලබමින් සිටියදී ය. ඔහු එතනින් පටන් ගත් දේශපාලන ගමන නායකත්වයට පත්වී තමාගේ යුතුකම් රට වෙනුවෙන් ඉටු කරන තාක් නොනවත්වා සිදු කළේය.

රාජ්‍යයේ සියලු දෙනාට සමසිත් ඇති පියෙකු මෙන් කටයුතු කළ මෙතුමා " ජාතියේ පියා" යන අන්වර්ථ නාමයෙන් ආමන්ත්‍රණය කිරීමට සැබෑම සුදුස්සෙකු බව එතුමාගේ ජීවිත කතාව මනාව අධ්‍යයනය කරන විට පැහැදිලි වේ. බංගලාදේශයේ ස්වාධීනත්වය සුරකිමින් දේශීය ආර්ථිකය ගොඩනංවාලීමට දැරූ උත්සාහය සහ අධිෂ්ඨානය ඉතා ප්‍රශංසනීය බව කිව යුතුමය. දුප්පත් ජනතාවට සහන ලබාදෙමින් දේශීය කෘෂිකර්මාන්තය හා දේශීය කර්මාන්ත නගා සිටවූ මෙතුමා සැබෑම දේශප්‍රේමියකු ලෙස ජනාදරයට පාත්‍ර වූයේය. කොතෙකුත් තාඩන පීඩන තමාට එල්ල වුවද ඒවා හමුවේ ඉන්ද්‍රඛීලයක්ව නොසැලී සැබෑ

නායකත්වය යනු කුමක්ද යන්න ලොවට විදහා දැක්විය. දේශීය ජනතාවගේ සිහින සිහිනයක් විලසම මියැදෙන්නට නොදී එතුමා කළ සේවයට වටිනාකමක් නියම කළ නොහැක.

තමාගේ අසල්වැසි රාජ්‍යයන් සමග ඉතා මිත්‍රශීලීව කටයුතු කළ මෙතුමාට අවශ්‍ය වූයේ තම රාජ්‍ය ජාත්‍යන්තරය තුළ ද පිළිගැනීමට ලක්වන රාජ්‍යයක් බවට පත් කිරීමයි. ඒ සඳහා එතුමා අනුගමනය කළ වැඩපිළිවෙළ හා එහි සාර්ථකත්වය මෙම නිර්මාණය තුළින් මනාව පෙන්වා දී ඇත.

මනා පෞර්ෂයක්, දැක්මක් හා ප්‍රතිපත්ති මාලාවක් ඇති සැබෑ නායකයෙකුට ජයගත නොහැකි බාධකයක් නොමැත. සැබෑ ජාත්‍යාලයක් ,පොදුජන හිතෛෂී බවකින් යුතු නාකයෙකුට සැබෑ කළ නොහැකි සිහිනයක් නැත."ෂෙයික් මුජිබර් රහ්මාන්" ජීවිත කතාව අධ්‍යයනය කරන විට මෙය මනාව පැහැදිලි වේ. මෙම නිර්මාණය තුළ මෙකී සියලු කරුණු ඉතා පැහැදිලිව හා විස්තරාත්මකව ඉදිරිපත් කර තිබේ.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

බංගලාදේශ ජනරජයේ ආරම්භක පියා වන ෂෙයික් මුජිබර් රහ්මාන් (Sheikh Mujibur Rahman) 1920 මාර්තු 17 වැනි දින බ්‍රිතාන්‍ය ඉන්දියාවේ බෙංගාල පළාතේ ගෝපාල්ගංජ් (Gopalgunj) දිස්ත්‍රික්කයේ තුංගිපාර (Thungipara) නම් ගම්මානයේ උපත ලැබුවේ ය. ෂෙයික් මුජිබර් රහ්මාන් දියණියන් සිව් දෙනෙක් හා පුතුන් දෙදෙනෙකුගෙන් යුත් පවුලක තෙවැනි දරුවා විය. මුජිබර්ගේ පියා ගෝපාල්ගංජ් සිවිල් උසාවියේ නිලධාරියෙකි.


1927 දී ඔහු ගිමදංග ප්‍රාථමික පාසලට (Gimadanga Primary School) ඇතුළත් වූ අතර වසර දෙකකට පසු තුන්වන පන්තිය සඳහා ගෝපල්ගංජ් පොදු පාසලට සම්බන්ධ වුයේ ය. 1931 දී ඔහු මදරිපූර් ඉස්ලාමියා උසස් පාසලට (Madaripur Islamia High School) හතරවැනි පන්තියට ඇතුළත් වුයේ ය . කෙසේ වෙතත් අක්ෂි ශල්‍යකර්මයකට භාජනය කිරීම සඳහා මුජිබර් 1934 දී පාසලෙන් ඉවත් වූ

අතර නැවත පාසලට පැමිණෙන්නේ ශල්‍යකර්මයේ බරපතලකම හා මන්දගාමී සුවය හේතුවෙන් වසර 4 කට පසුව ය.

මුජිබර් සිය ළමා කාලය තුළ ඉතාමත් බුද්ධිමත් පිරිමි දරුවෙකු වූ අතර ඕනෑම අයෙකු සමග නිර්භයව කතා කළේය. ඔහු අසරණ මිනිසුන්ට උපකාර කිරීමට බෙහෝ සෙයින් උනන්දු වූ පුද්ගලයෙක් ලෙස හඳුන්වා දිය හැක. ඔහු සිය කාලය හා ශක්තියෙන් වැඩි කොටසක් අන් අයගේ සේවය සඳහා ආයෝජනය කළේය. මුජිබර් කුඩා අවධියේ පටන් වැඩිහිටියන්ට කීකරු මෙන්ම සමාජශීලී පුද්ගලයෙක් වුයේය. ඔහුගේ ළමා කාලය තුළ ප්‍රරෝහණය වූ මෙම ගුණධර්ම ඔහුගේ ජීවිතයට විශාල බලපෑමක් කළ බව ප්‍රතික්ෂේප කළ නොහැක.

ෂෙයික් මුජිබර් රහ්මාන් දේශපාලනට පිවිසීම 1939 දී ගෝපාල්ගංජ් මිෂනාරි පාසලේ ඉගෙනුම ලබමින් සිටියදී ආරම්භ වුයේය. 1940 දී ඔහු සමස්ත ඉන්දීය මුස්ලිම් ශිෂ්‍ය සම්මේලනයට (All India Muslim Students Federation) සම්බන්ධ වූ අතර වසරක කාලයක් සඳහා මන්ත්‍රිවරයෙකු ලෙස තේරී පත් විය. ප්‍රවේශ විභාගය සමත්වීමෙන් පසු ඔහු 1942 දී කල්කටා ඉස්ලාමියා විද්‍යාලයට (Calcutta Islamia College) (වර්තමානයේ මවුලානා අසාද් විද්‍යාලයට (Maulana Azad College)) ඇතුළත් වූ අතර එහිදී දේශපාලනයට සම්බන්ධ වුයේය.

ඉන්පසුව 1943 දී බෙංගාල මුස්ලිම් ලීගයට (Bengal Muslim League) සම්බන්ධ වූ ඔහු ප්‍රමුඛ පෙළේ බෙංගාලි මුස්ලිම් නායකයෙකු වන හුසේන් ෂහීඩ් සුහ්රාවාඩි (Huseyn Shaheed Suhrawardy) නායකත්වයෙන් යුත් කණ්ඩායමට සමීප විය. මෙම කාලය තුළ මුජිබර් වෙනම මුස්ලිම් රාජ්‍යයක් උදෙසා වන පකිස්ථානය යන ඔහුගේ ස්වාධින සංකල්පය වෙනුවෙන් ක්‍රියාකාරීව කටයුතු කළ අතර, ඔහුගේ ක්‍රියාකාරී කැපවීම මත 1946 දී ඔහු ඉස්ලාමීය විද්‍යාල ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් ලෙස තේරී පත්විය. 1947 වර්ෂයේදී නීති උපාධිය ලබාගත් ඔහු ඉන්දියාව බෙදීමත් සමග කල්කටාවේ ඇතිවූ වාර්ගික ප්‍රචණ්ඩත්වය අතරතුර සුහ්රාවාඩි යටතේ සේවය කළ මුස්ලිම් දේශපාලනඥයින් අතුරින් කෙනෙකි. ඔහු මුස්ලිම්වරුන් ආරක්ෂා කරමින් ප්‍රචණ්ඩත්වය මැඩ පැවැත්වීමට උත්සාහ කළේය.



*(තරුණ ෂෙයික් මුජිබර් රහ්මාන්)*

ඉන්දියාවේ බෙදීමෙන් පසුව ඔහු එවකට නැගෙනහිර පාකිස්තානයේ ඩකා විශ්වවිද්‍යාලයට (University of Dhaka) නීති ශිෂ්‍යයෙකු ලෙස සම්බන්ධ වූ අතර 1948 ජනවාරි 4 වන දින ඔහු නැගෙනහිර පාකිස්තාන මුස්ලිම් ශිෂ්‍ය ලීගය (East Pakistan Muslim Student's League) ආරම්භ කළේය. 1948 දී නැගෙනහිර පාකිස්තානයේ බෙංගාල ජාතිකයන් උර්දු රාජ්‍ය භාෂාව ලෙස පිළිගන්නා බව පළාත් මහ ඇමති ක්වාජා නසිමුදීන් (Khwaja Nazimuddin) හා මුහම්මද් අලි ජින්නා (Muhammad Ali Jinnah) ප්‍රකාශ කළ විට දැඩි විරෝධතා දියත් කළ අතර අනෙකුත් දේශපාලන නායකයන් හා සිසුන් සමග සන්නිවේදනය ආරම්භ කළේය.

1948 මාර්තු 2 දින දේශපාලන පක්ෂ කිහිපයක් විසින් භාෂා ගැටලුව විසඳීම සඳහා රැස්වීමක් පවත්වන අතර මාර්තු 11 වන දින බෙංගාලයට එරෙහි මුස්ලිම් ලීගයේ කුමන්ත්‍රණයට විරුද්ධ මතභේදයක් සනිටුහන් කිරීම සඳහා ක්‍රියාකාරී සභාව විසින් මහා වැඩ වර්ජනයක් කැඳවන ලදී. එදින මුජිබර් අත්අඩංගුවට ගනු ලැබුවේ අනෙකුත් නායකයින් සමඟ ය. එහෙත් ශක්තිමත් ශිෂ්‍ය ව්‍යාපාරයක් විසින් ඔහු සහ අනෙක් අය මාර්තු 15 වන දින නිදහස් කිරීමට මුස්ලිම් ලීගය රජයට බල කෙරුණි.

1949 ජූනි 23 වන දින ඔහු බෙංගාල ජාතිකවාදීන් වන සුහ්රාවඩී, මවුලානා භාෂිනි සහ තවත් අය සමඟ එකතු වී නැගෙනහිර පකිස්තාන අවාමි මුස්ලිම් ලීගය (East Pakistan Awami Muslim League) පිහිටුවීය.

## නායකත්වය කරා ගිය ගමන් මග

ෂෙයික් මුජිබර් රහ්මාන් නම් වූ අසහාය නායකයාගේ දේශපාලන ගමන 1949 නැගෙනහිර පකිස්තාන අවාමි මුස්ලිම් ලීගය පිහිටුවීමත් සමඟ ආරම්භ විය. ඒ අනුව, 1949 ජනවාරි 26 වන දින රජය ප්‍රකාශ කළේ උර්දු නිල වශයෙන් පාකිස්තානයේ රාජ්‍ය භාෂාව වනු ඇති බවයි. මේ වන විට මුජිබර් සිරගතව සිටියේය. සිරගතව සිටියද ඔහු සෙසු ක්‍රියාකාරික කණ්ඩායම්වලට වැඩ වර්ජන හා විරෝධතා දියත් කිරීමට දිරිගැන්වූ අතර දින 13 ක් උපවාසයේ නිරත විය. මින් පසුව එළඹෙන්නේ මුජිබර්ගේ දේශපාලන ක්‍රියාකාරිත්වයට ඔහු නිල වශයෙන් යොමු වන අවධියයි.

මුජිබර් සිය දේශපාලන දිවිය දියත් කළ අතර අවාමි මුස්ලිම් ලීගය පිහිටුවීම සඳහා මුස්ලිම් ලීගයෙන් ඉවත්ව සහ්රාවර්දි හා මවුලානා සමග එක්විය. ඔහු 1949 දී නැගෙනහිර පකිස්තාන ඒකකයේ ඒකාබද්ධ ලේකම් ලෙස තේරී පත් වුයේය. නැගෙනහිර පකිස්තාන හා සමාජවාදී පක්ෂවල විශාල සන්ධානයක් ගොඩනැගීමට සහ්රාවර්දි කටයුතු කළ අතර මුජිබර් අවධානය යොමු කළේ බිම් මට්ටමේ සංවිධානය පුළුල් කිරීම සඳහාය. 1951 දී මුජිබර්, උර්දු භාෂාව එකම ජාතික භාෂාව ලෙස ප්‍රකාශයට පත් කිරීමට විරෝධය දැක්වූ සිසුන් පොලීසිය විසින් ඝාතනයට ලක් කිරීමට ප්‍රතිචාර වශයෙන් විරෝධතා සහ පෙළපාලි සංවිධානය කිරීමට පටන් ගත්තේ ය. පසු කලෙක භාෂා ව්‍යාපාරය ලෙස හැඳින්වූ මෙම කැළඹිලි කාලය මුජිබර් සහ තවත් බෙංගාලි දේශපාලනඥයින් අත් අඩංගුවට ගන්නා ලදි. 1953 දී පක්ෂයේ මහලේකම් ධුරයට ද තේරී පත්වූ ඔහු 1954 දී එක්සත් පෙරමුණ සන්ධාන අවසරයෙන් නැගෙනහිර බෙංගාල ව්‍යවස්ථාදායක සභාවට තේරී පත්විය. නමුත් කෙටි කාලයකදීම අත් අඩංගුවට ගනු ලැබුවේ මධ්‍යම රජය විසින් ඔහුව ඉවත් කිරීමට ගත් තීරණයට විරෝධය දැක්වීම නිසාවෙනි. පසුව ඔහු පාකිස්තානයේ දෙවන ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට තේරී පත්වූ අතර 1955 සිට 1958 දක්වා සේවය කළේය. බලවත් මධ්‍යම රජයත් සමග ඒකාබද්ධ වූ බටහිර පාකිස්තානය හා නැගෙනහිර පාකිස්තානයට පක්ෂව පළාත් විසුරුවාහැරීමේ යෝජිත සැලැස්ම පිළිබඳව ඇමතීමේදී දේශනයක් කරමින් මුජිබර් ඉල්ලා සිටියේ බෙංගාලි ජනතාවගේ

ජනවාර්ගික අනන්‍යතාවයට ගරු කළ යුතු බවත්, ජනප්‍රිය තීන්දුවක් මගින් ප්‍රශ්නය තීරණය කළයුතු බවත් ය. එහි දැක්වෙන ඉල්ලීම වූයේ;

"මහත්මයාණෙනි, (ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයේ සභාපතිතුමනි) ඔවුන්ට නැගෙනහිර බෙංගාලය වෙනුවට නැගෙනහිර පකිස්තානය යන වචනය තැබීමට අවශ්‍ය බව ඔබට පෙනෙන්නට ඇත. පකිස්තානය වෙනුවට බෙංගාලය භාවිතා කළයුතුයැයි අපි බොහෝ වාරයක් ඉල්ලා සිටියෙමු. බෙංගාලයට ඉතිහාසයක් ඇත. එයටම ආවේනික වූ සම්ප්‍රදායක් ඇත. ඔබට එය වෙනස් කළහැක්කේ ජනතාවගෙන් විමසීමෙන් පසුව පමණි. මෙම ගැටළුව වැඩිකල් නොයාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පැමිණිය හැකිය. ඔබට එය මේ අවස්ථාවේ භාරගැනීමට අවශ්‍ය ඇයි සහ බෙංගාලින්ගේ රාජ්‍ය භාෂාව පිළිබඳව ඔබට කුමක් කිව හැකිද, මේ සියල්ල සමග එක් ඒකකයක් සලකා බැලීමට අපි සූදානම් වෙමු. එබැවින් අනෙක් පස සිටින්නාවූ මාගේ මිතුරන්හට මම ආයාචනා කරමි. ඕනෑම ආකාරයකින් ඔවුන්ගේ තීන්දුව ලබාදීමට ජනතාවට ඉඩ ලබාදෙන ලෙස සහ එය ජනමත විචාරණයකින් හෝ ඒ ආකාරයේ ක්‍රමයකින් යුක්තව".

1956 දී මුජිබර් කර්මාන්ත, වාණිජ, කම්කරු, දූෂණ විරෝධී හා ග්‍රාම ආධාර අමාත්‍යවරයා ලෙස දෙවන සභාග රජයකදී තේරී පත්වූ නමුත්, පක්ෂ සංවිධානය වෙනුවෙන් පූර්ණ කාලීනව වැඩ කිරීම සඳහා 1957 දී ඉල්ලා අස් වුයේ ය. ජෙනරාල් අයුබ් ඛාන් 1958 දී ව්‍යවස්ථාව අත්හිටුවා යුධ නීතිය පැනවූ විට ප්‍රතිරෝධය සංවිධානය කිරීම සඳහා මුජිබර් අත් අඩංගුවට ගෙන 1961 දක්වා සිරගත කරන ලදි. අයුබ් ඛාන්ගේ පාලන තන්ත්‍රයට විරුද්ධවීම සහ බෙංගාලයින් සඳහා දේශපාලන බලය වැඩිකිරීම සහ නැගෙනහිර පාකිස්තානයේ ස්වාධිනත්වය සඳහා කටයුතු කිරීම සඳහා ශිෂ්‍ය නායකයින් විරෝධතා සංවිධානය කිරීම නිසාවෙන් ඔහු 1962 දී නැවත වරක් අත් අඩංගුවට ගනු ලැබුයේ එම අවස්ථාවේදී ය.



*(භාෂා ව්‍යාපාරයේ දිවි පිදුවන්ට උපහාර දැක්වීම සඳහා මවුලානා අබ්දුල් හමීඩ් ඛාන් භාෂානි සහ ෂෙයික් මුජිබ්ර රහ්මාන් විසින් 1954 පෙබරවාරි 21 වන දින රැලිය පාවහන් නොමැතිව ගමන් කළ අවස්ථාව)*

1963 දී සහ්රාවර්දිගේ මරණයෙන් පසුව මුජිබර් අවාමි ලීගයේ ප්‍රධානියා ලෙස පැමිණියේ ය. එය දැන් පකිස්තානයේ විශාලතම දේශපාලන පක්ෂවලින් එකකි. පක්ෂය විසින් "මුස්ලිම්" යන වචනය සිය නාමයෙන් අතහැර දමා ඇත්තේ ලෞකිකත්වයට එනම් සාම්ප්‍රදායික වර්ගවාදයෙන් වැලකීම සහ මුස්ලිම් නොවන ප්‍රජාවන්ට පුළුල් අවස්ථාවක් ලබාදෙමිනි. ජනාධිපති අයුබ් ඛාන්ගේ මූලික ප්‍රජාතන්ත්‍රවාදී සැලැස්ම, යුධ නීතිය සැකසීම සහ බලය කේන්ද්‍රගතකර පළාත් ඒකාබද්ධ කරන යෝජනා ක්‍රමයට විරුද්ධ වීමට පෙළඹවූ ප්‍රධාන නායකයින්ගෙන් එක් අයෙකු වූයේ මුජිබර්ය. වෙනත් දේශපාලන පක්ෂ සමග වැඩ කරමින් ඔහු 1964 මැතිවරණයේ දී අයුබ් ඛාන්ට එරෙහිව විපක්ෂයේ අපේක්ෂක ෆාතිමා ජින්නාට සහය දැක්වූයේ ය. මුජිබර් මැතිවරණයට සති දෙකකට පෙර අත් අඩංගුවට ගෙන දේශද්‍රෝහී චෝදනාවන් යටතේ වසරක් සිරගත කරන ලදි. මෙම වර්ෂවලදී බෙංගාලයන්ට එරෙහි රාජ්‍ය වෙනස්කම් කිරීම සහ නැගෙනහිර පකිස්තානයේ ගැටලු සහ අවශ්‍යතා නිල වශයෙන් නොසලකා හැරීම පිළිබඳව නැගෙනහිර පකිස්තානයේ අප්‍රසාදය ද වැඩිවිය. ජයග්‍රහණයෙන් බහුතරයක් ලැබුව ද, පකිස්තාන පොලීසිය සහ මිලිටරිය තුළ බෙංගාල ජාතිකයන් දුර්වල ලෙස නියෝජනය විය. ආදායම් වෙන් කිරීම සහ බදුකරණය අතර ගැටුම්ද විය.

දිගින් දිගටම ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ නොසන්සුන්තාවය පකිස්තානය පුරා පැතිර ගිය අතර මුජිබර් පළාත් විසුරුවා හැරීමට එරෙහි විරෝධය තීව්‍ර කළේය. 1966 දී ලාහෝර්හි පැවති විපක්ෂ දේශපාලන පක්ෂවල සංචිත සමුළුවකදී මුජිබර් විසින් ''අපගේ පැවැත්ම පිළිබඳ ප්‍රඥප්තිය'' නමින් කරුණු 06 කින් සමන්විත සැලැස්මක් ප්‍රකාශයට පත්කළ අතර එහිදී පාකිස්තාන සම්මේලනයක් තුළ නැගෙනහිර පාකිස්තානය සඳහා ස්වයං පාලනයක් සහ සැලකිය යුතු දේශපාලන ආර්ථික හා ආරක්ෂක ස්වාධීනත්වයක් ඉල්ලා සිටියේ ය.

මුජිබර්ගේ කරුණු නැගෙනහිර පකිස්තානය පුරා මහජන සහයෝගය උත්ප්‍රේරණය කළ අතර සමහර ඉතිහාසඥයින් විසින් එය කරුණු 6යේ ව්‍යාපාරය ලෙස හඳුන්වනු ලැබීය. එය පාකිස්තානයේ බෙංගාලයන්ගේ ස්වාධීනත්වය සහ අයිතිවාසිකම් සඳහා නියුතු වූ සූදුව ලෙස පිළිගැනේ. මුජිබර් නැගෙනහිර පාකිස්තානයේ හින්දු සහ අනෙකුත් ආගමික ප්‍රජාවන් ඇතුළු බෙංගාලයන්ගේ පුළුල් සහයෝගය ලබා ගත්තේය. කෙසේ වෙතත් ඔහුගේ ඉල්ලීම් බටහිර පාකිස්තානයේ රැඩිකල් ලෙස සලකනු ලැබූ අතර එය සිහින් වැස්මකින් යුතු බෙදුම්වාදය ලෙස අර්ථකතනය කරන ලදි. මෙම යෝජනා බටහිර පාකිස්තාන ජනතාව හා දේශපාලනඥයින් මෙන්ම නැගෙනහිර පාකිස්තානයේ බෙංගාලි නොවන සහ මුස්ලිම් මූලධර්මවාදීන් ද ඒකාබද්ධ කර ඇත.

මුජිබර්ව හමුදාව විසින් අත් අඩංගුවට ගනු ලැබූ අතර වසර දෙකක සිර දඬුවමක් ලැබීමෙන් පසු හමුදා අධිකරණයක දේශද්‍රෝහී නඩු විභාගයක් ආරම්භ විය. අගර්තලා කුමන්ත්‍රණ නඩුව ලෙස පුළුල් ලෙස හැඳින්වෙන මුජිබර් සහ බෙංගාලි හමුදා නිලධාරීන් 34 දෙනා පාකිස්තානය බෙදීමට හා එහි එක්සත්කම, පිළිවෙල හා ජාතික ආරක්ෂාවට තර්ජනය කිරීමේ වැඩ පිළිවෙලක් තුළ ඉන්දීය රජයේ නියෝජිතයන් සමග සම්බන්ධකම් පැවැත්වූ බවට රජය චෝදනා කළේය. මෙම සැලසුම ඉන්දියාවේ ත්‍රිපුර ප්‍රාන්තයේ අගර්තලා නගරයේ සැලසුම්කර ඇති බවට චෝදනා එල්ල විය. විශාල විරෝධතා වැඩ වර්ජන මධ්‍යයේ මුජිබර් අත් අඩංගුවට ගැනීම සහ ඔහුට එරෙහිව ගෙන ආ දේශද්‍රෝහී චෝදනාව විසින් නැගෙනහිර පාකිස්තානය අස්ථාවර කළේය. බෙංගාලි දේශපාලන හා ශිෂ්‍ය කණ්ඩායම් සිසුන්ගේ කම්කරුවන්ගේ හා දුප්පත් ජනතාවගේ ගැටලු විසඳීම

සඳහා ඉල්ලීම් එකතු කරමින් විශාල කරුණු 11 ක සැලැස්මක් සකස් කලහ. එමගින් ආණ්ඩුව වැඩිවන පීඩනයට යටත්වූ අතර කොන්දේසි විරහිතව මුජිබර් නිදහස් කළේය. මුජිබර් නැවත නැගෙනහිර පකිස්තානයට පැමිණියේ මහජන වීරයෙකු ලෙසිනි. 1969 දී අයුබ් ඛාන් විසින් කැඳවන ලද සර්ව පාක්ෂික සමුළුවට සහභාගිවූ මුජිබරී තම කරුණු හය සහ අනෙකුත් දේශපාලන පක්ෂවල ඉල්ලීම් පිළිගන්නා ලෙස ඉල්ලා සිටි අතර එහිදී එය ප්‍රතික්ෂේප කිරීමෙන් පසු ඉවත්ව ගියේය. 1969 දෙසැම්බර් 05 වන දින සහ්රාවර්ධිගේ මරණ සංවත්සරය සැමරීම සඳහා පැවති ප්‍රසිද්ධ රැස්වීමකදී මුජිබර් ප්‍රකාශ කළේ මෙතැන් සිට නැගෙනහිර පකිස්තානය "බංගලාදේශය" ලෙස හඳුන්වනු ලබන බවයි.

"මෙම භූමියෙන් සහ එහි සිතියමෙන් ''බංග්ලා" යන වචනය මකා දැමීමට සියලු උත්සාහයන් දැරූ කාලයක් තිබුණි. බෙංගාල බොක්ක යන යෙදුම හැර "බංග්ලා" යන වචනයේ පැවැත්ම කොතැනවත් දක්නට නොලැබුණි. පාකිස්තානය වෙනුවෙන් මම අද නිවේදනය කරමි. නැගෙනහිර පකිස්ථානය වෙනුවට මෙම භූමිය "බංග්ලාදේශය" ලෙස හඳුන්වනු ඇත."

මුජිබර්ගේ මෙම ප්‍රකාශය රටපුරා, විශේෂයෙන් බටහිර පාකිස්තාන දේශපාලනඥයින් සහ හමුදාව අතර ආතතීන් උත්සන්න කළේය. ඔහු විවෘතව බෙදුම්වාදී නායකයෙකු ලෙස දැකීමට පටන් ගත්තේය. බෙංගාලි සංස්කෘතික හා ජනවාර්ගික අනන්‍යතාව පිළිබඳ ඔහුගේ ප්‍රකාශය කලාපීය ස්වයං පාලනය පිළිබඳ විවාදයද නැවත අර්ථ දැක්වීය. රෙ ජනගහනයෙන් බහුතරයකගේ වාසස්ථානය වූ නැගෙනහිර පාකිස්තානය පුරා සහයෝගය ලබාගැනීමට මුජිබර්ට හැකියාව ලැබූ අතර එමගින් ඔහු පාකිස්තානයේ බලවත්ම දේශපාලන චරිතයක් බවට පත් වුයේ ය. මුජිබර්ට ඔහුගේ ආධාරකරුවන් විසින් " බංගබන්ද්" ලෙස ඔහුව වැඩි වැඩියෙන් හඳුන්වනු ලැබුවේ ඔහුගේ කරුණු 06 කින් යුත් සැලැස්මට අනුවය.ඒ අනුව ඉතා දුෂ්කර දේශපාලන ගමන් මගක පැමිණි එතුමා 1971 දී බංගලාදේශයේ නායකත්වයට පැමිණියේය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව

බංගලාදේශය පිළිබඳව සාකච්ඡා කිරීමේදී අමතක කළ නොහැකි දේශපාලන නායකයෙකු හමුවේ. ඔහු නමින් ෂෙයික් මුජිබර් රහ්මාන් වේ. වර්තමාන ස්වාධීන බංගලාදේශය යනු මෙතුමාගේ ජාත්‍යාලයෙහි, එතුමාගේ කැපවීමෙහි ප්‍රතිඵලයකි. මොහුගේ දැඩි නොහැකි කැපවීම, බිඳ හෙළිය නොහැකි අධිෂ්ඨානය සහ යුත් නායකත්වය බංගලාදේශ ජනතාවට ස්වාධීන රාජ්‍යයක අයිතිය තහවුරු කර දුන් බව කිව මනාය.ඒ අනුව ඔවුන්ගේ ස්වාධීන රාජ්‍යයක සිහිනය 1971 මාර්තු 26 දින සැබෑවක් බවට පත් විය. මෙතුමා මිනිසුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සුරකින  නායකයෙකු ලෙස හඳුන්වාදිය හැකිය. ෂෙයික් මුජිබර් රහ්මාන්ගේ  නායකත්ව ගුණාංග සහ කැපවීම හේතුවෙන් ඔහු "බංගලාදේශ ජාතීයේ පියා" ලෙස හඳුන්වයි.ඔහු රටේ ස්වාධීනත්වය, සාමාන්‍ය ජනතාවගේ නිදහස හා අයිතීන් වෙනුවෙන් අරගල කිරීමට ඔවුන් සියලු දෙනා ඒකරාශි කළේය. තම ජීවිතය කැප කරමින් සාමාන්‍ය ජනතාව හා තම දේශය වෙනුවෙන් අරගල කළ මෙම ජනනායකයා බංගබන්දු ලෙස ද හැඳින්වේ. එනම් බංගලාදේශයේ යහළුවා (Friend of bangladesh) යන අදහසය.

මෙතුමා නායකත්වයට පිවිසීමෙන් පසු සිදු කළ සේවය මෙතෙකැයි කියා නිම කළ නොහැකි තරම් ය. මෙතුමා බංගලාදේශයේ පළමු ජනාධිපතිවරයායි. ඔහු විසින් සිදු කළ ප්‍රධානතම සහ වටිනතම සේවය නම් බංගලාදේශ ජනතාවගේ නිදහස්  රාජ්‍යයක සිහිනය සැබෑ කිරීමයි. 1971 වන තෙක්ම නොලත් නිදහස මෙතුමාගේ සමයේ ලබාගත හැකිවිය. සරල අධිෂ්ඨානශීලී සහ විශ්වාසනීය රකින නායකයෙකු වන  මෙතුමා නිදහසේ සංකේතය ලෙසත් මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කරන්නා ලෙසත් හැඳින්විය හැකිය.එපමණක් නොව පැහැදිලි දැක්මකින් යුතු නායකයෙකු වන මෙතුමා බංගලාදේශයේ සංවර්ධනයට හා කාර්මීකරණයට  මහඟු සේවයක් කළ නායකයෙකු බව කිව යුතුමය. 1974 දෙසැම්බර් 15 වන දින ඔහු කළ කතාවක දී මෙසේ ප්‍රකාශ කළේය.

"රන්වන් බංගලාදේශයක් නිර්මාණය කිරීමට අපට රත්තරන් මිනිස්සු අවශ්‍යයි. බංගලාදේශය සූරා කෑම්, මංකොල්ලකෑම් සහ වධහිංසාවලට නිතර ලක්වෙනවා. මේ ප්‍රශ්න විසඳීමට සහ ස්වාධීන, සමෘද්ධිමත් රටක් නිර්මාණය

කිරීමට මිනිසුන්ට උනන්දුවෙන් වැඩ කිරීමට සහ නිෂ්පාදන වැඩි කිරීමට සිදුවනවා."

බංගලාදේශ නිදහස් සටන හමුවේ ඒ වන විට එරටෙහි තිබූ භයානක තත්වය හඳුනා ගත් මෙතුමා මෙවැනි සාමාන්‍ය ජනතාවගේ හදවතට ආමන්ත්‍රණය කරන වදන් ඔවුන් අතරට යවමින් ඔවුන් දිරි ගන්වමින් එම තත්වය  වෙනස් කිරීමට මහගු උත්සාහයක් දැරනු ලැබුවේ ය. සියලු දෙනා එක් මාවතකට ඒකරාශී කර ජාතික අරමුණු ඉටුකර ගැනීම පිළිබඳ දැඩි ලෙස විශ්වාස කළ ඔහුට නිදහසින් පසු ඉතා සුළු කාලයක් තුළ සාර්ථකත්වය සඳහා වූ මාවතේ සැලකිය හැකි දුරක් ගමන් කිරීමට හැකි වුයේය. මෙතුමා නායකත්වයට පැමිණෙන විට එරට සතු වූයේ ඩොලර් බිලියන 8ක පමණ ආර්ථිකයකි. නමුත් ඔහුගේ නායකත්වය හමුවේ පැවැති බාධක බිඳ දමමින් ආර්ථිකය දියුණු වන්නට පටන් ගත්තේ ය.ඒ අනුව මුජිබර් මෙරට ආර්ථිකය නැවත ස්තාපිත කිරීමට දේශීය සම්පත් හා අන්තර්ජාතික සහයෝගය ලබා ගැනීමට කටයුතු කළේ ය.

බංගලාදේශයේ කාර්මීකරණයට හා සංවර්ධනයට මෙතුමා දැක්වූ දායකත්වය අදටත් එරට ජනතාවගේ චිත්ත සන්තානය තුළ සැඟවී ඇති බව නොඅනුමානය.පැරණි ශ්‍රී විභූතිය විසින් පණ ගන්වන ලද ඔහුගේ දැක්ම වූයේ "සොනාර් බංගලා" (Sonar Bangla) හෙවත් සශ්‍රීක බංගලාදේශය නැවත ස්තාපිත කිරීමයි.මෙය හුදු දේශපාලන අරමුණක්ම නොවුණ අතර ඔහුට සැබැවින් ම අවශ්‍ය වූයේ තම රට නගා සිටුවීමයි. බංගලාදේශය කෘෂිකර්මාන්තය සඳහා ප්‍රසිද්ධ රටකි.එයට හේතුව වන්නේ එහි ඇති සරුසාර පස,හිතකර භූගෝලීය හා කාලගුණික තත්වයයි. සේද,කපු,කුළු බඩු ආදිය අපනයනය මෙන්ම නැව් තැනීමේ කර්මාන්තය ද සිදු කරන රටක් ලෙස මෙය හඳුන්වාදිය හැකිය. බංගලාදේශය අතීතයේ වෙළඳ මධ්‍යස්ථානයකි.මුජිබර් මෙම අතීතය පිළිබඳ හොඳින් දැනුවත් වූවකු වන අතර ඔහු එම තත්වය නැවත ළඟා කර ගැනීමට කටයුතු කළ දේශපාලන නායකයෙකි.

එපමණක් නොව ආරම්භයේ දී පකිස්තානය බංගලාදේශයට සමාන ලෙස නොසැලකීය.මේ පිළිබඳව මනාව දැන සිටි මුජිබර් "කර්මාන්ත ෆෙඩරල් පාලන පනත" තරයේ හෙලා දකින ලදී. එමගින් පළාත්බද ආණ්ඩුව නොසලකා හැර

සියලුම කර්මාන්ත ශාලාවල පාලනය මධ්‍යම ආණ්ඩුවට ලබා දීම සම්බන්ධව ඔහු දැඩි සේ විරුද්ධ වුයේ ය.එහිදී නැගෙනහිර පකිස්තානය කෘෂිකර්මාන්තයට වඩා ප්‍රසිද්ධ වූවත් රජය මගින් බටහිර පකිස්තානයට වැඩිපුර අනුග්‍රහය දෙන ලදී. 90% ක් පමණ හණ අපනයන නැගෙනහිර පකිස්ථානය විසින් සිදු කළද,ඒවායේ බිල් බටහිර පකිස්තානයේ දී ගෙවිය යුතු විය.විශාල පරිමාණයේ කර්මාන්ත රැසක් මේ ආකාරයට බටහිර පකිස්තානයේ පාලනය යටතේ විය.එබැවින් මෙතුමා මෙයට දැඩි සේ විරුද්ධත්වයක් දැක්වීය.ඔහු මේ සඳහා නැගෙනහිර පකිස්තාන ජනතාව වෙනුවෙන් බදු ධනාත්මක වෙනසක් සිදු කිරීමට කටයුතු කළේය.ඔහු නැගෙනහිර පකිස්තාන ජනතාවට සාධාරණ ආර්ථික වාසි ලබා ගැනීම සඳහා මධ්‍යම රජය සමඟ සාකච්ඡා කළේය.එසේම තම දේශයෙහි කාර්මීක දියුණුවට ද විශාල මෙහෙවරක් ඉටු කළේය.

- ආනයන බලපත්‍ර පළාත් සභා විසින් නිකුත් කිරීම.
- හණ,කපු, රෙදිපිළි වැනි කර්මාන්ත පළාත් සභා විසින් පාලනය කළ යුතුය.
- ආනයන,අපනයන ප්‍රධාන පාලන කාර්යාලයක් නැගෙනහිර පකිස්තානයේ ස්ථාපනය කිරීම.
- වෙනම සැපයුම් හා සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජෙනරල් කාර්යාලයක් නැගෙනහිර පකිස්තානයට ලබාදීම.
- විදේශ විනිමයෙන් 50%ක් නැගෙනහිර පකිස්තානයට ලබාදීම
- වැනි සේවාවන් රැසක් මෙතුමා විසින් සිදු කරන්නට විය.

මුජිබර් යෝජනාවට අනුව නැගෙනහිර පකිස්ථානය ඔවුන්ගේ කර්මාන්තවල හා වෙළඳාමේ සම්පූර්ණ පාලනය 1957 අත්කරගත්හ. මධ්‍යම රජය ඔහුගේ යෝජනාවට ධනාත්මක ප්‍රතිචාර දක්වන ලදි. නමුත් කල්යත්ම ඔවුන් සිය පොරොන්දු කඩකිරීම හේතුවෙන් මෙම අසාධාරණයට විරුද්ධව දේශපාලන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට මෙතුමා පියවර ගත්තේය. එහි ප්‍රතිඵලයක් ලෙස ඔහුට සිරගත විමට පවා සිදු විය.කෙසේ වෙතත් මොහුගේ දේශපාලන ක්‍රියා හමුවේ අයුබ් ඛාන් රෙජිමය කඩා වැටුණේය.නැගෙනහිර හා බටහිර පකිස්ථානයට වෙනම ආර්ථිකයක් යෝජනා කළ ප්‍රථම පුද්ගලයා මුජිබර්

වේ. ඔහුගේ එම වෙනම ආර්ථිකයක් නිර්මාණය කිරීමේ දැක්ම 1971 නිදහස් සටනට පාදක වූ බව කිව මනාය. මන්ද ,එය සාමාන්‍ය ජනතාවගේ සිත තුළ ද ඒ වන විට දැඩි ලෙස එල්බගෙන තිබූ නිසාවෙනි. සාමාන්‍ය ජනතාවගේ හදවතට කතා කිරීමට දක්ෂ වූ මෙතුමා පළමු නිදහස් සැමරුමේ දී මෙසේ ප්‍රකාශ කලේ ය.

"අපි මේ යුද්ධයෙන් විනාශ වූ රට සශ්‍රීක රටක් බවට පරිවර්තනය කරමු. බෙංගාලයේ අනාගත මව්වරුන් සිනාසේවී, දරුවන් සෙල්ලම් කරාවි. එම සමාජය සූරාකෑම්වලින් තොර සමාජයක් වනු ඇත. කුඹුරු, කර්මාන්තශාලා සියල්ලෙහි සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කරන්න. අපට අනිවාර්යෙන්ම මේ රට නැවත සශ්‍රීක රටක් බවට පත් කළ හැකියි. අපි එකට වැඩ කරමු. එවිට නැවත රන්වන් බෙංගාලය (Golden Bengal) දිදුලන්න පටන්ගනීවි."

මෙහිදී මෙතුමා කෘෂිකර්මාන්තයට හා කාර්මීකරණයට ප්‍රමුඛත්වයක් දෙමින් තම දේශය සංවර්ධනය කිරීමේ ව්‍යාපාරයෙහි යෙදුණ බව පෙනීයයි. කෘෂිකර්මාන්තය දේශීය ජනයාගේ කුස ගින්න නිවනවා පමණක් නොව එය මෙරටෙහි ප්‍රධාන ආදායම් මාර්ගය බව ද මෙතුමා හඳුනාගෙන තිබේ. එබැවින් නිදහස ලබා ගැනීමෙන් පසු ඔහු එම ආදායම් මාර්ගය දියුණු කිරීමට ප්‍රමුඛත්වය දි කටයුතු කළේය. එහිදී ඔහු, යුද්ධයෙන් විනාශ වූ කෘෂිකර්මාන්තයට අවශ්‍ය යටිතල පහසුකම් සංරක්ෂණය කරන ලදී. කෘෂිකාර්මික උපකරණ නොමිලේ සහ සාධාරණ මිලට ලබාදීම, බීජ ලබා දීම, පකිස්තාන ආණ්ඩු සමයේ ගොවීන්ට තිබූ ණය සම්බන්ධ නඩු අවලංගු කිරීම, සාධාරණ මිලක් කෘෂි නිෂ්පාදනවලට ලබා දීම, දුප්පත් ගොවීන්ට සලාක පහසුකම් ලබාදීම, මේ ආකාරයේ සහනශීලී සේවාවන් රැසක් ඔහුගේ පාලන සමයේ දී සිදුවිය.

මුජිබර් රහ්මාන් කාර්මීකරණය හා කර්මාන්තශාලා සංවර්ධනය කිරීමේ වැදගත්කම ද හඳුනාගත්තේය. එමගින් රැකියා උත්පාදනය, භාණ්ඩ අපනයනය වැනි අවස්ථා රැසක් පිළිබඳ ඔහුගේ අවධානය යොමුවිය. නමුත් මෙහිදී අත්දැකීම් සහිත ව්‍යවසායකයින් හා ප්‍රමාණවත් අන්තර්ජාතික සහයෝගය නොමැතිකම වැනි අභියෝග රැසකට මුහුණදීමට ඔහුට සිදු වුයේය. මුජිබර් රහ්මාන් පළාත් සභා මන්ත්‍රීවරයෙකු ව සිටි කාලයේ දී ව්‍යාපාර පිරිවැය අවම කිරීමට නව

පනතක් යෝජනා කරන ලදී. එම කාලය තුළදී ඔහු දේශීය හා විදේශීය ව්‍යවසායකයින් නැගෙනහිර පාකිස්තානය වෙනුවෙන් මුදල් යෙදවීමට දිරිගන්වන ලදී. නිදහස ලබා ගැනීමට පෙර මෙම ක්‍රියාදාමය ක්‍රියාවට නැංවීම දුෂ්කර විය. මන්ද, පුද්ගලික ආයතනවලට නැගී සිටීමට ඉඩක් නොලැබුන නිසාවෙනි. නමුත් නිදහස ලබා ගැනීමෙන් පසු මුජිබර් විසින් ප්‍රධාන බැංකු, රක්ෂණ සමාගම්, හණ, සීනි සහ රෙදිපිළි කර්මාන්ත ශාලා රජයට පවරා ගත්තේය .මෙතුමා විසින් මෙම ආයතන රජයට පවරා ගනිමින් ජනසතු කිරීමට කටයුතු කිරීම ඉතා දූරදර්ශී තීරණයක් වන්නේ ඔහු සමාජය සාධාරණත්වය කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ නායකයෙකු නිසාවෙනි. කෙසේ වෙතත් මෙතුමාගේ පාලන සමයේ මැද භාගයේ දී පුද්ගලික අංශයට ද අවධානය යොමු විය. ඒ අනුව අත්හරින ලද කර්මාන්තශාලා 133ක් පුද්ගලික අංශයට ලබා දුන්නේය. එබැවින් ඉතා සමබර ලෙස ආර්ථිකය හසුරුවමින් තම දේශය වෙනුවෙන් මනා කැපවීමෙන් සේවය කළ ජන නායකයෙකු ලෙස ෂෙයික් මුජිබර් රහ්මාන් ඉතිහාස ගත වී ඇත.කෙසේ වුවත්,මේ ආකාරයේ විශාල සේවයක් කළ මෙතුමා සහ පවුලේ සියලු දෙනා (මෙතුමාගේ විදෙස්ගතව සිටි දරුවන් දෙදෙනා හැර) බංගලාදේශ හමුදා කැරලි කණ්ඩායමක් විසින් 1975 අගෝස්තු මස ඝාතනය කරන ලදී.

## විදේශ ප්‍රතිපත්තිය

විදේශ ප්‍රතිපත්ති නිර්මාණය සහ ක්‍රියාවට නැංවීම රාජ්‍යයක නායකයාගේ දේශපාලන දර්ශනය හා අනෙකුත් රාජ්‍යයන් සමඟ සබඳතාවල සමානත්වය මත පදනම් වේ. විදේශ ප්‍රතිපත්තියක සාර්ථකත්වය එම ප්‍රතිපත්තිය බලය මත පමණක් ම පදනම් නොවන අතර ඒ සඳහා ප්‍රබල නායකත්වයක් ද අවශ්‍ය වේ. සැබැවින් ම ජාත්‍යන්තර සබඳතාමය වශයෙන් රටක සාර්ථකත්වය අන්‍යෝන්‍ය විදේශ ප්‍රතිපත්ති හා නායකත්වය මත පදනම් වේ. බංගලාදේශයටද මෙය පොදු ධර්මතාවයකි.

ෂෙයික් මුජිබර් රහ්මාන් ජනවාරි 8 උදෑසන රහසේම ලන්ඩනයට පැමිණියේ 1972 ජනවාරි 7 රාත්‍රියේ ඔහු පකිස්තාන සිර මැදුරෙන් නිදහස් වූ පසුවය

.ලන්ඩනයේ දී ඔහු බ්‍රිතාන්‍ය අගමැති එඩ්වඩ් හෙත් (Edward Heath)හමු වුයේය. ජනවාරි 10 ඔහු ඉන්දියාව හරහා බංගලාදේශයට නැවත පැමිණියේ ය.ඔහුට නව දිල්ලිහිදී ඉන්දියානු ජනපති වී.වී.ගිරි (V.V.Giri) සහ ඉන්දීය අගමැති ඉන්දිරා ගාන්ධි (Mrs.Indira Gandhi) මැතිනිය, ඉන්දීය මැති ඇමැතිවරුන් සහ මිලියනයක් තරම් ජනතාවගේ උණුසුම් පිළිගැනීමක් ලැබුණේ ය.

නැවත බංගලාදේශයට පැමිණි මුජිබර්ට ඉතිරිව තිබුණේ දැවී ගිය නිවාස හා කැඩුණු මංමාවත් ය. මධ්‍යම බැංකුව ද හිස් විය. එම අවස්ථාවේදී තම මව් රටේ මෙන් ම එරට ජනතාවගේ ද වගකීම ඔහුගේ කර මත පැටවුණි. ස්වාධීන බංගලාදේශයක් නිර්මාණය කිරීමේ සිහිනයෙන් ඔහු වික්ෂිප්ත වුයේය. සැබැවින් ම එය කළ හැකි වූයේ මුජිබර් රහ්මාන් වැනි නිර්භීත,දේශප්‍රේමී ජන නායකයෙකුට පමණි. දැඩි ආත්ම විශ්වාසයකින් හා දුර දක්නා නුවණකින් යුතු ඔහු වැනි පුද්ගලයෙකු තවත් එක් විනාඩියක් හෝ නොඉද තම දේශය ගොඩනැගීමේ කටයුතු ආරම්භ කිරීම පුදුමයට කරුණක් නොවන බව පැහැදිලිය. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කිරීම ආරම්භ විය. එසේම විදේශ ප්‍රතිපත්ති නිර්මාණය ද සිදු විය. "සියලු දෙනා සමඟ මිත්‍රශීලී හා කිසිවෙකු හා ද්වේෂ නොවීම" සහ "මිත්‍රශීලී සහජීවනය" එවැනි ශක්තිමත් සබඳතාවයක් අනෙකුත් ජාතීන් සමඟ බංගලාදේශ ජනපති නිර්මණය කළේය. මුජිබර් දේශීය ජනයාගේ සුබසාධන පමණක් නොව ලෝකයේ ඇති අනුවේදනීයත්වය පිළිබඳව නිතර සිතුවේය. ඔහු නිතර පැවසූ දෙයක් වේ. එනම්, "ලෝකය කොටස් දෙකකට බෙදිලා තියෙනවා- පීඩා කරන්නන් සහ පීඩිතයින්. එසේම "අප පීඩිතයින්". කොතනක හෝ අසාධාරණයක් සූරාකෑමක් සිදු වේ නම්, මුජිබර් කිසිදා නිහඬව නොසිටියේ ය. ඔහු උපතින්ම පීඩිතයින් වෙනුවෙන් හඬ නැගූ ලෝක නායකයෙකි. ඔහු අප්‍රිකාවේ වර්ණභේදවාදයට එරෙහිව නැගී සිටියේ ය, පලස්තීන ජනතාව සමඟ එකමුතු බව ප්‍රකාශ කළේ ය, එසේම ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පත්කර ගත් සයිප්‍රස්හි ආණ්ඩුව බිඳ හෙලීම පිළිබඳ දොස් පැවරීය. 1972 පෙබරවාරි 6 දින මුජිබර් කොල්කටාවට ගියේ ය. එම සංචාරයේදී ඉන්දීය හමුදා මාර්තු වන විට බංගලාදේශයෙන් ඉවත් කර ගැනීමට තීරණය කළේය. ඒ අනුව, මාර්තු 1 වන දින ඉන්දියාව විසින් සිය හමුදා ඉවත් කර ගන්නා ලෙස ප්‍රකාශයට පත්කොට ඔවුන් මාර්තු 15 වන විට සම්පූර්ණයෙන් ඉවත් කර ගන්න ලදී. පසුව

පෙබරවාරි 29 සිට ඔහු මාර්තු 1වන දින දක්වා රුසියාවේ මොස්කව්හි සංචාරයක නිතර වූයේය. බෙංගාලි දේශපාලකයෙකු විසින් සමාජවාදී රාජ්‍යයක නායකයින් සමඟ සබඳතා පැවැත්වූ පළමු අවස්ථාව මෙය වේ.මෙය අධ්‍යාපනික හා ආර්ථික සබඳතා තර කිරීමට කරන ලද සංචාරයකි. එහි ප්‍රතිඵල වශයෙන් බෙංගාලි ශිෂ්‍යයන්ට සෝවියට් දේශයෙහි උසස් අධ්‍යාපනය සඳහා අවස්ථාව හිමි විය. එසේම, යුද්ධයෙන් විනාශ වූ චිතගොන් තොටුපළ ප්‍රතිසංස්කරණ කිරීමට සෝවියට් සහය ලැබුණි.



*( ඉන්දීය අගමැතිනිය ,ඉන්දිරා ගාන්ධි සහ ෂෙයික් මුජිබර් රහ්මාන් වසර 25ක මිත්‍ර, සහයෝගිතා හා සාම ගිවිසුමක් අත්සන් කිරීම)*

අනතුරුව මාර්තු 17 දින ඉන්දීය අගමැතිනිය , ඉන්දිරා ගාන්ධි බංගලාදේශයට පැමිණියේය. එහිදී ඔවුන් වසර 25ක මිත්‍ර, සහයෝගිතා හා සාම ගිවිසුමක් අත්සන් කරන ලදී.1971 බංගලාදේශය නිදහස් සටන සමයේදී දැඩි මිත්‍රශීලී රටවල් දෙකක් වූ ඉන්දියාව හා බංගලාදේශය අතර සමාජ ,ආර්ථික හා සංස්කෘතික සම්බන්ධය මෙම ගිවිසුම සමඟ තවදුරටත් වර්ධනය වුයේය.අගෝස්තු 18 දින මුජිබර් බ්‍රිතාන්‍ය අගමැති එඩ්වඩ් හීත් (Edward Heath) හමු වුයේය. අගෝස්තු 21 දින ඔහු ලන්ඩනයේ සිට ජිනීවා බලා පිටත් වූයේ ස්විස්ටර්ලන්තයේ ආරාධියෙක් වශයෙනි. සැප්තැම්බර් 13 දින ඔහු නැවත පැමිණීමේදී ඉන්දීය අගමැතිනිය, ඉන්දිරා ගාන්ධි සමඟ නව දිල්ලියේ දී සාකච්ඡාවකට සම්බන්ධ වුයේ ය.1972 ජූනි බංගලාදේශය අන්තර්ජාතික මූල්‍ය අරමුලෙහි (IMF –International monetary found) සාමාජිකයෙකු මෙන්ම සැප්තැම්බර් 20 දින ජාත්‍යන්තර පාර්ලිමේන්තු සංගමයේ ද (International Parlimentary Union) සාමාජිකයෙකු විය. ජුනි 22 ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO-International Labour Organization) සාමාජිකයෙකු ද විය.තවද, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක, සංස්කෘතික සංවිධානයේ

(UNESCO-United Nations Educational Scientific Cultural Organization) සාමාජිකත්වය, කොළඹ ක්‍රමයෙහි (Colombo plan) හා තීරු බදු හා වෙළඳාම පිළිබඳ පොදු ගිවිසුමෙහි සාමාජිකත්වය ද හිමි විය. 1972 අගෝස්තු 8 දින බංගලාදේශය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයාට එහි සාමාජිකත්වය ලබාගැනීමට නිල වශයෙන් අයදුම්පතක් භාර දෙන ලදී. අගෝස්තු 10 වන දින එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ සියලු දෙනාගේ සහාය ඉල්ලමින් මුජිබර් විසින් ඔවුන්ට ලියුමක් යවන ලදී.අගෝස්තු 23 එක්සත් රාජධානිය, ඉන්දියාව, රුසියාව හා යුගොස්ලෝවියාව විසින් බංගලාදේශ සාමාජිකත්වය සඳහා ආරක්ෂක මණ්ඩලයට යෝජනා කළද චීනය තම නිශේධ බලය පාවිච්චි කර එය තහනම් කළේය. කෙසේ වෙතත් නොවැම්බර් 30 දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් බංගලාදේශ සාමාජිකත්වය නිර්දේශ කළේය.සැප්තැම්බර් මාසයේ දී එක්සත් රාජධානිය විසින් වියට්නාමයට බෝම්බ දැමීම නවත්වන ලෙස බංගලාදේශ සාම සභාව විසින් එක්සත් රාජධානියෙන් ඉල්ලා සිටියේය. පැට්‍රිස් ලුලුම්බා සෝවියට් විශ්වවිද්‍යාලය (Patrice Lulumba University of USSR) විසින් මුජිබර්ට සාම පදක්කම පිරිනැමීමට තීරණය කරන ලදී.බංගලාදේශ විදේශ ප්‍රතිපත්ති ය ඇමරිකා එක්සත් ජනපද කෙරෙහි තිබූ ආකාරය සැලකීමේදී ප්‍රධාන අදියර දෙකක් හඳුනාගත හැකි ය.

01) මුජිබර් සහ ඔහුගේ ආණ්ඩුව,ඇමරිකා එක්සත් ජනපද ජනතාවට 1971 දී බංගලාදේශට ලබා දුන් සහයෝගය සම්බන්ධව ඔවුන්ට ස්තුතිවන්ත වීම.

02) බංගලාදේශ නිදහස් සටනේ දී නික්සන් කිසිංගර් (Nixon Kissinger) පකිස්තානයට නැඹුරු වීම විවේචනාත්මක විය.

1971 දී සෙනෙටර් එඩ්වඩ් (Senator Edward) වැනි ඇමරිකානු දේශපාලකයින් බංගලාදේශය වෙනුවෙන් හඬ නගා සිටි ආකාරය අමතක කළ නොහැක. මුජිබර්ගේ ආණ්ඩුවේ රාජ්‍ය තාන්ත්‍රික සාර්ථකත්වය 1972 අප්‍රේල් මස වොෂින්ටනය විසින් බංගලාදේශය පිළිගැනීමත් සමග අවශ්‍යයෙන් ම බාහිර ලෝකය ආවරණය කළේය. බංගලාදේශ - කියුබා සබඳතා හේතුවෙන් දෙරට අතර සබඳතා තරමක් දුරට දුරස් වුවද ඩකාහි ආණ්ඩුව වොෂින්ටනය සමඟ සබඳතා නිර්මාණය කර ගැනීමේ අවස්ථාව මග හැරියේ නැත.බංගලාදේශය

ලෝක බැංකුව සමඟ සබඳතා පටන් ගැනීම මෙරට විදේශ ප්‍රතිපත්තියෙහි ප්‍රධාන සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැක. එය මෙරට නිදහස් විදේශ ප්‍රතිපත්තියෙහි පිළිබිඹුවක් ලෙස දැක්විය හැකි වන්නේ එය තෘෂ්ණී යුද සමයේ සිදු වූ නිසාවෙනි.එසේම, දැඩි තේරීමක් කිරීමේදී කිසිදු බල කඳවුරකට ගැති නොවිය යුතු බව මුජිබර්ගේ ආණ්ඩුව ඒත්තු ගැන්වීය. ඒ අනුව ඔවුන් බල කඳවුරු දෙක සමග අවශ්‍ය වූ විට සහයෝගයෙන් කටයුතු කළේය.

1973 වසරේ සැප්තැම්බර් විදේශ අමාත්‍යවරු බංගලාදේශයට නොබැඳි ව්‍යාපාරයේ සාමාජිකත්වය තහවුරු කළහ.එම වසරේදි ම පැවති නොබැඳි සමුළුවට සහභාගි වීමට මුජිබර් රහමාන්ට අවස්ථාව හිම විය. එහිදී බංගලාදේශය හා අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර සබඳතා වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු විය .එසේම තෘෂ්ණී යුද සමයේදී බල කඳවුරු දෙක සමඟ ගනුදෙනු කිරීමේ දී බංගලාදේශය නොබැඳි ව්‍යාපාරය හා සම්බන්ධ වී සිටීම වාසිදායක විය .



*(ෂෙයික් මුජුබර් රහ්මාන් එක්සත් ජාතින්ගේ සංගමය ඇමතීම)*

1974 සැප්තැම්බර් 14 දින එක්සත් ජාතීන්ගේ 136 වන සාමාජිකයා ලෙස මහ මණ්ඩල රැස්වීමට සහභාගි වීමට අවස්ථාව හිමිවිය. එහිදී ඔක්තෝබර් 1වන දින ඇමරිකා එක්සත් ජනපද ජනපති ජෙරල්ඩ් ෆෝ(ර්)ඩ් හමු වුයේය.එසේම බංගලාදේශය ඉස්ලාමීය බැංකුවේ ආරම්භක සාමාජිකයෙකු විය. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් නැමීබියානු කොමිසම සඳහා 1974 දෙසැම්බර් 19 වන දින බංගලාදේශය නිර්දේශ කිරීමද බංගලාදේශය ජාත්‍යන්තරයේ කැපීපෙනෙන රාජ්‍යයක් බවට පත් කළේය .ලෝක සංචාරක සංවිධානයේ (World Tourism Organization) විධායක සභාවට බංගලාදේශය පත් වීම, ලෝක සෞඛ්‍ය සංවිධානයේ (World Health Organization) විධායක

මණ්ඩලයට පත් වීම ද ඔවුන් ලද සුවිශේෂී ජයග්‍රහණ අතර වේ. ලෝක ආහාර මණ්ඩලයේ උප සභාපති ලෙස බංගලාදේශය පත් වීමද මෙහි දැක්විය යුතුම වේ.

ඒ අනුව මෙතුමාගේ සමයේ විදේශ ප්‍රතිපත්තිය කොතෙක් සාර්ථක ද යන්න දැකගතහැකිය. සැබැවින්ම සෞදි අරාබිය, සුඩානය, ඕමානය සහ චීනය හැර අනෙකුත් සෑම රාජ්‍යයක්ම බංගලාදේශය මෙකල ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගත්හ. එබැවින් මෙම සමයෙහි විදේශ ප්‍රතිපත්තියේ සාර්ථකත්වය පිළිබඳ තව දුරටත් කරුණු දැක්විය යුතු නොවේ. මුජිබර් රහ්මාන්ගේ නායකත්වය, ස්වාධීන, පැහැදිලි දැක්ම හා පෞද්ගලිකව ඔහු හා ජාත්‍යන්තර නායකයන් සමඟ පැවති මිත්‍රශීලී සබඳතා ද මෙහි සාර්ථකත්වයට සෘජුව ම දායක වූ බව පෙන්වා දිය හැකිය.මෙතුමා අනුගමනය කළ සාර්ථක විදේශ ප්‍රතිපත්තිය හමුවේ ඔහු තරම් වෙනත් කිසිදු නායකයෙකුට සාර්ථකව තම විදේශ සබඳතා හරහා තම දේශය නංවාලීමට හැකි වූවාද යන්න සැබැවින් ම ප්‍රශ්නාර්ථයකි. මන්ද, ඔහු එතරම්ම සාර්ථක විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළ නායකයෙකි.

## ගත හැකි ආදර්ශ

බංගලාදේශ දේශපාලන ඉතිහාසයේ තම දේශය වෙනුවෙන් අද්විතීය, අසහාය මෙහෙවරක් කළ බංගලාදේශ නායක ධුරාවලියේ එන ඉතා සුවිශිෂ්ට පාලකයෙකු ලෙස ෂෙයික් මුජිබර් රහ්මාන් (Sheik Mujibur Rahman) පෙන්වාදිය හැකිය. ස්වාධීන බංගලාදේශයක් බිහි කිරීමෙහිලා මෙතුමාගේ කැපවීම, උත්සාහය, අධිෂ්ඨානය ඉතා අගනේ ය. මෙතුමාගේ ජීවිත කතාව තුළින් ගතහැකි ආදර්ශ ගණනාවක් වේ. එය එතුමාගේ කුඩා කල පටන් මරණය දක්වාම සුවිශේෂී සන්ධිස්ථානයන්හිදී විවිධාකාරයෙන් උද්දීපනය වී ඇත.

මෙතුමාගේ දිවියේ කැපී පෙනෙන සුවිශේෂී ආදර්ශයක් ලෙස තම දිවියේදී තමාට මුහුණදීමට සිදුවන විවිධාකාරයේ බාධකයන්ට ජීවිතාදිෂ්ටානයෙන්, විශ්වාසයෙන් යුක්තව මුහුණ දුන් ආකාරය කැපී පෙනේ. එය ඔහුගේ කුඩා කාලයේ සිටම දැකගැනීමට හැකිවූ සුවිශේෂී ගුණාංගයයි. ඔහු සිව්වන ශ්‍රේණිය

සඳහා 1931 දී "මදිරපූර් ඉස්ලාමීය උසස් පාසලට" ඇතුළත්වී මොහු 1934 දී ඉන් ඉවත්ව යනුයේ අක්ෂි ශල්‍යකර්මයකට යොමුවීමට සිදුවූ බැවිනි. නැවතත් වසර හතරකට පසු පාසලට ඇතුළත් වන්නේ කුඩා කාලයේදීම තමාට තිබූ බාධාවකින් ජය ලැබීමෙන් අනතුරුව වේ. හුදෙක් කුඩා කාලයේදී පමණක් නොව ඔහු නායකත්වයට පිවිසීමේ ගමන් මාර්ගයේදී නොයෙක් ආකාරයේ බාධාවන්ට විවිධ අවස්ථාවන්හිදී මුහුණ දිමට සිදු වුයේය. ඒ අතුරින් කැපී පෙනෙන බාධකය වනුයේ ඔහු වරින් වර අත් අඩංගුවට පත්වීමයි. විවිධ හේතූන් මුල් කර ගනිමින් මොහු විවිධ අවස්ථාවන්හිදී අත් අඩංගුවට පත් වුයේය. ඉන් එක් අවස්ථාවක් ලෙස 1949 ජනවාරි 26 වන දින රජය ප්‍රකාශ කළේ උර්දු භාෂාව නිල වශයෙන් පාකිස්තානයේ රාජ්‍ය භාෂාව වනු ඇති බවයි. මීට විරුද්ධව නැගී සිටි මොහු මාර්තු 11 වන දින අත්අඩංගුවට ගනු ලැබුවේය. ඔහුගේ මෙවන් අභියෝගයන්ට මුහුණදීමේ අවසන් ප්‍රතිඵලය වූයේ ඔහුට ස්වාධීන බංගලාදේශයක් නිර්මාණය සඳහා මූලික අඩිතාලම එක්වීම ය. එපමණක් නොව මොහු, මොහුගේ පාලන සමය තුළදී ද විවිධාකාරයේ බාධකයන් රාශියකට මුහුණ දෙනු ලැබුවේය. ඉන් එක් අවස්ථාවක් ලෙස 1957 දී නැගෙනහිර පකිස්තානය කර්මාන්ත හා වෙළඳාමේ සම්පූර්ණ අයිතිය ගත් අතර කල් යත්ම ඔවුන්ගේ පොරොන්දු කඩකිරීම් හේතුවෙන් මෙතුමා ඊට විරුද්ධව දේශපාලන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ඔහු සිරගත කළේය. කෙසේ නමුත් මෙතුමා මෙම ගැටලුව ඉතා සූක්ෂම ආකාරයෙන් විසඳා කර්මාන්ත හා වෙළඳාමේ අයිතිය තම රට සතු කර ගන්නා ලදි.

හුදෙක් මෙතුමාගේ ජීවිත කතාව දෙස බලන කල්හි උද්දීපනය වන තවත් වැදගත් සුවිශේෂී ආදර්ශයක් ලෙස කැපවීමෙන් ක්‍රියාකිරීම හා නොසැලෙන අධිෂ්ටානයෙන් ක්‍රියාකිරීම කැපී පෙනේ. මොහු නායකත්වය කරා පැමිණි ගමන් මගෙහිදී, මෙම ගුණාංගය බොහෝ තැන්හිදී ඉස්මතු වේ. ඊට කදිම නිදසුන වනුයේ මොහු විටින් විට කොතෙක් සිරගත වුවද ජනතාවගේ අවශ්‍යතාවයන් උදෙසා ඉතා කැපවීමෙන් ක්‍රියාකළ ආකාරයි. ඔහු කරුණු 6 කින් සමන්විත "අපගේ පැවැත්ම පිළිබඳ ප්‍රඥප්තිය" 1966 දී ඉදිරිපත් කරනු ලැබුවේය. එතුළින් උද්දිපනය වනුයේ ඔහුගේ කැපවීම හා අධිෂ්ඨානය වේ. මෙතරම් කැපවීම්

කරමින් නායකත්වයට සපැමිණෙන මොහුගේ පාලන කාලය තුළදී ද බොහෝ තැන්හිදී මෙම ගුණාංගය ඉස්මතු වනු ඇත.

ඔහුගේ මෙම කැපවීමේ හා නොසැලෙන අධිෂ්ඨානයේ අවසන් ප්‍රතිඵලය වූයේ බංගලාදේශය ස්වාධින රාජ්‍යයක් බවට පත්වීමයි. ඔහුගේ සියලු කැපකිරීම් මල්ඵල ගන්වමින් 1971 මාර්තු 26 දින බංගලාදේශය ස්වාධින රාජ්‍යයක් බවට පත්විය. ඉන්පසු බංගලාදේශ වැසියන් මෙතුමා "බංගලාදේශ ජාතීන්ගේ පියා" ලෙස හැඳින්විය.

මෙතුමාගේ ජීවිත කතාව දෙස බැලීමේදී මොහු තම දේශය පිළිබඳ අසීමිත ආදරයක්, භක්තියක් සහිත උදාර පාලකයෙක් ලෙස කැපී පෙනේ. මොහුගේ චරිතය පුරාවට කැපී පෙනෙන සුවිශේෂීම ආදර්ශය මෙයයි. මන්දයත් ඔහු තරුණ වයසේ සිටම තම දේශය වෙනුවෙන් අසීමිත ආදරයෙන් අරගල කරමින් දේශය රැකගැනීම උදෙසා මහගු කැපකිරීමක් සිදු කළේය. මෙතුමා තම දේශයට ආවේනික භාෂාවක්, ආගමක්, ශිෂ්ටාචාරයක් පවතින බව ලොවට පසක් කර දෙමින් අරගල කරන්නට වුයේය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ ස්වාධින බංගලාදේශයක් නිර්මාණයවීම වේ. එම නිසා මෙතුමා "බන්ගබන්දු" (Bangabandhu) නැතහොත් "බංගලාදේශයේ යාළුවා" (Friend Of Bangaladesh) ලෙස හැඳින්වීය.

මෙතුමා පැහැදිලි දැක්මක් සහිතව ක්‍රියාකළ අද්විතීය පාලකයෙක් ලෙස පෙන්වා දිය හැකිවේ. මොහු ජනපතිව සිටින සමය තුළ තම ජනතාව හට ආර්ථික වාසි ළඟාකරදීමට උපක්‍රමශීලීව ක්‍රියාකරන ලදි. හුදෙක් එපමණක් නොව මෙතුමා තම ජනතාවගේ නිදහස, අයිතිවාසිකම් පිළිබඳව මනා වැටහීමක් හා පැහැදිලි දැක්මක් සහිතව ක්‍රියා කරමින් ජනතාවට සහන සලසමින් ඔවුන්ගේ ආර්ථිකය සවිමත් කිරීම සඳහා උපරිම කැපවීමකින් හා පැහැදිලි දැක්මකින් යුතුව ක්‍රියාකළ සුවිශිෂ්ට පාලකයෙකි.

මෙතුමා හුදෙක් උක්ත ගුණාංගයන්ගෙන් පමණක් නොව දූරදර්ශී තීරණ ගැනීමේ ගුණාංගයෙන්ද යුතු දේශයක් පතන උගත් බුද්ධිමත් පාලකයෙක් මෙන්ම නායකයෙක් ද විය. මෙතුමා ජනතාවගේ සුබසිද්ධිය උදෙසා නිරන්තරයෙන් කැපවී ක්‍රියාකරන අතර පළාත් සභා මන්ත්‍රීවරයෙකුව සිටින කළ ව්‍යාපාරික

පිරිවැය අවම කිරීම උදෙසා නව පනතක් හඳුන්වා දෙන ලැබුවේය. එපමණක් නොව මෙතුමා කොතෙක් දූරදර්ශී වුවද යත්, පුද්ගලික ආයතනයන්ට නැගීමට අවස්ථාවක් ලබා නොදෙන ලදි. ඒ මන්ද යත්, ජනතාව ඉතා අපහසුවෙන් උපයාගනු ලබන ධනයට වටිනාකමක් ලබාදීමේ අරමුණින් විය. මෙතුමා බැංකු, රක්‍ෂණ සමාගම්, රෙදිපිළි, සීනි වැනි සමාගම් හා කර්මාන්තයන් ජනසතු කරන ලදි. මෙපමණක් නොව එතුමාගේ විදේශ ප්‍රතිපත්තීන් දෙස අවධානය යොමු කරන විට ඩකා-මොස්කව් සබඳතාවන්හි ප්‍රතිඵලයක් ලෙස සෝවියට් විශ්ව විද්‍යාලයන්හි බෙංගාලි සිසුන් සඳහා උසස් අධ්‍යාපනය ලබාගැනීමට හැකි වැඩ පිළිවෙලක් නිර්මාණය කළේය. එමගින් ඔහු බලාපොරොත්තු වූයේ තම රටේ තරුණ පෙළ දැනුමින් සුපෝෂිත කරමින් තම රට තුළ උගත්, බුද්ධිමත් නායක පරපුරක් බිහි කිරීමයි.එපමණක් නොව මෙතුමා නායකත්වය කරා පැමිණෙන ගමන් මගෙහිදීත්, පාලකයෙක් ලෙස කටයුතු කරනු ලබන කාලසීමාවේදීත්, ඔහුගේ විදේශ ප්‍රතිපත්තීන් තුළත් මෙතුමාගේ දූරදර්ශී තීරණ ගැනීමේ ගුණාංගය මනාව බොහෝ අවස්ථාවන්හිදී ප්‍රකට වී තිබේ.

"ෂෙයික් මුජිබර් රහ්මාන්" චරිතය තුළින් ඉස්මතුවන ආදර්ශ අතුරින් නායකයකු වශයෙන් දේශපාලන, අධ්‍යාපන, ආර්ථික යන බොහෝ අංශයන්ගේ සංවර්ධනය උදෙසා මෙතුමා කටයුතු කරන ලදි. එය එතුමාගේ විදේශ ප්‍රතිපත්තිය තුළින් මනාව ඉස්මතු වේ. ආර්ථික අංශය පිළිබඳව විමසීමේදී එතුමා තම රටේ ආර්ථිකය නගා සිටුවීම සඳහා හණ, කපු රෙදිපිළි වැනි කර්මාන්ත සඳහා අතහිත දෙමින් ආනයන අපනයන කටයුතු කරන ලදි. එමෙන්ම ආනයන අපනයන ප්‍රධාන කාර්යාලය නැගෙනහිර පකිස්තානයේ ස්ථාපනය කරමින් ඊට ක්‍රමවත් වැඩ පිළිවෙලක් හඳුන්වාදෙන ලදි. මෙපරිද්දෙන් මෙතුමා ආර්ථික අංශය පමණක් නොව අධ්‍යාපනය උදෙසාද සුවිශාල සේවාවක් කරනු ලැබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සෝවියට් විශ්ව විද්‍යාලවල බෙංගාල සිසුන් සඳහා උසස් අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සලසා දෙන ලදි. මේ අයුරින් මෙතුමා නායකයෙකු මෙන්ම පාලකයෙකු වශයෙන් සෑම අංශයක්ම සංවර්ධනය උදෙසා ක්‍රියාකරනු ලැබුවේය.

පාලකයෙකු ලෙස සිටින කාලසීමාවේදී මෙතුමා අසල්වැසි රාජ්‍යයන් සමග මිත්‍රශීලී ලෙස කටයුතු කරන ලදි. මෙය මෙතුමාගේ චරිතය තුළ ඉස්මතුවන ඉතා

සුවිශිෂ්ඨ ලක්‍ෂණයක් වේ. " ෂෙයික් මුජිබර් රහ්මාන්" 1972 මාර්තු 17 දින ඉන්දීය අගමැතිනිය ඉන්දිරා ගාන්ධි බංගලාදේශයට පැමිණෙන අතර ඔවුහු එහිදී වසර 25 ක මිත්‍ර සහයෝගීතා හා සාම ගිවිසුමක් අත්සන් කරනු ලැබූහ. මෙතුලින් උද්දීපනය වී පෙනෙනුයේ පාලකයකු වශයෙන් එතුමා අසල්වැසි රාජ්‍යයන් සමග ඉතා සුහදශීලී අයුරින් මිත්‍ර සබඳතා රැගෙන ගිය ආකාරය වනු ඇත.

මෙතුමාගේ ජීවිත කතාව දෙස අවධානය යොමු කිරීමේදී ඒ තුළින් ගතහැකි ආදර්ශ රාශියක් වනු ඇත. ඒ අතුරින් පාලකයකු වශයෙන් ජනතාවට සහනශීලී වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම මෙහිදී වැදගත් වේ. මෙතුමා ජනතාවගේ දුක දන්නා ජනතාවගේ හදවතට කතාකළ නායකයෙක් විය. තම දේශයේ බොහෝ ජනයා කෘෂිකර්මාන්තයෙන් හා දේශීය අනෙකුත් කර්මාන්ත යන් තුළින් නගා සිටුවීම උදෙසා ඉතා කැපවීමෙන් ක්‍රියා කරන ලදි. එමෙන්ම ඊට අවැසි යටිතල පහසුකම් දියුණු කරනු ලැබූ අතර සහන මිලට බීජ, පොහොර ආදිය ලබාදෙමින් දේශීය කෘෂිකර්මාන්තය හා කර්මාන්ත නගා සිටුවීමට ජනතාවට සහනශීලී වැඩපිළිවෙලක් සකසන ලදි. එය පාලකයෙකු තුළින් ඕනෑම රටවැසියෙක් බලාපොරොත්තු වන්නකි. ජනතා බලාපොරොත්තු මල්ඵල ගැන්වූ සුවිශේෂී පාලකයෙක් ලෙස මෙතුමා වැදගත් වේ.

එමෙන්ම මොහු ජනහිතකාමී පාලකයෙකි. මන්ද යත්, මිනිසුන්ගේ දුක දැක, එනම්, දුප්පත්කම, විරැකියාව වැනි සමාජීය ප්‍රශ්න හමුවේ ඔහු ඊට විසඳුම් ලබාදීම සඳහා සමාජශීලී ප්‍රතිපත්තියක් කරා යොමුවූ අතර ඔහු කොතරම් ජන හිතෛශී නායකයෙකු වේද යත්, ඔහු නායකත්වය කරා පැමිණෙන ගමන් මගෙහිදී ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් ලබාදෙන මෙන් ඉල්ලා දින 13 ක් උපවාසයේ නිරත වුයේය. මෙතුලින් ගම්‍යමාන වනුයේ මෙතුමා ජනතාවගේ දුක දන්නා, ජනතා හිතෛෂී, පාලකයෙකු වන බවයි.

මෙපරිද්දෙන් බලන කල ෂෙයික් මුජිබුර් රහ්මාන් චරිතය තුළින් ගතහැකි ආදර්ශයන් ගණනාවක් ඔහුගේ කුඩාකළ පටන් මරණය දක්වා ජීවිත කතාව අධ්‍යයනයට ලක් කිරීම තුළින් ගත හැකි වේ.

## සාරංශය

තම දේශයේ අභිමානය ජාත්‍යන්තරය කරා ගෙන ගිය අද්විතීය නායකයෙකු බංගලාදේශ දේශපාලන ඉතිහාසය තුළ හමු වේ. නමින් ඔහු ෂෙයික් මුජිබර් රහ්මාන් ය. 1920.03.17 දින බෙංගාල පළාතේ ගෝපාල්ගංජ් දිස්ත්‍රික්කයේ තුංගිපාර නම් ගම්මානයේ උපත ලද මෙතුමා "ගිමදංග"ප්‍රාථමික පාසලෙන් අධ්‍යාපනය ආරම්භ කළේය. වරින් වර විවිධ බාහිර බාධක හමුවේ පාසල් ගමනට බාධා වුව ද ස්වකීය උත්සාහය හේතුවෙන් විශ්වවිද්‍යාල වරම් ලබන ඔහු එහිදී විවිධ විප්ලවකාරී සංගම් සමග ඒකාබද්ධ වෙමින් තම රට ජාතිය වෙනුවෙන් කැප වුයේය. 1949 දී සමස්ත ඉන්දීය මුස්ලිම් ශිෂ්‍ය සම්මේලනයට සම්බන්ධ වීමත් සමඟම මොහුගේ දේශපාලන ගමන ආරම්භ වේ. 1949 දී නැගෙනහිර පකිස්තානයේ ඒකාබද්ධ ලේකම් වශයෙන් දේශපාලන කටයුතුවල නිරත වන මෙතුමා ස්වාධීන බංග්ලාදේශය නිර්මාණ කිරීමේ අරමුණට ළගා වුයේය. 1966 දී "අපගේ පැවැත්ම" පිළිබඳ ප්‍රඥප්තිය නමින් කරුණු හයකින් සමන්විත සැලැස්මක් ඉදිරිපත් කරමින් ස්වයංපාලනයක් හා සැලකිය යුතු දේශපාලන, ආර්ථික අංගයන්ගෙන් ස්වාධීනත්වය ඉල්ලා සිටියේය .ඒ හේතුවෙන් ඔහුට වසර දෙකක් සිරගතවන්නට සිදුවිය. පසුව නිදහස් වූ මෙතුමා 1969 යේ දී ජනතාව අමතා කියා සිටියේ නැගෙනහිර පකිස්තානය මෙතැන් සිට බංගලාදේශය ලෙස හඳුන්වන බවයි. 1971 මාර්තු 26 දින මෙම රාජ්‍යය ස්වාධීන රාජ්‍යක් බවට පත් වුයේය. මෙතුමාගේ මෙම සේවය හේතුවෙන් "ජාතියේ පියා","බංගබන්දු" හෙවත් "බංගලාදේශයේ යහළුවා" යන අන්වර්ථ නම්වලින් ද හැඳින්වේ. ඒ අනුව නිදහස් බංගලාදේශයේ ප්‍රථම ජනපති වන මෙතුමා නායකයෙකු ලෙස ඉතා විශාල සේවයක් තම දේශය වෙනුවෙන් සිදු කරන ලදී. මීළඟට මෙතුමාට අවශ්‍ය වූයේ තම රාජ්‍යය සශ්‍රීක රාජ්‍යයක් බවට පත් කිරීමයි. ඒ අනුව බංගලාදේශයට වෙළඳ අයිතීන් ලබා ගැනීමේ ගිවිසුමේ පොරොන්දු පකිස්තානය විසින් කඩ කිරීම හේතුවෙන් මුජිබර් එයට විරුද්ධව නැගී සිටියේය. එසේම මෙතුමා නායකත්වයට පැමිණීමෙන් පසු දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීමට ගොවීන්ට අවැසි බීජ ,පොහොර ආදිය සඳහා සහන ලබාදෙන ලදී. කර්මාන්ත දියුණු කිරීම කෙරෙහි ද මෙතුමාගේ අවධානය යොමු වුයේය. ඒ අනුව ,හණ, සීනි, රෙදිපිළි ආදී කර්මාන්ත නගා සිටුවීමට කටයුතු කළේය. එතුමාගේ විදේශ

ප්‍රතිපත්තිය ද සැබැවින් ම තම රාජ්‍යයට වාසිදායක අයුරින් නිර්මාණය වූවකි.එබැවින් අසල්වැසි රාජ්‍යයන් සමඟ මිත්‍රශීලී සබඳතා ගොඩනැගීමට එතුමාට හැකි විය. ඒ අතර, සෝවියට් විශ්වවිද්‍යාලයෙහි බෙංගාලි සිසුන්ට උසස් අධ්‍යාපනය ලැබීමට අවස්ථා සලසා දීම වැනි වාසි අත්විය. එමෙන්ම බංග්ලාදේශයේ සිටි ඉන්දීය සෙබළුන් නැවත ඉන්දියාවට යවමින් ඉන්දීය-බංගලාදේශ මිත්‍රත්වය ශක්තිමත් කරගන්නා ලදී .සැබැවින් ම එතුමාගේ ජීවිතය දෙස බැලීමේදී කැපවීම, අධිෂ්ඨානය, දූරදර්ශී තීරණ ගැනීමේ හැකියාව, පැහැදිලි දැක්මකින් යුක්ත වීම වැනි වූ ආදර්ශ රාශියක් හඳුනාගත හැකි ය.ඒ අනුව මෙතුමා තම දේශය වෙනුවෙන් දිවි හිමියෙන් කැපවූ උදාර නායකයෙකු ලෙස සියලු ලෝක ජනතාවට ආදර්ශමත් වී ඇති බව කිවමනාය. කෙසේ වුවත් , මෙම ආදර්ශමත් ජනහිතකාමී දේශපාලන නායකයා බංගලාදේශ හමුදා කැරලි කණ්ඩායමක් විසින් ඝාතනය කරනු ලැබුවේය.

## මූලාශ්‍ර නාමාවලිය

Rahman, S. M. (2012). Sheikh Mujibur Rahman: The unfinished Memoirs. , Penguin Books Limited.

Rahman , S. M. (2012). Bangabandhu's autobiography launched: The Independent.

Kamal, K. A. (1970). Sheikh Mujibur Rahman: Man and Politician. , Kazi Giasuddin Ahmed.

Ahsah , S. B. (2014). Sheikh Mujibur Rahman: From Rebel to founding father. Niyogi Books.

Ahsas, S. B. (2019, November 16). ) Foreign Policy in Bangabandhu's times.

Bangabandhu's thoughts on development. (2018, August 14).

Reza, M. H. (2019, September). Political Activities of Sheikh Mujibur Rahman as a charismatic leader.

biographyMujIbur-Rahman. (n.d.). Retrieved March 15, 2020, from https://www.britanica.com

father-of-the-nation. (n.d.). Retrieved March 15, 2020, from http://www.bdembassyusa.org

(n.d.). Retrieved March 17, 2020, from https://izquotes.com

quotes-of-sheikh-mujibur-rahman. (n.d.). Retrieved March 16, 2020, from https://bdnewsnet.com

Evaluation_of_Charismatic_Leader_of_Bangabandhu_Sheikh_Mujibur_Rahman. (n.d.). Retrieved March 20, 2020, from https://www.researchgate.net

# ෂෙයික් හසීනා



**කණ්ඩායම් සාමාජිකයන් :**

- දිලිනි උඩලාගම
- හිරුනි ආරියරත්න
- මන්දාකිණි අත්තනායක
- කුළුණි විතානගේ
- චමිදි දයාරත්න

# හැඳින්වීම

"ෂෙයික් මුජිබර් මරලා දාලා..........පවුලේ තව දාහතක් එක්කම..... ගෙදරදීම මරලා තියෙන්නේ."

ඇයට ඒ භයානක පුවත නිවැරදිව ඇසුණාද කියා විශ්වාසයක් නොතිබුණි. ඇගේ පණ මෙන් සිටි පියා සහ මව ද, එක බඩවැල කඩා පැමිණි සහෝදරයන්ද, සෙවණැල්ලක් බඳුව සිටි නෑදැයින් ද ඇය ව හැර දමා යන්නට ගොසින් ය. නිවසින් පමණක් නොව මව්බිමෙන් ද පිටත සිටින මොහොතක මෙවැනි ඉරණමකට මුහුණ දෙන්නට සිදු වේයැයි සිහිනෙන්වත් ඇය නොසිතන්නට ඇත. එහෙත් එය අවසානයම විය. දරාගත නොහැකි දුක් සයුරක ගිල්වමින් තම නැගණිය පමණක් මෙලොව සිටින එකම සමීපතයා බවට පත් කරමින් ප්‍රජාතන්ත්‍රය යන වචනය පවා නොදන්නා මෘගයන් විසින් ආසියානු දේශපාලන ඝාතන පොතට තවත් පරිච්ඡේදයක් එක් කළහ.

ඇයගේ දිවියට සදාකාලික අඳුරු මතකයක් එක් කරමින් ආදරණීයන් සැවොම ඇයගෙන් උදුරා ගත් නමුදු එය තම ජීවන ගමනේ හැරවුම් ලක්ෂය බවට පත් කර ගනිමින් බංග්ලාදේශය පමණක් නොව මුළු මහත් මුස්ලිම් සමාජය ම නව මාවතකට යොමු කරමින් ස්ත්‍රී සමාජයටම මහඟු ආදර්ශයක් ලබා දෙමින් ප්‍රබල දේශපාලන කාන්තා චරිතයක් ලෙසට නව ප්‍රතිරූපයකින් ඉදිරියට පැමිණියාය. "වේදනාව මිනිසුන් වෙනස් කරයි" යන්න සනාථ කිරීමට සමත් වූ ඈ අළුමතින් නැගුණු ෆීනික්ස් පක්ෂියෙක් මෙන් තම පවුල ඝාතනයේ වේදනාව තුළින් නැගී සිටිමින් එක් වරක් නොව සිව්වරක් ම බංග්ලාදේශයේ ඇගමැතිනිය වීමට වරම් ලබා ගත්තාය. ඇයගේ නැගී සිටීම කෙතරම් ප්‍රබල වූවාද කිවහොත් අදටත් එරට අගමැතිනිය ඇයයි. දශක කිහිපයක් පුරාවට බංග්ලාදේශයේ දේශපාලන කුණාටුවට අප්‍රතිහත ධෛර්යකින් මුහුණ දුන් ඇය එරට ට පමණක් නොව මුළු මහත් ලෝකයටම පෙරළිකාර චරිතයක් බවට පත් වීමට සමත් විය. කරුණාවන්ත දෙනෙතකට හා නේත්‍රාකර්ෂනීය සිනාවකට උරුමකම් කියූ ඕ තොමෝ ෂෙයික් හසීනා (Sheikh Hasina) හෙවත් බංග්ලාදේශයේ ඉෂ්ඨ දේවතාවිය වූවාය.

පස් දෙනෙකුගෙන් යුත් පවුලේ වැඩිමලා ලෙස ඇය 1947 දී නැගෙනහිර පාකිස්තානයේ, තුංගිපාරා (Tungipara) හි මෙලොව එළිය දුටුවාය. ඇයගේ පියා ෂෙයික් මුජිබර් රහ්මාන් නම් වූ බංග්ලාදේශයේ උදාර චරිතය විය. එබැවින් හසීනාගේ ද රුධිර බිඳුවක් පාසා ගලා ගියේ උදාරතර මනුෂ්‍යත්වයයි. කැළි කසළ දමා අපවිත්‍ර වූ ජලාශයක පතුළ නොපෙන්නාක් මෙන් දූෂිත පාලනයක් තිබූ බංග්ලාදේශයේ නොපෙණුනු අනාගතය ඇයගේ අධිෂ්ඨානය හමුවේ කෙමෙන් කෙමෙන් පැහැදිළි වන්නට පටන් ගැණුනි. එවන් අමරණීය කාන්තාවගේ ළමා කාලය, අධ්‍යාපනය, දේශපාලන ගමන් මග, මෙන්ම ඇයගෙන් විවිධ ක්ෂේත්‍ර වලට සිදු වූ සේවාව, ලෝකය හා සම්බන්ධ වීමට අනුගමනය කළ ප්‍රතිපත්තීන් හා ගත හැකි ආදර්ශ ආදී නොයෙක් මානයන් පිළිබඳ ගවේෂණයක යෙදීම මෙහි අරමුණ වේ. එසේ හෙයින් මෙතැන් සිට අප ප්‍රවිෂ්ඨ වනුයේ ෂෙයික් හසීනා නම් වූ සිංහ ධේනුවගේ දෛවෝපගත චාරිකාවටය.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම.

ධෛර්යයෙන් හා උත්සාහයෙන් තම අරමුණු මුදුන්පත් කරගත් ශ්‍රේෂ්ඨ රාජ්‍ය නායිකාවක් ලෙස ෂෙයික් හසීනා මේ දෙරණ තුළ නම් දරා සිටින තැනැත්තියකි. ඇගේ දයාබර පියාණන් වූයේ බංග්ලාදේශය පාකිස්තානයෙන් වෙන් කර වෙනම රාජ්‍යයක් ලෙස ගොඩනැංවීමේ සටනේ පුරෝගාමියෙකු ලෙස කටයුතු කර ඉන් අනතුරුව බංගලාදේශයේ ප්‍රථම ජනාධිපති වශයෙන් පත්වූ ෂෙයික් මුජිබර් රහ්මාන් නම් වූ සොඳුරු විද්වතාණන්ය.

ෂෙයික් මුජිබර් රහ්මාන් (Sheikh Mujibur Rahman) එකල නැගෙනහිර පාකිස්තානයේ ක්‍රියාකාරී දේශපාලඥයෙකි. 1971 දී බංග්ලාදේශය වෙනම රාජ්‍යයක් ලෙස බටහිර පාකිස්තානයෙන් සම්පූර්ණයෙන් වෙන්වීමට කළ සටනට ප්‍රබල දායකත්වයක් ඔහු විසින් ලබාදෙන ලදි. ඔහුගේ බිරිඳ වූයේ ෂෙයික් ෆසිලතුනීසා මුජිබ් (Sheikh Fazilatunnesa Mujib) ය. ඔවුන් දෙදෙනාට

දරුවන් පස් දෙනෙකු විය. ඔවුන් ගේ පළමු දරු උපත 1947 සැප්තැම්බර් 28 දා නැගෙනහිර පාකිස්තානයේ, තුංගිපාරා (Tungipara) හි සිදුවිය. සිය පවුලට වාසනාව ගෙන ආ ඔවුන්ගේ පළමු බිළිඳියට ෂෙයික් හසීනා (Sheikh Hasina) යන්න නම් තැබීය. හසීනා යන්න බෙංගාලි භාෂාවෙන් "චාම්" එසේත් නැත්නම් "සිනහව" යන්න අර්ථ ගැන්වේ. තම දියණිය කවරදාක හෝ තමන් මෙන් සිය මවුබිමේ අභිවෘද්ධිය උදෙසා නායකත්වය ගෙන කටයුතු කරනු ඇතැයි රහ්මාන් මැතිතුමා නිරතුරුවම අපේක්ෂා කරන්නට ඇත.

හසීනා ඇයට වඩා බාල සහෝදර සහෝදරියන් කැලක් සමඟ හැදී වැඩුණි. ඇයට බාල සහෝදරයන් තිදෙනෙකු සහ එක් සහෝදරියක් විය. වයස් පිළිවෙලින් ඔවුන්, ෂෙයික් කමල් (Sheikh Kamal), ෂෙයික් ජමාල් (Sheikh Jamal), ෂෙයික් රෙහානා (Sheikh Rehana) සහ ෂෙයික් රුසෙල් (Sheikh Russel) ය.දේශපාලන කටයුතු නිසා කාර්යයබහුල වී සිටි තම දෙමවුපියන්ගෙන් නොලැබුණු රැකවරණය බාල සහෝදර සහෝදරියන්ට ලබා දීමට ඈ පුරුද්දක් කරගෙන සිටියාය. නායකත්වය සහ වගකීම් සහගත බව ඇය මෙහිදී පුරුදු වන්නට ඇත. ඇයගේ ළමා කාලයේදී බංග්ලාදේශයේ පැවතුනේ දූෂිත පාලන තන්ත්‍රයකි. එකල ප්‍රජාතන්ත්‍රවාදයට කිසිදු තැනක් හිමි නොවීය. සාමාන්‍ය ජනයාට මෙන්ම දේශපාලඥයින්ටද ප්‍රචන්ඩකාරී ක්‍රියාවන්ගේ ගොදුරක් වන්නට සිදු විය. 1970 මහමැතිවරණ සමයේ පැවති ප්‍රචන්ඩකාරීත්වයේ ප්‍රතිඵලයක් ලෙස තම පියාව අත්අඩංගුවට ගත් අවස්ථාවේදී ඇයට තම මිත්තණිය සමඟ හැදී වැඩීමට සිදු විය.



*(හසීනා තම පවුලේ සාමාජික සාමාජිකාවන් සමඟ)*

හසීනා දේශපාලන පසුබිමක හැදීවැඩුණු නමුත් තම මිත්තණිය සමඟ ගත කළ කාලය ඇය සිහි කරන්නේ ජීවිතයේ සොඳුරුම අවධිය ලෙසයි. අධ්‍යාපනයට ඇය දැක්වූ ආසාව නිසාම කුඩා කළ සිටම හොඳින් ශිල්ප උගත්තාය. තම ප්‍රාථමික අධ්‍යාපනය ග්‍රාමීය පාසලකින් හැදෑරූ ඇය 1954 දී තම පවුලේ අනෙකුත් සාමාජිකයින් සමඟ ඩකා හි පදිංචියට ගිය බැවින් ඇගේ වැඩිදුර අධ්‍යාපනය බංග්ලාපීඩියා (Banglapedia) වෙබ් අඩවියේ සදහන් පරිදි 1965 දී අසිම්පුර් බාලිකා පාසලෙන් (Azimpur Girls High School) හා 1967 දී වර්තමානයේ බද්රුනේසා රාජ්‍ය බාලිකා විද්‍යාලයෙන් (Badrunnesa Government Girls' College) සම්පූර්ණ කළාය. හසීනා ශිෂ්‍ය දේශපාලනයට සක්‍රීයව දායක විය. එහි පළමු අවස්ථාව ලෙස ඇය බද්රුනේසා විද්‍යාලයේ ඉගෙනුම ලබන කාලයේදී විද්‍යාල ශිෂ්‍ය සංගමයේ උප සභාපති ලෙස තේරී පත් වීම සඳහන් කළ හැකිය.

ඇයට අවුරුදු 21 ලබත්ම එකල සමාජයේ පැවති සම්ප්‍රදායන්ට අනුව තම පියා විසින් ගෙන ආ විවාහ යෝජනාවට කැමැත්ත පල කරමින් 1968 දී න්‍යෂ්ටික විද්‍යාඥයෙකු වූ එම්. ඒ වසීඩ් (M. A. Wazed) සමඟ ඇය විවාහ ගිවිස ගත්තාය. විවාහයත් සමඟ බොහෝ කාන්තාවන්ගේ අධ්‍යාපනය, වෘත්තීය තත්වය අඩපණ වූ පසුබිමක බොහෝ දෙනා මත පලකර සිටියේ ඇය යළි කිසි දිනක දේශපාලනයට නොපිවිසෙනු ඇති බවටයි. එහෙත් හසීනා වාසනාවන්ත කාන්තාවකි. ඇයගේ අධ්‍යාපනයට මෙන්ම දේශපාලන ගමනට ද ඇගේ සැමියාගෙන් ලද සහයෝගය අතිමහත්ය. විවාහයෙන් මේ දෙපලට සයිමා වසීඩ් හුසේන් පුතුල් (Saima Wazed Hussain Puthul) නමින් දියණියක්ද සජීබ් වසීඩ් (Sajeeb Wazed) නමින් පුතෙක් ද වේ.

විවාහයෙන් පසු හසීනා තම සැමියාගේ රැකියා කටයුතු සදහා ජර්මනිය බලා ගියාය. 1975 අගෝස්තු 15 වන දින ඇගේ පියා මුජිබර් රහ්මාන් ඇතුළු පවුලේ සාමාජිකයන් රැසකගේ ඝාතනයෙන් පසු සය අවුරුද්දකට ඇයට නැවත බංග්ලාදේශයට පැමිණීම තහනම් විය. මෙයින් දිවි ගලවා ගත් ෂෙයික් පවුලේ එකම තැනැත්තිය වූ ඇගේ නැගණිය තමන් වෙතට ගෙන්වා ගැනීමට ඇය කටයුතු කළාය. ඉන් වසර කිහිපයකට පසු ඉන්දියාවට පැමිණි ඇය තම

දරුවන්ගේ අධ්‍යාපන කටයුතු එහිදී සිදුකිරීමට පියවර ගත්තාය. අවාමි ලීගයේ සභාපතීත්වය හිමිවීමත් සමග ඇය 1981 පෙබරවාරි 16 නැවත තම රටට පැමිණියාය.



*(ෂෙයික් හසීනා සහ එම්. ඒ වසීඞ් විවාහ වූ දා)*

## <u>නායකත්වය කරා ගිය ගමන් මග</u>

මිනිසුන් පමණක් නොව ස්වාභාවධර්මය පවා වෙනසක් අවැසියැයි හඬ නගා ඉල්ලා සිටින මොහොතක හසීනා කෙරෙහි උපන් අසීමිත විශ්වාසයෙන් යුතුව මුජිබර් රහ්මාන්ගේ පුරෝගාමීත්වයෙන් ආරම්භ කරන ලද අවාමි ලීගයේ (Awami League) සභාපතිත්වය එහි සාමාජිකයන් විසින් 1981 පෙබරවාරි 16 දින බංග්ලාදේශයේ නොමැති වුවද හසීනා වෙත ලබා දීමට තීරණය කළහ. එයින් මාස තුනකට පසුව එනම් මැයි 17 පිටුවහල් කිරීමේ කාලය අවසන් වී ඇය නැවත බංග්ලාදේශයට පැමිණි අතර මව්බිමේ ජීව ශක්තිය ඇගේ නහරයක් නහරයක් පාසා ගලා යන බව ඇයට වැටහුණි. මෙය යුතුකම් ඉටු කිරීමට තමාගේ අවස්ථාව බව වටහා ගත් ඕ තොමෝ කෙතරම් බාධක හමු වුවත් නොසැලී පෙරටම යාම සඳහා අදිටන් කරගනිමින් තම දේශපාලන දිවියේ ආරම්භය සනිටුහන් කළාය. එය දශක හතරකට වැඩි කාලයක් පුරා ගලා යාමට තරම් ප්‍රබල ඇරඹුමක් විය.

ඇයගේ පුනරාගමනයෙන් අනතුරුව බංග්ලාදේශය තුළ නැවත ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම සඳහා කටයුතු ආරම්භ කිරීමත් සමඟ එවකට බංග්ලාදේශ පාලකයන්ගේ කෙනෙහිලිකම්වලට මුහුණ දීමට ඇයට සිදු වූ අතර කෙමෙන්

කෙමෙන් මේ තත්ත්වය උත්සන්න වීමට පටන් ගැණුනි. මෙහි ප්‍රතිඵලය වූයේ ඇයව කිහිප වතාවක් සිර ගත කිරීමත්, නිවාස අඩස්සියේ තැබීමත් ය. එයින් නොනැවතුණු විරුද්ධවාදීන් ඇයව ඝාතනය කිරීමට ද කිහිපවතාවක් උත්සාහ කරන ලදි. එයින් 2004 වසරේ අගෝස්තු 21 වන දින බංගබන්දු මාවතේ (Bangabandhu Avenue) පැවති රැලියකදී අත්බෝම්බ විශාල ප්‍රමාණයක් ඇය වෙත එල්ල වූ අවස්ථාව ඇය ඝාතනය කිරීමට ගත් ප්‍රබලම උත්සාහය ලෙස හැඳින්වේ. එමඟින් හසීනාගේ ජීවිතයට හානියක් සිදු නොවුනද ඇයගේ ශ්‍රවණ හැකියාව දුර්වල විය. හොඳින් මුල් ඇද තිබෙන ශක්තිමත් වෘක්ෂයක් ගලවා දැමීමට නොහැකි වූ තැන කඳෙන් කපා වෙන් කළද භූ ගර්භය තුළ තවමත් පෞරාණික මූලයන් මිහිදන්ව ඇති බව බොහෝ දෙනෙකුට අමතක වී යන කරුණකි. මෙහිදී ද සිදු වූයේ එයයි. අසහාය රුක්ෂයක් බඳු ඇයට කෙතරම් අඩත්තේට්ටම් සිදු කරමින් කපා බිම හෙළීමට තැත් කළ නමුදු ශක්තිමත් මූලයන් බඳු වූ ඇගේ අධිෂ්ඨානය දිනෙන් දින දළු ලමින් ඇයව ආරක්ෂා කළාය.

පක්ෂ නායකත්වය භාර ගැනීමෙන් පසු ජනාධිපති හුසේන් මොහොමඩ් අර්ෂාඩ්ගේ (Hussain Mohommad Ershad) පාලන සමය තුළ අවාමි ලීගය හසීනා යටතේ පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරග කළ අතර ඉන්පසු 1986 - 1987 කාලසීමාව තුළ විරුද්ධ පක්ෂ නායිකාව බවට පත්විය. මෙකල විරුද්ධ පක්ෂය පක්ෂ අටකින් සමන්විත වු අතර හසීනා ජනාධිපති අර්ෂාඩ්ට එරෙහිව මෙම පක්ෂ අටකින් යුතු සන්ධානය මෙහෙය වූවාය. හසීනා මැතිවරණයට ඉදිරිපත් වීමට ගත් තීරණය ඇයගේ විරුද්ධවාදීන් විසින් විවේචනය කරන ලදි. ඡන්දය යුධ නීතිය යටතේ පැවැත්වීමට තීරණය කිරීම නිසා තවත් විරුද්ධ පාර්ශවයක් වූ කලීඩා සියාගේ (Khaleda Zia) නායකත්වයෙන් යුතු කණ්ඩායම ඡන්දය වර්ජනය කරන ලදි.

කෙසේ නමුත් හසීනාට සහය දැක්වූ පිරිස් පැවසුවේ ඇය එම ඡන්දය අර්ෂාඩ්ගේ පාලනයට අභියෝග කිරීමට ඵලදායිව යොදාගත් බවයි. නමුත් පසුව හසීනා සහ අවාමි ලීගය පාර්ලිමේන්තුවෙන් ඉවත් වූ අතර 1987 දෙසැම්බර් මාසයේ අර්ෂාඩ්

විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරිණි. බල අරගලයට සමගාමීව 1987 නොවැම්බර් සහ දෙසැම්බර් කාලසීමාව තුළ විශාල කැරැල්ලක් ඩකා හි (Dhaka) ඇතිවූ අතර එයින් හසිනාගේ උදව්කරුවෙකු වූ නූර් හුසේන් (Noor Hossain) ජීවිතක්ෂයට පත්විය. අර්ෂාඩ්ගේ ඒකාධිපති පාලනයට එරෙහිව උද්ඝෝෂණ වැඩ වර්ජන ක්‍රියාත්මක වූ අතර මෙයින් රටේ ආර්ථිකය තවදුරටත් දුර්වල විය. රජයේ සේවකයන් නියෝග පිළිපැදීම නතර කළ අතර රැකියාවලින් ඉවත් විය. ප්‍රසිද්ධියේම ඇඳිරි නීතිය උල්ලංඝනය කරන ලදි.

ෂෙයික් හසීනාගේ අවාමි ලීගය සහ සියාවුර් රහමන්ගේ (Ziaur Rahman) වැන්දඹුව වූ කලිඩා සියා එක්ව නැවත ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් බංග්ලාදේශය තුළ ස්ථාපිත කිරීමට කටයුතු ආරම්භ කරන ලදි. 1990 දී විශාල වශයෙන් විරෝධතා ආරම්භ කළ අතර අවසානයේ ජනාධිපති අර්ෂාඩ්ට ඉල්ලා අස්වීමට පැය විසිහතරක කාලයක් ලබා දෙන ලදි. මෙය නීත්‍යානුකූල ක්‍රියාපටිපාටියට අනුව සිදු වූ අතර ජනාධිපති අර්ෂාඩ් ඉල්ලා අස්විය.

ඉන්පසුව බංග්ලාදේශ ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරු ශහබුද්දීන් අහමඩ්ගේ (Shahabuddin Ahmad) නායකත්වයෙන් යුතු භාරකාර ආණ්ඩුවක් ස්ථාපිත කර එමගින් පාර්ලිමේන්තු මැතිවරණය 1991 දී ප්‍රකාශයට පත් කෙරිණි. එයින් බංග්ලාදේශ ජාතිකවාදී පක්ෂය (Bangaladesh Nationalist Party) ජයග්‍රහණය කළ අතර අවාමි ලීගය විශාලම විපක්ෂ දේශපාලන පක්ෂය ලෙස ඉදිරියට පැමිනුණි. හසීනා තරග කළ ඡන්ද කොට්ඨාශ තුනෙන් එක් ඡන්ද කොට්ඨාශයක් ඇය ජයගත් අතර ඉතිරි දෙක පරාජය විය. පරාජය පිළිගනිමින් ඇය පක්ෂ නායකත්වයෙන් ඉල්ලා අස්වීමට තීරණය කළ නමුත් පක්ෂ නායකයින්ගේ ඉල්ලීම මත එම තනතුරෙහිම රැඳී සිටියාය.



*(හසීනා විපක්ෂ නායිකාව ලෙස ජන හමුවක් අමතමින් )*

1994 මගුරා (Magura) අතුරු මැතිවරණයෙන් පසු බංග්ලාදේශ දේශපාලනය තුළ තීරණාත්මක වෙනසක් ඇති ඇතිවිය. මෙම මැතිවරණය පැවැත්වූයේ එම කොට්ඨාශයේ බලය හිමිව තිබූ අවාමි ලීග මන්ත්‍රීවරයාගේ අභාවය හේතුවෙනි. අවාමි ලීගය ආසනය නැවත දිනා ගැනීමට බලාපොරොත්තු වූ නමුත් බංග්ලාදේශ ජාතිකවාදී පක්ෂය එම කොට්ඨාසය දිනා ගන්නා ලදී. 1994 සිට අවාමි ලීගය හසීනාගේ නායකත්වය යටතේ පාර්ලිමේන්තුව වර්ජනය කරන ලදි. අවාමි ලීගය විසින් මීළඟ මහා මැතිවරණය භාරකාර ආණ්ඩුවක් යටතේ පැවැත් විය යුතු බවත් මැතිවරණ කටයුතු සඳහා භාරකාර ආණ්ඩුවට අවශ්‍ය විධිවිධාන පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතු බවත් ඉල්ලා සිටියේය. නමුත් එවකට පාලක පක්ෂය වූ බංග්ලදේශ ජාතිකවාදී පක්ෂය මෙම ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන ලදි. විරුද්ධ පක්ෂ විසින් උද්ඝෝෂණ දියත් කළ අතර සති ගණනක් පුරා වැඩවර්ජන කැඳවන ලදි. ආර්ථිකය විනාශ කරන බවට රජය ඔවුන්ට චෝදනා කළ අතර අවාමි ලීගය පවසා සිටියේ ඔවුන්ගේ ඉල්ලීමට එකඟ වීමෙන් මෙම ගැටලුව විසඳා ගත හැකි බවයි. 1995 වන විට අවාමි ලීගයේ සහ අනෙකුත් විරුද්ධ පක්ෂ මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවෙන් ඉල්ලා අස්විය.

ඉන් අනතුරුව පාර්ලිමේන්තුවේ ධූර කාලය අවසන් වී 1996 පෙබරවාරි 15 මහමැතිවරණයක් පැවැත්විණි. එහි ප්‍රතිඵලය වූයේ පාලක පක්ෂය වූ බංග්ලාදේශ ජාතිකවාදී පක්ෂය හැර අනිකුත් සියලුම ප්‍රධාන පක්ෂ විසින් මහමැතිවරණය වර්ජනය කිරීමයි. හසීනා මෙම මැතිවරණය අර්ථ දැක්වූයේ හාස්‍යජනක දෙයක් ලෙසය. පසුව බංග්ලාදේශ ජාතිකවාදී පක්ෂයේ බහුතරයකින් සමන්විත වූ පාර්ලිමේන්තුව භාරකාර රජයක් සඳහා විධිවිධාන නිර්මාණය කිරීම සඳහා

ව්‍යවස්ථාව සංශෝධනය කළේය. 1996 ජුනි 30 මීළඟ පාර්ලිමේන්තු මැතිවරණය විශ්‍රාමලත් අගවිනිසුරු මුහම්මද් හබිබූර් රහ්මන්ගේ (Mahammad Habibur Rahman) නායකත්වයෙන් යුත් භාරකාර රජයක් යටතේ පැවැත්විණි. මෙයින් බංග්ලාදේශ අවාමි ලීගය වැඩිම ආසන සංඛ්‍යාවක් දිනා ගන්නා ලදි.

මේ අනුව ෂෙයික් හසීනා පළමුවරට බංග්ලාදේශයේ දේශපාලන බලය ලබාගත්තාය. ඇය නිදහසින් පසු බංග්ලාදේශය තුළ තම මුළු ධූර කාලයම සම්පූර්ණ කළ ප්‍රථම අගමැතිවරිය බවට පත් විය. ඉන් අනතුරුව බංග්ලාදේශයේ අසහාය ගැලවුම්කරුවා බවට පත් වෙමින් තෙවරක්ම අගමැතිනිය වීමේ භාග්‍යය හිමි කර ගත්තාය. ණය නැති දියණියක විලස තම මාතෘ භූමිය වෙනුවෙන් ඉටු කළ යුතු කාර්යභාරය නොපැකිළව ඉටු කරමින් ආදර්ශමත් නායිකාවක් ලෙස තම ප්‍රතිරූපය ගොඩ නඟා ගෙන ඇති බැවින් අදටත් බංග්ලාදේශය තුළ ඉන්ද්‍රකීලයක් බඳුව ඇය විරාජමාන වී ඇත.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව

දහසක් බාධක හමුවේ අවසානයේ දී හසීනා තම අරමුණ වෙත පැමිණියාය. තම පියා දුටු අනාගත බංග්ලාදේශයේ සිහිනය යථාර්තයක් බවට පත් කිරීම උදෙසා ඇගේ වගකීම් ක්‍රම ක්‍රමයෙන් ආරම්භ කිරීමට පටන් ගත්තාය. ඇය කෙරෙහි තිබූ ජනතා විශ්වාසය කොතෙක්ද කිවහොත් එක් වරක් නොව සිව් වරක්ම අගමැතිනිය වීමට අවස්ථාව හිමි විය. ඇයට ලැබුණු ජනතා වරම් සඳහා ඇයට හැකි උපරිම සාධාරණය ඉටු කිරීමට වග බලා ගත්තාය. හසීනා විසින් තම මාතෘභූමිය උදෙසා සිදු කළ අමිල මෙහෙවර, ධූර කාල සතර ඔස්සේ පහත පරිදි විවරණය වේ.

**පළමු වරට අග්‍රාමාත්‍ය ධූරය දැරීම ( 1996-2001 )**

ලෝක ඉතිහාසයේ වැඩි කාලයක් බංග්ලාදේශය පිළිබඳව ප්‍රතිරූපය ගොඩ නැගී තිබුණේ ස්වාභාවික විපත් බොහෝ ප්‍රමාණයකට මුහුණ දෙන දුප්පත්කම, සාගතය පවතින දේශපාලන ප්‍රචණ්ඩත්වයෙන් යුත් රාජ්‍යයක් ලෙසය. නමුත් සියල්ල වෙනස් විය. ෂෙයික් හසීනා සංග්‍රාම භූමියට ඇතුල් වූ අතර බංග්ලාදේශය පුරා නැවුම් බලාපොරොත්තුවක සුවඳක් පැතිර යන්නට පටන් ගැණුනි. පළමුව ඇය ආර්ථික ක්ෂේත්‍රයේ සාර්ථකත්වයක් අත්කර ගැනීම උදෙසා සිය අවධානය යොමු කළාය. ඇගේ පක්ෂයේ මැතිවරණ පොරොන්දුවට අනුකූලව දරිද්‍රතාවය පිටුදැකීම සඳහා ඉහළම ප්‍රමුඛතාවය ලබා දුනි.

ඒ සඳහා දරිද්‍රතාවය අවම කිරීමේ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග මෙන්ම රැකියා විරහිත තරුණ තරුණියන්ට, කාන්තාවන්ට ණය ලබා දීම සහ රැකියා පුහුණුව ලබා දීම ආදීය ඇතුළත් කර ඇයගේ රජය විසින් පස් අවුරුදු සැලැස්මක් 1997 සිට 2002 දක්වා සකස් කරන ලදි. කෘෂිකාර්මික අංශය ඉලක්ක කර ගොවිතැන ප්‍රමුඛ කොටගත් වැඩසටහන් හේතුවෙන් බංග්ලාදේශයට 2000 වසර වන විට ආහාර සහ ධාන්‍ය නිෂ්පාදනයේ ස්වයංපෝෂිත භාවය ළඟා කර ගත හැකි විය. 1995-96 දක්වා කාලය තුළ ටොන් මිලියන 19 ට සාපේක්ෂව ආහාර සහ ධාන්‍ය නිෂ්පාදනය 2000 දී ටොන් මිලියන 26.5 දක්වා ඉහළ යන ලදි. 1996 දී 48%ක් වූ දරිද්‍රතාවයෙන් යුතුව ජීවත් වූ ජනගහනය 2001 වසර වන විට සිට 44% දක්වා අඩු විය.

ෂෙයික් හසීනා විසින් බංග්ලාදේශයේ අඩු අවධානයක් සහිත ජන කොටස් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රියාවලියක් ඇති කළාය. ඒ යටතේ 1997-98 දක්වා කාලසීමාව තුළ වැඩිහිටියන් සඳහා දීමනා ක්‍රමයක් දියත් කළ අතර ඒ යටතේ 400,000 කට අධික වැඩිහිටියන්ට මාසික දීමනා ලබා දෙන ලදි. තවද වැන්දඹු සහ පීඩාවට පත්වූ කාන්තාවන්ට පරීක්ෂණ සහන, පෝෂණ දීමනා ආදියට අමතරව වෙනත් දීමනා ලබා දීම සඳහාද සමාන වැඩසටහනක් 1999-2000 කාලය තුළ ආරම්භ කරන ලදි. ආබාධිත පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීම හා පුහුණු කිරීම සඳහා ජාතික පදනමක් ටකා මිලියන 100 ක (Taka 100 million) මූලික ප්‍රදානයක් සමඟ රජය විසින් පිහිටුවන ලදි.

ඊට අමතරව රජය විසින් නිවාස නොමැති අයට නවාතැන් හා රැකියා අවස්ථා ලබා දීම සඳහා “අස්රයන්”(Asrayan) නමින් පස් අවුරුදු ව්‍යාපෘතියක් 1997-2002 දක්වා කරන ලදි. එයින් නොනැවතුණු හසීනා ඇතුළු රජය විසින් ගංගා ගඟේ (Gangas River) ඛාදනය හේතුවෙන් නිවාස අහිමි වූවන්ට ආධාර කිරීම සඳහා 1997-98 දී රජය විසින් නිවාස අරමුදලක් මෙන්ම තරුණ ප්‍රජාවේ රැකියා උත්පාදනය සඳහා 1998 දී රැකියා බැංකුවක් පිහිටුවන ලදි. එලෙසම ගෘහස්ථ ගොවිතැන සහ ගෙවතු වගාව තුළින් සමාජයේ දුප්පතුන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා අගමැති හසීනා විසින් 'එක්ති බාරි එක්ති කමාර්' ('Ekti Bari Ekti Khamar') හෙවත් ‘‘එක් නිවසක් එක් ගොවිපලක්’’ (One House One Farm) නමින් තවත් ව්‍යාපෘතියක් දියත් කරන ලදි.

1996-2001 වාරයේ දී, ෂෙයික් හසීනාගේ රජය බොහෝ ක්ෂේත්‍රයන්හි ප්‍රශංසනීය සාර්ථකත්වයක් අත්කර ගත් අතර, වඩාත්ම වැදගත් දේ වූයේ ඉන්දියාව සමඟ වසර 30 ක ගංගා (River of Ganga) ජලය බෙදා ගැනීමේ ගිවිසුමයි (The Ganga Treaty). එමගින් බංග්ලාදේශයේ ජල සම්පත් සංවර්ධනයට ඇති බාධක බොහෝ ප්‍රමාණයක් ඉවත් විය. එය ෂෙයික් හසීනාගේ දුරදක්නාභාවය සහ දේශපාලන දක්ෂතාවය පෙන්නුම් කළ අතර වැඩිදියුණු කළ ජල කළමනාකරණ ක්ෂේත්‍රයේ නව සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. එහි ප්‍රතිඵල ලෙස වාරිමාර්ග පහසුකම් වැඩි දියුණු වී බෝග අස්වැන්න වැඩි වූ අතර බංග්ලාදේශයේ බොහෝ අංශයන් මෙය හේතුවෙන් දියුණු වන්නට පටන් ගැණුනි.

හසීනා රජය විසින් සකස් කරන ලද කාන්තා අභිවෘද්ධිය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ද පුළුල් ලෙස පැසසුමට ලක්විය. එය ජීවිතයේ සෑම අංශයකින්ම පිරිමින්ගේ හා කාන්තාවන්ගේ සමානාත්මතාවය සහතික කිරීම, රටේ නොසලකා හරින ලද කාන්තා ජන කොටස් වැඩි දියුණු කිරීම හා ඔවුන්ගේ ආරක්ෂාව සහතික කිරීම, උගත් හා පුහුණු ශ්‍රම බලකායක් ලෙස ඔවුන්ව නඟා සිටුවීම, කාන්තාවන්ට එරෙහි වෙනස්කම් සහ මර්ධනයන් තුරන් කිරීම, ඔවුන්ගේ මානව හිමිකම් ස්ථාපිත කිරීම සහ දුප්පත්කම තුරන් කිරීම මෙන්ම සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන ධාරාවට ඔවුන්ගේ සහභාගීත්වය සහතික කිරීම ආදිය ඇතුළත් ජාතික ප්‍රතිපත්තියක් වූ අතර එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක

කිරීමෙන් ඔවුන්ගේ සමාජ හා නෛතික තත්ත්වයෙහි විප්ලවීය වෙනසක් ඇති වීමට පටන් ගැණුනි. එමෙන්ම බංග්ලාදේශයේ කාන්තාවන් විශාල සංඛ්‍යාවකට ඉහළ තනතුරු දැරීමට හමු වූ පළමු අවස්ථාව මෙය විය. එහි එක් අවස්ථාවක් ලෙස, 1997 දී දෙසැම්බර් මස පැවති යූනියන් පරිෂාඩ් පළාත් පාලන මැතිවරණයේදී (Union Parishad Local Government Election) සියලුම වෘත්තීය සමිතිවලට වෙන්කර ඇති ආසන 3 ක් සඳහා කාන්තාවන් තෝරා පත් කර ගන්නා ලදි. මෙය බංග්ලාදේශය නව දිශානතියකට යොමු කිරීමට සමත් විය.

කාර්මීකරණ ක්‍රියාවලිය කඩිනම් කිරීමට පුද්ගලික අංශය ශක්තිමත් කිරීමේ සහ සෘජු විදේශ ආයෝජන (Foreign Direct Investment) ආකර්ෂණය කර ගැනීමේ අරමුණු ඇතිව හසීනා ප්‍රමුඛ රජය විසින් 1999 දී නව කාර්මික ප්‍රතිපත්තියක් (New Industrial Policy-NIP) සම්මත කරන ලදි. නව කාර්මික ප්‍රතිපත්තිය විසින් අංශ හතරක් හැර පෞද්ගලික හා විදේශීය ආයෝජන සඳහා සියලුම අංශ විවෘත කළ අතර රජයේ පූර්ව අනුමැතියකින් තොරව විදේශීය ආයෝජකයින්ට සියයට සියයක් කොටස් හිමිකම ලබා ගැනීමට ඉඩ ලබා දුන්නේය. එහි ප්‍රතිඵලයක් ලෙස 1996-97 කාලය තුළ විදුලි සංදේශ අංශය (Telecommunication Sector) පෞද්ගලික අංශයේ ආයෝජකයින්ට විවෘත කළේය. “ජාතිය සංග්සාද්” (Jatiya Sangsad) හෙවත් ජාතියේ සභාව (House of the Nation) ලෙස හැඳින්වෙන බංග්ලාදේශයේ උත්තරීතර ව්‍යවස්ථාදායක මණ්ඩලය මඟින් පනතක් සම්මත කර ගැනීමෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවක් පිහිටුවීමට ද රජය පියවර ගත්තේය.

ආරම්භයේ සිටම ෂෙයික් හසීනා බංග්ලාදේශය තුළ ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය හා සමාජ ආර්ථික දියුණුව ශක්තිමත්ව හා කල් පවත්නා ලෙස ස්ථාපිත කිරීමට උත්සාහ කළ අතර පරිපාලන හා නීති ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (Administrative and Law Reform Commission) ද පිහිටුවන ලදී. ජමුනා ගඟ හරහා බංගබන්දු පාලම ඉදිකිරීම ආදිය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ඇයගේ පාලන කාලය තුළ සිදු වූ වැදගත් අවස්ථාවක් විය. රජය ගත් පියවර හේතුවෙන් යුනෙස්කෝව 1999 නොවැම්බර් 17 දින බංග්ලාදේශයේ

භාෂාව වෙනුවෙන් දිවි පිදූවන්ගේ දිනය (The Language Martyrs' Day) යෙදී තිබෙන පෙබරවාරි 21 වනදා 'ජාත්‍යන්තර මව් භාෂා දිනය' (The International Mother Language Day) ලෙස ප්‍රකාශයට පත් කළේය.

**දෙවන වරට අග්‍රාමාත්‍ය ධූරය දැරීම ( 2009-2014 )**

2009 දී පත් වූ විට හසීනා ඇතුළු රජය පෙර කාල සීමාවේ අඩු අවධානයක් හිමි වූ ක්ෂේත්‍ර කෙරෙහි වැඩිපුර සොයා බලන ලදි. එහිදී, දිගු කාලීන සැලසුම් ආරම්භ කිරීමට පෙර බලශක්ති හිඟය ඉවසා දරාගත හැකි මට්ටමකට අවම කළ යුතු බව ඇය දැන සිටියාය. තාවකාලික පියවරක් ලෙස, ඉක්මන් කුලී බලාගාර ලෙස හැඳින්වෙන කුඩා පරිමාණයේ විදුලි බලාගාර ඉදිකිරීමට පෞද්ගලික සමාගම්වලට ඉඩ දීමට ඇය තීරණය කළාය. එහි ප්‍රතිඵලයක් ලෙස 2009 දී ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 500 ක් පමණ විදුලිය එකතු කරන ලදි. 2013 වන විට විදුලිබල නිෂ්පාදන ධාරිතාව මෙගාවොට් 13,260 දක්වා වැඩි කිරීමට සමත් වූ අතර එය හසීනාගේ රජයේ විශිෂ්ඨ ජයග්‍රහණයක් විය. ඉතා දුප්පත් පුද්ගලයින් සඳහා සමාජ ආරක්ෂණ ජාල ආවරණය පුළුල් කිරීමේ අරමුණින් හසීනා රජය විසින් "අවදානමට ලක්විය හැකි කණ්ඩායම් පෝෂණය" (Vulnerable Group Feeding) හෙවත් වී.ජී.එෆ් (VGF) නමින් කාඩ්පත් සංඛ්‍යාවක් ලබා දුන් අතර එය 5,670,000 සිට 7,067,500 දක්වා වැඩි කරන ලදි. පසුගිය අවාමි ලීග් රජයේ පාලන සමයේදී ඉදිකරන ලද ප්‍රජා සායන දසදහසකට අධික සංඛ්‍යාවක් නැවත ක්‍රියාත්මක කල අතර 2009 සිට 2014 දක්වා කාලය තුළ රට පුරා ප්‍රජා සායන 18,000 ක් විවෘත කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කෙරුණි.

ඒ සමඟම නීතිය හා සාමය වැඩි දියුණු කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබූ අතර, දේශීය විදේශීය අපරාධකරුවන් සහ ත්‍රස්තවාදීන් අත්අඩංගුවට ගැනීම, නීති විරෝධී ආයුධ රජය වෙත පවරා ගැනීම, කප්පම් ගැනීම් සහ කොල්ලකෑම් මැඩපැවැත්වීම සහ සයිබර් අපරාධ මර්දනය කිරීම ආදිය සිදු කරන ලදි. ගෝලීය ආර්ථික අවපාතයේ බලපෑම් මඟහරවා ගනිමින් දේශීය, වෙළඳ හා වාණිජ කර්මාන්ත වල දියුණුව සහතික කිරීම වෙනුවෙන් රටේ ව්‍යාපාරිකයින් සඳහා මුදල් සහ ප්‍රතිපත්තිමය ආධාර ඇතුළත් දිරි දීමනා පැකේජයක් ප්‍රකාශයට පත්

කරන ලදි. ඒ සමඟම රටේ සෑම පවුලකම අවම වශයෙන් එක් සාමාජිකයෙකුටවත් රැකියාවක් සැපයීම ප්‍රමුඛ කොටගෙන වසර 5 ක ස්වයං රැකියා උත්පාදනය හා දරිද්‍රතාවය පිටුදැකීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළහ.

දේශීය කර්මාන්ත නගා සිටු වීමේ අරමුණෙන් පරිසර හිතකාමී කෘෂිකාර්මික භාණ්ඩයක් වන ජුට් හා සම්බන්ධ භාණ්ඩ සඳහා රජය විසින් වැදගත්කමක් ලබා දී රට තුළ වසා ඇති ජුට් මෝල් නැවත විවෘත කිරීමට පියවර ගත් අතර ගෝලීය වෙළඳපොලේ ජුට් සහ ජුට් භාණ්ඩ සඳහා නව ගැනුම්කරුවන් සොයා ගනිමින් අපනයන වැඩි දියුණු කිරීම සඳහා පියවර ගත්තාය. විදේශ ආයෝජන වැඩි පරිමාවකින් ආකර්ෂණය කර ගැනීම සඳහා නව කාර්මික ප්‍රතිපත්තියට නව දිරිගැන්වීම් සහ පහසුකම් ගණනාවක් එකතු කරන ලදි. රජය විසින් නිසි ආර්ථික කළමනාකරණය හේතුවෙන් 2009-10 මූල්‍ය වර්ෂය තුළ රටේ විදේශ විනිමය සංචිතය ඇමරිකානු ඩොලර් බිලියන 5 සීමාව පසු කළේය.

ඉහත සඳහන් කරුණු වලට අමතරව රජයේ සේවකයින් සඳහා නව වැටුප් පරිමාණයක් ප්‍රකාශයට පත් කිරීම, රටේ කොටස් වෙළඳපොල නංවාලීම සඳහා බැංකු 50 ක් ආරම්භ කිරීම, පාලනයේ අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා " ජාතික සංග්සාද" (National Sansad) හි භාරකාර රජය තුළ පනවන ලද බොහෝ අණ පනත් සම්මත කිරීම, නිවාස නොමැති, අසරණ සහ දැඩි දුප්පතුන්ට නවාතැන් හා රැකියා සැපයීම සඳහා ටකා බිලියන 3 ක වියදමින් " අස්රයන් ව්‍යාපෘතිය" (Ashrayan Project) පුනර්ජීවනය කිරීම, 2013 වර්ෂය වන විට රට ස්වයංපෝෂිත හෝ ආහාර ධාන්‍ය නිෂ්පාදනයේ අතිරික්තයක් බවට පත් කිරීම සඳහා 2009-10 කාලය තුළ ටකා කෝටි 150 ක ව්‍යාපෘතියක් දියත් කිරීම ආදියද හසීනා ප්‍රමුඛ රජයේ වැදගත් කාර්යභාරයන් විය.


**තෙවන වරට අග්‍රාමාත්‍ය ධූරය දැරීම ( 2014-2019 )**

ඇයගේ තෙවන ධූර කාලයේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස පද්මා පාලම් ව්‍යාපෘතිය (Padma Bridge project) හඳුන්වා දිය හැකි අතර බංග්ලාදේශ ඉතිහාසයේ වඩාත්ම අභියෝගාත්මක ඉදිකිරීම් ව්‍යාපෘතිය ද මෙය විය. මෙම ව්‍යාපෘතිය සඳහා පූර්ව සුදුසුකම් ලත් ටෙන්ඩරය බංග්ලාදේශ පාලම් අධිකාරිය

(The Bangladesh Bridge Authority-BBA) විසින් 2010 අප්‍රේල් මාසයේ දී කැඳවූ අතර පාලම ඉදිකිරීම 2011 මුල වන විට ආරම්භ කිරීමට අපේක්ෂා කරන ලදි. නමුත් ව්‍යාපෘති සකස් කිරීම හා සම්බන්ද සමහර පුද්ගලයින්ගේ දූෂණ චෝදනාවන් හේතුවෙන් ලෝක බැංකුව සිය දායකත්වය ඉවත් කර ගත් අතර අනෙකුත් පරිත්‍යාගශීලීන් ද එය අනුගමනය කළහ.


හදිසියේ මුහුණ දුන් මේ තත්ත්වය හමුවේ මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කිරීමට බංග්ලාදේශ රජය තීරණය කළේය. ඒ අනුව යමින් 2014 ජුනි 17 වන දින පද්මා පාලම ඉදිකිරීමේ වැදගත් ප්‍රගතියක් ලෙසට ඩොලර් බිලියන 2 ක් හෝ ව්‍යාපෘති පිරිවැයෙන් 70% ක් ආයෝජනය කරමින් චීනය විසින් පාලම ඉදිකිරීමට යෝජනා කරන ලදි. ඒ අනුව පද්මා ගඟේ දිගුකාලීන පාලම ඉදිකිරීම සඳහා සීමාසහිත "චයිනා මේජර් බ්‍රිජ් ඉංජිනේරු සමාගම" (China Major Bridge Engineering Company Ltd) ඉදිකිරීම් කටයුතු සම්බන්ධ සමාගම ලෙස තෝරාගත්තේය. 2015 වසරේ මෙහි ඉදිකිරීම් කටයුතු නිල වශයෙන් ආරම්භ කළ අතර බංග්ලාදේශයේ නිරිතදිග ප්‍රදේශය උතුරු හා නැගෙනහිර ප්‍රදේශ සමඟ සම්බන්ධ කිරීම මෙහි අරමුණ විය.

**බංගලාදේශයේ දළ දේශීය නිෂ්පාදිතය- 1996-2018**




*(මූලාශ්‍රය- ලෝක බැංකු ජාතික ගිණුම් දත්ත වාර්තාව 2018)*

**බංගලාදේශයේ රැකියා නියුක්තිය 1996-2016**




(*මූලාශ්‍රය* *www.ceicdata.com* )

චිතගොං (Chittagong) හි දිනකට ජලය ලීටර් කෝටි 14 ක් පිරිසිදු කිරීමේ හැකියාව ඇති අළුතින් ඉදිකරන ලද ජල පවිත්‍රාගාරය (Sheikh Hasina Water Treatment Plant) අග්‍රාමාත්‍ය ෂෙයික් හසීනා විසින් නිල වශයෙන් 2017 වසරේ මාර්තු 12 වන දින ආරම්භ කරන ලදි. එහෙයින් චිතගොං හි ජල සම්පාදන හා මලාපවහන අධිකාරියට (The Water Supply and Sewerage Authority-WASA) දිනකට ජලය ලීටර් කෝටි 18 ක් ව පැවති ධාරිතාවය දිනකට ජලය ලීටර් කෝටි 32 ක ධාරිතාවයක් දක්වා වැඩි කර නිෂ්පාදනය කිරීමේ හැකියාව හිමි විය.

ඇයගේ තෙවන ධූර කාලය තුළ මුහුණ දුන් බරපතළ අවස්ථාවක් ලෙස රෝහින්ග්‍යා අර්බුදය (Rohingya Crisis) පෙන්වා දිය හැකිය. 2017 සැප්තැම්බර් මාසයේදී ඇගේ රජය රෝහින්ග්‍යා සරණාගතයින් මිලියනයකට පමණ තාවකාලික නවාතැන් හා ආධාර ලබා දුන් අතර රෝහින්ග්‍යා මුස්ලිම්වරුන්ට එරෙහි හිංසනය අවසන් කරන ලෙස මියන්මාරයෙන් ඉල්ලා සිටියේය. රෝහින්ග්‍යා වැසියන්ට සරණාගතයින් ලබා දීමට රජය ගත් තීරණයට



*(ෂෙයික් හසීනා විසින් 2015 දෙසැම්බර් 12 වන දින බංග්ලාදේශයේ ඩකා නුවරදී පද්මා පාලම් ව්‍යාපෘතියේ සමරු ඵලකය නිරාවරණය කරමින් රටේ විශාලතම ව්‍යාපෘතියේ ප්‍රධාන කටයුතු ආරම්භ කරන ලදි.)*

බංග්ලාදේශ ජනතාවගෙන් බහුතරයක් සහාය දැක්වූ අතර හසීනාගේ ක්‍රියාව වෙනුවෙන් ගෞරවය හා ප්‍රශංසාව හිමි විය. හසීනා අතිවිශාල දැවැන්ත මානුෂීය රෝහින්ග්‍යා ප්‍රශ්නය එකවරම හසුරුවමින් ජාතික දේශසීමාවෙන් ඔබ්බට ගිය ඇයගේ දක්ෂ නායකත්වය ඇගයීමට හා පිළිගැනීමට ලක්විය. බංගලාදේශය රෝහින්ග්‍යා සරණාගතයින්ට රැකවරණය ලබා දුන් ෂෙයික් හසීනා සැබවින්ම මනුෂ්‍යත්වයේ මව (Mother of Humanity) ලෙස ඉස්මතු වී තිබේ. වඩා හොඳ ජීවන තත්වයන් සහතික කිරීම අඩු වරප්‍රසාද ලත් පිරිස් පුනරුත්ථාපනය කිරීම හා නැවත පදිංචි කිරීම ආදී ඇදහිය නොහැකි තරම් දුෂ්කර කාර්යයන් ඇය සිය ඉවසීම හා ධෛර්යය තුළින් සාර්ථක ලෙස විසඳුවාය. හසීනා තම මාතෘභූමියේ නාමය අභ්‍යවකාශයේද සනිටුහන් කිරීමට අවශ්‍ය සහය නොමඳව ලබා දුන්නාය.

එහි ප්‍රතිඵලයක් ලෙස 2018 වසරේදී බංග්ලාදේශයේ පළමු සන්නිවේදන චන්ද්‍රිකාව වන බංගබන්දු-1 (Bangabandhu-1) චන්ද්‍රිකාව දියත් කරන ලදි. තෙවන ධුර කාලය වන විට බංග්ලාදේශයේ තවත් ප්‍රදේශ සඳහා විදුලි බලය ලබා දුන් අතර රටෙන් 95% කට පමණ විදුලිය ලබා ගත හැකි විය. නමුත් ජනගහනය ආර්ථික වශයෙන් සංවර්ධනය වෙමින් පැවතුන බැවින් විදුලිය සැපයීම පුළුල් කිරීමට සිදු වූ අතර බලශක්ති නිෂ්පාදනය වැඩි කිරීමට සිදු විය. එසේ හෙයින් බංග්ලාදේශය විදුලියෙන් 2.5% ක් උත්පාදනය කිරීම උදෙසා ගල් අඟුරු යොදා ගන්නා ලදි. එය ඉදිරියට 25% ක් දක්වා වැඩි කිරීමට සැලසුම් කර තිබුණි. එයට අමතරව රට පුරා විශේෂ ආර්ථික කලාප 100 ක ජාලයක් ඉදිකිරීම සඳහා රජය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදි.

**සිව්වන වරට අග්‍රාමාත්‍ය ධූරය දැරීම ( 2019-වර්තමානය )**

හසීනා බංග්ලාදේශ ඉතිහාසයේ දීර්ඝ කාලයක් සේවය කළ අගමැතිවරියයි. 2018 වසරේ දෙසැම්බර් 30 වන දින පැවති ජාතික මැතිවරණයෙන් පාර්ලිමේන්තු ආසන 300 න් 288 ක් දිනා ගැනීමට ඇගේ පක්ෂය වන බංග්ලාදේශ අවාමි ලීගය සමත් වීමෙන් පසුව ඇය සිව්වන වරටත් ධුරයට පත්විය. වත්මන් ධුර කාලය ද ඇය අඛණ්ඩව තුන්වන වරටත් ධූරයට පත්වේ. මෙය තම අවසාන ධූර කාලය වනු ඇතැයි ඇය විශ්වාස කළ අතර ආහාර සුරක්ෂිතතාව, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමට හසීනා සැලසුම් කලාය. 2021 වන විට බංග්ලාදේශය සංවර්ධිත රටක් බවට පත් කිරීමේ අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කරන බවට හසීනා සහතික වී තිබේ.

ඇයගේ  නායකත්වය යටතේ සිදු වූ කටයුතු අතර ලොව විශාලතම පිළිස්සුම් සත්කාර මධ්‍යස්ථානය ලෙස සැලකෙන ෂෙයික් හසීනා ජාතික පිළිස්සුම් හා ප්ලාස්ටික් සැත්කම් ආයතනය (Sheikh Hasina National Burn & Plastic Surgery Institute) 2019 ජූලි 4 රෝගීන් සඳහා විවෘත කිරීම, ඊ-විදේශ ගමන් බලපත්‍ර නිෂ්පාදන සහ 4G තාක්ෂණය 5G කිරීමට පියවර ගැනීම ආදිය පෙන්වා දිය හැකිය. ජාතියේ පිනට පහළ වූ දියණියක් බඳු වූ හසීනාගේ නායකත්වය හමුවේ බංග්ලාදේශය කෙමෙන් කෙමෙන් දිගු ගමනක යෙදී සිටින අතර එහි අවසානයක් නම් පෙනෙන මානයක නොමැති බව ඉඳුරාම ප්‍රකාශ කළ හැකිය.

## විදේශ ප්‍රතිපත්තිය

ෂෙයික් හසීනා යටතේ බංග්ලාදේශයේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව අධ්‍යනය කිරීමේදී ඇය විසින් බංග්ලාදේශයේ ජාතියේ පියා (Father of Nation) ලෙස සැලකූ තම පියාණන්ගේ 'සැමට මිත්‍රත්වය, සැමට කරුණාව' (Friendship to all, Malice to none) නම් දර්ශනය අනුගමනය කරමින් කටයුතු කළාය. ඇයගේ නායකත්වය යටතේ බංග්ලාදේශයේ විදේශ සබඳතා ලෝකය තුළ සුහද

ප්‍රතිරූපයක් නිර්මාණය කිරීමට සමත් විය. සෑම රටක් සමගම මිත්‍රශීලිව කටයුතු කිරීමෙන් බංග්ලාදේශය ලෝකයේ පැසසුමටත්, අවධානයටත් අද වනවිට ලක්ව ඇත. එමෙන්ම එතෙක් බංග්ලාදේශය තුළ පැවති ත්‍රස්තවාදී, මෙන්ම දූෂිත ඝෘණාත්මක අනන්‍යතාවය වෙනුවට ප්‍රජාතාන්ත්‍රික, මානව හිමිකම් ආරක්ෂා කරන රටක් ලෙස ජාත්‍යන්තරය තුළ පිළිගැනීමට ලක්ව තිබේ.

**පළමු ධූර කාලය (1996-2001)**

ෂෙයික් හසීනා තම පළමු ධූර කාලය තුළ බංග්ලාදේශය හා ඉන්දියාව අතර පවතින ගැටලු විසඳාගැනීම සඳහා කටයුතු කළාය. ගංගා ගඟේ (River of Ganga) ජලය බෙදා ගැනීම පිළිබඳ දීර්ඝ කාලයක් තිස්සේ පැවති ආරවුල 1996 දෙසැම්බර් 12 වන දින ජල බෙදාගැනීමේ ගිවිසුම (The Ganga Treaty) අත්සන් කිරීමත් සමඟ විසඳීමට ඇය මූලිකත්වය ගෙන කටයුතු කළාය. 1997 දෙසැම්බර් 2 වන දින බංග්ලාදේශ රජය සහ ශාන්ත බහිනි මිලිෂියාව පාලනය කළ පර්බාටියා චට්ටග්‍රාම් (Parbatya Chattagram) ජන කොට්ඨාසයේ ජන සංගාති සමිතිය අතර 'චිතගොං හිල් ට්‍රැක්ට්ස් සාම ගිවිසුම' (The Chittagong Hill Tracts Peace Treaty) අත්සන් කරන ලදී.

1999 ඔක්තෝබර් 14 වන දින බංගලාදේශය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලය විසින් වසර 2 ක් සඳහා ආරක්ෂක මණ්ඩලයේ ස්ථිර නොවන සාමාජිකත්වය (Non permanent membership) සඳහා තෝරා ගන්නා ලදි. එකල බංගලාදේශය වැනි තුන්වන ලෝකයේ රටක් ලෙස ස්ථිර නොවන සාමාජිකයන් දස දෙනා අතරට තෝරා ගැනීමෙන් හසීනා තම විදේශ ප්‍රතිපත්තිය මඟින් ජාත්‍යන්තරය තුළ බංග්ලාදේශය ඉහළ නංවා තිබූ ආකාරය මනාවට පැහැදිලි වේ. ඒ අතරම 2000 වර්ශයේ මාර්තු මස ඇමරිකානු ජනාධිපති බිල් ක්ලින්ටන් (Bill Clinton) බංගලාදේශයේ සංචාරයක යෙදුනු අතර මෙලෙස සංචාරයේ යෙදුනු පළමු ඇමරිකානු ජනාධිපති බවට ක්ලින්ටන් පත් විය.

ඇගේ ප්‍රථම ධූර කාලය තුල බිම්ස්ටෙක් (Bay of Bengal Initiative for Multi Sectorial Technical and Economic Cooperation), අයෝරා (Indian Ocean

Rim Association) ඇතුළු විවිධ කළාපීය හා ජාත්‍යන්තර සංවිධාන රැසකගේ සාමාජිකත්වය ලබා ගැනීමට කටයුතු කළාය. එමෙන්ම විදේශ සංචාර රැසකට සහභාගී වූ ඇය 1999 මාර්තු වල ඩකා හි පැවති දෙවන ඩී-8 (D-8) සමුළුව, 1999 සැප්තැම්බර් මාසයේ ඩකා නුවර පැවති සාමය හා සහයෝගීතාවය වෙනුවෙන් කැපවූ ආසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පළමු සමුළුව ආදී සමුළු කිහිපයකට සත්කාරකත්වය ලබාදෙන ලදි.



*(අගමැති හසීනා සහ ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි නවදිල්හි නුවර පැවති රැස්වීමකින් පසු ද්විපාර්ශ්වික ව්‍යාපෘති තුනක් සඳහා සමරු ඵලකය නිරාවරණය කිරීම)*

**දෙවන ධූර කාලය (2009-2014)**

දෙවන වරට අග්‍රාමාත්‍යධූරයට පත් වීමෙන් පසු පළමු වරට වඩා වැඩි කාර්යභාරයක් ඉටු කිරීමට ඇයට හැකි විය. බංග්ලාදේශයේ ජාතික අභිලාශ, ආර්ථික වර්ධනය, විදේශ ආයෝජන සහ වෙළඳාම මෙන්ම දකුණු ආසියානු කලාපය තුළ සහ ලෝකය තුළ සාමය පවත්වා ගැනීමට බංග්ලාදේශය දරන උත්සාහය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පැසසුමට ලක්විය.

එක්සත් ජාතීන්ගේ 66 වන මහා මණ්ඩල රැස්වීමේදී අග්‍රාමාත්‍ය ෂෙයික් හසීනා විසින් "ජනතා සවිබල ගැන්වීම සහ සංවර්ධනය" (People's empowerment and a peace-centric development model) නමින් ලෝක සාම ආකෘතියක් ඉදිරිපත් කළාය. එක්සත් ජාතීන්ගේ සංවිධානය මෙම ආකෘතිය යෝජනාවක් ලෙස පිළිගත්තේය. මේ සමගම 2011 වර්ෂයේදී බංග්ලාදේශයට ගෞරව සම්මානයක් හිමි විය. මෙය 1971 වර්ෂයෙන් පසුව බංග්ලාදේශය ජාත්‍යන්තරය තුළ නැගී සිටීමක් ලෙස සලකනු ලබයි. බංග්ලාදේශය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ රටවල් සමග රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ආරම්භ කරන ලදී. ඉන්දියාව,

පාකිස්තානය සහ බුරුමය සමඟ ඇති සමහර ද්විපාර්ශ්වික ආරවුල් හැරුණු විට ඔවුන් සමඟ ඇති සබඳතා බොහෝ දුරට සුහද ය.

එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සමඟ ලොව පුරා සාමය ඇති කිරීම සඳහා බංග්ලාදේශය වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදි. 2012 වර්ෂයේදී සිරියාව සම්බන්ධ ගැටලුවේදී අනෙක් සියලු ජාතින් වෙන්ව ගියද සිරියාව වෙත ප්‍රථමයෙන් හමුදාව පිටත් කර හරින ලද්දේ බංග්ලාදේශයයි. මෙම දායකත්වය වර්තමානය වන විට භට පිරිස් 163,181 ලබාදීමට තරම් ප්‍රබලය.

චීනය බංග්ලාදේශයේ විශාලතම යුධ සැපයුම්කරු වූ අතර එක්සත් ජනපදය බංගලාදේශ නිෂ්පාදන සඳහා විශාලතම අපනයන වෙළඳපොලක් විය. එමනිසා ඒ රටවල් සමඟ සමීප සබඳතා පැවැත්වූ හසීනා රුසියානු ණය සහ යුධමය නවීකරණය සඳහා තාක්ෂණික සහය ලබාදීම නිසාවෙන් රුසියාව සමඟද බලවත් සබඳතා ඇතිකර ගත්තේය. එහි ප්‍රතිඵලයක් වූයේ පළවෙනි වතාවට බංගලාදේශයේ න්‍යෂ්ටික බලාගාරයක් ඉදි කිරීමයි. ෂෙයික් හසීනා 2013 ජනවාරි මාසයේ රුසියාවේ මොස්කව් වෙත කරන ලද සංචාරයත් සමග න්‍යෂ්ටික බලශක්තිය හා ගෑස් නිස්සාරණය, යුධමය දෘඩාංග මිලදී ගැනීම සහ වෙනත් අංශවල ද්විපාර්ශවික ගනුදෙනු රාශියක් අත්සන් තබන ලදි. මෙම සංචාරය ඔවුන්ගේ සබඳතාවල විශේෂ සන්ධිස්ථානයක් වී තිබේ.

### තෙවන ධූර කාලය (2014-2019)

තෙවන වතාවට බලයට පත්වූවායින් පසුව අසල්වාසී රට වන ඉන්දියාව සමඟ නව ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීමට පෙළඹුණු ෂෙයික් හසීනා ආසියානු දැවැන්තයන් දෙදෙනා වන ජපානය සහ චීනය සමඟද තම බැඳීම් ශක්තිමත් කිරීමට කටයුතු කළේය. ඉන්දියාව සමග පැවති ද්විපාර්ශ්වීය සබඳතා නව මාවතකට යොමු කරමින් 2015 ජූනි 6 වන දින ඉන්දියාව සහ බංග්ලාදේශය වසර 40 ක දේශසීමා සීමා ආරවුල අවසන් කිරීම සඳහා ගිවිසුමක් (Land Boundary Agreement) අත්සන් කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස රටවල් දෙක අතර නීතිවිරෝධී සංක්‍රමණය පාලනය විය. ටීස්ටා බාධකය (Teesta barrage) ඉදිකිරීමට ඉන්දියාවෙන්ද, මතාර්බාරි අල්ට්‍රා සුපිරි ගල් අඟුරු බලාගාර

(Matarbari Ultra supercritical coal-fired power plant) ව්‍යාපෘතියට ජපානයෙන්ද , පද්මා දුම්රිය සම්බන්ධතාවය (Padma rail link), ඩකා නැගෙනහිර-බටහිර අධිවේගී මාර්ගය (Dhaka east-west expressway) සහ ජමුනා ද්විත්ව මාර්ග (Jamuna double lines) ඇතුළු සංවර්ධන ව්‍යාපෘති කීපයකටයම චීනයෙන් ද ණය ආධාර ලබාගැනීමට ඇයට හැකිවිය. චීන ආයෝජන මේ ආකාරයෙන් ආකර්ෂණය කර ගැනීමට ඇයට හැකි වූ අතර චීනයේ නව සේද මාවත පිළිබද යෝජනාවේදී බංග්ලාදේශය වෙත වැදගත්කමක් ලබාදීමට හැකි විය.

ෂෙයික් හසිනා ගේ චීන සංචාරයේදී ඇය බංගලාදේශය-චීනය-ඉන්දියාව-මියන්මාර ආර්ථික කොරිඩෝවේ (BCIM-EC) ප්‍රගතිය අපේක්ෂා කරන බව ද පැවසුවාය. ඒ අතර බංග්ලාදේශයේ යටිතල පහසුකම් සඳහාද සංවර්ධන අංශයේ ප්‍රධාන අංශ කිහිපයක් සඳහා ද ඇය චීනයේ සහාය පතන ලදි. ඒ අනුව යමින් චීනය "විෂන් 2021" (Vision 2021) සාක්ෂාත් කර ගැනීම තුළින් මධ්‍යම ආදායම් ලබන රටක් බවට පත්වීමට බංග්ලාදේශයට සහනදායක ණය ලබා දී ඇත. බංගලාදේශයේ හිටපු ජනාධිපති අබ්දුල් හමීඩ් 2015 දෙසැම්බරයේ සිදු කළ ඉන්දිය සංචාරයට ප්‍රතිචාර දක්වමින් ඉන්දීය අග්‍රාමාත්‍යවරයා ප්‍රකාශ කර සිටියේ දෙරට අතර ඇති ගැටළු ඉක්මනින් විසඳා ගැනීමට හැකි වනු ඇති බවයි.

දකුණු ආසියාවේ නැගෙනහිර උප කලාපීය රටවල් සමූහයක් වන බංගලාදේශය, භූතානය, නේපාලය සහ ඉන්දියාව අතර මගීන්, පිරිස් සහ භාණ්ඩ වාහන ගමනාගමනය නියාමනය කිරීම සඳහා 2015 දී වැදගත් මෝටර් රථ ගිවිසුමක් (Motor Vehicles Agreement-MVA) අත්සන් කරන ලදි. යුරෝපීය ආකෘතිය මත පදනම් වූ මෙම ගිවිසුම කලාපයේ යහපත හා ඒකාබද්ධතාවය සහ එහි ආර්ථික සංවර්ධනය සඳහා දේශ සීමාව හරහා භාණ්ඩ හා මිනිසුන්ගේ බාධාවකින් තොරව ගමන් කිරීමට මග සලසා දුන්නේය. ගොඩබිම් සහිත භූතානය, බංග්ලාදේශය, නේපාලය සහ ඊසානදිග ඉන්දියානු ප්‍රදේශ චිතගොං සහ කොල්කටා වරායන් සමඟ සම්බන්ධ කිරීම මෙම ගිවිසුමේ අරමුණ විය. මෙම ගිවිසුම යටතේ බංග්ලාදේශය සහ නේපාලය 2018 අප්‍රේල් 24 වන දින ඉන්දියාව හරහා බස් සේවාවක් දියත් කළේය.

**සිව් වන ධූර කාලය (2019 සිට අද දක්වා)**

හසීනා සිව් වන වරට බලයට පත්ව එතරම් කලක් ගත නොවූවද තම රටෙහි විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කර ඇත. ඒ අනුව බංග්ලාදේශයේ විදේශ ප්‍රතිපත්තියේ මූලික අරමුණු වූයේ රජයේ අභ්‍යන්තර හා බාහිර ආරක්ෂාව ප්‍රවර්ධනය, සමාජ ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීම, සංස්කෘතික අනන්‍යතාවය සහ ජාතික ගෞරවය පවත්වා ගැනීම ය. එමෙන්ම ත්‍රස්තවාදය, මත්ද්‍රව්‍ය ජාවාරම, නීතිවිරෝධී ආයුධ සංසරණය, දේශගුණික විපර්යාස යනාදී ගැටළු නිරාකරණයට වැඩි අවධානයක් ලබා දී ඇත. 2019 ඔක්තෝබර් මස නවදිල්ලි නුවර පැවති ලෝක ආර්ථික සමුළුවේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීමට ෂෙයික් හසීනා ට අවස්ථාව හිමි විය. එහිදී ඉන්දියාව සමඟ රටවල් දෙකටම පොදු බැඳීම් පිළිබඳවද, දේශසීමා ආරක්ෂාව සහ කළමනාකරණය, රාජ්‍යයන් ද්විත්වයටම වාසිදායී වන ලෙසට ව්‍යාපාරික හවුල්කාරිත්වය (win-win business partnership), ගොඩබිම, ජලය, ගුවන් යනාදී සියලූම අංශවල සම්බන්දතාවය ඉහළ නැංවීම හා ආරක්ෂක සහයෝගීතාව ඇතුළු මාතෘකා රැසක් පිළිබදව සාකච්ඡා සිදුකෙරිණි.

එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ එක්සත් ජාතීන්ගේ මහලේකම්වරුන්ගේ ගෝලීය අධ්‍යාපන පළමු මුල පිරීමේ ඉහල මට්ටමේ සාකච්ඡාවකදී ඇය කියා සිටියේ, "යුද යන්ත්‍ර සහ ප්‍රචණ්ඩත්වය නිර්මාණය කිරීම සඳහා අප වැය කරන බිලියන ගණනක් මුදල් අපට අවශ්‍ය ලෝකය නිර්මාණය කිරීමේ අරමුණින් අධ්‍යාපනය වෙත යොමු කල යුතු බවයි." එලෙස කියූ පරිදි ඇගේ උපරිමයෙන් රටේ දියුණුව වෙනුවෙන් අදටත් කැප වෙමින් සිටි.

## <u>ගත හැකි ආදර්ශ</u>

බංගලාදේශයේ ගතිකානුගතික පරිසරය අතික්‍රමණය කල උත්කෘෂ්ට ගුණාංගයන්ගෙන් යුක්ත නවීන අදහස් පෙරදැරි කොටගත් කාන්තාවක ලෙස ෂෙයික් හසීනා නැමැති අද්විතීය කාන්තා නායකත්වය හඳුනාගත හැක. කාන්තාවක වුවද ඇය සතු වූ ශක්තිය හා පෞර්ෂය අපමණය. මෙනිසාම හසීනා

ඉතා දැවැන්ත චරිතයක් බව අප කවුරුත් මේ වන විට දනී. ෂෙයික් හසීනා මෙසේ දේශපාලනයේ දැවැන්ත චරිතයක් බවට පත්වීමට කුඩා කල සිට තම පවුල් පසුබිම මගින් ලද පන්නරය මෙන්ම සමාජයේ ඇයට මුහුණ පෑමට සිදුවූ තාඩනපීඩන සහ අභියෝගයන් මහත් රුකුලක් කරගත් බව කිව යුතුය.

ජනාධිපති රහ්මාන්ගේ නිර්භීත නායකත්වය හා නොපසුබට උත්සාහය තම ජීවිතයට ඇදා ගත් හසීනා තම දිවිය සාරවත් කරගැනීමට ඒවා උදව් කරගත්තාය. ඇයගේ නිහතමානී ගුණය ද අප ජීවිතයට ගත හැකි අගනා ආදර්ශයක් වේ. සැබැවින්ම අන් අයගේ දුක හඳුනන නායකයෙකු වීම නිසා ඇය 'මනුෂ්‍යත්වයේ මව' ලෙස හඳුන්වනු ලැබූ බව මින් පෙරද සඳහන් කරන ලදි. ඇය සතුවූ එම අපරිමිත සෙනෙහසත් මානුෂීය ගුණාංගත් ඇයගේ චරිතය තුළින් උකහා ගැනීමෙන් මේ මිහිමත ආදරය, කරුණාව, මිනිසත්කම වැනි උතුම් ගුණාංග උස් පහත් භේදයකින් තොරව පතුරුවාලීමට අපට හැක.

ඒමෙන්ම තම දේශපාලන කටයුතු නිසා කිසිසේත් අධ්‍යාපන කටයුතු කඩාකප්පල් කර නොගත් හසීනා දේශපාලනයද, අධ්‍යාපනයද සියල්ලම සමානව හසුරුවා ගත්තාය. එම නිසා එකවර කාර්යයන් කිහිපයක් සාර්ථකව කරගැනීමේ හැකියාව ඇයගෙන් ලබාගත හැකි තවත් ආදර්ශයක් වේ. තවද ෂෙයික් හසීනාගේ දෙමව්පියන් සහ සහෝදරයන් තිදෙනාද ඝාතනය වූ අවස්ථාවේ ඇයට තම රටින් පිටුවහල් වීමටද සිදුවිය. නමුත් එම බාධක සියල්ලන්ගෙන් නොසැලුනු ඇය දැඩි අධිෂ්ඨානයකින් යුක්තව තම දේශපාලන දැක්ම තව දුරටත් සවිමත් කරගනිමින් නැවත අවුරුදු හයකට පසුව සිය රටට පැමිණෙන්නේ තම පියා විසින් ආරම්භ කරන ලද "අවාමි ලීගය" (Awami League) නම් දේශපාලන පක්ෂයේ සභාපති ධූරයට පත්වෙමින්ය. දැඩි අධිෂ්ඨානය හා කැපවීම ඇයගේ චරිතයෙන් ගතහැකි තවත් ආදර්ශයන් වේ.

එමෙන්ම ඇය දේශපාලනයට පිවිසීමෙන් පසු විරුද්ධවාදීන් රැසකගේ කෙනහිලිකම් වලට මුහුණ දීමට සිදුවිය. විටින් විට හසීනාව සිරභාරයට ගැනීමට කටයුතු සිදුකිරීමට ඔවුහු සැලසුම් දියත් කළහ. එසේම විටෙක ඇයව නිවාස අඩස්සියටද නියම කළහ. මෙසේ සිදු කල කිසිදු එදිරිවාදිකමකට බිය නොවූ හසීනා නොසැලී ඉදිරියටම තම දේශපාලන කටයුතු සිදු කළාය. එම

ක්‍රියාපටිපාටිය විරුද්ධවාදීන්ට නිරන්තරයෙන් විශාල අභියෝගයක් විය. හසීනාගේ මෙම ධෛර්යයවන්ත බව සහ නොපසුබස්නා උත්සාහය අප අගය කළ යුතු අතරම අපගේ දිවියට ආදර්ශයක් ලෙස එක් කරගත යුතුය.

තවද ඇය මානව අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිට සෑම විටම යහපත් දේ කරලීමට උත්සහ කළ නායිකාවකි. එම ගුණාංගයද අප ජීවිතයට ගතහැකි වටිනා ආදර්ශයකි. හසීනා සෑම ජනකොටසක් පිළිබඳවම එක ලෙස සිතූ තැනැත්තියකි. එයට කදිම උදාහරණය ලෙස ඇය රෝහින්ග්‍යා සරණාගතයින් වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ගය පෙන්වා දිය හැක. බංග්ලාදේශයේ ආර්ථිකය ස්ථාවර මට්ටමකට රැගෙන ඒමට ඇයට හැකි වන්නේ ඇයගේ තීක්ෂණ බුද්ධිය නිසාවෙනි. ඇය තම තීක්ෂණ බුද්ධිය යොදාගනිමින් මනා කළමනාකරණයකින් යුක්තව තීන්දු තීරණ ගෙන එම අභියෝග ජයගත්තාය. මෙම සියලුම කරුණු කාරණා වලින් හැඟී යන්නේ හසීනා, ඇය කෙරෙහි දෝෂාරෝපනයක් සිදුකළ නොහැකි තරමේ අග්‍රගණ්‍ය නායිකාවක බවයි. ඇයගේ චරිතයෙන් ලොකු කුඩා කාටත් පාඩම් රැසක් උගත හැකිය.

## සාරංශය

තාඩන පීඩන, පළිගැනීම්, එදිරිවාදිකම් අභිමුව වුවද බංගලාදේශ ඉතිහාසයේ වැඩිම කාලයක් ධූරය හෙබවූ අගමැතිනිය ලෙස කිරුළු දරන ෂෙයික් හසීනා බංගලාදේශ ප්‍රථම ජනාධිපතිවරයාගේ වැඩිමහල් දියණිය ලෙස 1947 සැප්තැම්බර් 28 දින උපත ලැබුවාය. එතැන් පටන්ම තම පියාගේ ආභාෂයත් සමග දේශපාලන පසුබිම්ක හැදී වැඩීමට ඇයට අවකාශය හිමිවිය. තම පියා මෙන් ස්වකීය රාජ්‍ය වෙනුවෙන් තමාද අනාගතයේදී ඇප කැප වන බව කුඩා හසීනා ඉටා ගන්නට ඇත. ඊට අඩිතාලම ලෙස තම අධ්‍යාපන කටයුතු සර්ථකව සාක්ෂාත් කරගත් ඇය තම පියාගේ දේශපාලන දැක්ම සවිමත් කිරීමේ අදහසින් වසර හයකට පසු සිය රටට පැමිණුනේ අවාමී ලීගයේ සභාපති ධූරයට පත් වීමත් සමගයි. ඉන්පසුව 1996 දී ඇය බංගලාදේශයේ අගමැති ධූරයට පත් වූවාය. හසීනා අගමැති ධූරයට පත්වූ කාලවකවානු වල බංගලාදේශයේ ආර්ථිකය සාර්ථක මට්ටමකට ගෙන යාමට ඇයට හැකි විය. ඇය තම රට තුළ ප්‍රතිපත්ති

නිවැරදිව සම්පාදනය කළ අතර ප්‍රචණ්ඩකාරීත්වයට සපුරා විරුද්ධ වූවාය. මානව අයිතිවාසිකම් වෙනුවෙන් නිතරම පෙනී සිටි ඇය කාන්තා හා ළමා හිංසනය පිටු දැකීමට ද ක්‍රියාකාරීව සම්බන්ධ වූවාය. තම දේශපාලන ගමනේදී තමාට කොතෙකුත් කෙනෙහිලිකම් පැමිණියත් ඇය නොසැලී ඉදිරියටම පැමිණියාය. ඇය ප්‍රජාතන්ත්‍රවාදය අගය කළ නායිකාවක් ලෙස නිතරම කටයුතු කළ නිසාවෙන් බංගලාදේශය තුළ කිහිපවතාවක්ම අගමැති හා විපක්ෂනායක ධූර හෙබවීමට ඇයට ඉඩ ප්‍රස්ථාව ලැබුණි.

ෂෙයික් හසීනා තම විදේශ ප්‍රතිපත්තියද යහපත් මෙන්ම මිත්‍රශීලී ක්‍රියාපටිපාටියක් ලෙස පවත්වාගෙන ගියාය. එක්සත් ජාතීන්ගේ සංගමය හා සම්බන්ධ වී නොයෙකුත් වැඩසටහන්වලට ඉදිරිපත් වූ ඇය බංගලාදේශ ඉතිහාසය වෙනස් කරමින් ප්‍රජාතන්ත්‍රවාදය සුරකින යහපත් ප්‍රතිරූපයක් ජාත්‍යන්තර තුළ ඇති කළාය. එක්සත් ජාතීන්ගේ රටවල් සමඟ සුහදශීලි සබඳතා පවත්වාගත් හසීනා අනෙකුත් රටවල් සමඟද බොහෝ දුරට ගැටලු අවම වනසේ මිත්‍රශීලි සබඳතා ගොඩනගා ගත්තාය. එසේම හසීනා නිතරම ප්‍රමුඛතාව දෙනු ලැබූවේ දේශීය වෙළඳාම හා ආයෝජනයන් කෙරෙහිය. ඇය විදේශ ආධාර මත යැපීම ප්‍රතික්ෂේප කළාය. එම නිසාවෙන්ම බංගලාදේශ ආර්ථිකය දිනෙන් දින දියුණුවට පත්කරලීමට ඇයගේ ධූර කාලයන්හිදී ඇයට හැකි විය. ආසියාවේ ප්‍රධාන බලවතුන් වන ජපානය හා චීනය සමඟ එක් වී ආයොජන ව්‍යාපෘතීන් රැසක් තම රට තුළට ගෙන ආ හසීනා තම රටෙහි හමුදාමය සම්පතද අනෙකුත් රටවල් හා මිත්‍රශීලී සබඳතා ඇති කරගැනීමට උපායශීලීව යොදාගත්තාය. ෂෙයික් හසීනා තම රටට හා මුළුමහත් ලෝකයටම සිදුකරන ලද සේවාව නිසා 1998 දී යුනෙස්කෝවේ හූෆූජ් බොයිනි සාම ත්‍යාගය (UNESCO’s Houphouet-Boigny Peace Prize), 1999 දී මදර් තෙරේසා සම්මානය (Mother Teresa Award) හා 2009 දී ඉන්දිරා ගාන්ධි රන් සමරු ඵලකය (Indira Gandhi Gold Plaque) ඇතුළු සම්මාන රැසකින් පිදුම් ලබා ඇත. මීට අමතරව ඇය “Sheikh Mujib is my Father”, The Origin of Autocracy”, “The Quest for Vision 2021”, “My Dream My Struggle”, “Sada kalo” ඇතුළු පොත් කිහිපයක්ද රචනා කර ඇත.

# මූලාශ්‍ර නාමාවලිය

Sheikh Hasina Age, Husband, Children, Family, Biography & More. (n.d.). Retrieved May 2, 2020, from https://starsunfolded.com/sheikh-hasina/amp

Yurtoğlu, N. (2018). http://www.historystudies.net/dergi//birinci-dunya-savasinda-bir-asayis-sorunu-sebinkarahisar-ermeni-isyani20181092a4a8f.pdf. History Studies International Journal of History, 10(7), 241–264. doi: 10.9737/hist.2018.658

Sheikh Hasina: A futuristic leader. (n.d.). Retrieved May 2, 2020, from http://www.albd.org/articles/news/32992/Sheikh-Hasina:-A-futuristic-leader

Mehta, S., Kumar, V., & Kumar, A. (2018). The Way Forward: Advancing UN Sustainable Development Goals in India and Bangladesh. Lessons in Sustainable Development from Bangladesh and India, 103–121. doi: 10.1007/978-3-319-95483-7_5

Mahmud, M., Otsuka, K., Sawada, Y., & Yamada, E. (2017). Development Transformation in Bangladesh: An Overview. Economic and Social Development of Bangladesh, 3–26. doi: 10.1007/978-3-319-63838-6_1

Hasina, Sheikh. (n.d.). Retrieved May 2, 2020, from http://en.banglapedia.org/index.php?title=Hasina,_SheikhSalomon, H. (2019, January 25). Four priorities for Bangladesh's new government in 2019. Retrieved May 2, 2020, https://www.odi.org/blogs/10731-four-priorities-bangladeshs-new-government-2019

# හෝ චී මිං



**කණ්ඩායම් සාමාජිකයන් :**

- පී.එන්. ඉෂිනි සෙව්වන්දි
- එච්.යූ.ඩී. කීර්තිසිංහ
- ඩබ්.එම්.එච්.එච්.කේ. වීරසිංහ
- කේ.වී. සඳුනි ඉමාෂා
- එස්.ජී.එන්.පී. සේනාධීර

# හැඳින්වීම

වර්ෂ 1954 සිට 1969 යන කාල පරාසය තුළ උතුරු වියට්නාමයෙ (North Vietnam) හි ජනාධිපතිවරයා ලෙස කටයුතු කළ හෝ චී මිං (Ho Chi Minh) 20 වන ශත වර්ෂයෙහි ඉතා ප්‍රසිද්ධ මෙන් ම බලවත් කොමියුනිස්ට් දේශපාලනඥයෙකු ලෙස ඉතිහාසගත වේ. වියට්නාම ජාතික නිදහස් ව්‍යාපාරයෙහි පුරෝගාමියා ලෙස කටයුතු කළ මොහු බොල්ෂෙවික් (Bolshevik) විප්ලවය හරහා ලද පන්නරය තුළින් සමාජවාදී අදහස් ආසියානු කලාපය තුළ ව්‍යාප්ත කිරීමෙහිලා පුරෝගාමී අයෙකු ලෙස කටයුතු කරන ලදී. 20 වන ශත වර්ෂයේ ආරම්භයේ පටන් ම නිදහස් ස්වාධීන රාජ්‍යයක් ගොඩනැගීමෙහි ලා ප්‍රබල හඬක් නැගූ හෝ චී මිං ඒ සඳහා විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කරමින් තම අරමුණ උදෙසා අඩිතාලම සකස් කර ගන්නා ලදී. බොල්ෂෙවික් (Bolshevik) විප්ලවය හරහා ලද අදහස් තුළින් කොමියුනිස්ට්වාදී සංවිධානයකට බැඳී ඔහු සෝවියට් දේශයසහ චීනය (China) යන රටවල සංචාරයෙහි යෙදෙමින් සමාජවාදී අදහස් අග්නිදිග කලාපය තුළ ව්‍යාප්ත කිරීමට මහත් වෙහෙසක් දරන ලදී. ජිනීවා සමුළුවේදී ගත් තීරණයන්ට අනුකූලව වියට්නාමය උතුරු හා දකුණු වියට්නාමය ලෙස බෙදා වෙන්කළ අතර දකුණු වියට්නාමය ප්‍රංශ අධිරාජ්‍යය යටතේ පාලනය විය. දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව හෝ චී මිං වියෙට්නාමය ප්‍රංශ පාලනයෙන් මුදවා ගැනීමට ඇමරිකා එක්සත් ජනපදය (United States of America) සහාය පැතූ නමුත් ඇමරිකානුවන් විසින් එය ප්‍රතික්ෂේප කළ නිසාවෙන් චීනයේ සහ සෝවියට් දේශයෙහි සහාය ලබමින් තම අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කරන ලදී. ඇතැම් තැනක “අන්කල් හෝ ” (Uncle Ho) යන නාමයෙන් ද හැඳින්වූ හෝ චී මිං වියට්නාම් නිදහස් අරගලයේ සංකේතය වන්නාක් සේ ම වියට්නාම සංග්‍රාම අවධියේ ඇමරිකාවේ ප්‍රබලතම එදිරිවාදියා වශයෙන් ද කටයුතු කරන ලදී. එවන් වූ සුවිශේෂ චරිතයක ජීවිතාරම්භයෙහි සිට ජීවිත අවසානය දක්වා වූ ඔහුගේ චරිතාපදානය මෙමගින් විස්තර කරනු ඇත. හෝ චී මිං ගේ ළමා කාලය හා පවුල් පසුබිමත් ඔහුගේ දේශපාලන කාර්යභාරය හා විදේශ ප්‍රතිපත්තියත් යන ප්‍රධාන තේමාවන් යටතේ මෙහි කරුණු පෙළ ගස්වා ඇත.

## ළමා කාලය අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

හෝ චී මිං (Ho Chi Minh) 1890 දී න්ගුයන් සිං සක් (Nguyen Sinh Sac) සහ හෝන්ග් ති ලෝන් (Hoang Thi Loan) යන අයට දාව හොං ට්‍රෝ (Hoang Tro)හි න්ගුයන් සිං කන්ග් (Nguyen Sinh Cung) යන නමින් උපත ලැබී ය. පසු කාලීනව ඔහුගේ නම හෝ චී මිං (Ho Chi Minh) ලෙසට වෙනස් කර ගත්හ. 1890 ඔහුගේ උපන් වර්ෂය ලෙස සාමාන්‍යයෙන් පිළිගනු ලැබුව ද ඔහු විවිධ කාලවල දී තවත් උපන් වර්ෂ හතරක් භාවිත කළේ ය.

ඔහුගේ පියා සිං සාක් (Sinh Sac) කොන්ෆියුසියානු (Confucianism) විශාරදවරයෙකු හා ගුරුවරයෙකු වූ අතර පසුකාලීනව කුඩා දුර බැහැර දිස්ත්‍රික්කයක් වූ බින්හ් කේ (Bink keh) හි මහේස්ත්‍රාත්වරයෙකු ලෙස සේවය කර ඇත. හෝ චී මිං ට සහෝදර සහෝදරියන් තිදෙනෙකු වූ අතර එක් සහෝදරයෙක් කුඩා අවධියේ ම මිය ගොස් ඇත. ඔහුගේ සහෝදරිය වන බච් ලියන් (Bach Lien) ප්‍රංශ හමුදාවේ ලිපිකාරිනියක ලෙස සේවය කළා ය. ඔහුගේ සහෝදරයා වූ නගුයන් සිං ක්හීම් (Nguyen Sinh Khiem) සාම්ප්‍රදායික ආයුර්වේද විද්‍යාඥයෙකු විය.



*(හෝ චී මිං 1921 දී)*

හෝ චී මිං කුඩා අවධියේ දී තම පියාගෙන් මූලික අධ්‍යාපනය ලැබූ අතර වුවොන්ග් තුක් ඩෝ (Vuong Thuc Do) යන විශාරදවරයා යටතේ විධිමත් අධ්‍යාපනයට යොමු විය. වැඩිකල් නොගොසින්ම ඔහු චීන ලේඛන කලාවත්

වියට්නාම ලේඛන කලාවත් මනා ලෙස ප්‍රගුණ කළේ ය. කොන්ෆියුසියානු (Confucianism) සම්ප්‍රදායට අනුව හෝ චී මිං ගේ පියා ඔහුට දසවැනි වියේ දී නගුයන් ටට් තාන්හ් (Nguyen Tat Thanh) යන නව නාමය ලබා දුන්නේ ය. කුඩා කල ඔහු අධ්‍යාපනයට මෙන් ම විවිධ ත්‍රාසජනක ක්‍රියාකාරකම්වල යෙදීමට සහ සරුංගල් යැවීම, මසුන් ඇල්ලීම ආදිය කෙරෙහි දැඩි ප්‍රියතාවයක් දැක්වූවේ ය.

මුල් අවධියේ දී ප්‍රංශ අධ්‍යාපනය ලබා ගැනීම සඳහා හියු හි ලයිසී (Lycee in the Hue) පාසලටත් ඉන් අනතුරුව ෆාන් තියෙට් හි ඩක් තාන්හ් (Due Thanh School in Phan Thiet) පාසලටත් ඇතුළත් විය. මාස හයක් පමණ එහි අධ්‍යාපන කටයුතුවල නිරත වුණු ඔහු සායි ගොන් (Sai Gon) වෙත ගියේ ය. ස්වකීය ජීවිතයට එල්ලවන නොයෙක් බාධක හමුවේ ප්‍රංශ නෞකාවක මුළුතැන්ගෙයි සහයකයෙකු ලෙස සේවයට බැඳුණේ ය.

ඒ අනුව 1911 ජූලි ප්‍රංශයට පැමිණෙන ඔහු ප්‍රංශ යටත් විජිත පරිපාලන පාසලකට ඇතුළත් වීමට උත්සාහ දැරුවද , එය ව්‍යර්ථ විය. ඉන් බොහෝ සේ අධෛර්යට පත් වන ඔහු සිය නාවික ගමන් බිමන්වල දිගටම නිරත වූ අතර 1917 වන තෙක්ම නෞකාවල සේවයෙහි නියුතු වෙමින් රටවල් රැසක සංචාරය කළේ ය. 1912 සිට 1913 දක්වා කාලය තුළ ඔහු නිව්යෝක් (NewYork) හා බොස්ටන් (Boston) යන නගරවල විවිධ රැකියාවල නිරත වෙමින් දිවිගෙවූ අතර එය ඔහුගේ පෞද්ගලික මෙන් ම දේශපාලන ජීවිතයේ ද වැදගත් හැරවුම් ලක්ෂයක් බවට පත් විය. හෝ චී මිං ප්‍රථම වතාවට එක්සත් ජනපදයේ දී කොරියානු ජාතිකවාදීන් මුණගැසුණු අතර එමගින් ඔහුගේ දේශපාලන දෘෂ්ටිය බොහෝ සෙයින් වෙනස් විය.

1913 දී ඔහු එක්සත් රාජධානිය වෙත ගොස් 1919 දක්වාම එහි ජීවිකාව සඳහා විවිධ රැකියාවල නිරත වෙමින් විවිධ බාධක මධ්‍යයේ දිවි ගෙවුයේ ය. 1919 වර්ෂයේ දී ප්‍රංශයට යන අතර එය ඔහුගේ දිවියේ ඉතා තීරණාත්මක සංධිස්ථානයක් විය. හෝ චී මිං දේශපාලනයට ප්‍රවිෂ්ඨ වන්නේ ඔහු ප්‍රංශයේ ජීවත් වූ 1919 සිට 1923 වූ කාල වකවානු තුළ දී ය. මෙහි දී සමාජවාදී අදහස්

දරුද ඔහුගේ මිතුරා වූ මාර්සෙල් කැචින් (Marcel Cachin) ඔහුට විශාල සහයෝගයක් ලබා දුන්නේ ය.

හෝ චී මිං (Ho Chi Minh) වියට්නාම ජාතිකවාදී කණ්ඩායමක් සමග එක් වී සටන් කළේ ය. ඔවුහු වියට්නාමයේ ප්‍රංශ යටත් විජිත පාලනය අවසන් කර ස්වාධීන රජයක් පිහිටුවීම සහතික කරන ලෙස මිත්‍ර බලවතුන්ගෙන් ඉල්ලා සිටියහ. මෙය වර්සෙල්ස් සාම සාකච්ඡාවලට (Versaills peace talks) පවා ගෙනගිය නමුදු එය එතරම් සාර්ථක නොවී ය. දැඩි සටන්කාමී පුද්ගලයෙකු වූ හෝ චී මිං වියට්නාම යටත් විජිත විරෝධී ව්‍යාපාරයේ කැපී පෙනෙන චරිතයක් බවට නිතැතින් ම පත් විය. ඔහු ස්වකීය ලේඛන කුසලතා විදහාපාමින් ලිපි හා කෙටිකතා රචනය ආරම්භ කළේ ය. ඔහු වියට්නාම ජාතිකවාදී කණ්ඩායමට නායකත්වය ලබා දුන් අතර ෆ්‍රෙන්ච් කොමියුනිස්ට් පක්ෂයේ (French Communist party- FCP) හි ආරම්භක සාමාජිකයා විය.

හෝ චී මිං 1923 දී මොස්කව් (Moscow) වෙත ගොස් නැගෙනහිර ටොයිලර්ස් (Toilers of the East) හි කොමියුනිස්ට් (Commiunist) විශ්ව විද්‍යාලයට ඇතුළත් විය. ඒ අතරම ඔහු ආර්ථික දුෂ්කරතා මගහැරගැනීම සඳහා රැකියාවක් ද ලබා ගත්තේ ය. පසුව හෝ චී මිං (Ho Chi Minh) චීනය වෙත ගියේ ය. 1925 - 1926 දී ඔහු කැන්ටන් (Canton)හි වම්පෝවා හමුදා ඇකඩමියේ (whampoa military academy) තරුණ වියෙට්නාම විප්ලවවාදීන්ට පන්ති හා දේශන පැවැත්වීම සඳහා සම්බන්ධ විය. 1927 අප්‍රේල් මස ඔහු අග්නිදිග ආසියාව දෙසට ගමන් කළේ ය. ඔහු මොස්කව් (Moscow) , පැරිස් (Paris), බ්‍රසල්ස් (Brussels), බර්ලින් (Burlin), ස්විට්සර්ලන්තය (Switzerland), ඉතාලිය (Italy) යන නගරවල නතර වෙමින් අවසානයේ දී එනම් 1928 ජුලි මස තායිලන්තයේ බැංකොක් නගරයට (Thailand, Bangkok) පැමිණියේ ය. 1929 දී ඔහු ඉන්දියාවට ද ෂැංහයි (Shanghai) වෙත ද ගියේ ය. 1930 වර්ෂයේ දී වියට්නාම කොමියුනිස්ට් පක්ෂ දෙක ඒකාබද්ධ සංවිධානයක් කරලීමේ අරමුණ ඇති ව හෝ චී මිං එම පක්ෂ දෙකෙහි නියෝජිතයින් රැස්වීමක් හොංකොංහි දී සංවිධානය කළේ ය. මේ හේතුව නිසා 1931 දී හෝ චී මිං හොංකොං හි ( Hong Kong) දී අත්අඩංගුවට

පත් විය. කෙසේ නමුත් 1933 දී ඔහු නිදහස් කෙරුණු අතර පසුව චීනය (China) වෙත ගොස් චීන කොමියුනිස්ට් සන්නද්ධ හමුදාවේ උපදේශකවරයෙකු ලෙස සේවය කළ අතර 1940 දී ඔහු තම නම හෝ චී මිං (Ho Chi Minh) ලෙස වෙනස් කළේ ය. එහි අර්ථය 'ආලෝකය ගෙන දෙන්නා' යන්නයි.

## නායකත්වය කරා ගිය ගමන් මග

1930 වර්ෂයේ දී හෝ චි මිං (Ho Chi - Minh) ඉන්දු චීන කොමියුනිස්ට් පක්ෂයේ ආරම්භකයා වූ අතර 1945 සිට 1969 වන තෙක් වියට්නාමයෙහි ජනාධිපතිවරයා වශයෙන් කටයුතු කළේය. හෝ චි මිං නායකත්වය කරා යන ගමන් මගේදී ඔහු වියට්නාම නිදහස් විප්ලවයේ ප්‍රබල කොටස්කරුවෙක් ලෙස හඳුනාගත හැකි වේ. ඔහු 1912 වසරේ දී ඇමරිකාව බලා පිටත් වීමත් සමඟ එහි දී ඔහුට ඇසුරු කරන්නට ලැබුනේ "මාකස් ගාවේ" (markes Gwa) නම් කළු ජාතිය වෙනුවෙන් ක්‍රියාකාරී දේශපාලනයෙහි නියැලී සිටි ජමෙයිකානු පුවත්පත් කලාවේදියකු සහ කොරියානු ජාතිවාදීන් කිහිපදෙනෙකි. මේ හේතූන් නිසා ඔහුගේ දේශමාමක හැඟීම් වඩාත් ප්‍රබල විය.

පසුව ඔහු චීනයේ වියට්නාම් මායිමට ගොස් එහි රැඳී සිටිමින් වියට්නාම් විප්ලවය සංවිධානය කළේය. ආපසු වියට්නාමයට ගියහොත් නිසැකවම තමා ප්‍රංශ රජයේ සිරකරුවකු වන බව ඔහු දැන සිටියේය. 1924 වසරේ දී හෝ චි මිං (Ho Chi - Minh) සෝවියට් දේශයේ තම මිතුරකුට මෙලෙස ලියා එවා තිබුණි. "සෑම කොමියුනිට් වාදියෙකුම තම රටට ආපසු පැමිණිය යුතුව තිබෙනවා. අපේ රටෙහි ජනතාව අවදි කරන්නට, සංවිධානය කරන්නට හා නිදහස් වියට්නාමයක් බිහිකිරීම සඳහා ඔවුන් සටනට යොමු කිරීමට අප සෑම එක්ව ක්‍රියාකාරී විය යුතු යුගය එළඹ තිබෙනවා."

යටත් විජිතවාදයට එරෙහිව නැගී සිටි හෝ චි මිං ඒ වන විටත් වියට්නාමයේ ජාතික වීරයකු බවට පත්ව සිටියේය. මේ අතර සෑම සාකච්ඡා වාරයක් සඳහා බටහිර බලවේගයක් වෙත පෙත්සමක් යවමින් ඔහු කියා සිටියේ ප්‍රංශ අධිරාජ්‍යය වියට්නාම ජනතාව සම්බන්ධයෙන් මානව අයිතිවාසිකම් උල්ලංඝනය කරමින්

සිටින බවයි. වියට්නාමයෙන් ප්‍රංශ ජාතිකයන් ඉවත් කොට ඔවුන් නව ජාතික රජයක් යටතේ තබන්න යැයි ද ඔහු එකී පෙත්සමෙන් ඉල්ලා සිටී නමුත් ඔහුගේ එම පෙත්සම නොසලකා හැරුණි. හෝ චි මිං ගේ උත්සාහය වූයේ වියට්නාමයෙන් කෙසේ හෝ ප්‍රංශ හමුදාව නෙරපා දැමීමයි. ඔහු නායකත්වය කරා පැමිණි ගමන් මගේදී කිහිපවරක්ම ඔහුට සිරගත වීමට සිදුවිය. 1931 වසරේ දී හොංකොං (Hong kong) හිදී අත් අඩංගුවට පත් වූ ඔහු නැවතත් 1933 වසරේ දී බ්‍රිතාන්‍ය විසින් ඔහු නිදහස් කොට හැරියේය. පසුව ඉතාලියට (Italy) හා රුසියාවට (Russia) සංක්‍රමණය වූ හෙතෙම චීනයට පැමිණීමත් සමඟ අවිගත් චීන හමුදාවට ද උදව් උපකාර කළේය.

1940 සැප්තැම්බර් මාසයේ දී ජපාන (Japan) හමුදාව ඉන්දු - චීන සීමාව ආක්‍රමණය කොට තිබුණි. ඒ වන විට පැරීසියේ ජර්මානු හමුදාව කඳවුරු බැඳ සිටියහ. වියට්නාමයේ සිටී ප්‍රංශ හමුදාව සටන් නොවැදී ජපන් ජාතියන්ට යටත් විය. මේ සුදුසු අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් හෝ චි මිං තම ජන්ම භූමිය නිදහස් කර ගැනීම උදෙසා වියට්මින් සංවිධානය ස්ථාපිත කළේය. ඔවුන්ගේ ප්‍රථම ගරිල්ලා (Gurrilla) සටන සිදු වූයේ ජපන් හමුදාවට විරුද්ධවය. ජපන් ජාතිකයන් ඇමරිකාවේ පර්ල් වරායට බෝම්බ හෙළීමෙන් අනතුරුව වියට්මින්වරුන්ට ඇමරිකාවේ සහය ද ලැබුණි. දෙවැනි ලෝක යුධ සමය තුළ සිදු වූ බරපතලම සිදුවීම වූ ජපානයේ හිරෝෂිමා (Hiroshima) නාගසාකි (Nagasaki) නගරවලට ජර්මානු හමුදාව විසින් න්‍යෂ්ටික බෝම්බ හෙලනු ලැබීමත් සමඟ ජපානයේ බලය බිඳ වැටිණි. මේ අවස්ථාවේ හෝ චි මිං ගේ වියට්මින් (Viet Minh) හමුදාවට ශක්තිමත් වීමට හොඳ ඉඩකඩක් ලබා දුන්නේය.

දැඩි දූරදර්ශී ක්‍රියා පිළිවෙතක් අනුගමනය කරමින් වියට්නාමය ස්වාධීන රාජ්‍යයක් ලෙස නගා සිටුවීම සඳහා හෝ චි මිං මහත් පරිශ්‍රමයක් දැරූ අතර එහි අවසන් ප්‍රතිඵලය වශයෙන් 1945 සැප්තැම්බර් 02 වන දා වියට්නාම් සමූහාණ්ඩුව පිහිටුවීමට ඔහුට අවස්ථාව උදා වූ අතර හෝ චි මිං (Ho Chi - Minh) වියට්නාම් සමාජවාදී ජනරජයේ ප්‍රථම ජනාධිපතිවරයා වශයෙන් දිවුරුම් දෙන ලදි.



*(හෝ චී මි උතුරු වියට්නාමයේ ජනාධිපති සමග)*

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව

1945 සැප්තැම්බර් මස දෙවැනි දින වියෙට්නාම සමාජවාදී ජනරජයේ ප්‍රථම ජනාධිපතිවරයා ලෙස හෝ හෝ චී මිං (Ho Chi - Minh) පත් විය. ඔහු විසින් බා ඩින් චතුරස්‍රයෙහි (Ba Dinh Square) උත්සවයක් පවත්වා වියට්නාම ජනතාව ඉදිරියේ නිදහස් ප්‍රකාශය ප්‍රකාශයට පත් කිරීමේ භාග්‍යය උදා කර ගත්තේ ය. මෙම සිදුවීමත් සමග උතුරු වියට්නාමය නිල වශයෙන් ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගනු ලැබී ය.

1954 දී ප්‍රංශ හමුදාව ඩීන් බීන් ෆු (Dien Bien Phu) හි දී දරුණු ලෙස පරාජයට පත් වීමත් සමග ජිනීවා ගිවිසුම මගින් ඔවුන්ට වියට්නාමයෙන් ඉවත් වීමට බල කෙරුණි. ජිනීවා ගිවිසුමට අනුගත වෙමින් හෝ චී මිං ගේ වියට්නාම ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය උතුරු වියට්නාමයේ හැනෝයි (Hanoi) කොමියුනිස්ට් නායකත්වයෙන් යුත් ඒකීය පක්ෂ ක්‍රමයක් සහිත රාජ්‍යයක් සාර්ථකව පිහිටුවී ය. නමුත් ඒ අතරම කොමියුනිස්ට් විරෝධී හා ප්‍රජාතන්ත්‍රවාදී ගැති බලවේග දකුණේ නැවත එක්රැස් විය.

වියට්නාමය උතුරු වියට්නාමය සහ දකුණු වියට්නාමය ලෙස දෙකඩ වීම බාධක රැසකට මග පෑදී ය. මෙහි දී එක්සත් ජනපදය වියට්නාමය එක්සත් කිරීම සඳහා සැලැස්මක් සහිතව සමස්ත වියට්නාමය සඳහා තනි මැතිවරණයක් පිළිබඳ යෝජනාව ඉදිරිපත් කළ ද එය උතුරු වියට්නාමය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

හෝ චී මිං වූ කලී ඉතා දැඩි ප්‍රතිපත්ති අනුගමනය කළ ඍජු නායකයෙකි. ඔහු විසින් රජයට එරෙහි වන ජනතාව සිරගත කිරීම, මරා දැමීම ආදී දැඩි දඬුවම්

පැනවූයේ ය. මෙමගින් වියට්නාමය තුළ පැවති තත්ත්වය තවත් නරක අතට හැරුණි. හෝ චී මිං ගේ රාජ්‍ය කුලී අඩු කිරීම හා ඉඩම් ප්‍රතිසංස්කරණ වැඩසටහන් හඳුන්වා දුන් අතර එහි අරමුණ වූයේ රාජ්‍ය විරෝධී පිරිස් මැඩලීමයි. මෙම වැඩසටහන්වල දී වරදකරුවන් වූ පිරිස් වෙඩි තැබීම, හිස ගසා දැමීම හෝ මරණය තෙක් පහර දීම යන දඬුවම්වලට යටත් වූ බව පැවසේ. එහෙයින් උතුරු වියට්නාම ජාතිකයින් විශාල පිරිසකට හෝ චී මිං ගේ රාජ්‍ය සමයේ දී දිවි අහිමි වූ බව වාර්තා වේ. 1959 වර්ෂයේ දී හෝ චී මිං විසින් තම පක්ෂයේ වැඩබලන පක්ෂ නායකයා ලෙස ලී ඩුවාන් (Le Duan) පත් කළේ ය. එම වර්ෂයේ දී ම උතුරු වියට්නාමය විසින් ලාඕසය ආක්‍රමණය කළේ ය. හෝ චී මිං වියට්නාමයේ අසහාය පාලකයා ලෙස තව දුරටත් වැජඹෙමින් සිටියේ ය.

හෝ චී මිං විසින් 1963 දී දකුණු වියට්නාම ජනාධිපතිවරයා වූ ඩින් ඩීම් (Dinh Diem) සමග සාම ගිවිසුමක් සඳහා සාකච්ඡා පැවැත්වී ය. එය ඉතාමත් වැදගත් සිදුවීමක් ලෙස සැලකිය හැකි නමුදු එය එතරම් සාර්ථක නොවී ය. 1964 වන විට දකුණු වියට්නාමය උතුරු වියට්නාමයට විශාල තර්ජනයක් විය. ඊට හේතු වූයේ එක්සත් ජනපදය දකුණු වියට්නාමයට සහාය පලකරමින් උතුරු වියට්නාමයට විරුද්ධව යුධ වැදීම සඳහා විශාල වශයෙන් යුධ හමුදා රට තුළට එවීමයි.

1966 දී ඇමෙරිකා එක්සත් ජනපදයේ හා වියට්නාම සාකච්ඡාකරුවන් යුද්ධය අවසන් කිරීමේ මාර්ග සාකච්ඡා කිරීම ආරම්භ කළේ ය. මෙම සාකච්ඡා 1969 දක්වාම දීර්ඝ වූයේ අන්‍යෝන්‍යය වශයෙන් වාසිදායක ආකාරයට එකඟත්වයට පැමිණීමට තිබූ නොහැකියාව නිසා ය.

මේ අතර හෝ චී මිං විසින් වියට්නාමය එක්සේසත් වන තුරු ම දකුණේ යුද්ධය දිගටම කරගෙන යාමට ස්වකීය හමුදාවට අණ ලබා දෙන ලදී. 1969 සැප්තැම්බර් මස 2 වන දින හැනෝයි (Hanoi) පිහිටි ඔහුගේ නිවසේ දී හෘදයාබාදයක් හේතුවෙන් හෝ චී මිං අවසන් සුසුම් හෙළී ය. මිය යන විට ඔහු 79 වන වියේ පසු විය. ඔහු මිය යන විට වියෙට්නාම යුද්ධය අවසන් වී නොතිබුණු අතර වියට්නාම හමුදාව ඔහුගේ දැක්ම අනුව ක්‍රියා කරමින් එක්සත් ජනපද හමුදාවට විරුද්ධව සටන් වැදී වියට්නාමය එක්සේසත් කිරීමට සමත් විය.

හෝ චී මිං මරණින් පසුව ආදාහනය කිරීම සඳහා ඔහු කැමති වූවත් ඔහුගේ දේහය හැනෝයි හි බා ඩින් චතුරස්‍රයේ (Ba Dinh Square) සොහොන් ගෙයක් තුළ සංරක්ෂිතව තැන්පත් කර ඇත. හෝ චී මිං යන අසහාය පාලකයාට උපහාර දැක්වීමක් වශයෙන් දකුණු වියට්නාමයේ පෙර අගනුවර වූ සයිගොන් (Saigon) හි 1975 මැයි මස 1 වන දින හෝ චී මිං නගරය (Ho Chi – Minh city) ලෙස නම් කරන ලදී. හෝ චී මිං යන නමින් කෞතුකාගාරයක් හැනෝයි හි පිහිටුවා ඇති අතර එහි මෙම මහා විප්ලවවාදියාගේ ජීවිතය පිළිබඳ තතු මෙන් ම ඔහුගේ අසහාය මෙහෙවර පිළිබඳ කෘති ප්‍රදර්ශනයට තබා ඇත. වියෙට්නාම නිදහස් සටනේ පුරෝගාමියා වූ අසහාය පාලකයා ලෙස හෝ චී මින් යන නාමය වියෙට්නාම ඉතිහාසයේ රන් අකුරින් ලියැවී ඇත.

**හෝ චී මිං හා ඔහුගේ වියෙට්නාම යුද්ධය**

හෝ චී මිං විසිවන සියවසේ වඩාත් බලවත් ම කොමියුනිස්ට් නායකයන්ගෙන් අයෙක් මෙන්ම විප්ලවවාදීන් අතුරින් කැපී පෙනෙන චරිතයක් බවට පත් වන්නේ ඔහු විසින් ලෝක බලවතුන්ගේ යටත් විජිත ක්‍රමයට එරෙහි දීර්ඝතම හා දුෂ්කරතම සටනක් දියත් කළ බැවිනි. ඔහු විසින් මෙම සටන දියත් කරන ලද්දේ වියට්නාමය ස්වාධීන කරලීමට ය. වියට්නාමයේ විශාලතම නගරය ඔහු වෙනුවෙන් නම් කර තිබීමෙන් වියට්නාමය වෙනුවෙන් ඔහු කළ සේවය පිළිඹිබු වේ.

1941 සිට වියෙට් මිං (Viet Minh) ව්‍යාපාරයට නායකත්වය දුන් හෝ චී මිං 1945 දී කොමියුනිස්ට් පාලනයෙන් යුත් වියට්නාම ජනරජය උතුරු වියට්නාමයේ පිහිටුවී ය. 1954 දී ඔහුගේ නායකත්වය යටතේ ඩියන් බියන් ෆූ (Dien Bien Phu) සටනේ දී ප්‍රංශය පරාජයට පත් කරමින් පළමුවන ඉන්දු චීන යුද්ධය අවසන් කිරීමට වියට්නාමය සමත් විය. ඉන්පසු 1955 නොවැම්බර් 1 වැනිදා සිට 1975 අප්‍රේල් 30 දක්වා සීතල යුධ සමයේ ඇති වුණු වියට්නාම යුද්ධය හැඳින්වීමට දෙවන ඉන්දු චීන යුද්ධය, ඇමරිකාවට එරෙහි ප්‍රතිවිරෝධී යුද්ධය හෝ ඇමරිකානු යුද්ධය යන නම් භාවිතා කරන ලදි. මෙම වියට්නාම යුද්ධයේ දී වියට්නාම මහජන හමුදාවේ සහ වියෙට් කොං (Viet Cong) හි ප්‍රධාන චරිතයක් බවට හෝ චී මිං පත් විය. මෙම යුද්ධය නිල වශයෙන් උතුරු වියට්නාමය හා

දකුණු වියට්නාමය අතර ඇති වූ නමුත් උතුරු වියට්නාමයට සෝවියට් සංගමය, චීනය සහ අනෙකුත් කොමියුනිස්ට් රටවල සහය ලැබුණු අතර දකුණු වියට්නාමයට ඇමෙරිකා එක්සත් ජනපදය (USA) , දකුණු කොරියාව (South Korea), ඕස්ට්‍රේලියාව (Australia), තායිලන්තය (Thailand) සහ වෙනත් කොමියුනිස්ට් විරෝධී රටවල ආධාර හිමිවුණි. ඒ නිසා මෙම යුද්ධය සීතල යුධ සමයේ වූ අතුරු යුද්ධයක් ලෙස  සලකනු ලබන අතර ම එය එක්සත් ජනපදයට සිදු වූ මහත් අවමානයක් ලෙස ඉතිහාස ගත වේ.

වියට්නාම යුද්ධයේ ආරම්භය සනිටුහන් වන්නේ උතුරු වියට්නාමයේ සහාය ලද වියෙට් කොං (Viet Cong) නැමැති දකුණු වියට්නාමීය කොමියුනිස්ට් පෙරමුණ එම කලාපයේ කොමියුනිස්ට් විරෝධී බලවේගවලට එරෙහිව ගරිල්ලා යුද්ධයක් (Gurrilla War) ඇති කිරීමයි. එහි දී උතුරු වියට්නාම මහජන හමුදාව විශාල හමුදා ඒකක සටනට යොදවමින් යුධමය තත්ත්වයක් ඇති කරන ලදී. යුද්ධය දිගටම ක්‍රියාත්මක වන්නට වූ විට වියට්කොන්ග්වරුන්ගේ යුධමය ක්‍රියා අඩු වූ අතර උතුරු වියට්නාම හමුදාවේ ක්‍රියාකාරිත්වය වර්ධනය විය. මේ අවස්ථාව ප්‍රයෝජනයට ගත් එක්සත් ජනපදය දකුණු වියට්නාමයට සහාය පළ කරමින් සටනට එක් විය. යුද්ධයේ දී එක්සත් ජනපදය මගින් උතුරු වියට්නාමයට එරෙහිව මහා පරිමාණ උපක්‍රමශීලී බෝම්බ මෙහෙයුම් ක්‍රියාත්මක කරන ලදී.

උතුරු වියට්නාමය හා වියෙට් කොන්ග් (Viet cong ) එක්ව වියට්නාමය යලි එක්සේසත් කිරීමේ අරමුණින් සටන් වැදුණු අතර එය යටත් විජිතවාදී යුද්ධයක් ලෙස සැළකේ. යුද්ධයට එක්සත් ජනපදයේ මැදියත්වීම එම රජය විසින් කොමියුනිස්ට්වාදීන් දකුණු වියට්නාමය බලහත්කාරයෙන් අත්පත් කරගැනීම වැළැක්වීමට ගත් පියවරක් ලෙස සැළකුව ද එය සැබැවින් ම කොමියුනිස්ට්වාදය පැතිරයාම වැළැක්වීම අරමුණු කරගත් පිළිවෙතකි.

1950 ආරම්භයේ පටන් ඇමරිකානු යුධ උපදේශකයන් එවකට ප්‍රංශ ඉන්දු චීනයට පැමිණියහ. 1960 වන විට එක්සත් ජනපද මැදිහත්වීම වර්ධනය වූ අතර 1961 දී හා 1962 දී යුධ බල ඇණි ප්‍රමාණය තෙගුණ කරන ලදී. 1964 දී ටොන්කින් ගල්ෆ් (Gulf of Tonkin) සිදුවීමෙන් පසු එනම් ඇමරිකානු යාත්‍රාවක් උතුරු වියට්නාම

වේග ප්‍රහාරක යානාවක් මගින් විනාශ වීමත් සමග එක්සත් ජනපද හමුදා සහභාගීත්වය වැඩි කිරීමට එරට ජනාධිපති විසින් අවසර ලබා දෙන ලදී.

ජාත්‍යන්තර දේශසීමා ඉක්මවමින් මෙහෙයුම් ක්‍රියාත්මක වන්නට වූ අතර ලාඕසයේ, කාම්බෝජයේ දේශසීමා ප්‍රදේශ උතුරු වියට්නාමය විසින් සැපයුම් ප්‍රදේශ ලෙසට භාවිතා කරන ලදී. 1968 වනවිට යුද්ධයට ඇමරිකාවේ සහභාගීත්වය උපරිමයකට ලගා වී තිබුණෙන් එම ප්‍රදේශ දැඩි ලෙස ඇමරිකානු බෝම්බ ප්‍රහාරයට ලක් වන්නට විය. 1968 දී කොමියුනිස්ට්වාදී පාර්ශවය විසින් ටෙට් ඔෆෙන්සිව් (Tet offensive) දියත් කළ අතර එහි අරමුණු වූයේ දකුණු වියට්නාම රජය බලයෙන් පහ කිරීමයි. එහි අරමුණු ඉටු නොවුනද ටෙට් ඔෆෙන්සිව් යුද්ධයේ හැරවුම් ලක්ෂ්‍යයක් බවට පත් විය. එනම් වසර ගණනාවක් පුරාවට යුධ ආධාර සපයමින් ඇමරිකානු රජය විසින් ගෙන ගිය අසාධාරණ අතපෙවීම් ටෙට් ඔෆෙන්සිව් මගින් ඇමරිකානු ප්‍රජාවට ඒත්තු ගැන්වීමයි.

1973 වන විට එක්සත් ජනපදය තුළ මෙන් ම බටහිර ලෝකය තුළ දැවැන්ත වියට්නාම යුධ විරෝධී ව්‍යාපාරයක් ගොඩ නැගුණි. එබැවින් 1973 අගෝස්තු 15 එක්සත් ජනපද හමුදාවල සෘජු මැදිහත්වීම අවසන් වූ අතර උතුරු වියට්නාම හමුදාව සයිගොන් (Saigon) අත්පත් කර ගැනීමත් සමග යුද්ධයේ නිමාව සනිටුහන් කරන ලදී. 1976 දී උතුරු වියට්නාමය හා දකුණු වියට්නාමය එක් කරන ලදී. ලොව බලවතුන්ට එරෙහි ජයග්‍රාහී වියට්නාම ස්වාධීන අරගලය හෝ චී මිං යන නාමයත් සමග බැඳී පවතී

## විදේශ ප්‍රතිපත්තිය

වියට්නාමයේ අසහාය රාජ්‍ය නායකයකු වන හෝ චී මිං පිළිබඳ සාකච්ඡා කිරීමේදී ඔහුගේ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි ද දැඩි අවධානයක් යොමු වේ. ඔහු කොමියුනිස්ට්වාදය පෙරටුකොට ගත් පාලන තන්ත්‍රයක් ගෙන ගිය ද විවිධ අවස්ථාවන්හි දී එම අවස්ථාවන්ට ගැලපෙන පරිදි ඕනෑම කෙනෙකුගේ සහාය අතැතිව රට එක්සත් කරමින් තම පාලන කටයුතු ගෙනයාමට කටයුතු කර ඇති බව ඔහුගේ විදේශ සම්බන්ධතා පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ.

**හෝ චී මිං හා ඇමරිකාව**

ඇමරිකාව හා වියට්නාමය අතර සමීප සබඳතාවක් පැවති බව ඉතිහාසගත කරුණුවලට අනුව පෙනී යයි. දෙවන ලෝක යුද්ධ කාලපරාසය තුළ වියට්නාමය හා ඇමරිකාව අතර සමීප සබඳතාවක් පැවති බවත්, එවකට වියට්නාමය පාලනය කරමින් සිටි ජපන් අධිරාජ්‍යයා නෙරපා දැමීමට ඔහු විසින් ඇමරිකාවේ සහාය ලබා ගත් බවත් සඳහන් වේ. ඒ අනුව ඇමරිකාව විසින් යුධ ආධාර ලබා දී ඇති බවත් මෙම සිදුවීමෙන් අනතුරුව ඇමරිකාව හා වියට්නාමය අතර සමීප සබඳතාවක් ගොඩනැගුණු බවත් සඳහන් වේ. පසුව හෝ චී මිං ඇමරිකාව හා මිත්‍ර සම්මුතියක් ඇතිකර ගැනීමට යෝජනා කළ

අතර එය එවකට ජනාධිපති වූ ෆ්‍රැන්ක්ලින් ඩී රූස්වෙල්ට් (Franklin D. Roosvelt) විසින් අනුමත ද කරනු ලැබීය. නමුත් එකවර සිදු වූ යම් යම් සිදුවීම් කිහිපයක් නිසාවෙන් එය යථාර්ථයක් බවට පත්කර ගත නොහැකි විය.



*(වර්ෂ 1945 දී හෝ චී මිං ඇමරිකානු යුධමය බුද්ධි අංශ සේනා කාර්යංශය)*

හෝ චී මිං හා ඇමරිකාව අතර පැවතී සබඳතාව පැහැදිලිව පෙන්නුම් කරන තවත් එක් අවස්ථාවක් වනුයේ 1945 සැප්තැම්බර් 02 දා නිකුත් කරන ලද වියට්නාම් නිදහස් ප්‍රකාශනයේ ඔහු විසින් භාවිතා කරන ලද භාෂා විලාසයයි. තවද මෙහි පළමුවන වගන්තියේ සඳහන්ව ඇත්තේ "සියලුම දෙනාටම සමානාත්වයෙන් සැලකිය යුතු බවය." මෙය සම්පූර්ණයෙන්ම ඇමරිකානු නිදහස් ප්‍රකාශනයෙන් උපුටා ගන්නා ලද්දක් බව පැහැදිලිවම පෙනී යනු ලැබේ.

හෝ චී මිං ඇමරිකානු පාලන තන්ත්‍රය පිළිබඳ කැමැත්තක් දැක් වුව ද ඔහු කොමියුනිස්ට් පාලකයකු වන නිසා ඇමරිකාව හා අවංක සබඳතාවක් ගොඩනඟා ගන්නට හැකිවූයේ නැත. නමුත් කිසිදු විටක ඇමරිකාව හා තම සම්බන්ධතාවය නතර කර නැති අතර හෝ චී මිං සහ ඔහුගේ උසස් නිළධාරියකු

වන වොන්ගු යෙන් ගට් (Vongu Yen Gat) , ජෝර්ජ් වොෂින්ටන් (George Washington) විසින් බ්‍රිතාන්‍යයට එරෙහි සටනේදි භාවිතා කරන ලද යුධ උපක්‍රම තම සතුරන් පරාජය කිරීමට භාවිතයට ගත් බව සඳහන් වේ.

කෙසේ වුව ද, 1954 දී ජිනීවා සමුළුව මගින් වියට්නාමය, උතුරු වියට්නාමය හා දකුණු වියට්නාමය ලෙස බෙදා වෙන් කෙරුණු අතර හෝ චී මිං උතුරු වියට්නාමයේ නායකයා ලෙස පත්කරන ලදි. එහිදී හෝ චී මින් දකුණු වියට්නාමය හා ඇතිකරගත් සාම ගිවිසුම 1955 දී කඩකිරීම හේතුවෙන් මෙම තත්වය මැඬලීම සඳහා ඇමරිකාව මෙම ගැටුම් හා සම්බන්ධ වී ඇත. එහි දී ඇමරිකාව ප්‍රංශ පාලනය මුල්කොට ගත් දකුණු වියට්නාමයට සහය පළ කර ඇති අතර ඊට හේතු වූයේ කොමියුනිස්ට් පාලන තන්ත්‍රය නැගී සිටියැයි ඇමරිකාව තුළ වූ සැකය යි.

කෙසේ වුවද හෝ චී මිං ඇමරිකාව හා පැවැත් වූ සම්බන්ධතාවය ඔහු විසින් ඇමරිකානු රාජ්‍ය ප්‍රධානීන් වෙත යවන ලද ලිපි හරහා පෙනී යයි. ඉන් කිහිපයක් පහත දැක්වේ.

1945

- 1945. 10. 17 වනදා ජනාධිපති හැරි ටෲමන් (Harry Truman) වෙත යවන ලද ලිපිය.
- 1945. 10. 18 හා 22 වනදා ඇමරිකානු රාජ්‍ය ලේකම් වෙත යවන ලද ලිපිය.

1966

- 1966. 12. 23 වනදා ඇමරිකානු ජනතාව වෙත යවන ලද පණිවිඩය.

1967

- හෝ චී මිං (Ho Chi - Minh) හා ජනාධිපති ලින්ඩන් බි ජොන්සන් (Lindon B Johnson) සමඟ ලිපි හුවමාරු කර ගන්නා ලදි.

- ජනාධිපති රිච(ර්)ඩ් නික්සන් (Richard Nixon) සමඟ ලිපි හුවමාරු කරගත් බව සඳහන් වේ.

**හෝ චී මිං හා චීනය**

හෝ චී මිං හා චීනය සමඟ ද සමීප සබඳතා පැවැත් වූ බව සඳහන් වේ. වියට්නාමය තුළින් ප්‍රංශ අධිරාජ්‍යයත් පළවා හැරීමට හෝ චී මිං විසින් චීනයේ සහාය පතා ඇත. ඒ අනුව චීනය විසින් පාලනය අවසන් වූ අතර හෝ චී මිං හට අවශ්‍ය වූයේ දකුණු හා උතුරු වියට්නාමය එක්කොට රට එක්සේසත් කිරීමටයි. මෙය චීනයේ කනස්සල්ලට හේතු වූ කරුණක් විය.

හෝ චී මිං චීනය හා සම්බන්ධව අනුගමනය කළ ප්‍රතිපත්තිය දෙස බැලීමේදී, එහිදී චීනය හා සමීප සබඳතාවක් ගොඩනගා ගැනීමට චීනයේ අසහාය නායක මාඕ සේතුංගේ (Ma o Sethung) ක්‍රියා පිළිවෙත පිළිබඳ හෝ චී මිං තුළ පැවති අතිශය කැමැත්ත ද බලපාන ලදි. එමෙන්ම චීනයේ කැරලිකාර නායකයන් සමඟ සමීපව ඇසුරු කිරීමට ඔහු තුළ වූ කැමැත්තද ඒ අතර විය.

චීනය සමඟ ඔහු පැවැත් වූ සම්බන්ධතාව වඩාත් ඉස්මතු වී පෙනෙන්නේ සීතල යුද්ධ කාලපරිච්ඡේදයේදීය. එහිදී හෝ චී මිං විසින් සෝවියට් රුසියාව ( Soviet Russia) හා චීනය යන රටවල් ද්විත්වයෙන්ම උපකාර ඉල්ලා සිටිය ද චීනය පමණක් මෙයට ප්‍රතිචාර දක්වා ඇත.

**හෝ චී මිං හා සෝවියට් රුසියාව**

සෝවියට් රුසියාව (Soviet Russia) හා වියට්නාමය (Vietnam) අතර ද සමීප සබඳතාවක් පැවති බව යම් යම් කරුණු හරහා පැහැදිළි වේ. සෝවියට් රුසියාව විවිධ අවස්ථාවන්හිදී හෝ චී මිං හට උපකාර කර ඇති අතර විශේෂයෙන්ම ඒ හරහා කොමියුනිස්ට්වාදී අදහස් ආසියානු කලාපය තුළ වැඩි වශයෙන් ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වී ඇත.

වියට්නාම යුධ කාල පරාසය ඇතුළත සොවියට් රුසියාව යුධමය, මූල්‍යමය හා තාක්ෂණික අංශවලින් බොහෝ උපකාර කර ඇති අතර මේ හරහා ශක්තිමත් සබඳතාවක් දෙරට අතර ඇති වී තිබේ. මේ නිසාම ඇතැම් විටක බටහිර

රාජ්‍යයන් විසින් හෝ චී මිං සෝවියට් රුසියාවේ රූකඩයක් ලෙස ද හඳුන්වා ඇත. නමුත් කිසිදු විටක හෝ චී මිං සෝවියට් රුසියාවේ රූකඩයක් ලෙස ක්‍රියා නොකළ අතර ඔහු සැමවිටම තම රාජ්‍ය හා ජනතාවගේ සුභ සිද්ධිය සඳහා කටයුතු කළ අයෙකු විය.

දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව සෝවියට් රුසියාව ඉතා සීමිත වශයෙන් වියට්නාමයේ කොමියුනිස්ට්වාදී ව්‍යාපාරයට උපකාර කර ඇති අතර මෙයට හේතු වූයේ එවකට සෝවියට් දේශය පාලනය කළ ජෝසෆ් ස්ටාලින් (Joseph Starlin) ආසියානු කලාපයේ කොමියුනිස්ට්වාදී කණ්ඩායම් කෙරෙහි වූ අවිශ්වාසයයි.

වර්ෂ 1954 දී ජිනීවා සමුළුව මගින් වියට්නාමය, උතුරු වියට්නාමය හා දකුණු වියට්නාමය ලෙස බෙදා වෙන් කරන ලදි. දකුණු වියට්නාමය ප්‍රංශ අධිරාජ්‍ය යටතේ පාලනය වූ අතර හෝ චී මිං හට අවශ්‍ය වූයේ වියට්නාමය එක් රාජයයක් යටතේ එක් සේසත් කිරීමටයි. එහිදී දකුණු වියට්නාමය තුළින් ප්‍රංශ අධිරාජ්‍යයන් පළවා හැරීමට ඔහු විසින් ජෝසෆ් ස්ටාලින්ගේ සහාය පතන ලද නමුත් ඔහු එය ප්‍රතික්ෂේප කරන ලදි.

1950 හා 1960 දශකයන් වන විට සෝවියට් රුසියාව වියට්නාමය කෙරෙහි මන්දගාමී පිළිවෙතක් අනුගමනය කළ ද සෝවියට් රුසියාවේ නව පාලකයා වූ ඇලෙක්සි කොසිගින් (Aleksei Kosygin) යටතේ නැවතත් එම සම්බන්දතා වර්ධනය වන්නට පටන් ගැනුණි. වර්ෂ 1965 දී සෝවියට් නායකයා වියට්නාමයේ සංචාරයක යෙදෙන අතර එහිදී ඔවුන් උතුරු වියට්නාමය සමඟ ආරක්ෂක ගිවිසුමකට ද එළඹෙණ ලදි. එහිදී යුධමය හා මුල්‍යමය ආධාර සැපයීමට සෝවියට් දේශය කැමැත්ත පලකරන ලදි.

වර්ෂ 1967 දී ද ටයිම්ස් සඟරාව (Times Magazine) වාර්තා කළ ආකාරයට උතුරු වියට්නාමය හට ලැබුණු යුධ ආධාර තුළින් තුනෙන් දෙකකට වැඩි ප්‍රමාණයක් සෝවියට් රුසියාව විසින් ලබා දී ඇත. එමෙන්ම මෙය විශේෂ වන්නේ චීනයෙන් ලැබුණු යුධ සහ මූල්‍යමය ආධාර හුදෙක් ගනුදෙනු වලට

සීමා වූ නමුදු සෝවියට් රුසියාව එම යුධ ආධාර ලබා දී ඇත්තේ සත්‍යවශයෙන්ම උපකාරයක් නැතහොත් ආධාරයක් ලෙසිනි.

මේ ආකාරයට හෝ චී මිං විදෙස් රටවල් සමඟ ගනුදෙනු කර ඇති ආකාරය සාකච්ඡා කළ හැකි අතර එහිදී පෙනීයන විශේෂ කරුණක් වන්නේ වියට්නාමය කොමියුනිස්ට්වාදය පෙරටුකොට ගත් රාජ්‍යයක් වුව ද කොමියුනිස්ට්වාදී නොවන රටවල් සමඟ ද සබඳතා ගොඩනගා ගන්නට හෝ චී මිං කටයුතු කර ඇති බවයි.

## ගත හැකි ආදර්ශ

හෝ චි මිං (Ho Chi - Minh) මහා විප්ලවීය අරමුණක කැපී පෙනෙන උරුමයක් පමණක් නොව ගුණධර්මවල දීප්තිමත් ආදර්ශයක් ද ඉතිරි කළේය. ඔහු සිය මුළු ජීවිතයම රට වෙනුවෙන් සහ ජනතාවගේ සතුට වෙනුවෙන් කැප කළේය. හෝ චි මිං දක්ෂ නායකයෙකුගේ සියලු ගුණාංගයන්ගෙන් සමන්විත වූ අතර නව නායකයෙකුගේ ප්‍රතිමූර්තියක් ද විය.

මහජනයා සමඟ සමීප බැඳීමක් ඇති උතුම් හා ඉතා සරල පුද්ගලයෙකු වූ මොහු ජාතික ස්වාධීනත්වය සහ නැවත එක්වීම සඳහා මුළු හදවතින්ම කැපවී සිටියේය. තෘප්තිමත් ජීවිතයක් භුක්ති විඳිය හැකි ශක්තිමත් හා සමෘද්ධිමත් රටක් සඳහා වූ අභිලාෂ සහ වගකීම්වල උන්නතිය උදෙසා ඔහු නිරන්තරයෙන් සේවකයින්ට සහ පක්ෂ සාමාජිකයින්ට මග පෙන්වමින් කටයුතු කළේය.

විදේශීය ආක්‍රමණිකයින් විසින් රට තුළ ආධිපත්‍යය දැරූ කාලය සහ මිනිසුන් වහල්භාවයෙන් පීඩා විඳි කාලය සිහිපත් කරමින් හෝ චි මිං ජාතික ගැලවීමේ මාවත සොයා ගැනීමට තීරණය කළේය. බොහෝ දුෂ්කරතා හා අභියෝග ජය ගනිමින් ඔහු මුළු ජීවිත කාලයම ජාතිය වෙනුවෙන් කැප කළේය. ඔහුගේ විප්ලවීය ජීවිතය තුළ ඔහුට තිබුණෙ රට මුළුමනින්ම ස්වාධීන කිරීමටත්, ජනතාව මුළුමනින්ම නිදහස් කිරීමටත්, සෙබළුන්ට යැපීම හා පාසල් අධ්‍යාපනය ලැබීමටත් ඇති ආශාවත් පමණි. ඔහුට මෙලොව හැර යාමට සිදු වුවහොත්

තිබුණේ එක් කණගාටවුක් පමණි. ඒ වැඩි කාලයක් සේවය කිරීමට නොහැකි වීම පිළිබඳවයි. ධනයෙන් රැවටීමට නොව, දරිද්‍රතාවය පරාජය කිරීමට හා බලයට හිස නොනැමීම ඔහුගේ අරමුණ විය. ඔහුට විශාල කැමැත්තක් හා ශක්තියක් ලබා දුන්නේ ඒ මහා අභිලාෂයයි.

හෝ චි මිං ශ්‍රේෂ්ඨ නායකයෙකි. ඔහු ජනතාව සමග සමීප සම්බන්ධතාවයක් පැවත්වීය. හෝචි මිං සෑම සාමාජිකයෙකුගෙන්ම ඉල්ලා සිටියේ සේවා හැඟීම, ජනතාව කෙරෙහි වගකීම පිළිබඳ හැඟීම සහ ද්‍රව්‍යමය කටයුතු සහ ජනතාවගේ අධ්‍යාත්මික ජීවිතය ශක්තිමත් කළ යුතු බවය. ඔහුට අනුව, රට ස්වාධීන නමුත් ජනතාව නිදහස හා සතුට භුක්ති විඳින්නේ නැත්නම්, එවැනි ස්වාධීනත්වයකින් කිසිම පලක් නොමැතිය. සෑම කාර්ය මණ්ඩලයක්ම සහ පක්ෂ සාමාජිකයෙක්ම ''ජනතාවගේ නායකයා සහ සැබෑ පක්ෂපාත සේවකයා" ලෙස තම කාර්යභාරය ඉටුකළ යුතුය. ඔහුට අනුව නිලධාරීන් ජනතාවට සමීප විය යුතුය. ඔවුන්ගේ අභිලාෂයන් තේරුම් ගත යුතුය. කාලෝචිතව මිනිසුන්ට ඔවුන්ගේ ගැටලු විසඳීමට උදව් කළ යුතුය. ඒ අනුව යමින් ජනතාවගේ බෙල්ල පාගා දමන නිලධරයේ අධිකාරීත්වයේ සහ අවස්ථාවාදයේ සියලු ප්‍රකාශයන් ඔහු තරයේ ප්‍රතික්ෂේප කළේය.

පක්ෂයේ සහ රාජ්‍යයේ ප්‍රධානියා ලෙස සේවය කරන විට, බොහෝ කාර්යයන් සහ කාර්යබහුල කාලසටහනක් තිබියදීත්, ජනතාව තේරුම් ගැනීම සඳහා ජනාධිපති හෝ චි මිං (Ho Chi - Minh) ජනාධිපති මන්දිරයේ දී මිනිසුන් හමුවීමට කටයුතු කළ අතර බිම් මට්ටමේ ඒකක පරීක්ෂා කිරීමට කාලය ගත්තේය.

පක්ෂ සාමාජිකයින්ගේ සහ ජනතාවගේ අදහස් සලකා බැලීම සහ තීරණ ගැනීමට පෙර, ප්‍රදේශවල ක්ෂේත්‍ර චාරිකා කිරීම ඔහුට තම ධූරය හසුරුවා ගැනීමට සහ තත්ත්වය නිසි ලෙස තේරුම් ගැනීමට උපකාර විය. සෑම තරාතිරමකම පුද්ගලයින් සමඟ රැස්වීම් පවත්වා ජනතාවට තම අදහස් හා අභිලාෂයන් රාජ්‍ය නායකයින් වෙත ප්‍රකාශ කිරීමේ අවස්ථාවන් ප්‍රවර්ධනය කරන ලදි.

හෝ චි මිං සම්බන්ධයෙන් ගත් කල, ඔහු කිසි විටෙකත් තමන් ජනතාවට වඩා උසස් යැයි නොසිතුවේය. ඔහු ජනතාවගේ විශ්වාසවන්ත හා කැපවූ සේවකයා විය. ජනාධිපති හෝ චි මිං යනු ප්‍රභූ පන්තිය සිට කම්කරු පන්තිය දක්වා ජනතාවගේ ප්‍රසාදය දිනා ගත් අද්විතීය නායකයෙකු විය. ඔහුගේ සමීපභාවය, ප්‍රේමය, උණුසුම සහ ඉවසීම සහ සරල ජීවන රටාව සහ නිහතමානිකම මිනිසුන්ට දැකගත හැකි විය. ඔහු ප්‍රංශයේ පැරිස් නුවර ඡායාරූප ශිල්පියෙකු ලෙස සේවය කළ කාලයේ සිට අගනුවර හැනෝයි හි ජීවත් වන ජනාධිපතිවරයා වන තෙක් සෑම විටම සරල ජීවිතයක් ගත කළේය. සාමය යථා තත්වයට පත් වූ විට ඔහු නැවත හැනෝයි (Hanoy) වෙත ගියේය. ආණ්ඩුකාරවරයාගේ නිවස ජනාධිපති මන්දිරය ලෙස සලකනු ලැබුවද ඔහු එම ස්ථානය භාවිතා කළේ ජාත්‍යන්තර නායකයින් සහ අමුත්තන් පිළිගැනීමට පමණි. ඔහු ජීවත් වූයේ හා වැඩ කළේ කුඩා කාමර දෙකක් පමණක් සහිත සරල නිවසක ය. එහි තිබුණේ තනි ඇඳක්, ඇඳුම් ආයිත්තම් කට්ටලයක්, ගුවන්විදුලියක්, සෙරෙප්පු යුගලයක් සහ කාකි ඇඳුම් යුගල දෙකක් පමණි. එය රට සහ ජනතාව වෙනුවෙන් සිය මුළු ජීවිතයම කැප කළ මිනිසෙකුගේ විශිෂ්ට සරල බව පෙන්නුම් කළ අව්‍යාජ සාධකයන්ය. කොතරම් ධනය, බලය, සම්පත් තිබියදීත් ඒවාගෙන් උදම් නොවී හෝ චි මිං නිරහංකාර දිවිපෙවෙතක් ගත කළේය.

ජනාධිපති හෝ චි මිං ගේ සදාචාරාත්මක ආදර්ශය සහ ජනතාවට සේවය කිරීමට ඇති ඔහුගේ භක්තිය ගැන කතා කරමින් පක්ෂය මෙසේ සහතික කළේය.

ජනාධිපති හෝ චි මිං (Ho Chi - Minh) ගේ ජීවිතය ආලෝකය මෙන් පිරිසිදු ය. ඔහු ඔරොත්තු දීමේ හැකියාව, විප්ලවවාදී ආත්මය, ආත්ම දමනය, මනුෂ්‍යත්වය සහ ජනතාව කෙරෙහි ඇති ආදරය, ආචාර ධර්ම, සහ සරල බව විශිෂ්ට උදාහරණයකි. ඔහුගේ සිතුවිලි හා ගුණධර්ම අපගේ හදවත් හා මනස සදහටම ආලෝකවත් කරයි.

ජනාධිපති හෝ චි මිං අභාවප්‍රාප්ත වී වසර 50 කට ආසන්න කාලයක් ගත වී ඇත. ආදරණීය නායකයාගේ විශිෂ්ඨ කාර්යය සිහිපත් කරමින් සමස්ත පක්ෂය, ජනතාව සහ හමුදාව ඔහුගේ උපන්දිනයේ 128 වන සංවත්සරය සැමරීම සඳහා

ක්‍රියාකාරීව උත්සාහ කළහ. හෝ චි මිං ජනාධිපතිගේ චරිතයෙන් ලබාගත හැකි ආදර්ශ බොහොමයක් පවතින බව පැහැදිලි විය.

## සාරාංශය

වර්ෂ 1930 දී ආරම්භ කරන ලද ඉන්දු - චීන කොමියුනිස්ට් සංවිධානයෙහි පුරෝගාමියා ලෙසත් පසුව වර්ෂ 1941 දී වියට්නාම නිදහස් අරගලය උදෙසා ආරම්භ කරන ලද Viet Minh Vietnam Dac Lap නැතහොත් Vietnam Dac Lap යන සංවිධානයන්හි මූලාරම්භකයා ලෙස කටයුතු කරන ලද හෝ චි මිං නිදහස් වියෙට්නාමයේ ප්‍රථම ජනාධිපතිවරයා වශයෙන් ඉතිහාසගත වේ. ප්‍රංශ සහ ජපන් යන ද්විත්ව යටත් විජිත පාලනයන්ට එරෙහිව කටයුතු කර ස්වාධීන සහ එක්සත් වියට්නාම රාජ්‍යයක් ගොඩනැගීමෙහි ලා ඔහු තම ජීවිතයම ඇප කැප කෙරූ අයෙකු ලෙස සදා මතකේ රැදෙනු ඇත. මෙතුමාගේ දූරදර්ශී මෙන් ම කෘතහස්ත පාලන රටාව නිසාවෙන් ම නිදහස් වියට්නාම් රාජ්‍ය ඉතිහාසය තුළ ඇතැම්විට මොහු හා සමකළ හැකි තවත් පියෙකු නොවන්නට පුළුවන.

කොමියුනිස්ට් අදහස් හරහා පන්නරය ලබමින් අවශ්‍ය මොහොතේ සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කරමින් වියට්නාමය නිදහස් රාජ්‍යයක් ලෙස ලෝක දේශපාලන පද්ධතියට එක්කිරීමෙහි ලා නොනිමි අරගලයක යෙදුණු මෙතුමා මුළු මහත් ලෝක ඉතිහාසය තුළ ම නොමැකෙන නාමයක් සනිටුහන් කොට ඇත්තේ ය.



*(හෝ චි මිං පිළිමය (Ho Chi Minh statue) )*

## මූලාශ්‍ර නාමාලිය

Biograpghy.com Editors,(2/4/2014)Ho Chi – Minh Biography, A & E Television Networks, https://www.biography.com/Political-Figure/ho-chi-minh

TROUONG MINH T and THANH TRUNG N (10/11/2016),Vietnam's foreign policy: In search of a new delicate balance, https://amti.csis.org

History.com Editors, (13/10/2017) Vietnam war Timeline, A & E Television networks, https://www.history.com/topics/vietnam-war/vietanam-war-timeline

Jean Lacouture,(2020) Ho Chi- Minh, https://www.history.com.topics

Ho Chi Minh/ biography, presidency and tacts,Encyclopedia Britanica https://www.britanica.com / biography/ Ho Chi Minh

Biograpghy.com Editors,(2/4/2014)Ho Chi – Minh Biography, A & E Television Networks, https://www.biography.com/Political-Figure/ho-chi-minh

TROUONG MINH T and THANH TRUNG N (10/11/2016),Vietnam's foreign policy: In search of a new delicate balance, https://amti.csis.org

History.com Editors, (13/10/2017) Vietnam war Timeline, A & E Television networks, https://www.history.com/topics/vietnam-war/vietanam-war-timeline

Jean Lacouture,(2020) Ho Chi- Minh, https://www.history.com.topics

Ho Chi Minh/ biography, presidency and tacts,Encyclopedia Britanica https://www.britanica.com / biography/ Ho Chi Minh

Llewellyn J. Southey T.(2019) Chinese and soviet involvement in Vietnam,Alpha History, Retrieved from (https://alphahistory.com/Vietnamwar

Curtis T. (2019) Ho chi – minh : Things you didn’t know about him, Retrieved from (https:// Fee.Org)

Geffrey C. (2017) The Vietnam war : An intimate History

Lya V. Gaiduk (1996) The soviet union and the Vietnam war , capture review retrieved from (https://www.Foreignaffairs.com)

Krishnan Simha R. (2015) Vietnam war : The critical role of Russian weapons , Retrieved from (https:// www.rbth.com)

Fischer R. (1954) Ho Chi Minh : Disciplined communist, retrieved from (https://www.Foreignaffairs,com)

History.com editors (2009) viet minh take control in the north, A and E television networks retrieved from (https://www.history.com/this - day - in history / viet – minh – take – control – in the – north )

History.com editors (2009) Vietnam war, A and E television networks Retrieved from (https://www.history.com/topics/vietnam - war / Vietnam - war - history)

History.com editors (2010) Vietnam declares its independence from France , A and E Television networks, Retrieved fro (https://www.history.com/this - day - in history/ Vietnam – independence – proclaimed)

Philip B. (2014) Battle against oblivion: the defeat that ended French colonial rule in Vietnam, Retrieved From (https://www.theguardian.com.

# අවුන් සාන් සු කී



**කණ්ඩායම් සාමාජිකයන් :**

- කුළුණි නිසර්ගා විතානගේ
- එ. එම්. එස්. එම්. කේ. එ. එම්. අත්තනායක
- බි. පී. නවෝද්‍යා කේෂානි
- කේ. පී. එස්. එච්. ගිම්හානි
- ආර්. එ. එස්. එ. රණසිංහ

## හැඳින්වීම

ලොව කාන්තාවන්ට හිමිව ඇති සාමාන්‍ය තත්ත්වය අභිබවා ගිය තවත් ශ්‍රේෂ්ඨත්වයක් හිමි කාන්තාවක් ලෙස අවුන් සාන් සු කී (Aung San Suu Kyi) නම් වූ දිරිය කත හැඳින්විය හැකි ය. අවුන් සාන් සු කී මියන්මාර දේශපාලනඥයෙක් තානාපතිවරියක් සහ කතුවරියක්ද වේ . එපමණක් නොව ඇය විසින් සාමය වෙනුවෙන් සිදු කරන ලද මෙහෙවර වෙනුවෙන් වර්ෂ 1990 දී සකාරොව් (Sakharov) සම්මානයෙන් පිදුම් ලැබීය. එමෙන්ම 1991 වර්ෂයේදී ප්‍රජාතන්තවාදය වෙනුවෙන් සිදු කරන ලද මෙහෙවර හේතු කොටගෙන ඇය නොබෙල් සාම ත්‍යාගයෙන් ද පිදුම් ලැබී ය. නොබෙල් සාම ත්‍යාගයත් සමඟ ඇයට ඇමරිකානු ඩොලර් මිලියන 1.3 මුදලක් ලැබුණු අතර ඇය එය බුරුම ජනතාවගේ සෞඛ්‍ය සහ අධ්‍යාපනය මූලික කොට ගෙන අරමුදලක් පිහිටුවීම සඳහා පරිත්‍යාග කළාය. මෙය ඇගේ ශ්‍රේෂ්ඨත්වය විදහා පෑ අවස්ථාවක් ලෙස දැක්විය හැකිය.

අවුන් සාන් සු කී මියන්මාරයේ, ප්‍රථම සහ වත්මන් රාජ්‍ය උපදේශකවරිය ද වේ. කෙසේ නමුත් ඇගේ දේශපාලනමය ආගමනය, එවක සිටි පාලකයන්ට අවාසනාව ගෙනා බව පැහැදිලි කරුණකි. ඇයගේ ප්‍රමුඛත්වයෙන් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ජාතික ලීගය (National League for Democracy) පිහිට වූ අතරම මියන්මාරය මිලිටරි ජුන්ටා (Military Junta) පාලනයක සිට ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් දක්වා ගෙන යාමේ පුරෝගාමියෙකු ලෙස ද, ඇය කටයුතු කළාය. ශ්‍රේෂ්ඨත්වය කරා යාමට මාවත වැටී තිබුනේ අනේක විධ කරදර සහ දුක් කම්කටොලු හරහා ය. කුඩා කල සිටම නොයෙකුත් ගැටලුකාරී අවස්ථාවන්ට මුහුණපෑ ඇය ක්‍රමක්‍රමයෙන් ශක්තිමත් ලෙස විශිෂ්ට නායකත්වයක් කරා මියන්මාර දේශය ගෙනගිය අන්දම මෙයින් මනාව පැහැදිලි කර ගත හැකිය.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

වර්ෂ 1945 ජුනි 19 වැනි දින මියන්මාරයේ රැන්ගුන් (Rangoon) ප්‍රදේශයේදී, එනම් වත්මන් යැන්ගොන් (Yangon) ප්‍රදේශයේදී, අවුන් සාන්(Aung San) සහ කින් කී (Khin Kyi) හට දාව අවුන් සාන් සු කී උපත ලැබීය. ඇගේ පියා වන අවුන් සාන් නූතන බුරුම හමුදාවේ නිර්මාතෘ වීම හේතුවෙන් ඔහුව නූතන මියන්මාර දේශයේ පියා ලෙස වර්තමානයේදී ද, හඳුන්වනු ලබයි. එමෙන්ම ඔහු දෙවන ලෝක යුධ සමයේදී, ජපානය සමග සබඳකම් පවත්වනු ලැබීය. එමෙන්ම ඔහු බුරුම නිදහස වෙනුවෙන් සටන් වැදුණු පුද්ගලයෙක් ද විය. කෙසේ වුවද ඔහු ඊට පසු වසරේදී, සැලසුම් සහගතව ඝාතනය කරනු ලැබීය.

පියාගේ මරණයෙන් පසු, ඇය ඇගේ මව සහ සහෝදරයන් දෙදෙනා සමඟ රැන්ගුන් (Rangoon) හි ජීවත්විය. ඇගේ වැඩිමල් සොහොයුරා වන අවුන් සාන් ඕ (Aung San Oo) ජීවිත තර්ජන හේතු කොට ගෙන ඇමරිකාවට පලා ගිය අතර, ඇගේ අනෙක් සොහොයුරා කුඩා කාලයේදී ම අවාසනාවන්ත ලෙස මරණයට පත්ව තිබේ. මේ හේතුවෙන් සු කීගේ මව යැන්ගොන් (Yangon) පෙදෙසේම වූ ඉන්යා විල (Inya Lake) අසල වූ නිවසකට පදිංචිය වෙනස් කළාය. මෙහිදී කුඩා සු කී හට වෙනත් ආගම් සහ විවිධ දේශපාලන මත දැරූ පුද්ගලයන් ආශ්‍රය කිරීමට අවස්ථාව ලැබිණි.

සු කී කුඩා කාලයේදී, බුරුමයේ මෙතෝදිස්ත ඉංග්‍රිසී උසස් පාසලෙන් (Methodist English High School) අධ්‍යාපනය ලැබිය. මෙම පාසලේදී, ඉතා දක්ෂ ලෙස භාෂාවන් ඉගෙන ගත් අතර එම පන්නරයෙන් ඇය වර්තමානයේදී චතුර ලෙස භාෂා (04) කතා කරනු දක්නට ලැබේ .

ඒ බුරුම (Burmese), ඉංග්‍රිසී (English), ප්‍රංශ (French), සහ ජපන් (Japanese) යන භාෂාවන්ය. මේ අතර නව බුරුම ආණ්ඩුව විසින් සු කීගේ මව ඉන්දියාවේ සහ නේපාලයේ බුරුම තානාපති ලෙස 1960 වසරේදී පත් කරනු ලැබීය. සු කීගේ මව මේ සඳහා පිටත් වූයේ කුඩා සු කීවද රැගෙනයි.

සු කීගේ අධ්‍යාපනයට පදනම වැටුණේ ඉන්දියාවේදීය. ඇය නවදිල්ලි නගරයේ ජේසු සහ මරියතුමියගේ කන්‍යාරාම පාසලෙන් (Convent of Jesus and Mary School) අධ්‍යාපනය ලැබීය. ඇය ඇගේ උපාධිය සඳහා අධ්‍යාපනය ලැබුවේ ශ්‍රී රාම් උසස් කාන්තා අධ්‍යාපන ආයතනයෙනි (Lady Sri Ram College). 1964 වසරේදී, ඇය එම අධ්‍යාපන ආයතනයෙන්ම දේශපාලන විද්‍යාව පිලිබඳ උපාධියක් ලබා ගැනීමට සමත්වූවාය. නමුත් මෙතැනින් අධ්‍යාපනය නතර කර දැමීමට ඇය සූදානම් නොවීය. ඉන්පසු, ඇය එංගලන්තයේ ශාන්ත හියුස් උසස් අධ්‍යාපන ආයතනයෙන් (St. Hugh’s College, Oxford) 1967 වසරේදී දර්ශනය, දේශපාලනය සහ ආර්ථික විද්‍යාව පිලිබඳ ශාස්තවේදී උපාධියක් ලබා ගත්තාය. මෙයින් පසු ඇය, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වසර 3ක කාලයක් සේවය කරනු ලැබුවාය. ඉන්පසු වසර 1985 සිට 1987 දක්වා කාලය තුළ ඇය, ලන්ඩන් විශ්වවිද්‍යාලයේ පෙරදිග හා අපිකානු අධ්‍යයන අංශයේ (SOAS, School of Oriental and African Studies, University of London) පර්යේෂණ ශිෂ්‍යාවක ලෙස බුරුම සාහිත්‍යය පිළිබඳ ශාස්තපති උපාධියක් සඳහා කටයුතු කරමින් සිටියා ය.

1988 වසරේදී, ඇය නැවත තම මව් රටට පැමිණියා ය. ප්‍රථමයෙන් එහි අරමුණ ලෙස ඇය දැක්වූයේ, ඇගේ අසනීප මෑණියන් මුණ ගැසීමට පැමිණියා යන කාරණයයි. නමුත් ඇගේ යටි අරමුණ වූයේ, දේශපාලනයට පිවිසීමයි. මෙම වසරේදීම ඇගේ දේශපාලන දිවිය ද, තීරණාත්මක ලෙස ආරම්භ විය. ඇගේ දේශපාලනික ආගමනයත් සමඟ එකල බුරුමයේ මිලිටරි පාලකයා වූ ජෙනරාල් නෙ වින් (Ne Win) පසුබැස ගියේ ය. මේ අතරම 1988 වසරේ අගෝස්තු 26 වැනි දින අවුන් සාන් සු කී අතිවිශාල ජනකායකට ආමන්ත්‍රණය කළාය. එය පැවැත්වුණේ ෂ්වේදගන් පැගොඩා (Shwadagon Pagoda) හිදී ය. මෙය 8888 කැරුල්ල (8888 uprising) ලෙස හැඳින්විණි. මේ අනුව ඇය සමස්ත රටම ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සඳහා උනන්දු කරනු ලැබුවා ය. කෙසේ වුවත් එම

වසරේම සැප්තැම්බර් මාසයේදී, නව මිලිටරි ජුන්ටාවක් (Military Junta) මියන්මාරයේ බලය ලබාගනු ලැබීය.



*(අවුන් සාන් සු කී කුඩා කාලයේදී)*

බුදුන් වහන්සේ සහ මහත්මා ගාන්ධිතුමන් අනුව යමින් අවිහිංසාවාදය තම දර්ශනය ලෙස තෝරාගත් ඇය, ප්‍රජාතන්තවාදය මූලික කර ගනිමින් දේශපාලනයට පිවිසුණා ය. එමෙන්ම ඇය 1988 වසරේ සැප්තැම්බර් මස 27 වැනි දින එවක පැවති මිලිටරි ජුන්ටාව දැඩි ලෙස ප්‍රතික්ෂේප කළ හිටපු යුධ හමුදා නිලධාරීන් සමඟ එක්ව ප්‍රජාතන්තවාදය සඳහා වූ ජාතික ලීගය (National League for Democracy) පිහිටවූවා ය. ඒ සමඟම ඇය එහි මහ ලේකම් ධූරයට ද පත්විය.

## <u>නායකත්වය කරා ගිය ගමන් මග</u>

අවුන් සාන් සුකී ප්‍රජාතන්ත්‍රීයකරණය සඳහා වැඩ කිරීම මූලික කරගෙන දේශපාලනයට අවතීර්ණ වූ අතර ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ජාතික ලීගය (එන්.එල්.ඩී)1988, සැප්තැම්බර් 27 වන දින ආරම්භ කළාය. නමුත් ඇයව 1989 ජූලි 20 වන දින නිවාස අඩස්සියේ තබන ලදී. ඇය රට හැර ගියහොත් ඇයට නිදහස ලබා දීමට එකඟවුන නමුදු ඇය එය ප්‍රතික්ෂේප කළාය. අර්බුදය අතරතුර එන්.එල්.ඩී පක්ශය සමඟ එක් ව සිටි හමුදා අණදෙන නිලධාරීන් සහ දේශපාලනයින් පිරිසක් ඇය ගැටුම්කාරී යැයි විශ්වාස කළ අතර ඔවුන් එන්.එල්.ඩී (NLD) පක්ෂය හැර ගියහ. කෙසේවෙතත්, ඇය වැඩි කාලයක් යන්නට මත්තෙන් යෞවනයන් අතර විශාල ජනප්‍රියත්වයක් ලබා ගත්තාය. ප්‍රජාතන්ත්‍රවාදයේ හා බෞද්ධාගම අතර ගැළපුම සහ බෞද්ධාගම හරහා ඒකාධිපති රජයකින් නිදහස ලබා ගැනීමේ හැකියාව පිළිබඳව ද ඇගේ නායකත්වය යටතේ වැඩි සාකච්ඡාවක් ඇතිවිය.

අර්බුදය අතරතුර, කලින් ප්‍රජාතන්ත්‍රවාදී ව තේරී පත්වූ බුරුමයේ අග්‍රාමාත්‍ය යූ නු (U Nu) අන්තර් රජයක් පිහිටුවීමට පටන් ගත් අතර තමා හා එක් වන ලෙස විපක්ෂ නායකයින්ට ආරාධනා කළේය. කෙසේ වෙතත්, අවුන් සාන් සූකී ඔහුගේ සැලැස්ම තරයේ ප්‍රතික්ෂේප කළේ "විපක්ෂයේ අනාගතය ජනතාව විසින් තීරණය කරනු ඇත" යනුවෙන් ප්‍රකාශ කරමිනි. සුප්‍රසිද්ධ 88 මහජන නැගිටීම " රැන්ගුන්" හි (Rangoon) ආරම්භ වී මුළු රටටම ව්‍යාප්ත වෙමින් මිලිටරි මර්දනය හේතුවෙන් මිලියන ගණනක් ජනතාව මිය ගියහ. අර්බුදය පැවති අවස්ථාවේ තවත් බලගතු දේශපාලනයෙකු හා එන්.එල්.ඩී ඉතිහාසයේ පළමු සභාපතිවරයා වූ හිටපු බ්‍රිගේඩියර් ජෙනරාල් අවුන් ගයි (Aung Gyi) එය අනුගමනය කළ අතර අවුන් සාන් සූකී ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව එම සැලැස්ම ප්‍රතික්ෂේප කළේය. අවුන් ගයි පසුව එන්.එල්.ඩී සාමාජිකයින් කිහිපදෙනෙකු කොමියුනිස්ට්වාදීන් යැයි චෝදනා කර පක්ෂයෙන් ඉල්ලා අස්විය. 1988 අගෝස්තු 26 දී අවුන් සාන් සූකී, රැන්ගුන්හි ප්‍රසිද්ධ ෂ්වේදගන් පැගොඩා (Shwedagon Pagod) ඉදිරිපිට මිලියන භාගයක මහජන රැළිය අමතමින් ප්‍රජාතන්ත්‍රවාදී රජයක් ඉල්ලුවාය. 1988 සැප්තැම්බර් දී හමුදාව සිය බලය නැවත ස්ථාපිත කරන අතර රාජ්‍ය නීතිය හා සාමය පිළිබඳ ප්‍රතිසංස්කරණ සභාව (SLORC) පිහිටුවා ඇත. මිලිටරිය යළිත් ප්‍රජාතන්ත්‍රවාදී ගැති ව්‍යාපාරය බිඳ දමමින් තවත් සිය ගණනක් මරාදමන ලදි. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ජාතික ලීගය එම කාලයේදී පිහිටවන ලද අතර, අවුන් සාන් සූ කී ප්‍රධාන ලේකම් ලෙස කටයුතු ආරම්භ කළාය. කෙසේ වෙතත්, සැප්තැම්බර් මාසයේදී නව මිලිටරි ජුන්ටාවක් බලයට පත්විය.



*(ඔස්ලෝ හි නොබෙල් සාම මධ්‍යස්ථානයේ පැවති ප්‍රදර්ශනයේදී)*

1989 ජූලි මාසයේදී අලුතින් නම් කරන ලද මියන්මාරයේ යුධ හමුදාව (2011 සිට මියන්මාර සමූහාණ්ඩුව) සූ කී යැන්ගොන් (රංගූන්) හි නිවාස අඩස්සියේ ඇය රඳවා තබා ගත්හ. ඇය මියන්මාරයෙන් පිටවීමට එකඟ වුවහොත් ඇයව නිදහස් කිරීමට හමුදාව ඉදිරිපත් වූ නමුත්; රට සිවිල් රජයට ආපසු ලබා දෙන තෙක් සහ දේශපාලන සිරකරුවන් නිදහස් කරන තෙක් ඇය එය ප්‍රතික්ෂේප කළාය. 1988 දී සූ කී විසින් සම්පාදනය කරන ලද ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ජාතික ලීගය 1990 දී තරඟ කළ පාර්ලිමේන්තු ආසනවලින් වැඩි ප්‍රමාණයක් දිනා ගත් නමුත් එම මැතිවරණයේ ප්‍රතිඵල හමුදා රජය විසින් නොසලකා හරින ලදි. 1995 ජූලි මාසයේදී සු කී නිවාස අඩස්සියේ සිට නිදහස්වූ නමුත් ඇයට යැන්ගෝනයෙන් පිටත සංචාරය කිරීමේ හැකියාව සීමාකර තිබුණි. ඊළඟ වසරේදී ඇය එන්.එල්.ඩී (NLD) පක්ෂ සම්මේලනයට සහභාගී වූ නමුත් හමුදා රජය ඇයට සහ ඇගේ පක්ෂයට දිගින් දිගටම හිරිහැර කළේය. 1998දී ඇය නියෝජිත කමිටුවක් පිහිටුවීම නිවේදනය කළේ රටේ නීත්‍යානුකූල පාලක පාර්ලිමේන්තුව ලෙස ය.

1990 දී මිලිටරි ජුන්ටාව මහ මැතිවරණයක් කැඳවූ අතර එහිදී ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ජාතික ලීගය 59% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත් අතර එන්.එල්.ඩී පක්ෂයට පාර්ලිමේන්තු ආසනවලින් 80% ක් සහතික විය. ඇතැමුන් කියා සිටියේ අවුන් සාන් සූ කී අග්‍රාමාත්‍ය ධූරයට පත්වනු ඇති බවය. එනමුත් එහි ප්‍රතිඵල අහෝසි වූ අතර හමුදාවට බලය පැවරීම ද ප්‍රතික්ෂේප කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර විරෝධයක් ඇති විය. අවුන් සාන් සූ කී රංගූන්හි යුනිවර්සිටි ඇවනියුහි (University Avenue) පිහිටි ඇගේ නිවසේදී නිවාස අඩස්සියේ තබා තිබූ අතර (1989-1995), එම කාලය තුළ ඇයට 1990 දී චින්තනයේ නිදහස සඳහා සාකරොව් (Sakharov) ත්‍යාගය පිරිනමන ලදී. අවුන් සාන් සූ කී නොබෙල් සාම ත්‍යාගයේ (Nobel Peace Prize) ඇමරිකානු ඩොලර් මිලියන 1.3 ක ත්‍යාග මුදල බුරුම ජනතාව සඳහා සෞඛ්‍ය හා අධ්‍යාපන භාරයක් පිහිටුවීම සඳහා භාවිතා කළාය. මේ කාලය වනවිට, අවුන් සාන් සූ කී අවිහිංසාව කඩිනම් දේශපාලන උපක්‍රමයක් ලෙස තෝරා ගත් අතර, 2007 දී ප්‍රකාශ කළේ, "මම අවිහිංසාව සදාචාරාත්මක හේතූන් මත නොව දේශපාලන හා ප්‍රායෝගික හේතූන් මත තබාගෙන සිටිමි" යනුවෙනි.

සූ කීගේ අරගලය මෑත දශක කිහිපය තුළ ආසියාවේ සිවිල් ජනතාවගේ අතිශය අසාමාන්‍ය උදාහරණයකි. පීඩනයට එරෙහි අරගලයේ ඇය වැදගත් සංකේතයක් බවට පත් විය. නොබෙල් සාම ත්‍යාගය, යුරෝපීය පාර්ලිමේන්තුවේ සකාරොව් ත්‍යාගය සහ එක්සත් ජනපදයේ ජනාධිපති පදක්කම් ඇතුළු ජාත්‍යන්තර සම්මාන රාශියක් අවුන් සාන් සූ කී දිනාගත්හ. බුරුමයේ නිදහස සඳහා වන අරගලයට එක් වන ලෙස ඇය ලොව පුරා සිටින ජනයාගෙන් ඉල්ලා ඇත්තේ “කරුණාකර ඔබේ නිදහස අපගේ ප්‍රවර්ධනය සඳහා යොදා ගන්න” යනුවෙනි.

අවුන් සාන් සූ කී වසර 21 ක් තුළ වසර 15 ක් මුළුල්ලේ නිවාස අඩස්සියේ තබා ඇති අතර, ඇය සිය දේශපාලන ජීවිතය ආරම්භ කළ දින සිට අවස්ථා ගණනාවකදී, එම කාලය තුළ ඇයගේ පක්ෂ ආධාරකරුවන් සහ ජාත්‍යන්තර අමුත්තන් හමුවීම වළක්වන ලදි. සම්මුඛ සාකච්ඡාවකදී ඇය කියා සිටියේ නිවාස අඩස්සියේ සිටියදී තම සැමියා විසින් එවන ලද දර්ශනය, දේශපාලනය සහ චරිතාපදාන කියවීමට ඇය කාලය ගත කළ බවයි. නිවාස අඩස්සියේ සිටියද, අවුන් සාන් සූ කී ට බුරුමය හැර යාමට අවසර ලැබුණේ ඇය කිසිදිනෙක ආපසු නොඑන කොන්දේසිය යටතේ ය. ඇය එය ප්‍රතික්ෂේප කලේ: "මගේ පුතුන් අතහැර දමා මවක් වශයෙන් මා විශාල කැපකිරීමක් සිදු කළ ද, මට වඩා ඇතැමුන් විශාල වශයෙන් කැපකිරීම් කර ඇති බව මා සැමවිටම මා දැන සිටියෙමි . සිරගෙදර සිටින මගේ සගයන් ශාරීරිකව පමණක් නොව, මානසික ව පීඩා විඳිති” යනුවෙන් සඳහන් කරමිනි.

වසර 20 ක පරතරයකින් පසුව පවත්වන ලද මැතිවරණයෙන් ජුන්ටා පිටුබලය ලත් යූනියන් සහයෝගිතා සහ සංවර්ධන පක්ෂය (USPD) දින කිහිපයකට පසු 2010 නොවැම්බර් 12 වන දින, සුකී නිදහස් කිරීමට අවසර දෙන නියෝග අත්සන් කිරීමට එකඟ විය. සුකීගේ නිවස අත්අඩංගුවට ගැනීමේ වාරය 2010 නොවැම්බර් 13 වනදින අවසන් විය. 2012 ජනවාරියේදී සූ කී ඇය යැන්ගොන්හි (Yangon) මැතිවරණ කොට්ඨාශයකට මැතිවරණයක් ඉල්ලා සිටින බව නිවේදනය කළ අතර, ඇය ධූරය සඳහා ඉදිරිපත් වීමට දැරූ උත්සාහය පෙබරවාරි මාසයේ දී රජය විසින් අනුමත කරන ලදී. අප්‍රේල් පළමු වන දින පැවැත්වූ මැතිවරණයෙන් ඇය පහසුවෙන් සිය ආසනය දිනා ගත් අතර මැයි 2

වන දින දිවුරුම්දෙන ලදි. 2012 අප්‍රේල් අවුන් සාන් සූ කී අතුරු මැතිවරණයෙන් ආසනයක් දිනා ගත්තාය. අතුරු මැතිවරණයට ඉදිරිපත්වූ ආසන 45 න් 43ක්ම එන්.එල්.ඩීයට ලැබිණි. 2012 ජූලි 25 දී අවුන් සාන් සූ කී සිය පළමු කතාව පාර්ලිමේන්තුවේදී පැවැත්වූවාය. 2008 ජනවාරි 31 දී අවුන් සාන් සූ කී ට එන්.එල්.ඩී නායකත්වය හිමිවිය. "අපි හොඳම දේ බලාපොරොත්තු විය යුතු අතර නරකම දේ සඳහා සූදානම් විය යුතුයි" යන පණිවිඩය මහජනයාට දැනුම් දෙන ලෙස ඇය ඉල්ලා සිටියාය.

2015 නොවැම්බරයේ මුල්භාගයේ පැවති ඡන්ද විමසීමෙන් ජාතික ලීගයට (Natioal League for Democracy) විශාල ජයග්‍රහණයක් හිමිවූ අතර, එමගින් ඊළඟ ජාතික ආණ්ඩුව පිහිටුවීමට පක්ෂයට ඉඩ සැලසෙන පරිදි ව්‍යවස්ථාදායක සභා දෙකෙහිම ආසන විශාල ප්‍රමාණයක් ලබා ගැනීමට හැකිවිය. 2016 මාර්තු 15 වන දින රටේ නව ජනාධිපතිවරයා ලෙස සේවය කිරීම සඳහා ව්‍යවස්ථාදායක සාමාජිකයින් විසින් ඕ හටින් කියාව් (HtinKyaw) තෝරා ගන්නා ලදී. සූ කී මුලින් නව රජයේ අමාත්‍ය ධූර හතරක් දැරූ නමුත් සතියක් ඇතුළත පළමු තනතුරු දෙක අතහැර දමා තිබුණි. පසුව ඇය රාජ්‍ය උපදේශකවරිය ලෙස නම් කරන ලදි . මෙම තනතුර ව්‍යවස්ථාදායකය විසින් අලුතින් නිර්මාණය කරන ලද අතර හටින් කාව් විසින් නීතියට අත්සන් කරන ලදි. මෙම ධූරය අගමැති ධූරයට සමාන වූ අතර ජනාධිපතිවරයාට වඩා බලවත් විය හැකිවිය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව

2015 නොවැම්බර් මැතිවරණයෙන් අවුන් සාන් සුකී ප්‍රමුඛ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ජාතික ලීගයේ විශිෂ්ඨ ජයක් අත්කර ගත් අතර විදේශිකයෙකුගේ බිරිඳක් සහ විදේශීය පුරවැසිභාවය සහිත දරුවන්ගේ මවක වීම මත ඇයට ව්‍යවස්ථාවෙන් ජනාධිපති ධූරය හිමිකර ගැනීමට බාධා එල්ල විණි. එහෙයින් 2016 මාර්තු 30 දින ඇය විදේශ සබඳතා, අධ්‍යාපන, විදුලි හා බලශක්ති සහ ජනාධිපති කාර්යාලය සඳහා වූ අමාත්‍යධූරයන්ට අනුයුක්තව සේවය ඇරඹූවාය. පසුව අග්‍රාමාත්‍ය ධූරයට සමාන වූ බහුතර විධායක බලතල සහිත රාජ්‍ය උපදේශිකාව,

(State counselor) නම් නිලය ඇයට පිරිනැමුණු අතර ඇය මියන්මාරයේ විධායක බලතල උසුලමින් පාලන කටයුතු මෙහෙයවීම ඇරඹුවාය. කෙසේවතුදු දශක ගණනක හමුදා පාලනයකට පසු ලෝකයේ ලාබාලතම ප්‍රජාතාන්ත්‍රවාදී පාලනය බිහිකරලීම සැබැවින්ම පහසු කටයුත්තක් නොවේ. අඩසියවසක පමණ දුර්වල කළමණාකරණයකින් යුත් ආර්ථිකයක් නැවත දියුණු කරලීම අවුන් සාන් සුකීට සිදුව ඇති අතර එය අභියෝගයකි. ආර්ථිකය නගා සිටුවීම සේම මේ වනවිට ලෝකයේ දීර්ඝතම සිවිල් යුද්ධය අවසන් කිරීමට ද සාකච්ඡා කරමින් සිටි එමෙන්ම මියන්මාරයේ බලවත්ම අසල්වැසියන් වන චීනය, ඉන්දියාව සහ වේගයෙන් වර්ධනය ආසියාන් කලාපය සමඟ ද සබඳතා කළමණාකරණය කරමින් ඇත. අවුන් සාන් සුකීට මෙම සියලු කටයුතු මියන්මාරයේ තවමත් බලවත් හමුදා නියෝජනය ද සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට සිදු වී ඇත.

"බුරුමයේ ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් සඳහා වන අරගලය ජීවිතය සහ අභිමානය සඳහා වන අරගලයකි. එය අපගේ දේශපාලන, සමාජ හා ආර්ථික අභිලාෂයන් ඇතුලත් වන අරගලයකි."

- අවුන් සාන් සු කී-

මියන්මාර ජනතාවගේ දේශපාලන ප්‍රතිසංස්කරණ, මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදයේ ස්ථාපිත කිරීමේ එකම බලාපොරොත්තුව වූ අවුන් සාන් සුකී බලයට පත්වීමත් සමඟ හමුදා මැදිහත් වීම් සහිත වුවද ප්‍රජාතන්ත්‍රවාදී පාලන තන්ත්‍රයක් මියන්මාරය තුළ ස්ථාපිත විය. ඒ සමඟ මියන්මාරයේ විදේශ සබඳතා වර්ධනය කෙරෙහි අවුන් සාන් සුකී වෙත පැවති අන්තර්ජාතික පිළිගැනීම ද හේතුවිය. මියන්මාරයේ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කළ අවුන් සාන් සුකී 2016 දී ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ (International Development Association) දුප්පතුන් සඳහා වූ අරමුදලෙහි සමුළුවේදී මියන්මාරයේ ගම්මාන පීඩා විඳින විදුලිය නොමැතිකම, දරුවන්ගේ මන්දපෝෂණය සහ අධ්‍යාපනික පහසුකම් අවම වීම මෙන්ම විරැකියාව ආදී ගැටලු ඉස්මතු කරමින් දුප්පත්කම දුරලීමට සහයෝගය ඉල්ලා සිටියාය. ඒ අනුව එහි සහාය ලබන රටවල් අතර මියන්මාරයට ප්‍රමුඛ ස්ථානයක් හිමිවේ. මියන්මාරයේ 5000කට ආසන්න ප්‍රදේශ ගණනක මිලියන 03 කට අධික

ජනගහණයක් මේ හරහා සෞඛ්‍යය, අධ්‍යාපනය, මාර්ග සහ මූලික යටිතල පහසුකම් ප්‍රතිලාභ භුක්ති විඳියි.

2015 ලෝක බැංකු වාර්තාවන්ට අනුව මියන්මාරය ආසියාවේ ව්‍යාපාර ආරම්භ කිරීමට සහ පවත්වා ගෙනයාමට අපහසුම රටක් ලෙස නම් කර තිබිණි. ඒ අනුව මියන්මාරයේ ඍජු විදේශ ආයෝජන ඉතා පහළ මට්ටමක පැවතිණි. මියන්මාරයේ විදේශ ආයෝජන උදෙසා පැවති පිපාසය සංසිඳවනු වස් අවුන් සාන් සුකීගේ රාජ්‍ය විසින් මියන්මාර ආයෝජන සමුළුව (Myanmar Investment Conference) සහ රකීන් (Rakhine) හා චින් (Chin) ප්‍රාන්ත සඳහා ආයෝජන පොළ ද පවත්වනු ලැබූ අතර ඒ හරහා විදේශ ආයෝජන හරහා ආර්ථික වර්ධනය අපේක්ෂා කෙරිණි. එසේම අවුන් සාන් සුකීගේ රජය විසින් " මියන්මාර තිරසාර ආර්ථික සංවර්ධන සැලැස්ම"(Myanmar sustainable economic development plan ) හඳුන්වාදුන් අතර එය 2030 දක්වා වූ ආර්ථික ඉලක්ක වලින් සමන්විත විය. මෙම නව ව්‍යාපාර නීති හරහා විදේශිකයින්ට 35% දක්වා මියන්මාර ව්‍යාපාරයන්හි ආයෝජන කිරීමට ද කොටස්වල හිමිකම දැරීමට ද අවස්ථා උදා විය. එය කඩා වැටෙමින් පැවති ආර්ථිකයට නව දොරටුවක් විය. යුරෝපා සංගමය (European Union) සමඟ වෙළඳ සබඳතා හේතුකොටගෙන මියන්මාරයේ ඇඟලුම් කර්මාන්තය දියුණු විය. එසේම ලෝක බැංකුවේ 2019 වාර්තාවට අනුව මියන්මාරය ජාතික දරිද්‍රතා රේඛාව මත පදනම්ව 2005 සිට 2017 වසර දක්වා කාලය තුළ 48% සිට 25% දක්වා හරි අඩකට ආසන්න ප්‍රමාණයකින් දරිද්‍රතාව අඩු කරගැනීමට සමත්ව ඇත. සුකීගේ පාලන සමය තුළ ස්ථාවර උද්දමන අනුපාතයක් පවත්වා ගැනීම අගය කළ යුතුය. පෙර පැවති පාලනය විසින් බදු එකතු කිරීම පසෙකලා අයවැය හිඟ අවම කිරීම සඳහා මුදල් නෝට්ටු මුද්‍රණය කළ අතර ඒ තුළින් උද්දමනය පාලනය ඉතා අසීරු විය. හමුදා පාලනය යටතේ  මුදල් නෝට්ටු මුද්‍රණය හරහා 70 ක අයවැය හිඟ පිරවීම සිදු වුවද සුකී ගේ පාලනය යටතේ එය 30 ක් දක්වා අඩු කිරීමට සමත් විය තවද බැංකු කටයුතු ක්‍රමයෙන් නවීකරණය කිරීමට ද ඇයගෙ පාලන සමය තුළ කටයුතු කර ඇත. එසේම මියන්මාරයේ ආර්ථික වර්ධන වේගය 2019 වර්ෂය වන විට 6.6% වන අතර එය කලාපයේ අනෙකුත් රටවල් සමග සසඳන විට

යහපත් වර්ධනයක් ලෙස සැලකිය හැකිය. තවද අවුන් සාන් සුකීගේ පාලන සමය තුළ මියන්මාරය සමාජ මාධ්‍ය වල සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරමින් වඩාත් රැහැන් රහිත සමාජයක් බවට පරිවර්තනය වී ඇත. දුරකථන සිම්පතක මිල $ 1400 - 1500 සිට $ 1 දක්වා අඩු වී ඇත.

දීර්ඝකාලීන වැරදි කළමණාකරණයකින් යුත් ආර්ථිකයක් සහ සමාජයක් මුළුමනින්ම නගාසිටුවීමට අවුන් සාන් සුකී අසමත් වුව ද පැවති හමුදා පාලනයට සාපේක්ෂව යම් ප්‍රජාතන්ත්‍රවාදී පාලන තන්ත්‍රයක් ස්ථාපිත කිරීමට ඇය සමත් විය. නමුත් බලාපොරොත්තු වූ පරිදි ආර්ථිකය වර්ධනය කිරීමට අවුන් සාන් සු කී ප්‍රමුඛ රජය අසමත් වුවද යම් යම් සාධනීය සේවාවන් නැතුවාම නොවේ.

2020 දී මුළු ලොවම වෙලාගෙන පවතින Covid – 19 හෙවත් කොරෝනා වෛරසය මියන්මාරයට සැතපුම් 1400 ක් පමණ ගොඩබිම් දේශසීමා ඇති චීනයේ ඉතා දරුණු ලෙස ව්‍යාප්ත වුව ද මේ වන විටත් මියන්මාරය තුළ කොරෝනා වෛරස් ආසාදිතයන් ප්‍රමාණය ඉතා අවම මට්ටමක පවතී. එසේ වුවද අවුන් සාන් සුකී ප්‍රමුඛ රජය විසින් එරට සියලු උත්සව හා සැණකෙලි තහනම් කර ඇති අතර ඉදිරියේ පවත්වන එරට විශාලතම උත්සවයක් වන තින්ග්‍යාන් (Thingyan) උත්සවය පවා අවලංගු කර ඇත. එසේම රෝගීන් ප්‍රමාණය ඉහළ ගියහොත් ඒ අයට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය අරමුදල් ද මේ වන විට රැස් කරන බව මියන්මාරය සඳහන් කර ඇත. කෙසේ වුවද Covid – 19 මියන්මාර ආර්ථිකයට දැඩි බලපෑමක් එල්ල කර ඇති අතර ඒ සඳහා හැකි පමණ පියවර ගන්නා බව අවුන් සාන් සුකී ප්‍රකාශ කර ඇත. අවුන් සාන් සුකීගේ දැඩි සහ නිවැරදි තීරණ කොරෝනා වෛරසයෙන් මියන්මාරය තවමත් දැඩි පීඩාවකට පත් නොවීමට හේතුව බව ජාත්‍යන්තරයේ විශ්වාසයයි.

කෙසේ වුවද මියන්මාරය තුළ නායකත්වයට පැමිණීමෙන් පසු සිය පාලන කටයුතු පවත්වා ගෙන යාමේදී සුකී ට විවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදු විය. හමුදා පාලනය යටතේ සැකසුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තවමත් රට තුළ පවතින හමුදා අත පෙවීම්, ජනවාර්ගික ගැටලු, ඉතා දුර්වල ආර්ථිකය හා යටිතල පහසුකම්, දුර්වල රාජ්‍ය ආයතනික ව්‍යුහය ආදිය එවැනි අභියෝග ඒ අතර

කිහිපයකි.එක්සත් ජාතීන්ගේ සංවිධානය ඌණ සංවර්ධිත රටක් ලෙස නම් කර තිබූ මියන්මාරය නගාසිටුවීම පහසු කටයුත්තක් නොවන්නා සේම ලෝක බලවතුන් අතර පවත්නා බල අරගලයන්හි බලපෑම ද ආසියාන් සංවිධානයේ රටවල් අතරින් විශාල රාජ්‍යයක් වන මියන්මාරයට මුහුණ දීමට සිදුව ඇත.

නමුත් අවුන් සාන් සූකීගේ පාලන කාලය තුළ මියන්මාරයේ උද්ගතව ඇති රෝහිණ්‍යා අර්බුදය, ජනවාර්ගික අරගල, ජනමාධ්‍ය නිදහස සීමා කිරීම, ඉඩම් අයිතිය සම්බන්ධ ගැටලු හා මානව හිමිකම් කඩවීම් ආදිය හේතු කොටගෙන අවුන් සාන් සූකීගේ පාලනය බලාපොරොත්තු වූ මට්ටමේ සාර්ථකත්වයක් මියන්මාරයට ගෙන ඒමට අපොහොසත් වී ඇති බව බොහෝ දෙනාගේ මතයයි.



*(IDA සමුළුවේදී (International Development Association))*

## විදේශ ප්‍රතිපත්තිය

කොන්සර්වේටිව් පාක්ෂිකයන් දිගු කලක් පුරෝකතනය කර ඇත්තේ අවුන් සාන් සු කී ගේ නායකත්වයෙන් යුත් පරිපාලනයක් යටතේ රටේ විදේශ ප්‍රතිපත්තිය බටහිර දෙසට ඇදී යනු ඇති බවයි. ඇමරිකාව සහ චීනය අතර උපායමාර්ගික තරගයේ මියන්මාරය වැදගත් ක්‍රීඩකයකු වන අතර මියන්මාරයේ වර්තමාන නොබැඳි ස්ථාවරය සුළු වෙනස්කම්වලට ලක් වන බව ඔවුන් පවසයි. ඇමරිකා එක්සත් ජනපදය විසින් චීනය පාලනය කිරීම සඳහා මියන්මාරය භාවිත කිරීමට සැලසුම් කරන බවත් උතුරු කොරියාව සමඟ මියන්මාරයේ මිලිටරි සම්බන්ධතාවය සීමා කිරීම සඳහා එක්සත් ජනපදය අවුන් සාන් සුකීගේ සහාය පතනු ඇතැයි ඇතමුන් අපේක්ෂා කරයි. නමුත් මියන්මාරයේ දිගුකාලීන අවශ්‍යතා පවතින්නේ එහි බලවත් අසල්වැසියන් වන චීනය සහ ඉන්දියාව ඇතුළු සියළු විදේශ රටවල් කෙරෙහි එක් ප්‍රවේශයක් පවත්වා ගැනීමෙන් බව සුකී දනී.

අවුන් සාන් සුකී මියන්මාරයේ රාජ්‍ය නායක හා විදේශ ඇමති ධූරයට පත් වීමත් පසු සිය පළමු විදෙස් සංචාරය ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයින් මෙන් කලාපය තුළ සිදු විය. ඒ අනුව ජනාධිපති බවුන්හන්ග් වොරචිට් (Bounnhang Vorachit) ගේ ආරාධනයෙන් ඇය ලාඕසය වෙත ගියාය. එහිදි දෙපාර්ශවයම පොදු, කලාපීය හා ජාත්‍යන්තර ගැටලු පිළිබඳව අදහස් හුවමාරු කර ගත් අතර දෙරටේ සංචාරක හා වාණිජ ගමනාන්ත අතර ඍජු ගුවන් ගමන් නැවත ආරම්භ කිරීම පිළිබදව සාකච්ඡා කළහ.

හිටපු හමුදා තන්ත්‍රය හුදකලා කොට දඬුවම් කිරීමෙන් වසර ගණනාවකට පසු මියන්මාරය සමඟ ද්විපාර්ශ්වික සබඳතා යථා තත්ත්වයට පත් කිරීමට එක්සත් ජනපදය උනන්දුවෙයි. භූගෝලීය පිහිටීම සහ ආසියාන් (ASEAN) සංවිධානයේ සාමජිකත්වය මගින් චීනය පාලනය කිරීම ඇමරිකාවේ අරමුණු සඳහා ඉතා වැදගත් සාධකයකි.

ඇමරිකාවේ රාජ්‍ය නොවන සංවිධානයක් විසින් අවුන් සාන් සුකී නිවාස අඩස්සියේ සිට නිදහස් කර ගැනීමට කටයුතු කළ අතර ඇය රඳවා තබා ගැනීම ජාත්‍යන්තර නීතිය උල්ලංඝණය කිරීමක් බවට අත්තනෝමතික ලෙස රඳවා තබා

ගැනීම පිළිබඳ සංවිධානය එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායමේ අදහස් කිහිපයක් ද ලබා ගත්තේය. එමෙන්ම හිටපු ජනාධිපතිවරුන් අගමැතිවරුන් හා ඇමතිවරුන් 112 දෙනෙකු එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බැන් කී මූන් (Ban Ki-Moon) වෙත ලිපියක්ද යොමු කළ අතර ඇයව රදවා තබා ගැනීම පිළිබඳව මාධ්‍යයන් මගින් පුළුල් ලෙස කථා කළාය. තවද සු කී හට 2015 දී මැතිවරණ ජයග්‍රහණය සදහා එක්සත් ජනපදය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. එමෙන්ම රාජ්‍යතාන්ත්‍රික සබඳතා සාමාන්‍යකරණය කිරීමත්, ආධාර, වෙළදාම සහ ආයෝජන සදහා චීනය මත රඳා පැවතීමෙන් මියන්මාරය මිදීමට සහ විශාල දේශපාලන ආර්ථික හා මිලිටරි සබදතා පුළුල් කිරීමට එක්සත් ජනපදය කටයුතු කෙරීය.

2016 සු කී රාජ්‍ය නායකයා බවට පත් වීමෙන් පසුව ඇමරිකාවේ සංචාරයට පැමිණි අතර එහිදී ජනාධිපති ඔබාමා (Obama) විසින් මියන්මාරයට එරෙහි ආර්ථික සම්බාධක කිහිපයක් ඉවත් කරනු ලැබීය. නමුත් 2018, 2019 වර්ෂ වලදී මුස්ලිම් සරණාගත අර්බුදය හේතුවෙන් ඇමරිකාව විසින් මියන්මාර හමුදාවලට සම්බාධක පනවා ඇති අතර නැගෙනහිර ආසියා සමුළුව (East Asia Summit) සඳහා ඔබාමා මියන්මාර යේ කළ සංචාරයේදී ද මෙම අර්බුදය පිළිබඳව සාකච්ඡා කෙරිණි. විද්වතුන් අදහස් කරනුයේ මෙම සංක්‍රාන්තියේ අනපේක්ෂිත අභියෝග මධ්‍යයේ මියන්මාරය කෙරෙහි බටහිර බලපෑම අඩුවෙමින් පවතින අතර, චීනය වඩාත් ස්ථාවර වෙමින් රටේ තත්ත්වය සහතික කරමින් සිටින බවත් ය. එය බුරුමයේ භූ දේශපාලනික අභිප්‍රායන් හා ආර්ථිකය පිළිබඳ ගැටලුකාරී වේ.

ජනාධිපති ෂී ජින් පින් (Xi Jinping) විසින් වසරක් තුළ චීනයේ දෙවන සංචාරය ලෙස චීනයේ උපාමාර්ගික සමුළුවක් ලෙස සලකන එක් තීරයක් එක් මාවතක් (Belt Road Initiative) සමුළුවට සහභාගි වන ලෙස සු කී හට ආරාධනා කළේය. එහිදී දෙරටේ නායකයන් ගිවිසුම් පහකට අත්සන් තැබූ අතර (Belt Road Initiative) එම උපායමාර්ගය යටතේ සහයෝගීතාව පිළිබද අවබෝධතා ගිවිසුමක්ද 'ආර්ථික සහයෝගීතා කලාපයක්" පිහිටුවීම පිළිබද ගිවිසුමක්ද විය. ඇය ආපසු පැමිණි පසු චීන යුධ නැව් මියන්මාරයේ නාවික හමුදාව ඒකබද්ධ අභ්‍යාස වලට සහභාගි විය.

චීනයේ නිරිතදිග අභ්‍යන්තරය ඉන්දියන් සාගරයට සම්බන්ධ කරන ආර්ථික කොරිඩෝවක් ඔස්සේ දුම්රිය හා ගැඹුරු මුහුදේ වරාය ව්‍යාපෘති ඇතුළුව ගිනිකොණදිග ආසියානු රටවල් සමීප කරවන ද්විපාර්ශ්වික ගිවිසුම් තිස් තුනකට අත්සන් තැබුණු අතර බෙංගාල බොක්කෙහි කියුක්පියු (Kyaukpyu) හා චීනය සම්බන්ධ කරන දුම්රිය මාර්ග පිළිබඳ ගිවිසුම් අත්සන් කළ අතර එහි ගැඹුරු මුහුදේ වරායක් ඉදිකිරීම පිළිබඳ ගිවිසුමක් ඇති විය.



*(අවුන් සාන් සු කී හා චීන ජනාධිපති ෂී ජින් පින්ග් හමුවීම)*

තවද චීන දේශ සීමාවේ විශේෂ ආර්ථික කලාපයක් සඳහා වන ගිවිසුම් අත්සන් කළ අතර මියන්මාරයේ විශාලතම නගරයේ සැලසුම් සහගත නව කාර්මික වැඩසටහන වන නිව් යැන්ගොන් (New Yanggon) නගරය පිළිබද චීන රජය සතු ඉදිකිරීමේ සමාගමක් වන සී.සී.සී.සී (China Communication Construction Company) විසින් ගොඩනැගිලි යෝජනා කර ඇත.

චීනය මියන්මාරයට අත්‍යාවශ්‍ය සගයෙකු බව ඔප්පු කර ඇති අතර එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ සිය ආසනය භාවිත කරමින් එහි ආර්ථික අවශ්‍යතා සපුරාලන බැවින් සමහර ජාත්‍යන්තර වාරනයන්ගෙන් රට ආරක්ෂා කරගනී.

1997 දී මියන්මාරය, අග්නිදිග ආසියානු ජාතීන් දහදෙනෙකුගේ සංගමය ආසියාන් (ASEAN) සංවිධානයේ සාමාජිකත්වය ගත් අතර එහි හතලිස්නමවන විදේශ අමාත්‍යවරුන්ගේ රැස්වීමට අවුන්සාන් සුකී හා අනෙකුත් විදේශ ඇමතිවරුන් සහභාගි වූ අතර එය ලාඕටියානු (Laoti) අගනුවරවන වියන්ටේන්හි (Vientiane) 2016 දී පැවැත්විය. ලාඕ අගමැති තොන්ලූන්

සිසොලිත් (Thongloun Sisoulith) විසින් විදේශ ඇමතිවරුන් පිළිගත් අතර සාමාජික රටවල් සහ හවුල්කරුවන් අතර අවංක හා ඵලදායී සාකච්ඡා සඳහා කැඳවුම් කල ඔහු කලාපයේ සහ ලෝකයේ සාමය, ස්ථාවරත්වය හා සමෘද්ධිය පවත්වාගෙන යාමට සහ ප්‍රවර්ධනය කිරීමට සාකච්ඡා කළේය. අන්තවාදය හා ත්‍රස්තවාදය, ස්වභාවික විපත් හා දේශගුණික විපර්යාස දකුණු චීන මුහුද සම්බන්ධ ගැටලු මිනිස් ජාවාරම මෙන්ම මෑතකාලීන බ්‍රෙක්සිට් (Brexit) ඇතුලු ආර්ථික සංවර්ධනය මෙන්ම සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ආරක්ෂක අභියෝග රාශියක්ද මෙහිදී සාකච්ඡාවට බඳුන්විය.

වාර්ෂික රැස්වීමෙන් අනතුරුව සු කී මිකොන් ගංගා (Mekong-Ganga) සහායෝගීතා රැස්වීමට සහභාගී වූ අතර සංචාරක අංශය, අධ්‍යාපනය ප්‍රවාහන හා සංස්කෘතික යන අංශවල සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදි.

හයවන මිකොං- කොරියා (Mekong-Korea) රැස්වීමටද අවුන්සාන් සුකී සහභාගී වූ අතර මිකොං- කොරියා සහයෝගීතාවයේ ප්‍රගතිය හා අනාගත වැඩසටහන් පිළිබඳව එහිදී සාකච්ඡා කරනු ලැබීය. තායිලන්තය සමඟ වන සබඳතා දෙස බැලීමේදී සුකී වසර විසිහතරකට පසු කළ පළමු විදේශ සංචාරය ලෙස තායිලන්තයට ගියාය. බැංකොක් (Bangkok) ගුවන්තොටුපලේදී මාද්‍යවේදීන් හා ආධාරකරුවන් විසින් ඇයට සුබ පතනු ලැබීය. දින පහක සංචාරයේදී ඇය තායිලන්ත අගමැති හමු වූ අතර නැගෙනහිර ආසියාව පිළිබද ලෝක ආර්ථික සමුළුවට සහභාගි විය.

2016 දී බිම්ස්ටෙක් (BIMSTEC) සමුළුවට සහභාගි වීම සදහා සු කී, ඉන්දියාවට ගියා ය. චීනය සමග ඇති උපාය මාර්ගික සබඳතා යලි සමතුලිත කිරීමට බුරුමය ඉන්දියාව නැවත සම්බන්ධ කරගනු ඇතැයි සිතිය හැක. ඇය ඉන්දියාවට අමුත්තියක් නොවන අතර ඇයගේ මව 1960 දී ඉන්දියාවේ තානාපතිනිය ලෙස ද කටයුතු කෙරීය. 2016 අගෝස්තු මාසයේ දී ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය සුශ්මා ස්වරාජ් (Sushma Swaraj) බුරුමයට ගොස් රාජ්‍ය උපදේශක හමුවිය. එම වර්ෂයේම සිව්දින නිල සංචාරයක් සඳහා බුරුම ජනාධිපති ඉන්දියාවට ගියත් ඔවුන්ට අවශ්‍යවූයේ සුකී සමඟ සංවාදයක් ඇති කර ගැනීමට බව පැහැදිලි විය.

බුරුමය ඉන්දියාවේ ඊසාන දිග ප්‍රාන්ත සමඟ කි.මී 1600 ක දේශසීමාවක් බෙදාගෙන ඇති අතර එබැවින් ජනවාර්ගික හා කැරලිකාර අර්බුද හටගෙන ඇත. සුකී එම අර්බුද පිළිබඳව සාකච්ඡා කරනු ලැබීය. ඉන්දියාව බුරුමයෙන් ඉන්ධන සහ ගෑස් ආනයනය කෙරෙහි සැලකිල්ලක් දැක්වූ අතර මෝදිගේ නැගෙනහිර ප්‍රතිපත්තියේදී සුකී ගේ ඉන්දියානු සංචරය වැදගත්කමක් ගනී.

මේ අනුව සුකී කාලාපීය රටවල් කෙරෙහි සමබර සම්බන්ධයක් පවත්වාගෙන යනු ලබන බවත් ඇමරිකාව හා චීනය අතර උපායමාර්ගික සබඳතාවයේ වැදගත් ක්‍රීඩකයෙකු ලෙස කටයුතු කරන බව පෙනේ.

මීට අමතරව ජර්මනිය, ප්‍රංශය, හවායි, චෙක්, දකුණු කොරියාව, ජපානය, පෝලන්තය, බෙල්ජියම, හංගේරියාව ඇතුලු රටවල් වල නිල සංචාරයන් සඳහා සහභාගී වී ඇත.

මෑතක දී අවුන්සාන් සුකී කළ විදේශ සංචාර සහ එම විදේශ සංචාර වල දී ජාත්‍යන්තර ප්‍රජාවගෙන් ඇය ලද අතිමහත් ගෞරවය බටහිර රටවල් බුරුමය සමඟ ඇති සබඳතාවලට හිතකර අන්දමින් බලපා ඇත. මේ අනුව ජාත්‍යන්තර ආයෝජකයින්ට බුරුමයේ ආයෝජන සඳහා හිතකර අන්දමින් බලපා ඇති අතර ආයෝජන වැඩිවෙමින් පවතී.

මියන්මාරයේ රොහින්ග්‍යා (Rohingya) මුස්ලිම් ජාතිකයන් පිළිබඳ අර්බුදය දීර්ඝ කාලයක සිට පැවත එන්නකි. රොහින්ග්‍යා ජනයා යනු රකීන් (Rakhine) ප්‍රාන්තයේ ජීවත්වන සුළු ජාතික ජනකොටසක් වන අතර ඔවුන් මියන්මාරයේ පුරවැසියන් ලෙස පිළිගැනීමට එරට රජය පිළිගැනීමට අකමැති නිසා, මැලේසියාව, බංගලාදේශය, ඉන්දුනීසියාව වැනි රටවලට පලා යන්නට විය. එම අර්බුදයේ සුවිශේෂී තත්වයක් වන්නේ මියන්මාරය බෞද්ධ බහුතරයකින් යුත් රාජ්‍යක් වීමත් සුළුතර මුස්ලිම්වරුන් සම්බන්ධව ඇතිවුන අර්බුදය ආගම්වාදී හෝ වර්ගවාදී මුහුණුවරකින් ඉස්මතු වීමත් ය.

දීර්ඝ කාලයක සිට පැවත එන මෙම අර්බුදය පිළිබඳව සුකී අධීක්ෂණය කළ අතර "අපගේ ඉලක්කය විය යුත්තේ අවතැන් වූවන් හා සෑම වැසියන්ටම නිදහසේ සහ සාමයෙන් ජීවත් වීමට හැකියාව ඇති බව" ඇය ප්‍රකාශ කරනු

ලැබුවා ය. එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර අධිකරණයේ දී මියන්මාරයට එරෙහි ජන සංහාරක නඩුවේදී රටේ නායකයා වන සුකී හට තම රටේ වාර්තාව ආරක්ෂා කිරීමට අවස්ථාව ලැබිණි. එම නඩුව රොහින්ග්‍යා ජනවාර්ගික සුළුතරයට එරෙහිව මියන්මාරය ගෙන ඇති ක්‍රියාමාර්ග එනම් වාර්ථාකරන ලද අවිචාරවත් ඝාතන, සමූහ දූෂණ, වදහිංසා පැමිණවීම, ගම්මාන ගිනිතැබීම සහා 750 000 පමණ අවතැන්වීම වැනි ජන සංහාරයන් චෝදනා විනිශ්චය කිරීම සඳහා රටේ අධිකරණ පද්ධතියට විශේෂයෙන් ම එහි උසාවියට ඉඩදෙන ලෙස අවුන්සාන් සුකී අධිකරණයෙන් ඉල්ලා සිටියා ය.

"මියන්මාරය වැනි ද්‍රව්‍යමය වශයෙන් අඩුසම්පත් ඇති රටවල් සඳහා ලෝක අධිකරණය ජාත්‍යන්තර යුකිතියේ වැදගත් රැකවරණයකි". "ගැම්බියාව විසින් රකීම් ප්‍රාන්තයේ තත්ත්වය පිළිබඳව නොමගයවන සුළු චිත්‍රයක් අධිකරණයට ඉදිරිපත් කරතිබේ." ජාත්‍යන්තර අධිකරණය හමුවේ මෙසේ කරුණු දක්වමින් ඇය මියන්මාරයට එරෙහි සියලු චෝදනා ප්‍රතික්ෂේප කළාය.

## ගත හැකි ආදර්ශ

අවුන් සාන් සුකී ලොව කැපී පෙනෙන කාන්තා නායකත්වයක් ලෙස හැඳින්විය හැකිය. ඇය සතු ඍජු නායකත්ව ගුණාංග දැඩි අධිෂ්ඨානශීලී බව ශක්තිමත් පෞර්ෂත්වය ආදී ගුණාංග ඇයගේ ප්‍රතිරූපය ගොඩ නැංවීමෙහිලා වැදගත් කාර්යයක් ඉටු කොට තිබේ. තම පියාගේ අභාවයෙන් පසුව මවට හිමි වූ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරී තනතුරත් සමග ඇය ඉන්දියාවට පියාසර කළාය. ඉන්දියාවේ සහ එංගලන්තයේ අධ්‍යාපනය ලැබූ ඇයට විවිධ රටවල් පාලන ක්‍රමයන් පිළිබඳව අධ්‍යයනය කිරීමට අවස්ථාව හිමි විය. මියන්මාරයේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් බිහි කිරීම පහසු කටයුත්තක් නොවීය. ඇයගේ ආගමනය එවක පැවති හමුදා පාලනය තිගැස්මකට ලක් කිරීමට සමත් විය. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පිළිබඳව බුරුම ජනතාව අවදි කිරීමට ඇයට හැකි විය.

1990 මහමැතිවරණයට පෙර නිවාස අඩස්සියට ඇය පත් වුවද ප්‍රජාතන්ත්‍රවාදී මියන්මාර රාජ්‍යයක් බිහි කරලීමේ අරමුණ කිසිවිටෙකත් අත් නොහැරියාය. එවකට පැවති හමුදා පාලකයන් විසින් රට හැර යන්නේ නම් නිදහස ලබා දෙන

බව පවසා සිටියත් එය ප්‍රතික්ෂේප කර තම අරමුණ අත් නොහැරියා ය. ඇය තුළ වූ දැඩි අධිෂ්ඨානශීලී බව පෙන්වූ කදිම නිදසුනක් ලෙස එය දැක්විය හැකිය.

එමෙන්ම මහ මැතිවරණයෙන් ඇයගේ පක්ෂය වු ප්‍රජාතන්ත්‍රවාදී ජාතික ලීගය ජයග්‍රහණය හිමි කරගත්තද, එම ප්‍රතිඵලය අහෝසි කර දැමීමට එවක පැවති මිලිටරි ජුන්ටාව කටයුතු කරන ලදී. 1991 සඳහා නොබෙල් සාම ත්‍යාගය අවුන් සාන් සූ කී වෙත පිරිනැමීමේදී, නෝර්වීජියානු නොබෙල් කමිටුව මෙම කාන්තාවගේ නොවරදින උත්සාහය වෙනුවෙන් ඇයට ගෞරව දැක්වීමටත්, ප්‍රජාතන්ත්‍රවාදය ළඟා කර ගැනීමට උත්සාහ කරන ලොව පුරා වෙසෙන බොහෝ මිනිසුන්ට තම සහයෝගය පෙන්වීමටත් අපේක්ෂා කර තිබූහ.

අවසානයේදී ඇයට තම අරමුණ මුදුන් පමුණුවා ගැනීමට හැකි විය. සිය ස්වාමියාගේ පුරවැසිභාවය හේතුවෙන් ඇයට ජනාධිපති ධූරය හිමි නොවූව ද රාජ්‍ය උපදේශිකාව යන තනතුර හිමි විය.  රොහින්ග්‍යා ගැටලුවේ දී තම රට වෙනුවෙන් ජාත්‍යන්තර අධිකරණය ඉදිරියේ නොබිය ව කරුණු දැක්වූ ඇය තුළින් පෙන් වූයේ ඇයගේ ශක්තිමත් පෞරුෂත්වයයි. කාන්තාවක් ලෙස පවතින සීමා මායිම් බිඳ දමා කටයුතු කරන ආකාරය ලොව සියලු දෙනාටම විශේෂයෙන් කාන්තාවන්ට ඉතා වැදගත් ආදර්ශ ලබා දෙයි.

## සාරාංශය

අවුන් සාන් සු කී එදා මෙදා තුර බිහි වූ කාන්තා පෞරුෂත්ව අතරින් තවත් එක් විශිෂ්ට ගණයේ නායකත්වයක් ලෙස සැලකිය හැකිය. සාම්ප්‍රදායික ආසියානු කලාපය තුළ බිහි වූ සීමිත විශිෂ්ට කාන්තා නායකත්වයන් අතරට ඇයගේ නාමය ද මේ වනවිට එක් ව ඇත.

කුඩා කල සිටම ඇය විවිධාකාර දුක් කම්කටොලුවලට මුහුණ පෑ අයෙකි. කුමන්ත්‍රණයකින් තම පියා ඝාතනය කිරීමෙන් පසුව ඇයගේ මව පදිංචිය වෙනස් කරන ලදි. ඉන් පසුව ඇයගේ මවට හිමි වූ රාජ්‍ය තාන්ත්‍රික තනතුර හේතුවෙන් ඇයට තම මව සමඟ ඉන්දියාවට මෙන්ම නේපාලය වෙත යාමට සිදු විය. එහිදී ඇයට තම ජීවිතයට නව අත්දැකීම් ලබා ගැනීමට හැකි විය.

සු කී තම මූලික සහ උසස් අධ්‍යාපනය ලබා ගත්තේ ඉන්දියාවේ දීය. එතැනින් නොනැවතුණු ඇය, එංගලන්තය වෙත ගොස් තවදුරටත් අධ්‍යාපනයේ නියැලුණි ඇය මූලිකව දේශපාලන විද්‍යාව, දර්ශනය වැනි විෂයන් හදාරන ලදි.එක් එක් රටවල ආණ්ඩුක්‍රමයන් සහ පාලන ක්‍රමයන් පිළිබඳව ඇය තම දැනුම වර්ධනය කර ගැනීමෙන් මියන්මාරයට අවශ්‍ය කරන පාලන ක්‍රමය පිළිබඳව අවබෝධයක් ලබා ගත්තාය. ඉන් පසුව නැවතත් මියන්මාරය වෙත පැමිණි ඇය තම අරමුණ කරා යාමට අවශ්‍ය මාර්ගය නිර්මාණය ඩීකර ගැනීම සඳහා අඩිතාලම සකසා ගත්තාය. 8888 අවදිවීම ලෙස ඇය තම අඩිතාලම නිර්මාණය කරගත් අතර පැවති මිලිටරි ජුන්ටාව (Military Junta) දැඩි ලෙස ප්‍රතික්ෂේප කළ හිටපු යුධ හමුදා බලධාරීන් සමග එක්ව ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ජාතික ලීගය (National League for Democracy) පිහිටවූවා ය. මෙම ජාතික ලීගය 1990 මහමැතිවරණය සඳහා ඉදිරිපත් වූ අතර මැතිවරණයට මාස කිහිපයකට පෙර සිට සු කී ව නිවාස අඩස්සියට පත් විය. වසර 15කට ආසන්න කාලයක් ඇය නිවාස අඩස්සියේ සිටි අතර එම කාලය අතරතුර ඇයට නොබෙල් සාම ත්‍යාගය ද හිමි විය.

1996 දී ඇය සහ තවත් ප්‍රජාතන්ත්‍රවාදී නායකයන් යුඑස්පඩී (USPD) හි සාමාජිකයන්ගේ ප්‍රහාරයකට ලක් විය. එයට සාධාරණයක් බලාපොරොත්තුවෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කළ ද එවක පැවති රජය විසින් එයට විරුද්ධව නිසි ක්‍රියාමාර්ගයක් නොගැනීය. කෙසේ හෝ ඇය තම අරමුණ වූ ප්‍රජාතන්ත්‍රවාදී මියන්මාරය බිහි කරලීමට සමත් විය. රොහින්ග්‍යා සරණාගතයන් පිළිබඳ ගැටලුවේ දී ජාත්‍යන්තරයෙන් එල්ල වූ චෝදනාවන්ට සාර්ථකව මුහුණ දුන්නාය.

ලෝක දේශපාලනය කෙරෙහි කාන්තාවකට සිදු කළ හැකි බලපෑම පිළිබඳ ව ඇය තම ඍජු නායකත්ව ගුණාංග තුළින් පෙන්වා දී ඇත. කාන්තාවක් සතු ශක්තිය ධෛර්යය ආදී ගුණාංග ද ඇගේ ජීවිතය අධ්‍යයනය තුළින් දැක ගත හැකිය තොටිල්ල පදවන දෑතකින් රටක් පාලනය කළ හැකි බව ඇය පෙන්නුම් කර ඇති බව අපට අවබෝධ කර ගත හැක.

## මූලාශ්‍ර නාමාවලිය


Steinberg, David. (2010). Aung San Suu Kyi and U.S. Policy toward Burma/Myanmar. Journal of Current Southeast Asian Affairs.

Lubina, Michal. (2015). Pani Birmy. Biografia polityczna Aung San Suu Kyi (Aung San Suu Kyi of Burma. A Political Biography).

Victor, Barbara. The Lady: Aung San Suu Kyi; Nobel Laureate and Burma's Prisoner. Boston: Faber and Faber, 1998.

Win, Kanbawza. Daw Aung San Suu Kyi, The Nobel Laureate: A Burmese Perspective. Bankok: CPDSK Publications, 1992.

Chakraborty, Basanti. Aung San Suu Kyi.

Kipgen, Nehginpao. Myanmar: A Political History. (Oxford Scholarship Online, 2016).

Akins, Harrison. "The Two Faces of Demcoratization in Myanmar. A Case Study of the Rohingya and Burmese Nationalism." Journal of Muslim Minority Affairs 38:2 (2018): 229-245.

# බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාළ



**කණ්ඩායම් සාමාජිකයන් :**

- ඒ. පී. ජී. ඩී. සී. අමියන්ගොඩ
- එච්. එම්. එස්. චතුරිකා
- කේ. ඩී. ඒ. සිල්වා
- එන්. සී. අබේවික්‍රම
- එන්. ඩී. අබේවික්‍රම

# හැඳින්වීම

නේපාලය යනු දකුණු ආසියානු කලාපය තුළ පවතින සුවිශේෂී රාජ්‍යයක් බව ප්‍රකට කරුණකි. මිලියන 26.4 ක් වන ජනගහනයක් සහිත නේපාලය තුළ ෆෙඩරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් දැකගත හැකිය. නේපාලය සමාජ සංස්කෘතික පමණක් නොව දේශපාලනික කාරණා වලදී ද විශිෂ්ට ඉතිහාසයක් තුළින් සිය ගමන් මග ගොඩනගා ගත් රාජ්‍යයකි. මන්දයත් නේපාල දේශපාලනයේ ප්‍රතාපවත් චරිත රැසක් එම ගමන් මගෙහි තම නායකත්වය සිය රට වෙනුවෙන් ලබා දුන් නිසාවෙනි. ඒ අතරින් නේපාල දේශපාලනය තුළ මෙන්ම සාහිත්‍ය තුළ ද කැපීපෙනෙන සුවිශේෂී චරිතයක් ලෙස බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල චරිතය පෙන්වා දිය හැක. නේපාලයේ 22වන අග්‍රාමාත්‍යවරයා මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදීව තේරී පත් වූ පළමු නේපාල අග්‍රාමාත්‍යවරයා ලෙසින් ද ඉතිහාසයට එක්වන මෙම සුවිශේෂී චරිතය දකුණු අසියානු දේශපාලනය තුළ කාගේත් අවධානය දිනාගත්තේ ය.

බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල සමාජ ප්‍රජාතන්ත්‍රවාදී අදහස් දැරූ චරිතයක් නිසාම ඔහුට අවශ්‍ය වූයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෙකු ලෙස නේපාලයේ සෑම පුරවැසියෙකුටම එකග විය හැකි දේශපාලන ක්‍රමවේදයක් සොයා යෑමයි. නේපාලය වැනි දුප්පත් රටක පුද්ගල නිදහස සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සහතික කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බව බිෂ්වේෂ්වර් විසින් දරණ ලද මතවාදයයි. ප්‍රජාතන්ත්‍රවාදය යනු නේපාලයෙ සංවර්ධනයට විසඳුම බව ඔහු තරයේ ප්‍රකාශ කරනු ලැබුවේ මේ නිසාම ය. ඔහුගේ විශිෂ්ට නායකත්වය හමුවේ ගත් සෘජු තීරණ නේපාල දේශපාලනයේ ගමන් මග නිවැරදි මාවතකට යොමු කළ අයුරු ප්‍රශංසනීය ය.

මෙහිදී අප සාකච්ඡාවට යොමු කරනු ලබන්නේ ඒ සුවිශිෂ්ට නායකයාගේ ජීවන වෘත්තාන්තය වෙතයි. එහිදී ඔහුගේ ළමා කාලය, අධ්‍යාපනික පසුබිම හා දේශපාලනයට පිවිසීම පිළිබඳ සාකච්ඡා කරනු ලබයි. ප්‍රබල සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෙකු වූ කොයිරාල දේශපාලන දිවිය හා ලේඛන කලාව තුළ දී ඔහු ලැබූ සාර්ථකත්වය හා ඔහුගේ සේවාව පිළිබඳ මෙහිදී අවධානය යොමු කරනු ලබයි. තව ද කොයිරාලගේ සුවිශේෂී විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ පුළුල්ව

මෙහිදී සාකච්ඡා කරනු ලබන අතර අවසාන වශයෙන් ඔහුගේ චරිතය තුළින් ගත හැකි ආදර්ශ පිළිබඳ අවධානය යොමු කෙරේ.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශලනයට පිවිසීම

ආසියානු කලාපයේ දේශපාලන ඉතිහාසය දෙස බලන විට සුවිශේෂී පුද්ගල චරිත රැසක් හඳුනාගත හැකි ය. ඒ අනුව බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල (Bishweshwar Prasad Koirala) යනු එවැනි සුවිශේෂී පුද්ගල චරිතයක් ලෙස හැඳින්විය හැක. ඔහු නේපාලයේ පළමු ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමයෙන් තෝරා ගත් 22වන නේපාල අගමැතිවරයා ය. ඔහු නේපාලයේ පමණක් නොව ආසියාවෙම ජන හදවත් දිනා ගත් සුවිශේෂ දේශපාලන නායකයෙක් ලෙස අවිවාදයෙන් සඳහන් කළ හැක.

නේපාලයේ මෙම කොයිරාල පරපුර සුවිශේෂ දේශපාලන පසුබිමක් සහිත පරපුරක් ලෙස හැඳින්විය හැක. මෙම කොයිරාල පවුල නේපාලයේ පළමු ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ව්‍යාපාරයේ ක්‍රියාකාරී සාමාජිකයන් ලෙස ක්‍රියා කළේ ය. ඒ අතරින් මහත්මා ගාන්ධිගේ අනුගාමිකයෙක් වූ ක්‍රිෂ්ණා ප්‍රසාද් කොයිරාල (Krishna Prasad Koirala) ප්‍රබල අධිරාජ්‍ය විරෝධී අදහස් දැරූ දේශපාලන ක්‍රියාකාරකයෙක් විය. ඔහු ප්‍රබල සමාජ ක්‍රියාකාරකයෙක් ලෙස ද නමක් දිනාගත් පුද්ගල චරිතයක් විය. ඔහුගෙන් ආරම්භ වූ මෙම කොයිරාල පවුල නේපාලයේ අධිරාජ්‍ය විරෝධී දේශපාලන ව්‍යාපාරයේ ක්‍රියාකාරරී සාමාජිකයන් ලෙස ක්‍රියා කළේ ය. ක්‍රිෂ්ණා ප්‍රසාද් කොයිරාලගේ දෙවන පුත්‍රයා වූයේ බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල ය.

ඔහු 1914 සැප්තැම්බර් 8 වන දින ඉන්දියාවේ වරනාසි (Varanasi) හි උපත ලැබුවේ ය. කුඩාකල සිටම සුවිශේෂි දක්ෂතා පෙන්නුම් කල බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල වෙනස් අදහස් දැරූ චරිතයක් විය. බිෂ්වේෂ්වර් පවුලේ මෙම අධිරාජ්‍ය විරෝධී ක්‍රියාකලාපය නිසා 1971 දී අධිරාජ්‍යයින් ඔවුන් ඉන්දියාවෙන් පිටුවහල් කරන ලදී. බිෂ්වේෂ්වර් පවුල නැවතත් ඉන්දියාවට පැමිණෙන්නේ 1930 දීය. ඔහු කුඩාකල සිටම ලේඛන කලාවට ඇලුම් කළ අයෙක් විය. ඔහු කුඩාකල

හැදී වැඩුනේ බරණැස් (Banaras) නුවර ය. වයස අවුරුදු 14 වන තෙක් ඔහු අධ්‍යාපනය හදාරනු ලැබුවේ තම පියා විසින් පිහිටුවන ලද පාසලකය. ඉන්පසු ඔහු නගරයේ හරිස්චන්ද්‍ර පාසලට (Harishchandra School) ඇතුළත් වී ඉදිරි අධ්‍යාපන කටයුතු සිදුකරනු ලැබුවේ ය. ඔහු ලේඛන කලාවට දක්ෂතා දැක් වූ චරිතයක් නිසාම 9 වන ශ්‍රේණියේ පටන්ම ඔහු තම ලේඛන කටයුතු ආරම්භ කරන ලදී.



*(බී.පී.කොයිරාල 1950 දශකයේ දී)*

ඔහු පියාගේ අඩිපාරේම යමින් කුඩාකල සිටම අධිරාජ්‍ය විරෝධී අදහස් දැරූ පුද්ගල චරිතයක් විය. එම නිසාම ඔහුට අවුරුදු 16 වන විට 1930 දී ඔහුගේ සහෝදරයා වූ මැට්‍රිකා ප්‍රසාද් කොයිරාල (Matrika Prasad Koirala) සමග මාස 3ක කාලයක් සිර දඬුවම් විඳීමට සිදු වූයේ ත්‍රස්තවාදීන් සමග සම්බන්ධතා පැවැත් වූ බවට බ්‍රිතාන්‍ය රාජ්‍ය චෝදනා එල්ල කළ බැවිනි. මේ හේතුව මුල් කරගනිමින් බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල සිය පියාගේ කැමැත්ත පරිදි කල්කටා හි ස්කොට්ෂ් පල්ලියෙන් (Scottish Church College in Calcutta) අධ්‍යාපන කටයුතු නැවත ආරම්භ කරනු ලැබුවේ ය. නමුත් ඔහු 1930 අග වනවිට පාසලෙන් ඉවත් වී නැවත බරණැස් වෙත ගියේ ය. කෙසේ වුවත් 1932 වන විට ඔහු අධ්‍යාපනය මධ්‍යස්ථ මට්ටමට අවසන් කළේ ය. නමුත් මෙම තත්ත්වයට ඔහුගේ පියාගේ එතරම් කැමැත්තක් නොවී ය.

පියාගේ දැඩි ඉල්ලීම පරිදි බිෂ්වේෂ්වර් ප්‍රසාද් නැවත වරක් ස්කොට්ෂ් පල්ලියේ විද්‍යාලයෙන් අධ්‍යාපන කටයුතු ආරම්භ කරනු ලැබුවේ ය. නමුත් එය ද ඉතා කෙටි කලකට සීමා කරමින් ඔහු  නැවත වරක් එම විද්‍යාලයෙන් ඉවත් විය. ඉන් පසු ඔහු බරණැස් හි හින්දු විශ්වවිද්‍යාලයට (Banaras Hindu University)

ඇතුළත් වී 1934 දී ආර්ථික විද්‍යාව හා දේශපාලන විද්‍යාව පිළිබඳ උපාධිය සම්පූර්ණ කළේ ය. මෙය ඔහුගේ අධ්‍යාපන දිවියේ විශිෂ්ට කඩඉමක් විය. තවද ඔහු 1937 දී කල්කටා විශ්වවිද්‍යාලයෙන් (University of Calcutta) නීති උපාධිය ලබා ගත්තේ ය. ඉන් පසු ඔහු වසර කිහිපයක කාලයක්ම ඒ පිළිබඳ පුහුණුවීමක් ද ලබා  ගන්නා ලදී. මෙය ඔහුගේ දේශපාලන දිවියට ඉතා හොඳ අඩිතාලමක් වූ බව නොරහසකි. බිෂ්වේෂ්වර් යුග දිවියට එළඹුණේ සුසිලා කොයිරාල (Sushila Koirala) සමඟය. ඔවුන්ට ප්‍රකාශ් කොයිරාල (Prakash Koirala), හර්ෂ් කොයිරාල(Harsh Koirala) හා සශන්ක කොයිරාල (Sashanka Koirala) නමින් පුත්‍රයන් තිදෙනෙක් වූ අතර චේතනා කොයිරාල (Chetana Koirala) නමින් දියණියක් ද විය.

බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාලගේ අධ්‍යාපන දිවිය පිළිබඳ විමසා බැලීමේදී ඔහුගේ ලේඛන කුසලතාවය පිළිබඳ යමක් සඳහන් කළ යුතුමය. බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල නේපාල සාහිත්‍යයේ ඉතිහාසයේ රන් අකුරින් ලියවෙන පුද්ගල නාමයකි. මන්දයත් ඔහු අතින් රචනා වූ කෙටිකතා නවකතා පද්‍ය රචනා රැසක් නේපාල සාහිත්‍ය තවත් පෝෂණය කළ හෙයිනි. ඔහුගේ පළමු නේපාල කෙටිකතාව වන්නේ චන්ද්‍රාබදන් (Chandrabadan) ය. එය 1935 දී නේපාල සාහිත්‍ය සඟරාවක් හරහා ප්‍රකාශයට පත් විය. ඔහු හදරනු ලැබූ විෂය පථයන් ලෙස ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, තර්කනය, සාහිත්‍ය සහ නීතිය යන විෂයන් දැක්විය හැක. එමෙන්ම ඔහුට ඉංග්‍රීසි, ප්‍රංශ, ජර්මන්, රුසියානු, හින්දි, බෙංගාලි සහ නේපාල යන භාෂා පිළිබඳ හසල දැනුමක් ද විය. ඒ නිසාම එවැනි භාෂාවලින් රචිත සාහිත්‍ය නිර්මාණ නිතර ඇසුරු කළ අයෙක් විය.

මෙම ඉහළ අධ්‍යාපනික පසුබිමත් සහජයෙන් හිමි කලාත්මක හැකියාවත් එක්ව නිර්මාණය වූ ඔහුගේ සාහිත්‍ය නිර්මාණයන් ජීවිතය පිළිබඳ කලාත්මක හා තර්කානුකූල දැක්මක් හිමිවීමට හේතු විය. ඔහුගේ ඇතැම් සාහිත්‍ය නිර්මාණයන් තුළ ෆ්‍රොයිඩියානු මනෝවිශ්ලේෂණවාදයේ (Freudian Psychoanalisis) සංකල්පයන් අපූරුවට ගැබ් වී තිබූ බව බෝහෝ සාහිත්‍ය විශ්ලේෂකයන්ගේ මතය යි. කෙසේ වුවත් ඔහුගේ සාහිත්‍ය නිර්මාණයන් සම්ප්‍රදායික නොවන ප්‍රවේශයකින් පාඨකයන්ගේ හෘද සාක්ෂියට ආමන්ත්‍රණය කළ බව සැවොම

පිළිගන්නා කරුණකි. කෙසේ වුවත් ඔහු මෙවැනි අපූර්ව නිර්මාණකරුවෙකු වීමට සහජ කුසලතාවය මෙන් ම ඔහුගේ අධ්‍යාපන පසුබිම ද විශාල පිටිවහලක් වූ බව නොරහසකි.

බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල සමාජ ප්‍රජාතන්ත්‍රවාදී අදහස් දැරූ චරිතයක් විය. ඒ නිසාම ඔහුට අවශ්‍ය වූයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෙකු ලෙස නේපාලයේ සෑම පුරවැසියෙකුටම එකඟ විය හැකි දේශපාලන ක්‍රමවේදයක් සොයා යෑමයි. දේශපාලන නිදහස සහ ජනතාවට සමාන ආර්ථික අවස්ථා සහතික කළ හැක්කේ සමාජවාදයට පමණක් බව ඔහු විශ්වාස කළේ ය. සමාජවාදය අනාගත රැල්ලක් වන බව බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල ප්‍රකාශ කර සිටියේ ය. මෙවැනි දේශපාලනික අදහස් දැරූ බිෂ්වේෂ්වර් ප්‍රසාද් ඔහු ශිෂ්‍යයෙක්ව සිටි අවධියේම ඉන්දියානු ජාතික ව්‍යාපාරයට සම්බන්ධ විය. එමෙන්ම 1934 දී ඔහු ඉන්දීය ජාතික කොංග්‍රසයට සම්බන්ධ විය. ඉන් පසු දෙවන ලෝක යුධ සමයේ දී බ්‍රිතාන්‍යයන් විසින් බිෂ්වේෂ්වර් ප්‍රසාද් වසර 2ක් (1942-1944) ධන්බාද් (Dhanbad) හි රඳවා තබන ලදී. ඉන්දියාව නිදහස ලබා ගැනීමට ආසන්නව තිබියදී බිෂ්වේෂ්වර් නිදහස ලැබූ අතර ඒ සමග ඔහුට අවශ්‍ය වූයේ නේපාලයට ද වෙනසක් ගෙන ඒමටය. ඒ අනුව 1947 දී ඔහු ඉන්දියාවේ සිට සමාජවාදී නේපාල ජාතික කොංග්‍රසය ආරම්භ කළේ ය.

## නායකත්වය කරා ගිය ගමන් මග

බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල ශිෂ්‍යයෙක්ව සිටින අවධිය තුළදී ම තම දේශපාලන ජීවිතය ආරම්භ කළේ ය. කොයිරාල ශිෂ්‍යයෙක්ව සිටිය දී ඉන්දියානු ජාතික ව්‍යාපාරයට සහභාගී විය. 1934 දී ඔහු ඉන්දීය ජාතික කොංග්‍රසයට බැඳුණි.

1939 දී ඔහු සිය සියලු වැඩකටයුතු ඉන්දියාවේදී අවසන් කර නේපාලය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට තීරණය කළේ ය. ඔහු විසින් 1942 දී ඉන්දියා අරගලය දියත් කිරීමෙන් පසුව, දේවේන්ද්‍ර ප්‍රසාද් සිං (Devendra Prasad Singh) සහ අනෙකුත් මිතුරන් බැලීමට ඉන්දියාවේ හදිසි සංචාරයක යෙදී සිටියදී ඔහු අත්අඩංගුවට ගනු ලැබීය. 1942 සිට 1945 දක්වා

බිෂ්වේෂ්වර් හට සිරගෙදර සිටීමට සිදු වූයේ ය. කෙසේ වෙතත්, නේපාලය ඔහුගේ මනසෙහි ඉහළින්ම සිටි අතර ඔහු නේපාලයේ දේශපාලන පක්ෂයක් පිහිටුවීමට තීරණය කළේ ය. බිෂ්වේෂ්වර් තමාට ඉන්දියානු සමාජවාදීන්ගෙන් වගේම අනෙකුත් නායකයින්ගෙන් ලැබුන සහයෝගය ගැන ප්‍රකාශ කරන අතර ඔහු විසින් 1947 දී බුරුම සංචාරයක් සිදු කළේ ය. එතුළින් බුරුමයේ සිටි සමාජවාදීන්ගේ සහය ලබා ගැනීම අපේක්ෂා කර ඇත. නේපාලයේදී බිෂ්වේෂ්වර් සිරගත කරනු ලබන අතර ඔහු ඒ වන විටත් යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් පසු නොවුණි. එහිදී ගාන්ධි වැනි නායකයන්ගේ මැදිහත් වීම තුළ බිෂ්වේෂ්වර් නිදහස් කිරීමට රානා අගමැතිවරයාට සිදු වුනි. මේ ආකාරයෙන් ඉන්දියානු කොමියුනිස්ට්වාදීන් බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල වෙනුවෙන් වැඩ කළ ද ඔවුන් විසින් ගාන්ධිව හෙළා දැකීම, කොංග්‍රස් පක්ෂයේ අධිරාජ්‍ය විරෝධී අරගල වැනි ක්‍රියාවන් කොයිරාල ඔවුන්ගෙන් වෙන් කළේ ය.

නේපාලයේ අරගලය ආරම්භ වූයේ ගිරිජා ප්‍රසාද් කොයිරාලගේ (Girija Prasad Koirala) නායකත්වයෙන් යුත් බිරත්නගර්හි (Biratnagar) කම්කරු වැඩවර්ජනයකිනි. එහිදී බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල ඇතුළු වැඩවර්ජනයේ නායකයන් 6 දෙනෙකු නේපාල හමුදාව විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර ඔවුන්ව කත්මන්ඩුව වෙත ගෙන යන ලදී. මෙය බොහෝ දෙනෙකුගේ අවධානයට ලක් වූ කාරණාවක් විය. මන්ද ඔවුන්ව කත්මන්ඩුව (Kathmandu) වෙත පාගමනින් රැගෙන ගිය නිසාවෙනි. මෙම ගමනේ දී බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල ජනතාවගේ දුප්පත්කම දුටු අතර එය රට වෙනුවෙන් ඔහුගේ ආර්ථික වැඩපිළිවෙලේ අඩිතාලම සැකසීමට ඉවහල් විය. ඔහු සහ ඔහුගේ සගයන් නේපාලයේ සිරගෙවල්වල අපමණ දුෂ්කරතාවන්ට මුහුණ දුන්නේ ය. මෙම උපවාසය හේතුවෙන් ඔහු අසාධ්‍ය තත්ත්වයේ ද පසු විය.



*(1960 දී අගමැති කොයිරාල සමග ඉන්දීය අගමැති නේරු)*


බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල නායකත්වය කරා ගිය ගමනේ දී ඉතා වැදගත් සංසිද්ධියක් ලෙස 1951 දී සිදු කරනු ලැබූ ආයුධ විප්ලවය පෙන්වාදිය හැක. රානාවරුන් (Rana Dynasty) යනු ඉන්දීය උපමහද්වීපයේ සිටි ක්ෂත්‍රිය රාජවංශයකි. ඔවුන් ක්‍රි.ව. 1846 සිට 1851 දක්වා නේපාලය පාලනය කළේ ය. මෙම විප්ලවය තුළින් එතෙක් නේපාලයේ පැවති අවුරුදු 104ක් පැරණි රානා තන්ත්‍රය පෙරළා දැමීමට හැකි වූ අතර නේපාලයේ දේශපාලන පිබිදීම සම්බන්ධයෙන් ඉතා වැදගත් ආරම්භයක් සනිටුහන් කළ කාරණාවක් ලෙසට ද මෙය පෙන්වා දිය හැක. මෙහි වැදගත්ම ප්‍රතිඵලය වූයේ නේපාලයේ එතෙක් පැවති පරම්පරාගත අගමැති ක්‍රමය අහෝසි කිරීමයි. ඉන්පසුව බිෂ්වේෂ්වර් විසින් නේපාල දේශපාලන ව්‍යුහය සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ අතර එවකට අගමැතිව සිටි මොහාන් ෂම්ෂේවර් (Mohan Shumsher) පලවා හැර බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල ස්වදේශ කටයුතු අමාත්‍ය ධූරයට පත් විය.

නේරු ඇතුළු ඉන්දීය නායකයින්ට නේපාලය තුළ ශක්තිමත් මනසක් ඇති නායකයින්, ස්වාධීන නායකයින් බිහි කිරීමට අවශ්‍ය නොවන බව බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල විශ්වාස කළේ ය. අවිආයුධ සම්බන්ධයෙන් නේරු වෙත ගිය අවස්ථාවේ දී එය තහවුරු විය. ඉන්දියාවේ මේ උදාසීන ආකල්පයන්, මහේන්ද්‍ර රජුගේ අභිමතාර්තයන් හේතුකොටගෙන බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල රජුට මැතිවරණයක් පැවැත්වීමට බල කළ අතර 1959 මහ මැතිවරණයේදී නේපාල කොංග්‍රසය බලයට පත් වූයේ අගමැති ධූරයට පත් වීමෙනි.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කල සේවාව

නේපාලයේ ශ්‍රේෂ්ඨතම දේශපාලන චරිතයක් ලෙස පුළුල් ලෙස සැළකෙන කොයිරාල ප්‍රජාතන්ත්‍රවාදයේ දැඩි ආධාරකරුවෙකි. නේපාලය වැනි දුප්පත් රටක පුද්ගල නිදහස සහ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සහතික කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බව ඔහු තරයේ කියා සිටියේ ය. ''ප්‍රජාතන්ත්‍රවාදය යනු නේපාලයේ සංවර්ධනයට විසඳුමයි'' යැයි ඔහු පැවසුවේ එබැවිනි. කොයිරාල නේපාලයේ වඩාත් ම ප්‍රබුද්ධ දේශපාලන නායකයෙකු ලෙස සැළකෙන අතර ඔහු නේපාල සාහිත්‍යය වඩාත් හොඳින් හදාරන්නෙකු මෙන්ම

කල්පනාකාරි ලේඛකයෙකු වන බව මුළු මහත් ලොවම දක්නා සුවිශේෂී කරුණකි. ඔහුගේ ලේඛන කලාව තුළ කෙටිකතා, නවකතා සහ කාව්‍ය නිර්මාණයන් ද අන්තර්ගත වීම සුවිශේෂී වේ.




*(කොයිරාලගේ හිට්ලර් සහ යුදෙව්වන් කෘතිය)*

ඔහුගේ පළමු කතා සංග්‍රහය ප්‍රකාශයට පත් කරනු ලැබුවේ, ප්‍රේම් චන්ද් (Prem Chand) විසින් සංස්කරණය කරන ලද හින්දි සාහිත්‍ය සඟරාවක් වන හන්සා හි බනරස් (Banaras in Hansa) සඟරාවෙහි ය. ඔහුගේ පළමු නේපාල කෙටිකතාව වන චන්ද්‍රාබදන් (Chandrabadan) 1935 දී නේපාලයේ සාහිත්‍ය සඟරාවක් වන ෂරදාහි (Sharadahi) ප්‍රකාශයට පත් කරන ලදී.

කොයිරාලයන් සිය කෘති තුළින් කාන්තාවන්ගේ චරිතය සහ මනස නිරූපණයට කිරීමට උත්සුක වී ඇත. 1938 දී ඩාර්ජිලිං (Darjilin) හි ප්‍රකාශයට පත්කරන ලද ''කත කුසුම'' (Katha Kusuma) සඳහා කොයිරාලගේ තවත් කතා 04ක් ඇතුළත් විය. සමාජ යථාර්ථවාදියෙකු ලෙස සුවිශේෂී මනෝවිද්‍යාත්මක අවබෝධයක් ඇති නේපාල සාහිත්‍ය ඉතිහාසයේ මානව විද්‍යාව පදනම් කරගත් කතාන්දර හා නවකතා ලියූ පළමු ලේඛකයා ලෙස නේපාල ඉතිහාසය තුළ අභිමානවත් සුප්‍රකට පුද්ගල චරිතයකි.

''වීදුරු'' (Widuru) යන කොයිරාලයන්ගේ කෙටිකතා 16කින් යුත් ග්‍රන්ථය 1949 දී ප්‍රකාශයට පත් කරන ලදී. මෙමඟින් මනාව ප්‍රකට කරනු ලබන්නේ දේශපාලන

නායකයෙකු වුව ද නේපාල සාහිත්‍යයට දායක වූ ශ්‍රේෂ්ඨ සාහිත්‍යධරයෙකු වූ ඔහු මාහැඟි සේවාවක් සිදු කළ බවයි.

කොයිරාලයන් 1950 දී ඉතාමත් කාර්යබහුල වූ අතර ඔහු බොහෝවිට නේපාල දේශපාලන තත්ත්වයන් මාධ්‍ය හමු මඟින් හෙළි දැක්වීය. කෙසේ වෙතත්, අසම්පූර්ණ නවකතාවක් වන හිට්ලර් රා යාහුඩ් (Hitler Ra Yahud) කෘතිය, ඔහු අත්විඳි අත්දැකීමක් ලෙස අපූර්ව අයුරින් පාඨකයාට තිළිණ කිරීමට සමත් විය. කොයිරාලගේ සාහිත්‍ය නිර්මාණ තුළින් 1960 දශකය ඉතා ඵලදායි දශකයක් බවට පත්විය. ඔහු 1960-1968 කාලය තුළ සිරගතව සිටිය ද නවකතා හා කෙටිකතා රාශියක් ලිවීය. ඒවාට ඇතුළත් වන්නේ ටින් ගුටිම් (Tin Gutim ), 1968 නරේන්ද්‍ර ඩයි (Narendra Dai), 1969 සුම්තිමා (Sumnima), 1969 මෝඩියන් (Moodean), 1980 ෂ්වේටා බහිරවි (Shweta Bahirawi), 1983 බාබු අමාරා චෝරා (Bahu Amara Chora), 1989 දී අසම්පූර්ණ ස්වයං චරිතප්‍රදානයක් වන මෙරෝ කත (Mero Katha) සහ තවත් බොහෝමයක් සාහිත්‍ය ග්‍රන්ථ ප්‍රකාශයට පත් නොවූ ග්‍රන්ථ අතර වෙයි.

එසේම කොයිරාලයන් විසින් රචනා කරන ලද බොහෝමයක් දේශපාලන කෘති ඇත. ''රාජතන්ත්‍ර රා ලෝකතන්ත්‍ර'' (Rajatantra ra Lokatantra-1960); ''තිචිකා ජනතා ජගිසාකේ'' (Thichika Janama Jagisake-1969), ''රාස්ට්‍රියාටා නේපාල්කෝ සඳර්බාමා'' (Rastriyata Nepalko Sadarbama-1970), ''ක්‍රාන්තිඃ ඒක් අනිවර්යාටා" (Kranti: Ek Aniwariyata-1970), "පංචායතී ව්‍යවස්ථා ප්‍රජාතන්ත්‍රික් චයිනා" (Panchayati Vyavastha Prajatantrik Chaina -1978), " ප්‍රජාතන්ත්‍ර රා සමාජවාද්'' (Prajatantra ra Samajawadh-1979), සහ "රාස්ට්‍රියා ඒකටා කෝ නිම්ති අහ්වාන්" (Rastriya Ekata Ko Nimthi Ahwan-1980).

කොයිරාලගේ ලේඛන (දේශපාලන හා සාහිත්‍යමය) මෑතක් වන තුරුම තහනම් විය. කොයිරාලගේ ලේඛන සන්තකයේ තබා ගැනීම් චෝදනාව මත නේපාල තරුණයන් වසර ගණනාවක් සිරගතව සිටියහ. නේපාලයේ සුවිශේෂී නායකත්වයක් දැරූ කොයිරාල 1950, 1960 සහ 1970 දශකවල නේපාල දේශපාලනයේ කේන්ද්‍රස්ථානය විය. ඔහුගේ මරණයෙන් පසු බොහෝ කලකට

පසු අද පවා නේපාලයේ ජනතාව සිතන්නේ බහු පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදය යථා තත්ත්වයට පත් කිරීම ඔහුට උපහාරයක් බවයි.

කොයිරාල නේපාලයේ ඉතා වැදගත් සාහිත්‍ය චරිතයකි. එමෙන්ම දේශපාලනයේ දී කොයිරාල සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෙකි. සාහිත්‍යයේ ඔහු ටිම් ගුටිම් (Three turns) නවකතාවට අනුව පැවැත්මක් නිර්මාණය කර ගත් අයෙකි. සම්ප්‍රදායිකත්වයට එරෙහිව කැරලි ගැසූ ඔහුගේ ආරාජිකවාදී ආවේගයන්, තෘප්තිමත් කිරීම සඳහා සිය කෘති රචනාකර ඇති බව ඔහු පැවසීය.

ඉන්දීය නිදහස ලබාදීමත් සමග බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල නේපාලයට වෙනසක් ගෙන ඒමට උත්සහ කළේ ය. 1951 දී බිෂ්වේෂ්වර් සන්නද්ධ අරගලයකට නායකත්වය දුන් අතර එය නේපාලය අවුරුදු 104ක් පැරණි රානා තන්ත්‍රය පෙරළා දමනු ලැබීය. එසේම බිෂ්වේෂ්වර් ස්වදේශ කටයුතු අමාත්‍ය ධූරයේ නව මාසයක් සේවය කරන ලදී. බිෂ්වේෂ්වර් විසින් නේපාල දේශපාලන ව්‍යුහය සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළේ ය. බිෂ්වේෂ්වර් ජාතික සංහිදියාව ගොඩනැගීම සඳහා සුවිශේෂී සේවාවක් ඉටු කල බව පැහැදිලි වේ. යුධ හමුදාවන් සුවිශේෂී ලෙස යොදා ගනිමින් නේපාලය තුළ සාමය ඇති කරලීමට බෙහෙවින් උත්සුක විය.

කොයිරාලයන්ගේ සුවිශේෂීභාවය වනුයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෙකු ලෙස ඔහු නේපාලයේ සෑම පුරවැසියෙකුටම එකඟ විය හැකි දේශපාලන ක්‍රමයක් නිර්මාණය කිරීමයි. දේශපාලන නායකයෙකු ලෙස කොයිරාල තම රට තුළ බහු පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදයක් ස්ථාපිත කිරීම සඳහා සිය ජීවිත කාලය පුරාම අරගල කළේ ය. සම්ප්‍රදායික බලවේග, එවැනි උත්සහයන් එරෙහි වීම තුළ ඒවා තව තවත් ශක්තිමත් වීම, එය සිදු කිරීම බී. පී. කොයිරාලයන්ට ඉතා අසීරු විය. ඔහුගේ දේශපාලන මෙහෙවර ඉටු කිරීමට, සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෙකු ලෙස කොයිරාල කොමියුනිස්ට්වාදීන් සමඟ වෙනසකට පරිවර්තනය වන ලදී. ඔහු බොහෝවිට පැවසූ පරිදි මිනිසාට පාන්වලින් පමණක් ජීවත් විය නොහැකි ය. අසීමිත පරිභෝජනවාදය දුරාචාරය බවත්, ලෝකයේ සම්පත් භයානක ලෙස සූරාකෑම කෙටිකාලීන හා යථාර්ථවාදී නොවන බවත් සිතූ ඔහු ධනපතියන් කෙරෙහිද වෙනස් මානසිකත්වයක් නිර්මාණය කර ගත්තේ ය. දේශපාලන

නිදහස සහ ජනතාවට සමාන ආර්ථික අවස්ථා සහතික කළ හැක්කේ සමාජවාදයට පමණක් බව ඔහු විශ්වාස කළේ ය. ''සමාජවාදය යනු අනාගතයේ රැල්ලයි'' යනුවෙන් ඔහු පැවසී ය.



*(1951 කොයිරාල ස්වදේශ කටයුතු අමාත්‍යව සිටියදී)*

බී.පී කොයිරාල නමැති නේපාලයේ ගෞරනීය නායකත්වය සිය දේශපාලන ගමනේ ඉදිරි දැක්ම සඳහා ආර්ථික විද්‍යාව, තර්කනය, සාහිත්‍ය සහ නීතිය හැදෑරීය. එසේම ඔහු ඉංග්‍රීසි, ජර්මානු, ප්‍රංශ, රුසියානු, හින්දි, බෙංගාලි සහ නේපාල සාහිත්‍ය කියවන සුවිශේෂී දැවැන්ත නායකත්වයක් ඔහු සතුය. ඔහුගේ අධ්‍යාපන පසුබිම හා කලාත්මක හැකියාවන් ඔහුගේම කෘතිවලින් ඒකාබද්ධ කොට තර්කානුකූලව හා බලගතු ආකාරයකින් ජීවිතය පිළිබඳ දැක්මක් ඉදිරිපත් කළේ ය. සාම්ප්‍රදායික වටිනාකම් පිළිබඳ පිළිගැනීමට ලක් නොකිරීම පිළිබඳ ඔහුගේ දැඩි විවේචනයට ලක් විය.

කොයිරාලගේ කෙටිකතා ප්‍රථමවරට ප්‍රකාශනයට පත් කරනු ලැබුවේ 1930 වර්ෂවලදී ය. හින්දි සහ නේපාල සාහිත්‍යයේ අවධානයට මෙම කෘති ලක් වූයේ ඔහුගේ චරිත බොහෝ විට ෆ්‍රොයිඩ් මනෝ විශ්ලේෂණය පිළිබඳ අවබෝධයකින් යුතුව නිර්මාණය වී ඇති බැවින් ය. කොයිරාලගේ කෙටිකතා හා නවකතාවන්හි ප්‍රවේශයන් ෆ්‍රොයිඩියන් නොවූවත්, එය තවමත් නේපාල පාඨකයන්ට සුවිශේෂී වන්නේ ඔහු ජීවිතයට සාම්ප්‍රදායික නොවන නවමු ප්‍රවේශයන් ඉදිරිපත් කළ බැවිනි.

"මොඩියන්" (Moodean) කෘතිය බොහෝ විට ඔහුගේ කෙටිම නවකතාව විය හැකි ය. " මොඩියන් " කෘතිය තුලින් කොයිරාල මහා භාරත යුද්ධය දෙස

බලන්නේ යුද්ධය හේතුවෙන් තම ස්වාමියා අහිමි කරගත් තරුණියකගේ දෘෂ්ටිකෝණයෙනි. මෙම කාන්තාවගේ දෘෂ්ටිකෝණය තුළින් පිලිබිඹු වන්නේ යුද්ධයෙන් වැන්දඹු වූ තරුණියන් දහස් ගණනකගේ ජීවිත ය. මේ අනුව, කොයිරාලයන් භගවත් ගීතාවේ දර්ශනයට එරෙහිව දැඩි ආයාචනයක් ඉදිරිපත් කරන අතර, එනම් එය ලෝකයට මිත්‍යාවක් පමණක් යැයි උපකල්පනය කර ජීවිතය හා මරණය අර්ථ විරහිත සංසිද්ධියක් බවට පත් කරන බවත්, තමාගේ යුතුකම් ඉෂ්ට කිරීමට ප්‍රමුඛත්වය ලබා දෙන බවත් ය. නේපාල රාජ්‍යය තුළ කොයිරාල නැමැති සුවිශේෂී නායකත්වය යුද්ධයට විරුද්ධ වූ අතර, වෙදාන්ත දර්ශනය තුළින් යුද්ධය පිළිබඳ යුධ වැන්දඹුවකගේ දෘෂ්ටිකෝණයෙන් බැලීමෙන් ඔහු නැවත වරක් නේපාල පාඨකයන්ගේ හෘද සාක්ෂියට කතා කිරීමට සමත් විය. ලාක්ෂණික වශයෙන් කොයිරාල තම කෙටිකතා හා නවකතා බොහෝමයක් තුළින් ස්ත්‍රියකගේ මනස විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කර තිබේ.

එමෙන්ම නේපාලයේ දේශපාලන ක්‍රමය පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් ජාතික ජනමත විචාරණ සඳහා බිරේන්ද්‍ර රජු කළ ඉල්ලීම පිළිගත් කොයිරාල එම ප්‍රතිඵල පිළිගත් පළමු නායකයා බවට ද පත් විය. බී.පී කොයිරාලයන් විසින් සාහිත්‍ය සේවයට පමණක් නොව නේපාලයේ දියුණුව සඳහා අධ්‍යාපනික වශයෙන් ද සෞඛ්‍ය අංශ සඳහා ද අති විශාල සේවාවක් සිදුකර ඇති බව මනාව හඳුනාගත හැකිය. 1992 දී "බී.පී .කොයිරාල නේපාල සෞඛ්‍ය පදනම" ඉන්දියාවේ සහ නේපාලයේ අග්‍රාමාත්‍යවරුන් විසින් ආරම්භ කරන ලද්දේ රාජ්‍ය මට්ටමින් සාමාන්‍ය සහයෝගිතාව සහ අන්තර්ක්‍රියාකාරිත්වයට අතිරේකවය. මෙය නිර්මාණය කරනු ලැබුවේ රාජ්‍ය නායකයින්ට මාධ්‍යවේදීන්ට නිරන්තරයෙන් සේවය ලබා දීමට ය. තවද දෙරට අතර අවබෝධය සහ මිත්‍රත්වය තවදුරටත් වර්ධනය කිරීම මෙමගින් සිදු විය. මෙය නේපාල පුනරුදයේ සංකේතයකි. මෙකී ඉහත සෞඛ්‍ය පදනම සඳහා මහත් වූ පිටුවහලක් ලබා දුන් අයෙකු ලෙස බී.පී කොයිරාලයන් හඳුන්වා දිය හැක. එබැවින් මෙකී පදනම ඔහුගේ නාමය සහිතව ප්‍රකාශ කරනු ලැබීය.

1992 දී නේපාල රජය විසින් බී.පී කොයිරාල අනුස්මරණ ග්‍රහලෝකාගාරය, විද්‍යාගාරය සහ කෞතුකාගාර සංවර්ධන මණ්ඩලය නිර්මාණය කරන ලද්දේ ය. මෙම විද්‍යා කෞතුකාගාර පිහිටුවීම තාරකා විද්‍යාව, තාරකා භෞතික විද්‍යාව

සහ විශ්වවිද්‍යාල යන ක්ෂේත්‍රවල පර්යේෂණ කටයුතු කිරීම සඳහා මහඟු පිටුවහලක් විය. මෙමගින් ද කොයිරාල නමැති සුවිශේෂී දේශපාලන නායකයා නේපාලයේ සිදු කළ සේවාව ස්මරණය කිරීම සඳහා මෙසේ ඔහුගේ නමින් නම් කරන ලදී. "බී.පී කොයිරාල අනුස්මරණ භාරය", 2000 දී අභාවප්‍රාප්ත බී.පී කොයිරාලගේ නමින් ආරම්භ කරනු ලැබූ අතර මෙයට රාජකීය මුදල් එකතු කිරීම, ප්‍රකාශන හිමිකම් ලබා ගැනීම සහ රජයෙන් මූල්‍ය ආධාර කිරීම සිදු කරනු ලැබේ. බී.පීගේ මෙම භාරය පිහිටුවීම ඔහුගේ සේවයන් අතරට එක් වූ විශිෂ්ට මතක ජයග්‍රහණයක් ලෙස සැළකිය හැකි ය. එසේම නේපාලයට ඔහු විසින් කරන ලද පරාර්ථකාමී දායකත්වය සිහිපත් කිරීම සඳහා නේපාලයේ විවිධ වැඩසටහන් සංවිධානය කරනු ලැබීය.

## විදේශ ප්‍රතිපත්තිය

රටක විදේශ ප්‍රතිපත්තිය වනාහි ජාතික අවශ්‍යතා ආරක්ෂා කරගැනීම සහ සාක්ෂාත් කර ගැනීමට මෙන්ම ජාත්‍යන්තර සම්බන්ධතා වටපිටාව තුළ එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා රාජ්‍යයන් ගනු ලබන ස්වයං උපායමාර්ගයන් වේ. එවැනි ස්වයං උපායමාර්ගයන් විවිධාංගීකරණයෙන් ලබාගත් අවස්ථාවක් වශයෙන් බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාලගේ පාලන කාලය තුළ විදේශ ප්‍රතිපත්තිය දැක්විය හැක.

විශේෂයෙන්ම නේපාලය යනු චීනය හා ඉන්දියාව යන ප්‍රධාන බලවතුන් දෙදෙනෙකු අතර භූඋපායමාර්ගික ස්ථානයක පිහිටා ඇති කුඩා රාජ්‍යයකි. ජාතික බලය සම්බන්ධයෙන් ඉන්දියාව හා චීනය සමඟ අසමමිතික සම්බන්ධතාවක් නේපාලය විසින් පවත්වාගෙන යන ලදී. අතීතයේ සිටම නේපාලය සිය රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා හා විදේශ ප්‍රතිපත්තිය භූමූලෝපායික වශයෙන් ගොඩනගා තිබූ අතර නූතන රාජ්‍යයක් වශයෙන් ගොඩනැඟුණු පසු ජාත්‍යන්තර, කලාපීය හා දේශීය දේශපාලන වෙනස්වීම හා සංසිද්ධීන් ඔස්සේ විවිධ උපාය මාර්ග අනුගමනය කොට ඇත. පසුකාලීනව අසල්වැසි රාජ්‍යයන් සමඟ විශේෂ සම්බන්ධතා, නොබැඳී සමතුලිතතාවය, සමානාත්මතාවය, සමතුලිතතාවය හා හා ත්‍රෛපාර්ශවික සහයෝගීතාවය

හරහා සිය විදේශ ප්‍රතිපත්තිය තුළ උපායමාර්ගිකව සිය වෙනස්කම් සිදු කළේ ය. එමෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ සිය මාතෘ භූමියෙහි නියෝජිතභාවය ස්ථාපනය කිරීමෙහිලා බිෂ්වේෂ්වර් කටයුතු කරන ලදී.

බිෂ්වේෂ්වර්ගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව සඳහන් කරන විට නේපාලය තුළ විදේශ ප්‍රතිපත්තිය ඉතා නවීන ආකාරයකින් විවිධාංගිකරණය කිරීමට ඔහු කටයුතු කළේ ය. කොයිරාලගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව දැක්ම 1960 ඔක්තෝම්බර් මාසයේ පැවති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයේදී කළ ප්‍රකාශයෙන් යම්තාක් විද්‍යමාන වෙයි. එහිදී ඔහු සඳහන් කරනු ලැබුවේ නේපාලයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් ඔහු ආඩම්බර වන බවත් එකී ස්වාධීනත්වය කෙලෙසන ආකාරයක තීන්දු තීරණවලට එළැඹීමට අකමැති බවත්ය. එමෙන්ම ඔහු තවදුරටත් අවධාරණය කළේ සීතල යුද්ධයකට අන්තර්ග්‍රහණය වීමට හෝ කිසිඳු බලවේගයක මෙවලමක් බවට පත් වීමටත් අවශ්‍ය නොමැති බවයි. මෙකී ප්‍රකාශය හරහා උද්දීපනය වන්නේ ඔහුගේ විදේශ ප්‍රතිපත්තියේ භූමිකාවයි. න්‍යාත්මක හා නෛතික වශයෙන් එහාගිය ස්වාධීනත්වයක් ඔහු අපේක්ෂා කළේ ය.

නේපාලයේ ස්වාධීනත්වය කෙරෙහි තර්ජනයක් එල්ල වූයේ සෘජු අසල්වැසි රාජ්‍යයන්ගෙන් ය. මක් නිසාද යත් නේපාලය පිහිටා ඇත්තේ චීනය හා ඉන්දියාවට අතර මැදි වූ භූඋපායමාර්ගික ස්ථානයකය. නේපාලය කෙරෙහි පැවැති තර්ජනය බොහෝ සෙයින් මිලටරි හා දේශපාලන මුහුණුවරකින් යුක්ත විය. මිලටරි පැතිකඩ අවම කිරීම සඳහා ද නේපාලය ඉන්දියාව හා බටහිර බලවේග සමඟ ආරක්ෂක විධිවිධාන යෙදවීය. එමෙන්ම මේ සම්බන්ධයෙන් බිෂ්වේෂ්වර්ගේ මතය වූයේ ආසියානු රටවල් කෙරෙහි පොදු අනතුරක් පවතින බැවින් එක්සත් විය යුතු බවයි. බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල ජාත්‍යන්තරවාදී දෘෂ්ටියකින් යුක්ත වූවෙකි. ඔහු ජාත්‍යන්තර සමාජවාදයේ ක්‍රියාකාරී සාමාජික සමාජවාදියෙකු වූ අතර ඉන්දීය උප මහද්වීපයේ දේශපාලන සිදුවීම් හා ලෝක වේදිකාවේ අප්‍රිකානු ආසියානු ජාතිවාදයේ දෘෂ්ටිකෝණයෙන් නේපාලයේ ඉරණම දුටුවේ ය.

1959 මැයි 28 දින බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල සිය රජයේ විදේශ ප්‍රතිපත්ති පිළිබඳව පළමු දේශනයේදී දක්වා සිටියේ නේපාලය කිසිදු මිලටරි ක්‍රමවේදයක්

පිළිපදින්නේ නැති බවත් එමෙන්ම දේශපාලන ප්‍රතිපත්තිය තුළ ජාත්‍යන්තර සම්බන්ධතා වල දී මධ්‍යස්ථ ප්‍රතිපත්තිය අත්නොහරින බව ප්‍රකාශ කළේ ය. බොහෝ දේශපාලන විචාරකයින් හා විද්වතුන් දක්වා සිටින්නේ බිෂ්වේෂ්වර් පාලන සමය තුළ ඔහු සිය දේශපාලන ස්ථාවරත්වය ශක්තිමත් කිරීමේ මාධ්‍යයක් වශයෙන් විදේශ ප්‍රතිපත්තිය භාවිත කිරීමේ අවශ්‍යතාවය නොදැන සිටි බවයි. මක්නිසාදයත් එකල පැවති ප්‍රජාතන්ත්‍රවාදී අත්හදාබැලීම් සහිත කාලපරිච්ඡේදයක නව විදේශ ප්‍රතිපත්තියක අවශ්‍යතාව මතු වීමයි.



*(කොයිරාල ඊශ්‍රායලයේ සංචාරය අතරතුර ඩේවිඩ් බෙන් හමුව)*

බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාලගේ විදේශ ප්‍රතිපත්තියට පදනම් වූයේ නේපාලයේ ජාතික අවශ්‍යතාවන්ට හිතකර ප්‍රායෝගික කරුණු මතය. මේ සම්බන්ධයෙන් විවිධ මත වාදී අදහස් ජාත්‍යන්තර සබඳතා විෂය පථය තුළ විචාරකයින් ඉදිරිපත් කරයි. විශේෂයෙන්ම විචාරකයන් දක්වන්නේ බිෂ්වේෂ්වර් එක්සත් ජාතීන්ගේ සංවිධානයට සහයෝගය දැක්වීමට ඉදිරිපත් වූයේ එය සංවර්ධනය වෙමින් පවතින කුඩා රාජ්‍යයන්ගේ ස්වාධිනත්වය, භෞමික අඛණ්ඩතාවය හා ස්වෛරීත්වයේ භාරකරු ලෙස සැලකූ බැවිනි. එමෙන්ම බිෂ්වේෂ්වර් ලෝක දේශපාලනය තුළ බල කේන්ද්‍රීය සංවර්ධිත රාජ්‍යන්ගේ ප්‍රතිපත්තීන්, අරමුණු හා අභිමතාර්ථයන් කෙරෙහි විරුද්ධව කටයුතු කළේ ය. එයට හේතු සාධක වූයේ බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාලගේ දේශපාලන චින්තනයයි. ඔහුගේ චින්තනය වූයේ බලවත් සංවර්ධිත රාජ්‍යයන් සංවර්ධනය වෙමින් පවතින දුර්වල රාජ්‍යයන්ගේ ස්වාධීනත්වය කෙරෙහි නිරන්තරයෙන් තර්ජනයක් වන බවයි. බිෂ්වේෂ්වර් නොබැඳි පිළිවෙතක් අනුගමනය කළේ සීතල යුද්ධයේ අඳුරු

සෙවණැලි වලින් නේපාලය දුරස් කිරීමේ එකම ප්‍රතිපත්තිය නොබැඳි පිළිවෙලත වශයෙන් සිතූ බැවිනි. බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාලගේ විදේශ ප්‍රතිපත්තිය 1959 - 1960 යන අවධින් හි ජාතික දේශපාලනයේ ද පදනම විය.

බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාලගේ විදේශ ප්‍රතිපත්තිය තුළ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ යටත් විජිත විරෝධී, අධිරාජ්‍යවිරෝධී, සහ වාර්ගික විරෝධී, සැම නිහතමානී පියවරක්ම පිළිගැනීම හා දිරි ගැන්වීමයි. නේපාලයේ විදේශ ප්‍රතිපත්තිය තුළ වැදගත් ලක්ෂණයක් වන්නේ නේපාලය සිය සෑම මිත්‍ර රටකින්ම පාහේ ආධාර ලබාගැනීමයි. කෙසේ වෙතත් ආධාර භාර ගැනීම සඳහා නේපාලයට තමා විසින්ම පනවාගත් එක් කොන්දේසියක් තිබිණි. එනම් ලබා දෙන ආධාර කිසිඳු කොන්දේසියක් නොමැති විය යුතුය යන්නයි. පරිත්‍යාගශීලීන් ගේ බලපෑම්වලින් ආරක්ෂා වීමක් ලෙස නේපාලයේ ආධාර ප්‍රභවයන් විවිධාංගීකරණය කළ අතර එක්සත් ජාතීන්ගේ සංගමය, ආසියානු සංවර්ධන බැංකුව වැනි ජාත්‍යන්තර සංවිධාන හරහා මෙම ප්‍රතිපත්ති ගෙන යාමට කැමති විය. බිෂ්වේෂ්වර්ගේ මතය වූයේ නේපාලය සිය සමාජ ආර්ථික පරිවර්තනය සඳහා විදේශ ආධාර මත සම්පූර්ණයෙන්ම රඳා නොසිටිය යුතු බවයි. මන්දයත්, නේපාලයේ සංවර්ධනයට විදේශ ආධාර පමණක් ප්‍රමාණවත් නොවන අතර එයින් පමණක් රටේ තිරසාර බව සහතික කළ නොහැකි නිසාවෙනි. ඔහු තර්ක කළේ නේපාලය විදේශ ආධාර ලබා ගැනීම හරහා ආර්ථිකය විදේශ ආධාර මතම යැපීමටත්, ජාතිකත්වය පිරිහීමටත් හේතු විය හැකි බවයි. එමෙන්ම බලයේ සිටින අයගේ යහපත උදෙසාම බොහෝ විට විදේශ ආධාර හැසිරවිය හැකි බවයි. මෙකී කරුණු දුර්වලතාවයන් වශයෙන් බිෂ්වේෂ්වර් විසින් හඳුනාගන්නා ලදී. බිෂ්වේෂ්වර්ගේ ප්‍රතිපත්තිමය භූමිකාව පිළිබඳව අධ්‍යයනය කරන විට පැහැදිලි වන්නේ,

1. ආධාර ලබාගන්නාගේ රට තීරණය ගැනීමේ කාර්යභාරය අවතක්සේරු කරන ඕනෑම නියමයක් කොන්දේසි වලින් තොර විය යුතු ය.
2. ලැබීම් හා පරිත්‍යාග කරන රටවල් අතර ඇතිවන මානසික නොසන්සුන්තාව වළක්වාගැනීම සඳහා ආධාර සැපයීම එක්සත් ජාතීන් වැනි මධ්‍යස්ථ ආයතන හරහා ලබාදීම වැනි අදහස් ඔහු තුළ පැවති බවයි.

එයට සාක්ෂි වශයෙන් 1959 දෙසැම්බරයේ එක්සත් ජාතීන්ගේ පහළොස්වන මහා මණ්ඩල රැස්වීම අමතමින් කියා සිටියේ සංවර්ධිත රටකින් ලබාදෙන ආධාර එක්සත් ජාතීන් හරහා ලැබිය යුතු බවයි. මෙයින් බිෂ්වේෂ්වර්ගේ අරමුණ වූයේ විදේශීය සහයෝගීතාවය සහතික කිරීම හා තවත් අතකින් සංවර්ධිත රටවල් විසින් ආධාර ලබාදීමේ දී අනිත් රටෙහි ස්වාධීනත්වය හා ස්වෛරීභාවයට ගැටලුවක් වීම වැළැක්වීමය. විදේශීය ප්‍රතිපත්තිය තුළ දී අග්‍රාමාත්‍යවරයකු ලෙස බිෂ්වේෂ්වර් විසින් කර්මාන්ත, රෝහල් සඳහා විදේශ ආධාර අපේක්ෂා කරන ලදී. එමෙන් ම නේපාලයට රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇති රටවල් සමඟ ආධාර ගිවිසුම් ඇති කර ගැනීමටත් ඔහු කටයුතු කරන ලදී.

## ඉන්දියාව හා චීනය කෙරෙහි පැවැති විදේශ ප්‍රතිපත්තිය

ඉන්දියාව හා චීනය කෙරෙහි මොහුගේ පාලනය යටතේ, අනුගමනය කරන ලද විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කතා කරන විට වැදගත් කරුණක් වන්නේ, ඉන්දියාව හා චීනය අතර පවතින ගැටළුවලට බලපාන ඕනෑම දෙයක් කිරීමට හෝ අදහස් දැක්වීමට නේපාලය කටයුතු කිරීමයි. එය නේපාලය අනුගමනය කරන ලද නොබැඳි පිළිවෙතේ වැදගත් ලක්ෂණයක් වන "ස්වාධීන ප්‍රතිපත්තිය" ගම්‍යමාන කරන්නකි. ඉන්දියාව හා චීනය සම්බන්ධයෙන් නේපාලය ද්වීපාර්ශවීය ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ය.

- සාමකාමී හා මිත්‍රශීලී සාකච්ඡාව තුළින් චීනය සමඟ කැපී පෙනෙන ගැටලු නිරාකරණය කර ගැනීම
- චීනයෙන් එල්ල විය හැකි තර්ජනයන් හෝ පීඩනයකට මුහුණ දීම සඳහා ඉන්දියාව සමඟ දැනටමත් පවතින සමීප අවබෝධය වර්ධනය කර ගැනීම.

කොයිරාල පාලන සමයේ චීනය සමඟ පැවති වැදගත් විදේශ ප්‍රතිපත්තිමය ජයග්‍රහණයක් වන්නේ දෙරට අතර පැවැති විදේශ ප්‍රතිපත්ති දේශසීමා ගැටලු විසඳීම සම්බන්ධයෙන් 1960 මාර්තු මාසයේ දී බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල හා චෞ එන්ලායි (Zhou Enlai) අතර ඇති වූ ගිවිසුමයි. ඉන්දියාව සමග බිෂ්වේෂ්වර් සතුව පැහැදිලි විදේශ ප්‍රතිපත්තික් පැවතුණි. බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාලගේ රජය ඉන්දියාව සමඟ සමීප සම්බන්ධතාවක් සහ චීනය සමඟ මිත්‍රශීලී නමුත්

විධිමත් සම්බන්ධතා මත පදනම්ව විදේශ ප්‍රතිපත්තිය නිර්වචනය කිරීමට උත්සහ කළ බව විද්වත් අදහසයි. විචාරකයින් අවධාරණය කරන පරිදි ඉන්දියාව කෙරෙහි පැවැති විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් බිෂ්වේෂ්වර්ගේ අදහස් පැහැදිලි වුවත්, ඔහු නේපාල කොංග්‍රසයේ නායකත්වය දැරූ අවධියේ, ඉන්දියාව පිළිබඳව දෘෂ්ටිවාදාත්මකව පිළිගත නොහැකි හා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකි ප්‍රතිපත්ති ඔහු සතු නොවුනු අතර වැදගත් ආර්ථික අවශ්‍යතාවයන්ට හානිකර අන්දමින් විශේෂ අන්තර් සම්බන්ධතාවක් නැවත ඇති කරගැනීමේ අභිලාශයක් නො තිබුණි.

ඊට උදාහරණ වශයෙන්, මුස්තැන්ග් (Mustang) ප්‍රදේශයේ "කොර් ලා පාස්" (Kora La Pass) සිද්ධිය සිදු වූ අවස්ථාවේ ඉන්දීය අග්‍රාමාත්‍ය ජවහර්ලාර් නේරු (Jawaharlal Nehru) සහයෝගය ලබා දුන් විට නේපාල අග්‍රාමාත්‍ය බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල ප්‍රකාශයක් කරමින් සිටියේ නේපාලය පූර්ණ ස්වෛරී, ස්වාධීන ජාතියක් බවත් ස්වකීය අභිමතය හා විනිශ්චය මත අභ්‍යන්තරික හා බාහිර ප්‍රතිපත්තීන් තීරණය කරන බවත් ය. එමෙන් ම ඉන්දියාව සමඟ පවතින මිත්‍රත්වය හා සාමය මෙකී අවස්ථාවෙන් උද්දීපනය වන බවත් ය.

බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාලගේ ආකල්පය වූයේ සෑම විටම මිත්‍ර රටක් වන ඉන්දියාව සමග මිත්‍ර සම්බන්ධතා පවත්වා ගැනීම නමුත් එහි අතකොළුවක් නොවීමටයි. ඔහුට අවශ්‍ය වූයේ මිත්‍රත්වය හා සුහදතාවයේ දී නිවැරදි සම්බන්ධතා, සහයෝගිතාව හා සාම්ප්‍රදායික සම්බන්ධතා පවත්වා ගැනීමට පමණි. සමාජයීය හා ප්‍රතිපත්තිමය භූමිකාවක් කොයිරාලගේ නොබැඳි පිළිවෙතට පදනම් විය. උදාහරණ වශයෙන්, හංගේරියාව පිළිබඳ ස්ථාවරය හා චීනයේ ස්ථාවරය කෙරෙහි ටිබෙට් ප්‍රශ්නය බලපෑ අවස්ථා වැනි සංසිද්ධීන්වලදී නේපාලයේ ප්‍රතිපත්තිමය භූමිකාව දැක්විය හැක. මෙම අවස්ථාවේදී ඉන්දියාව සමඟ මිත්‍රශීලී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරන රටක් වුවද ඉන්දියාවේ ආකල්පයන්ට නේපාලය ගැති නොවීම දැක්විය හැක.

**ඊශ්‍රායලය කෙරෙහි පැවැති විදේශ ප්‍රතිපත්තිය**

බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල දැඩි ලෙස ඊශ්‍රායල් හිතවාදී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ය. ජාත්‍යන්තර වශයෙන් දකුණු ආසියාව තුළ මෑතක් වන

තුරුම සහයෝගයෙන් ඊශ්‍රායලය සමඟ කටයුතු කළ රටක් වශයෙන් නේපාලය දැක්විය හැකි ය. මෙකී පසුබිමක් ඇතිවීමට පදනම බිෂ්වේෂ්වර්ගේ විදේශ ප්‍රතිපත්තිය හරහා ඇතිවූ බව විද්වත් අදහසයි. බිෂ්වේෂ්වර් ඊශ්‍රායලය කෙරෙහි පැවති හිතවාදී ප්‍රතිපත්තිය පහත උදාහරණ වලින් ගම්‍යමාන වෙයි. 1960 දී අග්‍රාමාත්‍ය බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල මහතා නිල සංචාරයක් කළ අතර එනමුත් බොහෝමයක් රටවල් ඊශ්‍රායල් සමඟ ඒ කාලය තුළ හිතවාදී ප්‍රතිපත්තියක් අනුගමනය නොකළේ ය.

**රුසියාව කෙරෙහි පැවැති විදේශ ප්‍රතිපත්තිය**

1960 ඔක්තෝම්බර් මාසයේ දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරය සඳහා සහභාගී වෙමින් සිටියදී නිව්යෝර්ක් නුවර දී හමු වූ අග්‍රාමාත්‍ය බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල හා සෝවියට් අගමැති නිකිතා කෘෂ්චෙවු (Nikita Khrushchew) යන මහත්වරුන් විසින් නේපාලයේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

- චීන - නේපාල දේශ සීමා ආරවුල සමථයකට පත් කිරීම
- යටත් විජිතවාදය දියකර හැරීම

වැනි කාරණා සම්බන්ධයෙන් සමාන ප්‍රතිපත්තිමය අදහස් දෙරටේ නායකයන් අතර තිබුණි. ඉහත සඳහන් සමීප සම්බන්ධතා හැරුණුවිට 1959 - 1960 කාලය තුළ නේපාල සෝවියට් සබඳතාවල සුළු අර්බුද ඇති විය.

1. රුසියානු සිතියම් නේපාලයේ සමහර භූමි කොටස් චීනයට අයිති ප්‍රදේශ වශයෙන් සඳහන් කර ඇති බව වාර්තා විය.
2. රුසියානු ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම සඳහා සෝවියට් තානාපති කාර්යාලය විසින් සෘජුවම නේපාල සිසුන් තෝරා ගැනීම පිළිබඳ නේපාල රජය දැඩි ලෙස විරුද්ධ විය.
3. කත්මණ්ඩුහි සෝවියට් තානාපති කාර්යාලයේ පළමු ලේකම් නේපාල රජයට එරෙහිව කොමියුනිස්ට් උද්ඝෝෂණවල නිරත වූ බවට චෝදනා එල්ලවිය.

මේ අනුව බිෂ්වේෂ්වර් නේපාලයේ විදේශ ප්‍රතිපත්තිය සුවිශේෂීකරණයකින් මෙහෙයවන ලද අග්‍රාමාත්‍යවරයෙක් වන අතර විදේශ ප්‍රතිපත්තිය නවීන ආකාරයකින් විවිධාංගීකරණයට ලක්කරන ලද අග්‍රාමාත්‍යවරයෙක් ද වේ.

## ගත හැකි ආදර්ශ

ආසියානු දේශපාලන ඉතිහාසයේ කැපී පෙනෙන චරිතයක් වන බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල චරිතය තුළින් සමාජයේ ලොකු කුඩා කාටත් ගත හැකි ආදර්ශ අති මහත් ය. මෙම චරිතය කුඩා කල සිටම අපූර්ව අදහස්වලින් යුක්ත වූ වෙනස් චරිතයක් විය. මොහු කුඩා කල සිටම තම දෙමාපියන්ට ඉතා ලැදිකමක් දැක් වූ කීකරු පුද්ගල චරිතයක් වූවා පමණක් නොව තම දෙමාපියන්ගේ අරමුණු සාක්ෂාත් කිරීම වෙනුවෙන් කැපවූ චරිතයත් ලෙස හඳුනාගත හැක.

එමෙන් ම මොහු තමා තුළ පවත්නා වූ අපූර්ව අදහස් යොදාගනිමින් කුඩා කල සිටම ලේඛන කලාවට යොමු වෙමින් තම හැකියාවන් වර්ධනය කරගැනීමටත් බාධක හමුවේ තම පියාගේ අරමුණු සාක්ෂාත් කරමින් උසස් අධ්‍යාපනයේ ඉහළටම ගමන් කිරීමට ඔහුට හැකි විය. ඒ ඔහුගේ අපරිමිත උත්සහයත් කැපවීමත් තුළ වූ ප්‍රතිපලයක් ලෙස ය.

අනාගත අරමුණු සාක්ෂාත් කරගැනීමට වර්තමානයේ සිටම එයට අවශ්‍ය අඩිතාලම සකසා ගැනීම දක්ෂ උපායශීලි දේශපාලන නායකයෙකුගේ ලක්ෂණයකි. එය මනාව පිළිබිඹු කරමින් කොයිරාල තම දේශපාලන දිවියට අවශ්‍ය මූලික අඩිතාලම සකසා ගන්නේ තම උසස් අධ්‍යාපනය තුළින් ද්විත්ව උපාධි ලබා ගනිමිනි. නේපාල සාහිත්‍යට රන් අකුරින් බිෂ්වේෂ්වර් නාමය එකතු වන්නේ සාහිත්‍ය වෙනුවෙන් ඔහු කළ අනගිභවනීය සේවය හේතුවෙනි. තම ලේඛන කුසලතාවයෙන් සමස්ථ සමාජයට සේවයක් කළ කොයිරාල දේශපාලන නායකයින් අතර ආදර්ශමත් නායකයෙකු ද වන්නේ ය.

ඉන්දියාවෙන් නොනැවතුණු ඔහු නේපාලය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීමේ අරගලයට නායකත්වය දෙනු ලැබුවේ තම වගකීම් මනාව හඳුනාගත් දේශපාලන නායකයෙකුගේ ලක්ෂණ ප්‍රකට කරමිනි. එපමණක් නොව දේශපාලනයට

පිවිසෙන ගමනේ දී දුප්පත් ජනතාවගේ දුක හඳුනාගත් කොයිරාල නායකත්වයට පැමිණීමෙන් පසු රට වෙනුවෙන් ඔහුගේ ආර්ථික වැඩපිළිවෙළේ දී එම ජනතාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ ශ්‍රේෂ්ඨ නායකයෙකු විය. කෙටි කතා, නව කතා සහ කාව්‍ය නිර්මාණ රාශියකගෙන් නේපාල සාහිත්‍ය පෝෂණය කළ කොයිරාල අනෙකුත් දේශපාලඥයින් අතර සබුද්ධික දේශපාලන චරිතයක් ලෙස කැපී පෙනුණි.

කොයිරාලගේ මෙම ගමනේ දී ඔහු යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් පසු නොවුවද තමාට පෙර රට කෙරෙහි අවධානය යොමු කරමින් නේපාල පුනරුදයේ සංකේතය ලෙස සැලකෙන නේපාල සෞඛ්‍ය පදනම පිහිටුවීමට තම උපරිම සහයෝගය ලබාදීමට තරම් කොයිරාල පරාර්ථකාමී ආදර්ශමත් චරිතයක් විය. ජාත්‍යන්තරය හමුවේ තම රට හා රටේ ස්වාධීනත්වය වෙනුවෙන් අභීතව ඍජු තීරණ ගත් කොයිරාල සුවිශේෂී දේශපාලන නායකයෙකු ලෙස හඳුනාගත හැකි වන්නේ 1960 ඔක්තෝම්බර් මාසයේ පැවති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයේ දී  කළ ප්‍රකාශයෙන් ය. එහි දී ඔහු සඳහන් කරනු ලැබුවේ නේපාලයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් ඔහු ආඩම්බර වන බවත් එකී ස්වාධීනත්වය කෙලෙසන ආකාරයක තීන්දු තීරණවලට එළැඹීමට අකමැති බවත් ය.

බිෂ්වේෂ්වර් නායකයෙකු වශයෙන් ඔහුගේ විදේශ ප්‍රතිපත්තියේ දී වඩාත් උපායශීලී නායෙකයෙකු ලෙස කටයුතු කළේ ය. එකල රටවල් සමඟ සබඳතා පැවැත්වීමෙ දී සීතල යුද්ධයේ අඳුරු සෙවණැලිවලින් නේපාලය දුරස් කිරීමේ අරමුණු ඇතිව නොබැඳි පිළිවෙත අනුගමනය කිරීම තුළින් කොයිරාල තුළ පැවති ආදර්ශමත් නායකත්වය මනාව පැහැදිලි වේ.

කොයිරාල හැමවිටම ජනතාවගේ නායකයෙකු විය. ඔහු දේශපාලන දිවියට අවතීර්ණ වූ කල පටන්ම ජනතාවගේ යහපත උදෙසා කටයුතු කළ නායකයෙකු විය. කිහිපවරක්ම තම දේශපාලන ගමනේදී සිරගත කිරීම්වලට මුහුණදීමට කොයිරාල හට සිදු වුව ද ඒ සියල්ල අභියෝග ලෙස බාරගත් ඔහු තම රට වෙනුවෙන් හා රටේ ජනතාවගේ යහපත වෙනුවෙන් කටයුතු කළ ශක්තිමත් දේශප්‍රේමී නායකයෙකු විය. මෙවැනි ගුණාංග හා නායකත්ව ලක්ෂණවලින් යුත් කොයිරාල සියල්ලන්ටම ආදර්ශමත් චරිතයක් වී හමාරය.

## සාරංශය

ආසියානු කලාපයේ දේශපාලන ඉතිහාසය දෙස බලන විට සුවිශේෂී පුද්ගල චරිතයක් ලෙස බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල හැඳින්විය හැක. . නේපාලයේ පළමු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයෙන් තෝරාගත් විසි දෙවන නේපාල අගමැතිවරයා වූ ඔහු නේපාලයේ පමණක් නොව මුළු මහත් ආසියාවේම ජන හදවත් දිනා ගත් සුවිශේෂ දේශපාලන නායකයෙක් ලෙස සඳහන් කළ හැක. 1914 සැප්තැම්බර් 8 වන දින ඉන්දියාවේ වරනාසි හි උපත ලැබූ බිෂ්වේෂ්වර් කුඩාකල සිටම සුවිශේෂී දක්ෂතා පෙන්නුම් කළ වෙනස් අදහස් දැරූ චරිතයක් විය. ඔහු බරණැස්හි හින්දු විශ්වවිද්‍යාලයෙන් 1934 දී ආර්ථික විද්‍යාව හා දේශපාලන විද්‍යාව පිළිබඳ උපාධිය ද 1937 දී කල්කටා විශ්වවිද්‍යාලයෙන් නීති උපාධිය ද ලබා ගත්තේ ය. බිෂ්වේෂ්වර් යුග දිවියට එළඹුණේ සුසිලා කොයිරාල සමඟය. ඔවුන්ට ප්‍රකාශ් කොයිරාල, හර්ෂ් කොයිරාල හා සශන්ක කොයිරාල නමින් පුත්‍රයන් තිදෙනෙක් වූ අතර චේතනා කොයිරාල නමින් දියණියක් ද විය.

බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල නේපාල සාහිත්‍ය ඉතිහාසයේ රන් අකුරින් ලියැවූ පුද්ගල නාමයකි. මන්දයත් ඔහු අතින් රචනා වූ කෙටිකතා, නවකතා, පද්‍ය රචනා රැසක් නේපාල සාහිත්‍ය තවත් පෝෂණය කළ හෙයිනි. ඔහුගේ සාහිත්‍ය නිර්මාණයන් ජීවිතය පිළිබඳ කලාත්මක හා තර්කානුකූල දැක්මක් ඉදිරිපත් කළ අතර ඇතැම් සාහිත්‍ය නිර්මාණයන් තුළ ප්‍රොයිඩියානු මනෝවිශ්ලේෂණවාදයේ සංකල්පයන් අපූරුවට ගැබ් වී තිබූ බව බෝහෝ සාහිත්‍ය විශ්ලේෂකයන්ගේ මතයයි. කෙසේ වුවත් ඔහුගේ සාහිත්‍ය නිර්මාණයන් සාම්ප්‍රදායික නොවන ප්‍රවේශයකින් පාඨකයන්ගේ හෘද සාක්ෂියට ආමන්ත්‍රණය කළ බව නොරහසකි.

බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල සමාජ ප්‍රජාතන්ත්‍රවාදී අදහස් දැරූ චරිතයක් විය. ඒ නිසාම ඔහුට අවශ්‍ය වූයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෙකු ලෙස නේපාලයේ සෑම පුරවැසියෙකුටම එකඟ විය හැකි දේශපාලන ක්‍රමවේදයක් සොයා යෑමයි. 1939 දී ඔහු ඉන්දියාවේ සියලු වැඩකටයුතු අවසන් කර නේපාලය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට තීරණය කළේ ය. බී. පී. කොයිරාල සම්බන්ධයෙන් කතා කිරීමේ දී තවත් වැදගත් කරුණක් ලෙසට රානා තන්ත්‍රයට එරෙහිව කටයුතු කිරීම පෙන්වා දිය හැක. ඔහු විසින් 1951 දී විප්ලවයට

නායකත්වය ලබාදුන් අතර එය නේපාලයේ පැවති අවුරුදු 104ක් පැරණි රානා තන්ත්‍රය පෙරළා දැමීය. ඉන්පසුව කොයිරාල විසින් නේපාල දේශපාලන ව්‍යුහය සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළෙ ය.

1959 මහ මැතිවරණයේ දී නේපාල කොංග්‍රසය බලයට පත් වූයේ බී. පී. අගමැති ධූරයට පත් වීමෙනි. දේශපාලන නායකයෙකු ලෙස කොයිරාල තම රට තුළ බහු පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදයක් ස්ථාපිත කිරීම සඳහා සිය ජීවිත කාලය පුරාම අරගල කළේ ය. බී.පී කොයිරාලයන් විසින් සාහිත්‍ය සේවයට පමණක් නොව නේපාලයේ දියුණුව සඳහා අධ්‍යාපනික හා සෞඛ්‍ය අංශ සඳහා ද අති විශාල සේවාවක් සිදුකර ඇති බව මනාව හඳුනාගත හැකි ය. බී. පී. කොයිරාලගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව සඳහන් කරන විට නේපාලය තුළ විදේශ ප්‍රතිපත්තිය ඉතා නවීන ආකාරයකින් විවිධාංගීකරණය කිරීමට ඔහු කටයුතු කළේ ය. කොයිරාල සිය රාජයේ විදේශ ප්‍රතිපත්ති පිළිබඳව පළමු දේශනයේ දී දක්වා සිටියේ නේපාලය කිසිඳු මිලටරි ක්‍රමවේදයක් පිළිපදින්නේ නැති බවත් එමෙන්ම දේශපාලන ප්‍රතිපත්තිය තුළ ජාත්‍යන්තර සම්බන්ධතා වල දී මධ්‍යස්ථධාරී ප්‍රතිපත්තිය අත්නොහරින බව ප්‍රකාශ කළේ ය. කොයිරාල නොබැඳි පිළිවෙතක් අනුගමනය කළේ සීතල යුද්ධයේ අඳුරු සෙවණැලිවලින් නේපාලය දුරස් කිරීමේ එකම මාවත නොබැඳි පිළිවෙලත වශයෙන් සිතූ බැවිනි. කොයිරාලගේ විදේශ ප්‍රතිපත්තිය 1959 1960 යන අවධින් හි ජාතික දේශපාලනයේ ද පදනම විය. අසියානු දේශපාලන ඉතිහාසයේ කැපී පෙනෙන චරිතයක් වන බිෂ්වේෂ්වර් ප්‍රසාද් කොයිරාල චරිතය කුඩා කල සිටම අපූර්ව අදහස්වලින් යුක්ත වූ වෙනස් පුද්ගල චරිතයක් වූ නිසාම ඔහුගේ දිවිය තුළින් සමාජයේ ලොකු කුඩා කාටත් ගතහැකි ආදර්ශ අති මහත් ය.

## මූලාශ්‍ර නාමාවලිය

Muni,S.D.( 1973 ). Foreign Policy of Nepal.23, Darya Ganji, Delhi-110006;National Publishing House

Nepal.R.M.,( 2020 ). Leaderships in the Global South: On BP Koirala's Economic Thinking. International Journal of Social Sciences and Management. 7(1); pp 21-29


Boss Nepal. B.P.Koirala, an honest and true leader[Online] Available at: www.bossnepal.com

Rhoderick Chalmers.( 2009 ). Nepal must escape the Shadows that Chased BP Koirala.[Online]( updated 27 May 2009 ) Available at: www.crisisgroup.org/

New Spotlight Online.( 2019 ). BP Koirala's 37 the Memorial Day.[Online]( updated 22 July 2019 ) Available at: www.spotlightnepal.com

Embassy of India.( 2018 ). About B.P.Koirala Fundation.[Online]( updated 29 March 2020 ) Available at: www.indembkathmandu.gov.in/

# හමීඩ් කර්සායි



**කණ්ඩායම් සාමාජිකයන් :**

- අරෝෂ් මාටින්
- ඉෂාරා පෙරේරා
- ධනුද්දර වංශජ
- කවින්දි කෞෂල්‍යා
- චාරුක මදුසංක

## හැඳින්වීම

අස්ථාවර හා කලහකාරී පාලනයක් පැවති ඇෆ්ගනිස්ථානයේ (Afghanistan) ප්‍රථම වරට ප්‍රජාතන්ත්‍රවාදී ජනාධිපතිවරණයකින් තේරී පත් වූ ප්‍රථම ජනාධිපතිවරයා ලෙස හමීඩ් කර්සායි (Hamid Karzai) එරට දේශපාලන ඉතිහාසයට එක්වීය. එරට විරසකව ක්‍රියා කළ ටෝරා බෝරා (Tora bora) වැනි බොහෝ ගෝත්‍රික කණ්ඩායම් එකට එක් කිරිමෙහිලා මහගු කාර්යභාරයක් ඉටු කළ කර්සායි ඝාතන තැත් රැසක ප්‍රධාන ඉලක්කය වීම පුදුමයට පත් කරුණක් නොවී ය. තලෙයිබාන්වරුන්ගෙන් (Thaliban) විනාශය කරා ගමන් කරමින් තිබූ ඇෆ්ගනිස්ථානය මුදවා ගනිමින් නවමු රාජ්‍යයක් ලෙස එරට ජාත්‍යන්තරය ඉදිරියේ ඔසවා තැබීමට කර්සායි දැරූ උත්සාහය සුළු පටු නොවී ය.

1980 ගණන්වල කර්සායි ඇෆ්ගනිස්ථානයේ සෝවියට් යුද්ධයේදී 1979-1989 සෝවියට් හමුදා පලවා හැරීමට සටන් කළ මුජාහිදීන් (Mujahideen) සඳහා අරමුදල් සම්පාදකයෙකු ලෙස ක්‍රියාකාරී විය. සෝවියට් දේශයෙන් ඉවත්වීමෙන් පසු ඉස්ලාමීය ඇෆ්ගනිස්ථාන රාජ්‍යය පිහිටුවන ලද අතර 1996 දී තලෙයිබාන්වරු බලයට පැමිණ ඇෆ්ගනිස්ථානයේ ඉස්ලාමීය එමීර් රාජ්‍ය පිහිටවීමෙන් එරට නැවත අඳුරු යුගයක් කරා ඇදී යන ලදි. 1999 ජූලි මාසයේදී කර්සායිගේ පියා ඝාතනය කරන ලද අතර කර්සායි ඔහුගෙන් පසු පොපල්සායි ගෝත්‍රයේ (Popalzai tribe) ප්‍රධානියා ලෙස පත්විය. 2001 ඔක්තෝම්බර් මාසයේදී එක්සත් ජනපද ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කිරීම ආරම්භ වූ අතර 2001 අගභාගයේ දී තලෙයිබාන් තන්ත්‍රය ඉවත් කිරීමෙන් පසු කර්සායි ප්‍රමුඛ පෙලේ දේශපාලන චරිතයක් බවට පත්විය. 2001 දෙසැම්බරයේ ජර්මනියේ (Germany) පැවති ඇෆ්ගනිස්ථානය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේදී කර්සායි සිය මාසික කාලසීමාවකට අන්තර්කාලික පරිපාලනයේ සභාපති ලෙස ප්‍රධාන පෙලේ ඇෆ්ගනිස්ථාන දේශපාලන චරිත විසින් තෝරා පත් කරගන්නා ලදි.

ඇෆ්ගනිස්ථානයේ කාබුල් නුවර (Kabul) පැවති 2002 ලෝයා ජිර්ගා (Loya jirga) හෙවත් මහා සභාව අතරතුරදී ඔහු වසර දෙකක අන්තර්වාර ජනාධිපති ධූරයට තෝරා ගන්නා ලදි. රටේ ප්‍රබල සාම්ප්‍රදායික නායකයින් පාලනය කිරීම

සහ තලේබාන්වරුන්ට බලය නැවත ලබා ගැනීම වැළැක්වීම ඇතුළු අභියෝග රැසකට කර්සායි මුහුණ දුන්නේ ය. යුද්ධයෙන් විනාශ වූ රට නැවත ගොඩනැඟීමට ද ඔහු මහත් උත්සාහයක් දරන ලදි. ප්‍රචණ්ඩත්වය ඇෆ්ගනිස්ථානයට දිගින් දිගටම පීඩා කළ අතර කර්සායි ඝාතන උත්සාහයන් කිහිපයක ඉලක්කය විය. 2004 ජනාධිපතිවරණයෙන් පසු කර්සායි ජයග්‍රාහකයා ලෙස ප්‍රකාශයට පත් කර ඇෆ්ගනිස්ථාන ඉස්ලාමීය ජනරජයේ ජනාධිපති බවට පත්විය. ඔහු 2009 ජනාධිපතිවරණයේදී දෙවන වරටද පස් අවුරුදු ධූර කාලයක් දිනා ගත්තේය. මෙම වාරය 2014 සැප්තැම්බර් මාසයේදී අවසන් විය.

ඇෆ්ගනිස්ථානය තුළ නොමැකෙන වෙනස්කම් රාශියක් සිදු කළ හමීඩ් කර්සායිගේ ළමා කාලය සහ ඇෆ්ගනිස්ථානය තුළ ඔහු කළ වෙනස්කම් ඇතුලු දේශපාලන දිවිය පිළිබඳවත්, ඔහු විසින් පවත්වාගෙන ගිය විදේශ ප්‍රතිපත්තීන් පිළිබඳව ද කෙරෙන විවරණයක් ලෙස මෙය පෙන්වා දිය හැකිය.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

හමීඩ් කර්සායි උපත ලැබුවේ 1957 දෙසැම්බර් 24 වන දා කන්දහාර් නගරයට (Kandahar City) ආසන්නව පිහිටි කර්ස් (Karz) නැමැති කුඩා නගරයේ ය. එය පිහිටියේ ඇෆ්ගනිස්ථානයේ දකුණුදිග ප්‍රදේශයෙහි ය. ඔහු අයත් වූ පවුල පොපියුල්සායි (Populzai) කණ්ඩායමට අයත් වූ රදළ පවුලකි. එම කණ්ඩායම වසර 600 කට අධික කාලයක් එම රාජ්‍යය පාලනය කර ඇත. පොපියුල්සායි කණ්ඩායම අයත් වන්නේ පෂ්ටුන් (Pashtun) ගෝත්‍රිකයන්ටය. එය ඇෆ්ගනිස්ථානයේ විශාලතම ඉස්ලාමීය ගෝත්‍රික කණ්ඩායමයි. එයට පන් ලක්ෂයකට අධික සාමාජිකයන් සංඛ්‍යාවක් සිටී. ඔහුගේ පියාගේ පියා ජාතික කවුන්සිලයේ සභාපතිවරයා ලෙස මොහොමඩ් සහීර් ෂාහ් (Mohammed Zahir Shah) රජුගේ සමයේ දී කටයුතු කර ඇත. මොහුගේ පියා වන අබ්දුල් කර්සායි (Abdul Karzai) සෙනට් මණ්ඩලයේ ප්‍රධානියා ලෙස පාර්ලිමේන්තුවේ කටයුතු කර ඇත. ඔහු ගේ මාමා වන හබිබුල්ලා කර්සායි (Habibullah Karzai) එක්සත්

ජාතීන්ගේ ඇෆ්ගනිස්ථානු නියෝජිතයා වශයෙන් 1960 දශකයේ දී කටයුතු කර ඇත.

කර්සායි සහෝදර සහෝදරියන් සත් දෙනෙකුගෙන් යුක්ත පවුලක උපත ලැබීය. ඔහුගේ සහෝදර සහෝදරියන් පස් දෙනෙකු එක්සත් ජනපදයේ හෙල්මන්ඩ් (Helmand) නැමති අවන්හල් ජාලයේ හිමිකරුවන් විය. ඔවුහු තම කුඩා කාලයෙන් වැඩි කොටසක් ගත කළේ කන්දහාර් නගරයේ ය. ඔහු තම ප්‍රාථමික අධ්‍යාපනය කන්දහාර් නගරයේ මහ්මූඩ් හොටාකි (Mahmood Hotaki) සහ කාබුල් නුවර සයීඩ් ජමලුදීන් (Sayed Jamaluddin) යන පාසල්වලින් ලැබුවේ ය. ඔහු තම ප්‍රථම උපාධිය සඳහා ඉගෙන ගනු ලැබුවේ කාබුල් නුවර හබීබියා (Habibia) උසස් අධ්‍යාපන ආයතනයේ වන අතර එහි දී ඔහු හදාරනු ලැබූ විෂය පථය වනුයේ දේශපාලන විද්‍යාවයි. ඔහු ද්විතීක අධ්‍යාපනය ලැබුවේ ඇෆ්ගනිස්තානයේ අගනුවර වන කාබුල් (Kabul) නගරයේ ය. 1979 සෝවියට් දේශය, ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කිරීමෙන් පසු ව හමීඩ් ඇතුළු කර්සායි පවුලේ සියලුම සාමාජිකයන් පාකිස්තානයට පලා යන ලදි. කර්සායි මෙහි දී මුජයිදීන් (Mujahideen) නැමැති කොමියුනිස්ට් විරෝධී සංගමයේ මුදල් එක්රැස් එක්රැස් කිරීමෙහි කටයුතු සිදු කරන ලදි. මෙම සංගමය සඳහා ආධාර අනුබල දෙනු ලැබුවේ එක්සත් ජනපදය, පාකිස්තානය සහ සෞදි අරාබියයි. කර්සායි සිම්ලා හි හිමාචල් ප්‍රාදේශීය විශ්වවිද්‍යාලයේ (Himachal Pradesh University in Shimla) දේශපාලන විද්‍යාව හා ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳව පශ්චාත් උපාධිය හදාරා තිබේ. ඔහු පැරිස් නුවර ඉකෝල් සුපරිඒරෙ (Ecole Superieure) විශ්වවිද්‍යාලයේ දී පුවත්පත් කලාවේදය හදාරා ඇත. ඔහු අවුරුදු විසි හතක් වන විට භාෂා හතක් පිළිබඳ ප්‍රවීණයකු බවට ද තවත් බොහෝ වෘත්තීමය සුදුසුකම් ඇති පුද්ගලයෙක් බවට පත් විය.



*(1992 වර්ෂයේ හමීඩ් කර්සායි පරිවර්තකයෙකුගේ කාර්යයේ දී යෙදී සිටින මොහොතක් )*

## නායකත්වය කරා ගිය ගමන් මග

සෝවියට් හමුදා ඉවත් වීමෙන් පසුව හමීඩ් කර්සායි 1988 ඔක්තෝම්බර් මස මුලදී ඇෆ්ගනිස්ථානයට පැමිණියේ තාරීන්කෝට් (Thareenkote) හි මුජහිදීන් ජයග්‍රහණයට සහාය වීම සඳහා ය. පාලන තන්ත්‍රය නගරයෙන් නෙරපා හැරීම සඳහා පොපල්සායී සහ අනෙකුත් දුරාගී ගෝත්‍රිකයන් (Tribal) පෙළගැස්වීමට සහ මොහොමඩ් නාජිබුල්ලාගේ (Mohammad Najibullah) හමුදාවන් පන්සීයක් ඉවත් කිරීම පිළිබඳව සාකච්ඡා කිරීමට ද සහාය විය. 1992 දී නාජිබුල්ලාගේ සෝවියට් පිටුබලයත් රජය බිඳවැටුණු විට ඇෆ්ගනිස්ථාන දේශපාලන පක්ෂ එකඟ වූ පෙෂාවර් (Peshawar) ගිවිසුම ඉස්ලාමීය ඇෆ්ගනිස්ථාන රාජ්‍ය පිහිටුවා මහ මැතිවරණයෙන් පසු ව අතුරු රාජයයක් පත් කළේ ය. 1992 දී ජනාධිපති නජිබුල්ලා ධුරයෙන් ඉවත් වීමෙන් පසු කර්සායි, පළමු මුජාහිදීන් නායකයන් සමඟ කාබුල් බලා පිටත්ව ගියේ ය. ඔහු බර්හානුදීන් රබ්බාහි (Burhanuddin Rabbani) රජයේ නියෝජ්‍ය විදේශ ඇමති ලෙස සේවය කළේ ය. මොහොමඩ් ෆහීම් පසුව කර්සායිගේ උපසභාපති ධුරයට පත්ව ඇත. කෙසේ වෙතත් ගුල්බුදීන් හෙක්මට්යාර් වෙනුවෙන් ඔත්තු බැලීම හේතුවෙන් මොහොමඩ් ෆහීම් අත්අඩංගුවට ගනු ලැබුවේ ය. ඉන් අනතුරුව කර්සායි හෙක්මට්යාර් විසින් සපයන ලද, ගුල් රහමාන් විසින් පදවන ලද වාහනයකින් මොහොමඩ් ෆහීම් කාබුල් සිට පලා ගියේ ය.

හමීඩ් ගේ නායකත්ව ගමන ආරම්භ වන්නේ 1990 දශකයේ තලේබාන්වරුන්ගේ ආගමනයත් සමගය. 1990 දශකයේ මැද භාගයේ දී තලේබාන් සංවිධානය බිහි වූ විට කර්සායි මුලදී ඔවුන්ව නීත්‍යානුකූල රජයක් ලෙස පිලිගත්තේ තම රටේ දූෂණය නවත්වනු ඇතැයි ඔහු සිතූ බැවිනි. ඔවුන්ගේ තානාපතිවරයා ලෙස සේවය කරන ලෙෂ තලෙයිබාන් සංවිධානය ඉල්ලා සිටි අතර පකිස්තාන අන්තර් සේවා බුද්ධි අංශ (ISI) ඒවා වැරදි ලෙස භාවිත කරන බව තමාට හැඟුණ බව මිතුරන්ට පවසමින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළේ ය. ඔහු ඇෆ්ගනිස්ථාන සරණාගතයන් අතර පකිස්තාන කුවේට් (Kuwait) නගරයේ ජීවත් වූ අතර එහිදී ඔහු හිටපු ඇෆ්ගනිස්ථාන රජ සහීර් ෂා නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කළේ ය. 1999 ජූලි මාසයේ දී කර්සායිගේ පියා අබ්දුල් අහද් කර්සායි කුවේට් නගරයේ මුස්ලිම් පල්ලියක සිට නිවසට පැමිණෙමින් සිටිය දී අළුයම වෙඩිතබා ඝාතනය කරන ලදි.

තලෙයිබාන් සංවිධානය මෙය සිදු කළ බව වාර්තා වේ. මෙම සිද්ධියෙන් පසුව කර්සායි, අහමඩ් ෂි මෂුඩ්ලේ (Ahmadi Shia Majuba) නායකත්වයෙන් යුතු උතුරු සන්ධානය සමග සමීපව කටයුතු කිරීමට තීරණය කළේ ය. 2000 සහ 2001 වර්ෂවලදී ඔහු යුරෝපයට සහ එක්සත් ජනපදයට ගොස් තලේබාන් විරෝධී ව්‍යාපාරයට සහයෝගය ලබාගැනීමට උදව් කළේ ය. "තලේබාන් සංවිධානය අල්කයිඩා සංවිධානය සමග සම්බන්ධ වී ඇති බවත්, එක්සත් ජනපදයට ලඟදීම ප්‍රහාරයක් දියත් කිරීම සඳහා කුමන්ත්‍රණයක් පවතින බවත්" වාසුඩ් (Massoud) හා කර්සායි අනතුරු ඇඟවූහ. නමුත් ඔවුන්ගේ අනතුරු ඇඟවීම් නොසලකා හැරිණි. ඇමෙරිකාවේ 9/11 ප්‍රහාරයට දෙදිනකට පෙර 2001 සැප්තැම්බර් 09 වන දින අල්කයිඩා නියෝජිතයන් විසින් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකින් මාසුඩ් ඝාතනය කරන ලදි. එක්සත් ජනපද සන්නද්ධ හමුදා 2001 සැප්තැම්බර් මාසයේ දී තලේබාන් සංවිධානය සමග ගැටුමකට සූදානම් වෙමින් සිටිය දී, කර්සායි නේටෝ රාජ්‍යන්ගෙන් ඉල්ලා සිටියේ "මෙම අරාබිවරුන්, ඔවුන්ගේ විදේශීය ආධාරකරුවන් සහ තලේබාන් සංවිධානය සමග සැතපුම් ගණනාවක් නිවාස, පළතුරු වතු සහ මිදි වතු විනාශ කර ඇත. ඇෆ්ගනිස්ථානුවන් මරා දමා ඇත. ඔවුන් ඔවුන්ගේ අවි පුහුණු කරනු ලබන්නේ ඇෆ්ගන් ජීවිත මතය. අපට ඔවුන් පන්නා දැමිය යුතුය."

2001 ඔක්තෝබර් 7 වන දින මෙහෙයුම දියත් කිරීමෙන් පසුව, එක්සත් පෙරමුණ (උතුරු සන්ධානය) එක්සත් ජනපද විශේෂ බලකායේ කණ්ඩායම් සමඟ කටයුතු කළේ ය. ඔවුන් එක්ව තලේබාන් තන්ත්‍රය පෙරලා දමා ඇෆ්ගනිස්ථානයේ නව රජයක් සඳහා සහයෝගය ලබා ගත්හ. කර්සායි සහ ඔහුගේ කණ්ඩායම ඒ වන විට පකිස්තානයේ ක්වේටා හි සිටි අතර ඔවුන් රහසිගත මෙහෙයුම ආරම්භ කළහ. ඇෆ්ගනිස්ථානයට ඇතුළු වීමට පෙර ඔහු තම සටන්කරුවන්ට අනතුරු ඇඟවී ය.

2001 දෙසැම්බර් 5 වන දින දකුණු ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජනපද ගුවන් හමුදා නියමුවන්ගේ මිසයිල ප්‍රහාරයකින් හමීඩ් කර්සායි සහ ඔහුගේ සටන් කණ්ඩායම දිවි ගලවා ගත්හ. කණ්ඩායම තුවාල ලැබූ අතර එක්සත් ජනපදයේ ප්‍රතිකාර ලැබී ය. කර්සායිගේ මුහුණේ ස්නායුවලට තුවාල සිදු වී ඇති අතර සමහර විට ඔහුගේ කථාවල දී දැක ගත හැකිය. 2001 නොවැම්බර් 4 වන දින ඇමරිකානු විශේෂ මෙහෙයුම් බලකාය ආරක්ෂාව සඳහා කර්සායි ඇෆ්ගනිස්ථානයෙන් පිටතට ගෙන ගියේ ය.

2001 දෙසැම්බර් මාසයේදී දේශපාලන නායකයින් ජර්මනියේ රැස්වී නව නායකත්වය ව්‍යුහයන්ට එකඟ වූහ. දෙසැම්බර් 5 බොන් ගිවිසුම යටතේ ඔවුන් අතුරු පරිපාලනයක් පිහිටුවා 29 දෙනෙකුගෙන් යුත් පාලක කමිටුවක සභාපති ලෙස කර්සායි නම් කරන ලදී. ඔහු දෙසැම්බර් 22 වන දින නායකයා ලෙස දිවුරුම් දුන්නේ ය. 2002 ජුනි 13 වන දින ලෝයා ජිර්ගා විසින් කර්සායි ඇෆ්ගනිස්ථාන සංක්‍රාන්ති පරිපාලනයේ සභාපති ලෙස නව තනතුරේ අතුරු සභාපති ලෙස පත් කරන ලදි. උතුරු සන්ධානයේ හිටපු සාමාජිකයන් අතිශයින්ම බලවත් වූ අතර, විශේෂයෙන් උප ජනාධිපති මොහොමඩ් ෆාහිම්, ආරක්ෂක ඇමතිවරයා ලෙස ද කටයුතු කළේ ය.

කර්සායි බලයට පත්වීමෙන් පසු, ඔහුගේ සැබෑ අධිකාරිය කාබුල් අගනුවරින් පිටත කොතරම් සීමිතදැයි කියනු ලැබූ අතර, ඔහු බොහෝ විට කාබුල් නගරාධිපති ලෙස සමච්චලයට ලක් විය. කාබුල් අවට කළාපයෙන් පිටත ප්‍රතිසංස්කරණවලට බලපෑම් කිරීම සඳහා කර්සායි සහ ඔහුගේ පරිපාලනය මූල්‍යමය හෝ දේශපාලනික වශයෙන් සන්නද්ධ නොවූ හෙයින් තත්ත්වය විශේෂයෙන් සියුම් විය. වෙනත් ප්‍රදේශ, විශේෂයෙන් දුරස්ථ ප්‍රදේශ, ඓතිහාසික

විවිධ ප්‍රාදේශීය නායකයින්ගේ බලපෑමට ලක්ව ඇත. කර්සායි විවිධාකාරයේ සාර්ථකත්වයට පත්වී ඇති අතර, සමස්තයක් වශයෙන් ඇෆ්ගනිස්ථානයේ යහපත උදෙසා ඔවුන් සමග මිත්‍ර සබඳතා ඇති කර ගැනීමට උත්සාහ කර ඇත.

2004 ඔක්තෝම්බර් ජනාධිපතිවරණයේ දී කර්සායි අපේක්ෂකයෙකු වූ විට, ඔහු පළාත් 34 න් 21 ක් ජයග්‍රහණය කර, ඔහුගේ විරුද්ධවාදීන් 22 දෙනා පරාජය කර ඇෆ්ගනිස්ථානයේ ප්‍රජාතන්ත්‍රවාදීව තේරී පත් වූ පළමු නායකයා බවට පත්විය.

ප්‍රචණ්ඩත්වයට ඇති බිය නිසා ඔහුගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සීමිත වුවද සැලකිය යුතු සිදුවීමකින් තොරව මැතිවරණය සම්මත විය. ඡන්ද අක්‍රමිකතා පිළිබඳ එක්සත් ජාතීන්ගේ විමර්ශනයෙන් පසුව, නොවැම්බර් මස මුල දී පැවති ජාතික මැතිවරණ කොමිසම 55.4% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් කර්සායි ජයග්‍රාහකයා ලෙස ප්‍රකාශයට පත් කළේ ය. මෙය මුළු ඡන්ද මිලියන 8.1 න් මිලියන 4.3 ක් නියෝජනය කරයි.

කර්සායි 2004 දෙසැම්බර් 7 වන දින කාබුල් හි පැවති විධිමත් උත්සවයක දී ඇෆ්ගනිස්ථාන ඉස්ලාමීය ජනරජයේ ජනාධිපති ලෙස දිවුරුම් දෙන ලදි. යුද්ධයෙන් විනාශ වූ ජාතිය සඳහා සංකේතාත්මකව වැදගත් නව ආරම්භයක් ලෙස බොහෝ දෙනා එම උත්සවය අර්ථකථනය කළහ. සමාරම්භක උත්සවයට කැපී පෙනෙන අමුත්තන් වූයේ රටේ හිටපු රජ, සහීර් ෂා, හිටපු එක්සත් ජනපද ජනාධිපතිවරුන් තිදෙනෙකු සහ එක්සත් ජනපද උප ජනාධිපති ඩික් චෙනී ය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව

වර්ෂ 2001 වන විට දී ඇමරිකානු මැදිහත්වීම තුලින් ඇෆ්ගනිස්තානයේ පැවති තලෙයිබාන් පාලනය අවසන් විය. මෙමගින් අකර්මන්‍ය වු එරට පාලනය යථා තත්ත්වයට පත්කර ගැනීමට අතුරු පාලනයක් (interim administration) ඇති කිරීමට එරට දේශපාලන නායකයින් හා ගෝත්‍රික නායකයින් කටයුතු කළේ ය. ඒ අනුව 2001 වසරේ දී ඇතිකරගත් බොන් ගිවිසුම (Bonn agreement) මගින්

මාස 6ක කාලයක් සඳහා අතුරු රජයක් (interim government) පිහිට වූයේ ඇෆ්ගනිස්තානයේ වැඩිහිටියන්ගේ සාම්ප්‍රදායික කවුන්සිලය (Loya Jirga) රැස්වනතෙක්ය. මේ අනුව යමින් 2001 දෙසැම්බර් 22 වනදා හමීඩ් කර්සායි තාවකාලික රජයේ පාලකයා බවට පත්වන්නේ 29 දෙනෙකුගෙන් යුත් පාලන කවුන්සිලයේ (governing council) සභාපතිවරයා වශයෙන්ය. ඇෆ්ගනිස්තානයේ වැඩිහිටියන්ගේ සාම්ප්‍රදායික කවුන්සිලය 2002 වර්ෂයේ ජූනි මාසයේ දී රැස්වූ අතර නැවත 2004 වසරේ දී ඡන්දයක් පැවැත්වෙන තුරු රටේ පාලනය තවදුරටත් අතුරු රජයක් යටතේ පවත්වාගෙන යාමට තීරණය කළේ ය. ඒ සඳහා පැවැත් වූ ඡන්දයෙන් ඡන්ද 1295 ලබාගනිමින් කර්සායි ඇෆ්ගනිස්තාන අතුරු රජයේ ජනාධිපතිවරයා ලෙස පත් වූයේ 28 දෙනෙකුගෙන් යුත් කැබිනට් මණ්ඩලයක් හා උප ජනාධිපතිවරු 3 දෙනෙකු සමඟින් ය.

මෙකී කාලය තුළ දී කර්සායි විටක දී කාබුල් හී නගරාධිපතිවරයා (Mayor of Kabul) ලෙසද හඳුන්වනු ලැබීය. මන්දයත් ඔහු හා ඔහුගේ රජය සතුව පැවතියේ සීමිත බලයක් බැවිනි. ඊට හේතු වූයේ ඒ වනවිට ඇෆ්ගනිස්තානයේ බොහෝ ප්‍රදේශ ප්‍රාදේශීය නායකයින් යටතේ පාලනය වීමයි. මීට පිළියම් ලෙස කර්සායි 'එක්සත් ඇෆ්ගනිස්තානයක් බිහිකිරීමට එකී ප්‍රාදේශීය නායකයින් සමඟ සාකච්ඡා පැවැත් වුවද ඒවා එතරම් සාර්ථක නොවීය. එහෙත් හමීඩ් කර්සායි සෑමවිටකදීම උත්සහ දරන ලද්දේ තලෙයිබාන් පාලනයෙන් බැට කෑ ඇෆ්ගනිස්තානය තුළ සාමය ඇති කිරීම හා ඇෆ්ගන් ප්‍රජාව අතර නැවත විශ්වාසය ගොඩනැගීමටයි.



*(2002 වසරේ දී ඇෆ්ගනිස්තාන අතුරු රජයේ ජනාධිපතිවරයා ලෙස පත් වූ අවස්ථාවේදී ගත් ඡායාරූපයක්. )*

කර්සායී තම රාජකාරිය භාරගත් වහාම විවිධ ප්‍රචණ්ඩ ක්‍රියා රට තුළ උද්ගත වූයේ ඔහුගේ ජීවිතයද අවධානමේ හෙලමින්ය. ඔහු තම ජීවිතය නූලෙන් බේරා ගැනීමට සමත් වූ වාර ගණන අනන්තය. ඒ අනුව 2002 වර්ෂයේ සැප්තැම්බර් මසදී තුවක්කුකරුවෙකු විසින් එල්ල කරන ලද වෙඩි ප්‍රහාරයකින් තම දිවි ගලවා ගැනීමට ඔහුට හැකි විය. මීට අමතරව ඇෆ්ගනිස්තානයේ දේශපාලන නායකයින් මෙන්ම සාම සාධක මෙහෙයුම් ඉලක්ක කර සිදුවන ප්‍රහාර දෛනිකව සිදුවන සාමාන්‍ය සිදුවීම් බවට පත් විය.

මෙවැනි තත්වයක් යටතේ වුවද කර්සායී තමා වෙත පැවරුනු වගකීම් ඉටුකිරීමට සැමවිටකම උත්සහ දරන ලද්දේය. ඔහු ප්‍රමුඛතාවය ලබා දුන්නේ රටේ ආරක්ෂාවටයි. එහෙයින් ශක්තිමත් හමුදාවක් හා එක්සත් පොලිස් බලකායක් නිර්මාණය කිරීමට ඔහු කටයුතු කළේ ය. මීට අමතරව මත්ද්‍රව්‍ය ජාවාරම, අධික බදු අය කිරීම් වැනි විවිධාකාර දූෂණ ක්‍රියාවන්ට චූදිතයන් බවට පත් වූ ප්‍රාදේශීය නිලධාරීන් 20ක් පමණ සේවයෙන් පහ කළේ ය. තවද මෙම කාල සීමාව තුල දී ඔහු රාජ්‍යන් 15ක පමණ සංචාරය කරමින් ජාත්‍යන්තර සහය ලබා ගැනීමට කටයුතු කළ අතර ඉන් ඩොලර් බිලියන 5කට ආසන්න මුදලක් ආධාර වශයෙන් ලබා ගැනීමට ඔහු සමත් විය. ඔහු තුළ වූ රාජතාන්ත්‍රික ගුණාංග මෙන්ම ඔහු සතු වු මෘදු ගතිගුණද ඊට හේතු විය.

වර්ෂ 2004 ඔක්තෝබර් මස 9 වන දින, තලෙයිබාන් පාලනය අවසන් වීමෙන් අනතුරුව පළමු වරට ඇෆ්ගනිස්තානයේ ජනාධිපතිවරණයක් පැවැත්විණ. තම ජීවිතයට එල්ල වී තිබූ ජීවිත තර්ජනද නොතකමින් කර්සායී ජනාධිපතිවරණයට තරග කළ අතර ඉන් ඔහු ඉහළ ජයක් හිමිකර ගැනීමට සමත් විය. ඒ අනුව පලාත් 34න් 21ක් දිනාගනිමින් හා විරුද්ධකරුවන් 22ක් පරාජයට පත්කරමින් කර්සායී ඇෆ්ගනිස්තානයේ ප්‍රජාතාන්ත්‍රිකව තෝරා පත්කරගත් පළමු ජනාධිපතිවරයා බවට පත් විය. මේ අනුව ඔහු 2004 දෙසැම්බර් මස 7 වන දින, ඇෆ්ගනිස්තාන ඉස්ලාමීය ජනරජයේ ජනාධිපතිවරයා වශයෙන් දිවුරුම් දුන්නේය. බොහෝ අය මෙම අවස්ථාව යුද්ධයෙන් විනාශ වූ ජාතියක 'නව ආරම්භයක් ' ලෙස හඳුන්වන්නට විය.

කර්සායීගේ පළමු ධූරකාලය තුළ දී වසර ගණනාවකට පසු පළමු වරට එරට ආර්ථිකය වඩාත් වේගයෙන් වර්ධනය වන්නට පටන් ගැණුනි. තවද රජයේ ආදායම ප්‍රධාන වශයෙන් විදේශ ආධාර මත රඳා පැවතුනද එය ක්‍රමයෙන් සෑම වසරකදීම වැඩිවීමට පටන් ගත්තේ ය. ඇෆ්ගනිස්තානය තුළ අබිං වගාව (opium-poppy cultivation) ප්‍රචලිතය. එය හෙරොයින් නම් මත්ද්‍රව්‍ය සැකසීමට යොදා ගන්නකි. මෙම වගාව එරට ආර්ථිකයට වඩා වැදගත් වුවත් කර්සායී එම වගාවන් නතර කරන බවට ප්‍රතිඥා දෙනු ලැබුවේ තම දේශයේ සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම් පාලනය කිරීමටයි. එහෙත් මෙකී කාලය තුළදී ඇෆ්ගනිස්තානයේ පැවති යුධ තත්ත්වය හේතුවෙන් සිදු වූ සිවිල් හානි මෙන්ම දූෂණ ක්‍රියාවන් පිළිබඳව ජනතාව අතර ගොඩනැගුණේ අප්‍රසාදයකි.

**කර්සායීගේ ධූර කාලය තුළ (2004-2014) ඇෆ්ගනිස්තානයේ වාර්ෂික දළ දේශීය නිෂ්පාදන වර්ධන වේගය**



*(මූලාශ්‍රය- ලෝක බැංකුව)*

ඉහත ප්‍රස්ථාරයෙන් දැක්වෙන්නේ කර්සායීගේ ධූර කාලය තුළ (2004-2014) ඇෆ්ගනිස්තානයේ වාර්ෂික දළ දේශීය නිෂ්පාදන වර්ධන වේගයයි (annual GDP growth rate). ඒ අනුව 2009 වන විට අන් කවරදාකටත් වඩා එරට ආර්ථිකයේ ඉහළ යාමක් පෙනී යන අතර එය සඳහන් වන්නේ 21.391% වශයෙනි.

9/11 ප්‍රහාරය හෙවත් 2001 වසරේ දී තලෙයිබානුවන් විසින් ඇමරිකාවේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයට සිදුකළ ප්‍රහාරය හේතුවෙන් නේටෝ සංවිධානය

(NATO) ගෝලීය ත්‍රස්තවාදය මැඩලීමේ අරමුණින් ඇෆ්ගනිස්තානය තුළ විවිධ ක්‍රියාකාරකම් වල නියැලුණි. ඒ වන විට තලෙයිබානු නායක ඔසාමා බින් ලාඩන් (Laden) ඇෆ්ගනිස්තානයේ සැඟව සිටීමද මීට බලපෑ ප්‍රධාන කරුණකි. මේ අනුව 2006 මැයි මාසයේ කාබුල් හි ඇමරිකානු විරෝධී හා කර්සායි පාලන විරෝධී කැරළි ඇතිවිය. එමෙන්ම ඊට වසරකට පසුව ඇමරිකානු හා නේටෝවේ ත්‍රස්ත විරෝධී මෙහෙයුම් අතර සිදු වූ බෝම්බ ප්‍රහාරයක් හේතුවෙන් ඇෆ්ගනිස්තානයේ සිවිල් ජීවිත 51ක් නැති විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කර්සායි ප්‍රකාශ කර සිටියේ ඇමරිකානු හා නේටෝ සංවිධානයේ මෙහෙයුම් හේතුවෙන් තම රටේ සිවිල් පුරවැසියන්ට සිදුවන හානිය තවදුරටත් ඔහුගේ රජය විසින් අනුමත නොකරන බවයි. කෙසේ වුවත් කර්සායි මීට පෙරද ජාත්‍යන්තර අවධාණය මෙකී කරුණ කෙරෙහි යොමු කිරීමට උත්සහ දැරුවේ 2006 වසරේ සැප්තැම්බර් මස පැවති එක්සත් ජාතීන්ගේ මහ සභා (United Nations General Assembly ) සැසිවාරයේ දීය.

ඔහු එහි දී කියා සිටියේ ඇෆ්ගනිස්තානය තුළ ත්‍රස්තවාදය නැවත හිස ඔසවන බවත්, ඔවුන් තම රටේ දේශසීමා පසුකරමින් ඇෆ්ගනිස්තානයට ඇතුල් වී සිවිල් වැසියන් පීඩාවට පත්කරන බවයි. මේ හේතුවෙන් ඇෆ්ගනිස්තානය ඒ වන විට ත්‍රස්තවාදයේ ගොදුරක් බවට පත්ව ඇති බවද කර්සායි එහි දී පෙන්වා දුන්නේය. තවද එහි දී ඔහු ඇෆ්ගනිස්තානය තුළ මෙන්ම ඇෆ්ගනිස්තානයෙන් පිටත පවතින ත්‍රස්තවාදය මැඩලීමටද ජාත්‍යන්තර සහය පැතුවේ ගෝලීය ත්‍රස්තවාදය පිටුදකිමින්ය.

කර්සායිගේ පළමු නිල කාලය 2009 වසර වන විට දී අවසන් වූ අතර, ඔහු නැවත එම වසරේ පැවති ජනාධිපතිවරණයට තරග කලේ දෙවැනි වරටත් ඇෆ්ගනිස්තානයේ ජනාධිපතිවරයා බවට පත්වෙමින්ය. මේ අනුව 2009 අගෝස්තු මස 20 වන දින පැවති ජනාධිපතිවරණයෙන් මුළු ඡන්ද 50%කට වඩා වැඩි ප්‍රමාණයක් දිනා ගැනීමට ඔහු සමත් වූයේ තම ප්‍රතිවාදියා වූ අබ්දුල්ලා අබ්දුල්ලා පරාජයට පත් කරමින්ය. කෙසේ නමුත් එම කාලය වන විට කර්සායිගේ පාලනය පිළිබඳව එරට ජනයා අතර පැවතියේ දැඩි අප්‍රසාදයකි. මන්දයත් ඔහු තම පාලන කාලය තුළ දී ඇෆ්ගනිස්තානය ප්‍රතිසංස්කරණයට අපොහොසත් වූවා පමණක් නොව එරට තුළ නැවත ත්‍රස්තවාදය හිස එසවීම

වැලැක්වීමටද නොහැකි විය. මෙවැනි වාතාවරණයක් තුළ කර්සායි ලබාගත් මෙම ජයග්‍රහණය ඇදැහිය නොහැකි දෙයක් වූවා ය. එහි දී මැතිවරණ කාල සීමාව තුළදී සිදුවූ මැතිවරණ විරෝධී ක්‍රියාවන් පිළිබඳව එල්ල වූ චෝදනා හේතුවෙන් එය දූෂිත මැතිවරණයක් ලෙස නම් කරනු ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස දෙවන වටයේ ඡන්ද විමසීමකට කර්සායි එකඟ වූ අතර එය එම වසරේම නොවැම්බර් 7 වන දින පැවැත් වීමට නියමිතව තිබුණි. එහෙත් යම් කිසි කරුණක් හේතුවෙන් නොවැම්බර් 2 වන දින කර්සායිගේ ප්‍රතිවාදියා වූ අබ්දුල්ලා අබ්දුල්ලා මැතිවරණයෙන් ඉවත් වීමත් සමඟ මැතිවරණය අවලංගු විය. ඒ අනුව අවසානයේදී හමීඩ් කර්සායි නැවත වරක් ඇෆ්ගනිස්ථානයේ ජනාධිපතිවරයා බවට පත් විය.



*(2006 වසරේදී ඇෆ්ගනිස්ථානයේ කාබුල් නුවර පිහිටි ජනාධිපති මැඳුරේදී බැරක් ඔබාමා විසින් කර්සායි හමු වූ අවස්ථාව.)*

මෙලෙස පත් වූ කර්සායි සිය කැබිනට් මණ්ඩලයේ සාමාජිකයින් 24 සඳහා නාමයෝජනා ලැයිස්තුව දෙවතාවක් ඇෆ්ගනිස්ථාන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. මන්දයත් පළමු අවස්ථාවේ ඉදිරිපත් කළ ලැයිස්තුවෙන් 17ක් ප්‍රතික්ෂේප කළ අතර ඊට ආදේශ වශයෙන් දෙවන අවස්ථාවේ ඉදිරිපත් කළ 17න් 10ක්ද ඇෆ්ගනිස්ථාන පාර්ලිමේන්තුව ප්‍රතික්ෂේප කළ බැවිනි. මීට හේතු වුයේ කර්සායි විසින් ඉදිරිපත් කළ නාමයෝජනා ලැයිස්තු වල සිටි බොහෝ පුද්ගලයින් ඔවුන්ගේ නිපුණතාවය මත තෝරාගත් අය නොවූ අතර ඔවුන් හුදෙක් ජනවාර්ගික හා අල්ලස් හෝ මුදල් පදනම මත තෝරාගත් අය වීමයි. එමෙන්ම ඇෆ්ගනිස්ථාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු චෝදනා කරනු ලැබුවේ නාමයෝජනා ලැයිස්තුවල සිටි ඇතැමුන් එම තනතුරු වලට සුදුසු නොවන බවයි. කෙසේ නමුත් කර්සායි 2010 ජනවාරි මස මැද භාගය වන විට තම

කැබිනට් මණ්ඩලයේ සාමාජිකයින් 24න් 14 දෙනෙකු දිනාගැනීමට සමත් විය. තවද ඇෆ්ගනිස්තාන පාර්ලිමේන්තුව ශීතසෘතුව හේතුවෙන් පෙබරවාරි 20දා දක්වා වැසීම නිසාවෙන් කර්සායි හට තම කැබිනට් මණ්ඩලයේ ඉතිරි සාමාජිකයින් 10දෙනා තෝරාගැනීමට නොහැකි විය. මෙය එරට ආණ්ඩුව තුළ දේශපාලන අවිනිශ්චිතභාවය ඇතිවීමටද හේතු වූ කරුණක් වුවා ය.

වසර 2010 වන විටදී කර්සායි විසින් ඇමරිකාව විවේචනයට ලක් කරමින් එරට තුළ සිටින ඇමරිකානු භටයන්ට විවිධ චෝදනා එල්ල කරනු ලැබුවේ ඔවුන්ගේ මෙහෙයුම් හේතුවෙන් ඇෆ්ගනිස්තානයේ සිවිල් ජන ජීවිතයට සිදුවන හානි නිසාය. මෙවැනි දෑ හේතුවෙන් එතෙක් කර්සායි හා ඇමරිකානුවන් අතර තිබූ කිට්ටු සබඳතාවයන්  පළුදුවන්නට පටන්ගැණුනි.

මීට අමතරව ඒ වන විට ඇෆ්ගනිස්තානයේ පැවති තලෙයිබාන් කැරළි පිළිබඳව සාකච්ඡා කිරීමට ඇෆ්ගනිස්තානයේ වැඩිහිටියන්ගේ සාම්ප්‍රදායික කවුන්සිලය පැවැත්වීමට කර්සායි තීරණය කළේ ය. ඊට සහභාගී වීමට තලෙයිබාන් නායකයාට ආරාධනා කලද ඔහු එය ප්‍රතික්ෂේප කරන ලද්දේ කර්සායිගේ සාම සාකච්ඡා පිළිබඳ සිහිනය බොඳ කරමිනුයි. මේ අනුව 2010 අප්‍රේල් මාසයේ දී කර්සායි තලෙයිබාන් කැරළිකරුවන්ගෙන් ඉල්ලා සිටියේ ආයුධ බිම තබා ඔවුන්ගේ දුක්ගැනවිලි ඉදිරිපත් කරන ලෙසයි. මන්දයත් මෙලෙස දිගින් දිගට සටන් පවතින තුරු විදේශ බලවේග රටින් පිටව නොයන අතර එය තම රටට හානිදායක බැවිනි.

මේ අයුරින් කර්සායි සැමවිටකදීම උත්සහ දැරුවේ තම රාජ්‍ය තුළ සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාමයි. ඊට නොයෙකුත් බාධා පැමිණියද ඔහු තම වගකීම් මැනවින් ඉටුකිරීමට කටයුතු කළේ ය. ඒ  අනුව 2014දී  කර්සායි තම දෙවන නිල කාලය අවසන් කළේ ය.

## විදේශ ප්‍රතිපත්තිය

හමීඩ් කර්සායි ගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව සැලකීමේදී ඇෆ්ගනිස්ථානය පශ්චාත් යුද සමයක සිටීමත් එම යුද සමය තුළින් රට නැවත ගොඩ නැගීමත් ඉලක්ක කරගත් විදේශ ප්‍රතිපත්තියක් ගෙන ගිය බව පෙනී යනු ඇත. විශේෂයෙන්ම නේටෝ සහ ඇමරිකා එක්සත් ජනපදයත් සමග 2001 - 2010 දශකය තුළ ඉතා ශක්තිමත් සබදතාවක් ගොඩ නැගීමට හමීඩ් සමත් විය. 2007 වර්ෂයේදී හමීඩ් හට ඇමරිකාවේ සංචාරයකට ආරාධනා ලැබුණු අතර එහිදී ජෝර්ජ් ඩබ්ලිව් බුෂ් (George W. Bush) සමඟ හමුවක් ද පැවතුණි.



*(හමීඩ් විසින් බුෂ් ජනපති හමුවීම)*

කෙසේ නමුත් 2010 දශකයෙන් පසු කාලය හමීඩ් සහ ඇමරිකාව අතර සබඳතා පලුදුවීමේ ආරම්භය සනිටුවහන් කෙරුණි. 2014 වසරේදී රුසියාව විසින් ක්‍රිමියානු දේශය (Crimea) තම රටට ඈදා ගත් අතර එහිදී යුරෝපය මෙන්ම ඇමරිකාවද දැඩි විරෝධය පල කරන ලදි. එසේ උනත් එය නීත්‍යානුකූල ලෙස පිළිගත් අතලොස්සක් වූ රාජ්‍යයන් අතරට ඇෆ්ගනිස්ථානයද පත්වූයේ ඇෆ්ගනිස්ථාන - ඇමරිකානු සබඳතා පලුදු කරමින් ය.

හමීඩ් ගේ දකුණු ආසියාව සම්බන්ධ සබඳතා පිළිබඳ දැකීමේදී ද 2000 - 2010 දශකය තුළ පාකිස්තානය සමග ඉතා හොඳ සබඳතාවක් ගොඩනගා ගැනීමට හමීඩ් හට හැකිවිය. විශේෂයෙන්ම පාකිස්තාන අන්තර් දේශපාලන පක්ෂ වන අවාමි ජාතික පක්ෂය සහ පාකිස්තානු ජනතා පක්ෂය සමඟ ඉතා සමීපව කටයුතු කළේ ය. 2007 වර්ෂයේදී පාකිස්තාන ජනපති සමඟ දෙරටේ බුද්ධි අංශ කටයුතු ශක්තිමත් කර ඇත. එහීදී හමීඩ් පවසා ඇත්තේ ඇෆ්ගනිස්ථානය සහ පාකිස්තානය නිවුන් සහෝදරයන් බවයි. ඇෆ්ගනිස්ථාන - පාකිස්තාන සබඳතා

බොහෝ විට යුදමය හේතු සාධක මත පදනම් වූ බව විචාරකයන්ගේ අදහස විය.

රුසියානු බලපෑම මත ඇෆ්ගනිස්ථානයට සාර්ක් සංවිධානයේ (SAARC) සාමාජිකත්වය 1985 දී අහිමි වුවද 2007 දී නැවත සාමාජිකත්වය ලබා දෙන ලදී. එහිදී හමීඩ් ගේ ක්‍රියාකලාපය ඉතා වැදගත් සංධිස්ථානයක් විය. හමීඩ් විසින් 2010 වසරේ සිට ඉන්දියාව සමග පැවති සබඳතා ඉතා ශක්තිමත් කිරීමට කටයුතු කරන ලදී.



*(2010 වසරේදී සාර්ක් නායක සමුළුවට සහභාගී වූ හමීඩ් සහ අනෙක් නායකයන් )*

විශේෂයෙන්ම 2011 වසරේදී ඔසාමා බින් ලාඩන් පාකිස්තානයේදී මරණයට පත් වීමෙන් පසු ඉන්දියාව සමග උපායමාර්ගික ගිවිසුම්වලට එළඹීමට හමීඩ් විසින් කටයුතු කරන ලදී. ඒ නිසා පාකිස්තාන - ඇෆ්ගනිස්ථාන සබඳතා ඇතැම් විට බිඳ වැටීමකටද ලක් වී ඇත. 2015 දී හමීඩ් පැවසුයේ "අප පාකිස්තානය සමග යහපත් සබඳතා පවත්වාගත්ත ද ඔවුන් යටතේ කටයුතු කිරීමට බලාපොරොත්තු නොවේ" ලෙසයි.

හමීඩ් ගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව දැකීමේදී බොහෝ විට ලෝක හා කළාපීය බලවතුන් සමග සබඳතා පැවැත්වුවද අවශ්‍ය වූ සැනින් එම බලවතුන්ට ප්‍රතිවිරුද්ධ රටක් සමග සබඳතා ඇති කරගැනීමට මොහු දෙවරක් සිතා නැත. එය එක්තරා අකාරයක උපායමාර්ගික සබඳතාවන් පවත්වාගැනීමකි.

## ගත හැකි ආදර්ශ

1980 දශකයේ පටන් සෝවියට් රුසියානු හමුදා තම මව් රටින් පළවා හැරීමට කටයුතු කළ හමීඩ් කර්සායි නම් තරුණයා තම රට ජාතිය පිළිබඳ මහත් ආදරයෙන්, ආඩම්බරයෙන් මෙන්ම හැඟීමකින් කටයුතු කළ අයෙකු බව පැහැදිලිය. තම රට වෙනුවෙන් ජීවිතය පවා පූජා කිරීමේ හැකියාවක් සහිතව මොහු තම දේශපාලන ගමන ආරම්භ කරන ලදි.

ඉන් පසු රට තුළ වසංගතයක් බවට පත් වූ තලෙයිබාන් ත්‍රස්ත්‍රවාදීන්ගෙන් මව්බිම මුදවා ගැනීමටද හමීඩ් හට සිදු වූ අතර ඉවසීමේ ගුණයත් කිසිවක් අත් නොහැරීමේ ගුණයත් මනාවට පිළිබිඹු කරමින් ඔහු ත්‍රස්ත්‍රවාදයද රට තුළ මැඩපවත්වන ලදි.

රාජ්‍ය බලය ලබා ගැනීමෙන් පසුවද සාම්ප්‍රදායික නායකයන්ගේ බලයට යටත් වීමට ඇතැම් විට සිදු වුවද උපායමාර්ගික ලෙස කටයුතු කිරීම නිසා එම අභියෝගයද ජයගන්නා ලදි.

යුද්ධයෙන් පීඩා විඳි විනාශයට පත් වූ රටක් නැවත සංවර්ධනය කරා මෙහෙයවීමේ ඒ බාරදූර කර්තව්‍යය තම උර මතට ගත් හමීඩ් කර්සායි එම වගකීම නිසි ලෙස ඉෂ්ට කරමින් ඇෆ්ගනිස්ථානය ලොව පිළිගන්නා රාජ්‍යයක් කරා මෙහෙයවීමේ පළමු පියවර ඉතා සාර්ථක ලෙස නිර්මාණය කරන ලදි.

## සාරංශය

1957 දී පශ්ටුන් (Pashtun) ගෝත්‍රයේ කන්දහාර් (Kandahar) නගරයට සමීපව කර්ස් හි උපත ලැබූ ඇෆ්ගන් ජාතික දේශපාලනඥයකු වූ හමීඩ් කර්සායි 2001 වර්ෂයේ දෙසැම්බර් මස ඇෆ්ගනිස්ථානයේ ජනාධිපතිවරයා බවට පත්විය. ඔහු සෝවියට් සමූහාණ්ඩුව ට විරුද්ධව සටන් වැද ඇති අතර මොහොමඩ් සහීර් ෂා (Mohammed Zahir Shah) රජය බලාත්මක කිරීමට තැත් කරන ලදි. ඔහු 1990 සිට 1992 දක්වා නියෝජ්‍ය විදේශ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන ලදී.

ඔහු පශ්ටුන් ( Pashtun) ගෝත්‍රයේ නායකයා බවට පත්ව තලෙයිබාන් (Taliban) ගරිල්ලන් සමග සුහදශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදි.

1999 මැද භාගයේ දී එවකට ඇෆ්ගනිස්තානයේ ජනාධිපතිවරයා වූ මොහු ගේ පියා තලේබාන්වරුන් අතින් ඝාතනය විය. ඉන් අනතුරු ව මොහොමඩ් ඔමාර් (Mohammed Omar) ගේ නායකත්වයෙන් යුත් තලෙයිබාන් සටන්කරුවන්ට විරුද්ධව පාකිස්තානයේ කුළුට්ටා (Kuett) නගරයේ සිට සටනක් මෙහෙයවීය. 2001 සැප්තැම්බර් එකොළොස් වන දා නිව්යෝක් නගරයට එල්ල වූ ප්‍රහාරයෙන් අනතුරුව තලෙයිබාන්වරුන් ගේ ශක්තිය බිඳ දැමීම සඳහා එක්සත් ජනපදය විසින් මෙහෙයුමක් ආරම්භ කරන ලදි. තලෙයිබාන් කඳවුර බිඳ වැටීමෙන් පසුව ඇෆ්ගනිස්ථානයේ දේශපාලන පෙරළියක් ඇති කරවමින් එක්සත් ජාතීන්ගේ සංවිධානය ජර්මනියේ පැවැති සමුළුවෙන් අනතුරුව ජනාධිපතිවරයා ලෙස හමීඩ් කර්සායි ව තෝරා ගනු ලැබීය. අනතුරු ව ඔහු ඇෆ්ගනිස්ථානයට පැමිණි තලෙයිබාන්වරුන් ට කන්දහාර් නගරයෙන් ඉවත්වන ලෙස දැනුම් දෙන ලදි.

2001 වර්ෂයේ දෙසැම්බර් 22 වන දින ඇෆ්ගනිස්තානයේ විධායක ජනාධිපතිවරයා ලෙස හමීඩ් කර්සායි දිවුරුම් දෙන ලදි. ඔහු බලයට පත්වීමෙන් අනතුරුව තම ප්‍රථම රාජකාරිය බවට පත්කර ගත්තේ ටෝරා බෝරා (Tora Bora) ගෝත්‍ර අතර පැවැති නොසන්සුන්තාවයට පිළියම් සෙවීමයි. සටන්කාමී දේශයක් ලෙස පැවැති ඇෆ්ගනිස්තානය ප්‍රජාතන්ත්‍රවාදය දෙසට ගැනීම ඉතා අපහසු කාර්යයක් විය. 2002 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ දී ඔහුව ඝාතන කුමන්ත්‍රණය අසාර්ථක විය. ඇෆ්ගනිස්ථානයේ සිටි අවි ගත් ගෝත්‍රික කණ්ඩායම් නිරායුධකරණය ට ලක් කොට හැත්තෑ දහසක භට සංඛ්‍යාවකින් යුත් යුධ හමුදාවක් ස්ථාපනය කිරීමට කටයුතු කළේ ය.

2003 වර්ෂයේ දී ව්‍යවස්ථාදායක සභාව විසින් ඇෆ්ගනිස්තානයට නව ව්‍යවස්ථාවක් එක් කිරීමට කටයුතු කළේ ය. එම ව්‍යවස්ථාව මගින් ඇෆ්ගනිස්ථානය, ඉස්ලාමීය ප්‍රජාතන්ත්‍රවාදී ඇෆ්ගනිස්ථානු ජනරජය බවට පත් විය. ඉතා අර්බුදකාරී වාතාවරණයක වුව ද 2004 ඔක්තෝම්බර් මස 9 වන දා ඇෆ්ගනිස්ථානයේ නව ජනාධිපතිවරණයක් පැවැත්වීමට ඔහු කටයුතු කළේ ය. එම මැතිවරණයේ දී ඔහු 55% කට වැඩි ඡන්ද ප්‍රතිඵලයක් ලබාගෙන තම බලය

තහවුරු කර ගන්නා ලදි. අනතුරු ව ඔහු නව රජයක් පිහිටවන ලදි. 2008 වර්ෂයේ අගෝස්තු මාසයේ දී එංගලන්ත අගමැතිවරයා වන ගෝඩන් බ්‍රවුන් (Gordon Brown) සමග මත්ද්‍රව්‍ය මැඩලීම සඳහා උපක්‍රමශීලී ප්‍රතිපත්තියකට අත්සන් තබන ලදි. 2009 වර්ෂයේ පෙබරවාරි මාසයේ දී මියුනිච් (Munich) නගරයේ පැවැති එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිල රැස්වීමකදී ඔහු අවධාරණය කර සිටියේ තම මාතෘ භූමියට විදේශ හමුදාවන්ගේ පැමිණීම නිසාවෙන් විනාශමුඛයට ළඟා වී ඇති බවයි.

2009 වර්ෂයේ පැවැති ජනාධිපතිවරණය මඟින් හමීඩ් කර්සායි තම බලය තහවුරු කර ගත්ත ද එම මැතිවරණය සාධාරණ එකක් නොවූ බව විචාරකයන්ගේ අදහස විය. ඒ හේතුවෙන් දෙවන අදියරක් පැවැත්වීමට තීරණය කරන ලදි. කෙසේ වුවද ඔහුගේ ප්‍රබල ම ප්‍රතිවාදියා වූ අබ්දුල්ලා (Abula Abdullah) සටනින් ඉවත් වීම හේතුවෙන් ඇෆ්ගනිස්ථානු ඡන්ද කොමිසම විසින් හමීඩ් කර්සායිව ජයග්‍රහකයා ලෙස නම් කරන ලදි. ඔහු 2014 සැප්තැම්බර් මස 29 වනදා ධූරයෙන් සමුගන්නා ලදි.

## මූලාශ්‍ර නාමාවලිය

Google.com. 2020. Hamid Karzai News – The Latest From Al Jazeera. [online] Available at: <https://www.google.com/amp/s/www.aljazeera.com/amp/topics/people/hamid-karzai-141023060816320.html> .

Research, C., 2020. Hamid Karzai Fast Facts. [online] CNN. Available at: <https://www.google.com/amp/s/amp.cnn.com/cnn/2012/12/17/world/asia/hamid-karzai---fast-facts/index.html>

the Guardian. 2020. Hamid Karzai | World News | The Guardian. [online] Available at: <https://www.theguardian.com/world/hamid-karzai>.

The rebirth of Hamid Karzai: Kingmaker to president to father figure. 2020. The Rebirth Of Hamid Karzai: Kingmaker To President To Father Figure. [online] Available at: <https://www.google.com/amp/s/www.trtworld.com/opinion/the-rebirth-of-hamid-karzai-kingmaker-to-president-to-father-figure-25996/amp.